ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අටවන පාර්ලිමේන්තුව
(පළමු සැසිවාරය)

පා. ප්‍ර. මා. අංක. 2105/12

# විගණකාධිපති වාර්ෂික වාර්තාව




2014



## ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මහතා

### විගණකාධිපති (වැඩබලන)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(4) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් 2014 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩබලන විගණකාධිපතිවරයා ලෙස ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න මහතා පත් කරන ලදී. 1988 වර්ෂයේදි විගණන පරික්ෂකවරයෙකු ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් සිය වෘත්තිය ජීවිතය ආරම්භ කර 1992 වර්ෂයේදි දෙපාර්තමේන්තුවෙන් ඉවත් වී වසරකට ආසන්න කාලයක් රජයේ ගණකාධිකාරිවරයෙකු ලෙස කටයුතු කර ඇත. එම වර්ෂයේදී විගණන අධිකාරීවරයෙකු ලෙස නැවත විගණකාධිපති දෙපාර්තමේන්තුවට පැමිණ 2007 වර්ෂයේදි නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකු ලෙසද, පසුව අතිරේක විගණකාධිපති ධුරයටද උසස්වීම් ලබා ගන්නා ලදි. එතුමා වසර 04 කට ආසන්න කාලයක් වැටුප් රහිත නිවාඩු මත සෞදි අරාබියේ පෞද්ගලික සමාගමක ගණකාධිකාරීවරයෙකු ලෙසද කටයුතු කර ඇත.

වික්‍රමරත්න මහතා කැළණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී ගෞරව උපාධිධාරියෙකු වන අතර වරලත් ගණකාධිකාරිවරයෙකුද වේ. එතුමා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද, එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මුල්‍ය හා ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද හා ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සමාජිකයෙකුද වේ.

# විගණකාධිපතිවරයාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන මුදල් පාලනය ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයන් පැවැත්වීම හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරීම සම්බන්ධව 2014 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර, අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ හත යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

| | | |
|---|---|---|
| පළමුවන කාණ්ඩය | - | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු |
| දෙවන කාණ්ඩය | - | රාජ්‍ය සංස්ථා, අධිකාරී හා මණ්ඩල |
| තුන්වන කාණ්ඩය | - | ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් |
| හතරවන කාණ්ඩය | - | විදේශ ආධාර ව්‍යාපෘති |
| පස්වන කාණ්ඩය | - | පළාත් සභා |
| හයවන කාණ්ඩය | - | පළාත් පාලන ආයතන |
| අටවන කාණ්ඩය | - | කාර්යසාධන විගණනය හා වෙනත් විශේෂිත විමර්ශණයක් |

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය හා ව්‍යවස්ථාපිත භූමිකාව පිළිබඳව මහජන කථිකාවතේදී පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වීම නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුවට මෙය විශිෂ්ඨ වර්ෂයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාකාරී අංශයෙන් පමණක් නොව, පරිපාලනය හා මූල්‍ය සම්බන්ධයෙන්ද විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩි බලතල විගණකාධිපතිවරයා හා ඔහුගේ කාර්යය මණ්ඩලයට ලබාදිය යුතු බව රජය පිළිගෙන ඇත. මෙය යථාර්තයක් බවට පත්වනුයේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වීමත් සමඟය. දිගු කාලයක් අපේක්ෂා කළ විගණන සේවා කොමිෂම යථාකාලයේදී පිහිටුවන ලද අතර ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, කාර්ය මණ්ඩලය සේවයෙන් පහකිරීම්, හා විනය පාලනය රාජ්‍ය සේවා කොමිෂමෙන් මෙම කොමිෂම භාරගනු ඇත. අනෙක් ප්‍රධානතම වෙනස්කම වුයේ රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ සියයට 50 ක් හෝ ඊට වඩා වැඩි කොටස් හිමිකමක් ඇති සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්, විගණකාධිපතිවරයාගේ සියුම් පරීක්ෂාව යටතට ගෙන ඒමත්ය.

නීතිපතිවරයා, නීති කෙටුම්පත්වරයා හා නොයෙකුත් ක්ෂේත්‍රයන්හි නිරත වෙනත් වෘත්තීයවේදීන් ගණනාවකගෙන් තොරතුරු විමසීමෙන් අනතුරුව දිගු කාලයක් අපේක්ෂා කළ ජාතික විගණන පනත කෙටුම්පත් කර ඇත. විගණකාධිපතිවරයාට වර්තමානයේ පවරා ඇති සීමිත අධිකාර බලය මුළු රාජ්‍ය අංශයම ආවරණය වන පරිදි තවදුරටත් ව්‍යාප්ත කිරීමට ඉන් යෝජනා කරයි.

ශ්‍රී ලංකා විගණන සේවයේ හා විගණන පරීක්ෂක සේවයේ සාමාජිකයන් සිදුකරන ලද, සේවයේ වටිනා දායකත්වය අමාත්‍ය මණ්ඩලය හඳුනාගෙන තිබීම සහ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය " නමින් අලුත් සේවයක් පිහිටුවීම අනුමත කිරීම සහ ඉහත සේවාවන් දෙකෙහි නිලධාරීන් නව ඒකීය සේවාවට අවශෝෂණය කිරීමත් දෙපාර්තමේන්තුව ලද විශාල ජයග්‍රහණයකි.

ගිණුම්කරණ හා විගණන වෘත්තියෙහි කොටසක් ලෙස ගොඩනැගෙන පීඩනය ඇතුළත්ව වඩා අභියෝගකාරී සහ නිරන්තරයෙන් වෙනස්වන පරිසරයකදී දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංවිධානය සිදුකිරීම ඉතා වැදගත් වේ.

සියුම් අධීක්ෂණය හා විමර්ශනය සිදුකිරීමට හැකිවන පරිදි සහ විගණන විෂයය පථය පුළුල් කිරීමට හැකිවන පරිදි අංශ 59 ක් යටතේ විගණන හා සහායක සේවා සංවිධානය කරමින් ආයතනයේ සංවිධාන ව්‍යුහය පිළියෙල කිරීම දැනටමත් ආරම්භකර ඇත.

පාර්ලිමේන්තුවේ වැදගත්කම සැළකිල්ලට භාජනය කිරීම් මෙන්ම රාජ්‍ය අංශය මුහුණදෙන ප්‍රධාන ගැටළු දෙපාර්තමේන්තුව හොඳින් අවබෝධකර ගැනීම සහතික කිරීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව මුල් පිරීම් රාශියක් ක්‍රියාවට නංවා ඇත. විගණන වාර්තා කාර්යක්ෂමව හා ඵලදායීව බෙදාහැරීම උදෙසා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව වර්ධනය කිරීමට හා සමාලෝචනය කිරීමට දෙපාර්තමේන්තුව බැඳිසිටි. අවසානයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී තිබුණු විගණන ස්වාධීනත්වය දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවයේ ප්‍රධාන සාධකය ලෙස ඉතා පැහැදිලි ලෙස හඳුනාගනියි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ රාජකාරියට කැපවූ කාර්යය මණ්ඩලය සමඟ වැඩකිරීමට ලැබීම මා ලැබූවාවූ ගෞරවයක් සහ ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂමව කාර්යයසාධනයෙන් ඉටුකිරීමට ඔවුන්ගේ කැපවීම සම්බන්ධයෙන් මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි. රාජ්‍ය ගිණුම් කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා සහ සාමාජිකයන් පොදු වෘත්තීයේ යෙදෙන සහාය විගණනයන් සිදුකළ වරලත් ගණකාධිකාරවරුන්ගෙන් සමන්විත ආයතන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය, විගණිත ආයතන, දෙපාර්මේන්තුවේ පරිපාලන කටයුතුවලදී සහයෝගය ලබාදුන් ජනාධිපති ලේකම්තුමා හා ඔවුන්ගේ කාර්යය මණ්ඩලය, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා කාර්යය මණ්ඩල, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වැටුප් හා සේවක කොමිෂන් සභාව සහ පරිපාලන කටයුතුවලදී සහාය වූ අනෙකුත් රජයේ ආයතන, දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත් සංවර්ධනයට දායක වූ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතාවයට ස්තුතිවන්ත කිරීමට මම මෙම අවස්ථාව යොදාගනිමි.

පොදු මහජනතාවගේ හා පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවයන් උදෙසා පවතින විගණනය පිළිබඳව සහතික වීමට මම දැඩිව උනන්දු වෙමි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# පටුන


## අපගේ සංවිධානය 01

නිත්‍යානුකූල ඉටු කිරීම 04

අපගේ සංවිධාන සටහන 08

කාර්ය මණ්ඩල පුහුණුව 13

සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම 14

රාජ්‍ය ගිණුම් කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහයවීම 15

විගණකාධිපති විසින් පනවනු ලබන අධිභාර 16

විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන විගණනය 16

විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු 23

## 2014 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 30

## විගණන නිරීක්ෂණවල සාරාංශය (ක්ෂේත්‍ර අනුව) 44

ඒකාබද්ධ අරමුදල 45

රාජ්‍ය ව්‍යවසායන් 55

පළාත් පාලනය 65

විදේශාධාර ව්‍යාපෘති 70

බැංකු 73

කෘෂිකර්ම හා ඉඩම් 82

සංස්කෘතික හා කලා කටයුතු 86

අධ්‍යාපන 90

පරිසරය 94

විදේශ කටයුතු 97

විදේශ රැකියා නියුක්තිය 98

ධීවර හා පශු සම්පත් 100

සෞඛ්‍ය සේවා 107

ආයෝජන හා ප්‍රවර්ධනය 113

වාර්මාර්ග 115

ජනමාධ්‍ය 117

නීතිය හා සාමය 120

වරාය හා නාවික කටයුතු 121

මහාමාර්ග ඉදිකිරීම් හා පුනරුත්ථාපනය 124

කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය 129

ආපදා කළමනාකරණය 132

ආර්ථික සංවර්ධනය 133

ක්‍රීඩා 139

සංචාරක 141

නාගරික සංවර්ධනය 144

වෙළඳ හා වාණිජ 146

ඉදිකිරීම් කර්මාන්තය 153

නිවාස 157

ප්‍රවාහනය 161

තරුණ කටයුතු 167

සමාජ සේවා 171

තාක්ෂණය 173

උසස් අධ්‍යාපනය 175

රාජ්‍ය ආරක්ෂාව 179

වැවිලි කර්මාන්ත 186

බල ශක්තිය 192

ජලසම්පාදන හා ජලාපවාහන 204

රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ 208

## පළාත් සභාවල විගණන නිරීක්ෂණවල සාරාංශය 213

බස්නාහිර පළාත් සභාව 214

මධ්‍යම පළාත් සභාව 217

උතුරු මැද පළාත් සභාව 219

දකුණු පළාත් සභාව 221

නැගෙනහිර පළාත් සභාව 224

උතුරු පළාත් සභාව 227

සබරගමුව පළාත් සභාව 230

වයඹ පළාත් සභාව 234

ඌව පළාත් සභාව 240

# අපේ සංවිධානය

## අපේ දැක්ම

ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ප්‍රතිලාභය උදෙසා රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙරදැරි කරගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම.

## අපේ මෙහෙවර

ප්‍රශස්ත ගුණාත්මක විගණනයක් මෙහෙයවීම සහ පාර්ලිමේන්තුවට කාලීන හා නිරවද්‍ය වාර්තා ලබාදීම මඟින් යහපාලනය ප්‍රවර්ධනය කිරීම

## අපගේ අරමුණු

01. සම්පත්වල භාරකාරිත්වය පවරනු ලබන ආයතනවල කළමනාකරණයන් හා ඔවුන් හා පවරන ලද ගණන්දීමේ වගකීම ඉටුකර තිබේද යන්න ස්වාධීන පරීක්ෂණයක් සිදුකිරීම සහ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම.

02. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් කාරක සභාව යන නමින් හඳුන්වන පාර්ලිමේන්තුවේ පාලන කමිටු දෙක රාජ්‍ය ආයතනවල සිදුකරන කාර්යසාධනය පරීක්ෂා කිරීමට සහාය වීම.

03. විගණිත ආයතනවලට ඔවුන්ගේ ගිණුම් කටයුතුභාවය වර්ධනය කර ගැනීමට කළමනාකරණ වාර්තා නිකුත් කිරීම තුළින් නිර්දේශ සිදුකිරීම මගින් සහාය වීම.

## අපේ වටිනාකම්

විශිෂ්ඨත්වය

නවෝත්පාදනය

නායකත්වය

## අපගේ ඉතිහාසය

එවකට ලංකාව යනුවෙන් හැඳින්වුන ශ්‍රී ලංකාවේ වත්මන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ආරම්භය බ්‍රිතාන්‍ය යුගයේ මුල් කාල සීමාව තරම් ඈතට දිවේ. 1776 වර්ෂයේදී බ්‍රිතාන්‍යයන් විසින් දිවයින අත්පත් කර ගැනීමෙන් වසර 03 කට පසුව එනම්, 1779 වර්ෂයේදී සිසිල් ස්මිත් නමින් ගණකාධිකාරිවරයෙකු හා විගණකාධිපතිවරයෙකුව සිටි බව ලියකියවිලි වලින් සනාථ වේ. එතැන් පටන් ශ්‍රී ලංකාවේ උත්තරීතර විගණන ආයතනය වශයෙන් විගණකාධිපතිවරු 39 දෙනෙකු යටතේ ස්වාධීන ආයතනයක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

# විගණන සම්බන්ධව අපේ අධිකාරී බලය

රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට අධිකාරි බලය මූලික වශයෙන් ලැබෙනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවෙනි.

සමාගමේ කොටස් වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනක් විසින් දරනු ලබන සමාගම් පනත යටතේ පිහිටුවා ඇති සමාගම්ද, ආවරණය වන පරිදි 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ බලය තවදුරටත් පහත පරිදි වැඩිකර ඇත.

" විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාව, 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා , පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය."

පහත අණපනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිතුමා වෙත පවරා ඇති බලය විකාශනය කිරීමක් හෝ ප්‍රචාරණය කිරීමක් හෝ කර තිබේ.

- රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස
- පළාත් සභා සඳහා විගණනය විධිවිධාන සළසන 1987 අංක 42 දරන පලාත් සභා පනතේ 23 වගන්තිය
- මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සළසන මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය
- නගර සභා සඳහා විගණන විධිවිධාන සළසන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 වගන්තිය
- ප්‍රදේශීය සභා සඳහා විගණන විධිවිධාන සළසන 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 172 වගන්තිය
- ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සළසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය
- ක්‍රිඩා සංගම් සඳහා විගණන විධිවිධාන සළසන 1993 අංක 47 දරන ක්‍රිඩා සංගම් පනතේ 9 වගන්තිය

පාර්ලිමේන්තුව විසින් අවශ්‍යතාවයක් ලෙස සම්මත කරන ලද මොනයම් හෝ නීතියකින් සඳහන් කරන කවර හෝ වෙනත් රාජකාරි කරගෙන යාමට විගණකාධිපතිවරයා සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද වැඩිකරනු ලැබේ. විගණකාධිපතිවරයාගේ කටයුතු හා රාජකාරි ඉටුකිරීමේදී හා පැවරීමේදී ඔහුගේ රාජකාරියට සහායවීමට සුදුසුකම්ලත් විගණකවරුන්ගේ සේවය ලබාගැනිමට විගණකාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය දී ඇත. තවද විගණනයට අදාල වන තාක්ෂණ, වෘත්තීය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශේෂඥ සහාය ලබාගැනීමට අවශ්‍ය විධිවිධාන සළසා තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවෙන් විගණකාධිපතිවරයා ඔහුගේ රාජකාරි කටයුතු සිදුකිරීමේදී හා පැවරීමේදී සියලු පොත්පත් හා වාර්තා ඉහතින් සඳහන් කරන ලද ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල ගබඩා හා වෙනත් දේපලවලට පිවිසීමට විගණනයන් සිදුකිරීම හා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබාගැනීමට විධිවිධාන සළසා ඇත.

## අපගේ සේවා ග්‍රාහකයෝ

විගණකාධිපතිවරයාගේ විෂය පථය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නිර්වචනය කරන අතර තවදුරටත් එය දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සමාගම් ද ඇතුළත් කරමින් ව්‍යාප්ත කර තිබේ. වර්තමානයේදී අපගේ සේවාලාභී පදනම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අමාත්‍යාංශ | 59 |
| දෙපාර්තමේන්තු | 93 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 25 |
| සංස්ථා | 127 |
| විශ්වවිද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණුකිරීම් ආයතන | 73 |
| රාජ්‍ය බැංකු | 07 |
| ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් | 69 |
| විදේශ අරමුදල් ව්‍යාපෘති | 121 |
| අනෙකුත් ස්වාධීන ආයතන | 22 |
| පළාත් සභා | 09 |
| පළාත් පාලන ආයතන | 335 |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | 559 |
| ක්‍රීඩා සංගම් | 46 |

## අපගේ විෂය පථය

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂය පථය තීරණය කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව හඳුන්වා දී ඇති දැනට භාවිතයේ පවතින විගණන ප්‍රමිති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL), උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) හා උත්තරීත්‍ර විගණන ආයතන පිළිබඳ ආසියානු සංවිධානය (ASOSAI) විසින් අනුගමනය කරනු ලබන විගණනයට අදාළ සම්ප්‍රදායන්හි ප්‍රශස්ත පරිචයන් මගින් සහ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපති වෙත මඟ පෙන්වනු ලබයි.

මෙයට අමතරව රාජ්‍ය සංස්ථා සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සළකා බලා තීරණය කළයුතු විගණන විෂය පථය 1971 අංක 38 දරන මුදල් පනත මඟින් වඩා සවිස්තරාත්මකව දක්වා ඇත. ඒ අනුව විගණකාධිපති විසින් සංස්ථාවේ කළමනාකරණය වෙත විස්තරාත්මක වාර්තාවක් , සංස්ථාවේ වාර්තාව සමග ප්‍රකාශයට පත් කිරීම සඳහා වන වාර්තාවක් සහ පාර්ලිමේන්තුවට වෙනම ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවක් වශයෙන් වාර්තා 03 ක් නිකුත් කරනු ලබයි. මුදල් පනතේ විස්තර කර දක්වා ඇති පරිදි හැකිතාක් අවශ්‍යවන ප්‍රමාණයකට විගණන විෂය පථයට පහත කරුණු ඇතුළත් විය යුතුය.

(අ) තොරතුරු ඉදිරිපත් කිරීමේ අංශයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි සංවිධාන ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි නියමිත අන්දමට හා ප්‍රමාණවත්

ලෙස සකස් කර තිබේද යන බව සහ එවැනි ක්‍රම, කාර්ය පටිපාටි, පොත් , වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායීව ක්‍රියාත්මකව පවතීද යන බව

(ආ) රාජ්‍ය සංස්ථාවේ වැඩ කටයුතු එම රාජ්‍ය සංස්ථාවට අදාල නීති රීති හා නියෝග අනුව වූයේ ද සංස්ථාවේ පරිපාලනයෙහිලා සාධාරණත්වයක් තිබේද යන බව

(ඇ) අරමුදල් වෙන්කිරීමේදී හා එම අරමුදල් උපයෝජනය කිරීමේදි ආර්ථිකභාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ඉටු කර තිබේද යන බව

(ඈ) මුදල් තබා ගැනීමේ හා දේපල ආරක්ෂා කිරීමේ ක්‍රම සතුටුදායකද යන බව

(ඉ) සැලැකිල්ලට භාජනය වු කාලපරිච්ඡේදයට අදාළව විගණනයට භාජනය කරන ලද ගිණුම් සංස්ථාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කෙරෙන පරිදි ගණකාධිකරණය, මූල්‍යනය හා තක්සේරු කිරීම යන මුලධර්මයන්ට නිසි සැලැකිල්ල යොමු කරමින් පිළියෙල තිබේද යන බව සහ

(ඊ) විගණකාධිපති විසින් අවශ්‍යයැයි සලකනු ලැබිය හැකි වෙනයම් කරුණු

## අපගේ ස්වාධීනත්වය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කර ඇත. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් උත්තරීතර විගණන ආයතනයක ස්වාධීනත්වය මත පදනම් වූ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ මූලික මූලධර්මයන් සමග ගැලපීමට මෙය තවදුරටත් විකාශනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව ,

**''විගණකාධිපතිවරයෙක් වන්නේය. ඔහු සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව පත්කරනු ලබන අතර විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනතාක් ස්වකීය ධුරය දරන්නේය.''**

අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ ආබාධිත තත්ත්වය මත හෝ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමත් යන තත්ත්වයන්හීදී පමණක් ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක්වනු ලබන අතර ඔහුගේ ධූර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ.

## නීත්‍යානුකූල ඉටු කිරීම

### නීත්‍යානුකූල ඉටුකිරීම් සඳහා අවශ්‍යතාවය

විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ස්වාධීනත්වය මෙතාක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර තිබුණ ද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය පවත්නා ව්‍යවස්ථාව හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමා කිරීම් සිදුකර ඇත. විගණකාධිපතිවරයා කිසිදු පුද්ගලයෙකුගේ හා ආයතනයක සියලු බැදීම්වලින් නිදහස් විය යුතු අතර අත්තනෝමතික පළිගැනීම්වලින් තොරවිය යුතු නිසා මූල්‍ය හා මිනිස් බලය යන දෙවර්ගයෙන් දැක්වෙන ඔහුගේ සම්පත් සඳහා විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවේ රදාපැවැත්ම පාර්ලිමේන්තුව වෙනුවෙන් සිදුකරන ලද විගණනයේ ස්වාධීනත්වය සැබවින්ම හානියට ලක්වන බව පිළිගනී. මූල්‍ය පරිපාලන

ස්වාධීනත්වය ඇතුළුව විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මඟින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැලසිය යුතු වේ. වර්තමානයේදී විගණකාධිපතිවරයා ඔහුගේ වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ සහයෝගය තුළ යැපීම සිදුවන අතර දෙපාර්තමේන්තුවට සම්පත් වෙන්කිරීම දෙපාර්තමේන්තුව මුහුණ දෙන අවධානමට ගැලපෙන පරිදි සිදු නොවේ. අනෙකුත් උසස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වල පරිදි ශ්‍රී ලංකාවේ විගණකාධිපති සඳහා වූ අයවැය, නීති සම්පාදක කමිටුවක් විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව අනුමත කර හෝ ඔහුගේ අයවැය පිළිබඳ විධායක පාලනයට එරෙහි වූ කිසිදු ආරක්ෂාවක් හෝ සළසා නොමැත.

විගණකාධිපතිවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ පරිපාලන ස්වාධීනත්වය සුරක්ෂිත කිරීමට අවශ්‍ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පත්කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග,වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය ප්‍රථමයෙන් ජනාධිපති ලේකම් වෙත පැවරී තිබුණු අතර, පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වෙනි සංශෝධනයට අනුව එම බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) වෙත පැවරී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපතිවරයා වෙත සම්පූර්ණ වශයෙන් බලතල පැවරීමක් කර නොමැති හෙයින් ප්‍රවර්තන වැඩ පිළිවෙල යටතේ වුවද, විගණකාධිපතිට තම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පත් කිරීමේදී ගැටලුවලට මුහුණ පෑමට සිදු වී ඇත. විශේෂිත ආයතනයක් වූ අධිකරණ සේවා කොමිෂන් සභා විෂය සීමාව යටතට එන අධිකරණ සේවය පරිදි භුක්ති විඳිය යුතු ස්වාධීනතාවය පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කළ විගණන සේවය විශේෂ සේවාවක් වේ.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරීන් පිළිබඳ විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති පරිදි රජයේ සියලුම පරිපාලන රෙගුලාසි විගණකාධිපතිට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාළවේ. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනතාවය සීමා කිරීමක් වේ. ඔහුගේ රාජකාරි පිළිබඳ මෙම පරිපාලනමය පාලන අඩුපාඩුව විගණන කටයුතුවලට සැලකිය යුතු ලෙස අවහිර කිරීම් කළ අවස්ථා බොහෝමයක් විය.

එක්සත් ජාතින්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI) 1977 දී අනුමත කළ "ලීමා ප්‍රකාශනය" මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදී (2007 මැක්සිකෝව) "මැක්සිකෝ ප්‍රකාශනය" මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය පිළිබඳව ස්ථිර වශයෙන් වන පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

1. අර්ථාන්විත සහ ඵලදායි ව්‍යවස්ථාපිත නෛතික රාමුවක පැවැත්ම සහතික කිරීම සඳහා හා එහි තත්ත්වාකාර ව්‍යවහාරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල හා නීතිවල, උත්තරීතර විගණන ආයතනවල ස්වාධීනතාවය පැහැදිළිවම අර්ථ දැක්වීම.

2. උත්තරීතර විගණන ආයතනයන්ට රජයේ හෝ එහි අධිකාරින්ගේ බලපෑමෙන් තොරව, අවශ්‍ය සාධාරණ මිනිස් සම්පත්, ද්‍රව්‍ය හා මූල්‍යමය සම්පත් තිබිය යුතු අතර, තමන්ගේ අයවැය ඇස්තමේන්තුව හැසිරවීමට බලය තිබිය යුතුය.

3. උත්තරීතර විගණන ආයතනයේ ප්‍රධානියා හා අනෙකුත් සාමාජිකයින් පත්කිරීම සඳහා කොන්දේසි ව්‍යවස්ථාවේ සඳහන් විය යුතුය. උත්තරීතර ආයතනයන්ගේ ප්‍රධානියා හෝ අනෙකුත් සමාජිකයින්ගේ ස්වාධීනතාවය ඔවුන්ගේ පත්වීම ප්‍රමාණවත් දිගු කාලයකට හෝ ස්ථිර කොන්දේසි මත සිදුකිරීම හා ඉවත්කිරීම විධායකයේ බලපෑමෙන් තොර බවට සහතික විය යුතුය.

4. උත්තරීතර විගණන ආයතනයක් තමාගේ බලවරම ඵලදායිව ඉටු කිරීම සඳහා විගණන විෂය කරුණු තෝරා ගැනීම, ඔවුන්ගේ විගණන කටයුතු සැලැසුම් කිරීම, විගණන ශිල්ප ක්‍රම ක්‍රියාත්මක කිරීම මෙන්ම ඔවුන්ගේ විගණනය ක්‍රියාත්මක කිරීම, කාර්ය මණ්ඩලය සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීම

සඳහා ස්වාධීනතාවයක් තිබිය යුතුය. ව්‍යවස්ථාදායකයේ හෝ විධායකයේ හෝ මෙහෙයවීමකින් හෝ බලපෑමකින් තොරව ඔවුන්ගේ බලවරම ක්‍රියාත්මක කිරීමට මේ මගින් ඉඩ සැලසේ.

5. විගණන ආයතනවලට ඔවුන්ගේ වගකීම මනා ලෙස ඉටු කිරීම සඳහා ඔවුනට අවශ්‍ය විය හැකි සියලු ආකාරයේ ලියවිලි සහ තොරතුරුවලට ප්‍රවේශවීමේ නිදහසක්, කාලයක් සහ සීමා කිරීම්වලින් තොර වූ හිමිකමක් තිබිය යුතුය.

6. උත්තරීතර විගණන ආයතන අවම වශයෙන් වර්ෂයකට වරක්වත් ඔවුන්ගේ විගණන වැඩවල ප්‍රතිඵල පිළිබඳව වාර්තා කළ යුතුය. කෙසේ වුවද අවශ්‍යයැයි සළකනු ලබන්නේ නම්, නිරන්තර වාර්තා කිරීමේ නිදහස ඇත.

7. විගණන වාර්තාවල අන්තර්ගතය තීරණය කිරීම සහ විධිමත්ව සභාගත කිරීම සඳහා යෝග්‍ය අධිකාරියකට, එම වාර්තා භාරදුන් පසු එම වාර්තා ප්‍රසිද්ධ කිරීමට සහ බෙදාහැරීමට උත්තරීතර විගණන ආයතනයන්ට නිදහස තිබිය යුතුය.

8. විගණිත ආයතන විගණන නිගමන හා නිර්දේශවලට නිවැරදිව යොමුවී තිබේද හා නිවැරදි පියවර ගනු ලබනවාද යන්න පිළිබඳව පසු විපරම් කිරීමේ ස්වාධීන ක්‍රියාවලියක් උත්තරීතර විගණන ආයතනවලට තිබිය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය නොව, විගණකාධිපතිවරයා බැවින් වෙනත් රටවල මෙන්ම වෙනමම විගණන පනතක් තුළින් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කටයුතු සහ අධිකාරය විස්තර කිරීමට අවශ්‍ය වේ.

විගණකාධිපතිවරයාට පරීක්ෂා කළ හැකිවනුයේ රාජ්‍ය ආයතනවල කටයුතු පමණක්ය. කෙසේ වුවද, සම්පූර්ණයෙන් හෝ කොටසක් අයිති, සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද රාජ්‍ය සමාගම් විගණකාධිපතිවරයාගේ විෂය පථයට නොගැනේ. කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 50 ක් හෝ ඊට වඩා වැඩි ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර ආයතනයෙන් ප්‍රාග්ධනය ලෙස යොදවන රාජ්‍ය සමාගම් 200 කට වඩා වැඩි ප්‍රමාණයක් පවතියි. රාජ්‍ය ව්‍යාපාර විසින් සැලකිය යුතු සමාගම් සංඛ්‍යාවක් පිහිටුවා ඇත. තවද, රාජ්‍ය ආයතනයකින් අරමුදල් ලැබුණු සංවිධානද ඇතුළුව පෞද්ගලික සංවිධාන විමර්ශනය කිරීමට විගණකාධිපතිවරයාට නොහැකිව ඇත.

## දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට යටතේ 153 හා 154 ව්‍යවස්ථාවන්ට සිදුකළ සංශෝධන

විගණකාධිපතිවරයා විසින් මුහුණ දුන් පරිපාලන හා මූල්‍ය ස්වාධීනත්වයේ අඩුපාඩු මඟ හැරීම සඳහා පහත සඳහන් සංශෝධනයන් දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදු කර ඇත. රාජ්‍ය විගණනය නවීකරණය කරමින් තවදුරටත් ප්‍රතිසංස්කරණයන් විගණන පනත් කෙටුම්පතෙහි ඇතුළත් කර ඇත.

- විගණකාධිපතිවරයා සුදුසුකම්ලත් විගණකවරයෙකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවත්මෙන් සිටිනතාක් ස්වකීය ධූරය දරන්නේය.

- විගණකාධිපතිවරයා සභාපතිත්වය දරන විගණන සේවා කොමිෂන් සභාවක් පිහිවනු ලැබේ. නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපතිවරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධූරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු සහ ශ්‍රී ලංකා පරිපාලන

සේවයේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙකු අනෙකුත් සාමාජිකයන් වනු ඇත. ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශයන්ට යටත්ව වර්ෂ 03 ක ස්ථිර කාලපරිච්ඡේදයකට කොමිෂන් සභාවේ සාමාජිකයන් ජනාධිපතිවරයා විසින් පත්කරයි.

- ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සමාජිකයන්ගේ බඳවාගැනීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරීමෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

- රජය විසින් ඍජුව හෝ වක්‍රවද සහ සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් රාජ්‍ය අනුග්‍රහය සපයන රාජ්‍ය ආයතන සියල්ලේ විගණනය විගණකාධිපතිවරයාගේ විෂයය පථය යටතට ගැනේ.

- විගණකාධිපතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනිමට '' රාජ්‍ය නිලධාරියා'' යන නිර්වචනයෙන් ඉවත් කරයි.

- විධායකගේ කිසිදු මැදිහත්වීමකින් තොරව විගණකාධිපතිවරයාගේ කටයුතු සිදුකිරීමට ප්‍රමාණවත් අරමුදල් සපයන බවට සහතික කර ගැනීමට කොමිෂන් සභාව විසින් පිළියෙළ කරන ජාතික විගණන ආයතනයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුව විසින් විමර්ශනය කරයි. ජාතික අයවැයට ඇතුළත් කිරීමට මුදල් විෂය භාර අමාත්‍යවරයාට යොමු කරයි.

## යෝජිත ජාතික විගණන පනත් කෙටුම්පත

රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය ශක්තිමත් කිරීමට, රාජ්‍ය සම්පත් භාවිතා කිරීම වාර්තා කිරීමේ ගිණුම් කටයුතුභාවය සහතික කිරීමේ විගණකාධිපතිවරයාගේ කටයුතු, අධිකාර බලය සහ ස්වාධීනත්වය වැඩි කිරීමට, රාජ්‍ය සම්පත් භාවිතා කිරීමේදී පිරිමැසුම්බව, කාර්යක්ෂමතාවය ඵලදායිතාවය ඉහළ නැංවීමට අධිකාර බලය ඔප්නංවමින් විගණන පනතක් ඉදිරිපත් කිරීමට යෝජනා කරයි. ජාතික විගණන පනත් කෙටුම්පත නිතීපතිවරයා සහ නීති කෙටුම්පත්වරයාගෙන් උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව දැනටමත් කෙටුම්පත් කර ඇත. මෙය දැනටමත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබෙන අතර මහජන අදහස් සඳහා ගැසට් පත්‍රයේ පල කරනු ඇත.

ඉහතින් දක්වන ලද විගණන පනත් කෙටුම්පතේ සඳහන් ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

- ගිණුම්, මූල්‍ය, මූල්‍ය තත්ත්වය සහ රාජ්‍ය අරමුදල්වල මූල්‍ය පාලනය සහ විගණන ආයතනවල දේපල පරීක්ෂාව සහ කාර්යසාධන විගණනයක් සිදුකිරීමට හැකිවෙන ලෙසට සමාන ඔවුන්ගේ ගිණුම්කටයුතුභාවය , තාක්ෂණික විගණනයන් සිදුකිරීමට විගණකාධිපතිවරයාට හැකිවන පරිදි විෂය පථය වැඩිකිරීමට අපේක්ෂා කරයි.

- මහජනයා අතරින් යම්කිසි පුද්ගලයෙකු විසින් විගණිත ආයතනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යම්කිසි ගැටළුවක් විමර්ශනය කිරීමට සහ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම විගණකාධිපතිවරයාගේ අභිමතානුසාරී බලය පරිදි සිදු කිරීම.

- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති යටතේ පිහිටුවන ලද විගණන ප්‍රමිති කමිටුව විසින් තීරණය කරන ලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ජාතික විගණන කාර්යාලය විසින් බාරගනු ලබන අතර එය සියලු විගණනයන්ට අදාළ වේ.

- විගණකාධිපතිවරයාට හෝ අධිකාර බලයලත් නිලධාරියෙකුට සහාය නොදැක්වීම වරදක් වන බවට පනතෙහි විධිවිධාන සළසා තිබේ.

- රහස්‍යභාවය නොසළකා, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා, පොත්, ලියවිලි හෝ තොරතුරුවලට පිවිසීමේ ඉඩකඩ සළසාලමින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කර ඇත.

- ඕනෑම පුද්ගලයෙකුගේ හෝ ආයතනයක හෝ ගිණුම් විගණනය කර විගණන පිරිවැය අයකර ගැනීමට විගණන ගාස්තුවක් නියම කිරීමට විගණකාධිපතිවරයාට අධිකාර බලය දෙනු ලැබේ.

- විගණකාධිපතිවරයාගේ මතය පරිදි ගනුදෙනුවක් කවර හෝ නීතියකට , රෙගුලාසියකට හෝ රීතියකට පටහැනිව කර තිබීමෙන් එම ගනුදෙනුවට අදාල වූවන්ගේ වංචාව, නොසැලකිල්ල, දූෂණය හෝ විෂමාචාරය හේතුවෙන් අඩුවක් හෝ පාඩුවක් සිදුවන අවස්ථාවකදී හෝ ඇතුළත් කළ යුතු කවර වූ හෝ ගනුදෙනුවක් ගිණුම්වලින් අත්හැර තිබෙන අවස්ථාවකදී එවැනි සියලු ගනුදෙනුවල මූල්‍ය හෝ වෙනත් වටිනාකම, ප්‍රතික්ෂේප කිරීමට විගණකාධිපතිවරයාට හැකි වන්නේය. එවැනි ගනුදෙනුවට අදාල මුළු වටිනාකම අධිභාර කිරීමේ බලතල විගණකාධිපතිවරයාට ලබාදෙනු ලැබේ. එකී ගනුදෙනුවේ වටිනාකම එයට වගකිවයුතු පුද්ගලයන්ගෙන් වෙන් වෙන්ව හෝ සාමුහික වන පරිදි අධිභාර කිරීමට විගණකාධිපතිවරයාට හැකිය.

- අධිභාරයන් පැනවීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුද්ගලයෙකුට , එයට එරෙහිව විගණන සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමට අයිතිවාසිකම් තිබේ. කොමිෂන් සභාව අවසාන තීරණය ගනු ලැබේ.

- වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කාලරාමු නියම කිරීම.

- රටේ උත්තරීතර විගණන ආයතනය ලෙස ජාතික විගණන කාර්යාලයක් පිහිටුවනු ලැබේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සියලු විගණන කාර්ය මණ්ඩලය ජාතික විගණන කාර්යාලයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

- ජාතික විගණන කාර්යාලය විගණනය කිරීමට සුදුසුකම්ලත් ස්වාධීන විගණකවරයෙකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

- මේ පනත මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම් නියම කරනු ලැබේ.

- අභ්‍යන්තර විගණනයේ පැවැත්ම සහ කර්තව්‍යන් මේ පනත මඟින් නිර්වචනය කරනු ලැබේ.

- ජනරජයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවධාරණය කර තිබේ.

- විගණන හා කළමනාකරණ කමිටුවල පැවැත්ම සහ ඒවායේ සඵල ක්‍රියාකාරීත්වය අවධාරණය කර තිබේ.

- විගණකාධිපතිවරයාට තොරතුරු සපයන පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කර තිබේ.

- විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් අවංක විශ්වාසයෙන් හෝ එකී අදහසින් යුක්තව සිදු කරනු ලබන කිසිදු කටයුත්තකින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉටු කරනු ලබන පූර්ව නීතිමය කටයුක්තකට එරෙහිව පැනනගින නීතිමය පියවරයන්ගෙන් ඔවුන් නිදහස් කරනු ලැබේ.

## අපගේ සංවිධාන සටහන

විගණකාධිපතිවරයා දෙපාර්තමේතුවේ ප්‍රධානියා වන අතර සියළුම වැටුප් හා දීමනා සහ පරිපාලනාත්මය කරුණු සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ තත්ත්වයෙහිලා සැලකේ. දෙපාර්තමේන්තුවේ වර්තමාන සංවිධාන ව්‍යුහය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත


කරනු ලැබ ඇති කාර්ය මණ්ඩලය හා අනුකූලවන පරිදි එක් එක් මට්ටම්වල රැඳුණු නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධූරාවලි මට්ටම් 4 කින් සමන්විත වේ.

පළමු මට්ටම අතිරේක විගණකාධිපතිවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් විසින් මධ්‍යම රජයේ හා පළාත් සභාවල විගණන කටයුතු සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනමය හා සංවර්ධන කටයුතු අධීක්ෂණය කරනු ලැබේ.

දෙවැනි මට්ටම ප්‍රධාන අංශ තිස් දෙකකින් සමන්විත වන අතර, නියෝජ්‍ය විගණකාධිපතිවරයෙකු හෝ සහකාර විගණකාධිපතිවරයෙකු හෝ එකී අංශයේ ප්‍රධානියා වේ. මෙම අංශ ප්‍රධානීන් වෙත පැවැරෙන විගණන "ශාඛා" වන්හි ප්‍රධානත්වය "ශාඛා ප්‍රධානී" ලෙස විගණන අධිකාරීවරයෙකු හෝ විගණන පරීක්ෂක සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකු විසින් දරන අතර ඔහුන්ට නිශ්චිත විගණිත ආයතන සංඛ්‍යාවක් පවරා ඇත. ඔවුන් තුන්වන මට්ටමට අයත් වේ. ඒ අනුව නිශ්චිත ලෙස තම අධීක්ෂණයට ගැනෙන විගණන ශාඛා ක්‍රියාත්මක විය යුතු ආකාරය කළමනාකරණය කිරීම හා අධීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වගකීම අංශ ප්‍රධානියාට පැවැරේ. ශාඛා ප්‍රධානීන් වෙත අනුයුක්ත කරනු ලැබ ඇති විගණන පරීක්ෂක සේවයේ සහයක ක්ෂේත්‍ර නිලධාරීන් කාර්යක්ෂමව හා ඵලදායීව සේවයේ යොදවා ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල විගණනයන් ක්‍රියාත්මක කරවීම අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහයවන එම ක්ෂේත්‍ර නිලධාරීන් සිව්වන මට්ටමට අයත් වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවන්ට හා පරිචයන්ට අනුකූල වන පරිදි පරීක්ෂණ, නිරීක්ෂණ සහ ක්ෂේත්‍ර ගමන් ආදිය සිය අනුමත වැඩ සටහන්වලට අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහය වේ. ඉහත සඳහන් දෙවැනි මට්ටමට අයත් වන ප්‍රධාන අංශ තිස් දෙකක අංශ ප්‍රධානීන්ගෙන් අංශ නවයක ප්‍රධානීන් ප්‍රාදේශීය මට්ටමින් එනම් බස්නාහිර, දකුණ, ඌව, සබරගමුව, උතුර, නැගෙනහිර, උතුරු මැද, වයඹ හා මධ්‍යම ප්‍රාදේශීය කාර්යාල භාරව කටයුතු කරති.

දිවයින පුරා පවතින විගණන උපකර්යාල මණ්ඩලයේ කොටසක් අනුයුක්ත වී සිටින අතර බහුතරයක් කාර්ය මණ්ඩලය කොළඹ ප්‍රදේශයේ අනුයුක්තව ඇත. 2015 සැප්තැම්බර් 30 දිනට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ව්‍යුහය යටතේ එක් එක් කාණ්ඩය අනුව අනුමත කාර්ය මණ්ඩලය පහත දැක්වේ.




විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය පිළිබඳ ඇගයීමකින් පසු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2011 නොවැම්බර් 14 දින අනුමත කර තිබූ නව අනුමත කාර්ය මණ්ඩලය අනුව ශ්‍රී ලංකා විගණන සේවාවේ මුළු නිලධාරීන් සංඛ්‍යාව 350 ක් ද, විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන් සංඛ්‍යාව 1200 ක්ද විය. නව අනුමත සේවක සංඛ්‍යා අනුව ශ්‍රී ලංකා විගණන සේවය සඳහා විශේෂ ශ්‍රේණියක් ඇති කර තිබූ අතර, එම ශ්‍රේණිය අතිරේක විගණකාධිපති තනතුරු 03 කින් සමන්විත විය. මෙම අතිරේක විගණකාධිපති තනතුරු තුන ඇතුළත්ව නව කාර්ය මණ්ඩලය, නියෝජ්‍ය විගණකාධිපති තනතුරු 8 කින්ද, සහකාර විගණකාධිපති තනතුරු 30 කින්ද, විගණන අධිකාරී තනතුරු 70 කින් ද, විගණන පරීක්ෂක සේවයේ තනතුරු 121 කින්ද වැඩි කර තිබුණි.

මේ අවස්ථාව වන විට ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව පිළියෙල වෙමින් පැවති අතර එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යන ආයතනවල එකඟතාවය ඇතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012 නොවැම්බර් මාසයේදී අනුමත කර තිබුණි. එම සේවා ව්‍යවස්ථාව සඳහා

අමාත්‍ය මණ්ඩල නිශ්කාෂණය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිණිස ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණද, එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම විවිධ හේතු නිසා ප්‍රමාද වෙමින් පැවතුණි. නව සේවා ව්‍යවස්ථාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කිරීමත් සමඟ එය ක්‍රියාත්මක විය යුතු වුවත්, ඉහත සඳහන් පරිදි අමාත්‍ය මණ්ඩල නිශ්කාෂණය ලැබීම ප්‍රමාද වීම නිසා ඒ වනවිට ඇතිවී තිබූ පුරප්පාඩු පිරවීමට නොහැකි විය.

එම තත්ත්වය යටතේ 2014 වර්ෂය ආරම්භයේ හා අවසානයට හා 2015 ජූනි 30 දිනට දෙපාර්තමේන්තුවේ ඒ ඒ තනතුරුවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි විය.

| තනතුර | 2014 ජනවාරි 01 දිනට | | | 2014 දෙසැම්බර් 31 දිනට | | | 2015 ජූනි 30 දිනට | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය | පුරප්පාඩු | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය | පුරප්පාඩු | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය | පුරප්පාඩු |
| අතිරේක විගණකාධිපති | 03 | - | 03 | 03 | 03* | - | 03 | 03* | - |
| නියෝජ්‍ය විගණකාධිපති | 15 | 06 | 09 | 15 | 12 | 03 | 15 | 12 | 03 |
| සහකාර විගණකාධිපති | 44 | 32 | 12 | 44 | 21 | 23 | 44 | 20 | 24 |
| විගණන අධිකාරී | 288 | 172 | 116 | 288 | 175 | 113 | 288 | 174 | 114 |
| විගණන පරීක්ෂක | 1200 | 815 | 385 | 1200 | 791 | 409 | 1200 | 1085 | 115 |

* වැඩ බැලීමේ පදනම මත අතිරේක විගණකාධිපති තනතුරට උසස් කර ඇත.

ඉහත සඳහන් පරිදි දෙපාර්තමේන්තුවේ සෑම තනතුරකම කාර්ය මණ්ඩල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම ඉටු කිරීමට බාධාවක් බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දීමෙන් පසු 6/2006 චක්‍රලේඛය අනුව අනුමත නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන ඉදිරි දිනයක් දක්වා එතෙක් ක්‍රියාත්මකව පැවති සේවා ව්‍යවස්ථාවේ වලංගු කාලය දීර්ඝ කරන ලදී. ඒ අනුව ඉහත පුරප්පාඩු සඳහා ද බඳවාගැනීම් කටයුතු කිරීමට අවස්ථාව සැලසිණි. ඒ අනුව එවකට පුරප්පාඩුව පැවති නියෝජ්‍ය විගණකාධිපති තනතුරු 08 ක්ද, සහකාර විගණකාධිපති තනතුරු 20 ක්ද 2014 වර්ෂයේදී පිරවීමට හැකි විය. එසේ නියෝජ්‍ය විගණකාධිපති තනතුරුවලට සහකාර විගණකාධිපතිවරුන් උසස්වීම හා විශ්‍රාම ගැනීම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩු 13 ක් හා නියෝජ්‍ය විගණකාධිපතිවරුන් දෙදෙනෙකු විශ්‍රාම ගැනීම නිසා ඇතිව තිබූ පුරප්පාඩු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් ලැබූ නිලධාරීන් නිර්දේශ කරමින් අනුමැතිය සඳහා 2015 මැයි මාසයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලදි. එසේ වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනය අනුව, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන හා මූල්‍ය බලතල විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරීමත්, එම කොමිෂන් සභාව ස්ථාපනය කරන තුරු එම කටයුතු අමාත්‍ය

මණ්ඩලය වෙත පැවරී තිබීමත් නිසා ඉහත පත්වීම් සඳහා අනුමැතිය ලබාගැනීම පිණිස මේ වනවිට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

අනුමත කාර්ය මණ්ඩලයේ අතිරේක විගණකාධිපති තනතුරු 03 කඩිනමින් පිරවීමේ අවශ්‍යතාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හඳුනා ගැනීමෙන් පසු එම තනතුරු වැඩ බැලීමේ පදනමෙන් පිරවීම සඳහා අනුමැතිය දී තිබුණි. එසේම එම තනතුරු පුරප්පාඩු ස්ථිර පදනමෙන් පිරවීමට විධිවිධාන සැලසෙන පරිදි දැනට ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලැබී තිබූ අනුමැතිය හා උපදෙස් පරිදි කටයුතු කරමින් එම විධිවිධාන ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව, එම තනතුරු ස්ථිර ලෙස පිරවීමට පියවර ගෙන ඇත.

විගණන පරීක්ෂක සේවයේ 2013 දක්වා වූ පුරප්පාඩු 316 පිරවීම සඳහා 2014 මාර්තු 28 දින ගැසට් පත්‍රයේ පල කිරීම මඟින් අයදුම්පත් කැඳවන ලද අතර එම තරඟ විභාගය 2014 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලදි. එම විභාග ප්‍රතිඵල 2015 මාර්තු මාසයේදී නිකුත් වී තිබූ අතර සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් එම මාසයේදීම සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ සුදුසුකම් සපුරා සිටි එම අයදුම්කරුවන් 2015 අප්‍රේල් 22 දින සිට විගණන පරීක්ෂක තනතුරුවලට පත් කරන ලදී.

## සේවා ව්‍යවස්ථාව පිළියෙල කිරීම

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන්ගෙන් හා විගණන පරීක්ෂකවරුන්ගෙන් සමන්විත වේ. එවකට පැවති තත්ත්වය අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව මෙම සේවාවන් දෙක සඳහා වෙන වෙනම සේවා ව්‍යවස්ථාවන් පිළියෙල කරනු ලැබුවත් ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයෙන් වූ විවිධ යෝජනා හා ඉල්ලීම් පිළිබඳව තවදුරටත් සළකා බැලීම සඳහා ජනාධිපති ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව විගණකාධිපතිවරයාගේ සභාපතිත්වයෙන් හා හිටපු විගණකාධිපතිවරුන් දෙදෙනෙකු හා ජනාධිපති අතිරේක ලේකම්වරයෙකුගේ සාමාජිකත්වයෙන් සමන්විත විය. එම කමිටු නිර්දේශ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය යන සේවාවන් දෙක ඒකාබද්ධ කර "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" නමින් නව සේවයක් ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014 දෙසැම්බර් 23 දින අනුමැතිය ලබාදී තිබුණි.

එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවය හා විගණන පරීක්ෂක සේවය ඒකාබද්ධ කර, ස්ථාපනය කිරීමට යෝජනා කර තිබූ "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය" පිහිටුවීම රජය ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන තිබුණි. ඒ අනුව නව සේවාව සඳහා සේවා ව්‍යවස්ථාවක් පිළියෙල කෙරෙමින් පවතින අතර එමඟින් විගණකාධිපතිවරයා වෙත පැවරෙන කාර්යයන් හා කර්තව්‍යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු

කිරීම සඳහා වඩාත් පුළුල් වෘත්තීය මට්ටමේ කාර්ය මණ්ඩල පවත්වා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. එසේම, නව සේවාවේ පත්වීම් හා විනය බලධාරියා විගණන සේවා කොමිෂන් සභාව බැවින් ප්‍රමාදයකින් තොරව එම කටයුතු ඉටු කිරීමට හැකිවීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට පිටිවහලක් වනු ඇත.

## කාර්ය මණ්ඩල පුහුණුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව තම කාර්ය මණ්ඩලයෙහි වෘත්තීය හා තාක්ෂණික කුසලතා වර්ධනය කිරීමට හා ගණකාධිකරණ හා විගණන පරිසරයේ වෙනස්කම් හා අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා අඛණ්ඩව පුහුණුව ලබා දෙනු ලැබේ. ඵලදායි හා ප්‍රතිඵල දායක පුහුණු වැඩසටහන් පැවැත්වීමේ අරමුණින් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙනමම පුහුණු මධ්‍යස්ථානයක් (රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය) රාජ්‍ය අංශ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකුව මඟින් සපයන ලද රු.මිලියන 150 ක අරමුදල් භාවිතා කර රත්නපුර පිහිටුවන ලදි. එය 2014 ඔක්තෝබර් 29 දින ගරු කථානායකතුමා විසින් අභිනවයෙන් විවෘත කරන ලද අතර මෙම අවස්ථාවට රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ ගරු සභාපති, විගණකාධිපති, හිටපු විගණකාධිපතිවරුන් හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහභාගී වූහ. මෙම පුහුණු මධ්‍යස්ථානය පරිගණක විද්‍යාගාරයක්, පුස්තකාලයක් දේශන ශාලාවක්, නේවාසිකාගාර සංකීර්ණයක් හා පුහුණු කටයුතු වඩා කාර්යක්ෂමව හා ඵලදායිව කරගෙන යාමට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් වලින්ද පරිපූර්ණ වේ.

රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි සමාරම්භක පුහුණු සැසිය ලෙස පළාත් පාලන ආයතනවල මූල්‍ය විගණන ක්ෂේත්‍රය සම්බන්ධව සේවස්ථ පුහුණු සැසියක් පැවැත්විණි. පළාත් පාලන ආයතන සඳහා පරිගණක පුහුණු වැඩසටහන්, නවක විගණන පරීක්ෂකවරු සඳහා අනුස්ථාපන පුහුණු වැඩසටහනක්, පළාත් පාලන ආයතන සඳහා නව මූල්‍ය විගණන ක්‍රමවේදය, දෙමළ භාෂා ප්‍රවීනතා වැඩසටහන්, ආසියානු සංවර්ධන බැංකු අරමුදල් ව්‍යාපෘතිවලට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා සිවිල් ඉදිකිරීම් සම්බන්ධ පුහුණු වැඩසටහන් යනාදිය සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානයේදී කරන ලද ප්‍රධාන සේවස්ථ පුහුණු වැඩසටහන් වේ. මෙම සියලු පුහුණු වැඩසටහන් කාර්ය මණ්ඩලයේ ශාරීරික හා මානසික යෝග්‍යතාව උසස් කිරීමද සළකා බලා සැලැසුම් කර තිබේ. එමනිසා ඒ තුළ උදෑසන ශාරීරික ව්‍යායාම, භාවනාවන්, කණ්ඩායම් හැඟීම ගොඩනැගීම හා නායකත්ව දක්ෂතා වර්ධන ක්‍රියාකාරකම් මෙන්ම පුද්ගල සංවර්ධන ක්‍රියාකාරකම්ද ඇතුළත් වේ.

2011 වර්ෂයේ ආරම්භ කරන ලද නව විගණන ක්‍රමවේදය දෙපාර්තමේන්තුව තුළ ව්‍යාප්ත කිරීමේ වැඩසටහන 2014 වර්ෂයේදීද ක්‍රියාත්මක විය. ඒ අනුව දින 06 ක මූල්‍ය විගණන ක්‍රමවේදය නිලධාරීන් 83 ක් සඳහාද, තෙදිනක කාර්යසාධන විගණන ක්‍රමවේදය නිලධාරීන් 30 ක් සඳහා සමාලෝචිත වර්ෂය

තුළ පවත්වන ලද අතර නව විගණන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු විසඳීමේ පුහුණු වැඩසටහන් මේ අතරතුර පවත්වනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන්වල විස්තරයක් පහත දක්වා ඇත.

| **පුහුණු ක්ෂේත්‍රය** | **පුහුණු කරන ලද නිලධාරීන් ප්‍රමාණය** | **පුහුණු පැය ගණන** |
|---|---|---|
| මූල්‍ය විගණනය | 442 | 7,809 |
| ප්‍රසම්පාදන හා සිවිල් ඉදිකිරීම් | 40 | 1,600 |
| කාර්යසාධන විගණනය | 30 | 720 |
| නවක විගණන අධිකාරීවරුන් සඳහා අනුස්ථාපන වැඩසටහන | 35 | 1,680 |
| පළාත්පාලන ආයතන-මූල්‍ය විගණනය | 300 | 2,400 |
| **එකතුව** | **847** | **14,209** |

## සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීම

පවතින පුරප්පාඩු හේතුවෙන් වූ සම්පත්වල පරතරය පියවා ගැනීම සඳහා රාජ්‍ය බැංකු විගණනය වැනි විශේෂ අවස්ථාවලදී අවශ්‍ය වන විශේෂිත සේවා සඳහාද සුදුසුකම්ලත් විගණකවරුන් සේවයෙහි යොදවා ගැනීම අවශ්‍ය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 ව්‍යවස්ථාව මගින් සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීමට විගණකාධිපතිවරයාට බලතල පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ විගණන ගාස්තු කමිටුවේ අනුමැතිය මත අදාල විගණිත සමාගම්වලට ඔවුන් සපයන ලද විගණන සේවා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා මුළු එකතුව රු. මිලියන 32.47 ක් හා 2013 වර්ෂය සඳහා රු. මිලියන 33.09 ක්ද ගෙවා තිබුණි. සුදුසුකම්ලත් විගණකවරුන් සේවයේ යොදවා ගැනීමේදී ඔවුන් විසින් පෙර සපයා තිබූ සේවාවන්හි තත්ත්වය, සමාගමේ සිටින හවුල්කරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සමඟ සේවයේ යෙදී සිටින විගණන පුහුණුවන්නන් සංඛ්‍යාව සමාගමේ ප්‍රමිතිය දැක්වීමේ කරුණක් වශයෙන් ඔවුන්ගේ ජාත්‍යන්තර සම්බන්ධතාවය, ඔවුන් සළසන වෘත්තීය සේවාවන්වල තත්ත්වය ආදී කරුණු ඔවුන් තෝරා ගැනීමේ නිර්ණායකයට ඇතුළත්වී තිබුණි.

සාමාන්‍යයෙන් එක් විගණන සමාගමකට උපරිම වර්ෂ 05 ක කාලයක් සඳහා අඛණ්ඩව එක් විගණන කාර්යභාරයක් පවරනු ලැබේ. එම විගණන සමාගමට එම විගණන කාර්යභාරය යළි පැවරිය හැකි වන්නේ අවම වශයෙන් වර්ෂ 05 ක කාලයක් ඉකුත්වීමෙන් පසුව පමණකි.

ප්‍රධාන රාජ්‍ය වාණිජ බැංකු 03 ක ශාඛාවන් ඇතුළත්ව 2014 හා 2013 වර්ෂවලදී ආයතන 174 ක විගණන පැවරුම් සිදු කිරීමට මට සහායවීම සඳහා 2014 හා 2013 වර්ෂයන් සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින විගණන සමාගම් පිළිවෙලින් 135 ක හා 158 ක සේවය ලබා ගෙන තිබුණි.

## රාජ්‍ය ගිණුම් කාරක සභාවට හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට සහායවීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 හා 126 යටතේ පිළිවෙලින් රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) පිහිටුවා ඇත. රාජ්‍ය ගිණුම් කාරක සභාවේ මූලික අරමුණ වන්නේ රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතනවල කාර්යක්ෂමතාවය හා මූල්‍ය විනය සියුම්ව පරීක්ෂා කිරීම වන අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අරමුණ වන්නේ රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් රාජ්‍ය ව්‍යාපාරවල ගිණුම්, අයවැය හා ඇස්තමේන්තු මූල්‍ය පරිපාටීන්, කාර්යසාධනය සහ කළමනාකරණය පිළිබඳ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම වේ.

මෙම කමිටු දෙක මගින් විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන වාර්තා සමාලෝචනයට ලක් කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී විගණකාධිපතිවරයා විසින් සාකච්ඡාවලදී පැනනැගුණ කරුණු සම්බන්ධයෙන් යම් මඟ පෙන්වීමක් ලබා දෙනු ලැබේ. මෙම කමිටු විසින් රාජ්‍ය ආයතනවල වගකිව යුතු නිලධාරීන් වෙතින් අදාළ සාක්ෂි ලබා ගැනෙන අතර අරමුදල් යෙදවීම සම්බන්ධව කළමනාකරණයට අවශ්‍ය රෙකමදාරු කිරීම් සිදු කෙරේ. මෙම කාරක සභා දෙක මගින් ඔවුන්ගේම වාර්තා දෙකක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ. රාජ්‍ය ගිණුම් හා පොදු ව්‍යාපාර කමිටුවලට සහාය දැක්වීමක් වශයෙන් විගණකාධිපතිවරයාගේ වගකීම වන්නේ රාජ්‍ය ආයතන ඉහළ ගුණාත්මක මට්ටමකින් පාලනය කිරීම, තත්ත්වයන් තක්සේරු කිරීම සහ රාජ්‍ය වගවීම තහවුරු කිරීම සම්බන්ධ කරුණු පරීක්ෂා කිරීම වේ.

විගණකාධිපතිවරයා විසින් සභාගත කරනු ලබන වාර්තා අඛණ්ඩව සාකච්ඡාවට ලක් කිරීම මෙම කමිටු දෙක විසින් අඛණ්ඩව සිදු කරනු ලබන අතර සම්පත් කළමනාකරණය කිරීම පිළිබඳ අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගෙන් ඒ සඳහා අවශ්‍ය සාක්ෂි ලබා ගැනීම සිදු කරනු ලැබේ.

2014 වර්ෂය මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ලක් කළ යුතු වර්ෂයක් වන අතර එහිදී රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් රාජ්‍ය ආයතන 105 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. මෙම තත්ත්වය අපගේ දෙපාර්තමේන්තුවට විශාල අභියෝගයක් වුවද, මා සහ මාගේ නිලධාරීන් ක්‍රියාකාරී බවින් යුතුව මේ සඳහා සම්බන්ධ වෙමින් රාජ්‍ය ආයතනවල කටයුතු ඉහළ මට්ටමින් පරීක්ෂා කිරීමට මෙම කමිටු සඳහා සහාය වී ඇත.

2014 වර්ෂයේදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 44 ක කටයුතු පරීක්ෂාවට ලක්කර රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කටයුතු ඉටු කිරීමට විගණකාධිපතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සහාය දැක්විය.

ඉහත පාර්ලිමේන්තු පාලන කමිටු දෙකකට සහභාගීවීම හැරුණු කොට පළාත් සභා 09 ක විගණන කටයුතු කරන සහකාර විගණකාධිපතිවරු පළාත් සභා යටතේ වන ආයතනයන්හි කටයුතු පරීක්ෂා කිරීම

සඳහා පළාත් සභා ගිණුම් කාරක සභාවලට සහාය දැක්වූහ. මෙම සන්දර්භය තුළ මාගේ නිලධාරීන් 2014 වර්ෂයේදී රැස්වීම් වාර 120 ක් සඳහා සහභාගි වී ඇත

## විගණකාධිපති විසින් පනවන ලද අධිභාර

ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ආයතන සංඛ්‍යාව 335 නක් වූ අතර, මහ නගර සභා 23 ක්, නගර සභා 41 ක් හා ප්‍රාදේශීය සභා 271 ක් ඊට අයත් විය. මෙම පළාත් පාලන ආයතන විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා අදාළ ආඥාපනත් සහ පනත්වල විධිවිධාන පරිදි විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

එකී ආඥා පනත් සහ පනත්වලින්, නීතියට පටහැනි ගෙවීම් විෂයයන්, නොසැලකිල්ල සහ විෂමාචාරය නිසා සිදුවූ පාඩු සහ ගිණුම්වල දැක්විය යුතු නමුත් දක්වා නැති විෂයයන් අධිභාර කිරීම සඳහා විගණකාධිපති වෙත බලය පවරා ඇත. ඉහත දී අධිභාර අය කිරීමේ ක්‍රියාවලිය නිසිපරිදි ක්‍රියාත්මක වුවද, අදාළ බලධාරීන් විසින් දැනට, අධිභාර අයකර ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි නිසි අවධානයක් යොමුකරන බව දක්නට නොමැත.

අධිභාර නිදහස් කිරීමේ බලය මහ නගර සභා හා නගර සභාවන්හි පළාත් පාලන විෂය භාර මධ්‍යම රජයේ අමාත්‍යවරයා වෙත ද ප්‍රාදේශීය සභාවල මධ්‍යම රජයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් වෙතද පැවරී ඇති බව නීතිපතිවරයාගේ අර්ථ දැක්වීම අනුව තහවුරු වේ.

එසේ වුවද, 2014 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ අධිභාරවලින් රු. මිලියන 6.73 ක් පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යවරුන් සහ පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නිදහස් කර තිබුණි. මේ අනුව, 2014 වර්ෂය තුළ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පාර්ශවකරුවන් 33 ක් වෙනුවෙන් රු.මිලියන 5.81 ක අධිභාර සහතික 07 ක් නිකුත් කර තිබූ අතර, එම මුළු මුදලම අයවිය යුතුව ඇත. 2014 වර්ෂය තුළදී පාර්ශවකරුවන් 178 ක් වෙනුවෙන් රු. මිලියන 294.75 ක් වූ අධිභාර නිවේදන 17 ක් නිකුත් කර ඇත.

## විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන කාර්යසාධන විගණනය

මූල්‍ය විගණනයට සමගාමීව තෝරාගත් විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් එක් එක් රාජ්‍ය ආයතනයන්ගේ කටයුතුවල ආර්ථිකබව, කාර්යක්ෂමබව, ඵලදායීබව හා පාරිසරික බලපෑමද ඇගයීමට ලක්කර අදාල විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් නිර්දේශයන් ඇතුළත්ව වාර්තා කිරීම කාර්යසාධන විගණනයෙන් කරනු ලැබේ.

2011 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් ලෙස කාර්යසාධන විගණන ඒකකය ක්‍රියාත්මක කරන අතර රාජ්‍ය ආයතන වල විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෙනත් විගණන ශාඛාවලින් ඉදිරිපත් කරනු ලබන යෝජනා හා මෙම කාර්යසාධන හා පරිසර විගණන ඒකකය මගින් තෝරා ගන්නා ලද විශේෂ ක්ෂේත්‍රයන්ට අදාල මාතෘකා මෙන්ම විගණකාධිපතිතුමා අවශ්‍ය යැයි තීරණය කරනු ලබන ක්ෂේත්‍ර ඔස්සේ කාර්ය සාධන හා පරිසර විගණන සිදු කරනු ලැබේ. තවද මූල්‍ය විගණන වාර්තාවන්ට අමතරව ඉදිරිපත් කරනු ලබන මෙම කාර්යසාධන හා පරිසර විගණන වාර්තාවන්ද පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන අතර මෙම ක්ෂේත්‍රයට අදාල දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීමද සිදු කරනු ලැබේ.

මෙම කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යඵල පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වන නමුත් ශ්‍රී ලංකාවේ දැනට කාර්ය ඵලය පදනම් කරගත් අයවැය ක්‍රමයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාලව විගණන නිර්ණායකයන් අප විසින් නිශ්චය කොට කාර්යසාධන විගණනය ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව විගණනයන් ක්‍රියාත්මක කර ඇති අතර සම්පූර්ණ කරන ලද කාර්යසාධන විගණන වාර්තා කීපයක් පිළිබද සාරාංශ ගත තොරතුරු පහත පරිදි වේ.

## ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු හා රාජ්‍ය අරමුදල් උපයෝජනය

1957 වර්ෂයේ ලංකා ගමනා ගමන මණ්ඩලය ආරම්භ කර ඉන්පසු කලින් කලට විවිධ අරමුණු සදහා සිදුකළ ව්‍යුහගත වෙනස්කම් ගණනාවකින් පසු මහජනතාව වෙත කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ඇති කිරීමේ අරමුණින් 2005 වර්ෂයේ දී ස්ථාපිත ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය දිවයින පුරා ඩිපෝ 120 ක්, ප්‍රාදේශීය කාර්යාල 12 ක්, ප්‍රාදේශීය වැඩපලවල් 11 ක් හා රියදුරු පුහුණු පාසල් 07 කින් සමන්විත වේ. 2012 වර්ෂය ආරම්භයේ ශ්‍රී ලංගම සතු බස්රථ ඇණිය 7,900 ක් පමණ වු නමුත් මෙයින් තථ්‍ය වශයෙන් ධාවනය වු බස්රථ ප්‍රමාණය බස්රථ 4,400 ක් හෙවත් සියයට 56 ක් පමණ විය. 2012 වර්ෂයේ දී ප්‍රවේශ පත්‍ර ආදායම රු. මිලියන 18,357 ක් පමණ වු අතර එම වර්ෂයේ දී භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් රු.මිලියන 1,508 ක මුදල සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව වුව ද, 2012 වර්ෂයේ දී අලාභය රු.මිලියන 2,458 ක් ලෙස වාර්තා විය.

ශ්‍රී ලංගම සම්බන්ධයෙන් සිදු කළ මෙම කාර්යසාධන විගණනයේ ඉහත සඳහන් ප්‍රධාන නිරීක්ෂණයන් අතර බස් රථ නිසි පරිදි නඩත්තු නොකිරීම, පෞද්ගලික බස්රථ ධාවනය මගින් ශ්‍රී ලංගමයට එල්ල වී ඇති බාධාවන්, ප්‍රාදේශිය වැඩපලවල දුර්වල කාර්යසාධනය, ඉහළ ඉන්ධන පිරිවැය කළමනාකරණය නොකිරීම, අසාර්ථක වු බස්රථ යථාතත්වයට පත් නොකර ගර්හිතකර අබලි බස්රථ ලෙස ප්‍රසිද්ධ

වෙන්දේසි කිරීම, ශ්‍රී ලංගමයට අමතර කොටස් මිලදී ගැනීමේදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානයන්ට පටහැනිව අදාල මිලදී ගැනීම් සිදු කිරීම, ශ්‍රී ලංගමයට ආදායම් ඉපැයිය හැකි විකල්ප ප්‍රභවයන් පිළිබඳ නිසි අවධානය යොමු නොකිරිම, පාරිසරික කරුණු පිළිබඳව සැලකිලිමත් නොවීම, ශ්‍රී ලංගමයට අයත් ඉඩම් ගොඩනැගිලි සහ දේපලවල අයිතිය සම්බන්ධ ගැටළුකාරි අවස්ථා තිබීම සහ ඒවා අවභාවිතයට ඉඩ හැරීම යන නිරීක්ෂණවලට අමතරව ශ්‍රී ලංගමයට අනුමත කාර්ය මණ්ඩලයක් නොවීම හා බඳවා ගැනීම් උසස් කිරීම් හා මාරු කිරීම් සඳහා නිසි ක්‍රමවේදයක් නොවීම, කාලීනව වැටුප් නොගෙවීම, සේවක අර්ථසාධක අරමුදලට කළ යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් කාලීනව නොගෙවීම, සේවක පාරිතෝෂිත ගෙවීම පමා කිරීම හා ඒ වෙනුවෙන් විශාල මුදලක් වාර්ෂිකව අධිභාර ලෙස ගෙවීමට සිදුවීම යන කරුණු ගණනාවක් හේතුවෙන් ශ්‍රී ලංගමයේ කාර්යසාධනය අවම මට්ටමක පැවතුණි. තවද ශ්‍රී ලංගමයේ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය මෙහෙයුම් වියදම් සඳහා ප්‍රමාණවත් අරමුදල් බොහෝ ශ්‍රී ලංගම ඩිපෝ වල නොමැති වීම හා ඒ සඳහා භාණ්ඩාගාරයේ මැදිහත් වීම නිතර අවශ්‍ය වීම මෙහි දී කැපී පෙණුනු නිරීක්ෂණයන් අතර විය.

## බෝතල් කළ හෝ ඇසුරුම්කළ පානීය ජලය නිෂ්පාදනය පිළිබඳ කාර්යසාධන විගණනය

බෝතල් කරන ලද පානීය ජල භාවිතය වර්තමානයේ සීඝ්‍ර ලෙස වැඩි වී ඇති අතර, අධික නාගරීකරණය, කාර්මීකරණය, ජනගහන වර්ධනය, පාරිභෝගික ඉල්ලීමේ වෙනස්වීම්, පානයට සුදුසු ගෘහස්ථ ජලය සපයා ගැනීමේ ගැටළු යන කරුණු හේතුකොටගෙන ශ්‍රී ලංකාව තුළ සුලභ සම්පතක් ලෙස පවතින ජලය, බෝතල් කොට නව මුහුණුවරකින් වෙළඳපලට ඉදිරිපත් කිරීම ආරම්භ විය.

පානීය ජලය බෝතල් කිරීමේ නිෂ්පාදන ආයතන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නීතිමය අවසරය ලබාදෙන රාජ්‍ය ආයතනය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන පරිපාලන ඒකකය පිළිබඳව ද අදාල ජල ප්‍රභවය පිහිටා ඇති ප්‍රදේශයේ සෞඛ්‍ය බලධාරින්ගේ කාර්ය භාරය පිළිබඳවද මෙහිදී සළකා බලනු ලැබීය.

1980 අංක 26 දරන ආහාර පනතට අනුව ජලය ආහාරයක් ලෙස හඳුන්වා දී ඇත. ජලය, මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු ආකාරයට පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන පරිපාලන ඒකකය විසින් හඳුන්වාදී ඇති ආරක්ෂිත ක්‍රමවේදයට අනුව ක්ෂුද්‍ර ජීවින් මඟින් සිදුවිය හැකි ආහාර විෂවීම් වැළැක්වීම සඳහා හොඳ සෞඛ්‍ය පුරුදු මෙන්ම නිෂ්පාදන අවස්ථාවේ සිට පරිභෝජන අවස්ථාව දක්වා ආහාර දාමය නිසි පරිදි සැලැසුම් කිරිම අපේක්ෂා කරනු ලැබේ. රසායනවේදී ආරක්ෂාව සඳහා විෂ රසායනික ද්‍රව්‍ය මඟින් ආහාරවලට සිදුවිය හැකි හානි වැලැක්වීමට අපේක්ෂා කරනු ලැබේ. භෞතික ආරක්ෂාව පිළිබඳ කටයුතු ඒවා නිෂ්පාදනය, ගබඩාකිරීම, ප්‍රවාහනය, වැඩ අතරතුර හෝ

ඇසුරුම්කරන අවස්ථාවේදී සිදුවිය හැකිය. පාරිභෝගිකයා නොමග යැවීම සිදු නොවන ආකාරයට අවශ්‍ය කරන තොරතුරු ලේබල් කිරීම, අව්‍යංකව ඉදිරිපත් කිරීම යටතේ අපේක්‍ෂා කරනු ලැබේ.

මෙම විගණනයේ ප්‍රධාන අරමුණ වූයේ ඉහත අවශ්‍යතා සැලකිල්ලටගෙන ගුණාත්මක බෝතල් කළ ජලය නිෂ්පාදනය සම්බන්ධයෙන් අදාල රාජ්‍ය ආයතන සතුටුදායක ලෙස මැදිහත් වීමේ කාර්යසාධනය ඇගයීම විය. බෝතල් කළ පානීය ජල නිෂ්පාදන කර්මාන්තය සඳහා පවත්නා නීති රීති නිසිලෙස ක්‍රියාත්මක නොවීම, අනුමත ලියාපදිංචිය ඉක්මයාම හා නියමිත කාල සීමාව තුළදී අළුත් කිරීම් සිදු නොකිරීම, ප්‍රමාණවත් අධීක්‍ෂණයක් සිදුනොකිරීම, වලංගු ලියාපදිංචියකින් තොරව ජල බෝතල් ආනයනය කිරිම, ගුණාත්මක ජල බෝතලයක තිබිය යුතු සංරචකයන් අපේක්ෂිත ප්‍රමාණයෙන් වෙනස් වීම හා ආනයනය කරන ලද ජල බෝතල් පිළිබඳව නිසි ආකාරයේ අධීක්‍ෂණයක් සිදුනොකිරීම, වැනි කරුණු විගණන නිරීක්‍ෂණයන් අතර විය.ඒ අනුව වෙළඳපල නිසි අධීක්ෂණයක් හා අහඹු පරීක්ෂාවක් මගින් අනාවරණය කරගනු ලබන දුර්වල නිෂ්පාදන සම්බන්ධයෙන් අදාල නීතිය ක්‍රියාත්මක කිරීම මගින් මෙම ක්ෂේත්‍රයේ දුර්වලතා මගහැර ගත හැක.

## මොටර් වාහන සම්බන්ධයෙන් වායු විමෝචන ප්‍රමිති සඳහා වාර්ෂික අනුකූලතා සහතික ලබාදීමේ වැඩසටහන

පොසිල ඉන්ධන භාවිතය නිසා කාබන් මොනොක්සයිඩ්, නයිට්‍රජන් ඩයොක් සයිඩ්, සල්පර් ඩයොක්සයිඩ් ඇතුළු වායු වර්ග වායුගෝලයට මුදාහැරීම ඉහළ ගොස් තිබීම වායුගෝලීය සාමාන්‍ය උෂ්ණත්වය ඉහළ යාමට බලපා ඇත.

මේ නිසා නියමිත ප්‍රමිතීන්ට අනුව වාහන නඩත්තු කිරීමෙන් ඉන්ධන භාවිතයේ කාර්යක්‍ෂමතාව ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම, පරිසරයට පොසිල ඉන්ධන මගින් එකතුවන විෂ වායු ප්‍රමාණය අවම කර යහපත් පරිසරයක් පවත්වාගෙන යාමේ සමාජ වගකීම ඉටුකිරීම සඳහාත් අවශ්‍යයෙන්ම ගත යුතුව තිබූ ක්‍රියා මාර්ගයක් වශයෙන් මෝටර් වාහන සඳහා වායු විමෝචන වැඩ සටහන 2008 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආරම්භ කර ඇත.

මෙම වායු විමෝචන වැඩසටහනේ ප්‍රධාන කාර්ය භාරය මධ්‍යම පරිසර අධිකාරිය හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින්ද, පරීක්ෂණාගාර පහසුකම් හා දත්ත තොරතුරු සැපයීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින්ද, සිදු කරනු ලැබේ.

වායු විමෝචන වැඩසටහනේ කටයුතු සඳහා අරමුදලක් 2010 වර්ෂයේ මාර්තු මාසයේ පිහිටුවා ඇත. 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ රු. මිලියන 108.12 ක අතිරික්තයක් හා රු.මිලියන 326.91 ක් මහා භාණ්ඩාගාරයේ ආයෝජනය කර රු. මිලියන 36.50 ක පොලී ආදායමක් ලබාගෙන තිබුණි. වායු විමෝචන අරමුදල පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පත් කර නොතිබුණි. තවද වායු විමෝචන පරීක්ෂණ සිදුකරන සමාගම් 02 විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු මුදල් වෙනුවෙන් ගෙවිය යුතු දඩ මුදල් සම්බන්ධ තොරතුරු පවත්වා නොතිබුණි.

වායු විමෝචන පරීක්ෂණ පවත්වන සමාගම් දෙක විසින් බස්නාහිර පළාත තුළ පරීක්‍ෂණ මධ්‍යස්ථාන 61 පිහිටුවා තිබූ නමුත් 1980 අංක 47 දරන මධ්‍යම පාරිසරික අධිකාරිය පනතේ විධිවිධාන ප්‍රකාර බලපත්‍ර ලබා ගත් මධ්‍යස්ථාන සංඛ්‍යාව 16 ක් පමණක් විය.

අදාල පනත යටතේ ආදායම් බලපත්‍ර ලබාගැනීමේදී වායු විමෝචන සහතික ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද, බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයට අදාලව නිරීක්ෂණය වූ අඩුපාඩු අතර, ඇතැම් වාහන කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව එම අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම හා එම සහතික ඇතුළුව අනෙකුත් ආකෘති පත්‍ර පිළිබඳ පාලනය සතුටුදායක නොවීම සම්බන්ධව කරුණු අනාවරණය විය.

වායු විමෝචන අරමුදල විසින් පහත සඳහන් අංශයන් හී පවත්නා අඩුපාඩු නිවැරදි කර ගැනීම අවශ්‍ය වේ.

- මෝටර් වාහන පරීක්ෂා කිරීමට සුදුසු ගරාජ හදුනා ගැනීම සහ ඒවාට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.
- එම ගරාජ් නිසි විමර්ශනයට භාජනය කිරීම.
- ජංගම පරීක්ෂාවන් විධිමත් කිරීම.
- අරමුදලේ තොරතුරු නිවැරදිව පවත්වා ගැනීම.
- වායු විමෝචන සහතික ව්‍යාජව ලබා ගතහැකි බවට පවත්නා මතය පිටු දැකීම.

## මැද පෙරදිග රැකියා සඳහා විදේශගතවන ශ්‍රමිකයන්ට ඇතිවන ගැටළු සම්බන්ධව මැදිහත්වන රාජ්‍ය ආයතනවල කාර්යසාධනය ඇගයීම.

මිලියන 20.5 ක් පමණ වන සමස්ථ ශ්‍රී ලංකා ජනගහනයෙන් මුළු ශ්‍රම බලකාය මිලියන 8.8 ක් වේ. මෙම ශ්‍රම බලකාය අනුපාතයක් ලෙස සියයට 95.6 ක් සේවා නියුක්ති පිරිස වන අතර සේවා වියුක්ති අනුපාතය

සියයට 4.4 වේ. ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතය පුරුෂ සියයට 6.6 කින්ද, ස්ත්‍රී සියයට 3.2 කින්ද වැඩිවී ඇත. මේ තත්ත්වය යටතේ රැකියා අපේක්ෂාවෙන් 2013 වසරේදී ශ්‍රමිකයන් 293,218 ක් විදේශ ගත වී ඇත. එයින් සියයට 48 ක් කාන්තාවන් විය. ගෘහ සේවය සඳහා විදේශ ගතවන සංඛ්‍යාවෙන් සියයට 93 කට වඩා වැඩි සංඛ්‍යාවක් මැදපෙරදිග රටවලට පිටත්ව යන බව නිරීක්ෂණය විය.මෙසේ විදේශ ගත වන සමස්ථ ශ්‍රී ලාංකිකයන් විසින් උපයන විදේශ විනිමයෙන් මැද පෙරදිග රටවල සේවය කරන විගමනිකයන් ඉපයූ විදේශ විනිමය සාමාන්‍ය වශයෙන් සියයට 55.6 ක් විය.

පසුගිය වර්ෂවල විදේශ රැකියා සඳහා පිටත්වීම සීඝ්‍ර වර්ධනයකින් සිදු වී තිබූ අතර, විදේශ ගතවන කාන්තාවන්ට ඇති වූ විවිධ ගැටළු සම්බන්ධව ලැබෙන පැමිණිලි ද වැඩිවෙමින් පැවතිණි. එම පැමිණිලි වල ඉදිරි කටයුතු සඳහා විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය මැදිහත් වී ක්‍රියා කරනු ලැබේ.

ලංකාවේ විදේශ විනිමයට ප්‍රබල දායකත්වයක් ලබාදෙන විගමණිකයන්ගේ ආරක්ෂාව සහ සුභ සිද්ධිය සඳහා ඔවුන් විදේශ රැකියාවට පිටත්වීමට පෙර සහ විදේශීය රැකියාවේ නිරත වීමේදී සහ ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුද ඔවුන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් අදාල රාජ්‍ය ආයතන කටයුතු කළයුතු වේ. විදේශ සේවා නියුක්ති කාර්යංශයට ලැබෙන පැමිණිලි, විදේශ ගත වූවන්ගෙන් සියයට 5 ක් පමණක් වුවද ඉන් බහුතරයක් ගෘහ සේවය සඳහා පිටත්වන කාන්තාවන්ගේ පැමිණිලි විය. මේ අතර ශාරීරික හා මානසික වද හිංසා , රැකියා ගිවිසුම් කඩකිරීම්, අදාල රටේ නීතියට පටහැනි ක්‍රියා සහ රැකියා සඳහා යෝග්‍යතාවයක් නොවීම යන කරුණු විශේෂත්වයක් ගන්නා අතර ඒ පිළිබද සොයා බලා කටයුතු කළ යුතු විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ අදාල තානාපති කාර්යාලවල මැදිහත් වීම ප්‍රමාණවත් නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලැබෙන බොහෝ පැමිණිලි විසදා තිබුණද, පැමිණිලි වලට අදාල සමහර ගොණු නොවිසදී තිබිය දී එම ගොනු වසා නැවත අළුත් පැමිණිල්ලක් ලෙස නව ගොනුවක් ආරම්භකර තිබුණි. ඇතැම් සිද්ධිවලට අදාල ගොනු අසම්පූර්ණ ඒවා වූ අතර පැමිණිලි විසදීම සඳහා නියෝජිතායතනවලින් ලැබෙන සහය ප්‍රමාණවත් නොවන අවස්ථා විය.

ශ්‍රමිකයන් විදේශ ගත වීමට පෙර ලබාදෙන පුහුණු වැඩ සටහන් වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. පුහුණුව ලබන අතරතුරේ දී කුඩා දරුවන් සිටින මව්වරුන් හා මානසික හා ශාරිරික ආබාධයන් ඇති පුද්ගලයන් හදුනා ගැනීමෙන් පසු එම ශ්‍රමිකයන් අසාදු ලේඛනයට ඇතුළත් කිරීම, විදේශ ගතවන ශ්‍රමිකයන් වෛද්‍ය පරීක්ෂණයට ලක්කිරීමේ දී ගැබ්ණිභාවය හදුනා නොගැනීම, රෝග ලක්‍ෂණ හදුනා නොගැනීම, ව්‍යාජ වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම, විදේශ ගත වීමට පෙර ඒ රටවල ඇති නිතීය හා

භාෂාව පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම යන කරුණු පිළිබඳ දැනුවත් කිරීම තවදුරටත් පුළුල් විය යුතුය.

ව්‍යාජ තොරතුරු සපයමින් ව්‍යාජ ගමන් බලපත්‍ර ලබාගෙන අඩු වයස් කාණ්ඩවල ශ්‍රමිකයින්ට විදේශ ගතවීමට ඉඩකඩ සැලසී තිබූ අතර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව යන ආයතන එක්ව දත්ත පද්ධතියක් මගින් සම්බන්ධ නොවීම නිසා මෙසේ ව්‍යාජ ගමන් බලපත්‍ර ලබාගැනීමේ හැකියාව ලැබී තිබූ අතර එමගින් නුසුදුසු පුද්ගලයින් විදේශගතවීමට ඉඩකඩ ලැබී තිබූ හෙයින් එම තත්ත්වය පාලනය කිරීම සඳහා අදාල ආයතනික කාර්යභාරය ශක්තිමත් කළයුතුය.

## ගුණාත්මක ආහාර ආනයනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනවල මැදිහත් වීම.

විවෘත ආර්ථික ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමත් සමඟම එතෙක් රාජ්‍ය මැදිහත් වීම යටතේ සිදු කරන ලද රටට අවශ්‍ය ආහාර ආනයනය කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික අංශයේ මැදහත්වීම කැපි පෙණුනි. මෙම ආනයනික ආහාරවල පරිභෝජනයට නුසුදුසු බව හා ගුණාත්මක තත්ත්වයෙන් අඩු වූ බව ජනමාධ්‍ය මගින් වරින් වර වාර්තා කර ඇත.

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ආහාර පරිභෝජනයට සුදුසු තත්ත්වයේ සහ නිසි ගුණාත්මක තත්ත්වයේ පවතී ද යන්න පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා කටයුතු කරනු ලබන ප්‍රධාන බලධාරියා වන්නේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වන අතර ආහාර බලධාරියා වන්නේ ලේඛ අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ. ආනයනිත ආහාර පරීක්ෂාව සම්බන්ධයෙන් සහාය දෙනු ලබන රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, වෛද්‍ය පර්යේෂණ ආයතනය යන ආයතන වල රසායනාගාරයන් මගින් ලැබෙන සහාය පිළිබඳ විවිධ ගැටළුද වාර්තා විය.

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් තොර පහත සඳහන් ආහාර ද්‍රව්‍ය වෙළඳපොලට නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය.

- 2011,2012 හා 2013 වර්ෂයන්හි දී අවස්ථා 10 ක දී ශ්‍රී ලංකාවට ආනයනය කළ මාළු තොග අතරින් නියමිත ෆෝමලින් ප්‍රමාණය ඉක්ම වූ මාළු තොග.
- 2013 වර්ෂයේදී අවස්ථා 5 ක දී නියමිත පරාසය තුළ අයඩීන් රසායනිකය නොවූ ලුණු තොග.
- 2013 වර්ෂයේදී අවස්ථා 3 ක දී ආනයනය කරන ලද මාළු තොග අතරින් ස්වායු පටකය අඩංගු වූ මාළු තොග.
- 2013 වර්ෂයේදී අවස්ථා 4 කදී කිරි වල අඩංගු විය යුතු නියමිත මේද ප්‍රමාණය නොවූ කිරිපිටි තොග.

- 2013 වර්ෂයේදී සැල්මොනෙල්ලා අඩංගු වීම හේතුවෙන් පරිභෝජනයට නුසුදුසු යැයි තීරණය වූ කුකුල් මස් පෙට්ටි 1,425 ක් හා ස්ටැෆිලොකොකස් අඩංගු වීම හේතුවෙන් පරිභෝජනයට නුසුදුසු යැයි තීරණය වූ දැල්ලන් බෑග් 4,768 ක්.
- කිරිපිටි හා සැමන් වලට අදාළ පරමාණුක බලශක්ති අධිකාරියේ නියමිත රසායනාගාර වාර්තා නොමැතිව 2012 හා 2013 වර්ෂයන්හිදී පිළිවෙලින් 39 ක් හා 83 ක් වූ ආහාර තොග බහාලුම්

වෙළඳපොලට නිකුත් කර ඇති බවත්, 2012 හා 2013 වර්ෂයන්හි ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පිළිවෙලින් මෙ.ටොන් 113,993 ක් හා 150,889 ක් වූ රතු පරිප්පු තොග නියමිත ප්‍රමිතිය තුළ පවතී දැයි තහවුරු කර ගැනීම සඳහා එක් අවස්ථාවකදී පමණක් රසායනාගාර පරීක්ෂාවන්ට යොමු කර තිබුණි.

ඊට අමතරව, 2012 හා 2013 වර්ෂයන්හිදී පිළිවෙලින් ලොකු ළූණු මෙ.ටොන් 145,912 ක් හා 168,874 ක්ද, අර්තාපල් මෙ.ටොන් 110,823 ක් හා 123,204 ක්ද, වශයෙන් ආනයනය කර තිබූ නමුත් ඒවා රසායනාගාර පරීක්ෂාවන්ට යොමු කර නොමැති බවත් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි රසායනාගාර උපකරණ නිරන්තර අළුත්වැඩියාවන්ට යොමු කිරීමට සිදුවීම, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ තාක්ෂණවේදීන් සහ ප්‍රමාණවත් රසායන විද්‍යාගාර පහසුකම් නොමැති වීම සහ ඇතැම් පරීක්ෂණ සඳහා පහසුකම් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සතුව නොමැති වීම හේතුවෙන් ආනයනය කරන ලද ආහාර වෙළඳපොළට නිකුත් කිරීමේදී ප්‍රමාදයක් උද්ගත වී තිබූ බව අනාවරණය විය.

## විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

කළමනාකරණ පාලනය පිළිබඳ පැවරුමක් ඇති පුද්ගලයින්, සේවකයන් හෝ තුන්වන පාර්ශ්වයන් අතරින් පුද්ගලයන් එක් අයෙකු හෝ වැඩි දෙනෙකු විසින් අසාධාරණ හෝ නීති විරෝධී වාසියක් ලබා ගැනීම සඳහා රැවටීම් ප්‍රයෝජනයට ගන්නා වූ චේතනාත්මක ක්‍රියාවන් සම්බන්ධ අවදානම, වෙත මූලික අවධානය යොමුකර විමර්ශන විගණනය ක්‍රියාත්මක වන අතර එහිදී විමර්ශන විගණනය විසින් වංචා වැලැක්වීම, අනාවරණය කර ගැනීම පිණිස පද්ධති සවිබල ගැන්විය හැක්කේ කෙසේද යන්න පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීමක් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ යහපාලන සංකල්පයට ප්‍රමුඛත්වය ලබාදෙමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුකම ව්‍යවස්ථාව 19 සංශෝධනය මගින් විගණකාධිපති දෙපාර්තමේන්තු බලගැන්වීම සඳහා ක්‍රියාකිරීම තුල රාජ්‍ය යහපාලනය ඇති කිරීමට සහාය වීමට දෙපාර්තමේන්තුව විසින් විශේෂයෙන්

විමර්ශන විගණන අංශයේ සිටි කාර්ය මණ්ඩලය 08 සිට 20 දක්වා සියයට 150 කින් වැඩි කිරීමෙන් හා භෞතික සම්පත් වැඩි කිරීම තුලින් විමර්ශන අංශයේ ධාරිතාව ප්‍රවර්ධනය කිරීමට දැනටමත් ක්‍රියාකර ඇත.

විමර්ශන විගණන අංශය විසින් පසුගිය කාලයේ ආන්දෝලනාත්මක සිද්ධින් වු සහනාධාර පොහොර භාවිතය, වන අලින් නීති විරෝධීව පුද්ගලික සංතකයේ තබා ගැනීම්, වන අලි ගම් වැදීම පාලනය කිරීම සඳහා විදුලි වැටවල් ඉදිකිරීම, වී මිලදී ගැනීමේ හා ගබඩා කිරීමේ දුර්වලතා, පාසල් පද්ධතියේ අවිධිමත් මුදල් පාලනය හා පාසල් ළමුන්ගෙන් අවිධිමත් ලෙස මුදල් අය කිරීම්, පැල්පත් වාසීන්ට නාගරික සංවර්ධන අධිකාරියේ තට්ටු නිවාස ඉදිකිරීම් හා නිවාස ලබාදීම්, මැතිවරණ කටයුතු සඳහා රාජ්‍ය දේපළ අවභාවිතය හා ඛණිජ තෙල් නිෂ්පාදන ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අවභාවිතයන් පිළිබඳ පරීක්ෂා කර වාර්තා කරන ලදී.

ඉහත නිරීක්ෂණයන් සම්බන්ධයෙන් රු.බිලියන 13.86 ක වියදම් පරීක්ෂණයට ලක් කර ඇති අතර වත්කම් අවභාවිතා කිරීම, අක්‍රමිකතාවන්ගේ හෝ නීතිරීති වලට පටහැනි ගනුදෙනුවල වටිනාකම ලෙස රු.බිලියන 12.85 ක් නිරීක්ෂණය කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත මහජන නියෝජනයන් 806 ක් ලැබී තිබුණු අතර ඒවා පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අදාළ අංශ අතර බෙදාහරින ලදී. එයින් විශේෂ වු නියෝජන 87 ක් විශේෂ විමර්ශන අංශය වෙත යොමු කර තිබුණු අතර එයින් වැදගත් නියෝජන 30 ක් හා රු. බිලියන 4.12 ක වියදමක් පරීක්ෂා කිරීමේදී රජයට සිදුවු ඇස්තමේන්තුගත අලාභය රු.බිලියන 3.77 ක් ලෙස නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දී සිදුකළ විමර්ශනයන්ට අදාළ වැදගත් නිරීක්ෂණයන් සාරාංශ ගතකර පහත දක්වා ඇත.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය

කාර්යංශය 2013 හා 2014 කාලය තුළදී කළ ගනුදෙනු නියැදි පරීක්ෂාවේදී කූඨ ලේඛන පිළියෙල කර මුදල් වංචා කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කටයුතු කිරීම, අවිධිමත් හා වැඩියෙන් ගෙවීම් තුළින් අලාභ කිරීම, දේශපාලන හා පෞද්ගලික කටයුතු සඳහා මුදල් අවභාවිතා කිරීම, රූපවාහිනී දැන්වීම් හා වැඩසටහන් සඳහා අවිධිමත් ලෙස මුදල් අවභාවිතා කිරීම, අරමුණුවලට පටහැනිව වියදම් දැරීම යනාදී කරුණු හේතුවෙන් අවස්ථා 16 කදී රුපියල් මිලියන 113 කට අධික රාජ්‍ය අරමුදල් අවභාවිතයක් සිදුවී තිබුණි.

## ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - ලැබුණු පරිත්‍යාග හා මූල්‍ය සහය

කළුතර පාපන්දු ක්‍රීඩාංගණය නවීකරණය සඳහා ඉතාලි පාපන්දු ක්‍රීඩකයන්ගේ සංගමයෙන් ලැබුණු පරිත්‍යාග රු.මිලියන 6.29 ක් (යුරෝ 40,400) හා ආසියානු පාපන්දු සම්මේලන සභාපති කුසලාන තරඟාවලිය සඳහා ලැබුණු සත්කාරක ආධාර රු.මිලියන 6.41 ක් (ඇ.ඩොලර් 59,900) වංචනික ලෙස පෞද්ගලික බැංකු ගිණුම් වලට ලබා

ගැනීම සඳහා ව්‍යාජ නියෝග ලිපි බැංකුවට ඉදිරිපත් කිරීම තුළින් එකතුව රු.මිලියන 12.70 ක මුදලක් වංචා කර තිබුණි.

සුනාමි ව්‍යසනයෙන් හානියට පත්වූ නිවාස ඉදිකිරීම වෙනුවෙන් ලැබුණු රු.මිලියන 5 ක ආධාර මුදලක්, නිවාස ඉදිකිරීම් සඳහා මුදල් නොගෙවා මූල්‍ය අක්‍රමිකතා සිදුකර තිබුණි.

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව - දක්ෂිණ අධිවේගී මාර්ගයේ නිත්‍ය මගී බස්රථ සේවා අවසරපත්‍ර නිකුත් කිරීම

2014 අප්‍රේල් 9 දින සිට 22 දක්වා උත්සව සමය සඳහා විධිමත් හා නිසි ක්‍රමවේදයකින් තොරව තාවකාලික මගී සේවා අවසරපත්‍ර 13 ක් නිකුත් කර තිබුණි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව එහි සභාපතිවරයාගේ අභිමතය පරිදි 2014 සැප්තැම්බර් 02 දින දක්වා මාස 05 ක කාලයක් තුළ අවස්ථා 10 කට වැඩි වාර ගණනකදී තාවකාලික අවසරපත්‍රවල කාලය අවිධිමත් ලෙස දීර්ඝ කර තිබුණි. මෙසේ තාවකාලික අවසරපත්‍රවල කාලය දීර්ඝ කිරීම සඳහාවූ නීතිමය ප්‍රතිපාදන ද සළසා නොතිබුණි.

බස්රථ අළුත්වැඩියාව, නව බස් රථයක් හෝ වෙනත් බස් රථයක් අදේශනය හා අයිතිය සංශෝධනය යනාදී හේතූන් ඉදිරිපත් කර නිත්‍ය මගී සේවා පවත්වා නොතිබුණු බස් හිමියන්ට තාවකාලික අවසරපත්‍ර 07 ක් නිකුත් කර තිබුණි.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව - මූල්‍ය පාලන දුර්වලතා

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණද වැලිකඩ බන්ධනාගාරය, බන්ධනාගාර රෝහල සහ වැලිකඩ බන්ධනාගාර රෝහල යන ස්ථානවල ඇඟිලි සළකුණු යන්ත්‍ර 2009 සැප්තැම්බර් මස සවිකර තිබුණද ඒවා නිසි නඩත්තුවකින් හා ක්‍රියාකාරී තත්ත්වයකින් පවත්වා ගැනීමකින් තොරව නිලධාරීන්ගේ පාලනය යටතේ පවත්වා ගන්නා ලද පැමිණීමේ ලේඛන පදනම් කරගෙන 2013 වර්ෂයේදී කරන ලද රු.මිලියන 20.51 ක අතිකාල ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු නොවීම.

## අධ්‍යාපන අමාත්‍යාංශය - පාසල් පද්ධතියේ අවිධිමත් මූල්‍ය හා මෙහෙයුම් පාලනය

1982 මාර්තු 30 දිනැති අංක 1982/2 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 15.2 උප වගන්තිය පරිදි ඇස්තමේන්තු සැලසුම් හා වැඩ පත්‍රිකා වලට ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, එම අනුමැතිය නොමැතිව කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ ආපනශාලාව රු.මිලියන 3.32 ක් වැයකර අළුත්වැඩියා කර තිබීම හා බොහෝ අළුත්වැඩියා නිසි ප්‍රමිතියකින් තොර වීම නිසා කාර්යය අසාර්ථක වී තිබීම.

කොළඹ තර්ස්ටන් විද්‍යාලයට 2013 හා 2014 වර්ෂවලදී පළමු වසරට ළමුන් ඇතුළත් කර ගැනීමේදී 2012 මැයි 28 හා 2013 මැයි 23 දිනයන්හිදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කළ අංක 2012/19 හා 2013/23 දරන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව එකතුව රු.මිලියන 15.46 ක මුදලක් ළමුන්ගේ දෙමාපියන්ගෙන් අයකරගෙන ආදී ශිෂ්‍යය සංගම් ගිණුමට බැරකර තිබීම.

## ලංකා ෆොස්පේට් ලිමිටඩ් - සම්පත් උපයෝජනය නොකිරිම

එප්පාවල පිහිටි ටොන් මිලියන 60 ක පමණ ධාරිතාවයක් ඇති ෆොස්පේට් නිධිය දේශීය කෘෂිකර්මාන්තයට අවශ්‍ය කේවල සුපර් ෆොස්පේට් හා ත්‍රිත්ව සුපර් ෆොස්පේට් නිෂ්පාදනයට යොදා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු.මිලියන 3,220 ක් වූ රජයේ වියදම් අවම කර ගැනීමට හා වාර්ෂිකව ඩොලර් මිලියන 45.9 ක විදේශ විනිමය ඉතිරි කර ගැනීමට තිබූ අවස්ථාවක් අහිමි වී තිබීම.

## නැගෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව - ප්‍රසම්පාදන අක්‍රමිකතා

ජපාන ජාත්‍යන්තර සහයෝගීතා සංවිධානයේ ආධාර යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති පැකේජ 59 ක් අතුරින් පැකේජ 11 ක ලංසු ප්‍රමාණපත්‍රවල වැඩ විෂයන්ගේ ගෙවීම් රේටයන් වංචා සහගත ලෙස වැඩි කිරීම තුලින් රුපියල් මිලියන 174 කට අධික මූල්‍ය පාඩුවක් සිදුකර තිබීම.

## වනජීවි දෙපාර්තමේන්තුව - අලි මිනිස් ගැටුම අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා

අලි මිනිස් ගැටුම අවම කිරීමේ උපක්‍රමික ක්‍රියාමාර්ග අතුරින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩි අවධානයක් යොමු කර තිබුණු විදුලි වැට ඉදිකිරීම හා අලිවෙඩි බෙදාහැරීම පිළිබඳ කටයුතු ක්‍රියාත්මක කිරීමේ පහත දූර්වලතා නිරීක්ෂණය විය.

2012 ජනවාරි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි විදුලි වැට ඉදිකිරීම හා නඩත්තුව ක්‍රමවත්ව පවත්වා ගැනීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනීමට තීරණය කර කි.මී.710 ක විදුලි වැට ඉදිකිරීම් සඳහා රු.මිලියන 67.92 ක ප්‍රතිපාදන සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නිදහස් කර තිබුණි. ඉන් සියයට 68 ක් උපයෝජනය නොකර නිෂ්කාර්යව පොදු තැන්පතු ගිණුමේ පැවතුණි.

වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත විදුලි වැට ඉදිකිරීම හා නඩත්තුව වෙනුවෙන් වැයදැරීම් අනුව ඉහළ මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කළද ඊට සාපේක්ෂව භෞතික ඉදිකිරීම් ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පැවතුණි. ඉදිකිරීම් සඳහා උපකරණ මිලට ගැනීම හා ඉදිකිරීම් සිවිල් වැඩ සඳහා මුදල් ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට පෙර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට මුදාහැරීම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධනය ඉහළ යාමට හේතු වී තිබුණි. 2014

ජනවාරි 01 දිනට කාර්ය 33 කට අයත් ඉදිකර අවසන් කළ යුතුව පැවති විදුලිවැට කි.මී.1,020 ක් අතුරින් 2014 මැයි 15 දින වන විට ද අවසන් කර තිබුණේ කාර්යයන් 14 කට අයත් විදුලි වැට කි.මී.490 ක් පමණකි. එනම් භෞතික කාර්යසාධනය සියයට 48 ක් විය. නියැදි භෞතික සෝදිසි පරීක්ෂණ වලදී ප්‍රමිතියෙන් තොර ලී කණු මිලට ගැනීම හා ඉදිකිරීම් නිසි පිරිවිතරයන්ට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නියැදි පරීක්ෂණයට අනුව කි.මී.155 ක විදුලි වැට ඉදිකිරීම් කාර්යයන් 09 ක් වෙනුවෙන් 2012 හා 2013 වර්ෂවලදී මිලදී ගෙන තිබුණු රු.මිලියන 28.4 වටිනා උපකරණ තොග 2015 මැයි 15 වන විටත් අදාල කාර්යයන්ට උපයෝජනය නොකර පැවතුණි.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - දේශීය සංචාරකයින් සඳහා ප්‍රචාරක වැඩසටහන - ඌව පළාත

දේශීය සංචාරකයින් දැනුවත් කිරීමේ ප්‍රචාරක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා යැයි දක්වා විධිමත් අධිකාර බලයකින් හා අනුමැතියකින් තොරව අධිකාරියේ සුභසාධන සංගමයට රු. මිලියන 5.74 ක් ගෙවා තිබූ අතර එම මුදලින් 2014 ඌව පළාත් සභා මැතිවරණයට රු. මිලියන 4.77 යොදාගෙන තිබුණි.

උක්ත වැඩසටහනේ ඉතිරි මුදල වූ රු. මිලියන 0.97 අධිකාරිය වෙත සංගමය විසින් නොගෙවා සංගමයේ ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

2014 වර්ෂයේ ලෝක සංචාරක දිනය සැමරීම වෙනුවෙන් ටී ෂර්ට් 8000 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් යැයි පවසමින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ව්‍යාජ ලේඛන සකස් කරමින් කාර්යාංශයේ අරමුණට හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසිවලට පටහැනිව එක් දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රු.මිලියන 5.82 ක් වියදම් කර තිබුණි.

2014 වර්ෂයේදී සංචාරක ක්ෂේත්‍රය තුළ සාමාජීය වගකීම් ප්‍රවර්ධන වැඩසටහන් (Social Responsibility Promotional Campaign In Tourism) යටතේ රු.මිලියන 166.75 ක ඇස්තමේන්තුවක් සහිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන 02 ක් තෝරාගෙන අවස්ථා 06 ක දී රු.මිලියන 55.45 ක මුදලක් ගෙවා තිබුණි. ඉහත ආයතන දෙක තෝරාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට පටහැනිව සදොස් ලෙස මිල ගණන් කැඳවා, එකම අයිතිකරුවන් යටතේ ලියාපදිංචි වී තිබුණු ආයතන දෙකක් වෙත කොන්ත්‍රාත් පිරිනැමීමද සිදුකර තිබුණි. එසේම කාර්යංශයේ අරමුණ ඉටු නොවී තිබියදී හා කළ වැඩ කොටස සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිසි ඇගයීමක් හා අනුමැතියකින් තොරව මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 55.76 ක් ගෙවා තිබුණි.

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව - මිශ්‍ර ගොඩනැගිලි ඉදි කිරීම් ව්‍යාපෘතිය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව සැලැසුම් හා නිර්මාණ පිළියෙල කිරීම ඇතුළුව වරලත් ඉංජිනේරු උපදේශක සේවා 06 ක් සඳහා රු. මිලියන 90.67 ක කොන්ත්‍රාත් පෞද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි.

මුලින් සැලැසුම් කළ මහල් 28 ක ගොඩනැගිල්ල මහල් 11 දක්වා ඉදිකිරීම් විෂය පථය සියයට 42 කින්ද ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 2,015 සිට රු.මිලියන 1,567 දක්වා රු.මිලියන 448 කින්ද අඩුවී තිබුණ ද පිරිවැය මත පදනම්ව උපදේශක සේවා ගාස්තු සංශෝධනය කරගෙන නොතිබීම නිසා රු.මිලියන 8.53 ක ඇස්තමේන්තුගත අලාභයක් සිදුවී තිබුණි.

ව්‍යාපෘති වාර්තාව පිළියෙල නොකිරීම, පෙර විකුණුම් ක්‍රමය (Pre-Sale Method) යටතේ අරමුදල් සපයා ගැනීමට සිදුකළ වෙළඳපල සමීක්ෂණය සිදුකර නොතිබීම, ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම සහ සමාජමය බලපෑම පිළිබඳ තක්සේරුව ආදී අවශ්‍යතා සිදුකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයන් හා සංශෝධනයන් දක්නට ලැබුණි.

## වී අලෙවි මණ්ඩලය - වී තොග සහල් කිරීමේ ක්‍රියාවලිය

2012 / 2013 මහ කන්නය සඳහා සහ 2013 යල කන්නය සඳහා මිලදී ගත් වී තොග සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ නිර්දේශ මත පෞද්ගලික මෝල් හිමියන් වෙත ලබාදීම හා එම සහල් සතොස සමාගමේ අලෙවිසැල් හරහා බෙදාහැරීම පිළිබඳ පරීක්ෂාව.

උක්ත පරීක්ෂණයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක නිරීක්ෂණයන් පහත දැක්වේ.

2013 වර්ෂයට අදාළව ලියාපදිංචි පෞද්ගලික මෝල්හිමියන් 154 දෙනෙකුගෙන් 133 දෙනෙකු වෙත සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ නිර්දේශ මත වී තොග නිකුත් කර තිබූ අතර ඉන් ගිවිසුම් අත්සන් කර තිබුණේ 10 දෙනෙකු සමඟ පමණි. මෝල් හිමියන් 123 දෙනෙකු වෙත රු.මිලියන 2,906.12 ක් වටිනා වී මෙට්‍රික් ටොන් 112,092 ක් සැපයීම් කර තිබුණි. ඒ සඳහා මෝල්හිමියන්ගෙන් 2012 වසරේ ලැබිය යුතු ශේෂයන් ද ගැලපීමෙන් පසු 2013 දෙසැම්බර් 31 දිනට සහල් වර්ග 5 ක මෙට්‍රික් ටොන් 61,767 ක් සඳහා රු.මිලියන 2,962 ක් ලැබිය යුතුව තිබුණි. තවද සතොස සමාගම මෝල්හිමියන්ගෙන් සහල් බාරගැනීම් පිළිබඳ පරීක්ෂාවේදී අධික ලෙස ප්‍රමිතියෙන් බාල සහල් වර්ග භාරදීම් හා ප්‍රතික්ෂේප කිරීම් සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

වී අලෙවි මණ්ඩලය විසින් 2010, 2011 සහ 2012 වසර වල සහල් අපනයන වැඩසටහන යටතේ පෞද්ගලික සහල් මෝල් හිමියන් 95 දෙනෙකු සඳහා ලබාදී තිබූ රු.මිලියන 262 ක් වූ වී තොග සඳහා ඒ වෙනුවට සහල් භාරදීම හෝ

මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. තවද 2010 සහ 2011 වර්ෂවල වී සහල් කර වෙළඳපලට සැපයීම යටතේ මෝල් හිමියන් 65 දෙනෙකු වෙත ලබාදී තිබුණු වී තොග සඳහා ගෙවීම් පැහැර හැර තිබීම හේතුවෙන් රජයේ ගාස්තුව වූ රු.මිලියන 17.72 ක් ද ඇතුළුව රු.මිලියන 88.60 ක් 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයට ලැබිය යුතුව තිබුණි.

සමුපකාර තොග වෙළඳ සංස්ථාව යටතේ ක්‍රියාත්මක සහල් මෝල් දෙකෙහි 2012 වසරේ සහල් අතුරු නිෂ්පාදන ලෙස ලැබී තිබුණු කැඩුණු සහල් කිලෝ 258,272 ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව අඩු මිලකට අලෙවි කර තිබුණි.

# 2014 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හඳුන්වාදීම තුළින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සළසා දෙන ලද ප්‍රතිපාදනවලින් ජනිතවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමෙන් ඒවායේ පාලනය මෙන්ම රටක් වශයෙන් රජය සතු වත්කම්වල වටිනාකම ගණනය කිරීමෙන්, ඒවායේ ආරක්ෂාව තහවුරුවන පරිදි වගකීම පැවරීමටත් හැකි තත්ත්වයක් නිර්මාණය වන බව සඳහන් කළ යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් උපචිත පදනම මත ගණනය කළ ආදායම හා වියදම සමඟ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් ආදායම් හා වියදම් සැසඳිය හැකිවීම තුළින් ආදායම් රැස්කීමට හා වියදම් පාලනයක් ඇති කර ගත හැකිය.

## වාර්ෂික විසර්ජනයන්

2014 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදනය කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය රු.මිලියන 1,042 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 1,024 ක් විය. මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 210 ක් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය විසින් ධාරිතාවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සළසා දෙන ලදී. 2014 වර්ෂයේ සත්‍ය වියදම රු.මිලියන 59 ක් වූ අතර ඊට අනුරූපිය ඉකුත් වර්ෂයේ වියදම රු.මිලියන 153 ක් විය.

2014 වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන බලමණ්ඩල, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු වශයෙන් රු.මිලියන 100 ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්කිරීමට අපේක්ෂා කළ විගණන ගාස්තුව රු.මිලියන 90 ක් වුවත්, එම ඇස්තමේන්තුව රු.මිලියන 10 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු රැස්කිරීමට හැකි වී තිබුණි.

## දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

වත්කම් පාලනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා මෙවලමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ මූලික වැඩ කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කෙරුණි. යටත් විජිත සමයේ සිට විසර්ජන ගිණුම් පමණක් ඉදිරිපත් කරමින් පවතින ආයතන කාණ්ඩය යටතේ පවතින දෙපාර්තමේන්තුවලට ප්‍රථම වතාවට මෙම ගිණුම්කරණය හඳුන්වා දී ඇත. තවදුරටත් 2013 වර්ෂයේ සිට සෑම අමාත්‍යාංශයකම හා දෙපාර්තමේන්තුවකටම මෙම ගිණුම් ක්‍රමය 2013 ජනවාරි 24 දිනැති අංක SA/AS/AA/Circular දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් හඳුන්වා දී ඇත. මේ මගින් ආරම්භක පියවරක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මුළු රාජ්‍ය ක්ෂේත්‍රයටම ආදර්ශයක් වී ඇත.

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| ඇස්තමේන්තුව 2014 | | සටහන | 2014 | 2013 |
|---|---|---|---|---|
| *රු.000* | | | *රු.000* | *රු.000* |
| | **ආදායම** | | | |
| 90,000 | විගණන ගාස්තු | 1 | 117,238 | 104,185 |
| 200 | කුලී | | 232 | 134 |
| 9,000 | පොළී | | 10,110 | 10,303 |
| - | දඩ මුදල් හා රාජසන්තක කිරීම් | | 69 | - |
| 2,000 | අනෙකුත් | | 2,714 | 2,225 |
| - | වත්කම් අපහරණයෙන් ලාභ | 2 | 3,637 | 571 |
| **101,200** | **මුළු මෙහෙයුම් ආදායම** | | **134,000** | **117,418** |
| **711,183** | පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය | 3 | 780,973 | 740,296 |
| **812,383** | **මුළු ආදායම** | | **914,973** | **857,714** |
| | | | | |
| | **වියදම** | | | |
| 700,650 | පුද්ගල පඩිනඩි | 4 | 670,988 | 635,327 |
| 21,900 | ගමන් වියදම් | 5 | 13,611 | 19,425 |
| 16,500 | සැපයීම් | 6 | 21,033 | 15,498 |
| 14,200 | නඩත්තු වියදම් | 7 | 14,954 | 9,746 |
| 48,519 | සේවා | 8 | 52,693 | 42,268 |
| 10,114 | මාරු කිරීම් | 9 | 10,326 | 10,054 |
| 500 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | | 251 | 316 |
| - | ක්ෂයවීම් | 10 | 79,530 | 72,843 |
| - | පුනරාවර්තන වියදම් - රාජ්‍ය අංශයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය | | 1,788 | 25,058 |
| - | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් - කපා හැරීම | | - | 67 |
| - | විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය ක්‍රමක්ෂය | 11 | 24,904 | 24,904 |
| **812,383** | **මුළු වියදම** | | **890,078** | **855,506** |
| - | **වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය/(ඌනතාවය)** | | **24,895** | **2,208** |

## 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2014 දෙසැම්බර් | | 2013 දෙසැම්බර් | |
|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් ශේෂය | | - | | - | |
| තොගය | 12 | 6,577 | | 5,449 | |
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 13 | 231,840 | | 251,605 | |
| ලැබිය යුතු විගණන ගාස්තු | 14 | 214,810 | | 189,456 | |
| **මුළු ජංගම වත්කම්** | | | **453,227** | | **446,510** |
| **විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීම** | 11 | | 176,284 | | 201,188 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල,පිරියත හා උපකරණ | 10 | | 1,151,089 | | 1,027,340 |
| කෙරීගෙන යන වැඩ | | | **-** | | **139,188** |
| **මුළු වත්කම්** | | | **1,780,600** | | **1,814,226** |
| | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වියදම් | | 2,897 | | 115,310 | |
| ගෙවිය යුතු තැන්පත් | | 18,221 | | 8,456 | |
| **මුළු ජංගම වගකීම්** | | | **21,118** | | **123,766** |
| **සමුච්චිත අරමුදල** | | | | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 193,595 | | 191,387 | |
| වර්ෂයේ අතිරික්තය/(ඌනතාවය) | | 24,895 | | 2,208 | |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | | 218,490 | | 193,595 |
| **දායකය** | | | | | |
| භාණ්ඩාගාර | 16 | 623,327 | | 662,610 | |
| රාජ්‍ය අංශයේ ධාරිතාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 17 | 917,665 | 1,540,992 | 834,255 | 1,496,865 |
| **මුළු බදු ගෙවන්නන්ගේ ස්කන්ධය** | | | **1,780,600** | | **1,814,226** |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති ( වැඩ බලන)
2015 ඔක්තෝබර් 28 දින

එස්.ජී.සේනාරත්න
ප්‍රධාන ගණකාධිකාරී

## ගිණුම් ප්‍රතිපත්ති

### 1 වාර්තා කිරීමේ අස්තිත්වය

විගණකාධිපති දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කිසියම් විශේෂ නීතියක් නොමැත. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවෙහි විගණකාධිපතිවරයෙක් විය යුතු බව දක්වා ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හා (3) ව්‍යවස්ථාවල සඳහන් ආයතනවලට විගණන සේවා සැපයීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වේ.

### 2 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය

වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය ජනවාරි 01 දිනෙන් ආරම්භ වී දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය වේ.

### 3 සකස් කිරීමේ පදනම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර සියලුම වටිනාකම් ආසන්නම රුපියල් දහසේ වටිනාකමට වටයා ඇත.

### 4 ආදායම්

භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන, විගණන ගාස්තු, ණය සඳහා පොළී, ගොඩනැගිලි කුළී, සංචාරක බංගලා ගාස්තු, වත්කම් අපහරණයෙන් ලාභ, දඩ හා ගාස්තු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන අතර ඒවා උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ආදායම ඒවාට ලැබුණු ප්‍රතිෂ්ඨාව අනුව සාධාරණ පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු අයකරනු ලබයි. කාලපරිච්ඡේදයට අදාල ආදායමක් ලෙස ගාස්තු හඳුනාගනී. විගණන ගාස්තුවල වටිනාකම, විගණනය සඳහා ගත කරනු ලබන කාලය හා එම විගණනය සඳහා වැය කරන ඍජු පිරිවැය පදනම් කරගෙන තීරණය කරනු ලැබේ.

ණය සඳහා පොලී, ගොඩනැගිලි කුලී, සංචාරක බංගලා ගාස්තු, දඩ හා ගාස්තු, වත්කම් අපහරණයෙන් ලද ආදායම් ගණන්දීමේ නිලධාරියා වෙනත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වුවත්, දෙපාර්තමේන්තුවට අදාල එම ආදායම් එකතු කරන නිලධාරියා විගණකාධිපති වන හෙයින් හා එකතු කරන ලද ආදායම සමස්ථ ආදායමෙන් සුළු ප්‍රතිශතයක් වන හෙයින්, එම ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. මුදල් පදනම මත භාණ්ඩාගාර පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදානයන් ගිණුම්ගත කරනු ලැබේ.

## 5 වියදම්

උපචිත පදනම යටතේ සියළු පුනරාවර්තන වියදම් ගිණුම්ගත කරනු ලැබේ.

## 6 විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුව සිදුවන දිනට පවතින විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. එම ගනුදෙනු පියවීමේදී සිදුවන විදේශ විනිමය ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

## 7 මුදල් හා මුදල්වලට සමාන දෑ

අතැති මුදල් හා බැංකුවල ඇති වැඩි ද්‍රවශීලතාවයෙන් යුක්ත කෙටිකාලින තැන්පතු, මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත් වේ.

## 8 ණයගැතියන් හා අනෙකුත් ලැබිය යුතු මුදල්

ණයගැතියෝ හා ලැබිය යුතු දෑ මූලිකව සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. ලැබිය යුතු ශේෂ පිළිබඳ මූලික කොන්දේසිවලට අනුව දෙපාර්තමේන්තුවට මුදල් අයකර ගැනීමට නොහැකි බවට සාක්ෂි තිබෙන විට ලැබිය යුතු මුදලක් හානි වූ ලෙස සලකනු ලැබේ.

## 9 දේපල, පිරියත හා උපකරණ

ඉඩම්, ගොඩනැගිලි, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, පරිගණක දෘඩාංග හා මෝටර් රථ යනාදියෙන් දේපල, පිරියත හා උපකරණ සමන්විත වේ. දේපල පිරියත හා උපකරණ පිරිවැයට සමුච්චිත ක්ෂය හා අපහරණයෙන් වූ පාඩු අඩුකර දක්වනු ලැබේ. 2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ශේෂ පදනම් කරගෙන පළමුවරට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර 2010 ජනවාරි 01 දිනට පැවැති සියළුම ඉඩම් හා ගොඩනැගිලි මැණුම් දෙපාර්තමේන්තුවේ සැලැසුම්වලට අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කරන ලද තක්සේරුවට අනුව ගිණුම් ගත කරන ලදී. සියළුම මෝටර් රථ වාහන රජයේ තක්සේරුකරු විසින් කරන ලද ප්‍රත්‍යාගණනය පදනම් කරගෙන ගිණුම්ගත කර ඇති අතර, ලීබඩු, පරිගණක හා වෙනත් විෂයයන් ස්වාධීන තක්සේරු කණ්ඩායමක් විසින් සිදුකරණ ලද තක්සේරුව මත පදනම් කරගෙන ගිණුම්වලට ගන්නා ලදී.

දේපල පිරියත හා උපකරණ විෂයයක පිරිවැය වත්කමක් ලෙස හඳුණාගනු ලබන්නේ විෂයය සමඟ සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ වියහැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේ නම් හා එම විෂයෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය. බොහෝ අවස්ථාවලදී දේපල පිරියත හා උපකරණ විෂයයන් එහි

පිරිවැයට හඳුනාගනු ලැබේ. පිරිවැය රහිතව අත්කර ගත් හෝ නාමික පිරිවැයට අත්කර ගත් වත්කමක පිරිවැය, එම වත්කම අත්කර ගත් දිනයේදී සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

### 9.1 අපහරණයන්

අපහරණයේදී ලැබෙන මුදල වත්කමෙහි ධාරණ වටිනාකම සමඟ සසඳා අපහරණයෙන් උද්ගතවන ලාභය හා පාඩුව තීරණය කරනු ලැබේ. අපහරණය මත ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

### 9.2 පසුව සිදුවන පිරිවැය

මුල් අත්පත් කර ගැනීමෙන් අනතුරුව දරනු ලබන පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එමගින් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ හෝ ලැබිය හැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේනම් සහ එම විෂයන්හි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය.

### 9.3 ක්ෂය කිරිම

පිරිවිත හා උපකරණවල පිරිවැය අඩුකළ ඇස්තමේන්තුගත අවශේෂ වටිනාකම් සහ ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය අනුපාතයට අනුව සියළුම පිරියත හා උපකරණ සඳහා ක්ෂය සරල මාර්ග පදනම මත ප්‍රතිපාදනය කරනු ලබයි. ප්‍රධාන වත්කම්වලට ප්‍රයෝජනවත් ආයු කාලය හා සම්බන්ධිත ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත.

| වත්කම | ආයු කාලය වර්ෂ | ක්ෂය අනුපාතය ප්‍රතිශතය |
|---|---|---|
| ගොඩනැගිලි | 50 | 2.0 |
| කුඩා පරිමාණ මුද්‍රණාලය | 20 | 5.0 |
| විදුලි සෝපානය | 20 | 5.0 |
| මෝටර් වාහන | 8 | 12.5 |
| ලීබඩු හා උපකරණ | 5 | 20.0 |
| පරිගණක හා දෘඩාංග | 4 | 25.0 |

## 10. ගෙවිය යුතු මුදල්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට පවතින වටිනාකමට ගෙවිය යුතු මුදල් ගිණුම්වලට ගනු ලැබේ. මූලිකව සාධාරණ අගයට ගෙවිය යුතු මුදල් ගණනය කරනු ලැබේ.

## 11. වාර්ෂික ඇස්තමේන්තු

පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත මගින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන සංඛ්‍යා ප්‍රධාන ඇස්තමේන්තුවේ සංඛ්‍යා වේ. මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ වීරමොං පරිපාටියෙන්ද, පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් හා පරිපූරක ඇස්තමේන්තු මගින් ගැලැපීම් කිරීමෙන් පසුව මෙම සංඛ්‍යා අවසාන සංඛ්‍යා ලෙස දක්වනු ලැබේ.

## 12. විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම්

ප්‍රතිපත්ති යොදා ගැනිම සහ වාර්තා කරන ලද වත්කම් හා බැරකම්, ආදායම් හා වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු කිරිම්, උපකල්පනයන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම සඳහා අවශ්‍ය වේ. අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගැලැපෙන පරිදි ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පනයන් ඓතිහාසික අත්දැකීම් හා වෙනත් විවිධ කරුණු මත පදනම් වේ.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්

**සටහන් 01 විගණන ගාස්තු**

| ඇස්තමේන්තුව 2014 | විස්තරය | 2014 | 2013 |
|---|---|---|---|
| රු.දහස් | | රු.දහස් | රු.දහස් |
| **90,000** | **ලැබීම්** | | |
| | රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන | 38,809 | 42,986 |
| | පළාත් පාලන ආයතන | 15,025 | 16,324 |
| | ගොවිජන සේවා මධ්‍යස්ථාන | 725 | 489 |
| **90,000** | **එකතුව** | **54,559** | **59,799** |
| | **ලැබිය යුතු** | | |
| | රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන | 32,852 | 16,004 |
| | පළාත් පාලන ආයතන | 28,171 | 26,704 |
| | ගොවිජන සේවා මධ්‍යස්ථාන | 1,656 | 1,678 |
| **-** | **එකතුව** | **62,679** | **44,386** |
| **90,000** | **මුළු එකතුව** | **117,238** | **104,185** |

සටහන 02 වත්කම් අපහරණය

| ඇස්තමේන්තුව 2014 රු.දහස් | විස්තරය | 2014 රු.දහස් | 2013 රු.දහස් |
|---|---|---|---|
| | **වාහන අපහරණය** | | |
| - | වාහනවල විකුණුම් වටිනාකම | 7,241 | 0 |
| - | විකුණුම් පිරිවැය | (3,610) | 0 |
| - | වාහන අපහරණයෙන් ලාභ/(අලාභ) | **3631** | **-** |
| | | | |
| - | **ලීබඩු හා උපකරණ අපහරණය** | | |
| - | ලීබඩු හා කාර්යාල උපකරණ විකුණුම් වටිනාකම | 8 | 710 |
| - | විකුණුම් පිරිවැය | (2) | (139) |
| - | ලීබඩු හා උපකරණ අපහරණයෙන් ලාභය | **6** | **571** |
| - | **වත්කම් අපහරණයෙන් ලාභය** | **3,637** | **571** |

සටහන 03 පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය

| ඇස්තමේන්තුව 2014 රු.දහස් | විස්තරය | 2014 රු.දහස් | 2013 රු.දහස් |
|---|---|---|---|
| 711,183 | පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම | 676,539 | 637,100 |
| - | ඉකුත් වර්ෂය සඳහා තොගය ගැලැපීම | 0 | 5,449 |
| - | 2014 සඳහා ක්ෂයවීම් සඳහා ලැබිය යුතු අග්‍රිම | 79,530 | 72,843 |
| - | විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය | 24,904 | 24,904 |
| **711,183** | පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකය | **780,973** | **740,296** |

සටහන 04 පුද්ගල පඩිනඩි

| ඇස්තමේන්තුව 2014 රු.දහස් | විස්තරය | 2014 රු.දහස් | 2013 රු.දහස් |
|---|---|---|---|
| 370,650 | වැටුප් හා වේතන | 341,291 | 340,820 |
| 3,000 | අතිකාල හා නිවාඩු දින දීමනා | 2,999 | 2,584 |

| | | | |
|---|---|---|---|
| 327,000 | අනෙකුත් දීමනා | 326,698 | 291,923 |
| **700,650** | **එකතුව** | **670,988** | **635,327** |

**සටහන 05** **ගමන් වියදම්**

| ඇස්තමේන්තුව 2014 | විස්තරය | 2014 | 2013 |
|---|---|---|---|
| රු.දහස් | | රු.දහස් | රු.දහස් |
| 12,000 | දේශීය | 11,226 | 12,555 |
| 2,713 | විදේශීය | 2,385 | 6,870 |
| **14,713** | **එකතුව** | **13,611** | **19,425** |

**සටහන 06** **සැපයීම්**

| ඇස්තමේන්තුව 2014 | විස්තරය | 2014 | 2013 |
|---|---|---|---|
| රු.දහස් | | රු.දහස් | රු.දහස් |
| 9,000 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 9,131 | 8,652 |
| 12,000 | ඉන්ධන | 11,454 | 6,398 |
| 450 | ආහාර පාන හා නිල ඇඳුම් | 448 | 448 |
| **21,450** | **එකතුව** | **21,033** | **15,498** |

**සටහන 07** **නඩත්තු වියදම්**

| ඇස්තමේන්තුව 2014 | විස්තරය | 2014 | 2013 |
|---|---|---|---|
| රු.දහස් | | රු.දහස් | රු.දහස් |
| 8,500 | මෝටර් වාහන | 6,238 | 5,406 |
| 5,250 | පිරියත, යන්ත්‍ර හා උපකරණ | 4,662 | 1,016 |
| 4,500 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 4,054 | 3,324 |
| **18,250** | **එකතුව** | **14,954** | **9,746** |

**සටහන 08** **සේවා**

| ඇස්තමේන්තුව 2014 | විස්තරය | 2014 | 2013 |
|---|---|---|---|
| රු.දහස් | | රු.දහස් | රු.දහස් |
| 11,200 | ප්‍රවාහන | 10,920 | 4,110 |
| 10,500 | තැපැල් හා සංනිවේදනය | 10,118 | 7,915 |
| 12,500 | විදුලිය හා ජලය | 11,518 | 11,212 |

| | | | |
|---|---|---|---|
| 1,500 | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | 548 | 622 |
| 19,600 | අනෙකුත් | 19,589 | 18,409 |
| **55,300** | **එකතුව** | **52,693** | **42,268** |

**සටහන 09** **මාරු කිරීම්**

| ඇස්තමේන්තුව 2014 | විස්තරය | 2014 | 2013 |
|---|---|---|---|
| රු.දහස් | | රු.දහස් | රු.දහස් |
| 600 | දායක මුදල් හා සම්මාදම් | 468 | 440 |
| 9,900 | රජයේ නිලධාරීන්ගේ දේපල ණය මත පොළී | 9,858 | 9,614 |
| - | අනෙකුත් | - | - |
| **10,500** | **එකතුව** | **10,326** | **10,054** |

**සටහන 10** **දේපල, පිරියත හා උපකරණ**

| | ඉඩම් | ගොඩනැගිලි | මෝටර් වාහන | පරිගණක හා දෘඪාංග | ගෘහ භාණ්ඩ හා උපකරණ | සුළු පරිමාණ මුද්‍රණාලය | විදුලි සෝපානය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.දහස් | රු.දහස් | රු.දහස් | රු.දහස් | රු.දහස් | රු.දහස් | රු.දහස් | රු.දහස් |
| **පිරිවැය** | | | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 256,147 | 581,513 | 88,208 | 131,057 | 82,388 | 26,023 | 8,828 | 1,174,164 |
| එකතු කිරීම් | - | 193,515 | - | 1,337 | 12,039 | - | - | 206,891 |
| අපහරණය කිරීම් | - | - | (5,775) | - | (6) | - | - | (5,781) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 256,147 | 775,028 | 82,433 | 132,394 | 94,421 | 26,023 | 8,828 | 1,375,274 |
| **ක්ෂය කිරීම්** | | | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | - | 24,361 | 30,381 | 59,761 | 28,580 | 2,602 | 1,139 | 146,824 |
| අපහරණය කළ වත්කම් වෙනුවෙන් ක්ෂය | - | - | (2,165) | - | (4) | - | - | (2,169) |
| එකතු කිරීම් | - | 15,501 | 10,304 | 33,099 | 18,884 | 1,301 | 441 | 79,530 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 39,862 | 38,520 | 92,860 | 47,460 | 3,903 | 1,580 | 224,185 |
| **2014 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය** | **256,147** | **735,166** | **43,913** | **39,534** | **46,961** | **22,120** | **7,248** | **1,151,089** |

සටහන 11 විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරිමේ වියදම්

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු.දහස් | රු.දහස් |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 201,188 | 206,497 |
| 2014 වර්ෂයේ වියදම | - | 19,595 |
| 2014 වර්ෂයට අදාල පිරිවැය ක්‍රමක්ෂය (පිරිවැයෙන් 10%) | (24,904) | (24,904) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **176,284** | **201,188** |

සටහන 12 තොගය

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු.දහස් | රු.දහස් |
| ගොඩනැගිල්ල නඩත්තු කිරීමේ ද්‍රව්‍ය | 367 | 284 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 4,973 | 4,846 |
| ටයර් හා ටියුබ් | 1,237 | 319 |
| **එකතුව** | **6,577** | **5,449** |

සටහන 13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම්

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු.දහස් | රු.දහස් |
| දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ගෙන් අය විය යුතු ශේෂ එකතුව | 228,663 | 248,265 |
| වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව | 187 | 1,730 |
| විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව | 1,917 | 435 |
| තනතුර අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව | 475 | 580 |
| සේවය අවසන් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව | 598 | 595 |
| **එකතුව** | **231,840** | **251,605** |

සටහන 14 ලැබිය යුතු විගණන ගාස්තු

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු.දහස් | රු.දහස් |
| සංවර්ධන සභා | 30 | 30 |
| මහා නගර සභා | 24,493 | 22,706 |
| නගර සභා | 50,187 | 47,732 |
| ප්‍රාදේශීය සභා | 24,601 | 24,443 |
| රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා අනෙකුත් රාජ්‍ය ආයතන | 105,207 | 86,153 |

| | | |
|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | 10,254 | 8,392 |
| ආර්ථික මධ්‍යස්ථාන | 38 | - |
| **එකතුව** | **214,810** | **189,456** |

**සටහන 15 උපචිත වියදම්**

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු. දහස් | රු. දහස් |
| දුම්රිය බලපත්‍ර - නිවාඩු | 416 | 105 |
| දුම්රිය බලපත්‍ර - රාජකාරී ගමන් | 44 | 5 |
| ඉන්ධන වියදම් | - | 33 |
| තැපැල් ගාස්තු | 21 | 15 |
| දුරකථන බිල්පත් | **844** | **163** |
| විදුලි බිල්පත් | 808 | 945 |
| ජල බිල්පත් | 60 | 34 |
| වාහන අළුත්වැඩියා | 296 | 10 |
| රත්නපුර ගොඩනැගිල්ල - උපදේශක ගාස්තු | - | 3,556 |
| පොදු විකාශන පද්ධති ගාස්තුව | - | 441 |
| රත්නපුර ගොඩනැගිල්ල - ගෘහ භාණ්ඩ | - | 13,541 |
| විගණන ක්‍රමවේදය | - | 19,595 |
| රත්නපුර ගොඩනැගිල්ල - ඉදිකිරීම් | - | 76,867 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 355 | - |
| දේපල හා පිරියත නඩත්තු කිරීම | 53 | - |
| **එකතුව** | **2,897** | **115,310** |

**සටහන 16 මුලධන වියදම් හා පොදු තැන්පත් ගිණුම සඳහා භාණ්ඩාගාර දායකය**

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු.දහස් | රු.දහස් |
| රජයේ නිලධාරින්ට අත්තිකාරම් සඳහා | 231,840 | 251,605 |
| තැන්පත් ගිණුම සඳහා | (18,221) | (8,456) |
| ස්ථාවර වත්කම් සඳහා | 409,708 | 419,461 |
| **එකතුව** | **623,327** | **662,610** |

**සටහන 17** **රාජ්‍ය අංශ ධාරිතාවය වර්ධනය ව්‍යාපෘතියේ දායකය**

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| | රු.දහස් | රු.දහස් |
| ස්ථාවර වත්කම් සඳහා | 741,381 | 652,662 |
| විගණන ක්‍රමවේදය සඳහා | 176,284 | 181,593 |
| **එකතුව** | **917,665** | **834,255** |

# විගණන නිරීක්ෂණවල සාරාංශය ( ක්ෂේත්‍ර අනුව )

# ඒකාබද්ධ අරමුදල

ඒකාබද්ධ අරමුදලට කරනු ලබන ගෙවීම් සහ එම අරමුදලෙන් මුදල් ඉවත් කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට හා රාජ්‍ය මූල්‍ය පරිපාලන රෙගුලාසිවලට අනුකූලව ඉටුවිය යුතුය.

රාජ්‍ය ආදායම් ඉපයීම සහ රජයට ලැබිය යුතු වෙනත් මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළු මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අධීක්ෂණයද මුදල් රෙගුලාසි 124 අනුව මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති සියළුම ආකාරයේ දෙපාර්තමේන්තුමය මුදල් ගණුදෙනු ඉටු කළ යුත්තේ සාමාන්‍යයෙන් කවර සීමාවක් ඇතුළතද යන වග අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබයි. සියළුම ලැබීම් හා ගෙවීම් පිළිබඳව පාර්ලිමේන්තුවට උත්තර දීම මුදල් අමාත්‍යවරයාගේ යුතුකම වන අතර ඒ වෙනුවෙන් මහජන අරමුදල් එකතු කිරීම හා වැය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් එක් එක් අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වශයෙන් පත්කර භාණ්ඩාගාරයේ විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තු මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම ඒ නිලධාරීන්ට පවරනු ලබයි. අමාත්‍යාංශ ලේකම්වරුන්ට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(7) ව්‍යවස්ථාවෙහි නිශ්චිතවම සඳහන් කර ඇති දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් අධීක්ෂණය කරනු නොලබන වෙනත් දෙපාර්තමේන්තු භාර නිලධාරීන් ද එකී දෙපාර්තමේන්තුවල මුදල් ගණුදෙනු පිළිබඳ අධීක්ෂණය පවත්වා ගැනීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගකීම ඉටුකිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වන්නේය.

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. 2014 වර්ෂය සඳහා රාජ්‍ය වියදමට අවශ්‍ය ප්‍රතිපාදන 2013 අංක 36 දරන විසර්ජන පනතින් සළසා තිබුණු අතර එය 2014 අංක 42 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධනය කර තිබුණි. ඒ අනුව වැය ශීර්ෂ 208 ක් සඳහා රු. බිලියන 992.50 ක් පුනරාවර්තන වියදම් සඳහාද, රු.බිලියන 700.05 ක් මූලධන වියදම් සඳහාද වශයෙන් එකතුව රු.බිලියන 1,692.55 ක ප්‍රතිපාදන සලසා තිබුණි. පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු පුනරාවර්තන වියදම රු. බිලියන 610.12 ක් ද මූලධන වියදම රු.බිලියන 448.33 ක් ද වශයෙන් එකතුව රු.බිලියන 1,058.45 ක වියදමක් ද සමාලෝචිත වර්ෂයේදී දැරිය යුතු විය. ඒ අනුව රු.බිලියන 2,751 ක ප්‍රතිපාදන 2014 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ දක්වා තිබුණි. මීට අමතරව විශේෂ නීති සේවා සඳහා අතිරේකව ලබාදුන් රු.බිලියන 16.04 ක ප්‍රතිපාදනය සමඟ 2014 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රතිපාදනය රු.බිලියන 2,767.04 ක් විය. පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 2 සංවර්ධන වැඩසටහනට පුනරාවර්තන වියදම් සඳහා රු.බිලියන 8.127 ක්ද, මූලධන වියදම් සඳහා රු.බිලියන 20.12 ක් වශයෙන් එකතුව රු.බිලියන 28.24 ක ප්‍රතිපාදන සළසා තිබුණි. මෙසේ විසර්ජන පනතින් ප්‍රතිපාදනය කරන ලද මූල්‍ය සම්පත්, විශේෂ වියදම් ඒකක 22 ක් රජයේ අමාත්‍යාංශ 59 ක් රජයේ දෙපාර්තමේන්තු 93 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් හා පළාත් සභා 09 ක් මඟින් උපයෝජනය කර තිබුණු අතර, 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ

මුදල මූලධන වශයෙන් රු. බිලියන 595.71 ක් ද පුනරාවර්තන වශයෙන් රු. බිලියන 2,006.01 ක් ද ලෙස මුළු එකතුව රු. බිලියන 2,601.72 ක් ද විය.

2014 වර්ෂය වෙනුවෙන් සලසා තිබූ ප්‍රතිපාදන සඳහා අරමුදල් සපයා ගැනීමට ආදායම් සංකේත 99 ක් යටතේ සංශෝධනයන්ද ඇතුළුව රු.බිලියන 1,331.45 ක් ඇස්තමේන්තුකර තිබුණි. එම ඇස්තමේන්තුගත ආදායමින් සමාලෝචිත වර්ෂය තුල රැස්කළ ආදායම රු.බිලියන 1,127.63 ක් විය. මීට අමතරව අරමුදල් සපයා ගැනීම සඳහා රු.බිලියන 646.01 විදේශ ණය ගැනීම්, රු.බිලියන 13.40 ක විදේශ ප්‍රදානයන් හා රු.බිලියන 989.23 ක දේශීය බැංකු නොවන ණය ගැනීම්, රු.බිලියන 14.75 ක උප ණය අය කර ගැනීම් හා රු.බිලියන 0.30 ක ප්‍රාග්ධන වත්කම් විකිණීම් සඳහා ඇස්තමේන්තු කර තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.බිලියන 422.54 ක්,රු.බිලියන 9.42 ක් හා රු.බිලියන 965.45 ක්, රු.බිලියන 14.89 ක් රු.බිලියන 17.60 ක් සහ තැන්පතු ගිණුම් හා වගකීම්වල ශුද්ධ වෙනස්වීම මඟින් රු.16.92 ක්, මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම රු.බිලියන 27.27 ක් වශයෙන් අරමුදල් රැස්කර ගැනීමට රජය සමත් වී තිබුණි. දේශීය බැංකු නොවන ණය යටතේ ප්‍රධානම අරමුදල් සපයාගන්නා මාර්ගය ලෙස භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම රජය විසින් උපයෝගි කරගෙන තිබුණි.

## රාජ්‍ය ආදායම සහ අයවැය හිඟය

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2014 වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන වියදම රු. බිලියන 1,370.05 ක් හා රජයේ මූලධන වියදම රු. බිලියන 595.71 ක් වී ඇත. එහෙත් රජය විසින් උපයා තිබූ සමස්ථ ආදායම රු. බිලියන 1,127.63 වීම හේතුවෙන් එය 2014 වර්ෂයේ පුනරාවර්තන වියදම පියවා ගැනිමටවත් ප්‍රමාණවත් වී නොමැත. ඒ අනුව සමස්ථ රාජ්‍ය ආදායම ඉක්මවා වැය කර ඇති පුනරාවර්තන වැය රු. බිලියන 242.42 ක් විය. මේ හේතුවෙන් රු. බිලියන 595.71 ක් වූ මූලධන වියදම් සමඟ ඇති වී ඇති සමස්ථ අයවැය හිඟය වන රු.බිලියන 838.13 ක් පියවා ගැනීම සඳහා දේශීය හා විදේශීය මූල්‍ය මාර්ග වෙත යොමු වීමට තවදුරටත් සිදුවී තිබේ. ඒ අනුව 2014 වර්ෂයේදී විදේශීය ප්‍රදානයන් ඇතුළු මුළු විදේශීය මූල්‍යකරණ රු. බිලියන 324.98 දක්වා සියයට 211.64 කින් වර්ධනය වී තිබුණු අතර, ශුද්ධ දේශීය ණය ගැනීම් රු. බිලියන 436.46 දක්වා, 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 9.46 කින් අඩු වී තිබුණි.

රාජ්‍ය ආදායම් කළමනාකරණය හා සම්බන්ධ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හා ආදායම් උපයන ආයතන වල කාර්යසාධනය ඇගයීමේදී පහත කරුණු වලින් රාජ්‍ය ආදායමට ඇතිවන බලපෑම බැහැර කළ නොහැක.


- විටින්විට සිදුකරනු ලබන බදු සංශෝධනයන්
- ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණයන්හි වර්ධනය
- විදේශ විනිමය අනුපාතයන්හි ඇතිවන විචලනය
- ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල මිල ගණන් උච්චාවචනය

## අරමුදල් උපයෝජනය

2014 වර්ෂය වෙනුවෙන් රු.බිලියන 2,767.04 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර උපයෝජනය කර තිබූ මුදල රු.බිලියන 2,601.72 ක් වීම නිසා රු.බිලියන 165.32 ක ඉතිරියක් විය. ඉකුත් වර්ෂයේ ඉතිරිය වූ රු.බිලියන 191.37 සමඟ සැසැඳීමේදී රු.බිලියන 26.053කින් ඉතිරියේ අඩු වීමක් නිරීක්ෂණය විය. ඉහත සඳහන් පරිදි රු.බිලියන 2,767.04 ක ප්‍රතිපාදන වැය ශීර්ෂ වලට මාරු කර අදාල උපයෝජනයන් කර තිබුණත් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 41 ක රු.බිලියන 9.78 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. එය සමස්ථ ඉතිරියෙන් සියයට 5.9 ක් වී තිබුණි. ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 76.0 ත් සියයට 99.0 ත් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිය රු.බිලියන 14.87 ක් වී තිබුණි. එය සමස්ථ ඉතිරියෙන් සියයට 9.0 ක් වී තිබුණි. එසේම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51.0 ත් සියයට 75.0 ත් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිය රු.බිලියන 62.75 ක් වි තිබුණි. එය සමස්ථ ඉතිරිවීම්වලින් සියයට 37.9 ක් වි තිබුණි. එසේම රු.බිලියන 165.32 ක සමස්ථ ඉතිරියෙන් සියයට 40.3 ක් හෙවත් රු.බිලියන 66.62 ක් පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරියක් වූ අතර සමස්ථ ඉතිරියෙන් සියයට 59.7 ක හෙවත් රු.බිලියන 98.70 ක මූලධන ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. 2014 වර්ෂයට අදාලව ණය ගෙවීම් හැර ඇස්තමේන්තුගත මූලධන වියදම රු.බිලියන 671.66 ක් වූ අතර උපයෝජනය ඉන් සියයට 88.7 ක් හෙවත් රු. බිලියන 595.71 ක් වී තිබුණි. එය පසුගිය වර්ෂයේ උපයෝජනය කළ මූලධන ප්‍රතිපාදන වූ රු.බිලියන 455.58 සමඟ සැසඳීමේදී රු.බිලියන 140.13 ක වැඩි විමකි.

## දළ දේශීය නිෂ්පාදිතය හා රාජ්‍ය ආදායම

සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.2 වී තිබුණු අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ එම ප්‍රතිශතය සියයට 13.1 ක් විය. ඒ අනුව මෙම අඩුවීම සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක කාලය තුල සෑම වර්ෂයකම අඛණ්ඩව සිදුවී ඇති බව නිරීක්ෂණය විය. මෙම අඩුවීම සඳහා උපයන විට ගෙවීම් බදු ආදායම හැර අනෙකුත් සියලුම ආදායම් බදු වර්ගවලින් ලද බදු ආදායම අඩුවීම හේතු වී තිබුණි.




රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහා බැංකු වාර්ෂික වාර්තාව 2014

ඉහත දැක්වූ රජයේ ආදායම් රැස් කිරීම, ප්‍රතිපාදනය හා වියදම් කිරීම ආදී කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී ඒ මගින් ඉපයෙන පොළී ආදායම සහ මුහුණත වටිනාකමට වඩා වැඩියෙන් නිකුත් කිරීමෙන් ලැබූ අතිරික්තය වෙනම ආදායමක් ලෙස ගිණුම් ගත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ බැඳුම්කර නිකුත් කිරීම මගින් ඉපයූ පොළී ආදායම හා අතිරික්තය වූ පිළිවෙලින් එකතුව රු.බිලියන 17.89 ක් සහ රු.බිලියන 35.26 ක් දේශීය ණය සඳහා ගෙවූ පොළී ගිණුමට බැර කර තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල මුහුණත වටිනාකමට වඩා වැඩි වටිනාකමකට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මත රජයට ලැබී තිබුණු අතිරික්තය රු.බිලියන 35.255 ක් වූ අතර මුහුණත වටිනාකමට වඩා අඩු වටිනාකමකට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මත රජයට සිදු වී තිබුණු ඌනතාවය රු.බිලියන 3.09 ක් විය.

- මුහුණත වටිනාකමට වඩා අඩු මිලට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේදී බැඳුම්කරවල මුහුණත වටිනාකම භාණ්ඩාගාර බැඳුම්කර ගිණුමට බැර නොකර, බැඳුම්කර විකුණුම් වටිනාකම භාණ්ඩාගාර බැඳුම්කර ගිණුමට බැර කර තිබීම හේතුවෙන් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල 2014 දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරවල බැරකම් වටිනාකම රු.බිලියන 609.97 කින් අඩුවෙන් දක්වා තිබුණි.

- රජය සතු ව්‍යාපාර 08 කට අදාලව එකතුව රු.බිලියන 323.38 ක් මහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධනයට දායක වී ඇති බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, එම ආයතන විසින් ඍජුව විගණනයට තහවුරු කරන ලද ප්‍රාග්ධන දායකත්වයේ එකතුව රු.බිලියන 373.87 ක් විය. ඒ අනුව එම ආයතන 08 ට අදාලව එකතුව රු.බිලියන 50.49 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

- ආයෝජන සහතික පිළිබඳව සිදු කර තිබුණු සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ආයතන 07 කට අදාලව ආයෝජන වටිනාකම රු.බිලියන 19.50 ක් අඩුවෙන්ද, ආයතන 14 කට අදාලව ආයෝජන වටිනාකම රු.බිලියන 20.93 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

- රාජ්‍ය ප්‍රාග්ධන දායකත්වයක් සහිත ව්‍යාපාර 49 ක කොටස්වල ආයෝජනය කර තිබූ රු.බිලියන 9.69 ක වටිනාකමැති කොටස් සඳහා වූ සහතික, වාර්ෂික සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොතිබුණු බැවින් එම කොටස් ආයෝජනවල වටිනාකම සමීක්ෂණ මණ්ඩලය තහවුරු කරගෙන නොතිබුණි.

- රජයට අයත් ආයතන 92 ක වැවිලි සමාගම් 24 ක, සංවර්ධන බැංකු 02 ක හා විදේශ මුදල් වලින් ප්‍රකාශිත සංස්ථා 03 ක, එනම් ආයතන 121 ක කොටස් ප්‍රාග්ධනයේ එකතුව රු.බිලියන 397.84 ක් ආයෝජනය කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ලාභාංශ ලැබී තිබුණේ ඉන් රු.බිලියන 91.32 ක් ආයෝජනය කර තිබුණු ආයතන 40 කින් රු.බිලියන 4.68 ක් පමණි. එම මුදල ආයෝජිත වටිනාකමින් සියයට 1.17 ක අවම ප්‍රතිශතයක් වේ.

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් යටතේ ගෙවිය යුතු විදේශ ණය ශේෂ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 854-1 වාර්තාවේ දැක්වෙන විදේශ ණය ශේෂ සමඟ සැසඳීමේදී ණය ගිවිසුම් 81 කට අදාලව රු.බිලියන 2.92 ක් වැඩියෙන් හා ණය ගිවිසුම් 90 කට අදාලව රු.බිලියන 3.33 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

- ශීර්ෂ 206 කට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ විසර්ජන ගිණුම්වල ඩී.ජී.එස්.ඒ. 8(i), 8(ii), 8(iii) ආකෘති මගින් ඉදිරිපත් කර තිබූ 2014 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ පුනරාවර්තන වියදම් සඳහා වූ බැරකම්වල එකතුව රු.බිලියන 85.32 ක්ද, මූලධන වියදම් සඳහා වූ බැරකම්වල එකතුව රු.බිලියන 94.86 ක්ද වශයෙන් මුළු බැරකම්වල එකතුව රු.බිලියන 180.18 ක් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

- කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබුණු වාහන 24,017 ක් (යතුරු පැදි 21,498 ක්ද ඇතුළුව) වෙනුවෙන් මහා භාණ්ඩාගාරය සමාලෝචිත වර්ෂය අවසාන දිනට එළඹී ඇති මුළු බැරකම් ප්‍රමාණය වූ එකතුව රු.බිලියන 10.06 ක් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම් 03 ක අයිරා ශේෂය සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.බිලියන 11.87 ක පොලියක් ගෙවා තිබුණු අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට රු.බිලියන 1.60 කින් වැඩි වී තිබුණි.

- රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/FD/04/148 හා 2014 ඔක්තෝබර් 31 දිනැති ලිපිය ප්‍රකාරව ධාන්‍ය නිෂ්පාදනය සඳහා චක්‍රිය අරමුදලක් පිහිටුවීමට 277-1-1-0-2502 දරන වැය විෂයයෙන් රු.බිලියන 0.30 ක් අංක 6000/0000/00/0011/0602 දරන තැන්පත් ගිණුමට බැර කර තිබුණද එම ලිපියේ විධි විධාන අනුව කටයුතු නොකරීම නිසා එම තැන්පතුව අක්‍රිය තැන්පතුවක් වශයෙන් පැවතුනි.

- සමාලෝචිත වර්ෂයේ පාඩු හා හානි ලෙස ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු.බිලියන 0.382 ක් වන අතර එය ඉකුත් වර්ෂයේ පාඩු හා හානි වටිනාකම වූ රු.බිලියන 0.23 ට වඩා රු.බිලියන 0.16 ක හෙවත් සියයට 69.02 ක වැඩි වීමකි. විසර්ජන ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද ඩී.ජී.එස්.ඒ. 7 අකෘතියේ ඇතුලත් ශීර්ෂ 26 ක තවදුරටත් අයකරගැනීමට ඇති රු.බිලියන 0.54 ක වටිනාකම ජනරජයේ මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි.

- දේශීය ආයතන වෙත ලබා දී ඇති උප ණය ගිවිසුම් 09 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට ණය වටිනාකම රු.බිලියන 1.23 ක් ලෙස ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, එම ආයතන විසින් තහවුරු කරන ලද ණය වටිනාකම රු.බිලියන 0.81 ක් විය. එම නිසා එම ආයතන 09 ට අදාලව එකතුව රු.බිලියන 0.43 ක් වැඩියෙන් දක්වා තිබුණි.

- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ හිඟ හිටි ආදායම් වාර්තාව අනුව 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණු රු.බිලියන 8.69 ක් ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2013 සහ 2014 වර්ෂවලදී බාහිර පාර්ශවයන්ට සපයනු ලබන සේවාවන්ගෙන් උපයාගෙන තිබූ රු.බිලියන 1.09 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය හිඟය රු.බිලියන 777 ක් වුවද තත්‍ය අයවැය හිඟය රු.බිලියන 838 ක් වුයෙන් එය ඇස්තමේන්තු අයවැය හිඟයට වඩා රු.බිලියන 61 ක අවාසිදායක තත්ත්වයක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ තත්‍ය අයවැය හිඟය දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 8.5 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

- ජනරජයේ මුලා ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනට ජනරජයේ දළ බැරකම රු.බිලියන 6,971.18 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේ ජනරජයේ දළ බැරකම වු රු.බිලියන 6,344.94 සමඟ සැසඳීමේදි රු.බිලියන 626.23 ක, එනම් සියයට 9.9 කින් වැඩිවීමකි.

## රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද විශේෂ විමර්ෂණ හා එමඟින් රාජ්‍ය ආදායමට සිදු වූ බලපෑම්.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් වරින් වර රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විමර්ශන වලදී රාජ්‍ය ආදායම් කළමනාකරණයේ පවතින වැරදි, දුර්වලතා, අකාර්යක්ෂමතා හා අනාර්ථිකභාවයන් පෙන්වා දෙන ලදී. මේ පිළිබඳව විගණන විමසුම් සහ වාර්තා වලින් දිගින් දිගටම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද, එම අඩුපාඩු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීමේ මන්දගාමී බව රාජ්‍ය ආදායම් කළමනාකරණයට අහිතකර ලෙස බලපා ඇති බව පෙන්වා දීමට සිදු වී තිබේ. විශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ මුළු රාජ්‍ය ආදායමෙන් ආදායම් එකතු කිරීමේ ප්‍රධාන ආයතන 04 වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සියයට 85.35ක දායකත්වයක් ලබාදෙන අතර එම ආයතනවල කටයුතු පිළිබඳව සිදු කරනු ලැබූ විගණනයේදී අනාවරණය වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

### දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

- රු.බිලියන 210.08 ක් වු හිඟ ආදායම්, ආදායම් ගිණුම්වල දක්වා නොතිබුණි.

- මුළු මුද්දර බදු ආදායම රු.බිලියන 11.93 ක් වුවත් එයින් රු.බිලියන 8.33 ක්ද මුළු ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රු. බිලියන 57.68 ක් වුවත් එයින් රු.බිලියන 13.10 ක් ද ආදායම් ගිණුම්වල දක්වා නොතිබුණි.

- සාමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර වාර්තා අනුව ආදායම් පාලන ගිණුම් තුනෙහි බදු ආදායම සහ දෙපාර්තමේන්තුවේ බදු ආදායම අතර පැවති රු.බිලියන 0.66 ක වෙනසට හේතු සොයා බලා නිවැරදි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

- ජාතිය ගොඩනැගීමේ බදු ආපසු ගෙවීමේ බලධාරියා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වුවද භාණ්ඩාගාරය විසින් ජාතිය ගොඩනැගීමේ බදු ආපසු ගෙවීම් ලෙස රු. බිලියන 7.66 ක් දක්වා තිබුණු අතර ඒ සඳහා විස්තරද කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි.

- බදු වර්ග 4 කට අයත් රු.බිලියන 0.07 ක් වු බදු ආදායම සඳහා සාමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රේෂණ පත්‍ර ලැබි නොතිබීම නිසා බදුකරුවන්ගේ ගිණුම්වලට එම බදු ගිණුම් ගත කර නොතිබුණි.

- සංශෝධිත ආදායම් ඇස්තමේන්තු අනුව සමාලෝචිත වර්ෂයේදී රැස්කළ යුතුව තිබුණු බදු ආදායම රු.බිලියන 605.33 ක් වුවත් රු.බිලියන 485.39 ක් එනම් සියයට 80 ක් පමණක් රැස්කර තිබුණි.

- සමාලෝචිත වර්ෂය තුලදී වැට් වාර්තා ඉදිරිපත් නොකිරීම, බදු අඩුවෙන් ගණනය කිරීම සහ ගෙවීම් පැහැර හැරීම පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කර තිබුණු විගණන විමසුම් තුනක් හේතුවෙන් බදුකරුවන් 13 දෙනෙකුගෙන් රු.බිලියන 0.12 ක අතිරේක බදු ආදායමක් එකතු කර ගැනීමට හැකි වී තිබුණි.

- 2006 අංක 6 දරන දේශීය ආදායම් පනතේ 120 වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත එවිය යුතු, පාරිශ්‍රමිකයෙන් අඩු කරන ලද උපයන විට ගෙවීම් බදු සඳහා වූ මාසික වාර්තා රාජ්‍ය ආයතන 226ක් විසින් එවා නොතිබුණි.

## ශ්‍රී ලංකා රේගුව

- 2014 වර්ෂයේදී ආනයනිත බහාළුම්වලට අදාල රේගු සටහන්කර 192,848 ක් අතුරින් 170,120 ක් හෙවත් සියයට 88 කට ආසන්න ප්‍රමාණයක් විධිමත් පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කර තිබූ හෙයින් රේගු ආඥා පනතේ විධිවිධානවලට පටහැනි ආනයනයන් නිදහස් වීමට වැඩි ඉඩකඩක් පැවතීම.

- රේගු පරීක්ෂාවේ ස්වභාවය තීරණය කිරීම ස්ක්‍රීනින් (SCREENING) අංශයට අනුයුක්ත නිලධාරීන්ගේ පළපුරුද්ද සහ ආනයනකරුගේ ඉතිහාසගත තොරතුරු අනුව තීරණය කෙරෙතත් එවැනි තොරතුරු පද්ධතියක් ස්ක්‍රීනින් (SCREENING) අංශය තුළ ස්ථාපිත කර නොතිබූ අතර පරීක්ෂණ ක්‍රමවේදය නිලධාරීන්ගේ අභිමතය පරිදි තීරණය වී තිබුණි.

- බොහෝ විට අපනයනයන් ඇතුළත් බහාළුම් විස්තරාත්මක පරීක්ෂාවකට ලක් කර නොතිබුණි.

- ටොයෝටා හයිලක්ස් විගෝ ස්මාර්ට් කැබ් (Toyota Hilux Vigo) මාදිලියේ වාහන නිෂ්පාදනය කර ඇති ස්වරූපය අනුව නියමිත භාණ්ඩ වර්ගීකරණයෙන් බැහැරව බදු අය කිරීම නිසා එක් වාහනයකින් රු.බිලියන 0.002 ක රේගු බදු රජයට අහිමි වී තිබූ අතර මේ අකාරයේ වාහන 3000 කට අධික ප්‍රමාණයක් රේගුවෙන් නිදහස් කිරීමට කටයුතු කර තිබුණි.

- සහනදායි වාහන බලපත්‍ර මත ආනයනය කරනු ලබන වාහනවල වටිනාකම ඌන තක්සේරු කර බදු ගෙවීමට ආනයනකරුවන් විසින් කටයුතු කිරීම නිසා රු. බිලියන 0.72 කට ආසන්න බදු ආදායමක් අහිමි වී තිබුණි.

- ත්‍යාග ආකාරයට තැපැල් මගින් ගෙන්වන භාණ්ඩවල වටිනාකම තීරණය කිරීම පිණිස නිශ්චිත රේගු වටිනාකම් ඇතුළත් තොරතුරු පද්ධතියක් භාවිතා කර නොතිබුණි.

- නිෂ්පාදන බදු අයකර ගත යුතු නව ආයතන හඳුනාගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් නොවීම, නිෂ්පාදන බදු එකතු කිරීම සඳහා වූ නෛතික විධිවිධාන යාවත්කාලීන නොකිරීම, හිඟ නිෂ්පාදන බදු අයකර ගැනීමේ මන්දගාමී බව, නිෂ්පාදන බදු සම්බන්ධ වැටලීම් හා විමර්ශන විධිමත්ව සිදු නොකිරීම, නිෂ්පාදන බදු ගෙවීම පැහැර හැරීම පිළිබඳව ගෙන ඇති නීත්‍යානුකූල පියවරයන් සතුටුදායක ලෙස ක්‍රියාත්මක නොකිරීම, නිෂ්පාදන බදු අංශයේ නිලධාරීන් කාර්ය සාධනයන් ඉහළ මට්ටමක ගෙන ඒමේ විධිමත් අභ්‍යන්තර පාලන වැඩපිළිවෙලක් නොතිබීම නිරීක්ෂණය විය.

- වාණිජ ස්වරූපයේ භාණ්ඩ රැගෙන ඒම සඳහා ගුවන්තොටුපල මගී පර්යන්තය භාවිතා කරනු ලබන බව සහ 2014 වර්ෂය තුළ ගුවන් මගීන් 06 දෙනෙකු විසින් පමණක් අවස්ථා 391 කදී රු. බිලියන 0.02 ක් වටිනා වාණිජ ස්වරූපයේ භාණ්ඩ රැගෙන විත් තිබෙන බව පෙන්වා දී තිබුණි.

- රාජසන්තක කළ භාණ්ඩ ගබඩා කිරීමේ, තක්සේරු කිරීමේ හා විකිණීමේ ක්‍රියාවලියේ දුර්වලතා නිරීක්ෂණය විය.

- ආනයනකරුවන් විසින් ආනයනය කිරීමෙන් අනතුරුව අත්හරින ලද භාණ්ඩ සම්බන්ධයෙන් සිදු කර ඇති රේගු විමර්ශනවලදී, විමර්ශන මෙහෙවන නිලධාරීන්ගේ අභිමතය පරිදි දණ්ඩන නියම කිරීම, භාණ්ඩවල වටිනාකම ඌණ තක්සේරු කිරීම, රේගු වැරදි සිදුකල ආනයනකරු වෙතටම භාණ්ඩ නිදහස් කිරීම, රේගු විමර්ශන කඩිනමින් සිදු නොකිරීම හේතුවෙන් භාණ්ඩ විනාශ වීම, යල් පැනීම ආදී කරුණු හේතුවෙන් ප්‍රමාණවත් පරිදි රාජ්‍ය ආදායම සුරක්ෂිත නොවූ අවස්ථා පැවති අතර එවැනි අවස්ථා 02 කදී පමණක් රු.බිලියන 0.04 කින් රජයේ ආදායම අහිමි වී තිබුණි.

- සමුද්‍ර මුර සංචාරක කටයුතු සඳහා යාත්‍රා, රියදුරු සහ ලස්කාර් නිලධාරීන් ප්‍රමාණවත් පරිදි අනුයුක්ත කර නොතිබීමෙන් නීති විරෝධී ආනයනයන් පාලනය කිරීම සඳහා ප්‍රාදේශිය රේගු නිවාරණ කාර්යාලවල කාර්යභාරය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

- රේගු වැරදි හා වංචා කිරීම්වලට අදාලව දණ්ඩන පැනවීමෙන් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ශ්‍රී ලංකා රේගුව විසින් 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙලින් රු.බිලියන 2.98 ක හා රු. බිලියන 2.63 ක ආදායමක් උපයාගෙන/රැස්කරගෙන තිබුණු අතර එම ආදායමෙන් රාජ්‍ය ආදායමට බැර කර තිබුණේ සියයට 30 ක් එනම්, පිළිවෙලින් රු. බිලියන 0.90 ක් සහ රු. බිලියන 0.788 ක්, පමණක් වීම සහ ඉතිරි සියයට 70 ම එනම්, පිළිවෙලින් රු. බිලියන 2.09 ක් සහ රු. බිලියන 1.82 ක් රේගු නිලධාරීන්ට තැගි සඳහා සහ සුභ සාධන කටයුතු සඳහා වෙන් කර තිබීම කැපී පෙනුනි.

## සුරාබදු දෙපාර්තමේන්තුව

- 2010 දෙසැම්බර් 31 දිනට පැවති රු.බිලියන 0.5 ක් වූ සුරාබදු හිඟ හිට ඇති ආදායම 2014 දෙසැම්බර් 31 දින වන විට රු.බිලියන 1.535ක් දක්වා සීග්‍රයෙන් වර්ධනය වෙමින් පැවතියද , හිඟහිට ඇති ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක නොවීම හා හිඟ බදු ආදායම් අයකර ගැනීමට කාලීන හා අර්ථාන්විත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- මත්පැන් අපනයනයේදී අපනයන බදු ප්‍රතිදාන ලබාදීම සඳහා දෙපාර්තමේන්තුව රේගු අපනයන පත්‍ර (Customs Export Entry) පමණක් පදනම් කරගනු ලබන අතර, සත්‍ය වශයෙන්ම අපනයනය කරන ලද ප්‍රමාණය දැන ගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් සකසා නොතිබුණි.

- මත්පැන් නිෂ්පාදන සමාගම්වලට අනුයුක්ත කර ඇති නිලධාරීන් මඟින් සිදු කරනු ලබන ආදායම් රැස්කිරීමේ කාර්යය,දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ සෝදිසි පරීක්ෂාවකට ලක් කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් සිගරට් අපනයනය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කරනු ලැබුවද, අපනයනය කරනු ලබන සිගරට් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම අපනයනය කර තිබේද යන වග තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

- ස්ප්‍රීතු දේශීයව මිලදී ගැනීමේදී හා ආනයනයේදී අය කරනු ලබන රඳවා ගැනීමේ බදු මුදල් එම ස්ප්‍රීතු යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් සඳහා අදාල සුරාබදු ගෙවීමේදී හිලව් කිරීමට ඉඩදෙනු ලැබුවද, රු.බිලියන 0.51 ක් වූ රඳවා ගැනීමේ බදු මුදල් සුරාබදු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

- පහසුවෙන් හා නිවැරදිව සුරාබදු ආදායම එකතු කිරීම හා ගිණුම්ගත කිරීමට සුදුසු පරිගණක ජාල පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

- සුඛෝපභෝගී බදු අයකර ගැනීමේ කටයුතු නිසි පරිදි ඉටු නොකරන ලද රක්ෂණ ආයතන 18 සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- සුඛෝපභෝගී බදු ගෙවීම් පැහැර හරිනු ලබන වාහන හිමියන් 371 සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කර නොතිබුණි.

- සුනාමි, ත්‍රස්තවාදී ව්‍යසනයන්ගෙන් හෝ අනතුරකට පත් වී හෝ වෙනත් ලෙසකින් සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලද වාහන සම්බන්ධයෙන් පනතේ විධිවිධාන අනුව කටයුතු කර වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

- අවලංගු කරන ලද මෝටර් වාහන පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබුණි.

- දිවයින තුළ සත්‍ය වශයෙන්ම ධාවනය කරනු ලබන වාහන ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යාත්මක තොරතුරු හඳුනාගත හැකි පරිදි ලේඛණ පවත්වා නොතිබුණි.

- දෙපාර්තමේන්තුවේ දෛනිකව ලියාපදිංචි කරනු ලබන වාහනවල මුල් ලිපිගොනු ආරක්ෂා කර තබා ගැනීම දෙපාර්තමේන්තුව විසින් ඉටු කල යුතු අත්‍යවශ්‍ය වූ මූලිකම කාර්යභාර්යක් වුවද, වාහනවල මුල් ලිපිගොනු විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තු භාරයේ නොමැතිවීම/අස්ථානගත වීම සිදු වන බව පසුගිය වර්ෂ ගණනාවක සිට විගණනයෙන් දිගින් දිගටම පෙන්වා දී තිබියදීත්, එම ලිපිගොනු ආරක්ෂා කර ගැනීමේ තම වගකීම නිලධාරීන් පැහැර හැර තිබුණි.

- විශේෂයෙන් පසුගිය වර්ෂ 04 තුලදී පමණක් විගණනයට අත්‍යවශ්‍ය/ වංචනික ක්‍රියාවලට සම්බන්ධ ලිපි ගොනු 597 ක් විගණනයට මෙතෙක් ලබා දී නොතිබුණි.

- යථෝක්ත පරිදි වගකිව යුතු නිලධාරීන් වාහනවල මුල් ලිපිගොනු ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම පසුගිය වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම විගණනයෙන් පෙන්වා දී තිබුණු, වංචා, අක්‍රමිකතාවයන් සහ රජයට විශාල වශයෙන් ආදායම් අහිමිවීම්වලට ප්‍රධානතම හේතුව වී තිබුණි.

- එලෙසම වංචනික ලෙස ලියාපදිංචි කිරීමේ අරමුණින් යතුරු පැදි 141ක් පමණක් ආනයනය කරන ලද රේගු සටහන්කර 85කින් යතුරු පැදි 2577ක් ආනයනය කල ලෙසද කිසිඳු යතුරු පැදියක් ආනයනය නොකල රේගු සටහන්කර 07 කින් යතුරු පැදි 2098ක් ආනයනය කල ලෙසද දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණි.

- අනතුරකට පත්ව හෝ වෙනත් අයුරකින් ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල හඳුනාගැනීමේ අංකය යටතේ නීති විරෝධී ලෙස ආනයනය කරන ලද හෝ සකසන ලද නවීනතම වාහන දිගින් දිගටම ලියාපදිංචි කර තිබීම විගණනයෙන් පෙන්වා දී තිබුණද එවැනි වාහන 29 ක් පිළිබඳවද දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- දැනටමත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පැරණි වාහන අංකයන් යටතේ වූ වාහනවල වැසි අංකය සඳහන් කර නවීනතම වාහන පැරණි අංක යටතේ ධාවනය කිරීමට අවකාශ සලසාදී තිබීම පිළිබඳව විගණනයෙන් පෙන්වා දී තිබුණ එවැනි වාහන 05 ක් පිළිබඳවද දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- 2009 අංක 08 දරන මෝටර් රථ වාහන (සංශෝධන) පනතේ 16 වන වගන්තිය මඟින් කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ මෝටර් වාහනයක් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය හෝ එහි නිර්මාණ වෙනස් නොකල යුතු බව දන්වා ඇත. එහෙත් මෙකී විධිවිධාන උල්ලංඝණය කරමින් වාහන 26 ක නිර්මාණ ස්වරූපය මුළුමනින්ම වෙනස් කර තිබූ බව විගණනයෙන් පෙන්වා දී තිබුණද, එවැනි වාහන පරීක්ෂා කර නෛතික විධිවිධාන අනුව ක්‍රියාකිරීමට කටයුතු කිරීම වෙනුවට එම තත්ත්වය නීත්‍යානුකූල වන පරිදි දෙපාර්තමේන්තුවේ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර තිබුණි.

- සිංගල් කැබ් රථ ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර පසුව, ජීප් රථ ලෙස පරිවර්තනය කර ඇති වාහන 18 කින් සුඛෝපභෝගී බදු රු. බිලියන 0.004 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- අඩු රේගු බදු ගෙවා ආනයනය කරනු ලබන විශේෂකාර්යය වාහනවලින් වාහන 22 ක් ද්විත්ව කාර්යය වෑන් ලෙස හා වාහන 56 ක් මෝටර් ලොරි ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම මඟින් විශාල වශයෙන් රජයේ ආදායම අහිමි කිරීම සහ වසර 7 ක් දක්වා වූ පැරණි වාහන රට තුලට පැමිණ තිබූ බව නිරීක්ෂණය විය.

- නීති විරෝධී ලෙස ආනයනය කරන ලද හෝ කොටස් එකලස් කර සකසන ලද යතුරු පැදි විශාල ප්‍රමාණයක් දිනපතා වංචනික ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම මඟින් රජයට විශාල බදු ආදායමක් අහිමි වීම සහ 2014 ජූනි මාසයේ දින 05ක් තුලදී පමණක් එවැනි ලියාපදිංචි කිරීම් 108 ක් සිදු කර තිබුණි.

- යථෝක්ත නීති විරෝධී කටයුතු පිළිබඳව විගණනයෙන් දිගින් දිගටම පෙන්වා දී තිබුණද වගකිව යුතු නිලධාරීන් එම නීති විරෝධී කටයුතු වැළැක්වීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර එම නීති විරෝධී ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

# රාජ්‍ය ව්‍යවසායන්

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන රාජ්‍ය ව්‍යවසායන් ජලය,විදුලිය, ඛනිජ තෙල් වැනි භාණ්ඩ හා සේවා සැපයීමේ නියැලෙන ජාතික ආර්ථිකයේ උපාය මාර්ගික අංශයන්හි නිරත වේ. මෙම ව්‍යවසායන්හි මූල්‍ය මෙන්ම මෙහෙයුම් කාර්යසාධනය රටෙහි සාර්ව ආර්ථිකයේ ස්ථායිතාවය සඳහා සෘජු බලපෑමක් ඇති කරයි. එමෙන්ම විශේෂිත වූ හා පොදු අරමුණු සඳහා පිහිටුවන ලද අරමුදල් ද ස්ථාපිත කොට තිබේ. 2014 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසාය හා අරමුදල්වල මූල්‍ය කාර්යසාධන පිළිබඳ විශ්ලේෂණයක් මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කර ඇත.


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි ව්‍යවස්ථාව අනුව රාජ්‍ය ව්‍යවසායන් යනු " රාජ්‍ය ප්‍රදාන, රාජ්‍ය ණය හෝ වෙනත් ආකාරයකින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ප්‍රාග්ධනයට දායකවීම මඟින් රජයේ පාලනය සඳහා ප්‍රමාණවත් අයිතියක් ඇති ඕනෑම සංස්ථාවක්, මණ්ඩලයක් හෝ සමාගම් පනත හැර වෙනත් ඕනෑම ලිඛිත නීතියක් මත ස්ථාපනය කරන ලද ආයතනයක්" වේ.


මෙම විශ්ලේෂණය සඳහා අරමුදල්, රජයේ විශ්ව විද්‍යාල ඇතුළු රාජ්‍ය සංස්ථා 276 ක් රාජ්‍ය ව්‍යවසායන් ලෙස පුළුල්ව හඳුනා ගන්නා ලද අතර එහි ස්වාභාවය, ප්‍රමාණය හා මෙහෙයුම් අනුව ප්‍රධාන අංශ පහකට පහත පරිදි වර්ග කර ඇත.

| වර්ගීකරණය | ආයතන සංඛ්‍යාව |
|---|---|
| විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් (SBE) | 53 |
| නියාමන හා අධීක්ෂණ ආයතන (RMI) | 22 |
| විශ්ව විද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණු ආයතන (URT) | 74 |
| අනෙකුත් සංවර්ධන හා ලාභ අරමුණු කර නොගත් ආයතන (DNP) | 64 |
| අරමුදල් (FUN) | 69 |
| **එකතුව** | **282** |

කෙසේ වෙතත්, 2015 ඔක්තෝබර් 20 දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් වී ඇති මූල්‍ය ප්‍රකාශ මත පදනම්ව මෙම විශ්ලේෂණය සිදු කර ඇත. එදින වන විට 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට රාජ්‍ය ව්‍යවසායන් හා අරමුදල් 43 ක මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් වී නොතිබුණු අතර එහි SBE 13, RMI 1, URT 6, DNP 15 සහ FUN 8 ක් අන්තර්ගත වේ. ජනදිරිය අරමුදල හා නාවික සංවර්ධන අරමුදල මෙම වර්ෂයේ දී අක්‍රීයව පැවතිණි . සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය දිවි නැගුම දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කර ඇති අතර එය තවදුරටත් රාජ්‍ය ව්‍යවසායක් ලෙස හඳුනාගත නොහැක. එමෙන්ම 2014 වර්ෂයේදි ශ්‍රී ලංකා භූවිද්‍යා ආයතනය ස්ථාපිත කර ඇත.


2014 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන්හි මුලු ආදයම රුපියල් බිලියන 1,431 ට වඩා වැඩි අගයක් ගෙන තිබුණු අතර එය මුලු රාජ්‍ය ආදායමද ඉක්මවා තිබුණි. එය ඉකුත් වර්ෂයේ ආදායම හා සැසඳීමේදී සියයට 9 ක වැඩිවීමකි. මුලු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 9,000 ඉක්මවා තිබුණු අතර එය ඉකුත් වර්ෂය හා සැසදිමේදි සියයට 15 කින් වැඩි වී තිබුණි. 2014 දෙසැබර් 31 දින වන විට රාජ්‍ය ව්‍යවසායන්හි වත්කම් හා ආදායමෙහි සංයුතිය A හා B රූප සටහන් මඟින් පෙන්වා ඇත.





රූප සටහන් A අනුව වැඩිම වත්කම් ප්‍රමාණය SBE සතු වන අතර එය මුලු වත්කම් ප්‍රමාණයෙන් සියයට 59 ක් නිරූපණය වේ. අනතුරුව වැඩිම වත්කම් ප්‍රමාණයක් FUN සතු වන අතර එය මුලු වත්කම්වලින් සියයට 18 ක් වේ. එසේම රූප සටහන් B අනුව වැඩිම ආදායම් උපයා ඇත්තේ SBE වන අතර එය මුලු ආදායමෙන් සියයට 76 කි. අනතුරුව FUN වැඩි ආදායමක් උපයා ඇති අතර එය සියයට 13 කි. මෙමඟින් SBE හා FUN මුලු ආදායමෙන් සියයට 89 ක් උපයා ඇති අතර මුලු වත්කම් ප්‍රමාණයෙන් සියයට 77 කට දායකත්වයක් ලබා දී ඇත. එම නිසා මෙම කාණ්ඩයන්ට අදාළව ගනු ලබන උපාය මාර්ගික තීරණ රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය කාර්යසාධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි.

තවදුරටත් C හා D රූපසටහන් මඟින් පෙන්නුම් කර ඇති පරිදි වැඩිම ආදායමක් උපයන රාජ්‍ය ව්‍යවසායන් 10 මඟින් ලද රාජ්‍ය ප්‍රදාන හැර මුලු ආදායමෙන් සියයට 87 ක් මෙම වර්ෂයේදී උපයා ඇති අතර එය ඉකුත් වර්ෂයේ දී සියයට 86 ක් වේ. එමෙන්ම මෙම වර්ෂයේදී හා පෙර වර්ෂයේ දී මුලු වත්කම්වලින් සියයට 89 ක් වැඩිම වත්කම් ප්‍රමාණයක් ඇති රාජ්‍ය ව්‍යවසායන් 10 සතු වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉහලම ආදායමක් උපයා ඇති අතර එය මුලු ආදායමෙන් සියයට 39 ක් වන අතර වැඩිම වත්කම් ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල සතු වන අතර එය මුලු වත්කම් ප්‍රමාණයෙන් සියයට 16 ක් වේ. එමනිසා රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය කළමණකරනය පිලිබඳව සලකා බැලීමේ දී මෙම ආයතන කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතු වේ.




## ලාභදායීත්වය

රාජ්‍ය ව්‍යවසායන්හී බදුපෙර ලාභය 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 14 ක ප්‍රමාණයකින් වර්ධනය වී ඇත. කෙසේ වුවද, විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හී ලාභදායීත්වය වර්ධනය වී ඇත්තේ සියයට 11 ක ප්‍රමාණයකිනි. රාජ්‍ය ව්‍යවසායන් 71 ක ප්‍රමාණයක් 2014 වර්ෂයේදී සෘණ බදුපෙර ලාභයක් උපයා ඇති අතර 2013 වර්ෂයේදී එම ප්‍රමාණය 77 ක අගයක් ගෙන තිබුණි. මේ තුළ SBE7 , RMI7, URT32,DNP20 සහ FUN5 අන්තර්ගත වේ. මෙහි සුවිශේෂත්වය වන්නේ 2013 වර්ෂයේදී ශුද්ධ අලාභ ලබා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 24 ක ප්‍රමාණයක් 2014 වර්ෂයේදී ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර 2013 වර්ෂයේදී ශුද්ධ ලාභ ලබා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 18 ක ප්‍රමාණයක් 2014 වර්ෂයේදී ශුද්ධ අලාභ ලබා තිබුණි.

මහා පරිමාණයෙන් අලාභයන් ලබන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් කිහිපයක් පවතින අතර එයින් වැඩි ප්‍රමාණයක් DNP සහ URT ට අයත් වූ අතර එවැනි ව්‍යවසායන් ලෙස ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය දැක්විය හැක. ශ්‍රී ලංකා මහ බැංකුව විශාලතම අලාභය ලබා ඇති අතර එය රුපියල් බිලියන 30 කට අධික වේ. කෙසේ වුවද විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් ගණයට වැටෙන සමහර රාජ්‍ය ව්‍යවසායන්ද මහා පරිමාණයෙන් අලාභ ලබන අතර ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය ඒ යටතේ දැක්විය හැක. අපගේ ඇගයීමට අනුව අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන් අතුරින් විශාල රාජ්‍ය ව්‍යවසායන් ප්‍රමාණයක් දිගින් දිගටම අලාභයන් ලැබීමට හේතු ලෙස පරිපාලනයෙහි සහ යහපාලනයේ දුර්වලතාවය, අඩු සේවක ඵලදායීතාවය, දුර්වල මූල්‍ය කළමනාකරණය, අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවය සහ ව්‍යුහාත්මක ඌනතාවයන් දැක්විය හැක. ඉතා විශාල රාජ්‍ය ව්‍යවසායන් ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු ඌණ තරඟකාරීත්වයක් යටතේ හෝ කිසිදු තරඟකාරීත්වයක් නොමැතිව ක්‍රියාත්මක වේ. එමනිසා පුද්ගලික ව්‍යවසායන් මෙන් වෙළඳපල තුල පැවැත්ම හෝ රැඳීසිටීම වර්ධනය කිරීම සඳහා ලාභදායීත්වය උපරිම කිරීමට ඇති අවධානයෙහි අඩුවක් දක්නට ලැබේ. කලින් කලට පාලනය වෙනස් වීම හේතුකොටගෙන දිගුකාලීන සංතතික සැලසුම් සහ කෙටි කාලීන ඉලක්කයන්හී දුර්වලතාවයක් සාමාන්‍යයෙන් දක්නට ලැබේ. එමනිසා සමහර රාජ්‍ය ව්‍යවසායන්හී කළමනාකාරීත්වය සමාජීය හෝ

ආර්ථික වශයෙන් ශක්‍යතාවයක් නොමැති, රාජ්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි කඩකිරීම සිදුවිය හැකි තීරණ ගැනීමට පෙළඹීමක් දක්නට ලැබේ.

## අනෙකුත් ආදායම්

රාජ්‍ය ව්‍යවසායන්හී අරමුදල් ආයෝජනය මහාභාණ්ඩාගාරයෙහි අනුමැතිය නොමැතිව සිදුකල නොහැකි වන අතර ඒවාහී අතිරික්ත අරමුදල් වෙතොත් ඒවා 1971 අංක 38 දරන මුදල් පනතට අනුව මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල යුතුය. කෙසේ වුවද මෙම විධිවිධානයන්ට පටහැනිව බහුතර රාජ්‍ය ව්‍යවසායන් සංඛ්‍යාවක් ආයෝජන මඟින් ආදායම් උපයනු ලබයි. ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් ඔවුන්ගේ දෛනික වියදම් පියවා ගැනීම ඔවුන්ගේ ප්‍රධාන ක්‍රියාකාරකම් තුලින් ජනනය වන ආදායමෙන් සිදු නොකරන අතර එය ආයෝජන මඟින් උද්ගත වන ආදායමෙන් පියවා ගනු ලබයි.එමගින් රටට එකතු කල අගයක් බිහි කිරීම සීමා කරනු ඇත. මීට අමතරව රාජ්‍ය ව්‍යවසායන්හී කළමනාකාරීත්වය විසින් ඔවුන්ගේ කාලය ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වලට වඩා අරමුදල් ආයෝජන කළමනාකරණය සඳහා යොදවනු දක්නට ලැබේ.

බොහෝ රාජ්‍ය ව්‍යවසායන් ඒවාහී මුලු වියදමෙන් සියයට 50 වැඩි ප්‍රතිශතයක් රජය මගින් ලබාදෙන දායකය මගින් ආවරණය කරගනු ලබන අතර මින් වැඩි ප්‍රමාණයක් URT වන අතර SBE 3ක් ද මේ අතර වේ. කෙසේ වුවද විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් සහ අරමුදල් සඳහා ලැබී ඇති පුනරාවර්තන ප්‍රදාන ඔවුන්ගේ මුළු ආදායම හා සසඳා බලනකල සියයට 1 කට අඩු ප්‍රමාණයක් වුවත් URT හී මුළු ආදායමෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රතිශතයක් පුනරාවර්තන ප්‍රදානයන්ගෙන් සමන්විත වේ.

## වියදම්

පුද්ගල පාරිශ්‍රමිකය පරිපාලන වියදම් තුල සැලකියයුතු අගයක් ගනු නිරූපණය කෙරේ. කෙසේ වුවද පුද්ගල පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශන තුල පැහැදිලිව දක්වනු ලබන්නේ රාජ්‍ය ව්‍යවසායන් 101 ක පමණි. මෙම ආයතන අතරින්, පෙර වසර හා සසඳා බලන කල පුද්ගල පාරිශ්‍රමික වියදම සියයට 11 කින් වර්ධනය වී ඇත. විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් 8 ක් සහ අරමුදල් 3ක් ඇතුළුව රාජ්‍ය ව්‍යවසායන් 56 ක් ඔවුන්ගේ මුළු වියදමෙන් සියයට 53 කට වැඩි ප්‍රතිශතයක් පුද්ගල පාරිශ්‍රමික සඳහා වියදම් කරනු ලබයි. ඊට අමතරව, විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන් 3 ක් සහ එක් අරමුදලක් ඇතුළුව රාජ්‍ය ව්‍යවසායන් 67 ක පුද්ගල පාරිශ්‍රමික වියදම ප්‍රධාන ක්‍රියාකාරකම් තුලින් ජනනය වන මුළු ආදායමට වඩා වැඩි බව පෙනීයයි. ඒ අනුව මෙම ආයතන සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමැතිව පවත්වා ගැනීමට නොහැකි බව තහවුරු වේ.කෙසේ වුවද විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හී එකතු කල වටිනාකමක් හෝ ප්‍රධාන ක්‍රියාකාරකම් තුලින් ජනනය වන ආදායමක් ලෙස හඳුනාගතහැකි ආදායම මූලිකවම සියයට 7 ක ප්‍රමාණයකින් පමණක් වැඩිවී ඇත. ඇතැම් ලාභ අරමුණු කරගත් විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්ද ඔවුන්ගේ වර්ෂයේ ආදායමට වඩා වැඩි ප්‍රතිශතයකින් පුද්ගල පාරිශ්‍රමික සඳහා වියදම් දරනු ලබයි. ඒ අනුව ක්‍රමවත් පුහුණුවක් සහ රාජ්‍ය අංශය දියුණු කිරීම සඳහා වන ආකල්පයන් ගොඩනැගීම තුලින් කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා රාජ්‍ය සේවකයන් කටයුතු කල යුතු බව මින් නිරූපණය වේ.
අනිකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් වල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දරන වියදම් වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දරන වියදම මුලු වියදමින් සියයට 0.1 ටත් වඩා අඩු මට්ටමක පවතී. රාජ්‍ය ව්‍යවසායන් වල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා මුලු

වියදමින් සියයට 1.21 ක් වූ ඉහලම පිරිවැය දරා ඇත්තේ URT යටතේ ඇති ව්‍යවසායන් වේ. URT යටතේ ඇති ව්‍යවසායන් වලින් බහුතරයක් පර්යේෂණ ආයතන හා විශ්වවිද්‍යාල වන අතර එම ඇතැම් ආයතන වල මුලු ආදායමින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ප්‍රදාන වේ. මෙම කරුණු සැළකිල්ලට ගත් විට, URT යටතේ ඇති ව්‍යවසායන් ඒවායේ මුලු වියදමින් සැලකිය යුතු ප්‍රමාණයක් පර්යේෂණ හා සංවර්ධන කටයුතු මත වියදම් කර නොමැත. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා අවම මුදල් ප්‍රමාණයක් වැය කර ඇත්තේ SBE වන අතර එය මුලු වියදමින් සියයට 0.01 කි. ඒ අනුව රාජ්‍ය ව්‍යවසායන් දිගු කලක සිට නව භාණ්ඩ හා සේවා නිපදවීමට එහි ඇල්ම ඇති පාර්ශවයන් අභිප්‍රේරණය කිරීම සඳහා ඉතා වැදගත් වන පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් වියදම් කර නොමැත.

රාජ්‍ය ව්‍යවසායන් වල මූල්‍ය පිරිවැය එහි මුලු වියදමින් සියයට 2.73 කි. අනිකුත් වර්ගීකරණ අතුරින්,මුලු වියදමින් ඉහලම ප්‍රතිශතය වූ 8%ක් වන මූල්‍ය පිරිවැය දරා ඇත්තේ DNP යටතේ ඇති ආයතන වේ. රාජ්‍ය ව්‍යවසායන් වලින් කිහිපයක් තම මූල්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ආයෝජන තිබියදීත් වෙනත් ණය ලබා ගත හැකි මූලාශ්‍ර වලට වඩා වැඩි පොලී අනුපාතිකයක් ඇති බැංකු අයිරා භාවිතා කොට ඇත. එම නිසා රජය විසින් ආයෝජනය කර ඇති අරමුදල් වලින් ලබා ගත හැකි උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා මනා මූල්‍ය කලමනාකරණයක් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

රාජ්‍ය ව්‍යවසායන් ආදායම් බදු ගෙවීම මගින් රජයට තම දායකත්වය ලබා දී ඇත. එය ආසන්න වශයෙන් රුපියල් මිලියන 5,099 ක් වන අතර එයින් වැඩි කොටසක් සඳහා දායක වී ඇත්තේ SBE වේ.

## මූල්‍ය ව්‍යුහය

රාජ්‍ය ව්‍යවසායන් වල මූල්‍ය සංයුතිය අනුව, ජංගම අනුපාතය 0.72ක් ලෙස දැක්වෙන අතර, එයින් පිළිබිඹු වන්නේ ජංගම වත්කම් වලට වඩා ජංගම වගකීම් පවතින බවත් ඒක්ශණ වගකීම් පියවීම සඳහා ඔවුන්ගේ ද්‍රවශීලතා වත්කම් ප්‍රමාණවත් නොවිය හැකි බැවින් එය කෙටි කාලීන මූල්‍ය බැඳීම් පියවීමෙහි ලා අහිතකර තත්වයක් පෙන්නුම් කරයි. අහිතකරම ජංගම අනුපාතය වූ 0.44 පෙන්නුම් කරනු ලබන්නේ RMI යටතේ වූ ව්‍යවසායන් වේ. SBE යටතේ ඇති ව්‍යවසායන්හි ජංගම අනුපාතයද සියයට 0.78 ක් වන අතර එයද අවධානම් තත්වයක් පෙන්නුම් කරයි.

රාජ්‍ය ව්‍යවසායන් වල මූල්‍ය ප්‍රකාශ අනුව ජංගම වත්කම් සියයට 40 ක් වන අතර, සියයට 60 ක් ජංගම නොවන වත්කම් වේ.එම වත්කම් මූල්‍යනය කර ඇත්තේ සියයට 55 ක් වූ කෙටි කාලීන අරමුදල් ප්‍රභවයන්ගෙන් හා සියයට 45 ක් වූ දිගු කාලීන අරමුදල් ප්‍රභවයන් වලිනි. එයින් පිළිබිඹු වන්නේ දිගු කාලීන වත්කම් වලින් කොටසක් මූල්‍යනය කර ඇත්තේ කෙටි කාලීන අරමුදල් ප්‍රභවයන්ගෙන් වන බවයි. එනම් ජංගම නොවන වත්කම්වලින් සියයට 25 ක් මූල්‍යනය කර ඇත්තේ කෙටි කාලීන මූල්‍ය ප්‍රභවයන්ගෙනි. මෙසේ කෙටි කාලීන වත්කම් හා කෙටි කාලීන මූල්‍ය ප්‍රභව අතර ඇති අසමතුලිතතාව හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායන්හි දිගු කාලීන ස්ථාවරත්වය මෙන්ම කෙටි කාලීන ද්‍රවශීලතාවයට ද විශාල ගැටලුවක් විය හැකිය. මෙය ආක්‍රමණශීලි ප්‍රවේශයකි.

දිගු කාලීන වත්කම් හා කෙටි කාලීන වත්කම් වලින් කොටසක්,දිගු කාලීන මූල්‍ය ප්‍රභව සමග කලමනාකරණය කිරීම හා කෙටි කාලීන මූල්‍ය ප්‍රභව සමග සමතුලිත කිරීම සඳහා මධ්‍යස්ථ මූල්‍ය ප්‍රවේශයක් අවශ්‍ය කෙරේ. මූලික වශයෙන් SBE හා RMI යටතේ වූ ව්‍යවසායන් වල ජංගම වත්කම් හා

ජංගම වගකීම් අතර අසමතුලිතතාවක් පෙන්නුම් කරයි. SBE හා RMI වල ජංගම නොවන වත්කම්වලින් පිලිවෙලින් සියයට 34 ක් හා සියයට 72 ක් මූල්‍යනය කර ඇත්තේ කෙටි කාලීන මූල්‍ය ප්‍රභවයන්ගෙනි. RMI හි මුලු වෙනසට විශාල වශයෙන් හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.කෙසේ වුවද, මධ්‍යස්ථ ප්‍රවේශය අනුව රාජ්‍ය ව්‍යවසායන් ඔවුන්ගේ දිගුකාලීන හා කෙටි කාලීන වත්කම් කලමනාකරණය පිලිබඳ වැඩි අවධානයක් යොමු කල යුතු අතර, ආයතනයක් විසින් තම සියලු අරමුදල් අවශ්‍යතා දිගුකාලීන අරමුදල් වලින් මූල්‍යනය කල යුත්තේ සහ කෙටි කාලීන මූල්‍යනය භාවිතා කල යුත්තේ හදිසි හා අනපේක්ෂිත ගෙවීම් සඳහාය.

රාජ්‍ය ව්‍යවසායන්හි ණය ප්‍රග්ධන අනුපාතය 1.7ට වඩා වැඩි අතර එය ආයතන වල දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වයට අහිතකරව බලපාන අතර විශාල මූල්‍ය පිරිවැයක් දැරීමට සිදු වේ.කෙසේ වුවද,SBE හි ණය ප්‍රග්ධන අනුපාතය 3ක් වන විටදී RMI හි ණය ප්‍රාග්ධන අනුපාතය 15 කි. RMI හි මෙම බලබැම සඳහා මූලික වශයෙන් හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.

ඇතැම් රජ්‍ය ව්‍යවසායන්හි බදු පසු ලාභයක් උපයා ඇතත් ඒවායෙහි ශුද්ධ වත්කම් තත්වය සෘණ අගයක් ගනී. ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව එයට නිදසුනකි. මීන් බොහෝ ආයතන වල මෙම අහිතකර තත්වය දිගු කාලයක් පුරා අඛණ්ඩව පවතී. එයින් පිළිබිඹු වන්නේ එම ආයතන තමාගේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කර ගැනීම සඳහා රාජ්‍ය ප්‍රදාන මත දැඩිව රදා පවතින බවයි. එයින් ඇතැම් ආයතන අය කිරීමකින් තොරව හෝ සහනාධාර වශයෙන් මහජනතාවට අත්‍යාවශ්‍ය සේවා ප්‍රතිපාදනය කිරීම ඉලක්ක කර ගත් හා ලාභ අරමුණු කර නොගත් ආයතන වේ. කෙසේ වුවද ඉහළ සෘණ ශුද්ධ වත්කම් තත්වයක් ඇති ලාභ අරමුණු කර ගත් ආයතනද SBE යටතේ ඇත.

ඇතැම් රාජ්‍ය ව්‍යවසායන්හි විශේෂයෙන් DNP හා URT යටතේ ඇති ව්‍යවසායන් ඔවුන් ගේ ප්‍රකාශිත ප්‍රාග්ධනය වෙනම හඳුනා ගෙන නොමැත. රාජ්‍ය ව්‍යවසායන් සංස්ථාගත කිරීමේදී රාජ්‍ය ප්‍රදාන ලැබීම් ප්රකාශිත ප්‍රාග්ධනය ලෙස හඳුනා ගැනීම පිළිබඳ හා කලින් කලට විශේෂ කාර්යන් සඳහා ලබාදෙන ප්‍රදාන වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීම පිලිබඳව රජය මග පෙන්වීම් සපයා ඇත. ප්‍රකාශිත ප්‍රාග්ධනය නිරන්තරයෙන් වෙනස්වීම හා බොහෝ අවස්ථා වලදී ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩුවීමේ තත්වයක් පෙන්නුම් කරන්නේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම හෙතුවෙනි. මෙම ක්‍රියාව රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ මූල්‍ය වාර්තාකරණ රාමුව මගින් අනුමත නොකරයි.

## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරිම

රාජ්‍ය අංශයේ ව්‍යාපාර ව්‍යවසායන් වල මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරිම හා ඉදිරිපත් කිරිම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS & SLFRS) වල ආකෘතියට අනුව සිදුකල යුතු වේ. රාමුවක් සපයයි. කෙසේ වුවත් විශේෂ ව්‍යාපාර ව්‍යවසායන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS & SLFRS) අනුගමනය කිරීම අවශ්‍යවේ. ඒ අනුව රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ 2003 ජුනි 02 අංක PED/12 ට අදාලව වාර්ශික මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුල මූල්‍ය තත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් කරුණු දක්වීම් ඇතුලත් කල යුතු අතර මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුයි. 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයට අදාලව රාජ්‍ය ව්‍යවසායන් 236 විසින් මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිණි. එසේ වුවද රාජ්‍ය ව්‍යවසායන් 66 ක් පමණක් නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇතත් රාජ්‍ය ව්‍යවසායන් 170 ක්

මූල්‍ය ප්‍රකශන ඉදිරිපත් කර ඇත්තේ නියමිත දිනට පසුව වේ.මේ අතරින් රාජ්‍ය ව්‍යවසයන් 65ක් පමණ ඔවුන් ගේ මූල්‍ය ප්‍රකශන නියමිත දිනට මාස තුනකට වඩා ප්‍රමාදවී ඉදිරිපත්කර ඇත. රාජ්‍ය ව්‍යවසයන් 38ක් හා අරමුදල් ඔවුන් ගේ මූල්‍ය ප්‍රකශන අදාල දිනට විගනකාධිපති වෙතට භාරදී නොමැත. රාජ්‍ය වවසයන් 02ක් අදාල වර්ශයේ අක්‍රීයව පවතී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා SLPSAS, LKAS සහ SLFRSs මඟින් ආකෘතිමය රාමුවක් ලබාදෙනු ලැබුවද එකම වර්ගයට අයත් වෙනත් ආයතන මූල්‍ය ප්‍රකශන පිළියෙල කර ඇත්තේ සම්පූර්ණයෙන් එකිනෙකට වෙනස් ආකාරයටය. රාජ්‍ය ව්‍යවසයන් ගේ මූල්‍ය ප්‍රකශන වල සංගතභාවයක් ඇතිකිරීම සඳහා පොදු ආකෘතියක් හඳුන්වාදීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හී අවශයතාවයන්ට අනුකූලව 2000 වෂීයේ ප්‍රසිද්ධ කරන ලද ගැසට් පත්‍රයක් මඟින් රාජ්‍ය ව්‍යවසයන් ලෙස හඳුනා ගනු ලැබූ ආයතන 42ක් විශේෂ ව්‍යාපාර ව්‍යවසායන් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් විශේෂ ව්‍යාපාර ව්‍යවසායන් 55ක් හඳුන්වාදී ඇත. කෙසේ වුවද, විශේෂ ව්‍යාපාර ඒකක වර්ගීකරණයට අදාල ක්‍රමවේදයක් හඳුන්වාදී නොමැත. ඇතැම් ආයතන විසින් රාජ්‍ය ව්‍යවසායන් විවිධාකාරයෙන් වර්ගීකරණය කොට ඇතත් එම වර්ගීකරණයන් අදාල නිර්ණායකයන්ට අනුකූල නොවේ.

## විගණන මතය

රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය සහ මෙහෙයුම් අංශ පිළිබඳ විගණන වාර්තාවන් ඉලක්ක කරන්නුයේ එහි මූල්‍ය කාර්යසාධනය, ආර්ථික කාර්යක්ෂමතාවය, මෙහෙයුම් ඵලදායිතාවය සහ මූල්‍ය තොරතුරු පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමකි. වාර්තාවේ පළමු කොටස මගින් රාජ්‍ය ව්‍යවසායන් විසින් පිළියෙල කර ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරන ලෙස පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවට සාධාරණ තහවුරුවක් ලබා දෙයි. බොහෝ අවස්ථාවලදී ප්‍රමාණාත්මක භාවය, පෘථුල භාවය හා අවප්‍රකාශන්හී බලපෑම අනුව මූල්‍ය ප්‍රකශන වල මතය වෙනස් කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව විගණන මත වර්ග හතරක් ප්‍රකාශ කරනු ලබන අතර ඒවා නම්, තත්වාගණනය නොකල මතය, තත්වාගණනය කල මතය, අහිතකර මතය සහ මතය ව්‍යාචනය කිරීම වේ. රාජ්‍ය ව්‍යවසායන් වල මූල්‍ය ප්‍රකාශන වල තත්වාගණනය නොකල මතයක් මගින් එහි සත්‍ය හා සධාරණ බවට ප්‍රමාණාත්මක තහවුරුවක් ලබා දේ. තත්වාගණනය නොකල මතය හැර අනිකුත් මතයන් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සෘණාත්මක තහවුරුවක් සපයයි. විෂය පථය සීමා කිරීම පෘථුල වීම තුල අහිතකර මතයත්, කළමනාකරණය සමග නොඑකග වීම පෘථුල වීම තුල මතය ව්‍යාචනය කිරීමත් සිදුකරන අතර ඒවා කළමනාකරණයට විශාල බලපෑමක් ඇති කරනු ලබයි. තත්වාගණනය නොකල මතයක් ප්‍රකාශ කල නොහැකි නමුත් කළමනාකරණය සමග නොඑකගතාවයක් පවතින හෝ විෂය පථය සීමා වීමක් ප්‍රමාණාත්මක වන විට අහිතකර මතයක් ප්‍රකාශ කිරීමට තරම් ප්‍රබල නොවන විටදී තත්වාගණනය කල මතයක් සපයයි. තත්වාගණනය කල මතයක් ලබා දීමෙන් අදාල කරුණු හැර අනිකුත් කරුණු පිළිබඳ මතයක් ප්‍රකාශ කරයි.

2014 වර්ෂයේ නිකුත් කරන ලද විගණන වාර්තා අනුව රාජ්‍ය ව්‍යවසායන්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ප්‍රකාශිත විගණන මත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විගණන මත වර්ගය | 2014 | 2013 |
|---|---|---|
| තත්වාගණනය නොකල | 41 | 43 |
| තත්වාගණනය කල | 151 | 181 |
| මතය ව්‍යාවනය | 12 | 9 |
| අහිතකර | 8 | 7 |
| 2015 ඔක්තෝම්බර් 20 තෙක් තීරණයකට නොපැමිණි | 29 | 12 |
| මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොවූ | 43 | 30 |

විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශන මත අහිතකතර මතයන් හා මතය ව්‍යාවනය සඳහා මඟ පෙන්වා ඇති බරපතල අවප්‍රකාශනයන් පෙන්වා දීමෙන් පසු ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගැනීමට කටයුතු කර ඇත . මෙවැනි ආයතන සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සකස් කර ඉදිරිපත් කරන ලෙස විගණන නිරීක්ෂණ මත ඔවුනට උපදෙස් ලබා දී ඇත. නමුත් සමහර රාජ්‍ය ව්‍යවසායන් විසින් මේ වන විටත් විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැති අතර සමහර ආයතන විසින් සැළකිය යුතු ප්‍රමාදයකින් යුතුව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. මෙවැනි හේතු මත මේවන විටද විගණන මතය නිෂ්චය නොවූ අවස්ථා දක්නට ඇත.

## අනෙකුත් පොදු විශේෂ කරුණු

බොහොමයක් රාජ්‍ය ව්‍යවසායන් දිගින් දිගටම නිරවද්‍ය නොවූ ප්‍රතිපත්තීන් අනුගමනය කොට ඇත්තේ විගණකාධිපති විසින් දිගින් දිගටම පෙර කාල පරිච්ඡේද ගණනාවක සිටම ඒවා පෙන්වා දී තිබියදීත් ය. එහිදී තව දුරටත් අවධාරණය කර ඇත්තේ එම නිරවද්‍ය නොවූ ප්‍රතිපත්තීන් නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා ලෙසය.

ස්ථාවර වත්කම් උපලේඛණ සහ ජංගම නොවන වත්කම් මත අනෙකුත් වාර්තා, උදාහරණ ලෙස ඉඩම් සහ ගොඩනැගිලි, මෝටර් වාහන, ලී බඩු, පිරියත හා උපකරණ මත උචිත වාර්තා පවත්වාගෙන යාම සාමන්‍යයෙන් දුර්වල මට්ටමක පවතී. මෙහි ප්‍රතිඵලයක් ලෙස නිරීක්ෂණය කල හැකි වූයේ කෙරීගෙන යන වැඩ වෙනුවෙන් අවශ්‍ය වන ස්ථාවර වත්කම් සඳහා ප්‍රාග්ධන සම්පාදනය සැළකිය යුතු ප්‍රමාදයන් සිදුව ඇත්තේද වගකිව යුතු නිලධාරීන් විසින් සම්පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙනි. සමහර රාජ්‍ය ව්‍යවසායන්ට අයිති ඉඩම් වලට අදාළ වාර්තා සම්පූර්ණ නොවීම හා පිහිටීම සමඟ විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් කිරීමට නොහැකි තත්වයක පසුවීම හේතු කොටගෙන විගණනයේදී ඒවායෙහි පැවැත්ම හා අයිතිය තහවුරු කර ගැනීම අසීරු වී ඇත.

වාණිජමය තීරණ ගැනීම සඳහා මෙන්ම රාජ්‍ය ව්‍යවසායන් සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට බොහෝ අනුමැතීන් අවශ්‍ය වන බැවින් අධ්‍යක්ෂවරුන්හට පවතිනුයේ සීමාසහිත අවස්ථාවන්ය. මේ නිසා බොහෝ රාජ්‍ය ව්‍යවසායන් සඳහා කොන්ත්‍රාත් පදනම මත ඉහළ වැටුපක් ගෙවීමේ පදනමින් සුදුසුකම් ලත් වෘත්තිකයන් බඳවා ගැනීමට හා රඳවා ගැනීමට දුෂ්කරතාවයක් පවතින්නේ ද පෞද්ගලික අංශය හා සැසඳීමේදී රජ්‍ය අංශයේ දුර්වල වැටුප් ව්‍යුහයක් පවතින බැවිනි. ඇතැම් විශාල රාජ්‍ය ව්‍යවසායන්හි මූලික කළමනාකරණ තනතුරු වල ඇබෑර්තු දීර්ඝ කාලයක් තිස්සේ පවතිනුයේ ඒවා සම්පූර්ණ කිරීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම හා සැළසුම් සකස් කිරීමේ පවතින දුර්වලතා හේතුවෙනි.

ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන් විසින්ම උපයන විට ගෙවීම් බදු එහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙනුවෙන් ගෙවා ඇතිබව නිරීක්ෂණයන් තුළින් පෙනීයයි. මෙහිදී තවදුරටත් අවධාරණය කළ හැක්කේ මහා භාණ්ඩාගාරය විසින් උපයන විට ගෙවීම් බදු ගෙවීම ආයතනයෙන් ආයතනයට විචලනය වීම් සිදු නොවීම සඳහා තිරසර විසඳුම් ගත යුතු අතර එහිදී සියළුම රාජ්‍ය නිලධරීන් සඳහා සාධාරණ සැළකිල්ලක් දැක්වීම අවශ්‍ය වේ.

දීර්ඝ කාලයක් තිස්සේ සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් රඳවා තබාගෙන එම අත්තිකාරම් මුදලින් දැනටමත් භාණ්ඩ ලබාගෙන හෝ සේවා සැපයීමද සිදු කර ඇති වුවද ඒවා වියදම් ලෙස ගිණුම් ගත කර නොමැත. තවද පෙරදී ලබා ගත් අත්තිකාරම් මුදල් ගෙවා නිදහස් වීමකින් තොරව සමහර නිලධාරීන් විසින් තව දුරටත් මිලදී ගැනීම් සඳහා හා වෙනත් අත්තිකාරම් මුදල් ලබාදී ඇති අවස්ථා හෙළිදරව් වී ඇත.

මහා පරිමාණ රාජ්‍ය ව්‍යවසායන් විසින් කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාගම් පනත යටතේ සීමා සහිත සමාගම් ව්‍යවස්ථාගත කර ඇති නිසා ඒ හේතුවෙන් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යයන් අඩපනව ඇත. කෙසේ වුවත් සමහර රාජ්‍ය ව්‍යවසායන් සතුව පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් පැවතියද පවතින ස්වකීය පාලන බලයේ දුර්වලතාවයක් පවතී

විගණන වාර්තා මඟින් කලින් නිවේදනය කල ගැටළුවලට අමතරව පහත සඳහන් පොදු ගැටළුද නිරීක්‍ෂණය කල හැකි විය.

- තවදුරටත් භාවිතා කළ හැකි තත්වයේ පවතින දේපල පිරියත උපකරණ වල ඵලදායී ජීව කාලය නැවත අගය කිරීම සඳහා පියවර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල ඇතැම් වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ලෙස දක්වා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය දක්වා ඇත.

- ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වැනි අස්ථිත්වයන්හි සම්බන්ධිත පාර්ශව වල තනි මූල්‍ය ප්‍රකාශන තුලින් පෙන්නුම් කරන පරිදි ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් එකිනෙකට වෙනස්වේ.ඉන් පෙනී යන්නේ සම්බන්ධිත පාර්ශවයන් වන පරිපාලිතයන් අතර සම්බන්ධය දුර්වල බවයි. එමනිසා මූල්‍ය ප්‍රකශන තුල එහි නියම ස්වරූපය අනාවරණය නොවීමේ හැකියවක් පවතී.

- ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් විසින් ඉඩම් අත්පත් කරගැනීම සඳහා අති විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කර ඇති අතර, එම වත්කම් අත්පත්කර ගැනීමේ සිටම අකර්මණ්‍යව පවතී. තවදුරටත් ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් විසින් අවුරුදු කිහිපයකට ඉහතදී විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පෞද්ගලික සමාගම් වලට අත්තිකාරම් ලබාදී ඇත.එම සමාගම් විසින් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොමැති අතර, අනෙක් අතට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආයෝජනය කිරීම තුලින් විශාල පොලී ආදායමක් උපයාගෙන තිබේ.මේවාට හේතු වී ඇත්තේ, රාජ්‍ය ව්‍යවසායන්ට එම අරමුදල් වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වීම සහ අදාල නොවන විශාල පිරිවැයන් දැරීමට සිදුවීමයි.

- ඉන් පෙන්නුම් කෙරෙනුයේ බොහෝ රාජ්‍ය ව්‍යවසායන් විසින් මානව සම්පත් කලමනාකරණය සඳහා ප්‍රමුකත්වයක් ලබා දී නොමැති බවයි. ධාරිතාවය/නිශ්පාදනය වැඩි නොකරමින් අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරේක කාර්යමණ්ඩලයක් සිටීම අස්ථිත්වයේ ප්‍රධාන ගැටලුව වීඇති අතර එහි

ප්‍රතිඵලයක් ලෙස අස්ථිත්වයේ කාර්යක්ෂමතාවය අඩු වේ. කෙසේවෙතත් අධ්‍යක්ෂකවරුන් වැනි වගකිවයුතු නිලතල සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් සිටියත් ඇතැම් අස්ථිත්වයන් තුල ඉල්ලුම් කරන අවම සුදුසුකම් සපුරා නොගත් සහ ඉල්ලුම් කරන ප්‍රමාණයට වඩා වයසින් වැඩි පුද්ගලයන් බඳවාගෙන තිබේ. තවදුරටත් ඇතැම් අස්ථිත්වයන් විසින් උපදේශන සහ වෘත්තීය සේවාවන් භාවිතා කරන අතර, එම තනතුරු සඳහා කාර්යමණ්ඩලය තුල සුදුසුකම් ලත් සේවකයන් සිටියත් ඒ සඳහා බාහිර පාර්ශවයගෙන් බඳවාගැනීම් සිදුකරයි. ඒ හේතුවෙන් අස්ථිත්වයන්ට අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදු වේ.

# පළාත් පාලනය

ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 335 න් මහා නගර සභා 23 ක් 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතින් හා එයට කරන ලද සංශෝධන මගින් පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර, නගර සභා 41 ක් 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතින් හා එයට කරන ලද සංශෝධන මගින් පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රාදේශීය සභා 271 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් හා එයට කරන ලද සංශෝධන මගින් පිහිටුවා ක්‍රියාත්මක වෙමින් පවතින අතර එම සංඛ්‍යාව 2014 දෙසැම්බර් 31 දිනට 335 ක් ව පැවතුණි. මෙම පළාත් පාලන ආයතනයන්ගේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීම, විගණනය සිදුකිරීම හා ගිණුම් පිළිබඳ විගණන මතයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| පළාත් පාලන ආයතන වර්ගය | ගිණුම් ඉදිරිපත් කළයුතු සභා ගණන | 2015 සැප්. 30 දිනට ගිණුම් ඉදිරිපත් කළ සභා ගණන | විගණන වාර්තා නිකුත් කළ සභා ගණන | 2015 සැප්තැම්බර් 30 දිනට වාර්තා අනුව විගණන මතය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය නොකළ | මතය ව්‍යාවනය | අහිතකර මතය |
| මහා නගර සභා | 23 | 22 | 19 | 16 | - | 03 | - |
| නගර සභා | 41 | 40 | 40 | 36 | 01 | 03 | - |
| ප්‍රාදේශීය සභා | 271 | 267 | 261 | 240 | 12 | 02 | 07 |
| **එකතුව** | **335** | **329** | **320** | **292** | **13** | **08** | **07** |

සෑම වර්ෂයකදීම විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු සභාවල හා පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ අවධානයට යොමු කරන ලදී. එහෙත් කලින් පෙන්වා දෙන ලද අඩුපාඩු සෑම වර්ෂයකම විගණනයේදී පෙන්වාදීමට සිදුවී තිබුණි. මෙම පෙන්වා දෙන අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පියවර නොගැනීම නිසා එකම අඩුපාඩුව දිගින් දිගටම වාර්තා කිරීමට සිදුවී තිබුණි. මෙම තත්ත්වය තුළ පළාත් පාලන ආයතනවලට ආධාර සපයන සංවිධාන විසින් ආධාර ලබාදීම විගණන වාර්තාවලින් පෙන්වාදෙන අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසුව ආධාර ලබාදෙන බවට දැනුවත් කිරීම නිසා එම ආධාර ලබාගැනීම සඳහා විගණන වාර්තාවල අඩුපාඩු නිවැරදි කර ඇති බවට නිරවුල් කිරීමේ සහතික ඉල්ලුම් කිරීමේ තත්ත්වයක් තිබුණි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයේ නව වන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බලමණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් පළාත් සභාව ක්‍රියාත්මක කර නොතිබුණු අතර, පළාත් පාලන බලමණ්ඩල ගිණුම් විගණනයේදී අනාවරණය කර ඇති කරුණු පළාත් පාලන බලමණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබුණි.

- පළාත් පාලන ආයතනවල අඩුලුහුඩුකම් සාකච්ඡා කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් පළාත් සභා වෙත වාර්ෂිකව ඉදිරිපත් කරන විස්තරාත්මක වාර්තාව මගින් අවධානය යොමු කරවන ලදී. මොරටුව නගර සභාවේ නගරාධිපතිවරයා විසින් නීතිපතිවරයාගෙන් ලබාගත් මතයක් අනුව පළාත් සභාවලට විගණකාධිපති වාර්තා සාකච්ඡා කිරීමේ බලයක් නොමැති බව ප්‍රකාශ කිරීම නිසා, බස්නාහිර පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන විගණන වාර්තා සාකච්ඡා කිරීම

නවතා දමා තිබුණි. මෙම තත්ත්වය යටතේ පළාත් පාලන ආයතන පිළිබඳ විස්තරාත්මක වාර්තාව සාකච්ඡා කරනු ලබන්නේ පාර්ලිමේන්තුවේද නැතිනම් පළාත් සභාව තුළද යන්න තීරණය කළ යුතුව ඇත.

- පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට 2012 වර්ෂය දක්වා ( යාපනය හා මන්නාරම දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතන හැර) විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව අනුව පළාත් පාලන ආයතනවලට අදාළ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇතත් මේ දක්වා සාකච්ඡාවට කැඳවා නොතිබුණි. මෙම වාර්තා පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ගතයුතු බව යෝජනා කරමි. මෙම තත්ත්වය යටතේ පළාත් පාලන බලමණ්ඩල ගිණුම් පිළිබඳ විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත (අ) සිට (ඌ) දක්වා ඡේදවල වේ.

(අ) පළාත් පාලන විෂය පථයට අයත් ඒ ඒ ප්‍රදේශවල ස්ථාපිත කර ඇති සම්ප්‍රේෂණ කුළුණුවලට බලපත්‍ර ලබාදීම මගින් ආදායම් රැස්කිරීම පළාත් පාලන ආයතනවල කාර්යයක් වුවද, අදාළ පළාත් සභාවන් විසින් බලපත්‍ර ලබාදීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම නිසා විශාල ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමිවී තිබුණි.

(ආ) පළාත් පාලන බලමණ්ඩලවල නීතියට අනුව සේවකයන් බඳවා ගැනීම සඳහා අනුමැතිය පළාත් රාජ්‍ය සේවා කොමිසමෙන් ලබාගත යුතු අතර, ඒ සඳහා අවශ්‍ය වැටුප් ප්‍රතිපූර්ණ පළාත් සභාවෙන් ලබාගත යුතුය. එහෙත් මෙයට පටහැනිව බොහෝ පළාත් පාලන ආයතන අවිධිමත් ආකාරයෙන් පත්වීම් ලබාදී ඇති නිසා වැටුප් ප්‍රතිපූර්ණ ලබාගැනීමට නොහැකිවී තිබුණු අතර, සභාවල මූල්‍ය තත්ත්වය අයහපත් තත්ත්වයට පත්වීම නිසා බැංකු අයිරා හෝ වෙනත් මූල්‍ය සම්පාදන ක්‍රමවලින් වැටුප් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) පළාත් සභා ක්‍රමය ඇතිවීමට පෙර මධ්‍යම රජය යටතේ පැවති පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව පළාත් පාලන ආයතනවලට කෙළින්ම ආදායම් රැස්කිරීම හා රැස්කරන ආදායම් වැඩිකිරීමට ලබාදුන් බලතල අනුව නිලධාරීන් විසින් කටයුතු කර ආදායම් රැස්කිරීමේ කටයුතු සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටියද, සමහර පළාත් පාලන ආයතන එවැනි අනුමැතියක් ලබා නොගැනීම නිසා රැස්කළ හැකි ආදායම් අහිමිවී තිබුණි. උදාහරණයක් ලෙස කඩ කුලී අය නොකිරීම පෙන්වාදිය හැකිය.

(ඈ) පළාත් පාලන ආයතන සතු වෙළෙඳපොළ කඩ මුල් අයිතිකරුවන්ට ලබාදීමෙන් පසුව ඔවුන් විසින් පසුකාලීනව කඩ, අතුරු බදුදී තිබුණි. ඒවා විධිමත් කර ආදායම් ලබාගැනීම සඳහා බොහෝ පළාත් පාලන ආයතන කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් සභා ක්‍රමය ආරම්භ කිරීමට පෙර පළාත් පාලන ආයතනවලට හිමි මුද්දර ගාස්තු හා උසාවි දඩ කඩිනමින් ලබාගැනීමේ හැකියාව තිබුණද, එම ආදායම් පළාත් සභාවේ ආදායම් දෙපාර්තමේන්තුව හරහා ලබාදීම නිසා එම ආදායම් පළාත් පාලන ආයතනවලට ලැබීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඊ) පළාත් සභා ක්‍රමය ඇතිවීමත් සමඟ එම ක්‍රමයට ගැලපෙන පරිදි පළාත් පාලන ආයතනවලට අදාළ මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත හා ප්‍රාදේශීය සභා පනත කාලීනව සංශෝධනය වියයුතු වුවද, එසේ සංශෝධනය නොවීමෙන් ඉදිරි සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දුෂ්කරතාවයක් ඇතිවී තිබුණි.

(උ) පළාත් පාලන ආයතනවලට රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් බලප්‍රදේශයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදෙන එකඟතාවය මත ක්‍රියාත්මක කර තිබුණද, එම සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු නිසා අදාළ මුදල් ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණු අවස්ථා තිබුණි. එහෙත් එම මුදල් ප්‍රමාණයන් ණයගැතියන් ලෙස ගිණුම්වල දිගින් දිගටම පෙන්වා තිබුණි.

(ඌ) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුව වන පළාත් සභා ලැයිස්තුවේ 4.2 අනුව පළාත් පාලන ආයතනවල බලතල අහිමි කිරීමක් කළනොහැකි වුවද, මහා නගර සභා ආඥා පනතේ 185(2) වගන්තිය පරිදි ආඥා පනතේ 2 වන උපලේඛනයේ සඳහන් සුරා බදු ආඥා පනත අනුව මහා නගර සභා සීමාවක් ඇතුළත මත්පැන් අලෙවි කිරීමට වෙන් වෙන්ව ලබාදෙන බලපත්‍ර සඳහා අයකරන ගාස්තු දැනට ක්‍රියාත්මක මහා නගර සභා 23 වෙත ලබාදීමට රජය හෝ පළාත් සභා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

තවද, පළාත් පාලන බලමණ්ඩල ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන විමසුම් මගින් අනාවරණය කරගත් වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

- පළාත් පාලන ආයතන 335 සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 වනවිට අයකර ගතයුතු හිඟ ආදායම් රු. මිලියන 15,466.67 ක් වූ අතර, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු හිඟ දායක මුදල රු. මිලියන 733.88 ක් විය.

- කොළඹ මහ නගර සභාවේ බැංකු ජංගම ගිණුමක 2014 දෙසැම්බර් 31 දිනට පැවති අයිරා ශේෂය රු.මිලියන 935.02 ක් වූ අතර, එ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබූ අයිරා පොළිය රු.මිලියන 31.75 ක් විය. මීට අමතරව වර්ෂය අවසානයට සභාවේ ජංගම ගිණුමේ රු.මිලියන 844.9 ක අයිරා ශේෂයක් පැවති හෙයින් සභාවේ මූල්‍ය කළමනාකරණය දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

- කොළඹ මහ නගර සභාවේ එක් ප්‍රදේශයක ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්තුකරුවෙකුගේ සේවය ලබාගෙන 2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු. මිලියන 101.29 ක මුදලක් ගෙවා තිබූ නමුත් ගිවිසුමක් නොමැතිවීම නිසා ටෙන්ඩර් කොන්දේසි ක්‍රියාත්මක කරවා ගැනීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට බලපෑමක් කිරීමට නොහැකිවී තිබුණි.

- කොළඹ මහා නගර සභාව මිලදී ගෙන වසර 23 ක් පමණ පැරණි ලෑන්ඩ් ලෝවර් රථයක් රු. මිලියන 2.17 ක පිරිවැයකට අළුත්වැඩියා කර තිබුණු අතර, අළුත්වැඩියාවෙන් පසු ධාවනයට යොදවා නොගෙන නගර සභා භූමියේ ගාල් කර තිබුණි.

- වැලිකඩ පොලිසිය අසල කෝට්ටේ මහ නගර සභාවට අයත් ඉඩමේ නගර සභා ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර අදාළ සේවා සැපයුම්කාර ආයතනය විසින් ඉදිරිපත් කළ රු. මිලියන 900.27 ක ව්‍යාපෘති ඇස්තමේන්තුව පිළිගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

  (i) නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ වියදම මූල්‍යනය කරනු ලබන්නේ කෙසේද යන්න අනාවරණය කර නොතිබුණු අතර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.
  (ii) පැවරුම් නියෝගයේ කොන්දේසි උල්ලංඝනය වන ලෙස මෙකී ඉඩම වාණිජ ව්‍යාපෘතියක් නොවන කටයුත්තක් සඳහා යොදා ගෙන තිබුණි.
  (iii) සේවා සැපයුම්කාර ආයතනය වෙත ගෙවිය යුතු රු. මිලියන 15.21 ක් නොගෙවීම මත ගිවිසුමේ සාමාන්‍ය කාර්යය කොන්දේසි 06 යටතේ සභාවට එරෙහිව නීතිමය පියවර ගැනීමට එම ආයතනයට හැකියාව ඇති බව නිරීක්ෂණය විය.

- කුලියාපිටිය නගර සභාවට අයත් ජල පවිත්‍රාගාරයක් යොදා ගනිමින් සභාව විසින්ම ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයින් 1,855 දෙනෙකුට පමණ ජලය සපයා තිබුණද තොග ජල මීටර් නොමැති වීමෙන් හා මාසික නිෂ්පාදනය, බෙදාහැරීම වැනි තොරතුරු නොමැතිවීම හේතුවෙන් ජල ව්‍යාපෘතියේ ඵලදායීතාවය පිළිබඳ ඇගයීමට නොහැකි විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ශේෂය රු. මිලියන 3.69 ක් වූ අතර එය වර්ෂයේ බිල් කිරීමෙන් ලද ආදායමෙන් සියයට 81 ක් පමණ විය.

- මහරගම නගර සභාවට අයිති, ගංගොඩවිල පිහිටි අක්කර 01 රූඩ් 03 පර්චස් 30 ක වපසරියකින් යුත් ඉඩම් කොටසක්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව වෙත අත්පත් කරගෙන, දෙල්කඳ පොළ එහි ස්ථාපිත කිරීමේ අරමුණෙන්, අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව රු.මිලියන 8.60 ක මුදලක් කෝට්ටේ මහ නගර සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ එම භූමිය තුළ ව්‍යාපාරික කටයුතු කරගෙන යන නමුත් එමගින් කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර එම බිම් කොටසේ අයිතිය මෙතෙක් කෝට්ටේ මහ නගර සභාව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

- දොරින් දොරට ගමින් ගමට වැඩසටහන යටතේ බලංගොඩ ප්‍රාදේශීය සභාව සඳහා රු. මිලියන 2.60 ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර කර්මාන්ත 08 ක් ඉටුකිරීම සඳහා රු. මිලියන 2.56 කට සමිති 08 ක් සමඟ ගිවිසුම් අත්සන් කර 2014 දෙසැම්බර් 31 දිනට එම කර්මාන්ත අවසන් කළ යුතුව තිබුණි. මෙම කර්මාන්තයන්හි ඉටුකළ වැඩ වටිනාකම රු. මිලියන 0.92 ක් වූ අතර, සාධාරණ හේතුවකින් තොරව එම කර්මාන්ත සම්පූර්ණ කිරීම අතරමග නවතා දමා තිබුණි.

- 2007 වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු. මිලියන 4.62 ක් වූ ණය මුදල උපයෝගීකරගෙන හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් හෝමාගම නගරය මධ්‍යයේ ඉදිකර තිබූ

පැරණි පොළ ගොඩනැගිල්ල 2014 ඔක්තෝබර් මාසයේදී රු. මිලියන 0.20 ක් ගෙවා කඩා ඉවත් කර තිබූ අතර, ඒ හේතුවෙන් රු. මිලියන 4.82 ක අලාභයක් සිදුවී තිබුණි. කඩා ඉවත් කළ සති පොළ වෙනුවට තාවකාලික මඩු ඉදිකිරීමට මසකට රු. මිලියන 0.58 බැගින් 2015 මාර්තු මාසය දක්වා ගෙවන ලද රු. මිලියන 3.51 ක මුදල හා සභාව විසින් එම කාලපරිච්ඡේදය සඳහා සති පොළෙන් ලද රු. මිලියන 2.12 ක ආදායම හා සැසඳීමේදී සභාව මෙම තාවකාලික පොළ පවත්වාගෙන යාමෙන් එම කාලය තුළ රු. මිලියන 1.39 ක පාඩුවක් සිදුවී තිබුණි. රුපියල් මිලියන 70 ක වියදමින් වෙළෙඳපොළ නවීකරණ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය 2015 මැයි 15 දින වනවිට අවසන් කර තිබුණද, එම සති පොළ විවෘත නොකර පොළේ තාවකාලික මඩු සඳහා දිගින් දිගටම ගෙවීම් සිදුකර තිබුණි.

- කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 1988 වර්ෂයට අදාළව මස් කඩ අක්‍රමවත් ආකාරයට බදු දීම හේතුවෙන් තමාට සිදුවූ අගතිය සම්බන්ධයෙන් වෙනත් බදුකරුවෙකු විසින් කුලියාපිටිය දිසා අධිකරණයේ ගොනු කර තිබූ නඩුවක තීන්දුව අනුව 1988 ජනවාරි 01 දින සිට 1988 දෙසැම්බර් 31 දින දක්වා එක් දිනකට රු.1,800 බැගින් රු.657,000 ක් ද, නඩු ගාස්තුද අදාළ පාර්ශවය වෙත ගෙවීමට සභාවට නියෝග කර තිබුණි.

- ගල්ගමුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග තලනය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායම රු.499,554 ක් වූ අතර, ඉන් රු. 457,554 ක් බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පැවතුණි. එමෙන්ම JCB යන්ත්‍රය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 2.68 ක් අයවීමට තිබුණි.

- නිකවැරටිය ප්‍රාදේශීය සභාව ටෙන්ඩර් කොන්දේසි අනුව අදාළ එකවර ගෙවන මුදල් මාස 05 ක් ඇතුළත ගෙවා අවසන් කළයුතු වුවද, ටෙන්ඩර් කර වසර 05 කට වැඩි කාලයක් ගතවී ඇතත් 2014 දෙසැම්බර් 31 වනවිටද කඩ කාමර 09 ක් වෙනුවෙන් රු. මිලියන 1.42 ක මුදලක් අයවීමට පැවතුණි.

- සීතාවකපුර ප්‍රාදේශීය සභාවට අයත් තානායම සහ ඉඩම කළමනාකරණය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ අතර, 2001 වර්ෂයේ සිට ලැබිය යුතු බදු කුලිය වන රු. මිලියන 11.24 ක් අයකර ගැනීමටත්, එම දේපළ සභාව වෙත ආපසු පවරා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

# විදේශීය ආධාර ව්‍යාපෘති

මුදල් අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන අනුව, 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය ප්‍රමාණය රු.බිලියන 3,113 ක් වූ අතර ඉන් සහනදායී ණය කොන්දේසි මත ලබාගත් විදේශීය ණය ප්‍රමාණය රු.මිලියන 1,491 ක් විය. 2013 දෙසැම්බර් 31 දිනට පැවති සහනදායී නොවන ණය කොන්දේසි මත ලබාගෙන තිබුණු රු.බිලියන 1,467.60 ක විදේශ ණය ප්‍රමාණය සමඟ සසඳන කළ 2014 දෙසැම්බර් 31 දිනට එම ණය ප්‍රමාණය රු.බිලියන 1,622 ක් වීමෙන් පෙනී ගොස් තිබුණේ සහනදායී නොවන ණය කොන්දේසි මත ලබාගත් විදේශ ණය ප්‍රමාණය ඉහල ගොස් තිබුණු බවයි. 2014 දෙසැම්බර් 31 දිනට ණය වෙළඳපලින් ඍජුව ලබාගත් ණය ප්‍රමාණය රු.මිලියන 1,164.5 ක් වූ අතර එය 2012 වර්ෂය අවසානයට පැවති තත්ත්වය හා සසඳා බැලීමේදී සියයට 12.94 ක වැඩි වීමක් විය.

සහනදායී කොන්දේසි මත ලබාගත් විදේශ ණය අතුරෙන් රු.බිලියන 786 ක් ද්වි පාර්ශවීය මූලාශ්‍රයන් වූ අතර ඉන් රු.බිලියන 416 ක දායකත්වයක් ලබාදී තිබුණේ ජපාන රජයෙනි. ඉන්දියානු රජයේ ආධාර ප්‍රමාණය රු.බිලියන 120 ක් විය. බහු පාර්ශ්වික මූලාශ්‍රයන් මත ලබාගෙන තිබුණු ණය ප්‍රමාණයෙන් රු.බිලියන 471 ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් හා රු.බිලියන 363 ක් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයෙන් ලබාගෙන තිබුණි.

සහනදායී කොන්දේසි මත ලබාගෙන තිබුණු විදේශ ණය ප්‍රධාන වශයෙන් දුගීභාවය දුරු කිරීම, ජීවනෝපාය සහාය, සමාජ සුභසාධන, අධ්‍යාපන, සෞඛ්‍ය යටිතල පහසුකම් නැංවීම යනාදි කාර්යයන් වෙනුවෙන් විදුලි බල හා බල ශක්ති, ජල සම්පාදන, මාර්ග , පාලම් , වරාය, කෘෂිකර්ම සහ වාරි මාර්ග යන ක්ෂේත්‍රයන් සඳහා ආයෝජනය කර තිබුණි.

සහනදායි කොන්දේසි මත සහ සහනදායි නොවන කොන්දේසි මත 2014 වර්ෂයේ ලබාගෙන තිබුණු විදේශ ණය ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර අතර ආයෝජන කර තිබුණු ආකාරය පහත සඳහන් සටහනෙන් දැක්වේ.

| ක්ෂේත්‍රය | ආයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|
| මාර්ග හා පාලම් සංවර්ධනය | 64 |
| ජල සම්පාදන හා සනිපාරක්ෂක | 6 |
| ආපදා කළමනාකරණ | 5 |
| කම්කරු හා වෘත්තීය පුහුණු | 5 |
| නිවාස හා නාගරික සංවර්ධනය | 3 |
| අධ්‍යාපන හා මාධ්‍ය | 3 |
| විදුලි බල හා බල ශක්ති | 3 |
| වෙනත් | 11 |

2014 වර්ෂය තුළදී සහනදායී කොන්දේසි මත බහු පාර්ශික ණය මූලාශ්‍රයන් ගෙන් ලබාගත් විදේශ ණය මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 121 ක් සිය මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඉන් 27 ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් හා 25 ක් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතනයෙන් මූල්‍යනය කරන ලද ව්‍යාපෘතින් විය. මෙම ව්‍යාපෘතින් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවල ඇතුළත් වූ වැදගත් විගණන නිරීක්ෂණ සාරාංශ ගත කර පහත දැක්වේ.

- විදේශ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වූ කාර්යයන්වල විෂය කාර්ය පථය පසුකාලීනව වෙනස් කිරීම හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැයෙහි විශාල ඉහලයාම් මෙන්ම අපේක්ෂිත කාල සීමාව තුළදී ව්‍යාපෘතිවල කාර්යයන් සම්පූර්ණ කිරීමට නොහැකි වූ අවස්ථා රාශියක් විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි ප්‍රධාන නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(i) රු.බිලියන 72.92 ක ඇස්තමේන්තුගත පිරිවැයක් මත ආරම්භ කර තිබුණු කොට්ටාව සිට කඩවත දක්වා අදියර 02 කින් සමන්විත කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ අතුරුගිරිය හුවමාරුව ව්‍යාපෘතියේ මුල් සැලසුම්වල ඇතුළත්වී නොතිබුණි. කෙසේ වෙතත්, අතුරුගිරිය හුවමාරුව මුල් ඇස්තමේන්තුවට සිදුකරන ලද විචලනයන් වශයෙන් සලකා රු.මිලියන 475 ක පිරිවැයකින් නිමකර තිබුණි.

(ii) ජාතික මාර්ග අංශ ව්‍යාපෘතිය යටතේ මහාමාර්ග ලේකම් කාර්යාලය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම් කටයුතු 2010 අගෝස්තු මස ආරම්භ කර තිබුණු අතර මහල් 08 සඳහා සැලසුම් කරන ලද මෙම ගොඩනැඟිල්ලේ විෂය පථය මහල් 10 ක් දක්වා පසු කාලීනව වෙනස් කිරීම හේතුවෙන් රු.මිලියන 1,167.44 ක් වූ මුල් ඇස්තමේන්තුව 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1,963.17 ක් දක්වා ඉහල ගොස් තිබුණි. මෙම ගොඩනැඟිල්ලේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් මුළු මනින්ම සම්පූර්ණ කර නොතිබුණි.

(iii) ජාතික මාර්ග අංශ ( අතිරේක මූල්‍යාණය ) ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කරන ලද මාතර සිට ගොඩගම මාර්ගය මුල් සැලසුම් වලට අනුකූල නොවූ කටයුතු හේතුවෙන් පිරිවැය රු.මිලියන 14 කින් වැඩිවී තිබුණි.

(iv) වියලි කලාපීය නාගරික ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ආරම්භ ඇස්තමේන්තු කිරීම් දුර්වලතා හේතුවෙන් විෂය කාර්ය පථය සංශෝධන කිරීම නිසා එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 113 සිට රු.මිලියන 163 දක්වා සියයට 44 කින් ඉහල ගොස් තිබුණි.

- ව්‍යාපෘතින් සඳහා සමස්ත සැලැස්මක් හෝ වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් පිළියෙල නොකර ක්‍රියාත්මක කරන ලද විදේශ ව්‍යාපෘතින් රාශියක් විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි ප්‍රධාන ව්‍යාපෘති පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත පිරිවැය |
|---|---|
| | රු.මිලියන |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | 187,010 |
| දේශගුණික ප්‍රස්තුතයන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 14,617 |
| ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 2,290 |
| දක්ෂිණ අධිවේගී මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 791 |
| උතුරු නැගෙනහිර ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 220 |
| වියලි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 113 |

- 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 33 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව යම් ව්‍යාපෘතියක කාර්ය මණ්ඩලය, ප්‍රසිද්ධ දැන්වීමක් මත අයදුම්පත් කැඳවා තෝරා ගත යුතු අතර එම පත්වීම් කොන්ත්‍රාත් පදනම මත වර්ෂ තුනක කාලයක් සඳහා සීමා විය යුතුය. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන හා ජල සම්පාදන අංශවල ව්‍යාපෘති සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් පල නොකර තෝරා ගත් මාර්ග සංවර්ධන අධිකාරියේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් අර්ධ කාලීන පදනම මත සේවයේ යොදවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද, මෙම නිලධාරීන් එක් ව්‍යාපෘතියක කාල සීමාව අවසන්වීමෙන් අනතුරුව වෙනත් ව්‍යාපෘතියක කාර්ය මණ්ඩලයට අනුයුක්තව සිටිමින් අඛණ්ඩව ව්‍යාපෘති කාර්යාලවල සේවයේ නියුක්ත වන බවද නිරීක්ෂණය විය.

- මහජන විරෝධතා හේතුවෙන් ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අවස්ථා කිහිපයක්ද විගණනයේදී හෙළිදරව් විය. 2011 මැයි මාසයේ ආරම්භ කර තිබුණු යාපනය, කිලිනොච්චිය ජල සම්පාදන හා සනිපාරක්ෂක ව්‍යාපෘතියේ වැඩ කටයුතු මහජන විරෝධතා හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දින වනතුරුත් ආරම්භ කිරීමට හැකිවී නොතිබුණි. බේස්ලයින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගය දක්වා සංවර්ධනය කිරීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විට අතරමග නැවති තිබුණි.

- විදේශ ව්‍යාපෘතීන් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ප්‍රමාදවී ඉදිරිපත් කිරීම හේතුවෙන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාල ණය / ප්‍රදාන ලබාදෙන ආයතන වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදුවී තිබුණි. ලංකා විදුලි බල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති 03 ක් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනට විගණනය සඳහා ලැබිය යුතු වුවත් අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ලැබී තිබුණේ 2015 ජූලි මාසයේදීය. මීට අමතරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති 07 කට අදාල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 31 දින වන විටත් විගණනය සඳහා ලැබී නොතිබුණි.

- දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කළ දිනයට සමගාමීව කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ කොට්ටාව හුවමාරුවේ ගොඩනැඟිලි ඉදිකිරීම ප්‍රමාදවීම හේතුවෙන් රු.මිලියන 259 ක වියදමකින් තාවකාලික හුවමාරු මධ්‍යස්ථානයක් කොට්ටාවේදී ඉදිකිරීමට කටයුතු කර තිබුණි. පසුව මෙම තාවකාලික හුවමාරු මධ්‍යස්ථානය රු.මිලියන 8.27 ක වියදමින් ඉවත් කර රු.මිලියන 945 ක පිරිවැයකින් ඉදිකරන ලද ස්ථාවර හුවමාරු මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගෙන තිබුණි. ඊට අමතරව කඩුවෙල, කොතලාවල ප්‍රදේශයේ රු.මිලියන 176 ක පිරිවැයකින් තාවකාලික හුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණු අතර එය 2015 මාර්තු මාසයේ රු.මිලියන 10 ක පිරිවැයක් දරා ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. මෙම පිරිවැය කොළඹ පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ - අදියර 01 ව්‍යාපෘතියේ වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

# බැංකු

## ලංකා බැංකුව

ලංකා බැංකුවේ මුළු වත්කම් පදනම 2013 වර්ෂයේ වූ රු. බිලියන 1,193 සමඟ සැසඳීමේදී 2014 වර්ෂයේ ප්‍රධාන වශයෙන් ආයෝජන රු.බිලියන 446 දක්වා රු. බිලියන 99.5 කින් හෙවත් සියයට 29 කින් වැඩිවීම හේතුවෙන් රු. බිලියන 1,323 දක්වා සියයට 10.9 කින් වර්ධනය වී තිබුණි. 2013 වර්ෂයේ සියයට 29.3 සිට 2014 වර්ෂයේදී සියයට 34.8 දක්වා සිදුවූ ශුද්ධ පොලී ආන්තිකය වර්ධනය වීම හේතුවෙන් බැංකුවේ ශුද්ධ පොලී ආදායම 2014 වර්ෂයේදී සියයට 14 කින් වැඩි වී තිබුණි. 2013 වර්ෂයේ රු. බිලියන 15.2 සමඟ සැසඳීමේදී රු. බිලියන 20.8 බදු පෙර ශුද්ධ ලාභයක් බැංකුව වාර්තා කර තිබුණි. 2014 වර්ෂයේදී රු. බිලියන 6.8 කින් ඒකාබද්ධ අරමුදලට දායක වී තිබුණි. 2014 වර්ෂයේදී තැන්පතු පදනම සියයට 11.8 කින් පමණක් වර්ධනය වී තිබූ අතර එය 2013 වර්ෂයේ වාර්තා කරන ලද සියයට 21 ට වඩා පහළ අගයක් විය.

2014 වර්ෂය අවසානයට අක්‍රීය උකස් අත්තිකාරම් රු. බිලියන 7.8 සිට රු. බිලියන 4.1 දක්වා අඩුවීම හේතුවෙන් බැංකුවේ අක්‍රීය ණය අනුපාතය (NPL) 2013 වර්ෂයේ සියයට 4.3 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී සියයට 3.8 කින් යහපත් වර්ධනය ක් සිදු වී තිබුණි.

2014 වර්ෂය තුළදී බැංකු ශාඛා ජාලය පුළුල් කිරීම සඳහා නව බැංකු 6 ක් ද හා සුළු හා මධ්‍ය පරිමාණ ණය මධ්‍යස්ථාන 2 ක්ද විවෘත කර තිබුණි. බැංකුව 2014 වර්ෂයේදීද ෆිච් රේටින් (ලංකා) වෙතින් AA+ දිගු කාලීන ශ්‍රේණිගත කිරීමේ රඳවා ගෙන තිබුණි.

## මහජන බැංකුව

2014 වර්ෂය අවසානයට රු.ට්‍රිලියන 1 ක වත්කම් පදනමක් වූ අතර එය 2013 වර්ෂයේ පැවැති රු.බිලියන 927 සිට 2014 වර්ෂයේ රු. බිලියන 1,026 දක්වා සියයට 10.6 ක වර්ධනයක් වාර්තා කර තිබුණි. 2013 වර්ෂයට වඩා ශුද්ධ පොලී ආදායම රු. බිලියන 6.8 කින් හෙවත් සියයට 18.6 කින් අඩු වී තිබියදී, ප්‍රධාන වශයෙන් වෙනත් ආදායම වැඩිවීම හා ණය සහ වෙනත් අලාභ වෙනුවෙන් සිදු කළ අගය අඩු කිරීමෙහි ආපසු ගැලැපීම් හේතුවෙන් බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 17.2 දක්වා වැඩි වී තිබුණි. 2013 වර්ෂයේ සියයට 11.4 ක් වූ වර්ධන අනුපාතයට සාපේක්ෂව 2014 වර්ෂයේදී සියයට 4 ක අඩු තැන්පතු වර්ධන අනුපාතයක් වාර්තා කර තිබුණි.

2013 වර්ෂයේ දී පැවැති සියයට 5.3 ට සාපේක්ෂව බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2014 වර්ෂය අවසාන් වන විට සියයට 3.2 ක් දක්වා වර්ධනය වී ඇති අතර අක්‍රීය උකස් ණය අත්තිකාරම් රු.බිලියන 0.95 ක් දක්වා රු.බිලියන 12.7 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මුළු රටම ආවරණය වන පරිදි ඇති ශාඛා 348 ක්, සේවා මධ්‍යස්ථාන 391 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 463 කින් ශාඛා ජාලය සමන්විතව බැංකුව ක්‍රියාත්මක වේ. පිළිවෙලින් තෙවන වර්ෂයටත් ෆිච් රේටින් (ලංකා) වෙතින් AA+ (lka) දිගුකාලීන ශ්‍රේණිගත කිරීමේ රඳවා ගෙන තිබුණි.

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

2014 වර්ෂය අවසානයට බැංකුවේ වත්කම් පදනම රු. බිලියන 779 ක් දක්වා සියයට 19 කින් වැඩි වී තිබුණි. 2013 වර්ෂයේ සියයට 1.7 ට වැඩියෙන් 2014 වර්ෂයේදී සියයට 3.0 දක්වා ශුද්ධ පොලී ආන්තිකයේ වර්ධනය සමඟ පොලී ආදායමේ වැඩිවීමක් වූ අතර 2013 වර්ෂයේ රු. බිලියන 2.3 ට සාපේක්ෂව රු. බිලියන 10.5 ක බදු පෙර ලාභයක් වාර්තා කර තිබුණි. 2014 වර්ෂය අවසානයට එහි තැන්පතු පදනම රු. බිලියන 554 දක්වා සියයට 10.4 කින් වර්ධනය වූ අතර එය 2013 වර්ෂයේ වාර්තා වූ වර්ධන වේගය වන සියයට 9 ට වඩා ඉහළ අගයකි.

2014 වර්ෂය අවසානයට ප්‍රධාන වශයෙන් සියයට 103 කින් රු. බිලියන 13.4 දක්වා අක්‍රීය උකස් ණය අත්තිකාරම් වැඩිවීම හේතුවෙන් අක්‍රීය ණය අනුපාතය 2013 වර්ෂයේ සියයට 7.0 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී සියයට 7.8 දක්වා සුළු වශයෙන් අඩු වී තිබුණි. 2014 වර්ෂයේදී බැංකුව අඛන්ඩව 12 වන වසරටත් AAA (lka) ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීම ෆිච් රේටින් (ලංකා) වෙතින් රඳවා ගෙන ඇත.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (PSB) ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ, ග්‍රාමීය ආර්ථික ශක්තිමත් කිරීමට දායක වෙමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පහසුවෙන් ලබා ගත හැකි හා දරාගත හැකි මට්ටමේ ණය පහසුකම් ලබා දීම.

පොලී වියදම පහත වැටීම හා පොලී ආදායම වර්ධනය වීම හේතුවෙන් 2014 වර්ෂයේදී සියයට 84 කින් ශුද්ධ ලාභය වැඩි වී තිබුණි. තැන්පතු සඳහා ලබා දුන් ඉහළ පොලී අනුපාතයන් වෙනස් කිරීම හේතුවෙන් පොලී වියදම 2014 වර්ෂයේදී සියයට 10.6 කින් රු.මිලියන 5,312 දක්වා පහත වැටී තිබුණි.

බැංකුවේ තැන්පතු පදනම සියයට 15.8 කින් ඉහළ ගොස් තිබුණි.

ප්‍රධාන වශයෙන් උකස් ණය ලබාදීමේදී වූ අලාභය හේතුවෙන් අක්‍රීය ණය අනුපාතය 2013 වර්ෂයේ සියයට 7.3 සිට 2014 වර්ෂයේ සියයට 7.6 දක්වා වැඩි වී තිබුණි.

2014 වර්ෂය තුළදී ශාඛා 19 ක් වෙනස් ස්ථානවල ස්ථාපනය කරන ලද අතර ශාඛා 8 ක් පුළුල් කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථාන 8 ක් විවෘත කර තිබුණි.

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය 2013 වර්ෂයේ සියයට 4.76 සිට 2014 වර්ෂයේ සියයට 4.96 දක්වා වැඩි වී තිබුණි. එබැවින් ලාභය සියයට 42 කින් වැඩි වී තිබුණි. කර්මාන්තයේ අනුපාතයන් වන සියයට 12.4 සහ සියයට 13.7 ට එරෙහිව පිළිවෙලින් තැන්පතු හා ණය සහ අත්තිකාරම් සියයට 14 ක් වූ එම ප්‍රතිශතයෙන්ම වැඩි වී තිබුණි.

අක්‍රීය ණය අනුපාතය 2013 වර්ෂයේ සියයට 37.11 සිට 2014 වර්ෂයේදී සියයට 34.06 දක්වා අඩු වී තිබුණි.

2014 වර්ෂය තුළදී නව බැංකු ශාඛා දෙකක් විවෘත කිරීම මඟින් බැංකුවේ ශාඛා ජාලය පුළුල් කර තිබුණි.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත එකම රාජ්‍ය බැංකුව වශයෙන් නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව ප්‍රධාන වශයෙන් නිවාස කාර්යයන් සඳහා ණය හා පහසුකම් ලබාදීමේ කාර්යයන්වල නිරත වේ.

බැංකුවේ වත්කම් පදනම ප්‍රධාන වශයෙන් ආයෝජන, ණය සහ අත්තිකාරම් වැඩිවීම හේතුවෙන් 2014 වර්ෂයේදී සියයට 25 කින් රු.බිලියන 35 ක් දක්වා වර්ධනය වී තිබුණි.

2013 වර්ෂයේදී පැවැති සියයට 4.38 ට සාපේක්ෂව ශුද්ධ පොලී ආන්තිකය 2014 වර්ෂයේදී සියයට 5.94 ක් දක්වා වර්ධනයවීමත් සමඟම පොලී ආදායමේ සිදු වූ වැඩිවීම හේතුවෙන් බැංකුවේ බදු පෙර ලාභය රු.මිලියන 818 ක් දක්වා සියයට 165ක වැඩිවීමක් වාර්තා කර ඇත.

2014 වර්ෂය අවසාන වන විට බැංකුවේ තැන්පතු පදනම රු. බිලියන 24.5 දක්වා රු. බිලියන 5.5 කින් හෙවත් සියයට 29.5 කින් වර්ධනය වී තිබූ අතර කාලීන තැන්පතු සියයට 87 ක් එයින් නියෝජනය වේ.

අක්‍රීය ණය අනුපාතය 2013 වර්ෂයේ සියයට 19.85 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී සියයට 22.57 දක්වා වැඩි වී තිබුණි.

2014 වර්ෂය තුළදී නව බැංකු ශාඛා 3 ක් විවෘත කිරීමත් සමඟ බැංකුවේ ශාඛා ජාලය 36 දක්වා පුළුල් කර තිබුණි. එසේම 2014 වර්ෂයේදී ද BBB+ ජාතික දිගුකාලීන ෆිච් රේටය (ලංකා) ශ්‍රේණිගත කිරීම වෙතින් රඳවා ගෙන තිබුණි.

# ප්‍රධාන විගණන අවධානයන්

## ශ්‍රී ලංකා මහ බැංකුව

- මුදල් නීති පනතේ (MLA) 39 වගන්තියේ විධිවිධාන අනුව, විසර්ජනයෙන් පසු සහ ශ්‍රී ලංකා රජය වෙතින් ලැබිය යුතු ශේෂ නිරවුල් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපයන ලද ලාභ මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මහා භාණ්ඩාගාරය වෙත මාරු කළ යුතුය. ඒ අනුව රු. බිලියන 32.31 ක පාඩුවක් තිබුණද සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තු දෙකෙහි ලාභයෙන් අත්තිකාරම් ගෙවීම් ලෙස 2014 වර්ෂයේ අවස්ථා දෙකකදී රු. බිලියන 8.5 ක මුදලක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. තවද රු. බිලියන 32.27 ක විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව හා රු.බිලියන 7.97 ක විදේශ වත්කම් මත "marked – to – market"ලාභය /

පාඩුව සැලකිල්ලට ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බෙදා හැරිය හැකි ලාභය ගණනය කර තිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ඉපැයීම්වල ශේෂය රු. බිලියන 5.7 ක සෘණාත්මක වටිනාකමක් ලෙස පැවතුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 122.81 ක මුදලක් වැය කරමින් එහි අනාගත මෙහෙයුම් සඳහා බ්‍රසීලයෙන් දේපලක් මිලදී ගෙන තිබුණි. මෙම මිලදී ගැනීමට පෙර අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර දේපල උපයෝජනය පිළිබඳ අනාගත සැලැස්මද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තීරණය කර නොතිබුණි. කෙසේ වුවද මෙම දේපල 2015 පෙබරවාරි 01 දින සිට වර්ෂ 02 ක කාලයක් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට කුලියට දී තිබුණු අතර එම දින සිට බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මෙම පරිශ්‍රයේ ක්‍රියාත්මක වේ.

- 2011 අගෝස්තු 24 දින එජඩො 6,207,116 ක් (රු.මිලියන 607.12ක්) වැය කරමින් නිව්යෝර්ක් හි ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකා මහ බැංකුව අත්පත් කරගෙන තිබූ අතර එය අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 2012 ජූනි 01 දින සිට වර්ෂ 3 ක කාලයක් සඳහා එජඩො 68,000 ක මාසික කුලියට විදේශ කටයුතු අමාත්‍යාංශයට කුලියට දී තිබුණි. කෙසේ වුවද මුදල් නීති පනතේ 117 වගන්තියට අනුව, “ශ්‍රී ලංකා මහා බැංකුව විසින් යම් හිමිකමක් පිළිබඳ තෘප්තවීමේදී යම් අකාරයකින් අත්කරගත හැකි එවැනි අයිතියක් හැර වෙළඳාමක හෝ වානිජමය හෝ හෝ වෙනත් ව්‍යාපාරයක නොයෙදිය යුතුයි.“

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත උපදේශක සේවා ලබා ගැනීම වෙනුවෙන් විදේශ සේවා සපයන්නන් තිදෙනෙකු සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 1,396.22 ක මුදලක් ගෙවා තිබුණි. මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කිරීමෙන් තොරව 2014 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වියදමක් ලෙස එම මුදල සලකා තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.මිලියන 2,050.62 ක් වූ මුළු වෘත්තිය උපදේශක සේවා වියදමෙන් සියයට 68 ක් එයින් නියෝජනය වේ.

- ශ්‍රී ලංකා ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා විදේශ සමාගමක් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව, පළමු වාරිකය වන එජඩො 250,000 ක මුදල 2014 ඔක්තෝබර් මාසයේදී ගෙවා තිබුණි. ඉන්පසු එම මුදල ඉහත සමාගමෙන් අයකර ගැනීමෙන් තොරව එම සමාගමෙන් සේවා ලබාගැනීම අත්හිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර තිබුණි.

## ලංකා බැංකුව

### ලංකා බැංකුවේ සීෂේල්ස් ශාඛාව

**ලංකා බැංකුව සඳහා නිව්යෝර්ක් හා ෆ්‍රැන්ක්ෆර්ට් හි අනුරූපී බැංකු සමඟ එජඩො වලින් හා යූරෝවලින් ගිණුම් විවෘත කිරීම.**

සීෂේල්ස් ශාඛාවේ සියලු විදේශ ගනුදෙනු අක් වෙරළ බැංකු කටයුතු අංශය හා ලංකා බැංකුව (යූකේ) ලිමිටඩ් මඟින් මෙහෙයවනු ලැබේ. එබැවින් අතරමැදි බැංකු විසින් විශාල ගාස්තු ප්‍රමාණයක් අයකරන

බැවින් හා ක්‍රියාවලියේ ප්‍රමාදයන් වීම හේතුවෙන් බැංකු ගනුදෙනුකරුවන් එම තත්ත්වය සමඟ තෘප්තිමත් නොවේ. ඇමරිකා එක්සත් ජනපදයේ (USA) හා යුරෝපයේ (EU) බැංකු සමඟ ලිපි ගනුදෙනු වලදී ඍජු සම්බන්ධතාවක් ඇත්තේ නම් එය සීෂේල්ස් බැංකුවට ප්‍රතිලාභයක් වනු ඇත.

සහකාර සාමාන්‍යාධිකාරී (විදේශ ශාඛා) හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමනාකරු (ජාත්‍යන්තර හා භාණ්ඩාගාරය ) විසින් 2014 මැයි 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිව්යෝර්ක්හි ස්ටැන්ඩඩ් චාටඩ් බැංකුව සහ ඩොයිෂ් බැන්ක් ට්‍රස්ට් කම්පණි ඇමරිකා, නිව්යෝර්ක් හි එජඩො ගිණුම් විවෘත කිරීමට හා ෆ්‍රැන්ක්පර්ට්හි ඩොයිෂ් බැංකුව සමඟ යූරෝ ගිණුම් විවෘත කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව බැංකුව විසින් නිව්යෝර්ක්හි හා ෆ්‍රැන්ක්ෆර්ට් හි අනුරූපී බැංකු සමඟ එජඩො වලින් හා යූරෝවලින් ගිණුම් විවෘත කිරීමට පරිශ්‍රමයක් දරා තිබුණි. කෙසේ වුවද සීෂෙල්ස්හි නීති හා රෙගුලාසි සමඟ අනුකූල නොවීම හේතුවෙන් එය අසාර්ථක වී තිබුණි. එම නිසා සීෂෙල්ස් බැංකු ශාඛාවට ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය.

**ගනුදෙනුකරුවන්ගේ තැන්පතු - සුළු ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් මත යැපීම**

තැන්පතු පිළිබඳ සමාලෝචනයේදී, 2015 අප්‍රේල් 30 දිනට එම ශාඛාවේ මුළු තැන්පතුවලින් සියයට 62 ක් තැන්පත් කරන ලද ප්‍රධාන තැන්පතු ගනුදෙනුකරුවන් 3 දෙනෙකු හා මුළු තැන්පතුවලින් සියයට 77 ක් තැන්පත් කරන ලද ප්‍රධාන තැන්පතු ගනුදෙනුකරුවන් 10 දෙනෙකු වූ බව නිරීක්ෂණය විය. ශාඛාව ඉතා සීමිත තැන්පත්කරුවන් සංඛ්‍යාවක් මත වැඩිපුර යැපෙන බවත් ඉතා ඉහළ ද්‍රවශීලතා අවදානමකට අනාවරණය වී ඇති බවත් මෙයින් දැක්වේ. එබැවින් ශාඛාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි මෙම තත්ත්වය අහිතකර ලෙස බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති බවට නිරීක්ෂණය විය.

**රු.මිලියන 750 ක් වූ එකතු කළ අගය මත බදු අත්තිකාරම් ගෙවීම**

එකතු කළ අගය මත බදු (VAT) ලෙස 2014 දෙසැම්බර් 30 දින බැංකුව විසින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට රු.මිලියන 750 ක ගෙවීම් කර තිබුණි. ඉහත අත්තිකාරම් ගෙවීම් මූල්‍ය සේවා මත අනාගත බදු බැරකම්වලින් අයකර ගත යුතුය. එකතු කළ අගය මත බදු (VAT) මාර්ගෝපදේශවලට අනුව, බැංකුව විසින් සිදු කරන ලද බදු අයකර ගත යුතු කාර්යයන් පදනම්ව සේවා සැපයීමෙන් පසුව එකතු කළ අගය මත බදු අය කර ගත හැකිවේ. කෙසේ වුවද, 2014 ගිණුම් වර්ෂය තුළ බැංකුවේ ලාභය/ ආදායම යොදා ගනිමින් ඉහත බදු අත්තිකාරම් ගෙවා තිබුණි. එබැවින් බැංකුවේ අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි එය ඉතා අහිතකර ලෙස බලපා තිබුණි. ඉහත ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස කෙටිකාලීන ආයෝජන මඟින් ලාභ හෝ ආදායම් ඉපැයීමේ අවස්ථා වැලකී තිබුණි.

**කළමනාකරණ අභ්‍යාසලාභීන් ඍජුව බඳවා ගැනීම**

2013 ඔක්තෝබර් 03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව ඉහත සඳහන් බඳවා ගැනීම සඳහා දෙවැනි ලිඛිත පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු වුවද විභාග පැවැත්වීම සඳහා කිසිදු පළපුරුද්දක් නොමැති පුද්ගලික පුහුණු පන්ති පවත්වන පුද්ගලික ආයතනයක් යොදා ගනිමින් එය ඉටු කර ගෙන තිබුණි.

ඉහත පුද්ගලික ආයතනය සඳහා අනුමැතිය ලබා ගැනීමේදී, සහකාර සාමාන්‍යාධිකාරී (පුහුණු හා සංවර්ධන) විසින් ඉහළ කළමනාකරණය නොමඟ යවමින් එය විශ්ව විද්‍යාලයක් ලෙස සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

දෙවැනි ලිඛිත පරීක්ෂණය පැවැත්වීමේ කාර්යය සඳහා පුද්ගලික ආයතනය තෝරා ගෙන තිබුණද, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ඇගයීම එම ආයතනය විසින් සිදු කර තිබූ අතර එහි අධීක්ෂණය සහ විභාග පැවැත්වීම ලංකා බැංකු කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබුණි. එසේ වුවද මෙම කාර්යයන් දෙක සඳහා පමණක් රු. මිලියන 2.1 ක මුදලක් ගෙවා තිබුණි.

ඉහත බඳවා ගැනීමේ සියලු කාර්යයන් සිදු කළ සහකාර සාමාන්‍යාධිකාරීගේ (පුහුණු හා සංවර්ධන) දියණිය එම විභාගයට පෙනී සිට සාර්ථකවීම පිළිබඳව ඉහළ කළමනාකරණය දැනුවත් කර නොතිබුණි. ඒ අනුව මෙම තත්ත්වය යටතේ එහි අපක්ෂපාතීවීම පිළිබඳ ප්‍රශ්නගත වේ.

## මහජන බැංකුව

- ශාඛා 18 ක මිලියන 1 ඉක්ම වූ ණය 74 කින් 2014 දෙසැම්බර් 31 දිනට එක් වාරිකයක් හෝ ගෙවා නොමැතිව අක්‍රීය ණය වර්ගයට මාරුකරන ලද ණයවල හිඟ ශේෂය රු. මිලියන 361.69 ක් විය.

- ප්‍රධාන ගනුදෙනුකරුවන් දසදෙනෙකුගේ අක්‍රීය ණය හා බැංකු අයිරා 2014 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන 6,176.16 ක් හා රු. මිලියන 601.26 ක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

- අක්‍රීය සේවක ණය අයකර ගැනීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් පිළියෙල කර නොතිබූ බැවින් 2014 වර්ෂය තුළ රු.මිලියන 260 සිට රු.මිලියන 336 දක්වා අක්‍රීය සේවක ණය ශේෂය වැඩි වී තිබුණද අක්‍රීය ණය ශේෂ අයකර ගැනීම සඳහා කළමනාකරණය විසින් ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

- අවම වශයෙන් බදු වලට පසු ලාභයෙන් සියයට 30 ක් හෝ හිමිකමෙන් සියයට 15 ක් යන දෙකින් වැඩි අගය වශයෙන් වූ ලාභාංශ ප්‍රතිපත්තියට පටහැනිව බැංකුව විසින් රු.මිලියන 510.96 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ හිමිකම් සහ වත්කම් 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 510.96 කින් අඩුවෙන් දක්වා තිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) අනුමත කරන ලද රු.මිලියන 55,371 ක් වටිනා මුළු ව්‍යාපෘති ණයවලින් වර්ෂය අවසානය වන විට රු.මිලියන 49,218 ක් මුදා හැර තිබුණි. ඉන් රු.මිලියන 11,711 ක් හෙවත් සියයට 24 ක් 2014 වර්ෂයේ දෙසැම්බර් මාසය තුළදී මුදා හැර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති මූල්‍යායන අත්පොත ප්‍රකාරව එක් එක් ව්‍යාපෘතිය සඳහා වන සෑම වාරික

මුදාහැරීමකටම පෙර කිසිදු භෞතික ප්‍රගති වාර්තාවක් බැංකුව විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගෙන නොතිබුණි.

- 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාජ ආපසු ගැනීම් හා මුදල් අයකැමිගේ ඌනතාවයන් රු. මිලියන 26.53 ක් හා රු. මිලියන 1.51 ක් වූ අතර ඒවායින් පිළිවෙලින් රු. මිලියන 17.64 ක් වර්ෂ 01 කට වැඩි කාලයක් හා රු. මිලියන 1.4 ක් වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- 1942 අංක 13 දරන උකස් බ්‍රෝකර්කරුවන්ගේ ආඥාපනතේ 13 වගන්තිය ප්‍රකාරව, එම ආඥාපනත යටතේ කරන ලද හෝ කිරීමට අදහස් කරන වෙන්දේසියක් මඟින් විකුණුමකදී ලංසු කිරීම හා මිලදී ගැනීම කරන උකස් බ්‍රෝකර්වරු ඔහු සමඟ තබන ලද දේපලෙහි සම්පූර්ණම හිමිකරු ලෙස සලකනු ලැබේ. මෙයට පටහැනිව නොවිකුණන ලද උකස් භාණ්ඩවල සම්පූර්ණ හිමිකම ලබාගැනීමෙන් තොරව කිලෝ ග්‍රෑම් 23.95 ක් වූ නොවිකුණන ලද උකස් භාණ්ඩ උණුකර තිබුණි. උණුකරන ලද රත්රන්වලින්, සාදන ලද රත්රන් කූරු (bars) විකිණීම මඟින් බැංකුවේ මුළු උකස් හිඟය පියවා තිබූ අතර එමඟින් ඉහත කී ව්‍යවස්ථාවේ 28 වගන්තියේ දක්වා ඇති පරිදි අතිරික්තයන් සඳහා ගනුදෙනුකරුවන් හිමිකම් පෑම වළක්වා තිබුණි.

- උණුකිරීමේ ගාස්තු, රත්රන් ප්‍රවාහන ගාස්තු හා උණුකරන ලද රත්රන් පිළිබඳ විකුණුම් මිල සඳහා උණුකිරීමේ ක්‍රියාවලිය මත තරඟකාරී ලංසු පරිපාටියක් අනුගමනය කර නොතිබුණි.

- 2012 පෙබරවාරි 23 දිනැති අංක 03/2012 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව විශ්‍රාමලත් සාමාන්‍යාධිකාරිවරයාට මහා භාණ්ඩාගාරයෙන් අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව වාහනයක් භාර දී තිබුණි.

- මිහින්තලේ පවත්නා ශාඛා කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ තිරප්පනේ ගොඩනැගිල්ල ඉදිකිරීම යන ඉදිකිරීම් කොන්ත්‍රාත් දෙක සඳහා මුළු කොන්ත්‍රාත් පිරිනැමීමේ මිලෙහි ප්‍රතිශතයක් ලෙස විචලන නියෝගයන්ගේ වටිනාකම පිළිවෙලින් සියයට 217 ක් හා සියයට 46 ක් විය. එම ප්‍රතිශතයන් අවමයට වඩා ඉතා ඉහළ වුවද, 2006 - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තියේ දක්වා ඇති පරිදි එම විචලන නියෝගයන් නිකුත් කිරීමට පෙර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

- 2013 ජුලි 01 සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ ගම්පහ ශාඛාවේ ගනුදෙනුකරුවන් විසින් තැන්පත් කරන ලද එකතුව රු. මිලියන 7.06 ක මුදල් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

- මහනුවර ශාඛාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අයකරගන්නා ලද රු. මිලියන 13.73 ක් වූ ණය වාරික (වතු) අදාළ ගිණුමට මාරු කර නොතිබුණි. එබැවින් ආදායම හා ණය ශේෂ පිළිවෙලින් රු. මිලියන 5.57 කින් හා රු. මිලියන 6.16 කින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

- සටහන් කිරීමේ දෝෂයක් හේතුවෙන් චෙක්පත් උපලබ්ධි ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට හර ශේෂයක් විය. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ණයගැතියන් රු. මිලියන 22.81 කින් වැඩියෙන් දක්වා තිබුණි

- 2013 දෙසැම්බර් 31 දිනට ගම්පහ ශාඛාවේ චෙක්පත් උපලබ්ධි ගිණුමේ - 004/1/09/1607 පැවතුණු රු.මිලියන 1.12 ක ශේෂය බැංකුව සසඳා තිබූ නමුත් 2014 දෙසැම්බර් 31 දක්වා ඒ සඳහා සටහන් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි.

- ශාඛා සමඟ ජංගම ගිණුම සහ ශාඛාවල ප්‍රධාන කාර්යාලය සමඟ ජංගම ගිණුම අතර රු. මිලියන 18.58 ක නොසැසඳූ ආරම්භක ශේෂයක් නිරීක්ෂණය විය.

- 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු, ඉතිරිකිරීමේ ගිණුම්, විසර්ජනය නොකළ ශේෂ ගිණුම්, ස්ථාවර තැන්පතුවලින් ණය ආදිය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය හා පරිගණක පද්ධතියෙන් ජනනය කරන ලද ශේෂයන් අතර රු.මිලියන 69.96 ක වෙනසක් නිරීක්ෂණය විය.

- හඳුනාගැනීමෙන් හා ගිණුම්වල ගැලපීම් කිරීමෙන් තොරව රු. මිලියන 4.21 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ දක්වා තිබුණි.

## නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

- 2014 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ගනුදෙනුකාර තැන්පතු වලින් සියයට 49 කට වැඩි ප්‍රමාණයක් තැන්පතුකරුවන් විසිදෙනෙකුට අයත් වූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 42 ක් විය.ඒ අනුව ඉතා සීමිත තැන්පතුකරුවන් මත බැංකුව යැපෙන බව දැක්වෙන අතර එය ඉහළ ද්‍රවශීලතා අවදානමකටද හේතු වේ.

- බැංකුව වෙනුවෙන් ස්ථාවර තැන්පතු රැස්කර ගැනීම සඳහා මූල්‍ය සමාගමක් සමඟ බැංකුව ගිවිසුමකට එළඹ තිබුණු අතර වර්ෂයකට සියයට 0.5 ක කොමිස් මුදලක් තැන්පතු වටිනාකම මත ගෙවීමට සහ ඉන්පසු ස්ථාවර තැන්පතුවක කවර අලුත්කිරීමකදී කොමිස් මුදල ගෙවීමට එකඟ වී තිබුණි.

- ප්‍රධාන කළමනාකරුවන් දෙදෙනෙකු ප්‍රධානත්වය දරන භාණ්ඩාගාර අංශය හා අලෙවි අංශය ලෙස වෙනම අංශ දෙකක් බැංකුව සතුව තිබුණද තෙවන පාර්ශවයක් මඟින් අරමුදල් රැස්කිරීම සඳහා පසු ගිය වර්ෂ 3 තුළ බැංකුව විසින් රු. මිලියන 1.29 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

- ඉහත මූල්‍ය සමාගම සමඟ එළඹී ගිවිසුම අනුව, රු.මිලියන 3 ට වැඩි ඉහළ වටිනාකමක් සහිත තැන්පතු සඳහා විශේෂ රේටයක් ගෙවීමට බැංකුව එකඟ වී තිබුණි. කෙසේ වුවද තැන්පතුවල වටිනාකම සැලකීමෙන් තොරව රු.මිලියන 3 ට අඩු තැන්පතු සඳහාද බැංකුව විසින් එම විශේෂ රේටයන් ලබා දී තිබුණි.

- සියයට 14.5 සිට සියයට 15.5 දක්වා පොලී අනුපාතයකට 2013 ඔක්තෝබර් මාසය තුළදී රු.බිලියන 2 ක් වටිනා සුරැකුම්පත් ණයකර බැංකුව විසින් නිකුත් කර තිබුණි. මේ අතර සියයට 8 සිට සියයට 9.75 දක්වා වූ පොලී අනුපාතයන්ට 2014 වර්ෂයේදී රු.මිලියන 850 ක් වටිනා සුරැකුම් නොලත් ණයකර බැංකුව විසින් මිලදීගෙන තිබූ බැවින් කළමනාකරණය විසින් කරන ලද මූල්‍ය වෙළඳපොළ පුරෝකථනය ප්‍රශ්නකාරී වේ.

- 2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 850 ක මුදලක් බැංකුව විසින් ණයකරවල ආයෝජනය කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට ණයකරවල සාධාරණ අගය අඩුවීම හේතුවෙන් රු. මිලියන 9.87 ක ඇස්තමේන්තුගත පාඩුවක් සිදු වී තිබුණි.

# කෘෂිකර්ම හා ඉඩම්

## කෘෂිකර්ම අමාත්‍යාංශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ හදබිම අධිකාරිය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, පසු අස්වනු තාක්ෂණ ආයතනය, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය යන ව්‍යවස්ථාපිත ආයතන 06 ක් සහ ලංකා පොහොර සමාගම හා කොළඹ කොමර්ෂල් පොහොර සමාගම යන රජය සතු සමාගම් දෙකක්ද අමාත්‍යාංයට අයත් වූ අතර ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම, කෘෂිකාර්මික විවිධාංගිකරණය හා නිෂ්පාදන වැඩි දියුණු කිරීම, කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම, පාංශු සංරක්ෂණ පනත, ගස් කැපීම් පාලනය කිරීමේ පනත, පැලෑටි ආරක්ෂණ ආඥා පනත, පොහොර පනතේ විධිවිධාන සහ පලිබෝධ නාශක පනත පරිපාලනය, කෘෂිකාර්මික අධ්‍යාපනය, පර්යේෂණ හා ව්‍යාපෘති සේවා, කෘෂි ව්‍යවසාය, පශු අස්වනු තාක්ෂණය සහ අධිතාක්ෂණික කටයුතු සංවර්ධනය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්වේ. සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේතුව සඳහා රු.මිලියන 41,004 ක් වෙන්කර තිබුණු අතර රු.මිලියන 37,757 ක් වැයකර තිබුණි.

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති පරීක්ෂාවේදි නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

- අතිරේක ආහාර භෝග නිෂ්පාදන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. මිලියන 72 ක් වෙන්කර තිබුණු අතර මෙම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 9.8 ක් සහල් සෝයා හා ධාන්‍ය ආශ්‍රිත අයිස්ක්‍රීම් නිෂ්පාදනය හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනයට ලබා දී තිබුණි. මේ යටතේ ප්‍රතිලාභින් සඳහා සියයට 50 ක දායකත්වයක් පමණක් රජයෙන් ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද ඊට පටහැනිව රු. මිලියන 4.2 ක් වැයකර අයිස්ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍ර 20 ක් 2014 දෙසැම්බර් 10 දින මිලදී ගෙන තිබුණද එම යන්ත්‍ර 2015 සැප්තැම්බර් 30 දින දක්වාම බෙදා හැර නොතිබුණි.

- සහල් අපනයනය ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා 2012 වර්ෂයේ සිට ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණද එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒ සම්බන්ධයෙන් සක්‍යතා අධ්‍යනයක් සිදුකර එය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවන් හා එහි ගැටලු හඳුනාගෙන නොතිබුණි. මේ වැඩසටහන වෙනුවෙන් 2014 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව සහල් අපනයන කලාප 04 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද කලාප 02 ක් පමණක් පිහිටුවා තිබුණි.

- එළවලු හා පලතුරුවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ඇසුරුම් කරණය හා ප්‍රවාහනය වැඩි දියුණු කිරීමේ වැඩ සටහන යටතේ 2011 වර්ෂයේදී මිලදී ගත් රු. මිලියන 2.17 ක් වටිනා තක්කාලි ඇසුරුම් හා ප්ලාස්ටික් කුඩ 5,448 ක් 2015 ජුලි 30 දින වන විටත් පසු අස්වනු තාක්ෂණ ආයතනයේ ගබඩාවල නිෂ්ක්‍රීයව පැවතුණි.

- අමාත්‍යාංශ විසින් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාම "ජාතික ගොවි සතිය" ප්‍රදර්ශනය පවත්වා තිබුණද විශේෂ ව්‍යාපෘතියක් ලෙස හදුනාගෙන වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන්කර නොගෙන සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු. මිලියන 26.19 ක් වැයකර තිබුණි.තවද විධිමත් බලය ලබාගැනීමකින් තොරව වාර්ෂික ඇස්තමේන්තුවෙන් අතිරේක ආහාර බෝග නිෂ්පාදනය සහ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩ සටහන යන වැඩ සටහන් දෙක සඳහා වෙන්කළ ප්‍රතිපාදන වලින් රු. මිලියන 13.2 ක්ද මෙම වියදම් දැරීම සඳහා යොදගෙන තිබුණි.

- කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 4/3/2/8/1 හා 2013 දෙසැම්බර් 11 දිනැති චක්‍රලේඛයේ ප්‍රකාරව වානිජ ගොවිපල වැඩසටහන යටතේ සියයට 50 ක දායකත්වයක් රජයෙන් ලබාදීම සඳහා එළවලු, පළතුරු හා අතිරේක බෝග වගාකරන ගොවින් තෝරාගන්නා ලෙස දන්වා තිබුණද රත්නපුර හා කොළඹ දිස්ත්‍රික්කවල මල් වගාකරුවන් 12 දෙනෙකු තෝරාගෙන ඔවුන්ට රජයේ දායකත්වය ලෙස රු. මිලියන 2.76 ක් ගෙවා තිබුණි.

- රජයේ පොහොර සහනාධාර වැඩසටහන යටතේ පොහොර මෙට්‍රික් ටොන් 300,000 ක් පමණ ආනයනය කර ලංකාව පුරා බෙදා හැරීමට කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ලංකා පොහොර සමාගම ඇතුළු පෞද්ගලික සමාගම් 12 ක් විසින් කටයුතු කර තිබුණි. වාර්ෂිකව මෙම වැඩසටහන සඳහා රු.බිලියන 32 ක් පමණ රජය විසින් වැය කර තිබුණු අතර මෙම වියදම තුළ පොහොර සමාගම් විසින් නියමිත දිනට ණයවර බිල්පත් නොපියවීම නිසා බැංකුවලින් ලබා ගන්නා ණය සඳහා ගෙවන ලද පොළී මුදල් විශාල ප්‍රමාණයක් ඇතුළත්ව තිබුණි. 2013 අප්‍රේල් 01 සිට 2014 ජුනි 30 දක්වා කාලය තුළ ඉහත රජයේ පොහොර සමාගම් දෙක විසින් ලබාගත් කෙටි කාලීන හා දිගු කාලීන ණය සඳහා පොලී හා බැංකු ගාස්තු වශයෙන් රු.මිලියන 4,922.13 ක් වැය කර තිබුණු අතර, ඉන් රු. මිලියන 4,752.07 ක් භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

## ඉඩම් අමාත්‍යාංශය

ජාතික ඉඩම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීම,භෞමික පරිසරය සුරැකීම,ඉඩම්වල ආරක්ෂාව සහතික කිරීම, ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම,රජයේ ඉඩම් මනාව කළමාකරණය කිරීම, හා සුදුසු ඉඩම්; ඉඩම් අහිමි ජනතාව අතර බෙදාදීම හා සංවර්ධනය කිරීමත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීමත් රටේ සියලු ඉඩම්වල හිමිකම තහවුරු කර අයිතිය ලියාපදිංචි කිරීම යන මූලික අරමුණු ඉටුකිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය හා ඒ යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සහ ව්‍යවස්ථාපිත ආයතන වන ඉඩම් මැනුම් සභාව හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ක්‍රියාත්මක වෙමින් පවතී. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු සඳහා සමාලෝචිත වර්ෂය සළසා තිබුණ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,150.3ක් වූ අතර ඉන් රු.මිලියන 6,025.1ක් උපයෝජනය කර තිබුණි.

2014 වර්ෂයට අදාල වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- අමාත්‍යාංශයේ 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ දැනට ක්‍රියාත්මක වන ඉඩම් අත්පත් ලිපිගොනු 4,408 කින් වන්දි ගෙවා වැඩ අවසන් වූ ලිපිගොනු ගණන 122 ක් වූ අතර අක්‍රීය ලිපිගොනු ගණන 298 ක් විය. 2014 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි මුදල් ලෙස රු.මිලියන 1,704.7 ක් ද පොලී ලෙස රු. මිලියන 525.03 ක්ද අමාත්‍යාංශය ගෙවා තිබුණි. මෙයට 2005 වර්ෂයේ දී අත්පත් කර ගෙන තිබූ ඉඩම් වෙනුවෙන් පමණක් රු.මිලියන 110.37 ක් වූ පොලී මුදලක් ඇතුළත්ව තිබුණි ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් පොලී වෙනුවෙන් විශාල පිරිවැයක් අමාත්‍යාංශයට දැරීමට සිදුව තිබුණි.

- අමාත්‍යාංශය විසින් උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත 2014 වර්ෂය තුලදී රු. මිලියන 50 ක් වෙන්කර දී තිබූ අතර දෙපාර්තමේන්තුව එයින් රු.මිලියන 41.69 ක මුදලක් වැය කොට තිබුණි. 2014 වර්ෂය තුළ ඉදිරිපත් වූ ගැටළු 199,641 කින් විසඳා තිබූ ගැටළු සංඛ්‍යාව 81,954 ක් වූයෙන් වියදමට සාපේක්ෂව සමස්ත භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතිණි.

- අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන බිම්සවිය වැඩසටහනේ පසුගිය වර්ෂ 4 ක කාලය තුල සමස්ත ප්‍රගතිය පහත පරිදි විය.

| වර්ෂය | ප්‍රතිපාදනය | වියදම | ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය | මැනුම්කළ බිම්කැබලි සංඛ්‍යාව | ගැසට්කළ කැබලි සංඛ්‍යාව | ලියාපදිංචි කළ හිමිකම් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | | | | |
| 2011 | 1,000 | 481 | 200,000 | 157,470 | 79,678 | 25,697 |
| 2012 | 1,100 | 416 | 200,000 | 124,717 | 62,130 | 26,386 |
| 2013 | 800 | 670 | 500,000 | 110,630 | 58,690 | 63,943 |
| 2014 | 446 | 445 | 500,000 | 121,973 | 66,759 | 50,672 |
| **එකතුව** | **3,346** | **2,012** | **1,400,000** | **514,790** | **267,257** | **166,698** |

2021 වර්ෂය අවසාන වනවිට සියලු ඉඩම් හිමියන් සඳහා හිමිකම් සහතික නිකුත්කර බිම්සවිය වැඩසටහන අවසන් කිරීමට නියමිත වුවත් වැඩසටහනේ සමස්ත ප්‍රගතිය සියයට 12 ක් පමණි. 2007 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා කොට්ඨාශ 97 ක වැඩ ආරම්භ කර තිබුණද 2014 වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර තිබුණේ කොට්ඨාශ 05 ක් පමණි.

- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සතුව පවතින නිල නිවාස 310 න් කුළී අයවන නිවාස 90 ක් වූ අතර නිවාස 220 න් නිල නිවාස 70 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේද නිවාස 22 ක් විනාශ වෙමින්ද පැවති බවද නිරීක්ෂණය වූ අතර නිවාස 23 ක් හිස්ව පැවතුණි. තවද අනවසර පදිංචිකරුවන් නිල නිවාස 37 ක පදිංචිව සිටින අතර එම නිල නිවාසවලින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

- මිනින්දෝරු දෙපාර්තමේන්තුව දිරි දීමනා ගෙවීමේදී මිනින්දෝරුවරයකු මාසිකව ඉටුකළ යුතු අවම වැඩ ප්‍රමාණය (Monthly Norms) තීරණය කර තිබුණද මසකට දිරි දීමනා ගෙවීමට අදාළ කරගත හැකි උපරිම කැබලි සංඛ්‍යාවක් හෝ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවිය හැකි සීමාවක් තීරණය කිරීමකින් තොරව 2012 සහ 2013 වර්ෂවල මෙන්ම 2014 වර්ෂයේදීද දිරි දීමනා හා අධීක්ෂණ ගාස්තු ගෙවා තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේදී දිරිදීමනා හා අධීක්ෂණ ගාස්තු වශයෙන් පමණක් වාර්ෂික මූලික වැටුපෙන් සියයට 50 සිට වාර්ෂික මූලික වැටුප මෙන් දෙගුණයද ඉක්මවා නිලධාරීන් 207 කට ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. වර්තමානයේ මැනුම් කටයුතු ඉතා දියුණු තාක්ෂණික උපකරණ මෙන්ම චන්ද්‍රිකා හා පරිගණක තාක්ෂණය වැනි ක්‍රමවේදයන් යොදාගෙන සිදු කරනු ලබන අතරම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රමාණවත් මැනුම් උපකරණ මිලදී ගෙන තිබියදීත්, වසර තිහකටත් වඩා පැරණි ක්‍රමවේදයක් වන මිනින්දෝරුවරයෙකු විසින් මසකට මැනිය යුතු අවම කැබලි සංඛ්‍යාව(Norm) 30 ක සීමාවට යටත්ව මැනුම් කටයුතු සිදුකිරීම කාලෝචිත නොවන බැවින් ඉහත දිරිදීමනා ගෙවීමේ විෂමකාරී තත්ත්වයට එය ප්‍රධාන වශයෙන් බලපා තිබූ බව නිරීක්ෂණය විය.

- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් ලබාදීම වශයෙන් දක්වා රු. මිලියන 1.87 ක් වැයකර පොල්ගොල්ල ප්‍රදේශයේ වැඩමුළුවක් පවත්වා තිබුණි. න්‍යාය පත්‍රය අනුව ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡාව සඳහා පැයක කාලයක් පමණක් වෙන් කර තිබුණු බැවින් රාජ්‍ය මුදල් ඵලදායී නොවන ලෙස පරිහරණය කර තිබූ බව නිරීක්ෂණය විය.

# සංස්කෘතික හා කලා කටයුතු

ශ්‍රී ලාංකීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සහ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය පිහිටුවා තිබුණි.

රටේ සංස්කෘතික හා කලා කටයුතු සහ ජාතික උරුමයන් ජනතා හැසිරීම මෙහෙයවන ප්‍රධාන මෙවලම් ලෙස සලකා ඉහත අරමුණු හඳුනාගෙන ඇත. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ ආයතන 5 ක්ද ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ආයතන 4 ක්ද පිහිටුවා තිබුණි.

2014 වර්ෂය තුළදී සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන 4 ක් සඳහා රු.මිලියන 2,186 ක් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා වෙන්කර තිබුණු අතර ඉන් රු.මිලියන 1,675 ක් උපයෝජනය කර තිබුණි. ආදායම් උපයනු ලබන ආයතනයක් වූ මධ්‍යම සංස්කෘතික අරමුදල 2014 වර්ෂය තුළදී රු.මිලියන 2,309 ක්, ප්‍රධාන වශයෙන් සංචාරක ප්‍රවේශපත් අලෙවියෙන් උපයා තිබුණු අතර ඉන් රු. මිලියන 1,830 ක් වැය කර තිබුණි.

## කාර්යසාධන සමාලෝචනය

### සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

- දෙස් විදෙස් සංස්කෘතික හුවමාරු වැඩසටහන යටතේ සාර්ක් රටවල් අතර සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ අරමුණින් සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා 2011 වර්ෂයේ සිට රු.මිලියන 2,177 ක් වෙන්කර තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 648.59 හෙවත් සියයට 29.79 ක් පමණක් විය.

- ඉදිකිරීම් භූමියේ අයිතිය විධිමත්ව පවරා ගැනීමෙන් තොරව සංස්කෘතික මධ්‍යස්ථාන 3 ක් ඉදිකිරීම සඳහා රජයේ ප්‍රතිපාදන රු.මිලියන 11 ක් වැයකර තිබුණි.

- රු.මිලියන 323 ක ඇස්තමේන්තුවක් මත සංස්කෘතික මධ්‍යස්ථානයක් හා සුනාමි පර්යේෂණ ආයතනය ඉදිකිරීම 2011 වර්ෂයේ ආරම්භ කර තිබුණු නමුත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් වැයකර තිබුණේ වියදම රු.මිලියන 82.91 ක් හෙවත් සමස්ත ප්‍රතිපාදයෙන් සියයට 20 ක් පමණක් විය.

## සංස්කෘතික කටයුතු දෙපාර්මේන්තුව

විධිමත් පරිදි නාට්‍ය කලාව අධ්‍යයනය කිරීමේ අඩුව පිරිමසාලීම හා සිංහල - දෙමළ සංස්කෘතික සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල 2014 වර්ෂයේදී රු. මිලියන 11.3 ක වියදමකින් ඉදිකර තිබුණි. එසේ වුවත් මෙම කාර්යය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මෙහිද ඇතුළත් කර නොතිබුණි. මෙම ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම මගින් සිදුකර තිබුණි. එසේම සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් අවස්ථා 59 කදී තත්කාර්යය අතුරු අග්‍රිම රු. මිලියන 2.27 ක් ලබාගෙන, පියවීම මාස 1 සිට 8 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි. මාණ්ඩලික නොවන නිලධාරීන් 40 ක් වෙත අවස්ථා 247 කදී රු. මිලියන 4.3 ක් ලබාදී තිබූ අතර පියවීම මාස 2 සිට 12 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

## මධ්‍යම සංස්කෘතික අරමුදල

සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට සැලසුම් කර තිබූ පුරාවිද්‍යා වැඩබිම් 301 ක් සඳහා ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැය රු. මිලියන 211 ක්ද සෘජු ශ්‍රම පිරිවැය රු.මිලියන 368 ක්ද විය. එසේ වුවත් තථ්‍ය ද්‍රව්‍ය පිරිවැය වූ රු. මිලියන 52 කට සාපේක්ෂව රු. මිලියන 402 ක් ශ්‍රම පිරිවැය ලෙස වැය කර තිබීම හේතුවෙන් සමස්ත කාර්ය සාධනයේ ශ්‍රමය වෙනුවෙන් දායකත්වය ඉහළ අගයක් ගෙන තිබීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

අරමුදලේ අරමුණුවලට පටහැනිව කහවිල්ගොඩ ජාතික උරුම සංකල්ප කෞතුකාගාරය ඉදිකිරීම සඳහා ජාතික උරුම උයන භාරය නමින් වූ කිසිදු නීත්‍යානුකූල පදනමක් රහිත ආයතනයකට වසර 3ක් තුළ රු. මිලියන 60 ක මුදලක් ණය පදනම මත ලබාදී තිබුණි. මෙම මුදල අයථා පරිහරණය කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම අරමුදලේ කාර්යසාධනයට සෘජුව අදාල නොවන සහ අවශ්‍යතාවයක් නොමැතිව ජාතික උරුමයන් පිළිබඳ මෘදුකාංග තැටි නිෂ්පාදනය සඳහා රු.මිලියන 70.7 ක මුදලක් 2014 වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී වැයකර තිබුණු අතර මෙයින් රු. මිලියන 50 ක් පමණ මුදලක් අයථා පරිහරණය කර තිබුණු බව නිරීක්ෂණය විය.

## ටවර්හෝල් රඟහල පදනම

එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ කටයුතු සඳහා 2012 මැයි 31 දින සිට ශ්‍රමදායකත්වය ලබාගත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග එකඟතා ගිවිසුමක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අත්සන් කර නොතිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 තෙක් මිනිස් දින 37,549 ක සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 17 ක් එම දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණු අතර 2014 දෙසැම්බර් 31 වන විට රංග ශාලාව වසා දමා තිබූ කාලය අවුරුදු 3 ක් ඉක්මවා තිබූ අතර නවීකරණ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් දළ වශයෙන් රු.මිලියන 6 ක පමණ වාර්ෂික ආදායමක් පදනමට අහිමි වී තිබුණි.

## ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

උරුම සංරක්ෂණ හා ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රකට හා අප්‍රකට පුරාවිද්‍යා ස්ථාන 100 ක් පිළිබඳ වාර්තාමය වැඩසටහන් නිර්මාණය, පහතරට සම්ප්‍රදායන් ආශ්‍රිත ශාන්තිකර්ම පිළිබඳ වැඩසටහන් සජීවීව පැවැත්වීම හා ඒවා රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය කිරීම සඳහා රු.මිලියන 60 ක් ප්‍රතිපාදනය කර තිබුණද රු. මිලියන 30 කට ආසන්න ප්‍රමාණයකට වැඩසටහන් / ව්‍යාපෘති 2014 වර්ෂයේදී සැලසුම්කර නොතිබුණි. එසේම ප්‍රකට හා අප්‍රකට පුරාවිද්‍යා ස්ථාන 100 ක් පිළිබඳ වාර්තාමය වැඩසටහන් ඇතුළත් සංයුක්ත තැටි නිර්මාණය සඳහා සහ පූර්ව ප්‍රචාරක දැන්වීම් සැකසීමට රු. 13,690,521 ක් වැයකර තිබුණද මෙම තොරතුරු රූපවාහිනී මාධ්‍යයක් ඔස්සේ ප්‍රචාරය කිරීමට කටයුතු කර නොතිබුණි.

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දීඝවාපිය, නිලගිරිය හා යුධගනාව ස්ථූප සංරක්ෂණය සඳහා 2014 වර්ෂය තුළදී රු.මිලියන 6 ක් වටිනා ගඩොල් 377,000 ක් දිඝවාපිය ස්ථූප සංරක්ෂණ භූමියට සපයා තිබූ නමුත් මෙම ගඩොල්වල ප්‍රමිතිය පිළිබඳ ගැටළු සහ සංරක්ෂණයට අදාල ඇස්තමේන්තු සකස් කර නොතිබීම යන කරුණු මත 2015 ජුනි මාසය වන විටත් සංරක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

එසේම පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස 2002 නොවැම්බර් 22 වන දින ප්‍රකාශයට පත්කර තිබූ රත්නපුර නගර මධ්‍යයේ උස් භූමියක පිහිටි දෙමහල් ගොඩනැගිල්ල සංරක්ෂණය සඳහා රු.මිලියන 6.5 ක් 2014 වර්ෂයේදී ලබාදී තිබූ නමුත් 2015 මැයි මාසය වන විටත් සංරක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතේ 46 (1) වගන්තිය යටතේ පිහිටුවන ලද පුරාවස්තු තෑගී අරමුදල සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි උසාවි විසින් නියම කරන ලද දඩ මුදල්වලින්, 2010 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා එකතුවී තිබුණු රු.මිලියන 64 ක් අරමුදල පිහිටුවීමේ අරමුණු සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

**කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු**

නියමිත පරිදි ගොඩනැගිලි නඩත්තුව සිදුකර නොතිබීම නිසා කොළඹ කෞතුකාගාරයේ ප්‍රධාන තරප්පු පෙළෙහි වම්පස කොටස 2013 මාර්තු 28 දින කඩාවැටීම හේතුවෙන් අළුත්වැඩියාවන් සඳහා කෞතුකාගාරයේ මැදිරි 14 න් 9 ක් පමණක් මහජන ප්‍රදර්ශනය සඳහා විවෘතව තැබීමට සිදුවී තිබුණි. මෙම නිසා 2012 වර්ෂයට සාපේක්ෂව 2013 සහ 2014 වර්ෂවලදී කෞතුකාගාරයේ ආදායම් රු.මිලියන 4 කින් පමණ අඩුවී තිබුණි.

## කොළඹ කෞතුකාගාරයේ ආරක්ෂාව

2012 මාර්තු 16 දින කොළඹ ජාතික කෞතුකාගාරයේ සිදුවූ සොරකම නිසා අස්ථානගතව තිබූ කෞතුක භාණ්ඩ ප්‍රමාණය 221 ක් වූ අතර එම භාණ්ඩවල වටිනාකම රු. 4,440,140 කට තක්සේරු කර තිබුණි. ඉන් භාණ්ඩ 94 ක් මුල් තත්ත්වයෙන්ම ද, භාණ්ඩ කොටස් හා ගල් වශයෙන් 57 ක් ද නැවත හමුවී තිබුණු අතර අනෙකුත් භාණ්ඩ කපා, තලා දැමීම නිසා විනාශයට පත්ව තිබුණි. 2015 ජූනි මාසය වන විටත් අධිකරණමය ක්‍රියාමාර්ග අවසන්ව නොතිබුණි.

2014 වර්ෂයේදී ද කෞතුකාගාරයේ රෙදිපිළි හා මැටි බඳුන් මැදිරියේ දොරගුළු කඩා අනවසර ඇතුළුවීමක් සිදුව තිබූ අතර මේ සම්බන්ධයෙන් කිසිදු සැකකරුවෙකු හඳුනාගෙන නොතිබුණි.

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පුළුල් කිරීම යටතේ රු.මිලියන 637 ක් වැයකර ඉදිකර 2012 නොවැම්බර් මස විවෘත කර තිබූ නව ගොඩනැගිලි පරිශ්‍රයේ විවිධ අංශ සඳහා අවශ්‍ය ලී බඩු උපකරණ අයිතම 285 ක්, පරිගණක අයිතම 105 ක් සහ මහල් හතර සඳහාම අවශ්‍ය Mobile Racking System මිලදී ගැනීමට ප්‍රමාද වීම නිසා ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි.

# අධ්‍යාපනය

නැණ - ගුණ - බල - සුව - සපිරි ගුරු දෙගුරුනට සහ මවුබිමට ආදරය කරන විශ්වයට සම්පතක් වන යහපත් දක්ෂ නිර්මාණාත්මක පුරවැසියන් පිරිසක් බිහිකිරීම මඟින් ශ්‍රී ලාංකේය මානව සම්පත සංවර්ධනය කිරීමේ මෙහෙවර හා ඊට අදාළ පරමාර්ථ පෙරදැරිව, ක්‍රියාත්මකව පවත්නා අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන රාශියකි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය සහ ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම එම ආයතන වේ. මීට අමතරව අධ්‍යාපන ක්ෂෙත්‍රයට අයත් කාර්යභාර්ය ඉටුකිරීම සඳහා විදේශාධාර හා විදේශ ණය ව්‍යාපෘතිවල දායකත්වය ලැබී තිබුණි.

අධ්‍යාපනය සඳහා සළසා තිබුණු පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන 2009 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 85,198 ක් හා රු.මිලියන 7,511 ක් වූඅතර, 2013 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 107,740 ක් හා රු.මිලියන 10,726 ක් විය. 2014 වර්ෂය වන විට එය පිළිවෙලින් රු.මිලියන 118,982 ක් හා රු.මිලියන 17,202 ක් වී තිබුණු අතර ඒ තුළ විදේශීය ණය හා ආධාර ලෙස ලැබී තිබුණු රු.මිලියන 2,907 ක්ද විය.2013 වර්ෂය සමඟ සැසඳීමේදී පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 10 කින් හා මූලධන ප්‍රතිපාදන සියයට 60 කින් වැඩිවී තිබුණි.

## පාසැල්, ශිෂ්‍ය හා ගුරුභවතුන් සංඛ්‍යාව

2009 වර්ෂයේදී 9,410 ක් වූ රජයේ පාසැල් සංඛ්‍යාව 2014 වර්ෂය අවසන් වන විට 10,119 ක් දක්වාද, 2009 වර්ෂයේදී 3,860,176 ක් වූ රජයේ පාසැල් වල ශිෂ්‍ය සංඛ්‍යාව 2014 වර්ෂය අවසන් වන විට 4,078,037 ක් දක්වාද, 2009 වර්ෂයේදී 213,694 ක් වූ ගුරුභවතුන් සංඛ්‍යාව 2014 වර්ෂය අවසන් වන විට 232,989 ක් දක්වාද වැඩිවී තිබුණි.මේ අනුව පාසැලක සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව 2009 වර්ෂයේදී 410 ක් වන බව වාර්තා වූ අතර එය 2014 වර්ෂය වන විට 403 දක්වා අඩුවීම් සහගත ප්‍රවනතාවයක් නිරීක්ෂණය විය. එසේම ගුරු ශිෂ්‍ය අනුපාතය 2009 වර්ෂයේදී 18 ක් වූ අතර එය 2014 වර්ෂය වන විට 17 දක්වා වර්ධනයවීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය විය.

## ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු

### ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන ක්‍රියාවලිය වඩා ඵලදායී අන්දමින් සිදුවන පරිදි හා ගුරුභවතුන් හා ශිෂ්‍යයින්ගේ සුභසාධනය උපරිම වන පරිදි පාසල්වල ගුරුමාරු ප්‍රතිපත්තියක් සකස්කර ක්‍රියාත්මක කිරීමේ අරමුණ නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික පාසැල් 193 ක පවතින ගුරු ඌනතා 2,248 ක් හා ජාතික පාසැල් 163 ක පවතින ගුරු අතිරික්තතා 1,387 ක් අවම කර ගැනීමට කටයුතුකර නොතිබුණු බවත්, ජාතික පාසැල් 200 ක ගුරුභවතුන් 4,268 දෙනෙකු වර්ෂ 12 ත් 35 ත් අතර කාලයක් ස්ථාන මාරුවීම් නොලබා එකම පාසැලක සේවයේ යෙදී තිබුණු බවත්, විශේෂ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය සඳහා බඳවා ගෙන පුහුණු කරන ලද ගුරුභවතුන් 118 ක් විශේෂ අධ්‍යාපන ඒකක රහිත

ජාතික පාසැල් 72 ක් වෙත අනුයුක්ත කර තිබුණු බවත්, විශේෂ අධ්‍යාපන ඒකක සහිත ජාතික පාසල් 40 කට අනුයුක්ත කර තිබුණු පුහුණු ගුරුභවතුන් 58 ක් සාමාන්‍ය සිසුන් සඳහා වූ පන්තිවල ඉගැන්වීම් සඳහා යොදවා තිබුණු බවත් නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.

## පාසැල් වෙත දරුවන් ඇතුළත් කිරීම්

**සෑම දරුවෙකුටම සමාන අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණට පටහැනිව හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ජාතික පාසැලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 හා ද්විතීක ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 යන සීමාවන් ඉක්මවා, ජනප්‍රිය ජාතික පාසැල් 20 කට දරුවන් 9,329 දෙනෙකු ඇතුළත් කර තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.**

## තාක්ෂණවේදය විෂයධාරාව හඳුන්වාදීම

2013 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා අළුතින් හඳුන්වා දුන් තාක්ෂණවේදය විෂයධාරාව වෙනුවෙන් මහින්දෝදය තාක්ෂණික විද්‍යාපීඨ 250 ක් ඉදිකිරීම සඳහා අනුමත මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන7,000 ක්වූ අතර 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 2,791 ක් වැය කර විද්‍යාපීඨ 02 ක් සම්පූර්ණයෙන් නිම කර 248 ක් අර්ධ වශයෙන් නිමකර තිබුණි. විද්‍යාපීඨ ඉදිකර අවසන් කිරීමට ප්‍රථම, 2014 වර්ෂය තුළදී රු.මිලියන 970 ක් වැයකර මෙම විද්‍යාපීඨ 250 සඳහා ලී බඩු හා අදාළ තාක්ෂණික උපකරණ මිලදී ගෙන තිබුණු බැවින් වර්ෂයකට වඩා වැඩි කාලයක් එම වත්කම් නිශ්ක්‍රීයව තබා තිබුණු අතර වගකීම් සහතික කල් ඉකුත්වී තිබුණි. අවශ්‍ය භෞතික හා මානව සම්පත් සහ අදාළ යටිතල පහසුකම් ලබා දීමට පෙර තාක්ෂණවේදය විෂයධාරාව සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම හේතුවෙන්, විෂය නිර්දේශයෙන් සියයට 15 ක් වූ ප්‍රායෝගික පුහුණුවීම් ලබානොදී 2015 අගෝස්තු මස පැවැත්වීමට නියමිත උසස් පෙළ විභාගය සඳහා ශිෂ්‍යයින්ව ඉදිරිපත් කරන බවත්, පාසැල් 13 ක විෂයධාරාව හැදෑරීම සඳහා එකම ශිෂ්‍යයෙකු හෝ නොමැති බවත්, පාසැල් 20 ත් 62 ත් අතර ප්‍රමාණයක මෙම විෂයධාරාව හදාරන ශිෂ්‍යයින් 1 ත් 9 ත් අතර ඉතා අඩු සංඛ්‍යාවක් වන බවත්, එකිනෙක විෂයයන් සඳහා සමස්ථ ගුරු ඌනතාවය 165 ක් වන බවත් අනාවරණය විය. එබැවින් තාක්ෂණවේදය විෂයධාරාව ව්‍යාප්ත කිරීම සඳහා අදාළ විද්‍යාපීඨ ඉදිකිරීම් කඩිනමින් අවසන් කර, ශිෂ්‍යයින් බඳවා ගෙන, උපකරණ නිසියාකාරව ප්‍රයෝජනයට ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීමේ වැදගත්කම නිරීක්ෂණය කෙරේ.

## මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීම.

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර 860 ක් ඉදිකිරීම සඳහා 2012, 2013, හා 2014 වර්ෂවලදී රු.මිලියන 8,557 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය වියදම රු.මිලියන 8,519 ක් විය. එදිනට ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණු විද්‍යාගාර 822 ක් පමණක් වූ අතර අර්ධ වශයෙන් නිමකර තිබුණු විද්‍යාගාර ප්‍රමාණය 38 ක් විය.

## නව ආදර්ශ පාසැල් 457 ක් වැඩිදියුණු කිරීම.

නගරබද ජනප්‍රිය පාසැල් අවට ඇති, සම්පත් බහුල නමුත් අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසැල් වෙත පහසුකම් ලබාදෙමින් වැඩිදියුණු කිරීම, පාසැල් අතර විෂමතාවයන් අවම කිරීම, ජනප්‍රිය පාසැල්වලට ඇති තරඟකාරිත්වය අඩු කිරීම, පාසැල් හැර යන සිසුන් සංඛ්‍යාව අවම කර ගැනීම හා පාසැල හා ප්‍රජාව අතර සම්බන්ධතාවය වැඩිකර ගැනීම යන අරමුණු පෙරදැරිව නව ආදර්ශ පාසැල් 457 ක් වැඩිදියුණු කිරීම 2008 වර්ෂයේදී ආරම්භකර තිබුණු අතර එතැන් සිට 2011 වර්ෂය දක්වා වර්ෂ 04 ක් තුළදී මෙම වැඩ සටහන යටතේ පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 316 ක ප්‍රතිපාදන සපසා තිබුණු නමුත් 2012, 2013 හා 2014 වර්ෂ තුන සඳහාම රු.මිලියන 118 ක පමණක් ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 73 ක් පමණක් වැයකර තිබුණි. එකිනෙක වර්ෂවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය දැක්වෙන කාර්ය සාධන වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් මෙම වැඩසටහනෙහි කාර්යසාධනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කළ නොහැකි වන අතර වැඩසටහන ආරම්භ කරන ලද අරමුණු ඉටුකර ගෙන අවසන් බැවින් ප්‍රතිපාදන සැළසීම අඩුකර තිබේද නැතහොත් ව්‍යාපෘතිය අසාර්ථක බැවින් ක්‍රමයෙන් ප්‍රතිපාදන අඩු කරන්නේද යන්න තහවුරු කර ගත නොහැකි විය.

## පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම්

පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව, 2014 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන හා අග්‍රිම මුදල් ලබාදී නොතිබීම හේතුවෙන් ජාතික පාසල් 119 කට අදාළව මුළු ශිෂ්‍යත්වධාරීන් 24,506 ක් වෙත රු.මිලියන 52 ක්ද, නියමිත පරිදි වවුචර්පත් ඉදිරිපත් නොකෙරීම හේතුවෙන් ජාතික පාසල් 29 කට අදාළව මුළු ශිෂ්‍යත්වධාරීන් 1,813 ක් වෙත රු.මිලියන 4 ක්ද වශයෙන් ගෙවා නොතිබුණු ශිෂ්‍යාධාරවල මුළු වටිනාකම රු.මිලියන 57 ක් වන බව සමස්ථ කළාප අධ්‍යාපන කාර්යාල 97 න් 50 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. ඒ අනුව අඩු ආදායම්ලාභී දෙමාපියන්ගේ දරුවන්ට හිමි ශිෂ්‍යාධාර නොලැබීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය හා මානසික තත්ත්වය පහළයාමට හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

## පිරිවෙන් ශිෂ්‍ය ප්‍රදාන හා පුස්තකාල ආධාර

ශිෂ්‍ය පැමිණීමේ සාමාන්‍ය ඇතුළත් වාර්ෂික වාර්තා නිසි පරිදි පිළියෙල කරවා ගෙන්වා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වාදී නොතිබීම, නිසි පසුවිපරමක් සිදුකර නොතිබීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබීම හා ක්‍රියාකාරි සැලැස්මකට අනුව විධිමත්, ක්‍රමවත් හා සාධාරණ ලෙස ප්‍රදාන හා ආධාර මුදල් බෙදී යන වැඩ පිළිවෙලක් හඳුන්වාදී නොතිබීම ආදී වූ කරුණු හේතුවෙන්, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව හා පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සෑම ලියාපදිංචි පිරිවෙනක් වෙතම ගෙවිය යුතුව තිබුණු ශිෂ්‍ය ප්‍රදාන හා පුස්තකාල ආධාර නියමිත පරිදි ගෙවා නොතිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට හිඟ මුදල රු. මිලියන 3.02 ක් විය.

## පරිගණකාගාර 775 ක් සඳහා පරිගණක හා ලැප්ටොප් ඇතුළු අදාළ අනෙකුත් උපකරණ මිලදී ගැනීම

පරිගණකාගාර 775 ක් සඳහා අන්තර් ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක පරිගණක හා ලැප්ටොප් ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව සහ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුකූල නොවන පරිදි, අන්තර්ජාතික තත්ත්වයේ නොවන පරිගණක මාදිලියක පරිගණක හා ලැප්ටොප් ඇතුළු අදාළ අනෙකුත් උපකරණ සපයා සවිකරවා ගැනීමට වැය කර තිබුණු මුළු මුදල රු.මිලියන 5,618 ක් විය. මෙහිදී එක් පරිගණක මධ්‍යස්ථානයන් සඳහා මිලදී ගෙන තිබුණු පරිගණක හා ලැප්ටොප් වෙනුවෙන් වැයකර තිබුණු මුදල රු.මිලියන 7.2 ක් වුවද, වෙනත් පරිගණකාගාර 40 ක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුකූලව අන්තර් ජාතික තත්ත්වයේ පරිගණක මාදිලියක පරිගණක හා ලැප්ටොප් මිලදී ගැනීමේදී එක් පරිගණකාගාරයක් සඳහා වැයකර තිබුණු මුදල රු.මිලියන 6.9 ක් පමණක් විය.

## පාසැල්වල තොරතුරු තාක්ෂණය භාවිතය

පාසැල් හා අධ්‍යාපන ආයතන 1,724 ක් වෙත ලබාදී තිබුණු පාසැල් පරිගණක ජාලයේ මෙහෙයුම් කටයුතු, උපකරණ සැපයීම හා දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන්, 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී වැයකර තිබුණු මුළු මුදල රු.මිලියන 855 ක් විය. පාසැල් පරිගණක ජාලයට අදාළ මාසික දුරකථන බිල්පත් පියවීමට ප්‍රථම, එහි කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය පිළිබඳ නිර්දේශ ලබාගැනීමකින් තොරව හා බිල්පත් අදාළවන පාසැල හෝ ආයතනය හඳුනාගැනීමකින් තොරව, 2011, 2012, 2013 හා 2014 වර්ෂවලදී පමණක් පියවා තිබුණු දුරකතන බිල්පත්වල මුළු වටිනාකම රු.මිලියන 814 ක් විය. පාසැල් පරිගණක ජාලය මන්දගාමී වීම, බොහෝ අවස්ථා වලදී සම්බන්ධතා විදාන සංඥා (signal) නොමැතිවීම ආදීවූ විවිධ හේතු රාශියක් නිසා බොහෝ පාසැල් මෙය භාවිතයෙන් ඉවත් කර ඇති බව තහවුරු විය.

තවද පාසැල්, කොට්ඨාස, කළාප, පළාත් හා අමාත්‍යාංශ මට්ටමේ සියළුම අධ්‍යාපන ආයතන වල, මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය කටයුතු වලට අදාළ තොරතුරු මෙන්ම, අන්තර්ජාලය හරහා කෙළින්ම ගුරුවරයාගේ පෞද්ගලික ලිපිගොනුව හා සම්බන්ධ රාජකාරී ඉටුකර ගැනීමටද, ගුරුභවතුන්ට තමන්ගේ තොරතුරු පරීක්ෂා කිරීම, නව තොරතුරු ඇතුළත් කිරීම, ස්ථාන මාරුවීම් හා පුහුණු අවස්ථා සඳහා අයදුම් කිරීම, අමාත්‍යාංශයට අවශ්‍ය සංඛ්‍යාත්මක වාර්තා ලබාගැනීම ආදී වූ විවිධ අරමුණු ඉටුකර ගැනීමට අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2011 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළදී වැය කර තිබුණු මුළු මුදල රු.මිලියන 64 ක්වූ නමුත්, වියදමේ ඵලදායිකත්වයක් හා කාර්යසාධනයක් නොමැති බවත්, මේ සම්බන්ධයෙන්වූ අරමුණු ළඟා කර ගැනීමට නොහැකිවී තිබුණු බවත් අනාවරණය විය.

# පරිසරය

පාරිසරික දූෂණය වලක්වා පරිසරය ආරක්ෂා කිරීම සහ යහපත් පාරිසරික තත්ත්වයක් රටතුළ පවත්වාගෙන යාම පිණිස පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සහ වනජීවී සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන් යටතේ පවතින වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය යන ආයතන ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධව කටයුතු කර තිබුණි.

## වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවට උරුම වී ඇති විශාල ජෛව විවිධත්ව උරුමය, පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීම සඳහා වනජීවී රක්ෂිත ජාලය ස්ථාපිත කිරීම හා කලමනාකරණය කිරීම, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වනජීවී හා ශාඛ විශේෂයන් සංරක්ෂණය හා වන සම්පත් ප්‍රයෝජනයට ගනු ලබන ජනතාව වෙනුවෙන් සමාජ හා ආර්ථික වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉටුකල යුතු කාර්යයන් වේ. මෙරට පවතින වන රක්ෂිතයන් වල භාරකාරත්වය දරන මෙම දෙපාර්තමේන්තුව වන උද්‍යාන වලට ඇතුළුවීම සඳහා ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් සහ වෙනත් කටයුතු වලින් 2014 වර්ෂය තුලදී රු.බිලියන 2.5 ක ආදායමක් උපයා වන සත්ව සංරක්ෂණ අරමුදලට බැර කර තිබුණි. මෙයට අමතරව මහාභාණ්ඩාගාරයෙන් දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 1,243 ක මුදලක් ලබාදී තිබුණි.

ඉකුත් වර්ෂ වලදී කැලයෙන් අල්ලාගත් ඇත්පැටවුන් සඳහා නීති විරෝධී ලෙස බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව විගණනය විසින් කරුණු පෙන්වා දීමෙන් පසුව 2014 වර්ෂයේදී ඇත්පැටවුන් 6 දෙනෙකු ලගතබාගෙන සිටි පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබුණි.

අලිමිනිස් ගැටුම් අවම කිරීමේ පිළියමක් ලෙස රු.මිලියන 189 ක් වැයකර හෙක්ටයාර් 1,117 ක භූමිභාගයක් තුළ ඇත්ගාලක් ඉදිකර තිබුණු අතර ඉදිකිරීම් වල අඩුපාඩු හේතුවෙන් රු.මිලියන 81.2 ක අලාභයක් සිදුව තිබුණු අතර විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර විද්‍යාත්මක පදනමකින් තොරව මෙම ඇත්ගාල ඉදිකර තිබීම හා ඇත්ගාල පවත්වාගෙන යාමට නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කර නොතිබීමත් නිසා මෙහි මුඛ්‍ය පරමාර්ථය වූ ඇතුන් ගාල් කර තැබීමේ කටයුතු සාර්ථක වීමට ඇති ඉඩකඩ අවම බව විගණනයේදී නිරීක්ෂණ විය.

දෙපාර්තමේන්තුවට අයත් වනජීවී සංරක්ෂණ අරමුදලින් ඉදිකර තිබුණු සංචාරක බංගලාවක් සඳහා කොන්ත්‍රාත්කරුට රු.මිලියන 15 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

හග්ගල දැඩි ස්වභාව රක්ෂිත භූමියේ නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශය තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම් 116 ක් ද, බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම් 103 ක් ද, වාර්තා වී තිබුණු අතර, පරිසර සංවේදී ප්‍රදේශයන් වන මෙම රක්ෂිත රැකගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග එනම් අනවසර අත්පත්කර ගැනීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## මධ්‍යම පරිසර අධිකාරිය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව මධ්‍යම පරිසර අධිකාරිය යම් පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ නිර්දේශ අනුව ක්‍රියා කරන ලෙස හා ඒ නිර්දේශ බලාත්මක කරන ලෙස ඒ පළාත් පාලන ආයතනයට නියම කිරීම අධිකාරියේ ප්‍රධාන අරමුණු අතර වේ. අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක ප්‍රගතිය පහත පරිදි විය.

පසුභාවිත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය ව්‍යාපෘති යටතේ පොලිතීන් පටල සැකසීමේ යන්ත්‍රයක් සහ ප්ලාස්ටික් පොලිතීන් ඇට සැකසීමේ යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 6.22 ක් වැය කර තිබූ අතර සැලසුමකින් තොරව හදිසි අවශ්‍යතාවය සේ සලකා යන්ත්‍රය ගුවනින් ගෙන්වීම නිසා රු. මිලියන 1.23 ක අලාභයක් සිදු වී තිබුණි.

රු. මිලියන 395 ක් වැයකර ඉදිකිරීම් නිමකර අධිකාරිය වෙත භාරදෙන ලද දොම්පේ සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමකින් තොරව වසරකට අධික කාලයක් නිෂ්කාර්යව පැවති බව 2015 මාර්තු 06 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.එසේම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු වලට අදාළව සිදුවී තිබුණු රු.මිලියන 49.6 ක අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ආර්ථික සහයෝගීතා අරමුදල් ණය පහසුකම් යටතේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඇති කිරීම සඳහා ඉදිකිරීමට යෝජනා කර තිබුණු බිම් පිරවුම් මධ්‍යස්ථාන 4 ක් ඉදිකිරීමේ කටයුතු 2013 නොවැම්බර් මාසයේ සිට ආරම්භ කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. මෙම නිසා 2014 වර්ෂය තුළදී කොරියන් රජය ලබාදීමට එකඟවී තිබුණු එ.ජ.ඩොලර් 1,340,608 ක් ව්‍යාපෘතිය සඳහා යොදවා ගැනීමට අපොහොසත් වී තිබුණි.

පිළිසරු ව්‍යාපෘතිය 2010 වර්ෂයේ නිමකිරීමට සැලසුම් කර තිබුණද 2015 අගෝස්තු අවසානය දක්වාම අවසන් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.බිලියන 5.633 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැයකර තිබුණේ සියයට 42 ක් පමණි. ව්‍යාපෘතියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සංරචකය යටතේ පළාත් පාලන ආයතන 121 ක කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 1,601 ක මුල්‍ය අනුග්‍රහය දක්වා තිබුණි. මෙම අංගන වලින් කොම්පෝස්ට්කරණය සිදු නොකරන අංගන 06 ක්, ඉදිකිරීම් ක්‍රියාත්මක වෙමින් පවතින අංගන 05 ක් සහ අක්‍රීය අංගන 05 ක්, ඉදිනොකරන ලද අංගන 02 ක් පවතින බව නිරීක්ෂණය විය.

නාය ගහ කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය මඟින් සමනළ අඩවිය රක්ෂිතය තුළ අමුණක් ඉදිකර ජලය හරවා විදුලි බලාගාරය තැනීම මඟින් සිදුවී තිබූ පරිසර හානිය සම්බන්ධව ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පරිසර අනුමැතිය ලබාදීමට අදාල කොන්දේසි සපුරාලීමට ව්‍යාපෘති යෝජක වන ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය අපොහොසත්වී ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී හා පසු විපරම් පරීක්ෂණ වලදී තහවුරු කරගෙන තිබුණද එම නිරීක්ෂණයන් නොසලකා 2011 අප්‍රේල් 12 සිට 2017 අප්‍රේල් 12 දක්වා පරිසර බලපෑම් ඇගයීමේ අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් මහජන

නියෝජන පැමිණිලි 113 ක් ලැබී තිබුණද ඒ පිළිබඳව කළමනාකරණ අවධානය යොමුකර නොතිබුණි. මේ අනුව මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා සඳහා අනුමැතිය ලබා දීමේදී පාරිසරික අවදානම් තත්ත්වයන් නොසලකා හැරීම නිසා මෙවැනි පාරිසරික හානි සිදුවී තිබුණි. මේ අනුව අධිකාරිය මූලික සමාජ වගකීමෙන් බැහැර වී ඇති බව නිරීක්ෂණය විය.

2014 වර්ෂය තුළ පරිසර පැමිණිලි 2053 ක් ලැබී තිබූ අතර ඉන් 1614 ක් හෙවත් සියයට 79 ක් විසඳී නොතිබුණි. මේ අනුව පැමිණිලි විසඳීමේ ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධන කර වැඩිදියුණු කිරීමට අවශ්‍ය හඳුනාගත් අංශයන් 18 ක් වෙනුවෙන් පනතේ සංශෝධනයන් සිදුකර නොතිබුණි.

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන අරමුණු අතරට ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාප වල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රය සම්බන්ධ කාර්යයන්ගෙන් දූෂණය වීම වැළැක්වීම, අඩු කිරීම, පාලනය කිරීමේ සහ කළමනාකරණ කාර්යයන් ඇතුළත් වේ.

2012 වර්ෂයේදී නෞකාවකින් තෙල් කාන්දුවීම නිසා ඇතිවීමට ඉඩ තිබුණු සමුද්‍ර දූෂණය වැලැක්වීම පිණිස අධිකාරිය විසින් දරන ලද සියළු වියදම්, අදාල නෞකාවේ හිමිකරුවන්ගෙන් අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබුණද ඒ සම්බන්ධයෙන් වැයකර තිබුණු රු. මිලියන 11.55 ක වියදම 2014 වර්ෂයේදී ද අයකර ගෙන නොතිබුණි. අධිකාරියේ 2009 වර්ෂයේදී පිහිටුවන ලද විද්‍යාගාරයේ උපකරණ මිලදී ගැනීම සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 31.16 ක් වියදම්කර තිබූ අතර මෙතෙක් විද්‍යාගාරය විසින් කරන පරීක්ෂණ වල වාර්තා ප්‍රසිද්ධ කිරීමට හෝ එම වාර්තා මත පදනම්ව සමුද්‍රීය දූෂණය වැලැක්වීමට ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර නැව් මගින් ඉවතලන බැලස් ජලය ඔස්සේ ආගන්තුක ආක්‍රමණ ජීවීන් ශ්‍රී ලංකා සාගර කලාපයට ඇතුළු වීම කළමනාකරණය සඳහා වූ ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ රු. මිලියන 5.58 ක් සහ සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 4.46 ක් වශයෙන් රු. මිලියන 10.04 ක් වියදමක් දරා තිබුණු නමුත් 2015 ජූනි අවසානය දක්වා ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සකස්කර නොතිබුණි.

# විදේශ කටයුතු

විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ 2014 වර්ෂය අවසාන වන විට මහ කොමසාරිස් කාර්යාල 14 ක් තානාපති කාර්යාල 37 ක් හා කොන්සියුලර් ජනරාල් කාර්යාල 11 ක් ඇතුළුව විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සංඛ්‍යාව 67 ක් විය.

2014 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 10,063.39 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර රු.මිලියන 9,769.53 ක් වියදම් කර තිබුණි. මෙයින් දූත මණ්ඩල විසින් දරන ලද වියදම රු. මිලියන 7,966.34 ක් වූ අතර එය මුළු වියදමින් සියයට 82 ක් නියෝජනය වී තිබුණි. දූත මණ්ඩල වියදම තුළ ලන්ඩනයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය වෙනුවෙන් රු.මිලියන 436 ක්ද ජිනීවා පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලය වෙනුවෙන් රු.මිලියන 426 ක්ද වැයකර තිබුණි. නිව්යෝර්ක්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කුලී ගාස්තුව රු.මිලියන 26.67 ක් විය.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ කටයුතු විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක අඩුපාඩු කරුණු කිහිපයක්

- විදේශ සේවය අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ සේවා නිලධාරීන්ගේ බර ගමන් බඩු වරායෙන් නිදහස් කර ගැනීමේ දී නිරන්තර ප්‍රමාද ගාස්තු ගෙවීම් අනාවරණය විය. 2014 වර්ෂයේදී ගෙවන ලද ප්‍රමාද ගාස්තුව රු. මිලියන 3.73 ක් වූ අතර එය බර ගමන් බඩු නිදහස් කර ගැනීමේ මුළු ගෙවීම වූ රු. මිලියන 12.78 කින් සියයට 29 ක ප්‍රතිශතයකි.

- විකුණුම් මිල රු.මිලියන 35.9 ක් වූ අධි සුඛෝපභෝගී බස් රථ දෙකක් කල් බදු ක්‍රමය යටතේ රු.මිලියන 55 ක මුදලකට වාරික 60 කින් ගෙවීමට 2013 නොවැම්බර් මාසයේදී ලබාගෙන තිබූ නමුත් එම බස් රථ ආවරණයක් රහිතව අමාත්‍යාංශ රථ ගාලේ නිශ්ක්‍රීයව ගාල් කර තිබීම.

- වර්ෂ 5 කට වඩා පැරණි රු.මිලියන 87 ක් වූ අග්‍රිම ශේෂ පියවා නොතිබීම.

- බේරුම් නොකළ අත්තිකාරම් සහ දූත මණ්ඩල මුදල් ශේෂ ඇතුළු අමාත්‍යාංශයේ තිබියයුතු අග්‍රිම ශේෂය සහ පොත්වල දැක්වෙන ශේෂය අතර වූ රු.මිලියන 75 ක් වූ වෙනස ගලපා නොතිබීම.

- 2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා විදේශ දූතමණ්ඩල කාර්යාලවල නොපියවූ අත්තිකාරම් ශේෂය රු.මිලියන 365 ක් වූ අතර දූත මණ්ඩල වලට අදාල වර්ෂ 6 කට වැඩි නොපියවූ රු.මිලියන 91 ක් අත්තිකාරම් ශේෂයන්ද එයට ඇතුළත් විය.

- ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සතු ඔස්ට්‍රේලියානු ඩොලර් 2,589,000 ක වටිනා ගොඩනැගිලි 02 ක් වර්ෂ 1 ක සහ වර්ෂ 6 ක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

# විදේශ රැකියා නියුක්තිය

2014 වර්ෂය තුළ විදේශ ශ්‍රම වෙළඳපල සඳහා විදේශගත වූ මුළු ශ්‍රමික සංඛ්‍යාව 300,413 කට ආසන්න වූ අතර මේ හරහා ශ්‍රී ලංකාවට රු.මිලියන 916,344 ක ප්‍රේෂණ ලැබෙතැයි මහා බැංකු වාර්තාවෙහි ඇස්තමේන්තුගත කර තිබුණි. විදේශ රැකියා කර්මාන්තය සඳහා වන නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වුවද කාර්යාංශයේ විගණනයේදී අනාවරණය වූ කාර්යාංශයේ අරමුණු වලට පටහැනි සැලකිය යුතු අඩුපාඩු පහත දැක්වේ.

- විගමනිකයින්ගේ පැමිණිලි /ආරවුල් 252 සමථයකට පත්කර ගැනිම සඳහා නියෝජිත ආයතන විසින්, 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා කාර්යාංශයේ තැන්පත් කර තිබූ මුදල් රු. මිලියන 12.45 ක් අදාල පාර්ශ්වයන්ට නොගෙවා රඳවාගෙන තිබුණි.

- විගමනික ශ්‍රමිකයන් සඳහා අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රමයක් කාර්යාංශය විසින් 1989 සිට 1996 වර්ෂය දක්වා කාල සීමාව තුළ පිහිටුවා පවත්වා ගෙන ගොස් තිබූ අතර දායක මුදල් ලෙස විගමනිකයින් ගෙවනු ලැබූ මුදලින් සියයට 60 ක් අදාල ශ්‍රමිකයා වෙනුවෙන් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ තැන්පත් කර රු. මිලියන 6.11 ක් වූ ඉතිරිය අදාල ශ්‍රමිකයන් වෙත මුදා නොහැර කාර්යාංශය විසින් රඳවා ගෙන තිබුණි.

- 1990 වර්ෂයේ දී ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීමෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබුණු මුදල් වලින් රු.මිලියන 2,975.5 ක් එකී පුද්ගලයින්ට නොගෙවා 2014 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යාංශය විසින් රඳවා ගෙන තිබුණි.

- විගමණිකයන් වෙත ගෙවිය යුතු මුදල් බේරුම් කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්,
  - මාස 24 ක් ඉක්මවූ රක්ෂණ වන්දි රු. මිලියන 3.45 ක්
  - විගමණිතයන්ගෙන් රු.50,000 බැගින් අයකර ගත් ආපසු ගෙවන තැන්පත් රු.මිලියන 18.35 ක්
  - වර්ෂයක් ඉක්මවූ රක්ෂණ වන්දි රු.මිලියන 2.06 ක්

- ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වූ ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රු.මිලියන 20 ක අත්තිකාරමක් ගෙවා තිබූ නමුත් ගනුදෙනුව බේරා ඉඩම පවරාගෙන අවශ්‍ය අරමුණට යොදා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 727.56 ක් වූ අතර විගමණිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් රු. මිලියන 232.98 ක් හෙවත් සියයට 32 ක් වැය කර තිබුණි. ඉතිරි සියයට 68 ක් වූ රු. මිලියන 494.58 කින් වැටුප් ආයතන පරිපාලන ආදී වියදම් නියෝජනය වේ.

- කාර්යාංශය පිහිටුවීමේ පනතට පටහැනිව අරමුණුගත නොවූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 හා 2014 වර්ෂවල පවත්වන ලද සංගීතමය වැඩසටහනක් වෙනුවෙන් දරා තිබුණු මුළු

වියදම රු. මිලියන 134.48 කි. අරමුණු කළ ව්‍යාපෘතිය අත්හැර දැමීම හේතුවෙන් ඒ සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් විය.

- වෙළඳපල මිල සැදහුම් ක්‍රමයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටින්ගෙන් බැහැරව කොරියානු නේවාසික පුහුණුලාභින්ට ආහාරපාන සැපයීම වෙනුවෙන් රු.මිලියන 38.31 ක් ගෙවීම් කර තිබුණි. කොරියානු නේවාසික පුහුණු වැඩසටහන් 28 ක පුහුණුලාභින් 1,244 ක් වෙනුවෙන් රු.මිලියන 9.53 ක් වූ ආහාර සැපයීම් ගාස්තු කොන්ත්‍රාත්තු ගිවිසුමක් හෝ ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

- කාර්යාංශයේ පරිපාලිත සමාගම වෙත 2012 වර්ෂයේදී ලබාදුන් රු.මිලියන 20 ක ණය මුදල අයකර ගන්නා ලෙසත්, සමාගමට ණයදීම අවශ්‍ය නොවන බව 2012 අගෝස්තු 14 දින පවත්වනු ලැබූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද, 2014 වර්ෂයේදී නැවත වරක් රු. මිලියන 20 ක ණය මුදල් ප්‍රදානය කර තිබුණි. සමාගමේ ආයෝජන සඳහා 2009 වර්ෂය දක්වා ලාභාංශ ලැබී නොතිබූ අතර ඉන්පසු 2014 වර්ෂය දක්වා ලැබී තිබූ රු.මිලියන 3.5 ක් ආපසු සමාගම වෙත ගෙවා තිබුණි.

# ධීවර හා පශු සම්පත්

## ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ ජනතාවගේ පෝෂණ මට්ටම නගා සිටුවීමේ කාර්යයේදී ධීවර ක්ෂේත්‍රය ප්‍රධාන ස්ථානයක් ගන්නා අතර ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා වගකීම පැවරී ඇති ආයතනය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයයි. වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම සිය මෙහෙවර කරගත් අමාත්‍යාංශය ඒ යටතේ වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (මත්ස්‍ය සම්පත කළමනාකරණය), ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (මිරිදිය ධීවර හා ජලජීවී වගා සංවර්ධනය), ධීවර වරාය නීතිගත සංස්ථාව (වරායන් හා නැංගුරම්පලවල් සංවර්ධනය සහ කළමනාකරණය), ජාතික ජල සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (විද්‍යාත්මක පර්යේෂණ), ලංකා ධීවර සංස්ථාව (අලෙවිකරණ කළමනාකරණය), සී/ස සීනෝර් පදනම (යෙදවුම් සැපයීම), පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමණාකරණ භාරය යන ආයතන අධීක්ෂණය තුළින් එම අරමුණු ඉටුකිරීමට අපේක්ෂා කරයි.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ඇතුළු අමාත්‍යාංශය යටතේ වූ ආයතන සඳහා 2014 වර්ෂය සඳහා රු.මිලියන 9,416 ක ප්‍රතිපාදන ලැබී තිබූ නමුත්, රු.මිලියන 8,069 ක් පමණක් වැය කර තිබූ අතර, රු.මිලියන 1,347 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විගණනයේදී නිරීක්ෂණය වූ වැදගත් කරුණු කීපයක් පහත දැක්වේ.

## මච් යාත්‍රා 02 ක් මිලට ගැනීම

අමාත්‍යාංශය විසින් මච් යාත්‍රා 02 ක් රු. මිලියන 326.02 කට මිලදී ගැනීම සඳහා 2007 වර්ෂයේදි විදේශීය සැපයුම්කරුවෙකු සමග ගිවිසුමකට එළඹ 2015 අගෝස්තු 31 දින දක්වා රු. මිලියන 113.55 ක මුදලක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම වාර්ෂිකව ප්‍රතිපාදන සළසා තිබුණද එම ප්‍රතිපාදන වලින් රු. මිලියන 541.01 ක් ඒ ඒ වර්ෂවල වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබූ අතර අරමුදල් ඵලදායි ලෙස උපයෝගී කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණු බැවින් පවත්නා සම්පත් ඵලදායී අයුරින් භාවිතයට ගැනෙන බවට තහවුරු කරන ලෙසත් කාර්ය සම්බන්ධයෙන් දැඩි අධීක්ෂණයක් සිදුකළ යුතු බවටත් 2013 අගෝස්තු 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට අවධාරණය කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය ආරම්භ කර වසර 08 ක් ගතවී තිබුණද මච් යාත්‍රා මිලට ගෙන නොතිබූ බැවින් මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට අමාත්‍යාංශය අසමත්වී තිබුණි.

## දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම ව්‍යාපෘතිය

අමාත්‍යාංශය විසින් 2009 වර්ෂයේ විදේශාධාර මත ආරම්භ කර 2011 වර්ෂයේ අවසන් කර තිබූ මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කර රු.මිලියන 792 ක ඇස්තමේන්තු අගයක් මත දේශීය අරමුදලින් 2011 වසරේ සිට ඉදිකිරීම් සිදුකර තිබුණි. මෙම වරාය සඳහා යාත්‍රා අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් සී/ස සීනෝර් පදනමට අයත් මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් රු.මිලියන 180 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැයකර තිබුණි. මේ වෙනුවෙන් ධීවරයින්ට සහන මිලට බෝට්ටු සහ යාත්‍රා අලුත්වැඩියා කර දීමට එකඟවී තිබූ බැවින් ඒ සඳහා වූ යෝජනා ක්‍රමයක් සකස් කරන ලෙස 2013 ජනවාරි 13 දින රාජ්‍ය ගිණුම් කාරක සභාව නියෝග කර තිබුණද එවැනි යෝජනා ක්‍රමයක් 2015 අගෝස්තු 31 දක්වාම සකස් කිරීමට කටයුතු කර නොතිබුණු අතර සීනෝර් පදනම වාණිජ පදනමින් යාත්‍රා නිෂ්පාදන කටයුතු සිදුකර තිබුණි. මේ හේතුවෙන් ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා මහා භාණ්ඩාගාරයෙන් වැය කරන ලද මුදල් වල ප්‍රතිලාභ ධීවර ජනතාව අතට පත්වී නොතිබුණි.

තවද ව්‍යාපෘතියට අදාළ නොවන, බෝට්ටු නිර්මාණයට යොදාගනු ලබන පරිගණක මෘදුකාංග බලපත්‍රයක් මිලදී ගැනීම සඳහා 2013 ජනවාරි මාසයේදී ගිවිසුමකට එළඹ රු. මිලියන 9.66 ක් 2014 වර්ෂයේදී ගෙවා තිබුණි. 2018 ජනවාරි 17 දිනෙන් වලංගු කාලය අවසන්වීමට නියමිත මෙම මෘදුකාංග බලපත්‍රය ලබාගෙන 2015 අගෝස්තු 31 දිනට වර්ෂ 02 මාස 08 ක් ගතවී තිබුණද එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## ධීවර වරාය හා නැංගුරම් තොටුපල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ධීවර වරායන් හා නැංගුරම්පලවල් 06 ක සංවර්ධන කාර්යයන් සඳහා 2013 වර්ෂයේ රු.මිලියන 2,000 ක පිරිවැයකට ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතියට 2014 වර්ෂයේදී අමතර ධීවර වරාය හා නැංගුරම්පලවල් 08 ක ඉදිකිරීම් ඇතුළත් කර පිරිවැය රු.මිලියන 5,789 දක්වා වැඩිකර තිබුණි.

- අමතර ධීවර වරාය හා නැංගුරම්පලවල් 08 ක ඉදිකිරීම් සඳහා භාණ්ඩාගාර සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද මෙම ඉදිකිරීම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.
- ව්‍යාපෘතිය යටතේ වූ ඉදිකිරීම් 04 ක ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 ප්‍රකාර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු හරහා ඉටුකිරීම වෙනුවට පිරිවැය කොටස් කර අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හරහා ඉටුකර තිබුණි.
- ව්‍යාපෘති කාර්යය ප්‍රායෝගිකව කොටස් කළ නොහැකි වීම හේතුවෙන් කොන්ත්‍රාත් ලබාදීමේදී ව්‍යාපෘති කාර්යයට අයත් සියළුම කොටස් එක් ආයතනයකට පවරා තිබුණු අතර ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටුවලට එක් එක් කොටස වෙනුවෙන් එකතුව රු. මිලියන 1.01 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

- මෙම ව්‍යාපෘතිය යටතේ වූ ව්‍යාපෘති කාර්යයන් 05 ක් ආරම්භ කිරීම වෙනුවෙන් මුල්ගල් තැබීමේ උත්සවය සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 9.9 ක් වැය කර තිබීම ආර්ථික නොවන බව

නිරීක්ෂණය කරන අතර මුල්ගල් තබන ලද ව්‍යාපෘති කාර්යයන් 03 ක් 2015 ජුලි 15 දින දක්වාද ආරම්භ කර නොතිබීම මතභේදයට තුඩුදෙන්නක් විය.

- ව්‍යාපෘති මෙහෙයුම් හා ක්‍රියාත්මක කිරීම් ඒකකය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 18 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබියදී ව්‍යාපෘතිය විසින් නිලධාරීන් 29 ක් බඳවාගෙන තිබුණි. අනුමැතියකින් තොරව බඳවාගත් 11 දෙනා වෙනුවෙන් 2014 අගෝස්තු දක්වා රු. මිලියන 2.48 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## ජීවනෝපාය සංවර්ධනය සඳහා ස්වයං රැකියා උපකරණ ලබාදීම

- ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වූ ස්වයංරැකියා ලෙස ධීවර ආශ්‍රිත කර්මාන්ත නොවූ මැහුම් කර්මාන්තය, ආහාර සැකසීම, කුළුබඩු නිෂ්පාදනය, කුකුල් පාලනය, මල් වගාව යන කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ වශයෙන් රු.මිලියන 10.5 ක් වටිනා උපකරණ අමාත්‍යාංශය විසින් මිලදීගෙන තිබූ අතර උපකරණ වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් රු. මිලියන 1.34 ක අලාභයක් සිදුව තිබුණි.

- මීගමුව දිස්ත්‍රික් ධීවර කාර්යාලය හරහා බෙදාහැරිය යුතු වූ මෙම උපකරණ එම කාර්යාලයට භාරදුන් බව දක්වා තිබුණද භාරගත් බවට හෝ බෙදාහැරිය බවට කිසිදු තොරතුරක් නොවූ අතර මිලදීගෙන තිබූ උපකරණ අතර ජුකී මහන මැෂින් 121 ක්, කාන්තා බයිසිකල් 53 ක්, පාසැල් උපකරණ කට්ටල 120 ක් වීම මතභේදයට තුඩුදී තිබුණි.

## සාවද්‍ය ගෙවීම්

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයට ආරක්ෂාව සපයනු ලබන පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම විසින් සත්‍ය වශයෙන් සේවයේ යොදවන ලද නිලධාරීන් සංඛ්‍යාවට වඩා වැඩි සේවක සංඛ්‍යාවක් සේවයේ යෙදවූ බවට සඳහන් කර ඉදිරිපත් කරන ලද මාසික ඉන්වොයිස්පත්වලට ගෙවීම් කිරීම හේතුවෙන් එම වෙළඳ සංකීර්ණයේ කළමනාකරණ භාරය විසින් 2011, 2012 හා 2013 නොවැම්බර් දක්වා කාලය සඳහා රු. මිලියන 15.39 ක් ආරක්ෂක සේවා ගාස්තු වශයෙන්ද, ඊට අදාල එකතු කළ අගය මත බද්ද (VAT) ලෙස රු.මිලියන 1.88 ක් සහ ජාතිය ගොඩනැඟීමේ බද්ද (NBT) ලෙස රු.307,999 ක් ද සාවද්‍ය ලෙස ආරක්ෂක සේවා සමාගමට ගෙවා තිබුණි. සාවද්‍ය ලෙස ගෙවා තිබුණු මුදල ආරක්ෂක සේවා සමාගමට ගෙවූ මුළු මුදලෙන් සියයට 45 ක ප්‍රමාණයක් විය.

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

ධීවර වරායන් ඉදිකිරීම හා නඩත්තු කිරීම, ධීවර යාත්‍රා සඳහා අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීම් පහසුකම් සැලසීම, ඉන්ධන සැපයීම, ශීතාගාර පහසුකම් හා අයිස් සැපයීම, ධීවර වරායවල් සහ නැංගුරම් පොළවල් සංවර්ධනය කිරීම වැනි ධීවරයන්ට අවශ්‍ය පහසුකම් සැපයීම සංස්ථාවේ කාර්යභාරය වුවද සංස්ථාව සතු ධීවර වරායන් 20 න් වරායන් 07 ක යාත්‍රා අළුත්වැඩියා කිරීම් පහසුකම්ද, 04 ක ඉන්ධන සැපයීමේ පහසුකම්ද, 06 ක අයිස් සැපයීම හා ශීතාගාර පහසුකම්ද නොතිබුණි. තවද ධීවර වරායන් 20 න්

12 ක් පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන අතර 2010 සිට 2014 දක්වා ලබා තිබුණු සමස්ථ අලාභය රු. මිලියන 323.52 ක් විය.

## ලංකා ධීවර සංස්ථාව

දළ දේශීය නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබාදීම, මසුන් අලෙවි කිරීම, සැකසුම් කිරීම, නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්ත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතුවල හා අලෙවි කටයුතුවල නිරතවීම සංස්ථාවේ මෙහෙවර වේ. කෙසේ වුවද 2015 අගෝස්තු 31 දිනට මත්ස්‍ය අලෙවි සැල් 150 ක් පැවති අතර, ඉන් 49 ක් වසා දමා තිබුණි.

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

කලාපයේ ජලජ සම්පත් පර්යේෂණ, කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සඳහා පුරෝගාමී ආයතනය ලෙස කටයුතු කිරීම නියෝජිතායතනයේ දැක්ම වන අතර විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම හා සම්පත් භාවිතයට ගනිමින් ජලජ සම්පත් අංශයේ ජාතික සංවර්ධන ගැටලු සඳහා නව්‍ය විසඳුම් සැපයීම මෙහෙවර වේ. කෙසේ වුවද 2011 වර්ෂයේදී රු. මිලියන 15.69 ක පිරිවැයක් දරා ඉදිකර තිබුණු පර්යේෂණ යාත්‍රාවක් 2015 අගෝස්තු 31 දින දක්වාම පර්යේෂණ කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. මේ සඳහා අනුයුක්තකර තිබුණු කාර්යය මණ්ඩලය සඳහා 2011 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 7.04 ක් වැටුප් සහ දීමනා වශයෙන් ගෙවා තිබුණි.

තවද නියෝජිතායතන පනතේ අරමුණු වලින් බැහැරව රු. මිලියන 152.25 ක පිරිවැයක් දරා මත්ස්‍ය වෙළඳසැලක් 2013 වර්ෂයේදී බේරුවල ඉදිකර තිබුණු අතර මෙම ගොඩනැගිල්ල 2015 අගෝස්තු 31 දක්වාම භාවිතයට ගෙන නොතිබුණි.

## පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, පශු සම්පත් කර්මාන්තය සංවර්ධනය කිරීම, කිරි නිෂ්පාදනය හා බෙදා හැරීම, පශු වෛද්‍ය සේවා හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම සහ සත්ව නිරෝධායනය, සත්ව පනත, සත්ව රෝග පනත සහ සත්ව ආහාර පනත, පරිපාලනය හා ක්‍රියාත්මක කිරීම හා ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය වැඩි දියුණු කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යන් වේ. පශු සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික විශේෂඥතාව මෙන්ම උපකාරක සේවාවන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවෙන් සපයන අතර මිල්කෝ පුද්ගලික සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගම මේ සඳහා දායක වන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ආයතන වේ.

අමාත්‍යාංශය හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වෙනුවෙන් 2014 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 5,789 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, රු.මිලියන 5,438 ක් වැය කර තිබූ බැවින් රු.මිලියන 351 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් පශු සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති 07 ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මුල් ඇස්තමේන්තුවෙන් රු.මිලියන 1,441.20 වෙන්කර තිබුණු අතර එම ව්‍යාපෘතිවල කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව විගණනයට ඉදිරිපත්කර නොතිබීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය. තවද 2014 ඔක්තෝබර් සකස් කර තිබුණු සංශෝධිත ඇස්තමේන්තුවට අනුව මෙම ව්‍යාපෘති සඳහා රු.මිලියන 3,478 ක් ලැබී තිබුණද එම මුදල උපයෝජනය කරගන්නා ආකාරය දැක්වෙන පරිදි ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කරගෙන නොතිබුණි.

## සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2012/2013 වර්ෂ වලදී රු. මිලියන 1.87 ක වියදමක් දරා සීප්පුකුලම සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජල පිරිපහදු ඒකකයක් ස්ථාපනය කර තිබුණි. එහෙත් අපේක්ෂා කළ පරිදි එම ජල පිරිපහදු මධ්‍යස්ථානයෙන් පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට අසමත්වී තිබුණු බැවින් 2015 මාර්තු සිට මසකට රු.15,000 බැගින් වැය කර පානීය ජලය ලබාගැනීමට කටයුතු කර තිබුණු අතර, ඒ සඳහා 2015 මාර්තු හා අප්‍රේල් මාස වල රු.29,000 ක වියදමක් දරා තිබුණි. එමෙන්ම 2015 ජූනි 10 දින වන විටද එම ස්ථාපනය කළ පිරිපහදුවෙන් පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් දායක මුදල් ගණනය කිරීමේදී සේවකයින්ගේ මූලික වැටුප පමණක් සැලකිල්ලට ගෙන තිබුණි.

- වෙලාඩ් එළගව ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන තිබුණු රු. මිලියන 1,600.8 ක ණය මුදල සඳහා 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 7.11 ක් හා රු. මිලියන 20.43 ක පොළී මුදලක් මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2014 වර්ෂය සඳහා පොලී වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. එසේම මෙම ණය මුදල ආපසු ගෙවීමේ සැලැස්මක් සකස්කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණු අතර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2012 නොවැම්බර් 06 දිනැති ලිපියකට අනුව 2013 මාර්තු 08 දිනට පෙර හෝ

එදින සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළයුතු වුවද, 2014 දෙසැම්බර් 31 දින වන විට ස්වයං තක්සේරුව අනුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 12 ක් පමණක් ආපසු ගෙවා තිබුණි.

- මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගමට කුකුළු පැටවුන් ලබාදීම වසර 05 කට වඩා පැරණි රු.මිලියන 9.45 ක් හා රේඛීය අමාත්‍යාංශයට කුකුළු පැටවුන් ලබාදීම නිසා වසර දෙකකට වඩා පැරණි රු. මිලියන 1.5 ක් මණ්ඩලයට අයවීමට තිබුණි.

- 2007 ජුනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කන්තලේ උක් වගා භූමියේ අක්කර 1,000 ක ප්‍රමාණයක් උක් වගා කිරීමට සුදුසු ව්‍යවසායකයෙකු තෝරාගන්නාතෙක් නියමු ව්‍යාපෘතියක් ලෙස බඩඉරිගු වගා කිරීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට තාවකාලිකව ලබාදීමට තීරණය කර ඒ සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමට නැගෙනහිර නවෝදය යටතේ රු.මිලියන 37.5 ක් ලබා දී තිබුණි.මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා ඒ සඳහා යොදාගෙන තිබුණු ඉඩම් 2011 සැප්තැම්බර් 01 දින කන්තලේ සීනි සමාගමට නැවත පවරා තිබුණි. අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් දැක්වීම් අනුව මෙම ව්‍යාපෘතියට ලබා දුන් ඉඩමේ උක් වගාව සඳහා සුදුසු ව්‍යවසායකයකු තෝරාගත් විට චක්‍රීය අරමුදලේ ඉතිරි මුදල් මහා භාණ්ඩාගාරයට යොමු කිරීමට යටත්ව මෙම යෝජනාව නිර්දේශ කර තිබුණු අතර, අදාල ඉඩම නැවත කන්තලේ සීනි සමාගමට 2011 සැප්තැම්බර් 01 දින පවරා තිබුණු බැවින් චක්‍රීය අරමුදලේ 2014 දෙසැම්බර් 31 දින පැවති රු. මිලියන 13.30 ක මුදල භාණ්ඩාගාරයට ආපසු නොයවා මණ්ඩලය විසින් ජංගම ගිණුමක රඳවාගෙන තිබුණි.

- ක්‍රියාකාරී සැලැස්මේ හා ප්‍රගති වාර්තාවේ දක්වා තිබුණු ගොවිපල 27 ක ව්‍යාපෘති 06 ට අදාල ක්‍රියාකාරකම් 61 ක භෞතික ප්‍රගතිය ශූන්‍ය අගයක් ගෙන තිබුණු අතර ගොවිපල 19 ක ක්‍රියාකාරකම් 40 ක ලඟා කරගෙන තිබුණු භොතික ඉලක්කය සියයට 50 කට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

- තවද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ගොවිපලවල් 31 ක්‍රියාකාරකම් 293 ක ප්‍රගතිය වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුලත් නොවු බැවින් එම ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ ඉටුකර තිබේද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

- රිදීයගම ගොවිපලෙන් අක්කර 150 ක් 2001 වර්ෂයේදී පුද්ගලයින් 98 දෙනෙකු විසින් අනවසර වගා කටයුතු සඳහා අත්පත් කරගෙන තිබුණු අතර ඔවුන් ගොවිපලෙන් ඉවත් කිරීමට හා මණ්ඩලයට අයත් ගොවිපලවල තිබෙන නිවාස 70 ක මණ්ඩලයේ නිලධාරීන්/සේවකයින්නොවන අනවසර පදංචිකරුවන් සිටින අතර ඔවුන් ඉවත් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවද කිසිවෙකු පදිංචි නොමැති නමුත් පදිංචියට සුදුසු නිවාස 145 ක් හා පදිංචියට නුසුදුසු නිවාස 110 ක් මණ්ඩලය සතු ගොවිපලවල පවතින බවද නිරීක්ෂණය විය

- කිරි ව්‍යාපෘතිය යටතේ කිරි අලෙවි කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් අලෙවිසැල් 69 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක තත්වයේ පැවති අලෙවිසැල් සංඛ්‍යාව 53ක් විය. අලෙවිසැල් 69 අතරින් අලෙවිසැල් 25 ක් රු. මිලියන 1.83 ක අලාභයක් ලබා තිබුණු අතර අලෙවිසැල් 44 ක් රු.මිලියන 17.06 ක ලාභයක් ලබා

තිබුණි.තවද මණ්ඩලය විසින් පවත්වාගෙන යන ගොවිපල 17කින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 152.39 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණු අතර එයින් ගොවිපල 07 ක් 2008 වර්ෂයේ සිටම අලාභ ලබමින් පැවතුණි.කෙසේ වුවද මෙම අලෙවිසැල් හා ගොවිපලවල් ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

# සෞඛ්‍ය සේවා

සෞඛ්‍ය අංශ සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය සේවා ලබා දීම සඳහා ප්‍රමිතීන් හා නීතිරීති සම්පාදනය කිරීම, මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණය, සැලසුම්කරණය සහ පද්ධති සංවර්ධනය, සම්පත් බෙදා හැරීම වැඩසටහන් හා ව්‍යාපෘතින් මෙහෙයවීම හා අධීක්ෂණය හා ඇගයීම් ප්‍රධාන කාර්යයන් වේ.

රෝගී සත්කාර සේවාව සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් 47ක් ද පළාත් සභාවලට අයත් රෝහල් 554 ද පෞද්ගලික අංශයට අයත් රෝහල් 210ක්ද වශයෙන් ලංකාව පුරා විහිදී ඇති රෝහල් සංඛ්‍යාව 811 වන අතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 341කි. 2014 වර්ෂයේදී රජය විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රු. මිලියන 138,403 ක් වැය කර තිබුණු අතර 2013 වර්ෂයේදී වැය කළ රු. මිලියන 119,530 හා සසඳන විට එය රු. මිලියන 18,873 ක් හෙවත් සියයට 15 ක වැඩිවීමකි.

මූලධන හා පුනරාවර්තන වියදම් වශයෙන් පසුගිය වර්ෂ 05 තුළ පිළිවෙලින් රු. මිලියන 87,329 ක් හා රු. මිලියන 432,655 ක් වශයෙන් රු. මිලියන 519,904 ක් වැය කර තිබුණි. 2010 වර්ෂයේදී රු.3,573 ක් වූ ඒක පුද්ගල සෞඛ්‍ය වියදම 2014 වර්ෂය වන විට රු.6,694 ක් දක්වා සියයට 87 කින් වැඩි වී තිබුණි. සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධව පෞද්ගලික රෝහල් වලින් කෙරෙන දායකත්වය 2010 වර්ෂය හා සසඳන කළ 2014 වර්ෂයේදී පෞද්ගලික රෝහල්වල ඇඳන් සංඛ්‍යාව වැඩිවීමක් පෙන්නුම් කරයි. එමෙන්ම රජයේ රෝහල් සංඛ්‍යාවේ හා ඇඳන් සංඛ්‍යාවේ වැඩිවීමක් මෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සමස්ථ ශ්‍රම බලකායේ වැඩි වීමක්ද පෙන්නුම් කරයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයෙන් වැටුප් ලබා ගන්නා වෛද්‍යවරු සංඛ්‍යාව 2845ක් විය. එයින් වෛද්‍යවරු 2638 ක් පශ්චාත් උපාධි අභ්‍යාසලාභී වෛද්‍ය නිලධාරින් වන අතර වෛද්‍යවරු 116 ක් අමාත්‍යාංශයේ පරිපාලන කේෂ්ත්‍රයේ තනතුරුවල නිරතව සිටි.

## මිලදී ගැනීම්, ගබඩා කිරීම් හා බෙදාහැරීම් පටිපාටිය

වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබෙන සියලුම බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කර බෙදා හැරීම සඳහා කොළඹ ගබඩා සංකීර්ණ ජාලය හා බැඳුණු දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රාදේශීය ගබඩා 26ක්ද ඇත. මීට අමතරව අංගොඩ තොග ගබඩා 03ක්ද දිගන තොග ගබඩාවක්ද වෛද්‍ය සැපයීම් අංශය සතුව පවතී. පළාත් සභා යටතේ පාලනය වන රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය මෙම දිස්ත්‍රික්ක මට්ටමේ වෛද්‍ය සැපයීම් අංශ හරහා බෙදා හැරීම සිදුකරයි. ප්‍රමාණවත් ඉඩකඩ නොමැති නිසා 2013 වර්ෂයේ දී වැලිසර ළය රෝහල් භූමියේ රු. මිලියන 199 ක වියදමින් ඖෂධ ගබඩාවක් ඉදිකිරීමට යෝජිතව තිබුණද සමාලෝචිත වර්ෂයේ දීද එම ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. ඖෂධ ගබඩාකිරීමට කුලී පදනම මත පුද්ගලික ගොඩනැගිලි යොදාගෙන තිබුණ අතර ඒ වෙනුවෙන් වාර්ෂික වැය කිරීම රු.මිලියන 9ක් විය.

## ඖෂධ වර්ග මිලදී ගැනීමේ වියදම් හා තත්ත්ව පරීක්ෂණවලින් අසමත් වූ ඖෂධ වර්ග

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ඖෂධ සංස්ථාවෙන් සැපයීම් කළ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය අයිතම 3537 ක තොග වටිනාකම රු.මිලියන 17,386 ක් විය. එයින් ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය අයිතම 48 ක රු. මිලියන 218 ක වටිනාකමකින් යුත් ඒකක මිලියන 10 ක ප්‍රමාණයක් තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණ නමුත් ඒ බැව් දැනුම් දීමට ප්‍රථම එම තත්ත්වයෙන් අසමත් ඖෂධ වලින් රෝගීන්ට ඒකක මිලියන 9 ප්‍රමාණයක් (රු. මිලියන 186 ක වටිනාකමකින් යුත්) නිකුත් කර තිබුණ බව අනාවරණය විය. මිලදී ගත් තත්ත්වයෙන් අසමත් තොගයෙන් එය සියයට 90 ක ප්‍රමාණයකි. සැපයුම්කරුවන්ට මුදල් ගෙවා තිබුණ බැවින් හා භාවිතා කර තිබුණු බැවින් එම තත්ත්වයෙන් අසමත් තොග සඳහා ප්‍රසම්පාදන කොන්දේසි ප්‍රකාරව වටිනාකම අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා භාවිතයෙන් ඉවත් කළ තොග සඳහා රු. මිලියන 210 ක වටිනාකමක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2014 වර්ෂය තුළදී ඖෂධයේ ජීව කාලය අවසන් වීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කරන ලද ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය අයිතම 45 කට අදාල වටිනාකම රු. මිලියන 218 ක් විය.

## ඖෂධ ප්‍රාදේශීයව මිලදී ගැනීමේ දී සිදුවන අතිරේක පිරිවැය දැරීම

වෛද්‍ය සැපයීම්වල ජාතික අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වන අතර වසරකට පෙර ඇණවුම් කිරීම මගින් සංස්ථාවේ ප්‍රසම්පාදන කටයුතුආරම්භ කරනු ලබයි. එසේ වුවත් නියමිත කාල වකවානු වලදී ඖෂධ නොලැබෙන නිසා ප්‍රාදේශියව හදිසි මිලදී ගැනීම් සිදු කිරීමට අමාත්‍යාංශයට සිදුවී තිබුණි. මේ හේතුවෙන් මිල ගණන් විචලතාව අනුව දැරීමට සිදු වී තිබුණු අතිරේක පිරිවැය 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු. මිලියන 2,013 ක් වේ. 2014 වර්ෂයේ පිරිවැය ගණනය කර නොතිබුණ අතර, 2013 වර්ෂය වෙනුවෙන් පමණක් රු. මිලියන 174 ක අතිරේක පිරිවැයක් දරා තිබුණි.

## වෛද්‍ය උපකරණ සැපයීම - ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය

වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ මෙම අංශය යටතේ රු.මිලියන 2,646 ක් වැය කර තිබුණි. මීට අමතරව විදේශ ණය ආධාර යටතේද වෛද්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි. 2014 වර්ෂයේ උපකරණ වර්ග 71කට අදාලව උපකරණ ඒකක 3059 ක් මිලට ගැනීමට සැලසුම් කර තිබුණද වර්ෂය තුළදී එයින් කිසිවක් මිලදී නොගෙන 2011, 2012, 2013 වර්ෂ වල සැලසුම් කළ උපකරණ හා වෙනත් උපකරණ මිලදී ගෙන තිබුණි. තවද මිලදී ගත් මෙම උපකරණ රෝහල් වල ස්ථාපිත කිරීමේ ප්‍රමාදයක් පැවති බවත් ඒ අනුව වගකීම් කාලය අපතේ යාමත් බොහෝ අවස්ථාවල සිදුවී තිබුණි.

## වාහන භාවිතය

මෝටර් රථ වාහන දෙපාර්තමේන්තු දත්ත අනුව 2014 ඔක්තෝබර් 19 දිනට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර තිබුණු මෝටර් වාහන 2705 කින් වාහන 971කට සිදුවූනේ කුමක්ද යන්න පැවසීම, අමාත්‍යාංශයට අපොහොසත් වී තිබුණි. එම වාහන පරිහරණය කරන පාර්ශව ගැන හෝ පවතින ස්ථානය ගැන හෝ තොරතුරු නොමැති වූ අතර මෝටර් වාහන ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. වෙන්දේසි කිරීමට නියමිතව තිබූ රජයේ වාහන 02 ක් (හොඳ ධාවන තත්ත්වයේ තිබූ) වෙන්දේසි කිරීම් නොකර රජයේ නිලධාරින් දෙදෙනෙකු විසින් අවිධිමත් ලෙස මිලදී ගෙන තිබුණි.

## විදේශ අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ ශුද්ධ විදේශ අරමුදල් ප්‍රතිපාදනය රු.මිලියන 11,696 ක් වූ අතර, වියදම රු.මිලියන 9,860 ක් විය. විදේශ අරමුදල් වියදම් කිරිමේ ප්‍රතිශත අනුව, විදේශ ණය වැය කිරීම සියයට 96 ක ඉහළ අනුපාතයක් තිබියදී විදේශ ප්‍රදාන වැය කිරීම සියයට 35 ක අනුපාතයක් රටට උචිත තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය කරන අතර ආපසු නොගෙවිය යුතු විදේශ ප්‍රදාන අරමුදල් හැකි උපරිමයෙන් උපයෝජනය කිරීමට කටයුතු නොකිරීම හා අවශ්‍ය පරිදි වැඩ සැලසුම් කාර්යක්ෂමව පිළියෙළ කර ඵලදායි ලෙස ප්‍රයෝජනයට නොගැනීම ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි.

## ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්තු

රෝගී සත්කාරය සඳහා රෝහල් ආශ්‍රිතව විවිධ ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති 38 ක් වෙනුවෙන් 2014 වර්ෂයේ දේශිය අරමුදලින් රු. මිලියන 1,610 ක් වෙන්කර තිබුණී. එයින් අරමුදල් උපයෝජනය කර නොතිබුණු ඉදිකිරිම් ව්‍යාපෘති 02 ක් වූ අතර නිම නොකර අත්හැර දැමූ ව්‍යාපෘති 02 ක් ද විය. (දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ මිලේනියම් වාට්ටු සංකීර්ණය, ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීම) වෙන් කළ මුදලින් සියයට 50 ට අඩු මූල්‍ය ප්‍රගතියක් තිබූ ඉදිකිරිම් ව්‍යාපෘති ගණන 15ක් විය. ප්‍රගතිය අඩු වීමට හේතු වශයෙන් අදාල රෝහල් වලින් ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම, වැඩ අතරමග නතර කර තිබිම හා කොන්ත්‍රාත් ආයතනය සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සඳහා පියවර ගැනීම හා ගෙවීම් සිදුකිරීම සඳහා වවුචර් ඉදිරිපත් කළ ද අරමුදල් නොමැති වීම යනාදි කරුණු ඉදිරිපත් කර තිබුණි. තවද කුරුණෑගල ශික්ෂණ රෝහලේ මාතෘ වාට්ටු සංකීර්ණය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 1,291 ක් වූ අතර 2007 වර්ෂයේ වැඩ ආරම්භ කර තිබූ මෙම කොන්ත්‍රාත්තුව 2013 පෙබරවාරි 10 දින වැඩ අවසන් විය යුතුය. අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක වන මෙම කොන්ත්‍රාත්තුව වසර 08 කට අධික කාලයක් ගතවී ඇතත් අදියර 02 ක් පමණක් අවසන් කර තිබුණි. වැය කර ඇති මුදල රු.මිලියන 394 ක් විය.

## සම්බන්ධීකරණ දූර්වලතා නිසා අනවශ්‍ය ප්‍රමාදයන් ඇති වීම

සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ සියළු රාජකාරී කටයුතු කිරීම සඳහා අංශ 90 ක් පමණ ඇති අතර, මේවා එකිනෙක සමඟ ඇති අන්තර් සම්බන්ධතාවය ඉතාම දූර්වල මට්ටමක පවතී. අංශ හා නිලධාරීන් අතර වැඩ බෙදීම් ද ඉතාමත් අවිධිමත් තත්ත්වයක පවතී. විශේෂයෙන්ම දැනට ඉහල තනතුරු දරන්නන්ට තමන් වෙත විශාල වැඩ කොටසක් පවරාගෙන ඇතත් එම සියලු වැඩ කොටස් නියමිත දින වකවානු වල කිරීමට නොහැකි වීම මත ලිපිගොනු මේස මත ගොඩගැසී ඇති අතර අමාත්‍යාංශයේ පරිපාලන කටයුතු දීර්ඝ ලෙස ප්‍රමාද වන බවත් නිරීක්ෂණය විය. ඇතැම් විට එක් අංශයකින් තවත් අංශයකට ලිපියක් භාරදීම සඳහා මාස ගණනාවක් ගත වී තිබුණි. බලතල නියමාකාරයෙන් පවරා නොතිබීම හා පසු අධීක්ෂණයක් නොකිරීම මෙම දූර්වලතාවයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

2014 වර්ෂයේ සංස්ථාවේ සමස්ථ පිරිවැටුම වූ රුපියල් මිලියන 22,134 ක ප්‍රමාණය 2013 වර්ෂයේ පිරිවැටුම වූ රුපියල් මිලියන 21,135 හා සසඳන කල රුපියල් මිලියන 999 කින් එනම් සියයට 4.7 කින් වර්ධනය වී තිබුණි. 2014 වසරේදී නව බලයලත් ඔසුසල් 07 ක්, නව රාජ්‍ය ඔසුසල් 03 ක් පිහිට වූ අතර නව බෙදාහරින්නන් 04 ක් මෙම ඔසුසල් ද සමග වසර අවසානයේදී රාජ්‍ය ඔසුසල් 31ක් (වසර මැදදී වසන ලද ඔසුසැල් 02 හැර) නියෝජිත ඔසුසල් 195 ක් බෙදාහරින්නන් 54 ක් හා බලයලත් වෙළඳුන් 10 ක් විවෘත වෙළඳපොලේ ක්‍රියාත්මක විය.

- තත්ත්වයෙන් අසමත් වීම,කල් ඉකුත්වීම ආදී හේතූන් මත සංස්ථාවේ අලවියට ගෙන්වන ලද රු. මිලියන 20 ක ඖෂධ ද වෛද්‍ය සැපයීම් අංශයේ අලවිය සඳහා ගෙන්වන ලද රු. මිලියන 42 ක ඖෂධ ද ඇතුළුව රු. මිලියන 62 ක තොග අලාභයක් සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාවට සිදු වී තිබුණි.

- සංස්ථාව විසින් දරන ලද බැංකු අයිරා පොළී වියදමින් වෛද්‍ය සැපයීම් අංශයේ මිලදී ගැනීම් වෙනුවෙන් වූ අයිරා පොලී ප්‍රතිපූර්ණය කිරීම 2012 වර්ෂයේ සිට 2014 අප්‍රේල් මාසය වනතෙක් මහා භාණ්ඩාගාරය විසින් සිදුකර තිබුණි. ඒ අනුව 2012 වර්ෂයට අදාලව රු. මිලියන 316 ක් ද 2013 දී රු. මිලියන 510 ක් ද 2014 දී රු. මිලියන 179 ක් ද වශයෙන් අයිරා පොලී වියදම් මහා භාණ්ඩාගාරය විසින් දරා තිබුණි.

- වෛද්‍ය සැපයීම් අංශය සමාලෝචිත වර්ෂයට ඇණවුම් කළ ඖෂධ අයිතම 610 අතරින් ඖෂධ අයිතම 103 කට අදාල ඒකක මිලියන 332.02 ක් සමාලෝචිත වර්ෂයේදී සැපයීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. එයින් කිසිදු ඒකකයක්වත් සැපයීමට නොහැකි වූ ඖෂධ අයිතම 38 කට අදාල ඒකක ප්‍රමාණය මිලියන 38.96 ක් විය.

- සමාලෝචිත වර්ෂය තුලදී අළුතින් ආරම්භ කල ඔසුසල් තුනද වසර මැදදී වසන ලද ඔසුසැල් 02 කද ඇතුළුව සංස්ථාවේ ක්‍රියාකාරී ඔසුසල් 33 ක් පැවති අතර ඔසුසල් 23ක් රු.මිලියන 41.96 ක අලාභයක් ලබා තිබුණු අතර ඔසුසල් 10 ක් තුළින් රු. මිලියන 113.89 ක ලාභ උපයා තිබුණි. මේ අනුව සමස්ථ ඔසුසල් ක්‍රියාකාරීත්වය තුළින් රු. මිලියන 71.93 ක ශුද්ධ ලාභ ලබා තිබුණු අතර

එය පසුගිය වර්ෂයේ ලැබූ රු. මිලියන 90.29 ක ලාභය හා සැසඳීමේදී රු. මිලියන 18.36 ක එනම් සියයට 20.3 ක අඩුවීමකි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 225 ක් වූ අතර එය 2013 වර්ෂයේ මෙහෙයුම් ලාභය වූ රුපියල් මිලියන 304 ක් හා සසඳන කළ රුපියල් මිලියන 79 කින් එනම් සියයට 26 කින් පහළ යාමකි. සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ අලවි ආදායම රු.මිලියන 1,712.1 ක් වූ අතර එය පසුගිය වසරේ සමස්ථ අලවි ආදායම වූ රු. මිලියන 1,941.1 ක් හා සැසඳීමේදී රු. මිලියන 229 කින් එනම් සියයට 11.8 කින් අඩුවී තිබුණි. තවද සමස්ථ අලෙවි අදායමෙන් රු. මිලියන 1,099.5 ක් වටිනා ඖෂධ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත අලෙවිකර තිබූ අතර එය සමස්ථ අලෙවියෙන් සියයට 64.2 ක් විය. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත සිදුකළ අලෙවිය පසුගිය වසර හා සැසඳීමේදී රු. මිලියන 312.6 කින් එනම් සියයට 22.1 කින් අඩුවී තිබුණි.

නිෂ්පාදිත ඖෂධ වර්ග 38 හි මුළු නිෂ්පාදනය වූ ඒකක මිලියන 1,909.2 න් ඒකක මිලියන 1,303.8 ක් එනම්, සියයට 68.3 ඖෂධ වර්ග 8 ක් මතද, මුළු නිෂ්පාදනයෙන් ඒකක මිලියන 605.4 ක් එනම් සියයට 31.7 ක් ඖෂධ වර්ග 30 ක් මතද රැඳී තිබුණි.

## සෞඛ්‍ය සංවර්ධන අරමුදල

1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 වගන්තිය ප්‍රකාරව අරමුදලට අයත් මුදල්, සෞඛ්‍ය සේවා සපයන ආයතන සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ඒ හා සම්බන්ධ තැනැත්තන්ගේ අධ්‍යාපනය හෝ ඥාණය වර්ධනය කිරීම, රෝග වැළැක්වීමට පියවර ගැනීම හෝ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා වූ යම් යෝජනා ක්‍රමයකට මුදල් යෙදවීම, වෛද්‍ය උපකරණ සහ අත්‍යාවශ්‍ය ඖෂධ මිලදී ගැනීම යනාදී කාර්යයන් ඉටු කිරීම සඳහා යොදා ගත යුතු බවට දක්වා තිබුණි. එසේ වුවද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට යෙදවිය යුතු මෙම අරමුදලේ මුදල්, එසේ නොයොදවා දිගින් දිගටම මුදල් ආයෝජනය කරමින් පැවතෙන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. 2014 වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.මිලියන 205.4 ක් විය.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,347.51 ක් වූ අතර, වියදම රු. මිලියන 1,179.12 ක් විය. ඒ අනුව ඉතිරිය රු. මිලියන 168.38 ක් හෙවත් සියයට 12.49 ක ප්‍රතිශතයක් විය.

පර්යේෂණ ඔසු උයන් නඩත්තු කිරීම හා ප්‍රවර්ධනය කිරීම අමාත්‍යාංශයේ සහ දෙපාර්තමේන්තුවේ කාර්යයන් වුවද අමාත්‍යාංශය යටතේ ඇති ඔසු උයන් 02 ක් (වෙදගම ඔසු උයන අක්කර 44, මැදිරිගිරිය ඔසු උයන අක්කර 25) හා දෙපාර්තමේන්තුව යටතේ පවතින ඔසු උයන් 05 ක් (නීලබැම්ම අක්කර 25,

මැදවච්චිය දංගොල්ල අක්කර 50, පදවිය ඔසු උයන අක්කර 25, හිවල් කඳුර අක්කර 100, පීල්ල අඹන්පොල අක්කර 69) වල් බිහිවී පවතින අතර නඩත්තුවක් සිදුකර නොතිබුණි. ඔසු උයන්වලින් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ලබාදීමක් සිදු නොකිරීම හේතුවෙන් ආයුර්වේද ඖෂධ සංස්ථාව හා ආයුර්වේද දෙපාර්තමේන්තුව අමු ඖෂධ බාහිර ආයතනවලින් ලබා ගැනීම සිදුකර තිබුණි.

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට මාරු කළ වෛද්‍ය නිලධාරියාට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් වැටුප් ගෙවනු ලබද්දී ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින්ද මාස 15 ක කාලයක් සඳහා රු. මිලියන 0.55 ක දළ වැටුපක් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම මුදල් අය කර ගෙන නොතිබුණු අතර සාවද්‍ය ලෙස වැටුප් ගෙවීම පිළිබඳ ඊට වගකිවයුතු නිලධාරීන්ගෙන් කරුණු විමසා නොතිබුණි.

## ආයුර්වේද වෛද්‍ය සභාව

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වන කොටස් 11(1)(ඉ) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් තෝරා පත් කරනු ලැබූ සමාජිකයින් 3 දෙනෙකු සභාවේ සංයුතියට ඇතුළත් විය යුතු වුවද, වෛද්‍ය සභාවට ලියාපදිංචි වෛද්‍යවරුන් කිසිවකු පත් කර නොතිබුණි.

2005 ජුලි 05 දිනැති අංක 14/13/08 (3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව අනුව 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 05 කට වරක් ලියාපදිංචි වූ වෛද්‍යවරුන් තම ලියාපදිංචි යාවත්කාලීන කර ගත යුතුය. තවද ඒ සඳහා ලියාපදිංචි ගාස්තුවක් අය කළ යුතු බවට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂ අවසාන වන විට ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගෙන් එක් අයෙකු පමණක් මුදල් ගෙවා යාවත්කාලීන කර තිබුණි.

වෛද්‍ය සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 24,049 ක් වන අතර එයින් මේ වන විට මියගිය සංඛ්‍යාව 3,001 ක් විය. ලියාපදිංචි වෛද්‍යවරු 2,545 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් යාවත්කාලින කර නොතිබුණි.

## හෝමියෝපති වෛද්‍ය සභාව

2011 වර්ෂයේ සිට මේ දක්වාත් (2015 අගෝස්තු 31 දින වන විටත්) වෛද්‍ය සභාවක් නොවූ අතර අතුරු පාලක කමිටුවක් විසින් සභාවේ කටයුතු සිදු කරනු ලබයි. මෙසේ වෛද්‍ය සභාව අකර්මණ්‍යව පැවතීමද පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට බාධාවක් වී තිබුණි.

# ආයෝජන ප්‍රවර්ධනය

ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරය ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. වර්ෂ 1978 සිට ශ්‍රී ලංකාවේ කර්මාන්ත වර්ධනය, සංවිධානය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රජයේ ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස ආයෝජන මණ්ඩලය ව්‍යවස්ථාගත වී ඇත. ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වනුයේ, විදේශ සෘජු ආයෝජන ධෛර්යමත් කිරීම හා ප්‍රවර්ධනය, විදේශ විනිමය ඉපයීම් මූලාශ්‍ර විවිධාංගීකරණය හා අපනයන ඉපයීම් වර්ධනය කිරීම, ආර්ථික සංවර්ධනය  පෝෂණය කිරීම නංවාලීම, කාර්මික හා වාණිජ ව්‍යවසාය පිහිටුවීම හා සංවර්ධනය, ආර්ථික පදනම පුළුල් කිරීම හා සංවර්ධනය ඇති කිරීම යනාදියයි.

සම්පූර්ණ විදේශ සෘජු ආයෝජන 2014 වර්ෂයේ දී රු. මිලියන 1391.10 සිට රු. මිලියන 1616.2 දක්වා සියයට 16 ක වර්ධනයක් පෙර වර්ෂයට සාපේක්ෂව පෙන්නුම් කරනු ලැබේ. විදේශ සෘජු ආයෝජන වලදී විශේෂයෙන් හඳුනාගනු ලබන අංශයක් වනුයේ යටිතල පහසුකම් සහ සේවා අංශය වන අතර එය සියයට 77 ක් ලෙස 2014 වර්ෂයේ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති හරහා විදේශ සෘජු ආයෝජනවලින් පෙන්වනු ලැබේ. කෙසේ වෙතත්, කෘෂිකර්ම හා නිමවුම් අංශයේ ආයෝජන සියයට 32 සිට සියයට 7 දක්වා පසුබෑමක් පෙර වර්ෂයට සාපේක්ෂව වාර්තා විය.

2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී ආයෝජන මණ්ඩල ව්‍යවසායන් හරහා සිදුකළ අපනයන පිළිවෙලින් සියයට 15  ක් හා සියයට 5  ක් බැගින් වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය. ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායන් විසින් දරන ලද අපනයන පිරිවැය 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ දී, පිළිවෙලින් සියයට 2 සිට සියයට 15 දක්වා වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය.

ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අනුමත කිරීම් 2009 වර්ෂයේ දී 384 ක සිට 2014  වර්ෂයේදී එය 181 ක් දක්වා සියයට 53 ක පසුබෑමක් වාර්තා විය. කෙසේවෙතත්, පසුගිය වසරට සාපේක්ෂව එය සියයට 3 ක වර්ධනයක් ලෙස පෙන්වනු ලබයි. එමෙන්ම, ව්‍යාපෘතිවල වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම් 2009 වර්ෂයේදී 134 ක සිට  2014 වර්ෂයේදී 87 ක් දක්වා පසුබෑමක් පෙන්වනු ලැබේ. අවලංගු කළ, වසාදමන ලද සහ අත්හිටුවන ලද ව්‍යාපෘති ගණන සැලකිය යුතු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම, සළකා බලන වර්ෂය තුළදී වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද ව්‍යාපෘති 87 ක් ද අවලංගු කරන ලද, වසාදමන ලද හෝ අත්හිටුවන ලද ව්‍යාපෘති 125 ක් ද වර්ෂය තුළ වාර්තා විය.

## අපනයන සැකසුම් කලාප මෙහෙයුම්

ආයෝජන මණ්ඩලය අපනයන සැකසුම් කලාප 12 මගින් ආයෝජකයන් හට පහසුකම් සලසයි. කෙසේ වෙතත් විශාල පරිපාලන පිරිවැය සහ ආදායම් ඉපයීම සඳහාවූ ඉඩම් ඌණ උපයෝජනය හේතුවෙන් වතුපිටිවල , කොග්ගල සහ මල්වත්ත යන අපනයන සැකසුම් කලාප 2008 වර්ෂයේ සිට අඛණ්ඩව පාඩු දරා තිබුණි. 2014 වර්ෂය අවසාන වන විට ඉහත කලාප තුනෙහි සමුච්චිත පාඩුව රු. මිලියන 250.65 ක් වූ අතර 2014 වර්ෂය සඳහා එම පාඩුව රු. මිලියන 47.76 ක් විය.

## වත්කම් ඌණ උපයෝජනය

අක්කර 122 ක වපසරියක් සහිත මලිදූවකන්ද වත්ත ඉඩම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් 2003 ජනවාරි 08 වන දින රු. මිලියන 97.94 ක පිරිවැයකට මිලදී ගෙන තිබුණු නමුත් 2014 මැයි අවසාන වන තෙක් එය යථෝක්ත අරමුණ සඳහා භාවිතා කොට නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛණයට අනුව 2014 දෙසැම්බර් 31 දිනට එම ඉඩමේ පොත් අගය රු. මිලියන 100.80 ක් ලෙස දක්වා තිබුණි.

## ආයෝජන ප්‍රවර්ධන කටයුතු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මුළු වියදම වූ රු. මිලියන 2,802.69 ක් අතුරින් රු. මිලියන 67.47 ක් හෝ සියයට 2 ක ප්රතිශතයක් ආයෝජන ප්‍රවර්ධන කටයුතු සඳහා 2014 වර්ෂයේ දී වැයකර තිබුණි. ආයෝජන ප්‍රවර්ධන වියදමෙන් රු.මිලියන 34.63 ක් හෝ සියයට 51 ක් හම්බන්තොට කොන්ක්ලේව් - 2014 CHOGM වලට සමගාමීව පවත්වනු ලැබූ ප්‍රදර්ශනය සහ උතුරු සහ නැගෙනහිර පළාත් සංවර්ධනය පිළිබඳව සකසන ලද විනාඩි 9.5 ක වාර්තා චිත්‍රපටිය සඳහාද වැයකර තිබුණි. ඉහත සඳහන් වියදම් ආයෝජන ප්‍රවර්ධන වියදම් වලට සම්බන්ධ ඒවා නොවීම බැවින් එම වියදම්වල අරමුණ ප්‍රශ්න සහගත විය.

සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිවිසුම් මග ඉදිකිරීම හේතුවෙන් නිවාස අහිමි වූ වැලිවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පදිංචිව සිටි ජනතාව වෙනුවෙන් හෙක්ටයාර 72 ක වපසරියක නිවාස 15 ක් සාදා දීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් රු. මිලියන 100 ක මුදලක් ගෙවා තිබුණි. විගණන පරීක්ෂණ දිනය වූ 2015 මැයි වනතෙක් වැලිවැව ඉඩම සම්බන්ධ අයිතිය ආයෝජන මණ්ඩලය වෙත පැවරී නොතිබුණි. එම නිවාස ඉදිකර දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු බැඳීම සහ එම නිවාස වලින් නිවාස 05 ක් දේශපාලන අධිකාරින් විසින් නම් කරන ලද පාර්ශ්වයන් වෙත පවරා දීම තවමත් ප්‍රශ්නාර්ථයක්ව පැවතුණි.

# වාරිමාර්ග

වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පත් මණ්ඩලය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය යන ව්‍යාස්ථාපිත ආයතන 03 ක් අමාත්‍යාංශයට අයත් වූ අතර වාරිමාර්ග, ජලාශ, ජල සම්පත් කළමනාකරණ විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු සහ වාරිමාර්ග ආයතනයන්හි අදාල ප්‍රතිපත්ති, වැඩ සටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම, වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවාහන සහ ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවන ජලය ඉවත් කිරීමේ යෝජනා ක්‍රම, ප්‍රවර්ධනය, ඉදිකිරීම, මෙහෙයවීම, නඩත්තු කිරීම, නැවත සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම, ගංගා ඇළ දොළ සහ අනෙකුත් ජල මාර්ග දූෂණය වැලැක් වීම, වැසි ජලය රැස්කිරීම, ඉංජිනේරු උපදේශන සේවා සහ ඉදි කිරීම , වාරිමාර්ග ආඥා පනත, ශ්‍රී ලංකා මහවැලි අධිකාරී පනත, ජල සම්පත් මණ්ඩල පනත සහ වෙනත් අමාත්‍යාංශයක විෂය යටතට නොගැනෙන ලද්දා වූ සහ වර්තමානයේ පවත්නා විෂයට අදාල වන සෑම නීතියක්ම ක්‍රියාත්මක කිරීම, වෙනත් ආශ්‍රිත අමාත්‍යාංශ සමඟ සම්බන්ධිත විශේෂ ව්‍යාපෘතිවලට අදාළ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් වේ. අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 50,120 ක් වූ අතර ඉන් රු.මිලියන 44,942 ක් උපයෝජනය කර තිබුණි.

**2014 වර්ෂයට අදාල වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.**

- අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවන කාර්යයක් වන වෙනත් රාජ්‍ය ආයතන සඳහා චීන රජයෙන් පෙරසවි ගොඩනැගිලි ආනයනය කිරීමට 2014 වර්ෂයේදී වෙන්කර දී තිබුණු රු.මිලියන 3,765.52 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,765.43 ක් වැය කර තිබුණද 2015 අගෝස්තු 10 දින දක්වා සවිකිරීම් සිදු කර රාජ්‍ය ආයතන වෙත භාරදුන් මුළු නිවාස සංඛ්‍යාව, නිවාස භාරදුන් රාජ්‍ය ආයතනයන්, එක් එක් ආයතනය වෙත භාරදෙන ලද නිවාස සංඛ්‍යාව සතුටුදායක ලෙසට සවිකළ බවට ආයතනයන්ගෙන් ලබාගත් සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම කාර්යය සඳහා 2014 දෙසැම්බර් 31 දක්වා දරන ලද මළු වියදම රු. මිලියන 8,576.6 ක් බවද නිරීක්ෂණය කෙරේ.

- ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රමවල හදිසි යටිතල පහසුකම් පුතරුත්ථාපනය සඳහා සළසා තිබූ ප්‍රතිපාදනවලින් රු. මිලියන 12.84 ක මුදලක් අමාත්‍යාංශය විසින් සූක්ෂම වාරි පද්ධති ස්ථාපිත කිරීම හා ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම වෙත 2014 වර්ෂයේදී ගෙවා තිබුණි. එසේම මෙම සමාගමට මෙවැනි කාර්යයන් ඉටු කිරීමේ සුදුසුකමක් නොතිබියදී ටෙන්ඩර් පටිපාටියෙන්ද බැහැරව එම කාර්යයන් පවරා තිබීමත් මොරගහකන්ද, රාජාංගනය, නිරාවිය ආදී ගොවිපලවල සූක්ෂම වාරි පද්ධති ස්ථාපනය සඳහා එම මුදල් යොදාගැනීමත් මතභේදයට තුඩුදෙන්නක් විය.

- 2013 මැයි මාසයේදී අවසන් කරන ලද නිවත්කම් දනන් වත්කම් දියුණුව සහ සවි බලගැන්වීමේ ව්‍යාපෘතියේ (PEACE) ගණකාධිකාරීවරුන් දෙදෙනාට විධිමත් පත්වීම් ලිපි නිකුත් කර නොතිබියදී

සහ අදාල ව්‍යාපෘතිය සක්‍රීයව නොතිබියදී අමාත්‍යාංශයට ශක්‍යතා අධ්‍යයනයට වෙන්කර තිබූ ප්‍රතිපාදන යොදාගෙන එකතුව රු. 630,000 ක් වැටුප් ගෙවීම මතභේදයට තුඩුදෙන ගෙවීමක් ලෙස නිරීක්ෂණය කෙරේ.

- උතුරු පළාත් ඇළ / මොරගහකන්ද/ කළු ගඟ යටිගං සංවර්ධන කටයුතු යන ව්‍යාපෘතිවලට ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් 2014 වර්ෂයේදී වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 11.14 ක් වයඹ පළාත් ඇල ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයන් සඳහා භාවිතා කර එම වියදම් සදොස් ලෙස ඉහත කී ව්‍යාපෘතිවල වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි. මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම විසින් මෙම කාර්යයන් සිදුකර තිබුණු අතර මෙම කොන්ත්‍රාත් පිරිනැමීම ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව සිදු කර තිබුණි.

- ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා අමාත්‍යාංශය වෙත 2014 වර්ෂයේදී වෙන්කළ ප්‍රතිපාදනවලින් රු. මිලියන 6.92 ක් යොදාගෙන ජල සම්පත් මණ්ඩලයේ නළ ළිං ඉදිකිරීම, අලුත්වැඩියා කිරීමට සහ දැයට කිරුළ වියදම් සඳහා යොදාගෙන තිබුණි.

- 1999 ඔක්තෝම්බර් 13 දිනැති අංක 1101/9 දරන රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2 වගන්තිය ප්‍රකාර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සේවකයන් බඳවා ගැනීම වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකළ යුතුව තිබුණද වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් රියදුරන් 75 දෙනෙකු දෙපාර්තමේන්තුව වෙත බඳවා ගැනීම සිදුකර තිබුණි. තවද ඉහත රියදුරු සේවා ව්‍යවස්ථාවේ 7.1 වගන්තිය ප්‍රකාර මෙවැනි බඳවා ගැනීමකදී අයදුම්පත් කැඳවීම රජයේ ගැසට් පත්‍රය මඟින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින් හෝ වෙනත් සුදුසු ආකාරයකට කළ යුතු වුවත් එයට පටහැනිව ඕනෑම අපේක්ෂකයයෙකුට අයදුම්කිරීමට ඇති අවස්ථාව අහිමි කරමින් අදාල දැන්වීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රදර්ශනය කරන මෙන් ලේකම්වරයා විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත කරන ලද දැනුම්දීමක් මත මෙම බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබුණි. මේ අනුව මෙම බඳවා ගැනීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් අනුමත කළ සුදුසු ක්‍රමයක් ලෙස නිරීක්ෂණය නොකෙරේ.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩ සටහන යටතේ වැය විෂයයන් 02 කට සළසා තිබුණු රු. මිලියන 55 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. ක්‍රියාත්මක කළ නොහැකි ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සළසා ගෙන ඒවා වෙනත් ව්‍යාපෘතිවලට මාරු කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

# ජනමාධ්‍යය

ජනහිතකාමී වූත්, සංවර්ධන නමා‍ය වූත්, නිදහස් හා වගකීම් සහිත ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය කලාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම, පහසුකම් සැලසීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම හා මෙහෙවර කාර්යයන් කරනු ලබන ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය මෙරට රාජ්‍ය මාධ්‍ය ආයතන ඍජුව ද, පෞද්ගලික මාධ්‍ය ආයතන වක්‍රව ද පාලනය කරනු ලබයි. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, පුවත්පත් මණ්ඩලය, ජාතික චිත්‍රපටි සංස්ථාව, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ සැලසිනේ ආයතනය, සීමාසහිත ලංකා පුවත්පත් ආයතනය හා ස්වාධීන රූපවාහිනී සේවය අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ ඇති රාජ්‍ය ජනමාධ්‍ය හා සම්බන්ධ ආයතන වේ.

විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා ද පැමිණිලි කළ හැකි පරිදි ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ පනත සංශෝධනය කිරීම, මහජන ආරක්ෂාව හා ආර්ථිකය පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීමට අදාළ පනත් කෙටුම්පතක් සකස් කිරීම, විකාශන සංවර්ධන අධිකාරි පනත සම්මත කිරීම සහ ශ්‍රී ලංකාව ප්‍රතිසම තාක්ෂණය වෙතින් අංකන තාක්ෂණය වෙත මාරුවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, රාජ්‍ය මුදල් අයථා ලෙස පුද්ගලික පාර්ශ්වයන් වෙත යෑම වැලැක්වීම සඳහා පෞද්ගලික ගුවන් විදුලි නාලිකා හා රූපවාහිනි නාලිකා බලපත්‍රලාභීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් සහ බලපත්‍ර ගාස්තු ක්‍රමයක් සැකසීම, කේබල් චන්ද්‍රිකා හා අන්තර්ජාලය මත පදනම්වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇති කිරීම, ආනයනය කරනු ලබන රූපවාහිනී වැඩසටහන් සඳහා අයකරන ආදායම සඳහා අරමුදලක් ප්‍රමාදයකින් තොරව පිහිටුවීම, ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් ඇති කිරීම හා රූපවාහිනී ප්‍රචාරණ දැන්වීම් පාලනය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම යන අංශයන් පිළිබඳ අමාත්‍යාංශයේ අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගන්නා ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නියම කර තිබුණ ද මෙකී කාර්යයන් ඉටු කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. එසේ වුවත් කේබල් චන්ද්‍රිකා හා අන්තර් ජාලය මත පදනම් වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇති නොකර 2014 නොවැම්බර් මස දී චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ රූපවාහිනී ජාලයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදී තිබුණි.

ආනයනික ටෙලිනාට්‍ය, වානිජ වැඩසටහන්, චිත්‍රපට හා ළමා වැඩ සටහන් විකාශය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2014 වර්ෂයේදී පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලයට විද්‍යාව මනෝ විද්‍යාව, නීතිය වැනි ක්ෂේත්‍රයන් පිළිබඳ නිපුණතාවයන්ගෙන් යුක්ත සම්පත්ධාරීන් අනුයුක්ත කර නොතිබූ අතර ළමා චිත්‍රපට හා කාටූන් විකාශය කිරීමට අනුමැතිය ලබාදීමේදී සමාජ වගකීමෙන් හා කැපවීමෙන් රටේ අනාගත පරපුර පිළිබඳව සැලකිල්ලකින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

බදු මුදල් ගෙවීමකින් තොරව ආනයනික වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීම සම්බන්ධ සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව දැන්වීම් 06 කින් පමණ රු.මිලියන 3 ක ආදායමක් අහිමි වී තිබුණි.

අමාත්‍යාංශය යටතේ ඇති රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ මෙහෙයුම් කටයුතු වලින් 2014 වර්ෂය තුළදී රු.මිලියන 52 ක අලාභයක් සිදුවී තිබුණ අතර මෙයින් රු. මිලියන 47 ක් ඉන්දියා චිත්‍රපට සමාගමකට නොමිලේ පහසුකම් සැපයීම වෙනුවෙන් දැරීමට සිදුවූ අලාභයක් විය.

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සත්‍ය තොරතුරු දැනගැනීමට ජනතාවට ලබාදී ඇති අයිතිය තහවුරු කිරීමේ අරමුණ ඇතිව 1948 ජූලි මස 31 වැනි දින රජයේ ප්‍රවෘත්ති දෙපාරත්මේන්තුව ස්ථාපිත කර තිබුණි.

දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබුණු රු.මිලියන 8.6 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුවේ මාධ්‍ය සමාජයේ බීමහල පවත්වාගෙන යාම වෙනුවෙන් රු.4,653,515 ක හිඟ මුදලක් අයකර ගැනීමට 2014 පෙබරවාරි සිට නීතිපති මගින් කටයුතු කරන බාහිර පුද්ගලයා වෙතම ගිවිසුමක් හෝ මුදලක් අයකිරීමකින් තොරව මත්පැන් බලපත්‍රය 2014 වර්ෂයේදී ද ලබාදීමට කටයුතු කර තිබුණි.

දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ ඒකකයක් තිබියදීත් 2014 වර්ෂය තුළදී ක්ෂේත්‍ර සමීක්ෂණ 02 ක් සඳහා බාහිර ආයතනයකට රු.3,380,000 ක් ගෙවා තිබූ අතර, ඉන් ලබාගත් ප්‍රතිඵලයක් ද නිරීක්ෂණය නොවීය.

## ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

පසුගිය වර්ෂය වන විට ජාතික නාලිකා 08 ක් , ප්‍රාදේශීය සේවා 06 ක් හා ප්‍රජා ගුවන් විදුලි සේවා 02 ක් හා එෆ්. එම්. සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන 07 ක් මධ්‍යම තරංග සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන 01 ක් කෙටි තරංග සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන 01 ක් ගුවන් විදුලි සංස්ථා සේවා ජාලයෙහි පැවතිය අතර 2014 වන විට ජාතික නාලිකා 06 ක් , හා ප්‍රජා ගුවන් විදුලි සේවා 01 ක් දක්වා අඩුවී තිබුණ අතර 2012 වර්ෂයේදී ජර්මන් රජය සතුව පැවති ඩොයිෂ්වෙල් ප්‍රතිවිකාශණාගාරය ද සංස්ථාව වෙත දී තිබුණි.

සංස්ථාව සතු දුර්වලතා ලෙස සංස්ථාවේ විකාශන පද්ධතිය පොදුවේ සැහීමකට පත්විය නොහැකි තත්ත්වයක තිබීම, සංස්ථාවේ වත්කම් නිසිලෙස කළමනාකරණය කර නොතිබීම, කණ්ඩායම් ක්‍රියාකාරීත්වය වර්ධනය වී නොතිබීම, අවශ්‍යතාවය ඉක්මවා සේවක සංඛ්‍යාවක් සිටීම, සේවකයින්ගේ දක්ෂතා ඇගයීමට ලක්කොට ඒ අනුව රාජකාරී නොපැවරීම, නව තාක්ෂණික උපකරණ සඳහා විශාල මුදලක් වැයකර ඇතත් ඒවා උපයෝගී කර ගැනීමට නියමිත පුහුණුවක් ලබා දී මනා කළමනාකරණයක් සිදු නොවීම යන ප්‍රමුඛ කාර්යයන් හේතු කොටගෙන සංස්ථාව දිගින් දිගටම අලාභ ලබා තිබුණි. මෙකී අලාභයන් හේතුවෙන් පසුගිය වර්ෂ 05 ක කාලය තුළ මහා භාණ්ඩාගාරයෙන් සංස්ථාවට ලබාදී තිබුණු දායකය රු.මිලියන 1,317ක් විය.

සංස්ථාවේ මූල්‍ය තත්ත්වය දිගින් දිගටම පිරිහෙමින් පැවතීම නිසා 2014 වර්ෂය අවසානයට සංස්ථාවේ බැංකු අයිරාව රු.මිලියන 36.7 ක් වූ අතර මේ සඳහා වර්ෂය තුළදී ගෙවා තිබුණු පොළිය රු.මිලියන 5.7 ක් විය.

සංස්ථාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම මගින් මුදල් ගෙවා පවරාගෙන භුක්ති විදිමින් සිටි ඉඩම්වල ඉදිකර තිබූ ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත තත්ත්වයට පවත්වා තිබුණු අතර ඇතැම් ඉඩම් සංස්ථාවට අහිමි වී වෙනත් පාර්ශ්වයන් වෙත අයිතිය පැවරී තිබුණු බව අනාවරණය විය.

උදාහරණ ලෙස වීරකැටිය විකාශනාගාරයේ ගොඩනැගිලි හා ඉඩම් අක්කර 30 ක් සාගර විශ්ව විද්‍යාලයට යොවුන් සේනාංක වැඩසටහනට නිදහස් කර තිබුණි. දියගම පිහිටි අක්කර 159 ක ඉඩමින් අක්කර 19 ක් මොරටුව විශ්ව විද්‍යාලයටද හා අක්කර 25 ක් ක්‍රීඩාංගණය සඳහා ද ලබාදීමට කටයුතු කර ඇති අතර ඉතිරි අක්කර 105 සම්බන්ධව ගනුලැබූ ක්‍රියාමාර්ග විගණනයට අනාවරණය නොවුණි.

## ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව

2013 වර්ෂයේ සංස්ථාව රු. මිලියන 36 ක ලාභයක් උපයන ලද නමුත් 2014 වර්ෂයේදී එය රු. මිලියන 175 ක අලාභයක් බවට පරිවර්තනය වී තිබුණි. ජනාධිපතිවරණය වෙනුවෙන් සංස්ථාව විසින් එක් ජනාධිපති අපේක්ෂකයකුගේ ප්‍රවර්ධන කටයුතු සඳහා රු. මිලියන 34.7 ක ගුවන් කාලයක් නොමිලේ ලබාදී තිබුණු අතර සංස්ථා වැඩසටහන් ලෙස උපලේඛනගත කර රු. මිලියන 2.2 ක් වටිනා විකාශන කාලයක් ලබාදී තිබුණි.එසේම ජනාධිපතිවරණයට අදාළව රු. 5,202,750 ක දැන්වීම් ප්‍රචාරණය කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර ඉන් රු. 1,000,000 ක දැන්වීම් සඳහා මුදල් ලැබී තිබියදීත් ගුවන් කාලය නොදීම හේතුවෙන් එම මුදල් නැවත ගෙවීමට සිදුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී හදිසි අවශ්‍යතාවයක් බව දක්වමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය ලබාගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය ලබාදී තිබුණු නියෝගයද නොසලකා ලිඛිත ගිවිසුමකට එළඹීමකින්ද තොරව ජාතික රූපවාහිනීය සැටලයිට් තාක්ෂණය ඔස්සේ විදේශ රටවල විකාශය කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත රු. මිලියන 3.5 ක් ගෙවා තිබුණි.

සංස්ථාවට අහිතකර කොන්දේසි සහිත ගිවිසුම් මත අනාගත තාක්ෂණ පරිවර්තනයන්ට නොගැලපෙන භාවිතා කරන ලද සම්ප්‍රේෂක 2 ක් රු.16,928,653 කට මිලදී ගෙන තිබුණි.

# නීතිය හා සාමය

ශ්‍රී ලංකා පොලිසිය හා විශේෂ කාර්ය බලකාය, නීතිය හා සාමය පිළිබඳ ක්ෂේත්‍රය යටතේ ක්‍රියාත්මක වන ආයතන වන අතර එම ආයතන සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම, එම ආයතන උසස් මට්ටමකින් ක්‍රියාත්මක කර වීම සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය සහ භෞතික හා මානව සම්පත් ලබා දීම, ක්‍රියාකාරීත්වය අධීක්ෂණය හා කාර්ය සාධනය ඇගයීම අමාත්‍යාංශ විෂය පථයට අයත් වේ. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වර්ෂ 1 සිට 3 දක්වා පැරණි, අය නොවෙමින් පවතින රු. මිලියන 6.30 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

- සමාලෝචිත වර්ෂය තුළ පොලිස් විශේෂ කාර්ය බලකායට අයත් වාහන 15 ක් සම්බන්ධව සිදු වී ඇති අනතුරු මත සිදු වූ රු. මිලියන 3.91 ක් වූ අලාභය අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට ක්‍රියාකර නොතිබුණි.

- වර්ෂ 1 සිට 3 දක්වා පැරණි, ආයතනයේ පවතින රු. මිලියන 133.39 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

- ගංජා, අබින්, හෂිස් සහ හොරොයින් වැනි සමාජයට විශාල අහිතකර බලපෑමක් එල්ල කරන මත්ද්‍රව්‍ය වැටලීම් 71,215 ක් පොලිස් දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී සිදුකරන ලද අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 1.2 ක වැටලීම්වල වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාජයේ යහපත තකා මේ සම්බන්ධව සිදු කරනු ලබන වැටලීම් වඩා විධිමත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

- ප්‍රසම්පාදන සහ ගබඩා ක්‍රියාවලියේ අඩුපාඩු විගණනයේදී පෙන්වා දෙන ලදි.

- මුදල් රෙගුලාසි 571 ට පටහැනිව රුපියල් මිලියන 66 කට අදාල තැන්පතු 218 ක් සහ විශ්‍රාම වැටුප් කාර්යය සඳහා ලද රුපියල් මිලියන 2.8 ක මුදලක් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ පොලිස් දෙපාර්තමේන්තු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි

- ප්‍රමාණ බිල්පත් සහ කොන්ත්‍රාත් ගිවිසුම්වල අඩුපාඩු හා අධීක්ෂණ ක්‍රියාවලියේ පවතින දුර්වලතා හේතුවෙන් 2011 වර්ෂයේ මාස 18 කින් නිම කිරීමට 2011 වර්ෂයේදී ප්‍රදානය කළ රු.මිලියන 354 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්වල 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධනය රු.මිලියන 184 ක් විය.

# වරාය හා නාවික කටයුතු

## වරාය සේවා

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් පාලනය වන ප්‍රධාන වරායන් ලෙස කොළඹ වරාය, දකුණු කොළඹ නව වරාය, ගාල්ල වරාය, හම්බන්තොට වරාය හා ත්‍රිකුණාමල වරාය දැක්විය හැකිය. මීට අමතරව ඔලුවිල් වරායෙහි මෙහෙයුම් කටයුතු එය ආරම්භයේ සිටම සිදු නොකරන අතර කන්කසන්තුරේ නාවික ජැටියෙහි නාවික මෙහෙයුම් සිදු කෙරෙමින් පවතී.

සමාලෝචිත 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලදී නිරීක්ෂණය වූ කැපීපෙනෙන වෙනස්වීම්

- 2014 වර්ෂයේ දී මුළු ශුද්ධ ආදායම රු.මිලියන 41,088 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 7,302 කින් වැඩි වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ආදායමට සාපේක්ෂව සියයට 21.56 ක වැඩිවීමකි.

- සමාලෝචිත 2014 වර්ෂයේ මුළු වියදම රු.මිලියන 33,139 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 978 කින් අඩු වී තිබුණි. එය සියයට 3.04 ක අඩු වීමකි.

- 2014 වර්ෂයේ බදු පසු ලාභය රු.මිලියන 7,947ක් වූ අතර ඉකුත් වර්ෂයේ ලාභය සමඟ සැසඳීමේ දී රු.මිලියන 6,322 කින් වැඩි වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය සමඟ සැසඳීමේ දී සියයට 389 ක ප්‍රතිශතයකින් බදු පසු ලාභයේ වැඩිවීමක් පෙන්නුම් කර තිබූ අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ විදේශ මුදල් හුවමාරු අනුපාතය ගැලපීමෙන් ඇති වූ ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 4,077කින් වැඩි වී තිබීමයි.

- 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවට පැමිණි මුළු නැව් ප්‍රමාණය 5,072 ක් වූ අතර, එය ඉකුත් වර්ෂය සමඟ සසඳන කල නැව් පැමිණීමේ සංඛ්‍යාව සියයට 5.68 ක වැඩිවීමකි.

- 2014 වර්ෂයේ දී මෙහෙයවන ලද අඩි 20 බහාළුම් ඒකක ගණන දහස් වලින් 2,559 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 2.3ක වර්ධනයකි. කෙසේ වුවද සම්ප්‍රදායික නැව් බඩු මෙහෙයවීම 2014 වර්ෂයේ දී මෙ.ටොන් දහස් වලින් 6,339ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වලින් සාපේක්ෂව සියයට 11.91 ක වැඩිවීමකි.

- ත්‍රිකුණාමල වරාය ඉකුත් වසර 08 ක් තුළ අඛණ්ඩව පාඩු ලබමින් පැවතුණු අතර සමුච්චිත පාඩුව රු.මිලියන 2,073 කි.

## දකුණු කොළඹ වරාය

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ලෙස දකුණු කොළඹ වරාය දිය කඩනය, නාවික පිවිසුම් මාර්ගය සහ වරාය තටාංගනය ගැඹුරු කිරීම සිදුකල අතර ඒ සඳහා දරා තිබූ මුළු වියදම රු.මිලියන 42,055 විය. (දේශීය රු.මිලියන 9,876 ,විදේශීය රු.මිලියන 32,179)

කෙසේ වුවද නාවික ජැටිය ඉදිකිරීම හා ග්‍රැන්ට් දොඹකර සවිකර මෙහෙයුම් කටයුතු කර වසර 35කින් ආපසු භාරදීමේ (BOT) පදනමට චීන සමාගමක දායකත්වයෙන් පිහිටවූ කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්ත සමාගම නැමති අළුතෙන් ලියාපදිංචි කල සමාගමකට භාර දී තිබූ අතර එම සමාගම සමඟ ශ්‍රී ලංකා වරාය අධිකාරිය එළඹ තිබූ ගිවිසුමට අනුව එම සමාගමෙන් කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 15 කොටස් මිලදී ගැනීමට ද අධිකාරියට සිදු වී තිබූ අතර ඒ සඳහා රු.මිලියන 2,860 ක් වැය කර තිබුණ ද මෙතෙක් ලාභාංශ ලෙස කිසිදු මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබා දී නොතිබුණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්ත සමාගම අතර ඇති කර ගත් ගිවිසුම අනුව බහළුම් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පුරස්කාර කුලියක් පමණක් ලැබේ. බහළුම් වෙනුවෙන් ලැබෙන පුරස්කාර කුලිය කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට ලබාගත් ණය මුදල සඳහා වූ පොලිය, ගෙවීම් සඳහාවත් ප්‍රමාණවත් දායක වීමක් ද නොවන බව නිරීක්ෂණය විය.

එසේම ශ්‍රී ලංකාවේ වරායවල් අතරින් ලොව විශාලතම නැව් පැමිණිය හැකි ගැඹුරුතම තටාකය වසර 35 ක කාලයකට ඉදිකර මෙහෙයුම් කර භාරදීම සඳහා චීන සමාගමකට ලබදීම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත වෙත නැව් ගෙන්වා ගැනීමට දැඩි තරඟකාරීත්වයට මුහුණ දීමට සිදුවී තිබුණි.

## හම්බන්තොට වරාය

2008 පෙබරවාරි 15 වන දින හම්බන්තොට වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ පළමු අදියර ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ අතර වරාය ඉදිකිරීම් කටයුතු 2011 දෙසැම්බර් 31 දින වන විට හම්බන්තොට වරායේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් වී තිබුණි.ඒ සඳහා රු.මිලියන 53,272 ක් වැය වී තිබිණි. කෙසේ වුවද වරායේ ග්‍රැන්ට් දොඹකර සවිකර නොතිබීම නිසා බහළුම් මෙහෙයවීම කල නොහැකි වී තිබීමෙන් හම්බන්තොට වරායට පැමිණෙන නැව් ප්‍රමාණය බොහෝදුරට මෝටර් රථ ප්‍රවාහනය කරන නැව් වලට පමණක් සීමා වී තිබුණි. කෙසේ වුවද ඇ.ඩොලර් මිලියන 808 ක විදේශ ණය මුදලක් යොදා ගනිමින් හම්බන්තොට දෙවන අදියර වරාය සංවර්ධන ව්‍යාපෘතිය තුලින් වරායේ නාවික මෙහෙයුම් උපකරණ සවිකිරීම හා මෙහෙයුම් පර්යන්තය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණ අතර 2014 දෙසැම්බර් 31 වන විට හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ I හා II අදියරයන් සඳහා වැයකර තිබූ මුළු මුදල රු.මිලියන 105,962 ක් වූ අතර 2015 අප්‍රේල් 14 වන දින එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිව තිබූ අතර ව්‍යාපෘතියට අවශ්‍ය අරමුදල් චීනයේ EXIM බැංකුවෙන් ලබාගැනීමට කටයුතු කර තිබුණි.

කෙසේ වුවද, වරාය ඉදිකිරීමට ලබාගත් ණය සඳහා පොලිය හා ණය වාරික ගෙවීමට ප්‍රමාණවත් ඉපයීමක් උපයා නොතිබුනෙන් 2011 සහ 2012 වර්ෂ තුල හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු වලින් දරා තිබූ

අලාභය පිළිවෙලින් රු.මිලියන 11.9 හා රු.මිලියන 25.5 ක් විය. එසේ වුවද 2013 වර්ෂය සඳහා හම්බන්තොට වරායේ මෙහෙයුම් ලාභය වෙනම පිළියෙල කර නොතිබූ අතර 2014 වර්ෂය සඳහා මෙම වරායේ ක්‍රියාකාරීත්වයෙන් වූ අලාභය රු.මිලියන 3,819 ක් විය.

## ඔලුවිල් වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඩෙන්මාර්ක් රජයේ DANIDA ඒජන්සියෙන් ණය මුදලක් ලබාගෙන ඔලුවිල් වරාය ඉදිකිරීම 2013 සැප්තැම්බර් 01 දින අවසන් කර තිබූ අතර යූරෝ මිලියන 38.96 (ශ්‍රී ලංකා මුදලින් රු.මිලියන 6,780) ක් ඒ සඳහා වැය කර තිබුණි. ඊට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය රු.මිලියන 444ක් දරා තිබුණි. ඒ අනුව ඔලුවිල් නාවික සහ ධීවර වරායවල වෙන වෙනම ඉදිකර තිබුණි. එසේම ඔලුවිල් වරාය ඉතාම අඩු ගැඹුරක් හෙවත් මීටර් 8 ක් පමණක් ගැඹුරු වරායක් වන බැවින් පැමිණිය හැක්කේ ද ඉතාම කුඩා නාවික යාත්‍රා බව තහවුරු විය. කෙසේ වුවද, ඔලුවිල් වරාය සඳහා ඉදිකිරීමට ලබාගත් විදේශ ණය ඉදිරි වසර 10ක් තුල ආපසු ගෙවිය වුතු බැවින් හා එකී වරායෙන් කිසිදු ආදායමක් නොලැබෙන බැවින් සහ වරාය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙනයාම වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදුවීමත් සලකන විට ලබාගත් විදේශ ණය සඳහා වාරික ආපසු ගෙවීමේ දී වරාය අධිකාරියට මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණ දීමට සිදු නොවේය යන්න බැහැර කල නොහැකි විය. කෙසේ වුවද, ඔලුවිල් වරාය ඉදිකර විවෘත කල පසු කිසිදු නෞකාවක් මෙම වරායට පැමිණ නොමැති අතර වර්තමානයේ ඔලුවිල් වරායේ වැලි පිරීඇති බැවින් නැවත හැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.

## නාවික කටයුතු

### සීමාසහිත ලංකා නැව් සංස්ථාව

1983 වසර වන විට නාවික යාත්‍රා 17 ක් සතුව තිබූ ලංකා නැව් සංස්ථාව සමාලෝචිත වර්ෂය වනවිට එකදු නැවක හෝ අයිතිය නොමැතිව සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යයි. ප්‍රධාන වශයෙන්ම කුලී පදනම මත නාවික යාත්‍රා ලබාගෙන ප්‍රවාහන කටයුතු කරන බැවින් සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු පුළුල් කර ගැනීමට ඇති හැකියාව අවම වී තිබුණි. සීමාසහිත ලංකා නැව් සංස්ථාව සතුව 2011 වර්ෂයේ පැවතුන එකම නෞකාව කුලියට ලබා දී තිබූ අතර 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම කුලියට ගත් පෞද්ගලික සමාගම කුලී ගාස්තු නොගෙවා තිබූ අතර ඒ වෙනුවෙන් සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අයවිය යුතු මුදල රු. මිලියන 87.6 ක් විය. එසේම කුලියට ගත් සමාගම කෙන්යාවේ වරායක නෞකාව රඳවා තිබී එකී වරායේ නැව් ගාස්තු හා අනිකුත් ගාස්තු නොගෙවීමෙන් නෞකාව කෙන්යා රජයේ අධිකරණයේ නියෝග මත රඳවාගෙන තිබුණි. ඒ අනුව කෙන්යාවෙන් නැව නිදහස් කර ගැනීමට වරාය ගාස්තු, නීත්මය ගාස්තු සහ නැවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් දීමනා ගෙවීම වෙනුවෙන් සීමාසහිත ලංකා නැව් සංස්ථාව රු. මිලියන 57.42 ක් වැය කර තිබූ අතර එම මුදලද කුලියට ගත් සමාගම ගෙවීම් කර නොතිබුණි.

ලංකා නැව් සංස්වේ පරිපාලන සමාගමක් වන සීමාසහිත ෂිලෝන් ෂිපිං ලයින් සමාගම 1992 වසරේ දී ජනතාකරණය කර තිබූ අතර එහිදී සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 51ක් සී ඇන්ඩ් ඒ කන්සල්ටන් සමාගමට විකුණා තිබූ අතර කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 39 ක් සීමාසහිත නැව් සංස්ථාව ඉතිරි කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට සීමාසහිත ලංකා නැව් සංස්ථාව රු.මිලියන 255 ක පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජනය කර තිබුණ ද එකී සමාගම් වලින් කොටස් ආයෝජනයෙන් ලැබෙන ලාභාංශ ආදායම රු. මිලියන 3 ක් වැනි ඉතාම අඩු මට්ටමක පැවතුනි.

# මාර්ග ඉදිකිරීම්

මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග ආරක්ෂණ අරමුදල, මහනැඟුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම, මහනැඟුම ඉමල්ෂන් නිෂ්පාදන පුද්ගලික සමාගම, මහනැඟුම මාර්ග ඉදිකිරීම හා යන්ත්‍රෝපකරණ සමාගම, වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය, ලංකා නැව් සංස්ථාව හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2014 වර්ෂය තුලදී මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ පාලනය විය.

2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ පුනරාවර්ථන වියදම් සඳහා රු.මිලියන 361.6 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 143,903.76 ක් ද වශයෙන් අයවැය ප්‍රතිපාදන සලසා තිබුණි.ඉන් රු.මිලියන 91,605 ක් විදේශීය ණයද වන අතර රු.මිලියන 1,994 ක් විදේශීය ප්‍රදාන ද වූ අතර රු.මිලියන 50,282.66 ක් දේශීය වශයෙන් ව්‍යාපෘති සඳහා යෙදවීමට යෝජිත වැය විය. ගිණුම් අනුව වර්ෂයේදී පුනරාවර්ථන වියදම් ලෙස රු.මිලියන 361.39 ක් ද ප්‍රාග්ධන වියදම් ලෙස රු.මිලියන 132,942 ක් ද වියදම් දරා තිබුණු අතර ඉන් රු.මිලියන 88,097 ක් විදේශීය ණය හා ප්‍රදාන වශයෙන් ලැබුණු මුදල් විය. එම වර්ෂය තුල මුළු කාර්ය මණ්ඩලය 396 ක් විය. 2014 වර්ෂයේදී අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වූ විදේශ ණය ව්‍යාපෘති සංඛ්‍යාව 37 ක් විය. ඒ සඳහා වර්ෂය තුලදී වෙන් කළ විදේශ ණය මුදල රු.මිලියන 93,599 ක් හා සියලුම ව්‍යාපෘති වෙනුවෙන් වැය කළ මුළු විදේශීය ණය වටිනාකම රු.මිලියන 88,098 ක් විය. සමාලෝචිත වර්ෂයේදී නිම කළ විදේශ ණය ව්‍යාපෘති සංඛ්‍යාව 06 ක් ලෙස වාර්තා වී තිබුණි.

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ගිණුම් විගණනයේදී හා අමාත්‍යාංශයේ සහ ඒ යටතේ වූ ආයතනවල ගණුදෙනු හා ක්‍රියාකාරකම් විගණනයේදී නිරීක්ෂණය වූ ප්‍රමාණාත්මක නිරීක්ෂණ පහත දැක්වේ.

- ඉදිරිපත් කළ ගිණුම් අනුව අමාත්‍යාංශය සිය මෙහෙයුම් කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේදී වැය විෂයයන් 54 ක් සඳහා ශුද්ධ වෙන් කිරීම් ඉක්මවා රු.බිලියන 53.5 ක බැඳීම් ඇති කරගෙන තිබුණි. මෙය අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ මුළු අයවැය ප්‍රතිපාදනයෙන් සියයට 37 ක අගයක් ගෙන තිබූ අතර වැය විෂයයන් 05 ක් සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 378.6 ක මුදල වැයකර නොතිබුණි.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවට පටහැනිව පාර්ලිමේන්තුවේ අවසරයකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරිය ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය මුදලකින් රු.බිලියන 7.86 ක මුදලක් අමාත්‍යාංශය විසින් ලබාගෙන අමාත්‍යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට යොදවා තිබුණි.

## මාර්ග සංවර්ධන අධිකාරිය

මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ කළමනාකරණයේ නිලධාරීන් 79 ක්ද ඉංජිනේරු සේවයේ 651 ක් සහ තාක්ෂණ සේවයේ නිලධාරීන් 886 ඇතුළු මුළු කාර්ය මණ්ඩලය 5,964 කින් සමන්විත විය. මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31දිනට අධිකාරියේ ඌනතාවය රු.මිලියන 4,962.67 ක් වූ අතර, මාර්ග වැඩි දියුණු කිරීම හා නඩත්තු කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 21,432.6 ක ප්‍රතිපාදන

ලබා දී තිබුණි. 2014 වර්ෂය තුළ අධිවේගී මාර්ග මගින් එකතු කරන ලද ආදායම රු.මිලියන 3,156.4 ක් විය.

මාර්ග සංවර්ධන අධිකාරිය සහ සමාගම් පනත යටතේ පිහිටුවන ලද ආශ්‍රිත සමාගම් වන මගනැගුම ඉමල්ෂන් ප්‍රඩක්ෂන් සමාගම, මගනැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉක්විප්මන්ට් සමාගම හා මගනැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම හා අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරියේ විධානය යටතේ ක්‍රියාත්මක කරන දේශීය හා විදේශීය අරමුදල් මත පිහිටුවා ඇති ව්‍යාපෘති මගින් අධිවේගී මාර්ග, මහා මාර්ග හා පාලම් ඉදිකිරීම හා ඒවා පුනරුත්ථාපනය හා නඩත්තු කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ වැදගත් විගණන නිරීක්ෂණ සාරාංශ කොට පහත දැක්වේ.

- සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධිකාරිය විගණනය සඳහා ඉදිරිපත් කළ ගිණුම් අනුව 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 – 10 අතර කාලය තුළ අධිකාරිය විසින් විවිධ පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොමැති වටිනාකම රු.මිලියන 3,014.91 වූ ණයගැති ශේෂ හා අධිකාරිය විසින් වර්ෂ 1 – 10 අතර කාලය තුල ගෙවා නොමැති වටිනාකම රු.මිලියන 1,492.38 ක් වූ ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය තුලදීවත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින කි.මි. 1,434 ක් වූ මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකු මගින් රු.බිලියන 151.77 ක ණය මුදල් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. ඒ අනුව මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.බිලියන 137.52 ක් වූ අගයට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර, 2012, 2013 හා 2014 වර්ෂ තුල දේශීය බැංකු 07 ක් මගින් එම මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා මුදලින් ලබාගත් මුළු ණය මුදල රු.බිලියන 108.25 ක් විය. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා පත්කර ගතයුතු වුවත් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් මත මෙම කොන්ත්‍රාත්තු සෘජුවම ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් එම ඉදිරිපත් කළ මිල ගණන් සම්මත මාර්ග රේටයන්ට වඩා වැඩි බව නිරීක්ෂණය වූ අතර මෙම ප්‍රදානය කළ කොන්ත්‍රාත්තු අතරින් මාර්ග 54 ක් සඳහා අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කිමිටුව විසින් නිර්දේශ කරන ලද රු.බිලියන 146.55 ක් වූ කොන්ත්‍රාත් වටිනාකම අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් රු.බිලියන 9.24 ක අගයකින් වැඩිකර තිබුණි. ඉහත අනුමත ණය සීමාව යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් අනුමත කරගත් ණය සීමාව රු.බිලියන 55.37 ක් වූ අතර ඉහත සඳහන් කරන ලද ප්‍රදානය කළ මාර්ග කොන්ත්‍රාත්තු 64 යටතේ වූ මාර්ග 28 ක් පුනරුත්ථාපනය වෙනුවෙන් රු.බිලියන 28 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාගෙන එම මුදල් මාර්ග පුනරුත්ථාපන කටයුතු වලින් පරිබාහිර කටයුතු සඳහා අධිකාරිය හා අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2014 වර්ෂයේ මාර්ග 141 ක් පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා වූ රු.මිලියන 16,238 ක ප්‍රතිපාදිත මුදල ඒ සඳහා වැය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වූ නමුත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් නොවූ මාර්ග 33 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැති වුවත් රු.මිලියන 2,757 ක මුදලක් වැයකර තිබුණි. තවද අධිකාරියට අයත් නොවූ (Non RDA) මාර්ග 900 ක මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම වෙනුවෙන් රු.මිලියන 38,519 ක් වැයකර තිබුණි. රු.මිලියන 5,319 ක් වැයකර අධිකාරියට අයත් මාර්ග 61 ක සහ රු.මිලියන 16,503 ක් වැයකර අධිකාරියට

අයත් නොවන මාර්ග 234 ක මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීමේ ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

- 2006 -2014 කාලය තුළ වැඩ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 5,891.05 ක් වූ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු කාර්යාල මගින් සිදු කරන අධිකාරියේ මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘති 50 ක් සඳහා රු.මිලියන 705.39 ක් වැයකර ඇතත්, කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදය, දුර්වල කාර්යසාධනය, අරමුදල් හිඟවීම සහ අධිකාරියට අයත් නොවන මාර්ගයන් වීම හේතුවෙන් එම ව්‍යාපෘතිවල වැඩ අතරමග නවතා දමා තිබුණු බව නිරීක්ෂණය විය.

- 2014 වර්ෂයේ නඩත්තු වැඩ සටහනේ ඇතුලත් කර තිබුණ මාර්ග 186 නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 493.83 ක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදනය කර තිබුණ නමුත් එම නඩත්තු කටයුතු සිදුකර නොතිබුණු අතර අයවැය ප්‍රතිපාදන සලසා නොමැති අධිකාරියට අයත් නොවන මාර්ග 281 ක (Non RDA) මාර්ග නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 1,248.14 ක් වැයකර තිබුණි.

- අධිකාරිය විසින් 2004 සිට 2007 දක්වා වූ කාලය තුල මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත ලබා දී ඇති වත්කම්, ද්‍රව්‍ය හා අමතර කොටස් වෙනුවෙන් අයවිය යුතු රු.මිලියන 63.27 ක් සහ මගනැගුම සමාගම් වෙත ලබා දී ඇති වාහන වෙනුවෙන් 2008 සිට 2013 දක්වා වූ කාලයට අදාලව අයවිය යුතු රු.මිලියන 488.86 ක් වූ වාහන කුලිය සමාලෝචිත වර්ෂය තුළවත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, මගනැගුම සමාගම් වෙත ලබා දී ඇති එහෙත් භාවිතයට ගත නොහැකි වාහන 20 ක් අධිකාරිය වෙත ආපසු ලබා දී නොතිබුණි.

- බිල්පත් සහ කල වැඩ වල මිණුම් ඉදිරිපත් කිරීමෙන් පසු ගෙවීම් සිදු කළයුතු වුවත්, අවස්ථා 55 කදී බිල්පත්‍ර සහ කළවැඩ පිළිබඳ මිණුම් පරීක්ෂා කිරීමකින් තොරව මගනැගුම සමාගම වෙත රු.මිලියන 6,126.37 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් ලබා දී තිබුණි.

## මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය - ව්‍යාපෘති (විදේශ ණය හා දේශීය මුදල් මත)

- සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති 06 කට අදාලව අත්කරගත් ඉඩම් හෙක්ටයාර් 1,165.4 ක පමණ ප්‍රමාණයක් සඳහා වන්දි ලෙස රුපියල් මිලියන 10,068.30 ක් ගෙවා තිබුණ අතර එම වන්දි ගෙවීම ප්‍රමාද වීම නිසා රු.මිලියන 1384.97 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි.

- අධිවේගී මාර්ග හා අනෙකුත් ප්‍රධාන මාර්ග ඉදිකිරීම සඳහා විදේශීය හා දේශීය අරමුදල් යොදා පිහිටුවන ලද ව්‍යාපෘති 10 ක මූලික කොන්ත්‍රාත් පිරිවැයට අමතරව නියමිත අනුමත කිරීමේ පටිපාටියෙන් බැහැරව විචලතා නියෝග 166 ක් මගින් රු.මිලියන 4,953.83 ක් සමාලෝචිත වර්ෂය තුළදී වෙන් කරවාගෙන තිබුණි.

- පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘති 2 ක සමාලෝචිත වර්ෂය තුල උපයෝජනය කිරීම සඳහා ණයදෙනු ලබන ආයතනය විසින් වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණය නියමිත කාලය තුල උපයෝජනය නොකිරීම නිසා එම ණය දෙනු ලබන ආයතනය විසින් රු.මිලියන 803.94 ක කැපවීමේ ගාස්තුවක් (Commitment Charges) අයකර තිබුණි.

- විදේශීය හා දේශීය ණය මගින් මාර්ග ඉදිකිරීම සඳහා පිහිටුවන ලද ව්‍යාපෘති 03 ක් විසින් එම ව්‍යාපෘතිවල අරමුණුවලින් බැහැර කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 161.33 ක් වැයකර තිබූ අතර එවැනිම ව්‍යාපෘති 10 ක් විසින් එම ව්‍යාපෘතිවල අරමුදල් වලින් රු.මිලියන 1,542 ක් අනාර්ථික කටයුතු සඳහා වියදම් දරා තිබුණි.

- කොළඹ වටරවුම් I ව්‍යාපෘතියේ ඉදිකිරීම්වල ගුණාත්මක තත්ත්වය කොන්ත්‍රාත්කරු විසින්ම ආරක්ෂා කර ගැනීමේ කොන්දේසිය මත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණ නමුත් එම කාර්යය විධිමත්ව කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකිරීම නිසා ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම්වල ගුණාත්මක තත්ත්වය පවත්වාගැනීම සඳහා රු.මිලියන 7.22 ක් සමාලෝචිත වර්ෂය තුල වියදම් දරා තිබුණි.

- ව්‍යාපෘති 05 ක කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු බිල්පත්‍ර නියමිත වේලාවට නොගෙවීම නිසා ඒ වෙනුවෙන් රු.මිලියන 204.09 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණි.

- අමාත්‍යාංශය යටතේ සියලු දේශීය හා විදේශීය ණය මුදල් මත පිහිටුවන ලද ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 33 හා 2007 අප්‍රේල් 05 දින දරන චක්‍රලේඛයට පටහැනිව සිදු කර තිබුණු අතර වැටුප් ගෙවීමද එම චක්‍රලේඛයට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කළ චක්‍රලේඛයක් පදනම් කරගෙන තිබුණි. මේ නිසා වැඩි දීමනා හා වැටුප් ව්‍යාපෘති නිලධාරීන්ට ගෙවීම් කර තිබුණි.

- සමාලෝචිත වර්ෂය තුලදී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ව්‍යාපෘති 02 ක රු.මිලියන 46,925.40 ක ඉදිකිරීම් ප්‍රදානය කර තිබූ අතර එක් ව්‍යාපෘතියක රු.මිලියන 119.26 ක් වැය කර ප්‍රාථමික අධ්‍යයන කටයුතු සඳහා උපදේශකවරුන් 11 දෙනෙකු ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව බඳවා ගෙන තිබුණි.

- කඩුවෙල සිට කඩවත (කි.මී.8) (අදියර II) දක්වා මාර්ගයේ ඉදිකිරීම් කටයුතුවලට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම රු.බිලියන 62.041 ක් වූ ලංසුව, රු.බිලියන 31.334 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තු ඉක්මවා තිබීම නිසා මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම අවලංගු කිරීමට 2010 ඔක්තෝබර් 06 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත් පසුව එම ලංසුවේ මිල රු.බිලියන 44.88 දක්වා අඩුකර 2011 නොවැම්බර් 23 දින එම කොන්ත්‍රාත්කරුටම ප්‍රදානය කර තිබුණි. සපයන ලද තොරතුරු අනුව ඉංජිනේරු ඇස්තමේන්තු හෝ මිල අඩු කරන ලද ලංසුව සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අධීක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබුණත්, වෙනස් කර ඉදිරිපත් කරන ලද එම ලංසුව අමාත්‍ය මණ්ඩලය විසින් 2011 පෙබරවාරි 15 දින අනුමත කර තිබුණි.

- මාර්ග ආංශික සහයක ව්‍යාපෘතිය යටතේ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කරනු ලබන මාර්ගවල ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට අයත් ජලනල පද්ධති නැවත ස්ථාපනය කිරීම සඳහා වසර 2 කට පෙර ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද රු.මිලියන 84 ක් වටිනා භාවිතයට නොගත් ජලනල හා උපාංග 2014 වර්ෂයේ අවසානයටත් ව්‍යාපෘතියේ ගබඩාවේ තබා තිබුණු අතර ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට හා පළාත්පාලන ආයතනවලට අයත් ජලනල පද්ධති නැවත ස්ථාපනය කිරීම සඳහා රු.මිලියන 74.8 ක් වැයකර තිබුණි. මෙම ප්‍රාග්ධන ගත වියදම් ව්‍යාපෘතියේ විෂය පථයට නොවැටෙන වියදම් වන අතර අදාළ ආයතන විසින් ප්‍රාග්ධනිත කිරීමට ද පියවර ගෙන නොතිබුණි.

# කාර්මික හා වෘත්තීය අධ්‍යාපන

වෙනස්වන ගෝලීය සමාජ, ආර්ථික හා තාක්ෂණික අවශ්‍යතාවයන්ගේ අභියෝගවලට මුහුණ දීමට, ගුණාත්මක හා තාක්ෂණික අධ්‍යාපන සහ වෘත්තීමය පුහුණුව මඟින් වඩාත් යහපත් වූ ජීවනයක් උදෙසා නිපුණ හා ඵලදායී මිනිස්බලය නිපදවීම සඳහා වෘත්තීමය අධ්‍යාපන හා පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා මගපෙන්වීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම අවශ්‍යතා හඳුනාගැනීම හා එම අවශ්‍යතාවලට යෝග්‍ය පූර්ණකාලීන හා අර්ධකාලීන වැඩසටහන් සකස්කිරීම, එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ උපදේශන සම්පත් නිපදවීම හා ඒවා ක්‍රියාත්මක කිරීම වෘත්තීමය අධ්‍යාපන හා පුහුණු කිරීම , තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරු පරිපාලකයින් හා කළමනාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීමද අරමුණු කරගෙන කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ආයතන පිහිටුවා ඇත.

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

2014 වර්ෂය සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මිලියන 1,543 ක් වූ අතර, සත්‍ය වියදම රු.මිලියන 1,500 ක් වුයෙන් රු.මිලියන 42.5 ක ඉතිරියක් නිරීක්ෂණය විය.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ තාක්ෂණ විද්‍යාල 9 ක් හා කාර්මික විද්‍යාල 30 පවතින අතර 2014 වර්ෂයේදී පාඨමාලා 85 ක් පවත්වා තිබුණි. තාක්ෂණ/කාර්මික පාඨමාලාවලින් 679ක් ප්‍රතිතනය කලයුතු අතර ඉන් 2014 වර්ෂයේදී ප්‍රතිතනය කර තිබුනේ 341 ක් පමණි.

## වෘත්තීය පුහුණු අධිකාරිය

වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවීන ක්‍රමවේදයන් හා තාක්ෂණය මඟින් පුද්ගලයන් තුළ නිපුණත්වයක් සංවර්ධනය කරමින් ගෝලීය ශ්‍රම ඉල්ලුම් සපුරාලීම පිණිස කටයුතු කරන වෘත්තීය පුහුණු අධිකාරිය කටයුතු කරයි. එම අධිකාරිය සතු රු. මිලියන 1,703.75 ක් වටිනා ඉඩම්වල අයිතිය තහවුරු කරගෙන නොතිබුණි. ජංගම දුරකථන සම්බන්ධතා හිමිකම් නොලබන සේවකයන් 477 දෙනෙකුට එම පහසුකම් ලබා දී සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3.78 ක් හා ඉකුත් වර්ෂයේ රු.මිලියන 3.22 ක් ගෙවා තිබුණි. අධිකාරියට අයත් කැබ් රථයක් 2003 වර්ෂයේදී අනතුරට ලක්වී තිබූ අතර රු.556,000 ක් වූ අලාභය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 20 (I) වගන්තියට අනුව වෘත්තීය පුහුණු සංවර්ධන අරමුදලක් පිහිටුවීමට හැකි වුවද එහි සඳහන් විධිවිධානවලට පටහැනිව එක් ආධුනිකයෙකුගෙන් රුපියල් 500 බැගින් අයකර රක්ෂණ අරමුදලක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12.34 ක මුදලක් එකතු කර තිබුණද, එකී මුදල් එම අරමුදලකට බැරකර නොතිබුණි. තවද වෘත්තීය පුහුණු අධිකාරි පනතේ

විධිවිධාන වලින් බැහැරව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් අවිධිමත් ලෙස අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2013 දෙසැම්බර් 18 දින පිහිටුවා තිබුණි.

නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වෘත්තීය පුහුණු අධිකාරියට රු. මිලියන 97.75 ක පුහුණු උපකරණ, පාඨමාලා ප්‍රතිනතය කිරීමේ අරමුණු සඳහා ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂා වලදී උපකරණ ලබාදීමට සැලසුම් නොකළ මධ්‍යස්ථාන සඳහා උපකරණ ලබා දීම, අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ උපකරණ ලබාදීම, එම උපකරණ වෙන්කර හඳුනාගැනීමට කටයුතු නොකිරීම, අළුත්වැඩියා කළ හැකි මට්ටමේ උපකරණ ඉවත්කර අළුතින්ම ලබාදීම, හොඳ තත්ත්වයේ තිබෙන උපකරණ තිබුණද නැවත අළුතින් ලබා දීම, ගබඩාවෙන් නිකුත් කළ උපකරණ ඇතැම් මධ්‍යස්ථානවලට ලැබී නොතිබීම, උපකරණ නිකුත් කිරීම පිළිබඳව බින්කාඩ්වල සටහන් නොකිරීම හා ඉන්වෙන්ට්‍රි පොත්වලට ඇතුළත් නොකිරීම, පුහුණු උපකරණ වලින් වැඩි කොටසක් භාවිතයට නොගෙන තිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

## ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

වෘත්තීය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට උචිත පරිදි තරුණ තරුණියන් සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය කටයුතු කරනු ලබයි. එසේ වුවද, අධිකාරියේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ඉහළ වගකීමක් දරනු ලබන අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් චෝදනා ලැබ වැඩ තහනමකට ලක්වූ තැනැත්තියෙකු බඳවාගෙන තිබුණි. තවද මෙම නිලධාරිනිය පරිවාස කාලයේ සිටින අතරතුර අවස්ථා දෙකකදී විදේශ ගත වීමට අනුමැතිය ලබා දී ඒ සඳහා රු.921,102 ක් ගෙවා තිබුණි.

ජංගම දුරකථන සම්බන්ධතා හිමිකම් නොලබන සේවකයන් 410 දෙනෙකුට එම පහසුකම් ලබා දී සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4.92 ක් හා ඉකුත් වර්ෂවල රු. මිලියන 2.79 ක් ගෙවා තිබුණි. අනුමැතියකින් තොරව රු. මිලියන 2.70 ක මුදලක් පරිත්‍යාග හා ත්‍යාග ලබා දී තිබුණි. නිපුණතා අභිෂේක වැඩසටහන සඳහා මිළට ගත් රු. මිලියන 1.46 ක්වූ පුහුණු උපකරණ භාවිතා කර නොතිබුණු අතර, රු. මිලියන 8.90 ක්වූ පුහුණු උපකරණ අස්ථානගත වී තිබුණි. එසේම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව ටෙන්ඩර් කැඳවීමකින් තොරව අවස්ථා 07 කදී රු. මිලියන 44.81 ක් වටිනා භාණ්ඩ හා සේවා ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

## තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

අභියෝගාත්මකව ලෝක වෙළඳ අවශ්‍යතා හා සමාජ ආර්ථික අරමුණු ඉටුවන කාර්යක්ෂම ඵලදායී ගුණාත්මක භාවය සහතික කළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කර පවත්වාගෙන යාමට කටයුතු කරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව රාජ්‍ය අංශයේ ආයතන 03 කට පෞද්ගලික අංශයේ ආයතන 06 කට හා පීඩාවට පත් වූ තරුණ තරුණියන්ට පාඨමාලා පවත්වාගෙන යන ආයතනයකට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4.34 ක මුදලක් මූල්‍යාධාර ලෙස ලබා දී ඇතත්, එම ආයතන ගිවිසුම් ප්‍රකාරව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකය නිකුත් කිරීමට අදාලව පාඨමාලා

ප්‍රතිතනය කරගෙන නොතිබුණි. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු කිරීම් අංශය සම්බන්ධයෙන් සිදු කරනු ලබන සමීක්ෂණ 02 සඳහා රු. මිලියන 3.30 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඒවා නිම කර නොතිබුණි.

## වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

2008 අංක 31 දරන පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මඟින් මධ්‍යම මට්ටමේ වෘත්තීන් සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය ලබාදී ඇති අයට උසස් අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීම සඳහා අවස්ථාව සලසා දීම සිදු කරනු ලබයි. දැනට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පද්ධතියේ හත්වන මට්ටම, එනම් තාක්ෂණික උපාධිය විශ්වවිද්‍යාලය මගින් හඳුන්වාදී ඇත. දිවයින පුරා විහිදී ඇති තාක්ෂණ විද්‍යාලයන්හි හෝ අනෙකුත් වෘත්තීය පාඨමාලා පවත්වනු ලබන ආයතනයන්හි NVQ මට්ටමේ 5 හෝ 6 සමත්වූවන් මෙන්ම මධ්‍යම මට්ටමේ කාර්මික ශිල්පීන් බිහිකරන NVQ නොවන පාඨමාලා හැදෑරූ ඩිප්ලෝමාධාරීන් විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් වශයෙන් බඳවාගැනීමට සුදුසුකම් ලබයි. වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය 2010/2013 උපාධි වර්ෂය වෙනුවෙන් බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 222 කි. මෙම සිසුන් සඳහා උපාධි ප්‍රදානෝත්සවය 2014 දෙසැම්බර් 22 දින පවත්වන ලදී. මෙහිදී උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස සියයට 43 කි.

2013 අගෝස්තු 02 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 හි 01.02 (III) ඡේදයට අනුව, සුදුසුකම් ලබන තනතුරකට හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වැටුප් ක්‍රමයකට පෞද්ගලික වනසේ හෝ අධිසේවක පදනම මත පත්කර වැටුපක් ලබාදී ඇති හෝ නිලධාරීන්ට සහන මෝටර් රථ බලපත්‍ර සඳහා හිමිකමක් නොමැති බව දක්වා ඇතත් 'දරන්නාට පෞද්ගලික වනසේ' පත්වීම් ලබාදී ඇති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අටදෙනෙකු සඳහා සහනදායී මෝටර් බලපත්‍ර ලබාදීමට අමාත්‍යාංශ ලේකම්වරයා අවිධිමත් ලෙස කටයුතු කර තිබුණි. එසේම එම චක්‍රලේඛ නියමයන්ට පටහැනිව ප්‍රදානය කරන ලද සහනදායි මෝටර් රථ බලපත්‍ර වෙනුවෙන්, රජයෙන් දෙන ලද රු. මිලියන 32.93 ක බදු නිදහස් දීමනාව නැවත රජය වෙත ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

# ආපදා කළමනාකරණය

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නාවූ ආපදා වලින් ඇතිවන අහිතකර බලපෑම් ඵලදායී ලෙස වැලැක්වීම සහ අවම කිරීම තුළින් විධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් යුතුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ කටයුතු සිදුකරනු ලැබේ. මේ කාර්යය සඳහා අමාත්‍යාංශය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැඟිලි හා පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන ක්‍රියාත්මක වේ. 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මඟින් පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 836 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 1,894 ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණි. උක්ත ආයතන සම්බන්ධ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවල ඇතුළත්වූ කරුණු සාරාංශ කර පහත දැක්වේ.

- අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, 1993 සැප්තැම්බර් 29 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණයක් මත පිහිටුවා තිබුණු අතර එය දිවයිනේ ස්වාභාවික විපත් අවදානම් කලාප තුළ සිදුකරනු ලබන ගොඩනැඟිලි හා වෙනත් ඉදිකිරීම් සම්බන්ධ නියාමන කටයුතු පිළිබඳ විධිමත් බලයක් සහිත ආයතනයක් වශයෙන් පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ඒ අනුව අවදානම් කලාප තුළ කරනු ලබන විවිධ ඉදිකිරීම් පිළිබඳව සංවිධානය විසින් නිකුත් කරනු ලබන නියෝගවල වලංගු භාවය ප්‍රශ්නකාරී විය.

- 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වන වගන්තිය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා තිබුණු අතර ආපදා කළමනාකරණ කටයුතු වඩා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානයට තිබෙන බලතල විධිමත් කිරීමේ අරමුණින් මෙම පනත සංශෝධනය කිරීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. අදාල සංශෝධන සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට 2014 ජූනි 16 දින ඉදිරිපත් කර තිබුණු නමුත් සංශෝධිත කෙටුම්පත් පනත 2015 අගෝස්තු 31 දින වන තෙක් ලැබී නොතිබුණි.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2009 වර්ෂයේදී රු.මිලියන 72.47 ක් වටිනා උපකරණ සහිත තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානයක් පාදුක්ක ප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු නමුත් එම මධ්‍යස්ථානය 2011 වර්ෂයේ සිට 2015 අගෝස්තු 31 දින වන තෙක් ක්‍රියාත්මක නොවූ බව නිරීක්ෂණය විය.

- ඉදිරිපත් කරනු ලබන කාලගුණ අනාවැකි පිළිබඳ නිරවද්‍යතාව සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් විවේචනයට ලක්ව තිබුණු නමුත් 2008 වර්ෂයේදී ලෝක කාලගුණ මධ්‍යස්ථානයේ උපදේශකත්වයෙන් රු.මිලියන 360 ක වියදමක් දරා දෙනියාය ප්‍රදේශයේ පිහිටුවා තිබුණු ඩොප්ලර් රේඩාර් පද්ධතිය 2015 අගෝස්තු 31 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් කාලගුණික තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රියාත්මක කර නොතිබුණි.
- ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත 2014 වර්ෂය තුළදී ස්වාභාවික ආපදාවන්ට ඔරොත්තුදෙන ආකාරයේ නිවාස 139 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 60.15 ක ප්‍රතිපාදන සළසාදී තිබුණු නමුත් වර්ෂය අවසානය වන විට යාපනය දිස්ත්‍රික්කයේ නිවාස 6 ක කටයුතු පමණක් නිමකර තිබුණි.

# ආර්ථික සංවර්ධනය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් වන දිළිඳුකම පිටුදැකීම, සංචාරක ප්‍රවර්ධනය හා ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීමත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා විමධ්‍යගත අයවැය ක්‍රියාත්මක කිරීමත් සඳහා 2014 වර්ෂයට රු.මිලියන 85,879 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 85,705 ක් උපයෝජනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවන ලෙස අමාත්‍යාංශයේ අංක 01 වැඩසටහනේ රු.මිලියන 29 ක් වූ මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම් අංක 02 වැඩසටහනේ මූලධන වියදම් සඳහා මාරුකර තිබුණු අතර විදේශාධාර මුදල් විස්තර සහ ඍජු විදේශාධාර මුදල් විස්තර සඳහා සලසන ලද ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,620 ක් ඒකාබද්ධ අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ගමනැගුම වැඩසටහන සඳහා මාරුකර තිබුණි. එසේම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන ප්‍රතිපාදන රු.මිලියන 9 ක් ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් අත්පත්කර ගැනීම සඳහා වැයකර තිබුණි.

- සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට සහ වෙනත් අමාත්‍යාංශවලට ලබා දෙන ලද ප්‍රතිපාදනවලින් 2014 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් රු.මිලියන 247 ක් වටිනා චෙක්පත් 9,548 ක් ලියා තිබුණු නමුත් එම චෙක්පත් ආදායකයන් වෙතට නිකුත් කර නොතිබුණි. එසේ වුවත් එම වටිනාකම් වර්ෂයට අදාල ගෙවීම් ලෙස අමාත්‍යාංශ විසර්ජන ගිණුමේ සටහන් කර තිබුණි.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සහ ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයට අදාලව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ණය කළමනාකරණ අංශය විසින් දරන ලද වියදම් පිළිවෙලින් රු.මිලියන14 ක් සහ රු.මිලියන 24 ක් " 2014 වර්ෂයේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්හි ඉතිරි ප්‍රතිපාදන නොමැතිවීම නිසා" යැයි සඳහන් කරමින් 2014 වර්ෂයේදී ගිණුම් ගත කර නොතිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුලදී ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 119 ක් සහ ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 380 ක් වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ වෙනත් වැය විෂයයන්වලට මාරුකර තිබුණි.

- අමාත්‍යාංශය යටතේ ඇති විදේශාධාර ව්‍යාපෘති තුනකට පමණක් අදාලව සිදුකරන ලද පරීක්ෂාවේදී රාජකාරී ආවරණය කිරීමේ පදනම මත ව්‍යාපෘති රාජකාරී කරන නිලධාරීන් විසින් සියයට 5 සහ සියයට 15 බැගින් වූ විශේෂ දීමනාව නිත්‍ය තනතුරට අදාල වැටුප සමග සහ ව්‍යාපෘති දීමනා සමග වශයෙන් අවස්ථා දෙකකදී ලබාගෙන තිබුණු අතර 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ව්‍යාපෘති තුනකට අදාලව වැඩිපුර ලබාගෙන ඇති දීමනාව රු.මිලියන 3 ක් විය.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයට අනුයුක්ත කළ නිලධාරීන් දෙදෙනෙකු එම අංශයේ සේවය නොකර මහජන නියෝජිතයෙකුට සේවය සපයා 2010 – 2014 කාල පරිච්ඡේදය තුළදී රු.මිලියන 1 ක් වැටුප් වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබාගෙන තිබුණි.

- විදේශාධාර ව්‍යාපෘතියක් වන ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ පාලම් 210 ක් විවෘත කිරීම හා නව පාලම් 1,000 ක් ගොඩනැගීමේ වැඩ ආරම්භ කිරීම පිළිබඳව දේශීය පුවත්පත් 09 ක සම්පූර්ණ පිටුවක් මත දැන්වීම් පළකිරීම සඳහා රු.මිලියන 3 ක් වැය කර තිබුණි. නමුත් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස්වලට පටහැනිව එවකට ජනාධිපතිවරණ අපේක්ෂකයෙකුගේ ඡායාරූපයක් ඇතුලත් කර මෙම දැන්වීම් පලකර තිබුණු අතර ප්‍රගති වාර්තා අනුව මෙම පාලම් 210 න් බොහොමයක වැඩ අවසන් වී නොතිබුණු අතර පාලම් 1,000 සඳහා මූලික ගිවිසුම්ද අත්සන් කර නොතිබුණි.

- මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛවලට පටහැනිව අවස්ථා 8 කදී ජනාධිපතිවරණ අපේක්ෂකයකුගේ ප්‍රවර්ධනයට හේතුවිය හැකි කාර්යයන් සඳහා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.බිලියන 3 ක් වටිනා විවිධ භාණ්ඩ වර්ග බෙදාහැරීම, සහනාධාර ණය ආධාර ලබාදීම හා එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි.

## දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම

- 2013 අංක 01 දරන දිවිනැගුම පනත ප්‍රකාරව අංක 1843/4 සහ 2014 ජනවාරි 03 දිනැති ගැසට් නිවේදනය මඟින් 2014 ජනවාරි 03 දින සිට බලාත්මක වන පරිදි සමෘද්ධි අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතන තුන ඒකාබද්ධ කර දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබුණි. එසේ වුවත්, 2013 වර්ෂයට අදාලව එම අධිකාරි තුන ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවලින් පසුව කිසිදු මූල්‍ය ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවලට අනුව 2014 වර්ෂය සඳහා එම එක් එක් ආයතනයේ වියදම පිළිවෙලින් රු.මිලියන 9,501 ක්, රු.මිලියන134 ක් සහ රු.මිලියන 45 ක් විය.

- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේදී ඒකාබද්ධ කළ ආයතනවල 2013 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම්වල වටිනාකම පිළිවෙලින් රු.මිලියන 24,232 ක්, රු.මිලියන 283 ක් හා රු.මිලියන 65 ක් වශයෙන් එකතුව රු.මිලියන 24,582ක් වූ අතර 2014 ජනවාරි 03 දිනට නව දෙපාර්තමේන්තුව වෙත මෙම වත්කම් පවරා ගැනීමේ තත්වය විගණනය වෙත වාර්තා කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනද පවත්වා නොතිබුණි.

- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමේදී ඒකාබද්ධ කළ ආයතන තුනෙහි සේවයේ නියුක්තව සිට ස්ව කැමැත්තෙන් සේවයෙන් ඉවත්වූ නිලධාරීන් 1237 දෙනෙකුට 2014 දෙසැම්බර් 31 දින වන විට වන්දි හා පාරිතෝෂික මුදල් වශයෙන් රු.මිලියන 1,328 ක් එම දිස්ත්‍රික්කයන්හී දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිවල අරමුදල් උපයෝගී කරගෙන ගෙවා තිබුණද 2015 මැයි වන විටද එම මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණි. එසේම, මෙම ගෙවීම් සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු

සමිති සතු ස්ථාවර තැන්පතු උපයෝගී කර ගැනීම නිසා එම බැංකුවලට පොලී මුදල් අහිමි වීමක්ද සිදු වී තිබුණි.

- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවූ නියඟයෙන් විපතට පත් ජනතාවට ජල බහාලන බඳුන් ලබාදීම සඳහා රු.මිලියන106 ක් වැයකර තිබුණි.

  – වැය කරන ලද මුදලින් රු.මිලියන 56 ක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ "ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්" වෙනුවෙන් ලබාදෙන ලද මූලධන ප්‍රතිපාදනවලින්, අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණි.

  – රු.මිලියන 90 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත මෙම මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන යෝජනාව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් නොකර අදාල අනුමැතීන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන්ම ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

  – විගණනය වෙත ලද තොරතුරු අනුව මිලදී ගත් ජල භාජන 224,694 ක් සඳහා ගෙවා තිබුණ මුදල රු.මිලියන 105 ක් වූ අතර මෙයින් දල වශයෙන් රු.මිලියන 13 ක් වූ ජල භාජන 25,894 ක් නියමිත දිස්ත්‍රික්ක වෙත ලැබුණු බවට තහවුරු කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. බෙදා හරින ලද ජල භාජන අදාල දිස්ත්‍රික්ක වෙත ප්‍රවාහනය කිරීම සඳහා මිලගණන් කැඳවීමකින් තොරව ප්‍රවාහන ආයතන දෙකක් තෝරාගෙන එම ආයතන වෙත රු.මිලියන 1 ක් ගෙවා තිබුණි.

- දිවයිනේ සියළුම ත්‍රී රෝද රථ රියදුරන් සඳහා ජීවිත රක්ෂණ හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීමට 2014 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 2 ක් වැයකර ආකෘති පත්‍ර මිලියන 1 ක් දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක වෙත දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් බෙදාහැර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව කිසිදු ක්‍රමවේදයක් හා සැලැස්මක් සකස් කර නොතිබුණි. 2015 අගෝස්තු 31 දින දක්වා දිස්ත්‍රික් කාර්යාලවලින් තොරතුරු ගෙන්වාගෙන නොතිබුණු අතර ඒ පිළිබඳව පසු විපරම් කටයුතුද සිදුකර නොතිබුණු අතර දරන ලද සියළු වියදම් නිෂ්ඵල වියදම් බවට පත්වී තිබුණි.

- සමෘද්ධි ප්‍රතිලාභින්ගේ සහනාධාර මුදල් වැඩිකිරීම හා තවදුරටත් සහනාධාර ලබාදිය යුතු පවුල් හඳුනා ගැනීම සඳහා වූ සමීක්ෂණයට අදාලව ආකෘති පත්‍ර මිලියන 2 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 8 ක් වැයකර තිබුණද මෙම සමීක්ෂණය මඟින් හඳුනාගත් නව ප්‍රතිලාභීන් පිළිබඳ සවිස්තර තොරතුරු 2015 මැයි වන විටත් දෙපාර්තමේන්තුව රැස්කර නොතිබුණු අතර ඒ වන විට මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි.

  – මෙම වැඩසටහන 2014 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් මගින් අනුමත වී නොතිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අයවැය ලේඛනය මඟින් නිශ්චිත මූල්‍ය ප්‍රතිපාදන සලසා

නොතිබුණි. එසේ වුවත් ආකෘතිපත්‍ර මුද්‍රණය සඳහා ප්‍රසම්පාදන ලියවිලි නිකුත් කිරීම ඇතුළු ප්‍රසම්පාදනයට අදාල සියළුම කටයුතු එක් දිනක් තුළ ඉටුකර තිබුණි.

– පිරිවැය රු.907,680 ක් වූ ආකෘති පත්‍ර 312,993 ක් බෙදා හැරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවති අතර දිස්ත්‍රික් කාර්යාලවලට නිකුත් කර තිබුණු ආකෘති පත්‍ර භාවිතා නොකර ආපසු දෙපාර්තමේන්තුවේ ගබඩාවට එවා තිබුණු අවස්ථා ද නිරීක්ෂණය විය.

- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සිදුකරන ලද ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

  – ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ "ග්‍රාමීය පාලම් 1210 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" යනුවෙන් සකස් කරන ලද රූපවාහිනී ප්‍රචාරක වැඩසටහන් දෙකක් සඳහා රු.මිලියන 5 ක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි අදාල මාධ්‍ය ආයතන වෙත ගෙවා තිබුණි.

  – ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත සකස්කළ බවට සාවද්‍ය ලෙස සඳහන් කරමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිසි අනුමැතියකින් තොරව, තත්පර 30 ක රූපවාහිනී කෙටි දැන්වීම් 3 ක් සඳහා නිෂ්පාදන ආයතනයකට රු.707,625 ක් ගෙවා තිබුණු අතර මෙම වැඩසටහන් 2015 මැයි වන විටත් ප්‍රචාරය කර නොතිබුණි.

  – ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත එවකට සිටි ජනාධිපතිවරයාගේ ඡායාරූපයක් සහිතව පුවත්පත් 7 ක පලකර තිබූ දැන්වීම් සඳහා රු.මිලියන 36 ක් නිරවුල් කිරීම සඳහා දෙපාර්තමේන්තුව බැඳීම් ඇතිකර ගෙන තිබුණි.

- 2014 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාකාරී සැලැස්මක් මගින් අනුමත වී නොතිබුණු, දිවිනැගුම සහනාධාර ලාභීන්ගේ නිවාස සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් වශයෙන් ක්‍රියාත්මක කර තිබුණු "ඉසුරුමත් නිවහනක් " වැඩසටහන යටතේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම්වල අරමුදල් උපයෝගී කරගෙන සහනාධාරලාභී පවුල් 1,197,111 ක් වෙත එක් පවුලකට රු.2,500 බැගින් රු.මිලියන 2,992 ක් 2014 දෙසැම්බර් මාසයේදී ගෙවා තිබුණි. නිශ්චිත ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට පමණක් අදාලවන මෙම වැඩසටහන පිළිබඳව දිවයිනේ සමස්ථ ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරණ දැන්වීම් වෙනුවෙන් රු.997,476 ක් වැයකර තිබුණි. ඊට අමතරව මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයට පටහැනිව එක් ජනාධිපතිවරණ අපේක්ෂකයෙකුගේ ඡායරූපය ඇතුළත් දැන්වීම් මුද්‍රිත මාධ්‍යවල පලකර තිබුණි. 2015 මාර්තු වන විටත් වැඩසටහනේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණු අතර රු.බිලියන 3 කට ආසන්න මුදලක් වැයකර තිබුණු මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුණි.

- සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයාගේ අංක 96/3 හා 1996 දෙසැම්බර් 06 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආරක්ෂණය අරමුණු කර ගෙන ප්‍රතිලාභීන් වෙත රජයෙන් දෙනු ලබන සහනාධාරවල අවකරණය කිරීම් මගින් සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවා භාරකාර මණ්ඩලයක පාලනය යටතේ භාරයක් වශයෙන් පවත්වාගෙන යමින් පවතින අතර 2013

දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ රු. මිලියන 7,586 ක ශේෂයක් පැවති අතර එදිනට පැවති ආයෝජනවල වටිනාකම රු. මිලියන 6,795 ක් විය .

- මෙම අරමුදල රාජ්‍ය විගණනයෙන් ආවරණය වීමේ උචිතභාවයක් පවතින බැවින් අරමුදල විගණනය කිරීමට විගණකාධිපතිවරයාට ව්‍යවස්ථාපිත හිමිකමත් ලැබෙන ආකාරයට පාර්ලිමේන්තුවේ නියමයන් ලබාදීමට අවශ්‍ය විධිවිධාන සලස්වන මෙන් විගණකාධිපතිවරයා විසින් 2004 මැයි 14 සහ 2014 ඔක්තෝබර් 15 දිනැති ලිපි මගින් අදාල අමාත්‍යාංශ ලේකම්වරයා හා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර තිබුණි. මීට අමතරව 2007 අගෝස්තු 07 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා නියෝග අනුව ද අරමුදල සඳහා පනතක් නොමැති බැවින් විගණකාධිපතිවරයාට විගණනය කිරීමේ හැකියාවක් නොමැති හෙයින් පනතක් සම්මත කිරීමට ඉක්මන් පියවර ගන්නා ලෙස නියෝග කර තිබුණි. එසේ වුවත් මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීමට මේ වන තෙක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

- දිවි නැගුම ප්‍රජා මූල බැංකු 1,074 ක් දිවයින පුරා ස්ථාපිත කර ඇති අතර, දිවි නැගුම සහනාධාරලාභීන් සඳහා රජයෙන් ලබාදෙන සහනාධාර, ප්‍රතිලාභීන්ගේ නමින් පවතින ඉතුරුම් ගිණුම් මාර්ගයෙන් බෙදාහැරීමට කටයුතු යොදා ඇත. මීට අමතරව අඩු ආදායම්ලාභීන්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටුකිරීම මෙම බැංකුවල ප්‍රධාන කාර්යයක් වන අතර 2014 දෙසැම්බර් 31 දින වන විට මෙම බැංකු සතුව පැවති සමස්ථ තැන්පතු වටිනාකම රු. මිලියන 48,042 ක් ද රු. මිලියන 48,405 ක ආයෝජන ඇතුලු මුළු වත්කම් ප්‍රමාණය රු. මිලියන 83,200 ක් ද විය. සියළුම ප්‍රජා මූල බැංකු කටයුතු මෙහෙයවීම දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රජා මූල බැංකු අංශය මගින් සිදු කරන නමුත් මෙම ප්‍රජා මූල බැංකු, ප්‍රජා මූල බැංකු සමිති හා ප්‍රජා මූල බැංකු අංශයේ 2014 වර්ෂය අවසානයට පැවති තත්ත්වයන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා හෝ ගිණුම් මගින් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කර නොතිබුණි.

- පළාත් පාලන ආයතනවල ඉල්ලීමකින් තොරව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවන කාර්යයක් වූ පළාත් පාලන ආයතන 58 ක් සඳහා කොඩි කණු සඳහා භාවිතා කිරීම පිණිස පිරිවැය රු.මිලියන 36 ක් වූ ගැල්වනයිස් බට 32,976 ක් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මස මිලදී ගෙන බෙදාහැර තිබුණි. එයින් බට 28,310 ක් තොග පොත්වල ඇතුළත් කර නොතිබුණි. ආයතන 17 කට ලබාදී තිබුණු බට 5,398 ක් දෙපාර්තමේන්තු අවසරයකින් තොරව වෙනත් පළාත් පාලන ආයතන 30 කට බෙදාහැර තිබුණු අතර ආයතන 33 කට ලබාදී තිබුණු බට 9,195 ක් එම ආයතනවල සභාපති, උප සභාපති, හෝ සභිකයින් වෙත නිදහස් කර තිබුණි. ආයතන 11 කට ලබාදී තිබුණු බට 2,734 ක් දෙපාර්තමේන්තු අවසරයකින් තොරව බාහිර පාර්ශවයන්ට නිකුත් කර තිබුණි.

- දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය වෙනුවෙන් දිවිනැගුම ප්‍රතිලාභී පවුල්වලට බෙදාදීම සඳහා දිවිනැගුම ලිත් 5,000,000 ක් මුද්‍රණය කරවා ගැනීම වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසයේදී රු.මිලියන 29 ක් ගෙවා තිබුණි.

- පූර්ව සැලසුමකින් තොරව දින 12 ක් වැනි කෙටි කාලයක් තුළ අවස්ථා 04 කදී ලිත් ප්‍රමාණය කොටස් වශයෙන් මුද්‍රණය කරවා ගැනීම නිසා සම්පූර්ණ තොගය එකවර ඇණවුම් කිරීමෙන් රජයට ලබාගත හැකිව තිබූ මිල වාසිය අහිමි කරගෙන තිබුණි.

- 2014 දෙසැම්බර් 31 දින වන විට දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභී මුළු පවුල් ගණන 1,479,811 ක් වුවද, ලිත් 5,000,000 ක් මුද්‍රණය කර තිබූ අතර එය ප්‍රතිලාභී පවුල් ප්‍රමාණයට වඩා සියයට 338 ක වැඩි වීමකි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන ලෙස රු.මිලියන 29 ක් වටිනා උක්ත ප්‍රසම්පාදන කාර්යය දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි.

- මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයට පටහැනිව ජනාධිපතිවරණයට තරඟ කරන එක් අපේක්ෂකයකුගේ ඡායාරූපයක් සහිතව අදාල ලිත් මුද්‍රණය කර බෙදා හැර තිබුණි.

# ක්‍රීඩා

2014 වර්ෂය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය සඳහා සළසන ලද ප්‍රතිපාදන උපයෝජනය සහ ප්‍රධාන ක්‍රීඩා සංගම්වල මූල්‍ය ප්‍රකාශන සහ මුදල් ගනුදෙනු පිළිබඳ විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අක්‍රමිකතා අනාවරණය විය.

## ක්‍රීඩා අමාත්‍යාංශය

ක්‍රීඩා සමාජ අතර බෙදාහැරීම සඳහා බවට සඳහන් කර රු. මිලියන 39 ක් වටිනා කැරම් බෝඩ් සහ දාම් බෝඩ් ඇනවුම් කර භාරගත් බවට ලේඛන වලට ගබඩා භාරකරු අත්සන් කර තිබුණද එම කැරම් බෝඩ් සහ දාම් බෝඩ් අමාත්‍යාංශයට ලැබී නොතිබූ අතර ක්‍රීඩා සමාජ වලට බෙදාහැරීමක්ද සිදුකර නොතිබුණි.

## ක්‍රීඩා අරමුදල

අරලියගහ මන්දිරයේ පැවති ක්‍රීඩා භාණ්ඩ කට්ටල 2,500 ක් බෙදාදීමේ වැඩසටහනකට සහභාගීවූ ක්‍රීඩා සමාජ සමාජිකයින්ගේ ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් රු.මිලියන 1.6 ක් ගෙවා තිබුණි. එහෙත් ක්‍රීඩා භාණ්ඩ කට්ටල 10 ක් පමණක් එහිදී බෙදාහැර තිබුණි.

## ක්‍රිඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

- XL වන ජාතික මහ ක්‍රීඩා උළෙලේ කාර්යය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් ද ක්‍රීඩා උළෙලට සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා නිලධාරීන්ට බෙදා දීම සඳහා ගමන් මලු සහ ටී ෂර්ට්ස් 3500 ක් බැගින් ද ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා ද රු.මිලියන 21 ක් ප්‍රසම්පාදනය පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව වැය කර තිබුණි.

- ටෙන්ඩර් ක්‍රියාපටිපාටියෙන් බැහැරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 13.81 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

- රු.මිලියන 126.8 ක වියදමින් ඉදිකරන ලද සුගතදාස ක්‍රීඩා සංකීර්ණය කෘතිම ධාවන පථය ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම හේතුවෙන් සහ වර්ෂාකාලයේ ඉදිකිරීම ගැලවී ගොස් තිබුණි.

- 2009 වර්ෂයේ සිට මුදල් අයකැමිගේ රාජකාරී ආවරණය සඳහා අනුයුක්ත කළ ආරක්ෂක නියාමකයකු විසින් රු.මිලියන 0.8 ක මූල්‍ය අක්‍රමිකතාවක් සිදුකර තිබුණි.

- ක්‍රීඩා හෝටලයේ කාමර 42 හි දෛනික කාමර දින 15,330 ක පහසුකම් පැවතියද වර්ෂය තුල උපයෝජනය වී තිබුණේ එයින් සියයට 27 ක් පමණි. තවද හෝටලයේ කාමර 3 ක් වර්ෂයක

පමණ කාලයක සිට වසා දමා තිබුණු අතර බිම් මහලේ පිහිටි බීම හල වර්ෂ 8 ක පමණ කාලයක් වසා දමා තිබුණි.

## ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය

- ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ කළමනාකරණ මණ්ඩලයේ හිටපු සභාපතිවරයා විසින්, සම්මේලනයට ලැබී තිබූ පරිත්‍යාගවලින් එක්සත් ජනපද ඩොලර් 100,000 ක්, යුරෝ 40,400 ක් හා රු. මිලියන 5 ක් වංචා සහගත ලෙස ලබාගෙන තිබුණි.

- හිටපු ප්‍රධාන විධායක නිළධාරිවරයා විසින් 2008 ජුනි 06 දින සම්මේලනයේ බැංකු ගිණුමෙන් ඉවත් කරගෙන තිබූ ඇ.ඩොලර් 30,000 ක මුදලින් ඇ.ඩොලර් 12,533 ක් 2015 ජනවාරි 19 දිනවන විටත් සම්මේලනයට ආපසු බාරදී නොතිබුණි.

- තවද විධායක කමිටු අනුමැතියකින් තොරව හා සම්මේලනයේ බැංකු ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් තිබියදී, සම්මේලනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරිවරයා 2008 ජුනි 20 දින, හිටපු කළමණාකරන කමිටු සභාපතිවරයාගෙන් ලබාගත් රු.මිලියන 6 ණය මුදලක් පියවීම සඳහා ඇ.ඩොලර් 60,000 ක් සම්මේලනයේ බැංකු ගිණුමෙන් හිටපු කළමණාකරන කමිටු සභාපතිවරයාගේ පුද්ගලික ගිණුමට ව්‍යාජ බැංකු නියෝගයක් මගින් මාරු කර තිබුණි.

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

- ශ්‍රී ලංකා ක්‍රිකට් පසුගිය වර්ෂ කිහිපය තුලදී විශාල මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබුණු අතර, 2014 වර්ෂයේදී රු. මිලියන 392.7ක ශුද්ධ මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබීම හා රු.මිලියන 4,303.5 ක වගකීම් පියවාගැනීමට ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් නොමැතිව තිබියදී 2013 වර්ෂයේදී වැටුප් වර්ධක වෙනුවෙන් රු. මිලියන 26.7 ක් ණයකර තිබුණි. තවද හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා අයවැය ප්‍රතිපාදන නොමැතිව වාහන 11 ක් මිලදී ගැනීමට රු. මිලියන 57.6 ක් වැයකර තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එක්දින තරග 13 ක් හා ජාත්‍යන්තර ටෙස්ට් තරග 04 ක් වෙනුවෙන් විධායක කමිටු අනුමැතියකින් තොරව රු.මිලියන 45.1 ක් වටිනා ටිකට්පත් 46,742 ක් නොමිලේ නිකුත්කර තිබුණු අතර නොමිලේ නිකුත්කර තිබූ ටිකට්පත් ලබාගත් පාර්ශ්වයන්ගෙන් සියයට 85 ක් ඒවා ලබාගත් බවට තහවුරු කර නොතිබුණි.

- ශ්‍රී ලංකා ප්‍රීමියර් ලීග් (එස්එල්පීඑල්) - 2012 වෙනුවෙන් පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.මිලියන 11.4 ක් වීධායක කමිටු අනුමැතියක් නොමැතිව බොල්ණය ලෙස කපාහැර තිබුණි.

# සංචාරක

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන 2011 – 2016 පස් අවුරුදු සැලැස්ම මඟින් සංචාරක ව්‍යාපාරයට ප්‍රමුඛතාවය දී ඇති අතර එක්සත් ජනපද ඩොලර් බිලියන 2.75 කට වැඩි ආදායමක් හා 500,000 වැඩි සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය සංචාර කර්මාන්තයේ 2016 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කය ලෙස සඳහන් කර තිබුණි.

අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වය නිමවීමෙන් පසුව ඇති වූ වර්ධන ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් 2014 වර්ෂයේ දී සංචාරක කර්මාන්තය යහපත් ක්‍රියාකාරීත්වයක් පෙන් වූ අතර, සංචාරක පැමිණීම මිලියන 1.5 ක් වූ වාර්ෂික ඉලක්කය ඉක්ම විය. සංචාරක ව්‍යාපාරය සඳහා වූ ආකර්ෂණයකින් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය මගින් සිදු කරන ලද ප්‍රවර්ධන වැඩ සටහන් මෙම සංචාරක පැමිණීම ඉහළ යාමට හේතු වී තිබුණි.

පෙර වර්ෂයේදී මෙන්ම 2014 වර්ෂයේ දී ද ප්‍රධාන කලාප සියල්ලකින්ම සංචාරක පැමිණීම වර්ධනය විය. ඒ අනුව නැගෙනහිර ආසියාව සියයට 53.2 ක්ද, නැගෙනහිර යුරෝපය සියයට 22.6 ක්ද, බටහිර යුරෝපයෙන් සියයට 13.8 ක් හා දකුණු ආසියාවෙන් සියයට 13.4 ක් වශයෙන් ප්‍රමාණාත්මක වැඩිවීමක් දක්නට ලැබුණි. එමෙන්ම රටක් වශයෙන් වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණ තිබුණේ පෙර වර්ෂයේ මෙන් ඉන්දියාවෙනි. එම ප්‍රමාණය 242,734 කි. ඊළඟට වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණ ඇත්තේ එක්සත් රාජධානියෙන්ය. එම ප්‍රමාණය 144,168 ක් ලෙස වාර්තා වී තිබුණි. මෙම වර්ෂය දී ආකර්ෂණීයම පැමිණීම වැඩි වී තිබූ මහජන චීන සමූහ ආණ්ඩුවෙනි. එම ප්‍රමාණය 128,166 ක් වූ අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 136.1 වැඩි වීමකි.

සංචාරක කර්මාන්තයෙන් ඉහල විදේශ විනිමය ඉපැයීමක් බලාපොරොත්තු වූ අතර 2014 වර්ෂයේ දී මෙම කර්මාන්තයෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 2,431 ක ආදායමක් උපයා තිබුණි. එම ප්‍රමාණය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 41.7 ක කැපී පෙනෙන වර්ධනයක් විය. විදේශීය සංචාරක පැමිණීම ඉහළ යාම මෙන්ම සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන ඉහල යාම සංචාරක ඉපැයුම් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. 2014 වර්ෂයේදී සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 160.8 ක් වූ අතර එම ප්‍රමාණය 2013 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 156.5 ක් විය. එමෙන්ම සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන 2014 වර්ෂයේදී දින 9.9 ක් වූ අතර එය පෙර වර්ෂය දි දින 8.6 ක් විය. එහෙත් සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් අපගේ ආසන්නම තරඟකාරී රට වන මාලදිවයින තුළ සංචාරකයකු වැයකරන මුදල වූ ඇ.ජ.ඩොලර් 2208 වූ අතර එම ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 1592 ක් විය.මෙම සංඛ්‍යාවන් සැසඳීමේදී, අප රට තුළ සංචාරකයන් කරනු ලබන වැය දැරීම් වල ඵලදායීත්වය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකාව ලෝකයේ හොඳම ගමනාන්තයක් වශයෙන් චීනයේ "Travel & Leisure " සඟරාව හඳුන්වා දී තිබුණු අතර 2015 වර්ෂයේ දි සංචාරය කිරීමට ලෝකයේ සුවදායක රටවල් 10 අතරින් එකක් ලෙස ශ්‍රී ලංකාව " Forbes " සඟරාව නම්කර තිබුණි. සංචාරකයන්ගේ පැමිණීම ප්‍රවර්ධනය වෙනුවෙන් 2014 වර්ෂය තුළ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය රු.මිලියන 1950 ක පමණ මුදලක් වැය කර තිබුණි. එසේ වුවත් ඉහත පරිදි බාහිර පරිසර සාධකයන් තුළින් සංචාරක කර්මාන්තයට ලැබී ඇති යහපත් අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා කාර්යාංශය මඟින් උපායමාර්ගික සැලසුම් අනුගමනය

කර නොතිබුණු බව එහි ක්‍රියාකාරී සැලසුම් වල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. 2014 වර්ෂයේදී රු.මිලියන 2,837.4 මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරන ආයතනය හා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය යන ආයතන 04 සඳහා සියයට 14 , සියයට 70, සියයට 12 හා සියයට 4 ක් බැගින් මූල්‍යනය කර තිබුණි. එහෙත් 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත මඟින් මෙම ආයතන 04 ට පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන් වලින්, ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ ලියාපදිංචි නොවී චාරිකා හෝ සංචාරක සේවාවන්හි නිරත වන යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් වරදකට වරදකරු කිරීමට රීති පැනවීම, සංචාරක උපදේශන කමිටු පිහිටු වීම, ශාස්ත්‍රීය කටයුතු භාර මණ්ඩලයේ පිහිටු වීම සහ පනත අනුව උපකාරක කර්මාන්ත හා සේවා සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ඊට සහාය දීම සඳහා ආයතන සහ ව්‍යාපාර පිහිටු වීම යන කටයුතු සිදු කර නොතිබුණි.

සංචාරක පනත යටතේ ස්ථාපිත පහත සඳහන් ආයතන වලට අදාල විගණන නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

- කල්පිටිය තොරෙයිඅඩි ජැටිය ඉදිකිරීමට අදාල කළුගල් කියුබ් 2016 ක් හා බොරළු කියුබ් 40 ක් භෞතිකව භාර ගැනීමකින් තොරව රු. මිලියන 10.19 ක මුදලක් සැපයුම්කරුට ගෙවා තිබුණි.

- බෙන්තොට නිවාඩු නිකේතනයේ පල්දෝරු පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා ශ්‍රම කොන්ත්‍රාත්තුව ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් ශ්‍රම කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා නොගෙන එකම කොන්ත්‍රාත්කරුවෙකුට වර්ෂ කිහිපයක් ශ්‍රම කොන්ත්‍රාත්තුව ලබා දීම නිසා ආයතනයට 2014 වර්ෂය අවසාන වන විට රු. මිලියන 6.89 ක් පාඩු සිදු වී තිබුණි.

- කතරගම නිවාඩු නිකේතනය අළුත්වැඩියා කිරීමට අදාලව කොන්ත්‍රාත්කරුට රු. මිලියන 11.09 ක වැඩිපුර ගෙවීමක් සිදු කර තිබුණි.

- බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ පිහිටි එක්තරා හෝටලයක් අක්‍රීය වූ ජල මනුවකින් මාස 97 ක් වංචා සහගතව ජලය ලබා ගැනීමට අදාල රු.මිලියන 8.4 ක මුදල විගණනයෙන් පෙන්වා දුන් පසු අධිකාරියට ගෙවා තිබුණි.

- පාසිකුඩා සංචාරක නිකේතන භූමියේ වැසිවතුර බැස යාමේ කාණු පද්ධතියට අදාල ඉදි කිරීම් මිනුම් වාර්තා භෞතික විගනනයේ දී රු. මිලියන 3.79 ක වැඩිපුර ගෙවීමක් අනාවරණය විය.

- කල්පිටිය මොහොට්ටුවාරම ජැටිය ඉදි කිරීමට ඩොසර් යන්ත්‍ර වලින් වැඩ කල බවට සඳහන් ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කල කොන්ත්රාත්කරුවෙකුට රු. මිලියන 3.23 ක මුදලක් ගෙවා තිබුණි.

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

- ව්‍යාජ ප්‍රචාරාත්මක වැඩසටහන් නිර්මාණ කොන්ත්‍රාත් එකක් සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට රු. මිලියන 14.5 ක මුදල් අත්තිකාරම් දී පසුව විගණන නිරීක්ෂණ පදනම් කරගෙන මාස 8 කින් එම මුදල ආපසු අයකර තිබුණි.

- 2014 සැප්තැම්බර් 23 සිට ඔක්තෝම්බර් 07 දක්වා රුසියාවේ පවත්වන ලද සංචාරක ප්‍රවර්ධන වැඩසටහන සඳහා ටී ෂර්ට් 12,000 ක් දේශීයව නිෂ්පාදනය කිරීමට රු.7,800,000 ක වැය කර තිබුණි. එහෙත් එම ටී ෂර්ට් රුසියාවේ පැවති සංචාරක ප්‍රවර්ධන වැඩසටහනට යොදා ගෙන නොතිබුණි.

- 2014 සැප්තැම්බර් 27 දිනට යෙදුනු ලෝක සංචාරක දිනය සැමරීමේ වැඩසටහන සඳහා " දිනන උඹව " " එක්සත් ජනතා නිදහස් සන්ධානය " යන්න මුද්‍රිත ටී ෂර්ට් 8000 ක් නිෂ්පාදනයට රු. මිලියන 5.82 ක් වැය කර තිබුණි.

- මුද්‍රණ මාධ්‍යයෙන් හා විද්‍යුත් මාධ්‍යයෙන් සිදු කළ ප්‍රචාරක වැඩසටහන් 2 ක් සඳහා රු. මිලියන 25.29 ක් අදාල කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණු අතර, නිසි ප්‍රමිතියකින් තොරව ඉටු කරන ලද කාර්යයන් සඳහාද රු. මිලියන 2.54 ක ගෙවීමක් සිදු කර තිබුණි.

# නාගරික සංවර්ධනය

2014 වර්ෂයේදී නාගරික සංවර්ධන සම්බන්ධ කාර්ය භාර්යයන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදුකරනු ලැබූ අතර ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන වැඩ සටහන් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ තෙත් බිම් සුරැකීම හා සංවර්ධනය කිරීම පිළිබඳ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ප්‍රධාන ආයතන මගින් ඉටුකරනු ලැබීය. උක්ත ආයතන විසින් සිදුකරනු ලබන නාගරික අලංකරණය, ඇල වේලි සකස් කිරීම හා නඩත්තු කටයුතු සඳහා ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ ශ්‍රම දායකත්වය ලබාගැනීම සමාලෝචිත වර්ෂය තුළදී කැපී පෙනෙන ලක්ෂණයක් විය. කෙසේ වෙතත් මේ හේතුවෙන් අදාල ආයතනවල මෙහෙයුම් වියදම් පහල යායුතු වුවත් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් වියදම් ප්‍රමාණවත් පරිදි පහළ ගොස් නොතිබුණි.

**පහත සඳහන් විගණන නිරීක්ෂණයන් කරනු ලැබේ.**

## නාගරික සංවර්ධන අධිකාරිය

- නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමේ අඛණ්ඩ ප්‍රමාදයක් පැවතිණි. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා 2014 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, එම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2015 ජූලි 02 දිනදීය. එමෙන්ම 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 04 දින ඉදිරිපත් කර තිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ 2013 හා 2014 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ප්‍රමාද වී තිබුණි.

- අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරිපාලිත සමාගම් තුනක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් පරිපාලිත සමාගමක විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගෙන තිබුණි. අධිකාරියේ පරිපාලිත සමාගමක් වන වෝටර්ස් එජ් හෝටල් සමාගමේ පාලනය අධිකරණ නියෝගයක් මත හේතුවෙන් අධිකාරිය වෙත ලැබී තිබුණු අතර ඒ අනුව එහි ආයෝජන වටිනාකම රු.10 ක් වශයෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. පරිපාලිත සමාගමේ වත්කම්වල ප්‍රතිඅගය කළ වටිනාකම රු.මිලියන 1,791 ක් හා පූර්ව අයිතිකරුවන් වෙත ගෙවිය යුතු මුදල රු.මිලියන 403.83 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා තිබුණි.

- කොළඹ නගරයේ පැල්පත් වාසීන්ට ස්ථිර නිවාස 65,000 ක් ඉදිකිරීමේ වැඩ පිළිවෙලට අරමුදල් සපයා ගැනීමේ අරමුණින් අධිකාරිය 2014 ඔක්තෝබර් මාසයේදී රු.බිලියන 10 ක් වූ වර්ෂ 10 කින් නිදහස් කළ යුතු ණයකර නිකුත් කර තිබුණු අතර පළමු වර්ෂ 03 ක කාලය සඳහා ණයකර පොලී මුදල් ගෙවීමට භාණ්ඩාගාරය එකඟවී තිබුණි. මෙම ණයකර 2015 ඔක්තෝබර් මාසයේදී නිදහස් කළ යුතු වුවත් ඒ සඳහා විශේෂිත අරමුදලක් පිහිටුවා හෝ නිදහස් කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

- කොළඹ නගරයේ පැල්පත් වාසීන්ට ස්ථිර නිවාස 65,000 ක් ඉදිකිරීමේ වැඩ පිළිවෙලෙහි පළමු අදියර යටතේ 2013 වර්ෂය අවසාන වන විට පහසුකම් සහිත නිවාස 20,500 ක් ඉදිකිරීමටත් එමඟින් නාගරික ඉඩම් අක්කර 150 ක් මුදවා ගැනීමට සහ එම ඉඩම් බදු පදනමට ලබාදීමෙන් රු.බිලියන 25 ක මුදලක් උපයා ගැනීමටත් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් අධිකාරිය සපයා තිබුණු තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිවාස 500 ක් ජනතා අයිතියට පැවරීමටත් අක්කර 9 ක් මුදවා ගැනීමටත් හැකිවී තිබුණි.

## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව

- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ක්‍රියාත්මක කරන ලද වේරැස් ගඟ ජලය බැසයාමේ හා පරිසර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමට 2013 වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු.මිලියන 14,227 ක ණය මුදලක් ලබාගැනීමට කටයුතු කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට මෙම ණය මුදලින් රු.මිලියන 1,600 ක් උපයෝජනය කර තිබුණි. මේ හේතුවෙන් 2013 වර්ෂය අවසානයට පැවති සංස්ථාවේ ප්‍රාග්ධන ණය අනුපාතය සියයට 18.5 සිට 2014 වර්ෂය අවසාන වන විට සියයට 62.89 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදලින් රු.මිලියන 453 ක් අදාල කාර්යයන් සඳහා භාවිතා නොකර 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.

- සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව විසින් රු.මිලියන 178.1 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති අතුරින් වීරකැටිය අනුස්මරණ කෞතුකාගාරය ඉදිකිරීම්, අනුරාධපුර කුඹිච්චන්කුලම වැව ප්‍රතිසංස්කරණය කිරීම, බෝලවලාන සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම යනාදි ව්‍යාපෘතිවල කටයුතු, ගං වතුර උවදුරු වැළැකීම, තෙත් බිම් සුරැකීම හා සංවර්ධනය සඳහා වූ සංස්ථාවේ අරමුණු වලට අදාල නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය. මීට අමතරව සංස්ථාව විසින් සිය නිලධාරීන් වෙනුවෙන් හා හමුදා සාමාජිකයින් වෙත සමරු තිළිණ පිරිනැමීමට සහ උත්සව පැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 18.9 ක මුදලක් අනාර්ථිකව වැයකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

- සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ අනුව විදේශ සමාගමක් මඟින් මුහුදු වැලි මීටර් කියුබ් 3,756,595 ක් ගොඩදමා තිබුණු අතර ඉන් රු.මිලියන 1,879 ක් වටිනා මුහුදු වැලි මීටර් කියුබ් 2,269,563 ක ප්‍රමාණයක් 2014 දෙසැම්බර් 31 දිනට තොගයේ පැවතුණි.

- 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව ඛනිජ සම්පත් ගවේෂණය, කැනීම, ප්‍රවාහනය, සකස් කිරීම හා වෙළඳාම සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ වලංගු බලපත්‍රයක් ලබාගත යුතු වුවද සංස්ථාව මුහුදු වැලි ගොඩදැමීම සඳහා විධිමත් බලපත්‍රයක් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

# වෙළෙඳ හා වාණිජ

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථ වනුයේ ශ්‍රී ලංකාව තුළ සිමෙන්ති නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම වුවද, සංස්ථාවේ සිමෙන්ති නිෂ්පාදනය වර්ෂ 20 කටත් වැඩි කාලයක් සම්පූර්ණයෙන් නතර වී ඇති අතර රටේ අවශ්‍යතාවයෙන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් දැනට ආනයනය කරනු ලබයි.

සංස්ථාව මෙන්ම සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා සිමෙන්ති සමාගම යන ආයතන දෙකම දැනට සිමෙන්ති ආනයනය කර අළෙවි කිරීම කරනු ලබන අතර මෙම ආයතන දෙකම දිගින් දිගටම අලාභ ලබමින් පවතින අතර, 2014 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාවේ හා සමාගමේ සමුච්චිත අලාභයන් පිළිවෙලින් රු. මිලියන 80.97 ක් හා රු. මිලියන 2,341.85 ක් විය. 2014 වර්ෂය තුළදී සංස්ථාව රු. මිලියන 14.49 ක ඌනතාවයක් ලබා තිබුණු අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ලබා තිබුණු ඌණතාවය රු. මිලියන 424.69 ක් විය. සමාගමේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අලාභය පිළිවෙලින් රු. මිලියන 1.85 ක් හා රු. මිලියන 192.92 ක් විය. ඒ අනුව ආයතනය අඛණ්ඩව පවත්වා ගෙන යෑම පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති වී ඇති බවට නිරීක්ෂණය විය. සංස්ථාවට විශාල ඉඩම් සහ දේපල ප්‍රමාණයකට අයිතිය ඇති අතර ඒවා වත්කම් ලෙස ලේඛන ගත කර නොතිබුණි.

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

2014 මණ්ඩලයේ මුළු විකුණුම් ආදායම රුපියල් මිලියන 881.03 ක් වු අතර එයින් හස්ත කර්මාන්ත නිෂ්පාදකයාට ගෙවා ඇති මුදල ආදායමින් සියයට 33 ක් විය. මණ්ඩලයේ පරිපාලන හා මූල්‍ය වියදම විකුණුම් ආදායමින් සියයට 64.7 ක් විය. ශුද්ධ ලාභය ආදායමින් සියයට 1.7 ක් පමණක් විය. මණ්ඩලය සතු මෙතෙක් ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල උගස් කර රු.මිලියන 698 ක ණය ලබා ගෙන ඇති නමුත් එම ගොඩනැගිල්ල අළුත්වැඩියා කර පාවිච්චියට නොගෙන වෙනත් දීර්ඝ කාලීන හා කෙටිකාලීන බදු මත ලබා ගෙන ඇති ඉඩම් වල ප්‍රදර්ශනාගාර ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉදිකිරීම් කර තිබුණි. ඉහත සඳහන් රු. මිලියන 698 ක ණය වෙනුවෙන් වූ ණය පොලී ගෙවීම සඳහා වර්ෂය තුළ පොලී වශයෙන් රු. මිලියන 80 ක් ගෙවා තිබුණි.

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

2015 දැයට කිරුළ වැඩ සටහනට සමගාමීව පාසල්වල පුස්තකාල අතර බෙදාදීම සඳහා මිලදී ගන්නා ලද රු.683,910 ක් වටිනා පොත් පාසල්වලට බෙදා නොදී ගබඩාවේ ගබඩා කර තිබුණි. එම පොත් බෙදාදීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක්ද 2015 මාර්තු 27 දින වන විටත් ගෙන නොතිබුණි.

සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලියාපදිංචි සීමිත සමාගම් සංඛ්‍යාව 71,110 ක් වූ අතර එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු සීමිත සමාගම් සංඛ්‍යාව 59,113 ක් විය. එසේ වුවද එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ සීමිත සමාගම් සංඛ්‍යාව 14,886 ක් වූයෙන් වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකළ සීමිත

සමාගම් ප්‍රමාණය 44,227 ක් වූ අතර එම නිසා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයකර නොගත් හිඟ වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම රු. මිලියන 221.13 ක් වූ අතර, පෙර වර්ෂයද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟ මුළු වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම රු.මිලියන 287.29 ක් විය.

සීමිත සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව 2014 ජනවාරි 21 වන දින පෞද්ගලික ආයතනයකට රු. මිලියන 88.81 ක මුදලකට පිරිනමා තිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එහි වැඩ කටයුතු 2014 ඔක්තෝබර් 20 දිනට පෙර අවසන් කල යුතු වුවත්, මේ වන විට කොන්ත්‍රාත්කරු එහි වැඩ කටයුතු අතරමඟ නවතා දමා කොන්ත්‍රාත්තුව හැර දමා ගොස් තිබුණි. දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්තුවේ කටයුතු නිසි පරිදි මෙහෙයවීම සහ අධීක්ෂණය කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සංග්‍රහයේ 5.4.8 (අ) වගන්තිය ප්‍රකාර කාර්ය සාධන ඇපකරයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබා නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙතෙක් මේ සඳහා දරා තිබූ රු.මිලියන 13.62 ක් වූ මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

- 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.5 වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩලය හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, එකතුව රු.මිලියන 2.92 ක් ඉංජිනේරු දීමනා, පාඨමාලා සම්බන්ධීකරණ දීමනා, ලේකම් දීමනා හා ගණකාධිකාරී දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

- රජයේ ආයතනයන් සඳහා උපදේශකයින් තෝරා ගැනීම රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය සහ රජයේ උපදේශකයින් පත් කිරීමේ මඟ පෙන්වීම අනුව සිදුකල යුතු වුවත්, එසේ සිදු නොකර, ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු, පර්යේෂණ හා පුහුණු ඒකකයේ උපදේශකවරයකු ලෙස පත්කොට තිබුණි. ඒ සඳහා දීමනා ලෙස සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා රු.මිලියන 1.32 ක් ගෙවා තිබුණි.

- ආයතනයේ ශාඛාවක් මන්නාරමේ පිහිටුවීම සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1.12 ක් වැයකර තිබුණ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ශාඛාව නිෂ්කාර්ය තත්ත්වයේ පැවති අතර, මෙම ශාඛාව නඩත්තුව සඳහා රු. මිලියන 0.16 කට අධික වියදම් මාසිකව දරනු ලබන බව නිරීක්ෂණය වූ අතර, එම මුදල්ද නිෂ්කාර්ය තත්ත්වයට පත්වී තිබුණි.

## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

- සංවර්ධන අංශ II යටතේ රබර් නිෂ්පාදන, බෝට්ටු, යාන්ත්‍රික, දැව, අච්චු හා තෙරපුම් අච්චු යන අංශවල ප්‍රගතිය වෙනුවෙන් වූ විවිධ වැඩ සටහන් සඳහා වෙන් කරන ලද රු.මිලියන 25 න් වැයකර තිබුණේ රු.මිලියන 4.28 ක් එනම් සියයට 17.12 ක් වන නමුත් ඒවායේද ප්‍රමාණාත්මක ප්‍රගතියක් වාර්තාවී නොතිබුණි.

- සංවර්ධන අංශ III යටතේ සම්භාණ්ඩ කර්මාන්තය නගා සිටුවීම සඳහා වෙනම කලාපයක් ඇති කිරීමට 2006 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලැබී තිබුණද 2014 දී එම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.මිලියන 120 ක් වෙන් කළද අදාළ ඉඩම නිදහස් කර දීමට අදාල බලධාරින් කටයුතු නොකිරීමෙන් එම ව්‍යාපෘතියද අසාර්ථකවී තිබුණි.

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2010 වර්ෂය දක්වා වූ පසුගිය වසර 5 ක කාලය තුලම සතොස වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාට විගණන මතයක් පලකල නොහැකි තත්ත්වයක් පැවතුණු අතර 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයා අහිතකර විගණන මතයක් පලකරන ලදී. කෙසේ වුවද මෙම හේතුව නිසා 2012, 2013 හා 2014 වර්ෂවල ගිණුම් පිළියෙල කිරීමට වරලත් ගණකාධිකාරී සමාගමක සහය ලබාගත්තද සංස්ථාවට 2012 හා 2013 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමට හැකිවූයේ 2015 වර්ෂයේ අග භාගයේදීය.

ඒ අනුව 2012 හා 2013 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 649 හා 177 ක අලාභ දිගින් දිගටම ලබමින් තිබූ අතර වෙළඳ කටයුතු වලින් 2012 හා 2013 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 217 ක් හා රු.මිලියන 159 ක් ද කුලී ආදායම රු.මිලියන 186.5 ක් හා රු.මිලියන 185.2 ක් ද වී සහල් කිරීමේ ව්‍යාපෘතියෙන් පිළිවෙලින් රු. මිලියන 37 ක් හා රු.මිලියන 177 ක් ලැබුණද කළමනාකාරිත්වයේ දූර්වල තීරණ මත පරිපාලන වියදම් හා මූල්‍ය පිරිවැය අධිකව දැරීම නිසා ඉහත පරිදි වූ අලාභදායි තත්ත්වයන් දිගින් දිගටම පැවතීමට හේතු විය.

සංස්ථාවේ දිගින් දිගටම පැවත එන සමුච්චිත අලාභය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ස්කන්ධයේ රු.මිලියන 7,587 ක පිරිහීමක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පිරිහීම රු.මිලියන 7,407 ක් විය.

අවසානයට නිකුත් කළ 2011 වර්ෂයේ විගණන වාර්ථාව අනුව පෙන්වා දී ඇති සංස්ථාව දිගින් දිගටම නිවැරදි කර නොගත් ප්‍රධාන අඩුපාඩු කිහිපයක් පහත පරිදි දැක්වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම, එකතුව රු. මිලියන 72 ක් වූ ආදායම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් වී නොතිබීම, රු.මිලියන 546 ක් සතොස ණයගැතියන් අඩුවෙන් පෙන්වීම, මතභේදයට තුඩු දෙන ලෙස රු. මිලියන 79 ක වියදමක් දරා සංස්ථාවට අයත් නොවූ ගබඩාවක වී මෝල් ඉදිකිරීම, රු. මිලියන 4,725 ක වටිනාකමක් සහිත ගනුදෙනු සම්බන්ධයෙන් වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම, වාණිජ බැංකු 3 කට ගෙවිය යුතු රු. මිලියන 4,597 ක බැඳුම්කර වගකීම් නිරවුල් කිරීමට දීර්ඝ කාලයක් තිස්සේ සංස්ථාව කටයුතු කර නොතිබීම, ප්‍රතිඵලදායක නොවන ආයෝජන 2 ක් වෙනුවෙන් සංස්ථාව රු. මිලියන 544 ක වියදම් දැරීම, සංස්ථාවට අයත් රු. මිලියන 15 ක වත්කම් වලින් සහල් සැකසීමේ යන්ත්‍ර 140 ක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්ක්‍රීයව පැවතීමත් රු.මිලියන 45 ක ව්‍යාපෘති මුදල් අරමුණුවලට පටහැනිව යොදාගෙන තිබීමත්, රු. මිලියන 57 කට අධික වටිනාකමකින් යුතු ගනුදෙනු හා වත්කම් සම්බන්ධයෙන් කළමණාකරනය අකාර්යක්ෂමතාවයෙන් යුතුව කටයුතු කර තිබීම හේතුවෙන් එම වටිනාකම් සංස්ථාවට අහිමිවීමත් නිරීක්ෂණය විය.

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

ආහාර දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතන වෙත කුලියට ලබාදී තිබුණු ගබඩා 66 කින් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 51.82 ක් හිඟ කුලී අයවීමට තිබුණි. ඉන් ගබඩා 24 ක් මේ වන විට නැවත පවරාගෙන තිබුණද, ඔවුන්ගෙන් අයවිය යුතුව ඇති එකතුව රු. මිලියන 31.88 ක් වූ හිඟ කුලී මේ දක්වා අයකරගෙන නොතිබුණි.

## වී අලෙවි මණ්ඩලය

2006 පෙබරවාරි 08 දිනැති අංක අමප/06/0238/218/10 දරන අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත 2006 වර්ෂයේදී වී අලෙවි මණ්ඩලයේ කටයුතු අක්‍රිය කර, ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය පිහිටුවා වී අලෙවි මණ්ඩලයේ කාර්යයන් එම අධිකාරියට පවරා තිබුණි. අනතුරුව 2007 ජූලි 25 දිනැති අංක අමප/07/1199/315/031 අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මත 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය ඈවර කර වී අලෙවි මණ්ඩලය නැවතත් ක්‍රියාකාරි තත්ත්වයට පත්කර තිබුණි. ඒ අනුව වී අලෙවි මණ්ඩලය විසින් අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, දකුණ, වයඹ, නැගෙනහිර හා උතුර වශයෙන් කළාප 07 ක් ස්ථාපිත කර 2008 යල කන්නයේ සිට වී මිලදී ගැනීමේ මෙහෙයුම් කටයුතු නැවත ආරම්භ කර තිබුණි.

- මණ්ඩලයේ උතුරු හා නැගෙනහිර කලාප 02 හැර කලාප 05 කට අයත් ගබඩා 235 ක් සම්බන්ධයෙන් 2013 ඔක්තෝබර් 31 දිනට පැවති වී තොග පිළිබඳ කරන ලද තොග සත්‍යාපනය අනුව 2012/2013 කාලපරිච්ඡේදය තුළ වී තොග මිලදී ගැනීම්, ගබඩා කිරීම් හා නිකුත් කිරීමේදී රු.මිලියන 578.39 ක අලාභයක් සිදුවී තිබුණි.

- 2012 වර්ෂය තුළ පොළොන්නරුව කලාපයේ ගබඩා 06 ක සිදුවූ රු. මිලියන 23.2 ක් වටිනා වී කිලෝ ග්‍රෑම් 777,453 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් එහි ගබඩා භාරකරුට විරුද්ධව නඩු පවරා තිබූ අතර, රු.873,236 ක තොග සමීක්ෂණ පිරිවැයද ඇතුළුව මෙමගින් මණ්ඩලයට සිදුවූ මුළු අලාභය රු. මිලියන 24.07 ක් විය.

- මිල ගණන් කැඳවීමකින් තොරව වී මිල තීරණය කිරීම සඳහා 2013 වර්ෂයේ පත්කළ තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් මඟින් පවතින වෙළඳපල මිල ගණන් සහ වී නිෂ්පාදනය කරන ප්‍රදේශවල පවතින වී තොගවල විකුණුම් මිල සැලකිල්ලට නොගෙන ව්‍යාජ තොරතුරු මත පදනම්ව වී මිල තීරණය කිරීම නිසා පොළොන්නරුව, අනුරාධපුරය සහ දකුණු කලාපවල වී තොග විකිණීමෙන් මණ්ඩලයට රු.මිලියන 54.86 ක අලාභයක් සිදුවී තිබුණි.

- වී මිලදී ගැනීම සම්බන්ධව මණ්ඩලය විසින් නිකුත් කළ 2013 ජූලි 24 දිනැති අංක PMB/2013/Y/AGR/CR දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි වේ.

    (අ) වී මිලදී ගැනීමේදී ඒවා අනුමත ප්‍රමිතීන්ගෙන් යුක්ත විය යුතු බවට හා එහි බොල් ප්‍රමාණය උපරිම සියයට 9 ක් (පරිමාවට අනුව) බව චක්‍රලේඛයේ දක්වා තිබුණද, එය මැනීමට නිශ්චිත ක්‍රමයක් භාවිතා කර නොතිබුණි.

(ආ) වී තොග අට්ටි ගැසීමට ප්‍රථම එක් එක් ගොවි මහතාට අදාළ පත්‍රිකාවේ අංකය සෑම ඇසුරුම් මිටියකට නොමැකෙන තීන්ත වලින් සටහන් කිරීම කළ යුතු බවට මෙම චක්‍රලේඛය මඟින් දැනුම් දී තිබුණද කිසිදු ගබඩාවක එසේ සිදුකර නොතිබුණි.

(ඇ) භාරගත් වී තොග නිකුත් කිරීමට පහසු වන පරිදි වී වර්ගය අනුව වෙන් වෙන්ව අට්ටි ගැසීම කළ යුතු වුවත් සමහර ගබඩාවල එසේ සිදුකර නොතිබුණි.

(ඈ) චක්‍රලේඛ උපදෙස් අනුව මිලදී ගන්නා සෑම වී මිටියකම සම්මත බර කිලෝ ග්‍රෑම් 50 ග්‍රෑම් 250 ක් ලෙස දක්වා තිබුණද කිලෝ ග්‍රෑම් 40 සිට 69 දක්වා බරින් යුතු වී මිටි මිලදී ගෙන තිබුණි.

(ඉ) චක්‍රලේඛ උපදෙස් අනුව එක් ගොවියෙකුගෙන් මිලට ගත හැකි උපරිම වී ප්‍රමාණය 2012/2013 මහ කන්නයේදී කිලෝ ග්‍රෑම් 2,000 ක් වුවත් සමහර අවස්ථාවලදී විධිමත් ලිඛිත උපදෙස් වලින් තොරව වී කිලෝ 5,000 දක්වා මිලදීගෙන තිබූ අවස්ථා විය.

(ඊ) චක්‍රලේඛ උපදෙස් අනුව මිලදී ගන්නා වී වල තෙතමනය සියයට 14 ක උපරිම ප්‍රතිශතයකට යටත්ව මිලදී ගත යුතු වුවත් දකුණු කලාපයේ යෝධ කණ්ඩිය ගබඩාවේ සුදු නාඩු වී වල තෙතමනය සියයට 15.5 සිට සියයට 17.9 දක්වා වූ අතර, වීරකැටිය ගබඩාවේ රතු නාඩු වල තෙතමනය සියයට 14.6 සිට සියයට 16.8 දක්වාද සුදු නාඩුවල තෙතමනය සියයට 14 සිට 15 දක්වාද විය.

- මණ්ඩලය සතු ආණමඩුව, ගලේවෙල, වරාවැව සහ නිකවැරටිය යන ගබඩා සංකීර්ණවල වී ගබඩා 08 ක් පෞද්ගලික ආයතන වෙත ලබාදී තිබූ අතර, මෙයින් ගබඩා 05 ක් වාර්ෂික කුලී අයකිරීමකින් තොරව ලබාදී තිබුණි.

- සෝමාලියා රාජ්‍යයට ආධාර පිණිස යැවීම සඳහා අවශ්‍ය සහල් ලබා ගැනීමට වී මෝල් හිමියන් වෙත නිකුත් කළ වී තොග වෙනුවෙන් රු. මිලියන 54.39 ක් වටිනා වී තොගයට අදාල සහල් කි.ග්‍රෑම් 1,281,937 ක් මණ්ඩලය වෙත 2015 ජූලි 31 දින වන විටත් ලැබී නොතිබුණි.

- 2013 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමා විසින් සහල් අපනයනය කිරීම තාවකාලිකව නවත්වා තිබුණද, අදාළ ඊර්බිය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා වෙත ලබාදී තිබූ බලය මත 2014 වර්ෂයේදී සහල් මෙට්‍රික් ටොන් 15,000 ක් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අපනයනය කිරීම සඳහා වී අලෙවි මණ්ඩලයේ ගබඩා මඟින් නාඩු වී කිලෝ ග්‍රෑම් 12,019,045 ක් සහල් මෝල් වෙත නිකුත් කර තිබුණි. මෙම වී තොග මිලදී ගැනීම් හා අනෙකුත් වියදම් වෙනුවෙන් රු.මිලියන 469.34 ක් මණ්ඩලය විසින් දරා තිබූ අතර, අපනයන කටයුතු සඳහා වී ලබා දීම වෙනුවෙන් මණ්ඩලයට ලැබී තිබුණේ රු. මිලියන 169.48 ක් පමණි. ඒ අනුව මෙකී තොග සැපයීම නිසා මණ්ඩලයට රු.මිලියන 299.98 ක මූල්‍ය අලාභයක් සිදුවී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

- වී අලෙවි මණ්ඩලය 2013 වර්ෂයේදී සිදුකළ කොන්ත්‍රාත් 09 ක් වෙනුවෙන් රු.මිලියන 65.48 ක් වැයකර තිබූ අතර මෙම සියළු කොන්ත්‍රාත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානවලින් බැහැරව සමූපකාර තොග වෙළඳ සංස්ථාවට පවරා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් හරහා එහි කොන්ත්‍රාත් සිදුකර අදාළ ගෙවීම් CWE කන්ස්ට්‍රක්ෂන් පෞද්ගලික සමාගම වෙත ලබාදී තිබුණි.

- ඉහත කොන්ත්‍රාත්වල ඇතිවන ප්‍රමාණ වෙනස්වීම් සහ අතිරේක වැඩ සඳහා ගෙවීම් කිරීමට ඇස්තමේන්තුවේ හදිසි අවශ්‍යතා සඳහා වෙන් කිරීම් කර නොමැති වුවත් කොන්ත්‍රාත් 02 ක් සඳහා කළ අතිරේක වැඩ සඳහා රු. මිලියන 3.42 ක මුදලක් ගෙවා තිබුණි. එකී අතිරේක වැඩ සිදු කිරීමට ප්‍රථම වී අලෙවි මණ්ඩලය මෙම කොන්ත්‍රාත් අධීක්ෂණය සඳහා පත්කළ උපදේශකවරයාගේ නිර්දේශ සහ ටෙන්ඩර් මණ්ඩලය වෙතින් ඒ සඳහා අනුමැතියන් ලබාගෙන නොතිබුණි.

- 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2013 හා 2014 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 25 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

- 2011 විගණන වාර්තාව අනුව 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ අඩුපාඩු කිහිපයක් පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05,16 හා 18 ප්‍රකාරව කටයුතු නොකිරීම.

(ආ) 2008 වර්ෂයට පෙර තිබූ වත්කම් හා බැරකම් ශේෂවල එකතුව පිළිවෙලින් රු. මිලියන 277.91 ක් හා රු. මිලියන 166.99 ක් හඳුනාගැනීමකින් තොරව අවිනිශ්චිත ගිණුමක රඳවාගෙන තිබීම.

(ඇ) ණයපොළී ගෙවීම සහ වී කෙටුම් කුළී හා ප්‍රවාහන ගාස්තු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදලින්, අදාල ගාස්තු පියවා ඉතිරිවූ රු. මිලියන 57.60 ක මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම.

(ඈ) ආදායම් ප්‍රකාශනයේ සහල් විකුණුම් පිරිවැය සදොස් ලෙස ගණනය කිරීම නිසා විකුණුම් පිරිවැය රු. මිලියන 601.55 කින් වැඩියෙන් දක්වා තිබීම.

(ඉ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැති ණයගැති ශේෂ මත ප්‍රමාණවත් බොල්ණය හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සළසා නොතිබිම.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2014 වර්ෂය සඳහා ඒකාබද්ධ කෘෂි ආදර්ශ, කෘෂි කලාප හා කෘෂිකර්මය සම්බන්ධ වැඩසටහන්, අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ලෙස හඳුනා ගෙන රු. මිලියන 518 ක් වූ වාර්ෂික රජයේ ප්‍රදානවලින් සියයට 58 ක ප්‍රතිශතයකින් එනම් රු. මිලියන 300.28 ක් වූ අපනයන සංවර්ධන වියදම් දරා තිබුණ අතර එවැනි

වැඩසටහන්වල ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම් හා සමාලෝචනය සඳහා වූ පසු විපරම් කටයුතු කිරීම වෙනුවෙන් නිර්ණායක හා පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. අපනයන සංවර්ධන කටයුතු සහ එහි කාර්යක්ෂමතාවය ඵලදායිතාවය ඇගයීම හා සමාලෝචනය කිරීම පිළිබඳ සැලකිල්ල දක්වා නොතිබුණි. එවැනි වැඩසටහන් කිහිපයක් පිළිබඳව විස්තර පහත දැක්වේ.

- මන්නාරම, වවුනියාව හා මුලතිව් දිස්ත්‍රික්ක තුනෙහි කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබූ අතර අනුමත මුදල රු.මිලියන 16.30 ක් විය. 2014 අප්‍රේල් 22 දින මන්නාරම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කළ රු. මිලියන 0.85 ක් වූ අත්තිකාරම් මුදල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පුද්ගලික රියදුරු පුහුණු ආයතනයක් වෙත නිකුත් කර තිබූ හෙයින් ජාතික තරුණ සේවා සභාව සම්බන්ධ කර ගැනීමෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වූ පුහුණුවීම් මොනවාද, පුද්ගලික රියදුරු පුහුණු ආයතනයක් හරහා ලබා දෙන අපනයන ක්ෂේත්‍රය සම්බන්ධිත වූ පුහුණුව කවරෙක්ද යන්න විගණනයට පැහැදිලි නොකෙරුණි.

- අපනයන වෙළඳපොළට මිරිස් සැපයීම අරමුණු කර ගෙන වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි මිරිස් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 15 ක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. එම මුදල ඉක්මවා රු.මිලියන 22.72 ක් වැය කරමින් අක්කර 50 ක 2014 වර්ෂයේදී ආරම්භ කළ මිරිස් වගා ව්‍යාපෘතියෙන් ගොවීන් වාර 2 කදී අස්වැන්න ලබාගත්තද, මේ දක්වා අපනයන වෙළඳ පොළට කිසිඳු අපනයනයක් සිදු කර නොමැති බවද නිරීක්ෂණය විය. මණ්ඩලය අපනයන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් තුළින් මණ්ඩලයේ අරමුණුවලට පටහැනිව කෘෂි කාර්මික කටයුතුවල නියැලී ඇති බව නිරීක්ෂණය විය.

- සමාගම් 30 ක වරණීය කොටස්හි කළ රු. මිලියන 105.06 ක් වූ ආයෝජන සඳහා 1997–2014 කාලපරිච්ඡේදයට සහ සමාගම් 31 ක සාමාන්‍ය කොටස්වල කළ එකතුව රු. මිලියන 43.49 ක් වූ ආයෝජන සඳහා 2001-2014 කාලපරිච්ඡේදයට අදාළව ලාභාංශ ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විසුරුවා හැර ඇති සමාගම් 3 ක සාමාන්‍ය කොටස්වල ආයෝජන වටිනාකම වූ රු.මිලියන 17.32 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි නොකිරීම මත සමාගම් ලේඛනයෙන් නම කපා හැර තිබූ සමාගම් අතුරින් සමාගම් 16 ක වරණීය කොටස් වටිනාකම රු. මිලියන 34.59 ක් සහ සමාගම් 17 ක සාමාන්‍ය කොටස් වටිනාකම රු. මිලියන 5.13 ක් වූ ආයෝජන උපලබ්ධි කර ගැනීම සඳහා මණ්ඩලය විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

- 2018 වර්ෂයේ පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සඳහා 2018 හම්බන්තොට නගරය වෙනුවෙන් ලංසු ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා ප්‍රවර්ධනය, ජාතික හා අන්තර් ජාතික මට්ටමේ ක්‍රීඩා ඉසව් සංවිධානය හා ක්‍රීඩා පුහුණු පහසුකම්වල ආයෝජනය යනාදී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිහිටවූ සීඩබ්ලිව්ජී හම්බන්තොට 2018 පුද්ගලික සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙහි මණ්ඩලය විසින් රු.මිලියන 8 ක් 2012 වර්ෂයේදී ආයෝජනය කර තිබුණද ඒ සඳහා කිසිදු ප්‍රතිලාභයක් මෙතෙක් ලබා ගෙන නොතිබුණි. මෙම ආයෝජනය සඳහා මුදල් ඇමතිවරයාගේ එකඟතාවය විගණනයට ඉදිරිපත් නොවීය.

# ඉදිකිරීම් කර්මාන්තය

## ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන අමාත්‍යාංශය

- ඉක්ටෑඩ් ආයතනයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 20 ක ඌනතාවයක් විය. කෙසේ වුවද, ආයතනය විසින් සිය සේවකයන්ට වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමේ අරමුණින් රු. මිලියන 32ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කරන ආකාරයේ වෙනමම ආදායම් ප්‍රකාශයක් එම වර්ෂය සඳහා පිළියෙල කර තිබුණි. ඒ අනුව 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව රු. මිලියන 3ක් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

- රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනේ හා ලෝක ජනාවාස දින වැඩසටහනේ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ආයතනය රු. මිලියන 1.5 ක් දරා තිබුණි.

- 2014 වර්ෂයේ "මහාභිමානී" වැඩසටහනේ ප්‍රචාරණ වියදම් වෙනුවෙන් නිකුත් කරන ලද රු. මිලියන 4.7 ක් වටිනා චෙක්පත් 05ක් 2015 ජනවාරියේ දී අවලංගු කර තිබූ අතර අවලංගු කිරීමට හේතූන් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

- 2013 වර්ෂය සඳහා කාර්යාංශයේ මෙහෙයුම් ආදායමෙන් උපදේශක සේවාවන් සැපයීමෙන් උපයා ගන්නා ලද ආදායම සියයට 14 ක් පමණ වූ අතර ඉතිරි ආදායම ඉදිකිරීම් වැඩවලින් උපයා ගෙන තිබුණි. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ආදී ඉදිකිරීම් වැඩ භාරගැනීමේ රජය සතු ආයතන බොහෝ ගණනක් තිබුණ ද ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) පමණක් උපදේශණ කාර්යයන් භාර ගනී. එසේ වුවද, ඉදිකිරීම් කාර්යයන්වල ද ව්‍යාපාර පිරිවැටුම හා වැඩ පරිමාව ඉතා ඉහළ බැවින් කාර්යාංශය ආරම්භ කරන අවස්ථාවේ දී පවරා තිබූ නියෝගාත්මක කාර්යයවන ඉංජිනේරු උපදේශකත්වය කාර්යාංශය විසින් උපාය මාර්ගිකව කේන්ද්‍රගත කර නොතිබුණි.

- මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ දී රු. මිලියන 3,601 ක් වූ යන්ත්‍ර හා උපකරණ ප්‍රදානයන් වශයෙන් කාර්යාංශය වෙත ලබා දී තිබූ නමුත් පසුව අමාත්‍යාංශය විසින් කාර්යාංශයට ගෙවිය යුතු කොන්ත්‍රාත් ගෙවීම් වලින් රු. මිලියන 250ක් ඒ වෙනුවෙන් අයකර ගෙන තිබුණි. කෙසේ වුවද, කාර්යාංශය විසින් වෘත්තීය තක්සේරුකරුවකු ලවා එම වත්කම්වල වටිනාකම තක්සේරු කරවා නොගෙන සහ ලැබුණු රු. මිලියන 3,351ක ප්‍රදාන නොසලකා එම වත්කම් රු. මිලියන 250 ක වටිනාකමකට ගිණුම්ගත කර තිබුණි.
- මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට යෝජනා ක්‍රම කිහිපයක් යටතේ දිරි දීමනා ගෙවීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණු අතර 2013 වර්ෂයේ දී එලෙස ගෙවන ලද දිරි දීමනාවල වටිනාකම රු. මිලියන 100 ක් විය.

- මධ්‍යම ඉදිරිකිරීම් සේවා පුද්ගලික සමාගම පිහිටුවීමේ මූලික අරමුණ වූ තරඟකාරී මිල ගණන් යටතේ කොන්ත්‍රාත් ලබාගැනීම වෙනුවට කාර්යාංශය විසින් ලබාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත් වලින් සියයට 90 ක් එම සමාගම වෙත උප කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලබදී තිබුණි. සමාගම විසින් සංස්ථාවට අයත් මානව, භෞතික හා අනෙකුත් සම්පත් යොදාගනිමින් ඉහත ඉදිකිරීම් සිදුකරන බව තවදුරටත් නිරීක්ෂණය විය. නිදසුනක් වශයෙන් ආයතන දෙකේම ප්‍රමාණ පත්‍ර, ඇස්තමේන්තු සහ ඉන්වොයිස් පිළියෙල කිරීම එකම කාර්ය මණ්ඩලයන් විසින් සිදුකරයි.

- දුර්වල කොන්ත්‍රාත් පාලනය හේතුවෙන් සමාලෝචන වර්ෂයේ දී කාර්යාංශය ලබාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩවලින් රු. මිලියන 60 ක පාඩුවක් සිදුවී තිබුණි.

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

- සංස්ථාව 2013 වර්ෂයේ දී රු. මිලියන 12,474 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 67 ක් භාරගෙන ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද, සංස්ථාවේ ද්‍රවශීලතා ගැටළු, සේවා දායකගෙන් ගෙවීම් නියමිත කාලයට නොලැබීම, අයහපත් කාලගුණ තත්ත්වයන්, සේවා දායක විසින් සැලසුම් වෙනස් කිරීම හා කළමනාකරණ අකාර්යක්ෂමතාව වැනි විවිධ කරුණු හේතුවෙන් ඉන් බොහෝ ව්‍යාපෘති මාස 6 සිට මාස 82 දක්වා වූ කාල පරාසයක් තුල ප්‍රමාද වී තිබුණු අතර 2013 වර්ෂයේ දී ප්‍රමාද වූ ව්‍යාපෘතිවලින් සිදුවූ මුලු අලාභය රු. මිලියන 70.3 ක් විය.

- කේවල කාර්යසාධනය ඇගයීමකින් තොරව 2013 වර්ෂයේ දී සංස්ථාවේ ඉදිකිරීම් අංශයේ තෝරාගත් තාක්ෂණික කාර්ය මණ්ඩලයකට රු. මිලියන 12.7 ක දිරිදීමනා ගෙවා තිබුණි.

- ඉදිකිරීම් ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් පත්කරන ලද නිලධාරීන් හතර දෙනෙකුට සංස්ථාව විසින් 2012 ජුනි සිට 2014 නොවැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුල කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ක්‍රියාත්මක කරන ලද ජනසෙවන වැඩසටහන යටතේ පාරවල් ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු සඳහා වාහන කුලී ගාස්තු වශයෙන් එකතුව රු. මිලියන 12 ක මුදලක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද එම අධීක්ෂණ කටයුතුවලට අදාල වාර්තා ලබා ගැනීමකින් තොරව සහ අසම්පූර්ණ ධාවන සටහන් පදනම් කරගෙන ඉහත කාර්ය සඳහා ගෙවීම් කර තිබුණි.

- සමාලෝචන වර්ෂය තුලදී එකතුව රු. මිලියන 3.2 ක් වූ ණයගැතියන් හත් දෙනෙකුගේ ශේෂ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමකින් තොරව ලියාහැර තිබුණි.

- සංස්ථාවේ කොන්ක්‍රීට් අංගනයේ හා ඉදිකිරීම් අංශයේ පිළිවෙලින් රු. මිලියන 28 ක් හා රු. මිලයන 36 ක් වූ ණයගැති ශේෂ 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 3 කට වැඩි කලක සිට හිඟව පැවතුණි. එයින් පිළිවෙලින් රු. මිලියන 24 ක් හා රු. මිලියන 25ක් වර්ෂ 05 කට වැඩි කාලයක් සිට හිඟ පැවැතුණු අතර අයකරගැනීමට කිසිදු පියවරක් සංස්ථාව විසින් ගෙන නොතිබුණි. තවද, 2013 දෙසැම්බර් 31 දිනට හිඟ පැවති රු. මිලියන 38 ක් වූ විවිධ ණයගැති ශේෂයන් සඳහා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවුණි.

- රු. මිලියන 5 ක් හා රු. මිලියන 19 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා වූ මිලදී ගැනීම් අත්තිකාරම් 2014 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් වර්ෂ 04 කට සහ වර්ෂ 2කට වැඩි කාලයක සිට නොපියවා තිබුණු අතර එය අයකර ගැනීමට සංස්ථාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඊට අමතරව සංස්ථාවේ පැලියගොඩ කාර්යාලයට අදාලව රු. මිලියන 22 ක් වූ මිලදී ගැනීම් අත්තිකාරම් සඳහා කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

- 2013 වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය බදුවලට පෙර රු.මිලියන 149 ක ශුද්ධ ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.මිලියන 226 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ශුද්ධ ලාභයෙහි රු.මිලියන 77 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

- 2013 වර්ෂය සහ ඉකුත් වර්ෂය සැසැඳීමේදී විශේෂ මෙහෙයුම් අංශයේ සහ උපදේශන අංශයේ මෙහෙයුම් ලාභය පිළිවෙලින් රු.මිලියන 216 ක් සහ රු.මිලියන 30 කින් පිරිහීමත් යන්ත්‍රෝපකරණ අංශයේ රු.මිලියන 45 ක මෙහෙයුම් අලාභයත් ශුද්ධ ලාභය පිරිහිමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

- 2011 වර්ෂයේ හැරුණු විට අනෙකුත් සියළුම වර්ෂයන්හි දී සංස්ථාවේ බදු වලින් පසු ලාභය අඛණ්ඩව අඩුවී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේ දී බදුවලින් පසු ලාභය අඩුවීම සියයට 40 ක් විය.

- 2012 වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේ සංස්ථාවේ උපදේශණ, විශේෂ මෙහෙයුම් සහ යන්ත්‍රෝපකරණ යන අංශවල ශුද්ධ මෙහෙයුම් ලාභ පිළිවෙලින් සියයට 24, සියයට 54 සහ සියයට 1,205 කින් පිරිහී තිබුණි.

- ඉදිකිරීම් හා උපාංග අංශයට අයත් ඒකල, වැලිකන්ද සහ රත්මලාන වැඩබිම්වල 2012 වර්ෂයේ රු.මිලියන 41 ක් වූ මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 7 ක් දක්වා සියයට 83 කින් පිරිහී තිබුණි. වැඩ බිම්වල විකුණුම් පිරිවැය හැර අනෙකුත් වියදම්වල වැඩිවීම මේ සඳහා බලපා තිබුණි.

- 2013 වර්ෂයේ දී ඉදිකිරීම් උපාංග අංශයට අයත් දංකොටුව ගඩොල් හා වඩු නිෂ්පාදන අංගනය සමාලෝචිත වර්ෂයේදී ද රු.මිලියන 3 ක අලාභයක් ලබා තිබුණු අතර , පසුගිය වසර 16 අතුරින් වසර 15කදීම මෙම අංගනය පාඩු ලබා තිබුණි. එම සමුච්චිත පාඩුව රු.මිලියන 29 ක් විය. වැඩ බිමේ ආදායම වැඩිවීමේ ප්‍රතිශතයට වඩා විකුණුම් පිරිවැය ඉහළයාම මෙම තත්ත්වයට බලපා තිබුණි.

- 2013 වර්ෂයේ දී යන්ත්‍රෝපකරණ අංශයේ ප්‍රධාන කාර්යාලය, කොලොන්නාව ප්‍රධාන ගබඩාව ඇතුළු ප්‍රාදේශීය කාර්යාල හා වැඩබිම් 15 ක් ලැබූ සමුච්චිත අලාභය රු.මිලියන 98 ක් විය.
- 2013 වර්ෂයේ දී බැංකු ඇපකර මත සංස්ථාවට ලබාගත හැකි බැංකු අයිරා පහසුකම රු.මිලියන 474 ක ට සීමාවී තිබුණද රු.මිලියන 556 ක් දක්වා අයිරා පහුසකම් ලබාගත් අවස්ථා විය. ඉන් රු.

මිලියන 150 ක් තාවකාලික බැංකු අයිරාවක් (Temporary Over Draft) ලෙස සියයට 30 ක පොලී ප්‍රතිශතයක් යටතේ ලබාගෙන තිබුණි. එබැවින් බැංකු අයිරා සඳහා 2013 වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවන ලද මුළු බැංකු අයිරා පොලිය රු.මිලියන 78 ක් විය.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ දී චීනයෙන් ආනයනය කර සංස්ථාවට ලබාදුන් ආනයනික වටිනාකම රු.මිලියන 1,339 ක් වූ යන්ත්‍රෝපකරණ 2013 වර්ෂයේ දී රු.මිලියන 736 කට පිළිගත් තක්සේරුකරුවන් විසින් තක්සේරුකර තිබුණි. වත්කම් මිලදීගෙන වර්ෂයක් වැනි කෙටි කාලයක් තුල සියයට 45 කින් අගය අඩුවීම හේතුවෙන් එම වත්කම් වල මුල් වටිනාකමේ සාධාරණත්වය පිළිබඳව විගණනයේදී සෑහිමකට පත්වීමට නොහැකි විය.

- 2008 වර්ෂයේ සිටම විදේශ රටවල ඉදිකිරීම් ව්‍යාපෘති අරඹා ආදායම් ඉපයීමට සංස්ථාව උනන්දු වී තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 13 ක මුදලක් වැයකර තිබුණි. එහෙත් කිසිදු විදේශ රටක ඉදිකිරීමක් ඇරඹීමට, කොන්ත්‍රාත් ලබා ගැනීමට හෝ කිසිදු ආදායමක් ඉපයීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සංස්ථාව අපොහොසත්වී තිබුණි.

- 2013 වර්ෂයේදී ඉදිකිරීම් කොන්ත්‍රාත් නියමිත කාලය තුළ අවසන් නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩ ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 20 ක මුදලක් ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි.

- 2013 වර්ෂයේ අවසන් දින වන විට ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිරිවැය දැරීම හේතුවෙන් ව්‍යාපෘති 34 ක් වෙනුවෙන් රු.මිලියන 187 ක අලාභයක් සිදුවී තිබුණි.

- වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2013 වර්ෂය සඳහා ඉංජිනේරු, ගෘහනිර්මාණ ශිල්පී, ප්‍රමාණ සමීක්ෂක යන සේවා වර්ගීකරණයට අයත් තනතුරු දරන සේවකයන්ට රු. මිලියන 159 ක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

- 2013 වර්ෂය අවසානයට වූ රු. මිලියන 4,656 ක වෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 95 කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතුව තිබූ අතර ඉන් රු. මිලියන 1,960 ක් වර්ෂ 03කට වඩා කල් ඉක්මවූ ශේෂ විය.

## රජයේ කර්මාන්තශාලාව

- කොළොන්නාවේ රජයේ කර්මාන්ත ශාලාවේ අක්කර 15 ක් පමණ වූ ඉඩමෙන් රූඩ් 01 පර්චස් 16 ක කොටසක් වසර 50 කට අධික කාලයක සිට අනවසර පදිංචිකරුවන් භුක්තිවිඳින අතර මෙම ඉඩම නිරවුල් කර ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- 2013 දෙසැම්බර් 31 දිනට පැවති ණයගැති ශේෂය වූ රු. මිලියන 362 තුළ 1995 වසරේ සිට 2007 වසර දක්වා රජයේ ආයතනවලට භාණ්ඩ සපයා වර්තමානය වන තෙක් අයකරගත නොහැකි වූ රු. මිලියන 53 ක මුදලක් කිසිදු අයකිරීම් ක්‍රියාමාර්ගයක් නොගෙන මේ වන තෙක්ම ගිණුම්වල පැවතුණි.

# නිවාස

ශ්‍රී ලාංකීය සෑම පවුලකටම ජීවත් වීම සඳහා නිවසක් ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ජන සෙවන නිවාස සහ ජනාවාස සංවර්ධන මෙහෙයුම 2011 වසරේ සිට ඉදිකිරීම්, ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හා එයට අනුබද්ධිත ආයතන වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සහ සාහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් කර ගෙන යනු ලැබේ.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

- අධිකාරිය විසින් ජන සෙවන නිවාස දශලක්ෂයේ වැඩ සටහනට අනුකූලව 2014 වර්ෂය තුළ ඉටුකිරීමට ඉලක්ක කර ගත් ජාතික නිවාස වැඩසටහන් හා වර්ෂය තුළ ලඟාකර ගැනීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

  (i) නිවාස සංවර්ධන අධිකාරියට අයත් දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් හා නාගරික කාර්යාලවල ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ සිය සේවාවන් ඉටුකරන කාර්ය මණ්ඩලය දායක කර ගනිමින් 2014 වර්ෂය තුළ නිවාස ඒකක 42,222 ක ඉදිකිරීම් ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කළද සත්‍ය වශයෙන් වැඩ නිම කළ නිවාස ඒකක ගණන 15,590 ක් විය. එනම් ඉලක්කගත නිවාස ඒකක ප්‍රමාණයෙන් වසර තුළ වැඩ අවසන් කළ නිවාස ප්‍රමාණය සියයට 37 ක් විය. එහෙත් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 43 ක් භාවිතා කර තිබුණි.

  (ii) සමාලෝචිත වර්ෂය අවසානයට ජනසෙවන උපහාර නිවාස ණය වැඩසටහන හැරුණු විට අනෙකුත් ණය වැඩසටහන්වල සැළකියයුතු ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි.

  (iii) රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස යෝජනා ක්‍රම 05 ක නිවාස ඒකක 877 ක් ඉදිකිරීමට සැලසුම් කළද සමාලෝචිත වසර අවසානයට ඉන් කිසිඳු නිවාස ඒකකයක් ඉදිකර නොතිබුණු අතර වැඩ ආරම්භ කළ නිවාස යෝජනා ක්‍රම ගණන 02 කි. එම යෝජනා ක්‍රමවල ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 2 ක් විය.

  (iv) සහශ්‍ර ලංකා නිවාස වැඩසටහන යටතේ රු.මිලියන 75 ක් මත නිවාස ඒකක 60 ක් සෑදීමට සමාලෝචිත වර්ෂය තුළ සැලැසුම් කළ ද ඉන් කිසිඳු නිවාස ඒකකයක වැඩ අවසන් කර නොතිබුණි.

  (v) රජය විසින් 2011 වර්ෂය තුළ හඳුන්වාදුන් ජනසෙවන නිවාස වැඩසටහන යටතේ නිවාස දශලක්ෂයක් ඉදිකිරීමේ කර්ථව්‍ය ඉටු කිරීමට රාජ්‍ය අංශයේ ප්‍රමුඛයා වන්නේ දිස්ත්‍රික් කාර්යාල 26 ක් හා නාගරික කාර්යාල 03 කින් සමන්විත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වුවද අධිකාරිය විසින් 2014-2018 කාල පරිච්ඡේදය තුළ එම ඉලක්කයන් සපුරාගැනීම වෙනුවෙන් ඉදිකිරිමට අපේක්ෂා කළ නිවාස ගණන මුළු නිවාස සංඛ්‍යාවෙන්

සියයට 25 ක් පමණක් විය. මෙවැනි තත්ත්වයන් මත ජනසෙවන නිවාස වැඩසටහනෙහි සඳහන් ඉලක්කයන් යථාර්තයක් බවට පත් කිරීම ගැටළු සහගත මට්ටමක පැවතුණු අතර අපේක්ෂිත ඉලක්ක /අරමුණු කරා ළගාවීමට ඇති බාධකයන් නිසි පරිදි හඳුනාගෙන ඒ සඳහා කඩිනමින් පිළියම් යෙදීමේ අවශ්‍යතාවය කළමනාකරණයේ අවධානයට යොමුවී නොතිබුණි.

- වන්දි ගෙවිය යුතු ඉඩම්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(ආ) වගන්තියට අනුව අධිකාරිය විසින් භුක්තිය භාරගෙන තිබුණු නමුත් ගැටළු සහගත තත්ත්වයන් මත ඇතැම් ඉඩම් අධිකාරියට පවරා ගැනීමට විශාල කාලයක් ගතවී තිබුණු අතර, ඒ හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු වන්දි මුදල රු. මිලියන 16 ක් වූ අතර, ඒ සඳහා ගෙවිය යුතු හිඟ පොළිය රු. මිලියන 40 ක් විය.

- 2010 වර්ෂයේ සිදුකරන ලද ඉඩම් සමීක්ෂණ වාර්තාව අනුව ඉඩම් හෙක්ටයාර් 645.66 ක් හඳුනාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එයින් අනවසර පදිංචි ඉඩම් හෙක්ටයාර් 208.75 ක් ඇති බවට හඳුනාගෙන තිබුණි. එමෙන්ම උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක 05 ක ඉඩම් පිළිබඳව සමීක්ෂණයක් ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සිදුකර නොතිබුණි.

- නිවාස යෝජනා ක්‍රම ඉදිකිරීමට ප්‍රථම අදාල පළාත් පාලන ආයතන මගින් නිවාස සැලසුම් අනුමත කරවා ගතයුතු වුවද, එලෙස කටයුතු නොකර නිවාස ඉදිකිරීම් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වසර අවසානය වන විට, නිවාස යෝජනා ක්‍රම 26 ක නිවාස 1,986 කට අදාල අනුකූලතා සහතික ලබා ගැනීමේ ගැටළු පැන නැගී තිබුණි. තවද එම තත්ත්වය මත නිවාස යෝජනා ක්‍රමයන්ට අදාල නිවාස, නිවාස හිමියන්ට පැවරීමක් සිදුකර කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී තිබීම හේතුකොට ගෙන එම නිවාස යෝජනා ක්‍රමවල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු තවදුරටත් අධිකාරිය වෙතම පැවරී තිබුණි. ඒ අනුව එකී නිවාස යෝජනා ක්‍රමවල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු.මිලියන 12 ක සහ රු.මිලියන 771 ක වියදමක් දැරීමට අධිකාරියට සිදුවී තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ණයගැති ශේෂය රු.මිලියන 3,880 කින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන, ලැබිය යුතු ශේෂවල එකතුව රු.මිලියන 2,202 ක් හෙවත් මුළු ණයගැති වටිනාකමින් සියයට 56 ක් වූ අතර එම ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම හිග ණය මුදල් අයකර ගැනිම සඳහා අධිකාරිය ඇතැම් පියවර ගෙන තිබුණ ද අයවීම් ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතුණි.

- අධිකාරියට අයත් හෝමාගම ජල්තර සහ දියවන්නා ගාර්ඩින්ස් යන නිවාස යෝජනා ක්‍රමවල නිවාස 02 ක් නිවාස බැහැර කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව අවිධිමත් ලෙස කිසිඳු ගිවිසුම් අත්සන් කිරීමකින්ද තොරව පුද්ගලයින් දෙදෙනෙකු වෙත කිසිදු අත්තිකාරම් මුදලක් ලබා ගැනීමකින්ද තොරව පදිංචිය සඳහා නිදහස් කොට තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 08 දිනැති අංක අමප/14/0619/517/021-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු පල්ලෙකැලේ වත්තෙහි දේශීය ආයෝජකයින් සමඟ ඒකාබද්ධව නිවාස ඒකක 42 කින් සමන්විත නිවාස ව්‍යාපෘතියක් ආරම්භ

කිරීමට පුද්ගලික හවුල්කරුවෙකු සමඟ ගිවිසුම්ගතවීමේ දී ඉදිකිරීමට අනුමත නිවාස ගණන හේතු දැක්වීමකින් තොරව ඒකක 39 දක්වා අඩුකර තිබුණි. තවද, ව්‍යාපෘතියේ සත්‍ය ලාභයෙන් අධිකාරියට හිමිවිය යුතු ප්‍රමාණයට ගිවිසුම්ගතවීම වෙනුවට එම ව්‍යාපෘතියේ සැලසුම් අදියරේදී ඇස්තමේන්තුගත කරන ලද ලාභයෙන් (Pre-determined profit) සියයට 10 ක් ලබා ගැනීමට එකඟවී තිබුණි.

- 1998 දෙසැම්බර් 17 දිනැති අංක 140/98 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, අනවසරකරුවන් වෙත දේපල බැහැර කිරීමේදී ආසන්න වර්ෂයේ තක්සේරුව ලබාගත යුතු වුවද මැනිංටවුන් නිවාස ක්‍රමයේ අංක D/V/2/2/L දරන නිවස බැහැර කිරීමේදී 1998 තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදී නිවස බැහැරකර තිබුණි. ඒ අනුව අධිකාරියට සිදුවූ අලාභය රු මිලියන 10 කි. එමෙන්ම අනවසරකරුවන් නියමානුකූල කිරීම සඳහා ක්‍රමවේදයන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබියදී ඊට පටහැනි ලෙස ගම්පහ වේවැල්දූව නිවාස ක්‍රමයේ අනවසරකරුවන් තිදෙනෙකු නියමානුකූල කිරීම සඳහා අධිකාරිය විසින් කටයුතු කිරීම හේතුවෙන් අධිකාරියට සිදුවූ අලාභය රු. මිලියන 4 ක් විය.

## සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය දේපළ, අර්ධ සහාධිපත්‍ය දේපළ සහ තාවකාලික දේපළවල පාලනය, කළමනාකරණය, ඒවා නඩත්තු කරවීම සහ පරිපාලනය කිරීම යන අරමුණු ඉටු කිරීම සඳහා 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනත සංශෝධනය කරමින් ඉදිරිපත් කළ 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධිත) පනතින් 2003 නොවැම්බර් 10 දින සිට සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවා තිබුණි.

- යථෝක්ත පනතේ 05(ඉ) වගන්තිය අනුව සහාධිපත්‍ය දේපළවල කළමනාකරණ සංස්ථාව පිහිටුවීමෙන් පසුව අධිකාරිය විසින් එහි කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කළයුතු වුවද, අධිකාරිය ලබාදී ඇති තොරතුරු අනුව 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලියාපදිංචි කිරීමට ඉලක්ක කරන ලද කළමනාකරණ සංස්ථා හා කමිටු ගණන 1,080 ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට පිහිටුවන ලද කළමනාකරණ සංස්ථා හා කමිටු ගණන 829 ක් වූ අතර එයින් සියයට 60 ක් 2015 මැයි අවසන් වන විටත් අක්‍රියව පැවතුණි.

- එමෙන්ම පනතේ 5(උ) වගන්තිය අනුව සහාධිපත්‍ය දේපලවල පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීමට අධිකාරිය කටයුතු කළයුතු වුවද මාළිගාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල පොදු පහසුකම් පළාත් පාලන ආයතන වෙත පැවරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අධිකාරිය කටයුතු කර නොතිබුණි.

- පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ආදායම රු.මිලියන 48 කින් හෙවත් සියයට 77 කින් ඉහළ ගොස් තිබුණද වියදම පියවා ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලය රු.449,155 ක ලාභයක් විය. ආදායම ඉහළයාමට සාපේක්ෂව වියදම් ද විශාල ලෙස ඉහළ ගොස් තිබූ බැවින් මූල්‍ය ප්‍රතිඵලය පහළ අගයක් ගෙන තිබුණි.

එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ශුද්ධ වත්කම්වල රු. මිලියන 12 ක වාසිදායක ශේෂයක් නිරූපනය වුවද පසුගිය වර්ෂ 03 ක එය පිළිවෙලින් රු. මිලියන 25, රු.මිලියන 16 සහ රු. මිලියන 32 ක් වශයෙන් සෘණ අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද සේවක වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 10 ක් ලැබීම හා රු.මිලියන 29 ක ඉකුත් වර්ෂ ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් වර්ධනයට මූලිකවම හේතුවී තිබුණි. මෙම තත්ත්වය ආයතනයේ අවිච්ඡින්න පැවැත්ම කෙරෙහි අහිතකරව බලපා තිබුණි.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

- අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 10ක ඌනතාවයක් ලබා තිබියදී, රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීමට සලසා තිබූ 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ලාභ උපයා ඇති ආයතනවල සේවකයන්ට ගෙවීමට නිර්දේශ කර තිබූ රු. 15,000 ක ප්‍රසාද දීමනාව පදනම් කරගෙන අධිකාරියේ සේවකයන් 89 දෙනෙකුට රු. මිලියන 1ක ප්‍රසාද දීමනාවක් පාලක මණ්ඩලයේ අනුමැතියෙන් ගෙවා තිබුණි.

- ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් "කොළඹ ළමයි" නමින් නාට්‍යයක් සහ වීදි ආහාර ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා රු. මිලියන 23 ක් වැය කර තිබුණි.

- 2007 පෙබරවාරි 22 දිනැති අංක අමප/07/0140/226/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිට වූ වහාම රීල් එස්ටේට් එක්ස්චේන්ජ් පුද්ගලික සමාගම ඈවරකර එම සමාගමේ වත්කම් හා වගකීම් ද, කාර්ය මණ්ඩලය ද අධිකාරිය වෙත පවරා ගතයුතු වුව ද, 2014 නොවැම්බර් මාසය වන විටත් කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහනය පමණක් සිදුකර තිබුණි.

- ජනසෙවන ස්වශක්ති සහභාගීත්ව පාරිසරික වැඩසටහන සඳහා අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු රුපියල් මිලියන 40 න් අනුරාධපුර නිවාස ව්‍යාපෘතියේ වියදම් රු. මිලියන දෙකක්, ප්‍රවාහන වියදම් රු.මිලියන හතක් සහ ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සව වියදම් රු. මිලියන 5 ක් වශයෙන් එකතුව රු. මිලියන 14 ක් අරමුණට පටහැනිව වියදම් කර තිබුණි.

- 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(ඉ) උපවගන්තිය අනුව අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපළ සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරගනු ලබන සියළු මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු වුවද, 2010 මාර්තු මාසයෙන් පසුව අධිකාරියට එලෙස මුදල් ලැබී නොතිබුණි. මෙසේ ලැබිය යුතු මුදල රු. මිලියන 207 ක් විය. තවද 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අය කිරීම නවතා ඇති අතර, ඒ හේතුවෙන් ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබුණි.

# ප්‍රවාහනය

ශ්‍රී ලංකාව මඟී ප්‍රවාහනය අවශ්‍යතාවයෙන් සියයට 58 ක් පමණ ඉටු කරනු ලබන්නේ පොදු ප්‍රවාහන සේවා තුලිනි. එම කාර්යයන් අධීක්ෂණය හා මෙහෙයවීම ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, සීමාසිහත ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ආදි ආයතන මගින් ඉටුකරනු ලබයි.

2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 7,557 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 17,453 ක් ද වශයෙන් අයවැය ප්‍රතිපාදන සලසා තිබූ අතර ගිණුම් අනුව වර්ෂයේදී පුනරාවර්තන වියදම් ලෙස රු.7,548 ක් ද ප්‍රාග්ධන වියදම් ලෙස රු. මිලියන 13,023 ක් ද වියදම් දරා තිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදන තුල දුම්රිය මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා වූ රු.මිලියන 11,002 ක විදේශ ණය මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණි. එම වර්ෂය තුල මුලු කාර්ය මණ්ඩලය 138 ක් විය. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ ප්‍රවාහන අමාත්‍යාංශයේ හා ඒ යටතේ වූ අනෙකුත් ආයතනවල ගනුදෙනු හා ක්‍රියාකාරකම් විගණනයේදී නිරීක්ෂණය වූ ප්‍රමාණාත්මක නිරීක්ෂණ පහත දැක්වේ.

- අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යනය යටතේ මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සඳහා වූ රු.මිලියන 36,166 ක ඇස්තමේන්තුවෙන් රු.මිලියන 11,123 ක් පමණක් වැයකර තිබුණි. ඊට අමතරව නව දුම්රිය මාර්ග 06 ක් ඉදිකිරීමේ යෝජනාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 376 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් ඉන් රු.මිලියන 19.8 ක් පමණක් සැලසුම් කිරීමේ කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිවල වාර්ෂිකව ලඟා කරගතයුතු භෞතික හා මූල්‍ය ප්‍රගතිය දැක්වෙන ව්‍යාපෘති සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී සිදුකළ නියැදි විගණන පරීක්ෂාවන්වලදී අරපරිස්සමෙන් තොරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ඵළැඹි ඵලදායි නොවන ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 6.552 ක් වූ අතර වැය විෂයන් 04 ක් සඳහා වෙන්කර තිබූ රු.මිලියන 25 ක ප්‍රතිපාදන භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

වර්තමානයේ ශ්‍රී ලංකාවේ දුම්රිය ජාලය කි.මී. 1640 ක් වේ. දෙපාර්තමේන්තුව සතුව ඉඩම් අක්කර 13,980 ක භූමි ප්‍රමාණයක් දීප ව්‍යාප්තව පවතී. ඉන් දුම්රිය මාර්ග හා කාර්යාල ගොඩනැගිලි ගබඩා වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්නා භූමිය ඉඩම් අක්කර 8,616 කි. 2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 16,893 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව උපයාගත් ආදායම රු.මිලියන 5,909 වන අතර රජයෙන් ලැබුණ ප්‍රතිපාදනවලින් පුනරාවර්තන වැය රු.මිලියන 16,943 ක් වූ අතර ප්‍රාග්ධන වියදම රු.මිලියන 34,601 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දුම්රිය

දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් කරන ලද විගණනයේදී නිරීක්ෂණය වූ වැදගත් කරුණු පහත දැක්වේ.

- දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුම අනුව දුම්රිය බලපත්‍ර වෙනුවෙන් රු.මිලියන 1,571 ද දුම්රිය වාර ප්‍රවේශපත්‍ර භාර නොගැනීම නිසා අය කරනු ලැබූ රු.මිලියන 1.102 ක දඩ මුදලක්ද සැසඳුම් ප්‍රකාශ ප්‍රකාරව විවිධ අයවීම් හිඟහිට ඇති රු.මිලියන 84.84 ක් ද දිගු කාලයක සිට දෙපාර්තමේන්තුවට අයවීමට තිබූ නමුත් ඒවා අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කිසිම පියවරක් ගෙන නොතිබුණි.

- වර්ෂ ගණනාවක සිට මියගිය හා විශ්‍රාම ගිය සේවකයින් 1047 කුගෙන් රු.මිලියන 52.23 ක් ද සේවය හැරගිය සේවකයින් 4071 දෙනෙකුගෙන් රු.මිලියන 21.417 ක් ද වැඩ තහනම් කළ 462 කුගෙන් රු.මිලියන 10.194 ක් ද වශයෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කිසිම පියවරක් ගෙන නොතිබුණි.

- 1998 සිට සමාලෝචිත වර්ෂය දක්වා විදේශීය රට වලින් ආනයනය භාණ්ඩ හා සේවා සම්බන්ධ නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු.මිලියන 1,030.60 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී වත් එම පසුගිය වර්ෂයන්ට අදාළ වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

- ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 5.6 වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී පැය 08 ක් දිනකට අඩු කළයුතු වුව ද දුම්රිය නියාමකවරු 68 දෙනෙකුට සතියකට වැඩ කළයුතු සාමාන්‍ය පැය ගණන අඩු කිරීමෙන් තොරව එම කාලයේදී රු.960,341 ක මුදලක් අතිකාල ලෙස ගෙවා තිබුණි.

- ඕමන්ත සිට පලෙයි දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීමේ ව්‍යාපෘතියේ දුම්රිය මාර්ගයට යොදා ඇති රු.මිලියන 80 ක් වටිනා සිල්පර 6849 ක් පලුදු වී ඇති අතර සිල්පර සැපයුම් කළ ආයතනයේ සහතිකය මත පමණක් කටයුතු කර තිබුණි. මෙම සිල්පර වල ගුණාත්මක තත්ත්වය පිළිබඳ පිළිගත හැකි පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. තවද එම ව්‍යාපෘතියේ අධි ඇස්තමේන්තු නිසා රු.මිලියන 374.19 ක් වටිනා රේල්පීලි සහ සිල්පර ඉතුරු වී තිබුණි. ඒ සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාගේ පිළිතුර වූයේ පවතින මාර්ගය නවීකරණයේදී ඒවා යොදවා ගැනීමට විකල්ප භාවිතයක් හඳුනාගෙන ඇති බවයි. නමුත් එම රේල්පීලි හා සිල්පර 2015 මැයි 31 දින වන විටත් හඳුනාගත් විකල්ප සඳහා භාවිතා කර නොතිබූ අතර ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු ව්‍යාපෘති කාර්යාලයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති වුවත් මාස 09 ක කාලයක් ව්‍යාපෘති කාර්යාලය පවත්වා මසකට රු.ලක්ෂ 3 බැගින් රු. මිලියන 1.8 ක් එම කාල සීමාවට වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

- 1987 ජනවාරි 05 දිනැති අංක 887 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිවාස කුලිය සංශෝධනය නොකිරීමෙන් උප දෙපාර්තමේන්තු 03 කට අදාල නිවාස 145 කින් ලැබිය යුතු රු.මිලියන 1.93 ක ආදායමක් රජයට අහිමි වී තිබූ අතර රත්මලාන පිහිටි දුම්රිය නිළ නිවාස 680 ක් සඳහා වෙනමම ජල මීටර සවි නොකර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජල සැපයුමෙන්ම ජලය සපයා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් ලබාගත් ජලය වෙනුවෙන් රු.මිලියන 58.49 ක මුදලක් දෙපාර්තමේන්තුව විසින් වැය කර ඇති බව නිරීක්ෂණය විය.

- විදේශයෙන් ගෙන්වන ලද භාණ්ඩ වරායෙන් නිසි කලට වේලාවට මුදා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව තුලදී පමණක් රු.මිලියන 1.287 ක ප්‍රමාද ගාස්තුවක් අනාර්ථිකව ගෙවීම් කිරීමට ගබඩා උප දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

## ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

2005 වර්ෂයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලෙස නැවත ස්ථාපිත කිරීමෙන් පසුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දිගින් දිගටම අලාභ ලබමින් පවතී. 2014 වර්ෂයේදී සැලසුම් අංශය විසින් පවත්වාගෙන ගොස් තිබූ තොරතුරු අනුව මුලු ආදායම රු.මිලියන 33,665 ක් වූ අතර මුලු වියදම රු.මිලියන 35,528.02 (ක්ෂයවීම් ඇතුලුව) වූ අතර රජයෙන් රු.මිලියන 500 ක මුදලක් ලැබී තිබුණි. ගිණුම් විගණනය සඳහා අවසාන වරට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2012 වර්ෂය වෙනුවෙන් වන අතර එම ගිණුම් අනුව 2012 දෙසැම්බර් 31 දිනට දළ අලාභය රු.මිලියන 3,966.54 ක් වූ අතර එම වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබුණ රු.1,508.2 ක ප්‍රතිපාදන නිසා අලාභය රු. 2,458.34 දක්වා අඩු වී තිබුණි. මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත 2012 වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ වත්කම්වල අගය රු.මිලියන 25,538.5 ක සෘණ අගයක් ගෙන තිබුණි. 2012 වර්ෂය වෙනුවෙන් අවසාන මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී නියමිත ගිණුම්කරන ප්‍රමිති ද අනුගමනය කර නොතිබුණි. මණ්ඩලයට වෙන්වූ කාලසටහන් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දිනකට සාමාන්‍යයෙන් බස්රථ 7204 අවශ්‍ය වුවද 2014 වර්ෂය තුළදී දිනකට ධාවනය වූ සාමාන්‍ය බස්රථ සංඛ්‍යාව 4596 ක් වී තිබුණි. මේ අනුව 2014 වර්ෂය තුළදී මුළු කාලසටහන් අවශ්‍යතාවයෙන් සියයට 37 පමණ ප්‍රමාණයක් සපුරාගත නොහැකි වී තිබුණි. එසේ වුවද පසුගිය වර්ෂය හා සසඳනවිට ධාවනය වූ කිලෝමීටරයකට මුළු ආදායම රු.87.84 සිට රු.90.68 දක්වා වර්ධනය වී තිබූ අතර මණ්ඩලය සතු පැරණි බස්රථ ඉවත් කර නව බස්රථ ධාවනයට එක් කිරීම මෙයට ප්‍රධාන හේතු වී ඇති බව මණ්ඩලය විසින් දක්වා ඇත. තවද වර්ෂය තුලදී බස්රථයක් කිලෝමීටර එකක් ධාවනය කිරීමේ සාමාන්‍ය වියදම රු.95.70 වූ බැවින් ධාවනය කිරීමේ එක කිලෝමීටරයකින් රු.5.02 ක මුදලක් තව දුරටත් පාඩු ලබමින් පවතී. 2014 දෙසැම්බර් 31 දිනට මුළු කාර්ය මණ්ඩලය 34,303 ක් වන අතර 2012 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී හා 2013, 2014 හා 2015 වර්ෂවල ගණුදෙනු විගණනය කිරීමේදී මතු වූ වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

- අංක පීඊඞී/12 හා 2003 ජුනි 02 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වන පරිච්ඡේදයට අනුව ගමනාගමන මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්, අනුමත කාර්ය මණ්ඩලයක් හා උසස් කිරීමේ පටිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගතයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

- චලනය නොවන වත්කම් හා බැරකම් පිළිවෙලින් රු.මිලියන 3,232.23 ක හර ශේෂ 66 ක් හා රු.මිලියන 2,010.90 ක බැර ශේෂ 23 ක් පිළිබඳව පූර්ණ පරීක්ෂාවක් සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව පොත්පත්වලින් කපා හැරීමට 2002 වර්ෂයේදී භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී තිබූ නමුත් 2012 වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා පූර්ණ පරීක්ෂාවකින් තොරව පොත්පත් වලින් කපා හැර තිබුණි.

- නියමිත කාලය තුළ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල සඳහා සේවක හා සේවා දායක මුදල් නොයැවීම නිසා 2015 මාර්තු 31 දින වන විට මණ්ඩලය විසින් එම අරමුදල් වලට යැවිය යුතු මුලු මුදල පිළිවෙලින් රු.මිලියන 9,502.6 හා රු.මිලියන 45.18 ක් විය. මෙසේ දායක මුදල් නොගෙවීම නිසා සියයට 5 සිට 50 දක්වා වූ අධිභාර මුදලක් ගෙවීමට සිදු වේ.

- පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් කරන ලද විධිමත් ඉල්ලීමකින් හා අනුමැතියකින් තොරව 2015 පැවති ජනාධිපතිවරණයයේ ප්‍රචාරක රැළි සඳහා මගීන් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් බස් ගමන්වාර 16280 ක් ලබා දී තිබූ අතර ඒ සඳහා තවදුරටත් අයවිය යුතු රු.මිලියන 142.52 ක මුදල එම දේශපාලන පක්ෂය විසින් ගෙවීම පැහැර හැර තිබුණි. මණ්ඩලය විසින් ද අවිධිමත්ව මෙම බස්රථ කුලියට දීම නිසා බස්රථ කුළියට දීමේදී අයකරනු ලබන මුදලට වඩා අඩු මුදලක් අය කිරීමේ හේතුවෙන් රු.මිලියන 94.52 ක ආදායමක් අහිමි වී තිබුණි.

- 2014 වර්ෂයේ පැවති බස්නාහිර පළාත් සභා මැතිවරණ ප්‍රචාරක රැළියක් සඳහා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ ලබා දී ඇති බවට මැතිවරණ කොමසාරිස් විසින් කරන ලද ලිඛිත දැනුම් දීමක් මත කරන ලද පරීක්ෂාවේදී කළුතර ප්‍රාදේශීය කාර්යාලයට අයත් ඩිපෝ 5 මගින් මතුගම පැවති උත්සවයක් සඳහා බස්රථ 47 ක් ලබාදී තිබූ නමුත් එම ලබාදීමට කළමනාකරණය ගත් තීරණය විගණනයට ඉදිරිපත් නොවුණි. විගණනය සඳහා ඉදිරිපත් වූ තොරතුරු අනුව ඩිපෝ දෙකක් මගින් ඉදිරිපත් කරන ලද බස්රථ 20 කට අදාල තොරතුරු පරීක්ෂා කිරීමේදී එම බස්රථ කිසිම අය කිරීමකින් තොරව ධාවනය කළ බව නිරීක්ෂණය විය.

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2014 වර්ෂයේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මුළු කාර්ය මණ්ඩලය 162 ක් වූ අතර එම වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වශයෙන් දැරූ වියදම පිළිවෙලින් රු.මිලියන 735.53 ක් හා රු.මිලියන 130.93 ක් විය. විගණනය සඳහා 2014 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.මිලියන 109.2 ක් වන අතර එම වර්ෂයේ සභාවේ ගණුදෙනු හා ක්‍රියාකාරකම් විගණනයේදී නිරීක්ෂණය වූ ප්‍රමාණාත්මක කරුණු පහත දැක්වේ.

- පසුගිය වර්ෂය අවසන් වනවිට ගැමිසැරිය බස් සේවා 31 ක් සහ නිසිසැරිය බස් සේවා 136 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර එම ප්‍රමාණයම සමාලෝචිත වර්ෂය තුළදීද පවත්වාගෙන යාමට සැලසුම් කර තිබුණද වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් බස් සේවා 21 ක් හා 114 ක් දක්වා අඩු වී තිබුණි.

- ජීපීඑස් තාක්ෂණය පදනම් කරගෙන අන්තර් පළාත් බස්රථ නියාමනය කිරීමේ කටයුතු පුළුල් කිරීම සඳහා නව පාලන මැදිරියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 40 ක මුදලක් වෙන්කර තිබූ අතර 2014 වර්ෂය අවසන් වනවිට එහි වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2015 අප්‍රේල් 10 දින වනවිට ගොඩනැගිල්ල පමණක් නිමකර තිබූ අතර ඒ සඳහා රු. මිලියන18.19 ක මුදලක් වැය වී තිබුණි.

- අන්තර් පළාත් බස්රථ සහ පළාත තුළ ධාවනය වන බස්රථ වල කාලසටහන් ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් රු.මිලියන 62.41 ක් වැයකර විද්‍යුත් ප්‍රදර්ශන පුවරු 07 ක් විවිධ නගරවල සවිකර තිබූ නමුත් මේ වනවිට එම සියළුම පුවරු අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එම පුවරු ක්‍රියාත්මක නොවුනද 2015 මැයි මස අවසානය දක්වා ලබාගත් දින 11 ක විදුලිය හා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් රු.මිලියන 1.49 ක මුදලක් ගෙවා තිබූ අතර තවදුරටත් රු.433,265 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි.
- බැස්ටියන් මාවත බස් පර්යන්තයේ කටයුතු එහි කළමනාකරුට හා කොමිෂන් සභාවේ සභාපතිවරයාට තම කාර්යාලවල සිට අධීක්ෂණය කළහැකි වන පරිදි රු.470,250 ක මුදලක් වැය කර CCTV කැමරා පද්ධතියක් සවිකර තිබුනත් සමාලෝචිත වර්ෂයේ එය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

- අන්තර් පළාත් බස්රථ ධාවන කටයුතු පිළිබඳ චන්ද්‍රිකා තාක්ෂණය උපයෝගී කරගෙන සෘජුවම අධීක්ෂණය කළහැකි වන පරිදි බස් රථ 2,095 ක ජීපීඑස් උපකරණ සවිකර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 79.06 ක මුදලක් වැයකර තිබුණි. තවද රු.මිලියන 8.31 ක මුදලක් එම උපකරණ නඩත්තු කරන ආයතනයට ගෙවිය යුතුව තිබූ අතර 2015 මැයි මාසය වනවිට සියළුම ජීපීඑස් උපකරණ අක්‍රීය තත්ත්වයේ පැවති අතර ඒවා යථා තත්ත්වයට පත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

විගණනයට ඉදිරිපත් කළ ගිණුම් අනුව වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් උපයා තිබූ මුදල රු.මිලියන 9,290.58 ක් වූ අතර පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 1,463.51 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 1,922.54 ක් ද අයවැය ප්‍රතිපාදන වලින් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ නිරීක්ෂණය වූ ප්‍රමාණාත්මක කරුණු පහත දැක්වේ.

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලිපිගොනු හා ලේඛන ලබා නොදීම, බොහෝ ප්‍රමාද කර ලබාදීම හේතුවෙන් විගණන කටයුතු සඳහා ඉමහත් බාධාවක් වී තිබුණු අතර විගණනය විධිමත් පරිදි සිදු කිරීමටද නොහැකි වී තිබුණි. 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විගණන කටයුතු සඳහා ඉල්ලා තිබූ ලිපිගොනු 500 කට අධික ප්‍රමාණයක් 2015 ජුලි 31 දින වන විටත් විගණනයට ලබා දී නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් කාලීනව ධාවනයෙන් ඉවත් කරන ලද වාහන හා අනතුරකට පත්ව ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු නොකිරීමේ හේතුවෙන් ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල අංකයන් යොදා ගනිමින් රේගු බදු නොගෙවා නීතිවිරෝධී ලෙස ආනයනය කරන ලද හෝ සකසන ලද වාහනවල දත්ත මෙම වාහනවලට ඇතුලත් කරමින් හෝ මෙම වාහන හඳුනාගැනීමේ අංකය යොදා ගනිමින් අක්‍රමිකතාවයන් රාශියක් සිදු කිරීමට ඉඩකඩ ලැබී තිබූ අතර ඒ හේතුවෙන් වංචනික ලෙස වාහන ලියාපදිංචිය තවදුරටත් ඉහලයාම සහ වාහන බදු ආදායම ප්‍රමාණවත් ලෙස අඩුවීමටත් හේතු වී තිබුණි. වාහන ලියාපදිංචි සඳහා යොදා ගන්නා ආරම්භක අංක 24, 25, 31, 32, 40, 50, 51, 64 සහ 65 ඇතුලු ඉතා පැරණි ඉලක්කම් අංක කාණ්ඩ යටතේ නවීනතම වර්ගයේ ජීප් රථ ලියාපදිංචි කර තිබූ අතර,

මාර්ගයේ ධාවනය වූ එවැනි ලියාපදිංචි කරනු ලැබූ වාහන පැවති බව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂා 5 දී නිරීක්ෂණය විය.

- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ පූර්ව අනුමැතියක් නොමැතිව කිසිදු අවස්ථාවක වාහනයක් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම, විකරණය කිරීම හෝ එහි වෙනත් නිර්මාණය කිරීම් නොකළයුතු වුවද, මාර්ගයේ ධාවනය වන වාහන පරීක්ෂාවේදී එවැනි පරිවර්තනයන් සිදු කරන ලද වාහන 26 ක් නිරීක්ෂණය විය. මෝටර් රථ පනතට අනුව මෙවැනි වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීම, වාර්ෂික වාහන ආදායම් බලපත්‍ර නිකුත් නොකිරීමට කටයුතු කිරීම හා මෙවැනි වාහන පිළිබඳව විස්තර ශ්‍රී ලංකා පොලිසිය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කිරීම ඇතුළු ඉතා පහසුවෙන් ඉටු කළහැකි කාර්යභාරයයන් කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.

- සිංගල් කැබ් රථ ලෙස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර, පසුව ජීප් රථ ලෙස පරිවර්තනය කර ඇති වාහන 18 කින් සුඛෝපභෝගී බදු වශයෙන් රු.මිලියන 4.32 ක් අයවිය යුතු වුවත්, එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- නවීන මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේදී විවිධ වංචනික ක්‍රියාවන් වැලක්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබූ අතර නව වාහන ලියාපදිංචියේදී ඊට අදාල ආනයනික තොරතුරු රේගු පරිගණක පද්ධතිය මගින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වෙත සම්ප්‍රේෂණය කර තිබුණද, අදාල තොරතුරු පරීක්ෂාවකින් තොරව වාහන ලියාපදිංචි කර තිබූ ද්විත්ව කාර්යය වෑන් රථ 22 ක් හා ලොරි රථ 56 ක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

- ගිලන් රථ හා අවමංගල්‍යා රථ වැනි විශේෂිත අරමුණු සඳහා භාවිතා කරනු ලබන වාහන ලියාපදිංචි කිරීමේදී, එකී විශේෂිත අරමුණින් බැහැර වීම වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් හා විධිමත් ක්‍රියාවලියක් දෙපාර්තමේන්තුව අනුගමනය කර නොතිබුණු බැවින් අක්‍රමිකතාවයන් රාශියක් සිදු වී තිබූ අතර විගණන නියැදි පරීක්ෂාවේදී එවැනි අවස්ථා 4 ක් නිරීක්ෂණය විය.

- සුඛෝපභෝගී බදු අය කිරීම සම්බන්ධයෙන් බදු මුදල් අයවීම හා ලැබිය යුතු හිඟ බදු පිළිබඳ ක්‍රමවත් වාර්තා පවත්වාගෙන නොයෑම, බදු අයකර ගැනීමේ කටයුතු නිසි පරිදි ඉටු නොකළ රක්ෂණ ආයතන සම්බන්ධයෙන් කටයුතු කිරීම, බදු ගෙවීම පැහැර හැරි වාහන හිමියන් සම්බන්ධයෙන් අදාල පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම හා නියමිත පාලන ගිණුම් නොපැවැත්වීම ආදී වැදගත් කාර්යයන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව අවධානය යොමුකර නොතිබුණි.

# තරුණ කටයුතු

තරුණ සංවර්ධනය සම්බන්ධයෙන් පුරෝගාමී මෙහෙවරක් ජාතික තරුණ සේවා සභාව විසින් සිදු කරනු ලබන අතර මෙම ජාතික මෙහෙවර වෙනුවෙන් 2014 වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් හා වෙනත් බාහිර දායකයන්ගෙන් එකතුව රු.මිලියන 1,483.86 ක් ජාතික තරුණ සේවා සභාව වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ථ වියදම රුපියල් මිලියන 1,626 ක් විය.

සභාවේ අරමුණු ඉටු කිරීම කෙරෙහි ඍජු දායකත්වයක් දක්වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලින් අංශ 10 ක් සඳහා වෙන්කළ එකතුව රු.මිලියන 432.669 කින් රු.මිලියන 236.280 ක් සමාලෝචිත වර්ෂයේදී අදාල අරමුණු කරා යෙදවීමෙන් තොරව ඉතිරිව තිබුණි. එමෙන්ම තරුණ සේවා සභාවට අයත් ගොවිපල 14 ට අදාලව මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 294 ක් වූ අතර ඉන් අක්කර 90 ක් පමණ වගා කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.

ජාතික තරුණ සේවා සභාව මඟින් යෞවන සමාජ මට්ටමින් සිදුකිරීමට සැලසුම් කරන ලද බොහොමයක් වැඩසටහන් ජාතික තරුණ සේවා සභාවේ අනුග්‍රහය ලබන ස්වේච්ඡා සංවිධානයක් වන ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය මඟින් සිදුකරන අතර සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එකතුව රු.මිලියන 3.95 ක් සභාව විසින් එම සම්මේලනයට ලබාදී තිබුණි. ස්වේච්ඡා සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් මෙම ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු විගණකාධිපති විසින් විගණනය කරනු නොලැබේ.

සමාලෝචිත වර්ෂය තුල තරුණ සංවර්ධනය හා සම්බන්ධ විශේෂිත වැඩසටහන් 18 ක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 857.84 ක මුදලක් වැය කර තිබුණි. වැඩසටහන් කිහිපයක ක්‍රියාකාරීත්වය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු පහත පරිදි විය.

## 2014 ලෝක තරුණ සමුළුව පැවැත්වීම

2014 ලෝක තරුණ සමුළුව පැවැත්වීම වෙනුවෙන් සභාව විසින් අමාත්‍යාංශ ප්‍රතිපාදන ඇතුලුව එකතුව රු. මිලියන 547.28 ක් පමණ වැය කර තිබුණි. 2015 න් ඔබ්බට වන පශ්චාත් සංවර්ධන න්‍යාය පත්‍රයට තරුණයා ප්‍රධාන තේමාව බවට පත්කිරීම මෙම සමුළුව පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වී තිබුණු අතර එම පරමාර්ථය පෙරදැරිකරගත් කොළඹ ප්‍රකාශය නමින් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ලෝක තරුණ සමුළුවේදී එළිදක්වා තිබුණි. එහෙත් එහි ඇතුළත් අරමුණු ඉටුකර ගැනීමට සක්‍රීය දායකත්වයක් සැලසෙන අයුරින් 2015 සංවර්ධන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැසුම් සකස් කර නොතිබුණි.

## ශ්‍රී ලංකා යූත් නිවාස ව්‍යාපෘතිය

2014 වර්ෂයේදී තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 246 ක නිවාස ගැටළුවලට මුහුණ දී සිටින එක් යෞවන සමාජ සාමාජිකයෙකු බැගින් තරුණ තරුණියන් 246 ක් තෝරාගෙන නිවසක් ඉදිකිරීමට

සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 46.12 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණද 2014 වර්ෂයේදී සැලසුම් කළ පරිදි එකම නිවාසයක්වත් ඉදිකර නොතිබුණි.

## ගෙවතු වගා ව්‍යාපෘතිය

යෞවන සමාජ තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට යොමු කිරීම මඟින් ඔවුන්ගේ ආර්ථික ශක්තිය ගොඩනැගීම සඳහා සහභාගීවීම හා ස්වශක්තිය කෙරෙහි විශ්වාසය ගොඩනැගීම මඟින් ආදර්ශමත් ගෙවතු බිහිකිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ගෙවතු වගා ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.මිලියන 1.143 ක විදේශාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යෞවන සමාජ සම්මේලනයට ලබාදුන්නද සම්මේලනය විසින් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

## ශ්‍රී ලංකා යූත් සිහිනය ව්‍යාපෘතිය

වෙනස් වූ හැකියාවන්ගෙන් යුත් තරුණ තරුණියන් සෞන්දර්ය, ක්‍රීඩා, අධ්‍යාපනික, ආර්ථික, සමාජීය හා දේශපාලන කුසලතා ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ඇගයීම හා වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර, 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 7.841 ක මුදලක් වැයකර තිබුණි. ව්‍යාපෘති යෝජනාවලට අනුව, අපේක්ෂිත දිස්ත්‍රික් යොවුන් කඳවුරු පැවැත්වීමද, ව්‍යාපෘතියේ ජයග්‍රාහකයන්ගේ ගීත සංයුක්ත තැටි නිර්මාණය කිරීමටද අවසන් වටයේ තරඟකරුවන් 12 දෙනා සඳහා මුදල් ත්‍යාග ලබාදීමද කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී එම කටයුතු සිදුකර නොතිබුණි.

## තරුණ සරසවිය වැඩසටහන

රජයට වැය බරක් නොවී තරුණ පිරිසකට උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසීම පිණිස කරන ලද තරුණ සරසවිය වැඩසටහන 2010 වසරේදී දිස්ත්‍රික්ක 15 ක ක්‍රියාත්මක කර තිබුණු අතර, 2014 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ආදායමට සාපේක්ෂව වියදම් ප්‍රතිශතය 2010 වසරේදී සියයට 66 ක් වී තිබුණු අතර, 2014 වන විට එය සියයට 230 දක්වා ඉහළ ගොස් තිබුණි.

## යොවුන් පාර්ලිමේන්තුව

සමාජයේ ප්‍රජාතාන්ත්‍රීය රාමුවට තරුණ ජනමතය අනුපාත කිරීම සහ විශේෂයෙන් දේශපාලනයේ සංකල්පවලින් ඔවුන් සන්නද්ධ කිරීමත් ජාත්‍යන්තර තරුණ වර්ෂයේ 25 වන සංවත්සරය වෙනුවෙන් වූ ප්‍රධාන ශ්‍රී ලංකා තරුණ ව්‍යාපෘතිය ලෙස ක්‍රියාත්මක කිරීමත් අරමුණු කරගෙන යොවුන් පාර්ලිමේන්තුව ස්ථාපිත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ පාර්ලිමේන්තු සැසිවාර 06 ක් පවත්වා තිබුණු අතර එම සැසිවාර 06 සඳහා අපේක්ෂිත සහභාගීත්වය 2884 ක් වූ අතර සහභාගී වූ සංඛ්‍යාව 1924 ක් විය. ඒ සඳහා එකතුව රු.මිලියන 46.203ක් වැය කර තිබුණු අතර සැසිවාර 06 සඳහා පාර්ලිමේන්තු ආකෘතිය ගලවා සවි කිරීමේ වියදම් ලෙස වැය කළ රු.මිලියන 15.403 ක මුදලක්ද ඒ අතර විය.

## දේශපාලන ශිල්පායතනය

ශ්‍රී ලාංකික යෞවනයේ දක්ෂතා හා කුසලතා හඳුනාගෙන නායකත්ව හැකියාවන් තාර්කික හැකියාවන් වර්ධනය කර යහපාලනයෙන් හෙබි දේශපාලන සංස්කෘතියක් බිහි කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද දේශපාලන ශිල්පායතනය වැඩ සටහන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 3 ක අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ මෙම වැඩසටහන අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

## මුරුක්කණ්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදිකිරීම.

මුරුක්කණ්ඩි ටෙම්පල් දුම්රිය ස්ථානය ඉදිකිරීම සඳහා රැස්කරන ලද රු.මිලියන 2.824 ක මුදලක් වර්ෂ 10 කට අධික කාලයක් නිෂ්කාර්යයව තිබී යුද්ධය නිසා අ.පො.ස. (සා/පෙළ) හා (උ/පෙළ) විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සිසුන් වෙනුවෙන් උපකාරක පන්ති පැවැත්වීම සඳහා 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය වෙත ලබාදී තිබුණු අතර  සැලසුම් ගත පරිදි වැසටහන ක්‍රියාත්මක නොකිරීමෙන් ඉතිරි වූ රු.මිලියන 2.627 ක් නැවත සභාව වෙත ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## තරුණ කැරැල්ල වැඩසටහන

යෞවන සමාජ වෙත තරුණ තරුණියන්ගේ නැඹුරුව වර්ධනය කිරීමේ මූලික පරමාර්ථය ඇතිව තරුණ කැරැල්ල නම් වූ වැඩසටහන ආරම්භ කර ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 15.930 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ඊට අමතරව එම වැය විෂය සඳහා රු.මිලියන 48.04 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ගෙන් මාරු කර තිබුණි. මෙම මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 39.8 ක් වර්ෂය තුළ වැයකර තිබුණි. එහෙත් වියදම් වාර්තා අනුව වැඩසටහනෙහි අරමුණු වලට ඍජු සබඳතාවයක් පවතින කටයුතු සඳහා වැයකර තිබුණේ සියයට 2 ක පමණ ප්‍රතිශතයකි. ඉතිරි ප්‍රතිපාදන අවස්ථානුකූල වැඩසටහන් ලෙස වැඩසටහනෙහි අරමුණු වලට අදාල නොවන  වෙනත් කටයුතු සඳහා උපයෝගී කරගෙන තිබුණි.

## තරුණ සුභසාධක අරමුදල

මහජන ආරක්ෂක පනතේ 5 වැනි වගන්තියේ විධිවිධාන යටතේ, 1993 වර්ෂයේ දී ජනාධිපතිවරයා විසින් පනවන ලද 1993 අංක 01 දරන තරුණ සුභ සාධක අරමුදල නියෝග යටතේ තරුණ සංවර්ධන අරමුදල පිහිටුවන ලද අතර මහජන ආරක්ෂක පනත යටතේ වූ නියෝග ප්‍රකාර රජයට පවරාගත් දේපොල මෙම අරමුදලට පවරා තිබුණි.

මහජන ආරක්ෂක පනත 1994 අගෝස්තු මාසයේ දී අහෝසි කිරීමත් සමඟම, ඒ යටතේ පනවන ලද නියෝගද අහෝසි වී තිබුණි. එ පරිදි, තරුණ සංවර්ධන අරමුදල ඈවර කිරීමේ කටයුතු ආරම්භ කළ යුතු වුවත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලේ ඈවර කිරීමේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

අරමුදලේ නිශ්චල දේපලවල අයිතිය ජාතික තරුණසේවා සභාවට පැවරීමට නීත්‍යානුකූල බාධාවක් නොමැති බව 1999 අගෝස්තු 09 දිනැති ලිපිය මඟින් නීතිපතිවරයා විසින් දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය නිමවන විටත් එම දේපලවල අයිතිය ජාතික තරුණ සේවා සභාව වෙත විධිමත් පරිදි පවරා නොතිබුණි. එමෙන්ම අරමුදල සතුව තිබූ වටිනාකම ගණනය නොකරන ලද රන් ආභරණ ඒකක 877 ක් හා වටිනාකම රු.මිලියන 27.50 ක්වූ රන් ආභරණ ඒකක 8135 ක් මහා භාණ්ඩාගාරයේ පැවති රු.මිලියන 8.997 ක මුදල් තැන්පතුව, මෝටර් රථ 2 ක් හා යතුරුපැදි 6ක් ඇතුළු අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි.

# සමාජ සේවා

අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා වූ කටයුතු විගණනයේදී අනාවරණය වූ ප්‍රමාණාත්මක අඩුපාඩු සහ කරුණු පහත දැක්වේ.

පහත සඳහන් කටයුතු නිමකිරීම සඳහා අමාත්‍යාංශය දැඩි අවධානයක් යොමු කළ යුතුවේ.

- ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන නව පනත
- සංඥා භාෂා පනත් කෙටුම්පත
- සුදු සැරයටිය භාවිතා කරන්නන් සඳහා නීතිමය රැකවරණය ලබාගැනීම සඳහා වන පනත් කෙටුම්පත
- ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම එළිදැක්වීම
- 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් කාර්යයන් හා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම් පනතේ කාර්යයන් ඉටුකිරීම.
- සමාජයේ සිටින ආබාධිත ප්‍රජාව හා වැඩිහිටි ප්‍රජාව පිළිබඳ නිවැරදි සහ යාවත්කාලීන දත්ත පද්ධතියක් සකසා ගැනීම.
- ආධාර ලබාදීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඉදිරිපත් කරන ලද සුදුසුකම් ලත් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්ගේ ඉල්ලීම් මත පමණක් ඉටුකිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.
- දැනට පවතින සියලුම ප්‍රසිද්ධ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා පොදු සේවා ලබාදෙන ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ වීමට හැකිවන ආකාරය සකස් කරනු ලැබීම සඳහා 2009 වර්ෂයේ පල කරන ලද නියෝගය ප්‍රකාර කාල සීමාව 2014 ඔක්තෝබර් 16 දින අවසන් වී තිබූ නමුත් නියෝග ප්‍රකාර කටයුතු කර නොමැති ආයතන සහ ස්ථාන වලට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය නීතිමය විධිවිධාන සලසා නොමැත.
- අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින්ට ඇස් කණ්ණාඩි සහ රෝද පුටු බෙදාදීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් සහ යාන්ත්‍රණයක් තිබියදී එයට පටහැනිව බාහිර පුද්ගලයන්ගේ මැදිහත්වීම් මත එය සිදුවී තිබුණි. 2014 වර්ෂයේ දී ඒ වෙනුවෙන් දරන ලද වියදම රු. මිලියන 29.96 ක් වූ අතර, ඒ පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.
  - ඇස් කණ්ණාඩි 6,493ක් බෙදා හැරී බවට වංචනික ලේඛණ ඉදිරිපත් කර රු.979,950ක් වංචා කිරීම.

- රු. මිලියන 1.27 ක් වටිනා දුර හා ළඟ පෙනෙන ඇස් කණ්ණාඩි 1,950ක් හිටපු සමාජ සේවා අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් වෙත භාරදුන් බවට ලේඛණවල සඳහන් වුවද එම කණ්ණාඩි බෙදාහැරීම පිළිබඳ සාක්ෂි නොතිබීම.

- කණ්ණාඩි මිලදී ගැනීමට පෙර, ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබීම.

- රෝද පුටු ලබා ගැනීමට සුදුසුකම් සහිත පුද්ගලයින් විසින් නියමිත පරිදි ඉදිරිපත් කළ ඉල්ලීම් ගැන නොසලකා, රු.මිලියන 2.7ක් වටිනා රෝද පුටු 181ක් අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් ඇතුළු විවිධ දේශපාලන පාර්ශවයන් වෙත නිකුත් කර තිබුණු නමුත් බෙදාහැරීම පිළිබඳ වාර්තා කාර්යාලයේ නොතිබුණි.

- 2014 වර්ෂයේ දී අඩු ආදායම්ලාභීන්ට රු. 3,000ක මුදල ආධාර දීමේ දී, එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රදේශයකට 65 බැගින් තෝරා ගත යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක් සඳහා ප්‍රතිලාභීන් 2,213ක් වෙනුවෙන් 2013 වර්ෂයේ දී රු. මිලියන 32.93 ක් නිදහස් කර තිබූ අතර, 2014 දෙසැම්බර් මස ගම්පහ දිස්ත්‍රික්කයේ ආධාර ගෙවීම් සඳහා රු. මිලියන 9.35 ක අධික වියදමක් දරා තිබුණි.

# තාක්ෂණය

තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය යටතේ වූ ආයතනවල විගණනයේදී අනාවරණය වූ ප්‍රධාන විගණන සොයාගැනීම් පහත දැක්වේ.

## විද්‍යාත්‍ම වැඩසටහන

- විධිමත් පරිදී පවරා නොගත් රජයට අයත් ඉඩම්වල භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මිලියන 306.10 ක් උපයෝගී කරගෙන 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විද්‍යාත්‍ම සම්පත් මධ්‍යස්ථාන 68ක් ඉදි කර තිබුණි.

- යෝජිත විද්‍යාත්‍ම මධ්‍යස්ථාන 10ක ඉදිකිරීම් කටයුතු විවිධ හේතු මත කල් දමා තිබූ අතර, 2012 සැප්තැම්බර් මාසයේ දී නිම කිරීමට නියමිතව තිබූ තවත් මධ්‍යස්ථානයක ඉදිකිරීම් 2014 දෙසැම්බර් 31 දින වනවිටත් නිමකර නොතිබුණි.

## ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

- ඩිජිටල් විශ්ව ගවේෂණ දර්ශන මහජනතාවට නැරඹීමට හැකියාව ඇති කිරීම පිණිස රු. මිලියන 151.2ක් වටිනා ප්‍රක්ෂේපන යන්ත්‍රයක් ග්‍රහලෝකාගාරය සඳහා මිලදී ගෙන තිබුණු අතර, එහි පවතින කාර්මික දෝෂ හේතුවෙන් දර්ශනයන් ප්‍රදර්ශනය කිරීමට නොහැකිවී තිබුණි.

- කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබාගත් තාක්ෂණික වාර්තා අනුව පරිගණක පද්ධතියට සවිකර ඇති සමහර උපාංග පාවිච්චි කළ ඒවාය. තවද, රූපවාහිණී සංස්ථාවේ ඉංජිනේරු වාර්තා අනුව ප්‍රක්ෂේපන යන්ත්‍රයද පාවිච්චි කළ එකකි.

## ප්ලාස්ටික් අපද්‍රව්‍ය පෙට්‍රෝලියම් බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය

- 2015 වර්ෂය දක්වා වර්ෂ හයකට අධික කාලයක් තුළ රු.මිලියන 155.57 ක භාණ්ඩාගාරය අරමුදල් වැයකර තිබුණද ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉන්ධන බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු වානිජ මට්ටමින් ආරම්භ කිරීමට අපොහොසත්වී තිබුණි.

- ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය වඩාත් ආර්ථිකමය හා ඵලදායී ක්‍රියාවලියක් වන අතර ඉන්ධන නිෂ්පාදනය වියදම් අධික ක්‍රියාවලියක් වේ. තවද, නිෂ්පාදන ඉන්ධන රථවාහන ධාවනයට යොදාගත නොහැක.

- ප්ලාස්ටික්වලින් ඉන්ධන නිපදවීමේ තාක්ෂණය සොයාගත් පුද්ගලයාට 2012 වර්ෂයේ සිට මසකට රු.75,000 ක දිමනාවක් ද එහි ප්‍රධාන විධායක නිලධාරීට මසකට රු.125,000 ක දීමනාවක් ගෙවා තිබුණි.

## ජාතික නිනිති තාක්ෂණ වැඩසටහන

- නැනෝ තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කිරීමට අදාල ඉඩම සඳහා රු.මිලියන 304.07ක් ගෙවා තිබුණද, භූමියේ අයිතිය විධිමත් ලෙස පවරාගෙන නොතිබියදී භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් රු.මිලියන 823.6ක් වැයකර තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කර තිබුණි.

- රු.මිලියන 2,207ක් වැයකර නැනෝ තාක්ෂණ උද්‍යානය සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනය, ඉදිකර තිබුණු අතර එම ආයතනවල අරමුණ මේ දක්වා ඉටුවී නොතිබුණි.

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

ජාතික ආර්ථිකයේ සියළු අංශවල ප්‍රමිතිකරණය, මිනුම්, තත්ත්ව සහතික කිරීම හා ඒ හා සම්බන්ධ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේ හා ඒ සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පිහිටුවා තිබූ නමුත්, ආයතනයේ අරමුණුවලට පටහැනි පහත සඳහන් ක්‍රියාකාරකම් විගණනයේ දී අනාවරණය විය.

- ශ්‍රී ලංකා ප්‍රමිති අංක 107 : 2008 යටතේ පිරිවිතර වලට අනුගත නොවූ සිමෙන්ති කි.ග්‍රෑම්. 12,060,000ක් වෙළෙඳපොලට නිකුත් කිරීම.

- සිමෙන්ති සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති අංක 107: 2008 හි 5.1 (h) ඡේදයට පටහැනිව නිෂ්පාදකයා විසින් ඇසුරුම් කල දින සිට දින 90ක් දක්වා වලංගු බව සඳහන් කර තිබූ සිමෙන්ති කිලෝග්‍රෑම් 336,500ක් සඳහා "සිමෙන්ති තොග නිදහස් කළ හැකිය" යනුවෙන් සඳහන් කොට අනුමත කිරීමටම දින 90කට ආසන්න කාලයක් ගතවී තිබීම.

- 2013 හා 2014 වර්ෂ වලදී ආනයනය කරන ලද සිමෙන්ති කි.ග්‍රෑම් 13,944,000ක් පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර වෙළඳපොළට මුදාහැර තිබීම.

- ආනයනය කරන ලද ඇමරිකානු ඩොලර් 2,951,574 ක් වටිනා ප්‍රතිදීප්ත විදුලි පහන් තොග කිලෝ ග්‍රෑම් 234,640ක් ශ්‍රී ලංකා ප්‍රමිති අංක 1231:2002 හි සඳහන් Harmonic Current Limits සහ SDCM Value යන අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව නිදහස් කිරීම.

# උසස් අධ්‍යාපනය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටවනු ලැබූ විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පොදු ජනතාවට වගකිව හැකි විශ්වවිද්‍යාල ක්‍රමයක් සඳහා අවශ්‍ය කෙරෙන සම්පත් සැපයීම හා උසස් අධ්‍යාපනය පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන් සමඟ සහයෝගයෙන් අධ්‍යාපන පාඨමාලාවන්හි විවිධත්වය සහ ගුණත්වය සහතික කිරීම සඳහා ඉගැන්වීම් සහ පර්යේෂණ වැඩ ප්‍රසස්ථ මට්ටමින් නිර්මාණය කිරීම සඳහා ධාරිතාවයන් සැපයීම සිදුකරන අතර මෙම කාර්යයන් සඵල කර ගැනීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2014 වර්ෂය අවසාන වනවිට විශ්වවිද්‍යාල 15 ක් ස්ථාපිත කර තිබුණි. මෙම විශ්වවිද්‍යාල 15ට අනුබද්ධිත ආයතන 17 ක් හා මණ්ඩප 03 ක් ද ස්ථාපනය කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය සහ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක කර ඇත. මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

## විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම

2014 වර්ෂය තුළ ලෝක විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම් ලේඛනය අනුව, ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල 15 න් කොළඹ, මොරටුව, පේරාදෙණිය යන විශ්ව විද්‍යාල 2251 සිට 2810 අතර පරාසයක පැවති අතර රුහුණ, කැළණිය, ශ්‍රී ජයවර්ධනපුර ශ්‍රේණිගත කිරීම් ලේඛනයේ 3000 සිට 5000 අතර ද අනෙකුත් විශ්වවිද්‍යාල 6097 සිට 16071 අතර ශ්‍රේණිගත වී තිබුණි. මෙය 2013 ශ්‍රේණිගත කිරීම් සමඟ සැසඳීමේදී විශ්වවිද්‍යාල 12 ක් පහත වැටී ඇති බව නිරීක්ෂණය විය.

## උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාවන්

2013 / 2014 අධ්‍යනය වර්ෂය සඳහා විශ්ව විද්‍යාල වලට ඇතුළු වීමට පැරණි හා නව නිර්දේශ වලින් සුදුසුකම් ලත් ශිෂ්‍යයින් 143,739 ගෙන් ශිෂ්‍යයින් 25,200 දෙනෙකුට ඒ සඳහා අවස්ථාව ලද අතර එය සුදුසුකම් ලැබූවන්ගෙන් සියයට 17.53 කි. ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ ශිෂ්‍යයින් 144,816 ක් සුදුසුකම් ලබා තිබූ අතර ශිෂ්‍යයින් 24,198 ක් විශ්ව විද්‍යාල වලට බඳවා ගන්නා ලදි. එය සුදුසුකම් ලැබූවන්ගෙන් සියයට 16.71 කි . ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 0.8 කින් බඳවා ගැනීමේ වර්ධනයක් පෙන්වා තිබුණි.

දේශිය ශිෂ්‍යයින් සඳහා විදේශ විශ්වවිද්‍යාල වල උපාධි ලබාගැනීම සඳහා විදේශ ශිෂ්‍යත්ව පිරිනමා තිබූ අතර ඒ සඳහා 2014 වර්ෂයේ පූර්ව උපාධි හා පශ්චාත් උපාධි විදේශ ශිෂ්‍යත්වලාභීන් 242 කට ද විදේශ සිසුන් 38 කටද මෙරට ශිෂ්‍යත්ව ලබාදී තිබුණි.

2014 වර්ෂයේ විශ්ව විද්‍යාල සඳහා පුනරාවර්ථන රු.මිලියන 20,841 ක් සහ ප්‍රාග්ධන රු.මිලියන 10,945 ක් වශයෙන් රු.මිලියන 31,786 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2013 වර්ෂයේ ලබා දී තිබූ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් හා සැසඳීමේදි එය පිළිවෙලින් රු.මිලියන 2,525 කින් හා 2,421 කින් වැඩි වීමකි.

## ශිෂ්‍ය සුභසාධන

### ශිෂ්‍යාධාර හා ශිෂ්‍යත්ව

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2014 වර්ෂයේ විශ්වවිද්‍යාල 12 ක ශිෂ්‍යයන් 28,214 කට හා 2013 වර්ෂයේ ශිෂ්‍යයන් 27,488 කට මහපොළ ශිෂ්‍යත්ව ලබාදී තිබූ අතර 2013 හා සැසඳීමේදී 2014 වර්ෂයේ ශිෂ්‍යයන් 726 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 604 ක් විය. 2014 වර්ෂයේ ශිෂ්‍යයන් 22,730 කට ද 2013 වර්ෂයේ ශිෂ්‍යයන් 20,009 කටද ශිෂ්‍යාධාර ලබාදී තිබූ අතර 2013 ට සාපේක්ෂව 2014 වර්ෂයේ ශිෂ්‍යයන් 2721 ක වැඩිවීමක් දක්නට ලැබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 254 ක වැය බරක් දරා තිබුණි.

### නේවාසිකාගාර

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නේවාසික ශිෂ්‍යයන් සංඛ්‍යාව 12,000 කින් වැඩකිරීමේ මූලික අරමුණින් රු. මිලියන 13,200 ක් ප්‍රතිපාදන වෙන්කර එක් නේවාසිකාගාරයක් සඳහා රු. මිලියන 220 ක සාමාන්‍ය වියදමක් ඇස්තමේන්තු කර විශ්වවිද්‍යාල තුල නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ලද ආරම්භ කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට ඉදිරිපත් කරන ලද තොරතුරු මත රු.මිලියන 5,856 ක වියදමක් දරා නේවාසිකාගාර 30 ක වැඩ අවසන් කර ඇති බවත් නේවාසිකාගාර 24 ක වැඩ නොනිමි තත්ත්වයක පවතින බවත් නේවාසිකාගාර 6 ක වැඩ ආරම්භක කර නොමැති බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය අදාල අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2015 දෙසැම්බර් 31 දිනට අවසන් විය යුතු බවත් දක්වා තිබුණි.

2014 වර්ෂයේ විශ්වවිද්‍යාල 12 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 35,585 කට එනම් සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 43 කට නේවාසිකාගාර පහසුකම් ලබාදී තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 258 ක් වැයකර තිබුණි. 2013 වර්ෂයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 21416 කට එනම් සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 27 කට රු.මිලියන 305 ක් වැයකර නේවාසිකාගාර පහසුකම් සපයා දී තිබූ අතර 2014 වර්ෂයේදී 2013 ට සාපේක්ෂව ශිෂ්‍යයන් 14,169 කට වැඩියෙන් පහසුකම් ලබා දී තිබුණි.

### පැමිණීම හා පිටවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම , පිටවීම හා නිවාඩු සඳහා ලේඛණ නඩත්තු කළ යුතු වුවත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය හා ඒ හා සම්බන්ධ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම ද ඔවුන් ලබාගත් නිවාඩු පිළිබඳ ලේඛණද නඩත්තු කර නොතිබුණි. එම හේතුවෙන් 2013 වර්ෂයේදී ලබාගත් තොරතුරු අනුව විශ්වවිද්‍යාල 09 යක ආචාර්යවරු 4070 ක් පැමිණීම , පිටවීම සටහන් නොකර වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 6,500 ක් ලබාගෙන තිබුණු අතර 2014 වර්ෂයේදී එම විශ්වවිද්‍යාල 09 හි ආචාර්යවරුන් 4149 ක් පැමිණීම හා පිටවීම සටහන් නොකර රු. මිලියන 7,135 ක වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. මෙය එම විශ්වවිද්‍යාල 09 හි වැටුප් හා දීමනා මුදලෙහි වියදම් වලට ප්‍රතිශතයක්

වශයෙන් පිළිවෙලින් සියයට 36 ක් හා සියයට 40 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දරා ඇති වැටුප් හා දීමනා නිසිලෙස විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## ඒක ශිෂ්‍ය පිරිවැය

විශ්වවිද්‍යාල 11 ක 2014 වර්ෂයේ (විවෘත විශ්වවිද්‍යාලයේ හැර) එක් සිසුවෙක් වෙනුවෙන් දරා ඇති සාමාන්‍ය වියදම රු.285,594 කි. එක් සිසුවෙක් වෙනුවෙන් දරන ලද උපරිම වියදම වූ රු.365,475 ක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ද අවම වියදම වූ රු.112,803 ක් රජරට විශ්වවිද්‍යාලයෙන්ද වාර්තා විය.

## කාර්යසාධනය

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා කුසලතාවයන් සංවර්ධනය කිරීම වෙනුවෙන් නායකත්ව පුහුණු වැඩසටහන් ආරම්භ කර තිබුණි. 2014 වර්ෂයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 18,740 කට රු. මිලියන 265 ක් වැය කරමින් පුහුණුවීම් ක්‍රියාත්මක කර තිබුණු අතර 2013 වර්ෂයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 17,568 කට රු. මිලියන 136 ක් වැය කරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. 2013 වර්ෂයට වඩා 2014 වරශයේ සිසුන් 1172 කට නායකත්ව පුහුණුව ලබා දී තිබුණු අතර වියදම් ද රු.මිලියන 129 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## උසස් අධ්‍යාපනය සඳහා අවස්ථානයන්

2014 හා 2013 වර්ෂයන් තුළ විවිධ උපාධි පාඨමාලා හදාරා පිළිවෙලින් උපාධිධාරීන් 32905 ක් හා 22087 ක් පිටව ගොස් තිබුණි. 2013 වර්ෂය සමඟ සැසඳීමේදී එය සියයට 49 ක වර්ධනයකි. කෙසේ වෙතත් රැකියා වෙළඳපොලට සරිලන ආකාරයේ පාඨමාලාවන් හඳුන්වාදීමේ ක්‍රමවේදයන් තවදුරටත් වර්ධනය කරගැනීම වඩාත් ඵලදායී බව නිරීක්ෂණය විය.

## උපයන ලද ආදායම්

විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව විශ්වවිද්‍යාල පිහිටුවීමේ අරමුණ වනුයේ උසස් අධ්‍යාපනය , වර්ධනය කිරීම සඳහා උපාධි, පශ්චාත් උපාධි, ආචාර්ය උපාධි වැනි පාඨමාලාවන් පවත්වාගෙන යාම වන අතර ස්වයං ආදායම් ඉපයීම සඳහා සෑම විශ්වවිද්‍යාලයක්ම හා ඒ සම්බන්ධ ආයතන විසින් සහතික පත්‍ර ඩිප්ලෝමා පාඨමාලා, පශ්චාත් උපාධි වැනි දෑ පවත්වා ආදායම් උපයාගැනීමේ ක්‍රමවේදයට අනුගතවී තිබුණු අතර ඉදිරිපත්කර තිබුණු තොරතුරු අනුව පාඨමාලා 342 ක් විශ්වවිද්‍යාල වල පවත්වා රු. මිලියන 1,604 ක ආදායමක් උපයා මෙම ආදායමින් සියයට 10 ක් පමණක් විශ්වවිද්‍යාලවල පොදු අරමුදලට බැරකර තිබුණු අතර අනෙකුත් ආදායම් සම්පත් දායකයන් සහ විවිධ අරමුදල් වලට බැරකර තිබුණි. විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල බාහිර පාඨමාලා පැවැත්වීම සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකඟතාවය හා පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

## අභ්‍යන්තර හා බාහිර පර්යේෂණ

2014 වර්ෂයේ විශ්වවිද්‍යාල 09 ක ආචාර්යවරුන් 2230ක් සඳහා පර්යේෂණ දීමනා වශයෙන් රු.මිලියන 397 ක මුදලක් ගෙවා තිබුණද, පර්යේෂණ යෝජනා සනාතන සභාව විසින් පිළිගත් කමිටුවකට ඉදිරිපත් කර නොතිබුණු අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර, ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් සිදුකර ආචාර්යවරුන් සඵලදායීව මෙම කටයුතු සඳහා යොදා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

## ගිවිසුම් කඩකිරීම්

1980 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල 11 ක ගිවිසුම් බැඳුම්කර කඩකරන ලද කථිකාචාර්යවරුන් 129 ක් සිටින අතර මෙම කථිකාචාර්යවරුන්ගෙන් රු.මිලියන 453 ක මුදලක් අයකර ගැනීමට තිබුණු අතර ඒ තුළ විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල අණපනත් වලට අනුකූල වන පරිදි ගිවිසුම් කොන්දේසි ඇතුළත් නොකිරීම හේතුවෙන් අයකරගත නොහැකි තත්ත්වයක් උදාවී තිබුණු ශේෂයක් පැවති අතර එම මුදල් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලින් විශ්වවිද්‍යාල පනතට අනුකූලව අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණු අතර අණපනත් වල දැක්වෙන කොන්දේසි වලට අනුකූලව නිසි පරිදි ගිවිසුම් අත්සන් කරවා නොගැනීමෙන් විශ්වවිද්‍යාල අරමුදලට සිදුවී ඇති පාඩුව සම්බන්ධව වගකිවයුතු නිළධාරින් සම්බන්ධයෙන්ද විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල

විශ්වවිද්‍යාල පද්ධතිය තුළට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව ලබාදීමේ මූලික අරමුණින් ආරම්භකර පවත්වාගෙනයන විවෘත විශ්වවිද්‍යාලයෙන් 2014 වර්ෂය තුලදී පාඨමාලා 67 කට සිසුන් 41344 ක් බඳවාගෙන තිබුණු අතර 2014 වර්ෂයේදී රු.මිලියන 953 ක් වූ ආදායමක් ලබා තිබුණි. 2013 වර්ෂය තුලදී පාඨමාලා 67 කට සිසුන් 38294 ක් බඳවාගෙන රු.මිලියන 611 ක් උපයාගෙන තිබුණ අතර ඒ අනුව 2013 වර්ෂය හා සැසඳීමේදී 2014 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම් සියයට 8 කින් වැඩි වී තිබුණ අතර ආදායම සියයට 56 කින් වැඩි වී තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුලදී සිසුන් 6450 ක් විවිධ පාඨමාලා හදාරා නිමකර සහතික පත් ලබාගෙන තිබුණි.

## සප්ත වාර්ෂික නිවාඩු

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 36 පරිච්ඡේදයේ 36.1 වගන්තිය ප්‍රකාරව සප්ත වාර්ෂික නිවාඩු අනුමත කරගෙන ඇති අයවලුන් තාවකාලිකව විශ්වවිද්‍යාලවල පරිපාලනයට සම්බන්ධ වැදගත් මූල්‍යාධිකාරී, ලේඛකාධිකාරී, පුස්තකාලාධිපති වැනි තනතුරුවල කටයුතු කිරීම හේතුවෙන් විශ්වවිද්‍යාල වල මූල්‍ය හා පරිපාලනය විධිමත්ව කරවාගැනීමට නොහැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ අතර මෙම සප්ත වාර්ෂික නිවාඩු මත සිටින බොහෝ නිලධාරීන් රාජ්‍ය ආයතනවලට සේවය කිරීම හේතුවෙන් ඔවුන් විසින් ඒකාබද්ධ අරමුදලෙන් දෙවතාවක් වැටුප් හා දීමනා ලබාගන්නා බවද නිරීක්ෂණය විය.

# රාජ්‍ය ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍ය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීම, රාජ්‍ය ආරක්ෂාව සහ රට තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වන අතර එය ඉටු කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ප්‍රධාන වශයෙන් ත්‍රිවිධ හමුදාවන්, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව භෞමික අඛණ්ඩතාවය හා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

උතුරේ පැවති යුද්ධය අවසන් වීමෙන් පසුව ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින්ගේ නිෂ්ක්‍රීය ශ්‍රමදායකත්වය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉටුකරන ප්‍රධාන ව්‍යාපෘති හරහා මෙන්ම ස්වාධීනව හමුදා යාන්ත්‍රණය තුළින් සුළු පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා විවිධ ව්‍යාපෘතිවලට දායකත්වය ලබාදී ඇත. ඉහත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා පූර්ව වර්ෂ දෙකක දී දරා ඇති වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පුනරාවර්තන | 231,250.45 | 199,371.13 | 184,221.91 |
| ප්‍රාග්ධන | 38,041.20 | 29,809.87 | 16,049.34 |
| **එකතුව** | **269,291.65** | **229,181.00** | **200,271.25** |

ඉහත දත්තයන් විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති සෑම ආයතනයකම වාර්ෂික වියදම ඉහළ ගොස් ඇති බවයි.

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන සියළුම ආයතනවල පොදුවේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී පවත්නා නීති, රීති රෙගුලාසිවලට පටහැනිව සිදුවන අවස්ථා නිරතුරුව නිරීක්ෂණය වන අතර එම ආයතනවල ද්‍රවශීලතාවය පිළිබඳ ගැටළු මෙයට බොහෝ සෙයින් ඉවහල්වී ඇත. මේ අනුව මෙම ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. එමෙන්ම විවිධ ව්‍යාපෘති හරහා මෙම ආයතන උපයා ගනු ලබන ආදායම් චක්‍රලේඛ ප්‍රකාරව රජයේ ආදායමට බැර නොකර වෙනම අරමුදල් පවත්වා ගනිමින් එම මුදල් නිලධාරින්ගේ සුභ සාධන කටයුතුවලට යොදවා ගැනීමද නිරීක්ෂණය කර ඇත.

### විගණන නිරීක්ෂණ

- විගණනයට ඉදිරිපත් කළ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,058,093 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 27 දක්වා කාල පරාසයක් ගතවී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

- 2008 නොවැම්බර් 04 දින රු. මිලියන 2.07 ක මුදලක් වැයකර මිල දී ගෙන තිබුණු ඡායා පිටපත් යන්ත්‍රය ඇතුළු අනෙකුත් යන්ත්‍ර කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වර්ෂ 03 කට ආසන්න කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවතුණි.

- හෝටල් ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය පිහිටා තිබුණු ඉඩම විදේශීය සමාගමකට රු. මිලියන 19,817.31 කට විකුණා ලද මුදල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාවට පටහැනිව අකුරේගොඩ ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම සඳහා මහාභාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ලබාදී තිබුණු අතර එම මුදල භාණ්ඩාගාර බිල්පත්වල සහ ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර සමාලෝචිත වර්ෂය තුළ රු.925,925,814 ක පොළී ආදායමක් උපයා තිබුණි. තවද රු. මිලියන 5,211.16 ක මුදලක් අදාල ඉදිකිරීම් සඳහා වැයකර තිබුණි.

- රු.මිලියන 42,032 ක වටිනාකමැති කොළඹ අග නගර සංවර්ධනය සහ ගං වතුර පාලනය කිරීමේ ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ පැවති අතර මෙම ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි ව්‍යාපෘති සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ව්‍යාපෘති කාලයෙන් සියයට 50 ක් ඉක්මවන අවස්ථාවේදී ව්‍යාපෘතියේ මූල්‍ය උපයෝජනය සියයට 17.3 ක් පමණක් පැවති අතර ව්‍යාපෘති ආරම්භයේදී ක්‍රියාත්මක කළ හැකිව තිබුණු උප සංරචකයන් 10 කින් 4 ක් සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි.

- යල් පැනීම හේතුවෙන් 2011, 2012 සහ 2013 යන වර්ෂවල මිලදී ගත් රු.577,170 ක් වටිනා ටෝනර් 55 ක් 2015 මාර්තු 17 දින පැවති වෙන්දේසියකදී රු.1,200 කට විකුණා තිබුණි. ගබඩාවේ තොග තත්ත්වය නොසලකා ටෝනර් මිලට ගෙන නව තොග පාවිච්චියට ගැනීම හේතුවෙන් මෙම යල් පැනීම සිදුවී තිබුණු අතර එයින් ඒකාබද්ධ අරමුදලට සිදුවූ අලාභය රු.575,970 ක් ලෙස හඳුනාගෙන තිබුණි.

- අමාත්‍යාංශයේ මානව සම්පත් තොරතුරු පරිගණක ගත කිරීම සඳහා රු.893,985 ක් වැයකර සර්වර් පද්ධතියක් මිලට ගෙන තිබුණු අතර මිලදී ගෙන මාස 07 ක පමණ කාලයක් ගත වී තිබුණ ද තොරතුරු පරිගණක ගත කිරීමේ දී පැනනැගුණු ගැටළු හේතුවෙන් අතරමග නවතා දමා තිබුණි.

- ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව බාහිර පාර්ශවයන්ට සපයනු ලබන සේවාවන්ගෙන් උපයනු ලබන ආදායම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව සහ 2009 පෙබරවාරි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර නොකිරීම නිවැරදි කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් රටේ ආර්ථික සංවර්ධනය උදෙසා ව්‍යාපෘති 33 ක් වෙනුවෙන් දායකත්වය ලබාදී තිබුණු අතර පොදු මහජන යහපත උදෙසා විවිධ වැඩසටහන් උතුරු නැගෙනහිර පළාත් ඇතුලු ප්‍රදේශ ගණනාවක පවත්වා තිබුණි. නගර සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 2,379 ක් වැයකර තිබුණු අතර මාර්ග සංවර්ධනය හා වෙනත් ව්‍යාපෘති වෙනුවෙන් යන්ත්‍රෝපකරණ හා භට පිරිස් යොදවා තිබුණි. පුද්ගල නාශක බෝම්බ 2,909 ක්, යුධ ටැංකි නාශක බෝම්බ 32 ක් සහ වෙඩි බෙහෙත් තොග 34,930 ක් ඉවත්කර තිබුණි. තවද වර්ෂය තුළ දී ස්වභාවික හා ස්වභාවික නොවන ආපදා තත්ත්වයන් වලදී පොදු මහජනතාවට සහන සැලසීම සඳහා ශ්‍රමදායකත්වය ලබාදී තිබුණි.

### විගණන නිරීක්ෂණ

- විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 422.37 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 01 සිට වර්ෂ 05 ක් දක්වා වූ කාල පරාසයක් ගතවී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

- මියගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු. මිලියන 5.69 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබු අතර ඉන් රු. මිලියන 1.03 ක ශේෂයන් අවුරුදු 05 ක් ඉක්මවූ ශේෂයන් බව නිරීක්ෂණය විය. එමෙන්ම විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු වූ රු. මිලියන 49.08 ක ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී රාගම පිහිටි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 10 ක ඉඩමක නිරවුල් අයිතිය ලබාගැනීමෙන් තොරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද්ධෝපකරණ ගබඩාව ඉදිකිරීම සඳහා යුද්ධ හමුදාව විසින් 2014 වර්ෂයේ දී රු. මිලියන 362.71 ක් වැයකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

- මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුව, පරිපූරක ඇස්තමේන්තුව හා මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම්වල එකතුව ඉක්මවා වැය දැරීම මෙන්ම බැරකම්වලට බැඳීම නොකළ යුතු බව දක්වා ඇතත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වැය විෂයයන් 06 කට අදාල ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු. මිලියන 91.59 ක බැරකම්වලට බැඳී තිබුණි.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා නාවික හමුදාව 2014 වර්ෂයේදී සෝමාලි මුහුදු කොල්ලකරුවන් ගෙන් ශ්‍රී ලංකා මුහුදු සීමාව ආරක්ෂා කරගැනීම සාර්ථක ලෙස ඉටුකර තිබුණු අතර නීති විරෝධි සංක්‍රමණිකයින් හා විගමනකයින් අත්අඩංගුවට ගෙන තිබුණි. එසේම රට තුළට ගෙන ඒමට උත්සාහ කළ මත්ද්‍රව්‍ය කිලෝ 397.55 ක් හා සිගරට් තොගයක් ද සමඟ පුද්ගලයින් 121 දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබුණි. රජයේ විවිධ ආයතනවල ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් සඳහා රු. මිලියන 798.33 ක ශ්‍රමදායකත්වයක් ලබා දී තිබුණු අතර 2014

වර්ෂය තුළදී ගංවතුර ආපදා තත්ත්වයන්ට ගොදුරු වූ පුද්ගලයින් 719 ක් බේරාගැනීමට කටයුතු කර තිබුණි. නාවික සෙබළුන් හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරි සඳහා යෙදවීම මගින් රු. මිලියන 67.02 ක විදේශ විනිමයක් 2014 වර්ෂය තුළ දී උපයා ගෙන තිබුණි.

## විගණන නිරීක්ෂණ

- ශ්‍රී ලංකා නාවික හමුදාවේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 12.25 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

- 2011 ජුනි මස 11 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේ සාකච්ඡා සටහන් වාර්තාවේ 07 වන කරුණ ප්‍රකාරව මිල දී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ ශ්‍රී ලංකා නාවික හමුදාවට ලැබීමට පෙර චෙක්පත් ලිවීම සහ සැපයුම්කරුවන්ට චෙක්පත් ලබාදීමේ පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් ක්‍රමය සම්පූර්ණයෙන් වැරදි ගනුදෙනුවක් බැවින් එය වහාම නිවැරදි කරන ලෙස උපදෙස් ලබාදී තිබුණද ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2011 ජුලි සිට 2014 අප්‍රේල් දක්වා කාලය තුළ එම ක්‍රමය උපයෝගී කර ගනිමින් අවස්ථා 6,720 කදී රු. මිලියන 2,091.96 ක් වූ මුදලක් වැය කර භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

- 2009 පෙබරවාරි 03 දිනැති කැබිනට් මණ්ඩල තීරණය, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 දෙසැම්බර් 09 දිනැති ලිපිය, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 ජුනි 28 දිනැති ලිපිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බාහිර පාර්ශවයන්ට සපයනු ලබන සේවාවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී උපයන ලද රු. මිලියන 1,048.09 ක් වූ ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

- ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා සපත්තු කුට්ටම් 7,000 ක් මිල දී ගැනීමේදී පළමු වරට මිල ගණන් කැඳවා නිර්දේශ වූ මිල ප්‍රතික්ෂේප කර දෙවන වර මිල ගණන් කැඳවා වැඩි මිලට මිලදී ගැනීම හේතුකොට ගෙන ශ්‍රී ලංකා නාවික හමුදාවට රු. මිලියන 5.98 ක පාඩුවක් සිදුවී තිබුණි.

- විදුලි බිල්පත්වලට නියමිත දිනයේ දී මුදල් නොගෙවීම හේතුකොටගෙන ලංකා විදුලිබල මණ්ඩලයට දඩ පොලිය වශයෙන් රු. මිලියන 4.83 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි.

- ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2011 වර්ෂයේදී ඇණවුම් 5 කට අදාළ රු. මිලියන 15.91 ක මුදල මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට පටහැනිව සහ සුරකුම් ලබාගැනීමකින් තොරව ඇණවුම් අවස්ථාවේදී ගෙවා තිබුණු අතර වසර 03 ක් ඉක්මයාමේදී සපයා තිබුණු භාණ්ඩවල වටිනාකම රු. මිලියන 10.76 ක් විය. ඉතිරිය වූ රු. මිලියන 5.15 ක් වූ මුදල අධිකරණ ක්‍රියාමාර්ගයක් මත පොලී රහිතව වාරික 12 කින් 2014 ජුනි සිට අයකර ගැනීමට සිදුවී තිබුණි. රජය අයවැය හිඟය පියවා ගැනීම සඳහා ලබාගන්නා ණය වෙනුවෙන් විශාල පොලියක් ගෙවන තත්ත්වයක් තුළ

එපරිදි පොලියට ලබාගත් මුදල් ඉහත දැක්වෙන පරිදි පෞද්ගලික ආයතනයක පරිහරණය සඳහා පොළී රහිත ණය මුදලක් ලෙස ලබා දී තිබුණි.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

සමාලෝචිත වර්ෂය තුළ දී ගුවන් පැය 13,209.55 ක් පියාසර කර තිබුණු අතර ඉන් ගුවන් මෙහෙයුම් කටයුතු සඳහා පැය 2,138.55 ක් යොදවා තිබීම හා නියමුවන් රහිත ගුවන්යානා වලින් නිරීක්ෂණ පියාසර පැය 64.33 ක් මඟින් සහාය දැක්වීමත් , ත්‍රිවිධ හමුදාවේ 25,970 කට ගුවන් ප්‍රවාහන පහසුකම් සලසාදීමත් සිදුකර තිබුණි. එසේම මුලතිව් ගුවන් පථය ඉදිකිරීම, දිගන හා මඩකලපුව ගුවන් ගමන් අංශයන් ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන 25.12 ක් රු.මිලියන 21.69 ක් සහ රු. මිලියන 21.55 ක් වැයකර තිබුණු අතර 2014 වර්ෂය තුළදී හයිටි රාජ්‍ය වෙත සාම සාධක නිලධාරීන් යොමු කරවීම මඟින් ඇ.ඩො.576,890 ක් විදේශ විනිමය උපයාගැනීමත්, ගුවන් ප්‍රවාහන සේවා සැපයීම මඟින් රු. මිලියන 248.70 ක ආදායමක් රැස්කිරීමත් සිදුකර තිබුණි.

ඊට අමතරව " අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතිය" සඳහා මිනිස් දින 103,660 ක් යෙදවීම මඟින් නිලධාරීන්ගේ නිවාස ඉදිකිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදී තිබුණු අතර රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් සහ අළුත්වැඩියාවන් කිරිමේ කාර්යයන්වලටද දායකත්වය ලබාදී තිබුණි.

### විගණන නිරීක්ෂණ

- ගුවන් යානා කුලී ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරියා වූ ගුවන් හමුදාපති හෝ ඔහුගේ අධිකාරිලත් වෙනත් නිලධාරියෙකු විසින් එම ආදායම් රැස්කිරීම සිදුකළ යුතු වුවත්, ගුවන් හමුදා නිලධාරින් කිහිපදෙනෙකු විසින් පිහිටුවා ගත් පෞද්ගලික සමාගමක් විසින් එම කටයුතු සිදුකර තිබුණි. එසේ රැස්කර ගෙන තිබු ගුවන් යානා කුලී ආදායමෙන් රු.මිලියන 23.04 ක් එකී ආදායම් ශීර්ෂයට බැර කිරීමට කටයුතු නොකර රජයේ ගිණුමක් නොවන විධායක සුබසාධන අරමුදල නම් වූ ගුවන් හමුදාවේ අභ්‍යන්තර අරමුදලකට බැර කර තිබුණි.

- ගුවන් හමුදාවේ ස්ථාවර වත්කම් විධිමත් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයක සටහන් කර නොතිබු අතර, 2014 වර්ෂය තුළ මිලට ගත් ස්ථාවර වත්කම් විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ හා ඩීජීඑස්ජී 4 ආකෘතියේ සටහන් කිරීමේදී ප්‍රමාණාත්මක වෙනස්කම් දක්නට ලැබුණි.

- 2014 ජනවාරි 01 දිනට පැවති රු. මිලියන 4,278.07 ක බැරකම්, එම වර්ෂය තුළ ගොඩනැඟුණු බැරකම් හා 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 3,949.12 ක බැරකම් සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගත හැකි වන පරිදි බැරකම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණු අතර වර්ෂය අවසානයට පැවති බැරකම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

- උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී නිලධාරීන්ට ලබාදී තිබූ සමහර දීමනා සැලකිල්ලට ගෙන නොතිබුණි. මේ හේතුව නිසා 2014 ජූලි මස සෝදිසි විගණනයට ලක්කළ නිලධාරීන් 50 දෙනෙකුට අදාලව රු.16,019 ක් අඩුවෙන් එම බදු ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

- රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කර තිබූ රණවිරු රියල්ස්ටාර් වැඩ සටහනේ අවසන් අදියරේදී, ගුවන් හමුදාවෙන් ඉදිරිපත් වූ තරගකරුවන් ඉදිරියට ගෙන ඒම වෙනුවෙන් එම තරගකරුවන්ගේ අංක වලට කෙටි පණිවුඩ යැවීම සඳහා ගුවන් හමුදා ප්‍රතිපාදනවලින් රු. මිලියන 20.91 ක් වැයකර තිබුණි.

- මුදල් රෙගුලාසි 95 යටතේ ගුවන් හමුදාවට සිවිල් සේවකයින් බඳවා ගෙන එම සේවකයින් ගුවන් හමුදාවේ කාර්යයන්ට පරිබාහිර වූ කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණු අතර එම සේවකයින්ට ගුවන් හමුදාවේ ප්‍රතිපාදනවලින් 2013 වර්ෂය තුළ රු. මිලියන 15.89 ක්ද 2014 ජනවාරි සිට අගෝස්තු දක්වා රු. මිලියන 15.65 ක්ද වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

- භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2014 නොවැම්බර් 19 දිනැති අංක බීඩී/එන්එෆ්/103/03/09/30 දරන ලිපිය පරිදි බාහිර පාර්ශවයන් වෙත සේවා සැපයීමෙන් උපයනු ලබන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් ගුවන් හමුදාවේ භෞතික හා මානව සම්පත් උපයෝගී කර ගනිමින් පවත්වා ගෙන යනු ලබන අරමුදල් 96 ක් සම්බන්ධයෙන් උපයනු ලබන ආදායම් එසේ ඒකාබද්ධ අරමුදලට බැර නොකර ගුවන් හමුදා අරමුදල් ගිණුම්වලට බැර කර තිබුණි.

- 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී ප්‍රසම්පාදන කටයුතු සඳහා ඇස්තමේන්තු කළ රු.මිලියන 1,245.61 ක ප්‍රාග්ධන වියදම් හා රු.මිලියන 8,131.97 ක පුනරාවර්තන වියදම් එම සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද එම සැලැස්මට ඇතුළත් කර තිබූ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන්ද සැලසුම් කර තිබූ ක්‍රමවේදයන් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකරන්නේද යන්න තහවුරු කර ගත හැකි වන පරිදි වාර්තා නඩත්තු කිරීමක් හෝ පාලන ක්‍රම හඳුන්වාදීමක් සිදුකර නොතිබුණි.

- නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මසකට රු.50,000 බැගින් වාහන 15 ක් කුලියට ගැනීමේදී වර්ෂයකට ගිවිසුම් අත්සන් කර තිබූ අතර අත්තිකාරම් නොගෙවන බවට එකඟවී තිබියදී සේවාව ලබාගැනීමට පෙර සම්පූර්ණ වර්ෂයක් සඳහා කුලිය වශයෙන් එක් අයෙකුට රු.600,000 බැගින් සැපයුම්කරුවන් 15 දෙනෙකුට රු.මිලියන 9 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

## සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේදී රටේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් බලකායන් හා පුහුණු කඳවුරු 23 ක් මඟින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති සඳහා භටයින් 17,676 ක් යොදවා රු.මිලියන 371.54 ක ආදායමක් උපයා ගෙන තිබුණි. පොදු මහජන යහපත උදෙසා රාජ්‍ය ආයතනවල ආරක්ෂක රාජකාරිවල නිරතවී ඇති අතර සිවිල් ජනතාව උදෙසා සමාජ සත්කාර වැඩසටහන් මෙන්ම ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා ද දායකත්වය ලබා දී ඇත.

## විගණන නිරීක්ෂණ

- සිවිල් ආරක්ෂක හටයින් හට විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට බව දක්වමින් රු. මිලියන 13.18 ක් වැයකර උත්සවයක් පවත්වා තිබුණද ඔවුන් ස්ථිර සේවයේ පිහිටුවා පත්වීම් ලබාදීමට කටයුතු නොතිබුණි.

- කුලී ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන දෙපාර්තමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ලේ උද්‍යාන ශාලා සිවිලිම නවීකරණය සඳහා රු. මිලියන 2.73 ක් වැයකර තිබුණද, මෙම වියදම ගොඩනැගිලි කුලියෙන් අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව දෙන ලද අතුරු අග්‍රිමයක් කුමන හේතුවක් මත වුවද දෙන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවත්, අවස්ථා 18 කට අදාලව ලබාදී තිබුණු එකතුව රු. මිලියන 2.85 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. එමෙන්ම මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට මාස 12 ක කාලයක් ගතවී ඇති බව නිරීක්ෂණය විය.

- වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 39.57 ක මුදල් අදාල කාර්යය භාරයන් ඉටුනොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි

- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් විධිමත් අනුමැතියකින් තොරව වාහන 16 ක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට 2006 වර්ෂයේදී ලබාදී තිබුණු අතර එම වාහන මෙතෙක් පවරාගෙන නොතිබුණි.

- ශ්‍රී ලංකා ගුවන් හමුදා මැදිරි සංකිර්ණයේ පැවැත්වූ රණවිරු රියල් ස්ටාර් වැඩ සටහනෙහි පාවිච්චිය සඳහා රු.773,254 ක් වටිනා වායු සමීකරණ යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණු අතර පාවිච්චියෙන් අනතුරුව මාස 18 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

# වැවිලි කර්මාන්ත

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ රබර් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල, තුරුසවිය අරමුදල හා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය යන ව්‍යවස්ථාපිත ආයතන 07 ක් සහ සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම අමාත්‍යාංශයට අයත් වූ අතර ආර්ථික සාමාජීය හා පාරිසරික වශයෙන් තහවුරු වූ වැවිලි අංශයක් මඟින් වැවිලි කර්මාන්තයේ ඵලදායීත්වය, ලාභදායීත්වය සහ තිරසාරත්වය ඉහළ නැංවීම, තේ,රබර් සහ කටුපොල් වගාව ප්‍රචලිත කිරීම සහ සංවර්ධනය කිරීමේ කාර්යභාර්ය හා පර්යේෂණ කටයුතු ද පැවරී තිබුණි. තවද, අමාත්‍යාංශය සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,276.81 ක් වූ අතර ඉන් රු.මිලියන 3,914.67 ක් උපයෝජනය කර තිබුණි.

**2014 වර්ෂයට අදාල වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.**

- අමාත්‍යාංයට අයත් වාහන අනතුරට ලක් වීම නිසා වාහන 11 කට අදාලව සිදුවූ අලාභ හානි වලින් තවදුරටත් අවරණය කර ගත නොහැකි වූ රු.මිලියන 7.74 ක අලාභ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් 2009 සිට 2014 දක්වා ඉකුත් වර්ෂ 6 ට අදාල රු. මිලියන 439.76 ක හිඟ කල්බදු කුලී අයකර ගෙන නොතිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධ කොන්දේසි බදු ගිවිසුම්වලට ඇතුළත්ව නොතිබුණි.

- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ 1994 වර්ෂයේ සිට අක්‍රිය තත්ත්වයේ පවතින රබර් පාලන අරමුදල සහ රබර් නැවත වගා සහනාධාර අරමුදල ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට 2014 දෙසැම්බර් 31 දක්වාම දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

රබර් වගාවේ ජෛව විද්‍යාත්මක පර්යේෂණ, ස්වභාවික රබර් කිරි වල රසායනය සහ භාණ්ඩ නිපදවීමේ තාක්ෂණය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ආයතනයෙහි වෘත්තීමය නිපුණතාවයන් සහිත පර්යේෂණ අංශ ප්‍රධානි තනතුරු 4 ක්, ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 3 ක්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු 12 ක් සහ පර්යේෂණ නිලධාරී තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුනි.

- 2014 ජනවාරි මාසයේ දී ඇති වූ හදිසි ගින්නක් හේතුවෙන් කොටසක් විනාශ වූ ඩාර්ටන්ෆීල්ඩ් රබර් කම්හලේ අලාභය රු. මිලියන 4.28 ක් ලෙසද, විනාශ වූ රබර් තොගයේ වටිනාකම රු.මිලියන 1.61 ක් ලෙසද, ඇස්තමේන්තු කර තිබුණු නමුත් නිවැරදි අගයට රක්ෂණය කර නොතිබීම හේතුවෙන් රක්ෂණ වන්දි ලෙස රු.702,517 න් පමණක් ලැබී තිබුණි.

- 2014 වර්ෂය අවසානයට පැවති රු. මිලියන 34.96 ක් වූ වෙළඳ හා විවිධ ණයගැති ශේෂයෙන් සියයට 52.4 ක් හෙවත් ණයගැති ගිණුම් 497 කට අදාළ රු. මිලියන 18.34 ක් වර්ෂ 5 කට වඩා පැරණි ශේෂයන් වූ අතර එයින් රු. මිලියන 8.05 ක් වර්ෂ 10 සිට 20 දක්වාද රු. මිලියන 2.55 ක් වර්ෂ 20 කටත් වැඩි කාලයක සිටද අයවියයුතු ශේෂයන් විය.

## තුරුසවිය අරමුදල

රබර් ක්ෂේත්‍රයේ නිෂ්පාදනයට වැඩි දායකත්වයක් සපයන කුඩා රබර් වතු හිමියන් ශක්තිමත් කර ඔවුන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම අරමුණු කර ගෙන දිස්ත්‍රික්ක 12 ක ග්‍රාමීය මට්ටමින් විසිරී සිටින කුඩා රබර් ඉඩම් හිමියන් ඒකරාශී කර තුරුසවිය සමිති 696 ක් පිහිටුවා තිබුණද අරමුදල විසින් නිසි කළමනාකරණයක් සිදුකර නොතිබුණු බැවින් සමිති 696 න් 315 ක් අක්‍රිය වීම සහ සාමාජික මුදල් රැස්කිරීම අඩාල වීම ආදී දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබුණි.

කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 05 දෙනෙකු ස්ථිර කිරීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (1) විධිවිධානවලට පටහැනිව වැටුප් තලයන් හි පිහිටුවීම හේතුවෙන් 2013 ජනවාරි මස 01 දින සිට 2015 ජුනි 30 දක්වා වැටුප් වශයෙන් රු.517,530 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලාංකීය තේ ගෝලීය වෙළඳපොළේ වඩාත් ආකර්ෂණීය පානයන් අතර ප්‍රමුඛතම ස්ථානයට පත්කරලීම මණ්ඩලයේ දැක්ම වන අතර ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීමත් ශ්‍රී ලංකාවේ තේ ලොවපුරා ප්‍රචලිත කිරීමත් සඳහා කටයුතු කිරීම මණ්ඩලයේ ප්‍රධාන කාර්ය වේ. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා තේ නිශ්පාදකයන්, තේ ඇසුරුම්කරුවන් හා තේ අපනයනකරුවන් ගෙන් ලියාපදිංචි ගාස්තු, ලියාපදිංචි අලුත්කිරීමේ ගාස්තු හා බලපත්‍ර ගාස්තු අය කරනු ලබන අතර තේ මණ්ඩල පනත ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව හා ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් තොරව 2010 ජූලි 29 දින මණ්ඩලය විසින් වැඩිකර තිබුණි. තවද සෙස් අරමුදල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ විධිවිධානවලට සංශෝධනයන් සිදුකර නොතිබුණි.

- තේ ප්‍රවර්ධනය සහ වෙළඳපොල උපාය මාර්ග සඳහා අපනයනය කරන ලද තේ කිලෝග්‍රෑම් එකකට රු.3.50 බැගින් තේ අපනයනකරුවන්ගෙන් 2010 නොවැම්බර් 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 5,818.67 බද්දක් එකතු කර තිබුණු අතර එයින් රු.මිලියන 876.48 ක් පමණක් 2014 වර්ෂය අවසානය දක්වා තේ ප්‍රවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණු අතර ඉතිරි මුදල් කෙටිකාලීනව ආයෝජනය කර තිබුණි.

- කොළඹ තුරඟ තරඟ පිටිය ගොඩනැගිල්ලේ තේ අලෙවි මධ්‍යස්ථානයක් (Tea House) ස්ථාපනය කිරීම සඳහා මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී රු.මිලියන 58.369 ක් වැයකර තිබුණද 2014 මාර්තු සිට දෙසැම්බර් දක්වා වූ මාස 10 ක කාලයතුළ මණ්ඩලය එයින් රු.මිලියන 13.5 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. කෙසේ වුවද තේ ප්‍රවර්ධන කටයුත්තක් ලෙස ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

- වර්ෂ පහකට වැඩි කාලයක සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු රු.මිලියන 25 ක මුදලක් වෙනුවට එම මණ්ඩලයට අයත් රු.මිලියන 16 ක් වටිනා හන්තාන පිහිටි " සිලෝන් ටී මියුසියම්" හි අයිතිය අත්කර ගැනීම හා රු.මිලියන 8 ක ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ තීරණයකට එළඹ තිබුණි. කෙසේ වුවද මෙම ක්‍රියාවලිය 2015 අගෝස්තු 31 දක්වාම අවසන් කර නොතිබුණි.

## තේ පර්යේෂණ මණ්ඩලය

- අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය කාර්යාලවල ස්ථාන භාර නිලධාරීන්ගේ නිල නිවාස නඩත්තු කිරීම සඳහා මාසික කම්කරු දීමනාවක් ප්‍රතිපූරණය කිරීමට 2007 මැයි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව අනුමත කර තිබුණු අතර 2013 හා 2014 වර්ෂවලදී නිලධාරීන් 13 දෙනෙකු සඳහා පිළිවෙලින් රු. මිලියන 2.72 ක් හා රු. මිලියන 2.73 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි.

- සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා අනිවාර්ය සේවා කාලය තුළ සේවය නොකර සේවයෙන් ඉවත්ව ගොස් සිටි නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු. මිලියන 22.03 ක මුදලක් 2015 ජුනි 30 දක්වාම අයකර ගෙන නොතිබුණි.

## තේ ශක්ති අරමුදල

- 2013 හා 2014 වර්ෂවල අවසන් මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 23 දක්වාම විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණු අතර අරමුදලට අයත් කම්හල් 13 න් 5 ක් 2008 වර්ෂයේ සිට 2012 දක්වා වූ වර්ෂ 5 ක කාලය අඛණ්ඩව අලාභ ලබා තිබුණි. 2012 වර්ෂයේ පස්සර කම්හල හැර ඉතිරි සියලු කම්හල් අලාභ ලබා තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේ කම්හල් අලාභය රු.මිලියන 57.65.ක් වූ අතර එක් කම්හලක හැර අනෙකුත් සියළුම කම්හල්වල නිෂ්පාදනයද පහත වැටී තිබුණි.

- අරමුදලේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වසර 50 ක බදු පදනම මත රු.මිලියන 28 ක වටිනා පර්. 40 ක් වූ බිම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගැනීමට එකඟවී 2010 මාර්තු 31 දින රු. මිලියන 8.08 ක් අත්තිකාරම් ලෙස එම අධිකාරියට ගෙවා තිබුණි. 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව එම ගොඩනැගිල්ල වෙනත් ස්ථානයක ඉදිකිරීමට යෝජනා වී තිබුණද ගෙවා තිබුණු ඉහත අත්තිකාරම් මුදල 2015 අගෝස්තු 31 දක්වාම ආපසු ලබා ගෙන නොතිබුණි.

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

- 2014 වර්ෂය තුල සංවර්ධන වියදම් වශයෙන් අධිකාරිය රු.මිලියන 345.10 ක මුදලක් වැය කර තිබුණු අතර ඉන් රු.මිලියන 331.21 ක මුදලක් සහනාධාර වශයෙන් තේ ගොවීන් හට ලබා දී

තිබුණි. ඉතිරි වියදම් තුළ 2014 නොවැම්බර් 12 දින අරලියගහ මන්දිරයේදී පවත්වන ලද තේ ගොවි හමුවක් වෙනුවෙන් දරන ලද රු.මිලියන 5.65 ක්ද පාංශු හා ජල සංරක්ෂණ ඵළදායීතා ප්‍රවර්ධන විශේෂ වැඩසටහන යටතේ තේ වගාකරුවන් 190,123 දෙනෙකුට රු.මිලියන 406.34 ක ආධාර මුදල් ලබාදීම සඳහා වූ චෙක්පොත් ගාස්තු වශයෙන් රු. මිලියන 2.84 ක්ද අයදුම්පත්‍ර හා පෝස්ටර් වෙනුවෙන් රු. මිලියන 1.58 ක්ද වැය කර තිබීම ආර්ථික නොවූ වියදම් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

- ජාතික අවශ්‍යතාවයට අනුව, උපරිම ඵලදාව ලබාගැනීමට සහ තේ ඉඩම් නඩත්තු කිරීමට වාර්ෂිකව හෙක්ටයාර් 2,300 ක් නැවත වගා කළ යුතුවුවත් සමාලෝචිත වර්ෂය තුළදී සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාර් 720 ක් පමණක් නැවත වගා කර තිබුණු අතර එය හෙක්ටයාර් 116,492 ක් වූ මුළු පරිණත තේ ඉඩම් වලින් සියයට 0.62 ක් නියෝජනය විය. මෙම පරිනත තේ වගාවෙන් හෙක්ටයාර් 21,613 ක් වර්ෂ 25 ඉක්මවූ වගාවන් බවද නිරීක්ෂණය විය.

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය

- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඇල්කඩුව වැවිලි සමාගම වෙත පවරා තිබූ මුල් භූමි ප්‍රමාණය හෙක්ටයාර 27,242.76 ක් වූ අතර එයින් සියයට 58 එනම් හෙක්ටයාර 15,825.35 ක් වගා කටයුතු සඳහා යොදාගෙන තිබුණි.හෙක්ටයාර 6,064.18 ක් එනම් මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 22 ක් වගා කටයුතු සඳහා යොදා ගත හැකි තත්ත්වයේ පැවතුනද වගා කටයුතු හෝ වෙනත් ආර්ථික ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි.

- තේ වගා කර තිබූ හෙක්ටයාර 8,008.95 ක් වූ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 5,135.44 ක් ඇට තේ වගාවද, හෙක්ටයාර 2,873.51 රිකිලි තේ වගාවද විය. තේ වගා කර ඇති මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 64 ක ප්‍රමාණයක් ඇට තේ වගාව වන අතර එම වගාව අවු.100 පමණ පැරණි වගාවක් බැවින් ඵලදායී ජීව කාලය ඉක්මවා ගොස් තිබුණි. මෙයින් ලැබෙන දළු අස්වැන්න රිකිලි තේ වගාවට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පවතී.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 2011-2014 දක්වා කාල සීමාව තුලදී ඇස්තමේන්තු කර තිබූ පොහොර අවශ්‍යතාවයෙන් සියයට 17 ත් සියයට 25 අතර ප්‍රතිශතයක්ද ඇල්කඩුව වැවිලි සමාගම 2011-2014 දක්වා කාල සීමාව තුල සියයට 29 - 92 අතර ප්‍රතිශතයක පොහොර යෙදීම සිදුකර තිබුණි. තේ වගාව සඳහා අවශ්‍ය පොහොර නිසි ප්‍රමිතියෙන් නොයෙදීම හේතුවෙන් වතුවලින් නෙලා ගන්නා දළු අස්වැන්නේ ගුණාත්මකභාවය හා ප්‍රමාණය පහළ මට්ටමක පැවතුණි.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් 2011 වර්ෂයේ සිට 2014 අගෝස්තු මාසය දක්වා නැවත වගාවන් සිදුකර නොතිබුණි.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතින වතුවල ගස් 62,440 ක් ඉවත් කර රාජ්‍ය දැව සංස්ථාව වෙත පැවරීමෙන් ලැබෙන ආදායමෙන් ආයතනවල පවතින රු.මිලියන 1,549 ක් වූ නොගෙවා ඇති සේවක අර්ථසාධක, සේවක භාර අරමුදල් සහ සේවන පාරිතෝෂික ගෙවීමට 2013 ඔක්තෝබර් 17 දින අමාත්‍ය මණ්ඩල විසින් තීරණය කර

තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබූ අතර, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට දැව අලෙවියෙන් රු.මිලියන 28 ක් ආදායමක් ලැබී තිබුණු අතර එයින් රු.මිලියන 16 ක් පමණක් ව්‍යවස්ථාපිත වගකීම් නිරවුල් කිරීම සඳහාද ඉතිරිය මණ්ඩලයේ සාමාන්‍ය වියදම් දැරීම සඳහා යොදාගෙන තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

- ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ 10, ඩාර්ලි පාරේ ගබඩා සංකීර්ණයේ ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබාගත් පුද්ගලික ආයතනයකින් අයවිය යුතු හිඟ බදු මුදල්වලින් බදුකරුගේ ඉල්ලීම මත රු. මිලියන 34.85 ක මුදලක් කපා හැරීමට මණ්ඩලය එකඟ වී තිබුණි.

- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් අලකොල්ල වතුයායේ තේ කර්මාන්තශාලාවේ ඇති වූ ගින්නෙන් විනාශයට පත්ව තිබුණු අතර එහිදී විනාශයට පත්වූ තේ තොගයේ වටිනාකම රු. මිලියන 4.55 ක් ද අමු තේ දළුවල වටිනාකම රු.327,285 ක් ද, දර රු.98,314 ක් ද හා කඩදාසි මලු රු.140,599 ක් ද විය. මේ සම්බන්ධයෙන් ආයතනය විසින් පිළියෙල කර තිබූ වාර්තාවේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අලාභය ආපසු අයකර ගැනීම හා සම්බන්ධ නිර්දේශ හා විනයානුකූල ක්‍රියාමාර්ගයන් ගැනීමට යෝජිතද යන්න ඇතුළත් කර නොතිබුණි.

## පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් පර්යේෂණ ආයතනය යන ව්‍යාස්ථාපිත ආයතන 03 ක් සහ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සහ සීමාසහිත හලාවත වැවිලි සමාගම යන රාජ්‍ය සමාගම් 02 ක් අමාත්‍යාංයට අයත් වූ අතර ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම, මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම, නාස්තිය හා දූෂණය පිටු දකිමින් නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම. බහුභෝග වගාවන් සහ සංගත ගොවිපොළ ක්‍රම තුළින් වැවිලි ඉඩම උපරිම මට්ටමින් භාවිතයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම සහ පොල් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාල කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්වේ. අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1.941 ක් වූ අතර ඉන් රු.මිලියන 1,717 ක් උපයෝජනය කර තිබුණි.

- මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් බලය ලබා ගැනීමකින් තොරව 2014 වාර්ෂික අය වැය ඇස්තමේන්තුව මඟින් වැලිගම පොල්කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය මර්ධන වැඩසටහන සඳහා වෙන් කර තිබුණු රු. මිලියන 200 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 5 ක් අමාත්‍යාංශය විසින් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලබා දී තිබුණු අතර මණ්ඩලය එම මුදලින් රු. මිලියන 4.9 ක් හම්බන්තොට මැදමුලන දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධනය වෙනුවෙන් වැය කර තිබු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

- පොල් සංවර්ධන අධිකාරිය විසින් ගෘහස්ථ පරිභෝජනයේදී සිදුවන පොල් නාස්තිය අවම කිරීමෙන් පොල් අපනයන ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ගෙඩි පොල් වෙනුවට පොල් කිරි , පොල් කිරි පිටි හා පොල් ක්‍රීම් ප්‍රචලිත කිරීම සඳහා ප්‍රචාරණ ආයතන ලෙස ශ්‍රී ලංකා රූපවාහිනි

සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව තෝරාගෙන තිබුණි. 2014 අගෝස්තු 14 සිට 2015 අප්‍රේල් 13 දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රු. මිලියන 9.34 ක්ද 2014 සැප්තැම්බර් 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට රු. මිලියන 3.94 ක් ද අධිකාරිය ගෙවා තිබුණි. එයින් රූපවාහිනී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව පිළිවෙලින් රු. මිලියන 8.80 ක් හා රු. 136,970 ක් ඉතිරිව ඇති බව අධිකාරියට දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ රූපවාහිනී සංස්ථා මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරියට ආපසු ගෙවිය යුතු මුදලක් නොමැති බවත් ගුවන් විදුලි සංස්ථාවෙන් අධිකාරියට ලැබිය යුතු මුදල රු.මිලියන 1.27 ක් බවත් සනාථ විය. තවද රූපවාහිනී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව විසින් ප්‍රචාරණ කටයුතු සිදුකළ බව තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු අධිකාරිය විසින් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

- 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.8.2 ඡේදයට පටහැනිව පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යලයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරින් හා වතු කළමණාකරුවන් සඳහා කම්කරුවන් දෙදෙනෙකුගේ මාසික වේතනයට සමාන දීමනාවක් ද, සහකාර වතු කළමණාකරුවන් ප්‍රධාන කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරිවරුන් හා වතු පාලන සේවාවේ කණිෂ්ඨ විධායක නිලධාරින් සඳහා කම්කරුවෙකුගේ මාසික වේතනයට සමාන දීමනාවක් ද වශයෙන් 2011 නොවැම්බර් 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල රු.මිලියන 16.71 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එම නිලධාරින්ට ගෙවා තිබූ බවට විගණයේදී නිරීක්ෂණය විය. එමෙන්ම ආදර්ශ පොල් උයන්වල වතු කළමණාකරුවන් හා සහකාර වතු කළමණාකරුවන් මෙම දීමනාව ලබා ගන්නා අතරම ඔවුන්ගේ නිල නිවාසවල සේවය සඳහා එම ආදර්ශ පොල් උයන්වල චෙක් රෝල් කම්කරුවන් දෙදෙනෙකු යොදවා ගෙන තිබූ බවද විගණනයේ දි නිරීක්ෂණය විය.

# බලශක්තිය

## ලංකා විදුලිබල මණ්ඩලය

විදුලිබල මණ්ඩලය විසින් ඉකුත් වර්ෂයේදී උපයන ලද රු.මිලියන 22,264 ක බදු පෙර ලාභය එරෙහිව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 13,154 ක බදු පෙර අලාභයක් උපයා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ප්‍රතිඵලයට වූ රු. මිලියන 35,418 ක පිරිහීමක පෙන්නුම් කෙරෙණි. පහත වගුවේ පරිදි ඉහත පිරිහීමට බලපෑ එක් හේතුවක් ලෙස ජලාශවල වූ අඩු ජල මට්ටම නිසා 2013 වර්ෂයේදී නිපදවූ ගි.වො. පැය 6,906 ට සාපේක්ෂව 2014 වර්ෂයේදී ගි.වො.පැය 2,372 කින් හෙවත් සියයට 34 කින් අඩුවිම හේතුවෙන් ගි.වො.පැය 459 ක අධි ඉල්ලුම පිරවීමට ඉන්ධන සහ ගල්අඟුරුවලින් වන විදුලි ජනනය ගි.වො.පැය 2,778 කින් හෙවත් සියයට 59 කින් වැඩිකිරීමට සිදුවීම දැක්විය හැක.

| මූලාශ්‍රය | 2014 | 2013 | වෙනස | |
|---|---|---|---|---|
| | ගි.වො.පැය | ගි.වො.පැය | ගි.වො.පැය | % |
| ජල විදුලිය | 4,534 | 6,906 | -2,372 | -34 |
| ඉන්ධන | 4,305 | 3,260 | 1,045 | 32 |
| ගල් අඟුරු | 3,202 | 1,469 | 1,733 | 118 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනී බල ශක්තිය | 315 | 263 | 52 | 20 |
| **එකතුව** | **12,356** | **11,898** | **458** | **4** |

ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී මණ්ඩලය විසින් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ගෙන් තාප විදුලිය මිලට ගැනීමට සහ ලංකා ගල් අඟුරු සමාගමෙන් ගල් අඟුරු මිලට ගැනීම සඳහා විශාල වියදමක් දරා තිබුණි. පෙර වසර සමඟ සසඳා බැලීමේදී 2014 වර්ෂයේදී මෙම සාධක දෙක සඳහා පිළිවෙලින් රු.මිලියන 37,997 ක් සහ රු.මිලියන 6,354 ක පිරිවැය වැඩිවීමක් දක්නට ලැබුණි.

පෙර වසර හා සැසඳීමේදී විදුලිය සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දැරූ ඍජු පිරිවැයේ සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | රු.මිලියන | % | රු.මිලියන | % |
| ඉන්ධන | 46,582 | 22 | 29,425 | 18 |
| බලය මිලට ගැනීම | 101,149 | 48 | 80,308 | 48 |
| ගල් අඟුරු | 17,031 | 8 | 10,677 | 6 |
| මෙහෙයුම් හා නඩත්තු | 24,913 | 12 | 26,196 | 16 |
| ක්ෂයවීම් | 21,174 | 10 | 20,319 | 12 |
| **එකතුව** | **210,849** | **100** | **166,925** | **100** |

ඉහත විශ්ලේෂණය අනුව පෙනී යන්නේ 2014 සහ 2013 වර්ෂවල මුළු මෙහෙයුම් වියදමින් පිළිවෙලින් සියයට 78 ක් සහ සියයට 72 ක් සෘජුවම බලය ජනනය කිරීම සඳහා අදාල වන බවත්, එය පෙර වසර හා සැසඳීමේදී සියයට 37 ක වැඩි වීමක් බවත්ය.

සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් සියයට 2 කින් ඉහල ගොස් ඇත. මීට අමතරව පෙර වර්ෂයේ ශුද්ධ වත්කම් රු.මිලියන 737 සමඟ සැසඳීමේදී එය 2014 වර්ෂයේදී රු.බිලියන 5.8 ක සෘණ අගයක් ගැනීම නිසා මුළු ශුද්ධ වත්කම් සියයට 887 ක පහල යාමක් පෙන්වයි. ජංගම වත්කම්වල අගය පහළ යාමට ප්‍රධාන හේතුව ණය අයකර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතියක් නොව සවනීකරණ අත්තිකාරම් අයකර ගැනීමයි. පෙර වර්ෂයේ සියයට 54 කට එරෙහිව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේදී මණ්ඩලයේ යෙදවූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට 32 ක් එනම් රු.බිලියන 220 ක් ණය ගැනීම් තුළින් මූල්‍යනය කර තිබුණි.

## ලක් විජය බලාගාරයේ මෙහෙයුම් කටයුතු

- ලක් විජය බලාගාරය විසින් ගල් අඟුරු තොගවලට අදාලව යළි ඇණවුම් මට්ටම, උපරිම තොග මට්ටම, අවම තොග මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය යනාදිය අදාළ වාර්තා නඩත්තු කර නොතිබුණි. ඊට අමතරව පහත දැක්වෙන අඩුපාඩු නිසා ගල් අඟුරු සම්බන්ධව පවත්වාගෙන ගිය වාර්තාවල නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය තහවුරු කරගත නොහැකි විය.

  - ගල් අඟුරු අංගනයට ඇතුල් කිරීමේදී විශ්වාසනීය මිනුම් භාවිතා නොකිරීම.
  - ගල් අඟුරු බලාගාරයට ඇතුල් කිරීමේදී විශ්වාසනීය මිනුම් භාවිතා නොකිරීම.
  - ගල් අඟුරු නැවෙන් බෑමේදී විදුලිබල මණ්ඩලයේ හෝ ගල් අඟුරු සමාගමේ අධීක්ෂණයක් නොතිබීම.
  - ගබඩා භාරකරුගේ කාර්ය තුළින් තොග පාලනයක් නොව නාමිකව වාර්තා පවත්වාගෙන යාමේ කාර්යක් පමණක් සිදුවීම.

  උදාහරණ ලෙස සලකා බලන වර්ෂයේ මුල් මාස නවය තුළදී ගල් අඟුරු මෙට්‍රික් ටොන් 181,016 ක් තොග වාර්තාවලට ගෙන නොතිබීම දැක්විය හැකිය.

- ලක් විජය බලාගාරයේ ගල් අඟුරු අංගනයේ මුළු ධාරිතාවය මෙට්‍රික් ටොන් 738,720 කි. එහෙත් සාමාන්‍ය මාසික තොග පරිභෝජනය මෙට්‍රික් ටොන් 195,000 ක් නිසා මෙකී අංගනයේ ගබඩා කළ හැක්කේ මාස 3.788 කට අවශ්‍ය ගල් අඟුරු තොගයක් පමණි. කෙසේ වුවද, අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා වන මාස 6 ක මෝසම් කාලය තුළ මුහුදේ සහ කාලගුණයේ පවත්නා අයහපත් තත්ත්වය නිසා ගල් අඟුරු ගොඩබෑමට නොහැකි බැවින් මෙකී අංගනයේ අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණය ගබඩා කිරීමේ ඉඩ පහසුකම් නොමැති විය.

- 2014 දෙසැම්බර් 31 දිනට ගල් අඟුරු පිළිබඳ භෞතික තොග සත්‍යාපනය ස්වාධීන මිනුම් සමාගමක් විසින් සිදුකර ඇති අතර, එම සමාගම විසින් නිකුත් කළ වාර්තාව අනුව රු.මිලියන 375 ක් වටිනා මෙට්‍රික් ටොන් 32,323 ක තොග අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, ඉහත (ඇ) (i) හි සඳහන් දෝෂ නිසා මතුවී ඇති නිරවද්‍යතාවය පිළිබඳ සැකය නිසාවෙන් එකී

තොග අතිරික්තය ගිණුම් සහ තොග වාර්තාවලට ගෙන ඒමට නිර්දේශ නොකරන ලදී. මේ අනුව ගල් අඟුරු තොග පාලනය සම්බන්ධව මනා පාලනයක් පවත්වා ගෙන යාම ලක් විජය බලාගාරයේ වගකීම බවද නිරීක්ෂණය විය.

- 2014 වර්ෂය තුළදී ජනනය කරන ලද විදුලිය සඳහා වැඩියෙන් පාරිභෝජනය කරන ලද ගල් අඟුරුවල වටිනාකම රු.මිලියන 2,144 කි.

- පුත්තලම කලපුව හරහා සම්ප්‍රේෂන කම්බි ඇදීමේදී නොරිච්චෝලේ ධීවරයින් විසින් පැවැත්වූ විරෝධය අවම කිරීම සඳහා පළාත් පාලන ආයතන සහ ප්‍රදේශීය ලේකම් කාර්යාලවලට සැපයූ රු.මිලියන 103 ක් ප්‍රාග්ධනිත කිරීමේ අරමුණින් කෙරිගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි. නමුත් මෙකී වියදම්වල සාධාරණත්වය, විනිවිදභාවය සහ ගිණුම්කටයුතුභාවය පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි. 2015 ජුනි 25 දින වන විටත් රු.මිලියන 18 ක් මෙම ආයතන තුළ අකර්මන්‍යව මාස 06 කටත් වැඩි කාලයක් තබා ගැනීම නිසාවෙන් මෙකී ගෙවීම් වල සැබෑ අවශ්‍යතාවය විගණනයට තහවුරු නොවුණි.

## ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ මෙහෙයුම්වල බලපෑම

- ගල් අඟුරු නැව් 03 ක දල තාපජනක අගය (Gross Calorific Value) පිළිබඳ කළ ගුණත්ව පරීක්ෂකයින්ගේ වාර්තා අතර වෙනස්කම් දක්නට ලැබුණි. ඒ අනුව, ස්වාධීන පරීක්ෂණ වාර්තාවේ දැක්වෙන දල තාක්ෂණික අගය, ප්‍රමිත අගයට වඩා අඩුවීම නිසා ගල් අඟුරු පැටවීමේදී ලබාගත් සැපයුම්කරුගේ තත්ත්ව පරීක්ෂණ වාර්තා සාවද්‍ය වන අතර, එකී පරීක්ෂණ සමාගම ඉන්දියානු අධිකරණය විසින් තහනම් වූ ආයතනයක් බවද නිරීක්ෂණය විය. මෙකී දෝෂයන් නිසා ඉහත සඳහන් නැව් තුනෙන් භාරගත් මෙට්‍රික් ටොන් 143,932 ක් වූ අඩු තාපජනක අගයන් සහිත ගල් අඟුරු දහනය නිසා ලංකා විදුලිබල මණ්ඩලයට වූ පාඩුව රු.මිලියන 345 කි.

- ඉහත සඳහන් අඩු දල තාපජනක අගයන් සහිත ගල් අඟුරු පාරිභෝජනය නිසා මණ්ඩලයට සිදුවූ මෙගා වොට් 25 ක විදුලිබල ඌනතාවය පියවා ගැනීම සඳහා වෙනත් විකල්ප මාර්ග වලට යාම නිසා සිදුවූ අතිරේක වියදම රු.මිලියන 508 කි.

- ගල් අඟුරු නැව් අංක 16 සහ 17 වලින් වූ ඌන සැපයුම වන මෙට්‍රික් ටොන් 29,896 ක ප්‍රමාණය 2012 අප්‍රේල් 04 සිට මාස 06 ක් ඇතුළත සැපයීම සඳහා ලංකා නැව් සංස්ථාව සහ ලංකා ගල් අඟුරු සමාගම අතර එකඟතාවයක් ඇති වුවද එසේ කිරීමට අපොහොසත් විය. එකී ඌන තොග සැපයුමෙහි වටිනාකම රු.මිලියන 654 කි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එකී අතිරික්ත ගෙවීම් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබූ අතර එලෙස ප්‍රාග්ධනය අනවශ්‍ය ලෙස හිරකර තැබීම හේතුවෙන් වූ ආවස්ථික පිරිවැය අයිරා පොලී අනුපාතය අනුව ඇස්තමේන්තු කිරීමේදී රු.මිලියන 229 ක් විය.

- සත්‍ය තාපජනක අගය බලාගාරයේ නිර්දේශිත තාපජනක අගයට වඩා අඩුවන අවස්ථාවලදී බලාගාරයේ කටයුතු දෝෂ වගකීම් කාලපරිච්ඡේදය තුළ පවත්නා නිසා උපදේශකයින්ගෙන් හෝ නිෂ්පාදකයාගෙන් උපදෙස් ලබා ගන්නා ලෙස මණ්ඩලයේ සාමාන්‍ය අධිකාරී විසින් අතිරේක සාමාන්‍ය අධිකාරී (ජනක) දැනුවත් කර තිබුණි. කෙසේ වුවද, එවැනි අදහස් ලබා ගැනීමක්

විගණනයට නිරීක්ෂණය නොවුණි. තවදුරටත් මණ්ඩලය විසින් නීතිපති ගේ 2012 දෙසැම්බර් 21 ලිපියේ නිර්දේශ අනුව වැරදි තීරණ ගත් පාර්ශවයන්ගෙන් මණ්ඩලයට වූ පාඩුව අයකර ගැනීම සඳහා 2015 ජූලි වන විටත් කටයුතු කර නොතිබුණි.

- ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය සහ ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණ ගැනීමේදී විධිමත් නොවූ ආකාරයට මිල ගණන් ඇගයීම නිසා වැරදි සැපයුම්කරුවකු තේරීමේ හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදුවූ අතිරේක පිරිවැය රු.මිලියන 264 කි (එ.ජ.ඩො.2,310,263).

- ලංකා විදුලි බල මණ්ඩලය සහ ලංකා ගල් අඟුරු සමාගම අතර එළඹි ගිවිසුම අනුව ගල් අඟුරු මැනීම් කිරීමේ පිරිවැය ලංකා ගල් අඟුරු සමාගම විසින් දැරිය යුතුය. ලංකා ගල් අඟුරු සමාගම විසින්ම මැරයින් මිනුම්කරු තෝරා ඇති බැවින් එහි ස්වාධීනත්වය ප්‍රශ්නකාරී වේ. කෙසේ වුවද, ගල් අඟුරු මෙහෙයුම්වලට අදාල සියළුම වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කරණු ලැබුවද බර මැනීම සඳහා වූ සහතික ඍජු තහවුරු කිරීමක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලය එවනු නොලැබේ.

- ලංකා විදුලි බල මණ්ඩලය විසින් නැවේදී හෝ අංගනයේදී ගල් අඟුරු මැනීම සඳහා ජාත්‍යාන්තර පාවිච්චි කරනු ලබන ක්‍රම වේදයන් අනුගමනය කිරීම හෝ හඳුන්වාදීම සිදුකර නැත.

- ලංකා විදුලි බල මණ්ඩලය භාරගන්නා ගල් අඟුරු නිවැරදිව මැනීමෙන් පසු භාරගැනීම සඳහා ක්‍රමයක් නොමැති නිසා, ලංකා නැව් සංස්ථාව සහ ස්වාධීන මැනුම් නියෝජිත විසින් මනිනු ලබන ප්‍රමාණයන් එලෙසම පිළිගනී. සමහර අවසිථා වලදී පැටවීම සහ බෑම යන ස්ථාන දෙකේදීම එකම ස්වාධීන පාර්ෂවය විසින් බර මැනීම කරනු ලබන බව හඳුනාගන්නා ලදී. එම නිසා මිණුම්වල නිවැරදිතාවය පිළිබඳ විනිවිදභාවය විගණනයේ පිළිගත නොහැක. තවද, බර මැනීමේ උපකරණ (පාලම් තරාදිය) ද නිවැරදි නොවුන අතර එය නිවැරදි කිරීමට හෝ විකල්ප ක්‍රම මගින් ලැබුණු ගල් අඟුරු මැනීම සඳහා මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි. එම නිසා ඉන්වොයිසයේ සඳහන් ප්‍රමාණය, භාරගත් ප්‍රමාණය සහ එහි වටිනාකමෙහි නිවැරදිතාවය පිළිබඳව සැක සහිත වේ.

- ලක් විජය බලාගාරයට අයත් ගල් අඟුරු ඇදගෙනයාමේ බෝට්ටු දෙකක් බත්තල් තුනක් සහ ලයින් බෝට්ටුවක් ත්‍රිකුණාමලය සහ කොළඹ වරාය තුළ 2009 වර්ෂයේ සිට නැංගුරම් දමා තිබුණි. කෙසේ වුවද මෙකී උපකරණ ව්‍යාපෘති අධ්‍යක්ෂ, ලංවිම නියෝජිතයින් සහ රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සහ නිර්දේශ යටතේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා ලබාගත් විදේශ ණය වලින් මිලට ගෙන තිබුණි. එකී නිළධාරීන්ගේ වැරදි තීරණ නිසා ලංවිම ට 2014 දෙසැම්බර් 31 දිනට දැරීමට සිදුවී ඇති රු. මිලියන 1,250 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව ඇත.

- සාමාන්‍යයෙන් ලංවිම විසින් ලංකා ගල් අඟුරු සමාගම වෙත ගල් අඟුරු මිලට ගැනීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම සඳහා වාණිජ ඉන්වොයිසිය පදනම් කරගෙන ගෙවීම් කරනු ලබන අතර බොහෝ අවස්ථාවලදී සත්‍ය ඉන්වොයිස් වටිනාකමට වඩා ණයවර ලිපි වටිනාකම ඉහල අගයක් ගනී. තවද, ලංකා ගල් අඟුරු සමාගමට මෙකී අතිරික්ත ගෙවීම් අයකර ගැනීම සඳහා

දිගු කාලයක් ගනී. උදාහරණයක් ලෙස නැව් අංක 43 සහ 44 ට අදාල අතිරික්ත ගෙවීම් අයකර ගැනීම සඳහා පිළිවෙලින් දින 196 ක් සහ 171 ක් ගත වී ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට අයිරා පොලී අනුපාතය වූ සියයට 14 මත ගණනය කරන ලද ප්‍රාග්ධනය හිරකර තැබීමේ ආවස්ථික පිරිවැය රු. මිලියන 7 කි.

- මිල කැඳවීම් අංක 03, 04, සහ 05 යටතේ වූ රු. මිලියන 15,697 කට අදාල ලැබුණු මිල කැඳවීම්වල ලැයිස්තු, ලංසු විවෘත කිරීමේ වාර්තා, තාක්ෂණික ඇගයීම් වාර්තා ප්‍රසම්පාදන කමිටු වාර්තා විගණනයට ඉදිරිපත් නොවීම නිසා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදුවූයේද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය.

2013 ඔක්තෝබර් 07 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ පරිදි "විදුලක්පාය" ලෙස නම් කරන ලද ලංවීම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු වහාම ක්‍රියාත්මක වන පරිදි නවතා දමා තිබුණි. කෙසේ වුවද, නවතා දැමීමට හේතු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ ඇතුළත් කිරීම හෝ විගණනය සඳහා ඉදිරිපත් කිරීම සිදුනොවුණි. එදිනට දරා ඇති පිරිවැය වූ රු. මිලියන 380 ක් වන අතර දැනට දරා ඇති මුළු පිරිවැය ද විගණනයට ඉදිරිපත් නොවුණි.

ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිය සඳහා ඉරාණයේ ණය යටතේ මිලට ගත් රු. මිලියන 2 ක් වටිනා විදුලි සන්නායක, තත්ව පාලන වාර්තා අනුව බාල ගුණත්වය නිසා ප්‍රතික්ෂේපකර තිබුණි. මෙකී ව්‍යාජ මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් ගෙන ඇති එකම ක්‍රියා මාර්ගය වන්නේ ඒවා කොටුගොඩ ගබඩාව වෙත යැවීම පමණි.

උපයන විට ගෙවීම් බදු 2009 සිට ක්‍රියාත්මක කල යුතු ඊලඟ වැටුප් සංශෝධනයේ සිට සේවාදායකයාට විතැන්කරන ලෙස 2007 දෙසැම්බර් 31 දින නිකුත්කර ඇති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ලංවීම විසින් ගෙවා ඇති උපයන විට ගෙවීම් බදු වටිනාකම රු. මිලියන 1,407 කි.

1994 ජුනි 04 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 94 ට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් විවිධ දීමනා 39 ක් වරින් වර ගෙවා තිබුණි. 2013 වර්ෂයේ දී ගෙවන ලද රු.මිලියන 642 ට සාපේක්ෂව 2014 වර්ෂයේ ගෙවා ඇති මෙකී දීමනාවල වටිනාකම රු. මිලියන 849 ක් බව විගණනයේදී හෙළිදරව් විය.

මණ්ඩලය විසින් බඳවා ගැනීමේ පටිපාටීන් දිගු කාලයකින් යාවත්කාලීන කර තිබුණි.

2012 වර්ෂයේදී මණ්ඩලය විසින් අනුමත කරවා ගෙන ඇති සේවක සංඛ්‍යාව ඉක්මවමින් 2014 දෙසැම්බර් 31 දිනට බඳවාගත් සේවක සංඛ්‍යාව 3655 කි. බාහිරව පුරවන ලද (Out sources) සේවක සංඛ්‍යාව මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 20 කි.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2014 වර්ෂය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයනය සඳහා දරන ලද මුළු පිරිවැය රු. බිලියන 600ක් (එ.ජ.ඩො. මිලියන 4,597ක්) වූ අතර එය 2014 වර්ෂයේ වර්තමාන වෙළඳ පොළ මිලට රු. බිලියන

9,785ක් වූ දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි) ආසන්න වශයෙන් සියයට 6ක් නියෝජනය විය. එසේම, එය 2014 වර්ෂයේ රු. බිලියන 2,535ක් (එ.ජ.ඩො මිලියන 19,417) වූ මුළු ආනයනයෙන් ආසන්න වශයෙන් සියයට 24ක් නියෝජනය විය.

## මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව වූ රු. මිලියන 7,889 ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලින් ප්‍රතිඵලය රු. මිලියන 1,854ක බදු පෙර ශුද්ධ ලාභයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 9,743ක වර්ධනයක් දැක්වුණි. වටිනාකම රු.මිලියන 2,715 ක් වූ භූමිතෙල් සහනාධාරය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම, පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය පිරිවැය රු. මිලියන 4,578 කින් අඩු වීම, සංස්ථාවේ බනිජ තෙල් නිෂ්පාදන මිලදී ගැනීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය වීම ආදීය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක වී තිබුණි. තවද, දෙවන අර්ධ වර්ෂයේදී ජාත්‍යන්තර ඉන්ධන මිල අඩු වීම සම්පූර්ණයෙන්ම දේශීය ඉන්ධන මිලට ගැලපීම් නොකිරීම තුලින් ඉහළ ලාභ ආන්තිකයක් ලබා ගැනීම, 2013 වර්ෂය අවසානයේදී රු. බිලියන 53ක් වූ හිඟ වෙළඳ ණය ශේෂය 2014 වර්ෂය අවසානයට රු. බිලියන 37ක් දක්වා අඩු කර ගැනීමට සහාය වූ හිඟ ණය අය කර ගැනීමේ වර්ධනය සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට දායක වූ අනෙකුත් කරුණු විය.

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 4.88 ක ආන්තිකයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේදී සියයට 4.86 ක් වූ ආන්තිකය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ සියයට 0.02 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එසේම, ඉකුත් වර්ෂයේ දළ ලාභය වූ රු. මිලියන 22,744 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය රු.මිලියන 24,447 ක් දක්වා රු. මිලියන 1,703 කින් හෙවත් සියයට 7.5කින් වැඩි වී තිබුණි.

කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම්වලින් රු. මිලියන 1,741ක ශුද්ධ ලාභයක් ලබා තිබූ නමුදු, සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 231,532ක සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතුණි. තවද, 2012 වර්ෂයේදී හෙජින් ගණුදෙනුවලින් සිදුවී තිබූ අධික පාඩුවල සෘණ බලපෑම ඉකුත් වර්ෂවල ශුද්ධ පාඩු ඉහළ යාමට හේතුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය වර්ධනය වී තිබූ නමුත් 2008 සිට අධික අලාභ ලැබීම හේතුවෙන් තව දුරටත් සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය ඛාදනය වී තිබුණි. එබැවින් රජයේ මූල්‍ය සහාය නොමැතිව සංස්ථාව ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙසට අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව සැක සහිතය.

**අංශ අනුව කාර්යසාධනය**

කෙසේ වෙතත් සංස්ථාවේ ලාභදායිත්වයට සෘණාත්මක බලපෑමක් කළ පහත දැක්වෙන නිෂ්පාදනයන්ගෙන් සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

| අංශය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ලාභය/(පාඩුව) | | | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| විදුලිබල උත්පාදන | | | | |
| නැප්තා | 413 | 1,081 | 1,048 | 798 |
| දේශීය | | | | |
| LPගෑස් (K.G.) | 312 | 436 | 377 | 224 |
| භූමිතෙල් | 1,775 | 2,449 | 3,525 | 6,886 |
| අපනයන | | | | |
| නැප්තා | 1,700 | 976 | 43 | 675 |
| දැවි තෙල් -1500 | 1,530 | 2,690 | 70 | 329 |
| Bunkering | | | | |
| ඩීසල් | 168 | 67 | - | - |
| දැවි තෙල් -1500 | 1,123 | 729 | - | - |
| දැවි තෙල් 3500 | 19 | - | - | - |

ඉහත දැක්වූ අඛණ්ඩ මූල්‍ය පාඩු හා ප්‍රාග්ධන බාදනය සඳහා හේතු වූ ප්‍රධාන කරුණු ලෙස අඩු ආන්තිකයක් සහිත වූ අකාර්යක්ෂම පිරිපහදු ක්‍රියාවලිය, අඩු ඵලදාව හා පිරිපහදුවේ නිතර සිදුවන හදිසි බිඳ වැටීම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස රටේ ඉල්ලුම සපුරාලීම සඳහා පිරිපහදු කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයනය, පිරිපහදු පිරිවැයට වඩා අඩු මිලට නැප්තා සහ දැවි තෙල් - 1500 අපනයනය, ගිවිසුම්ගත ගනුදෙනුකරුවන්ගේ මිලට වඩා අඩු සහන මිලකට සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හා සී/ස මිහින් ලංකා සමාගමට ඉන්ධන සැපයීම, ලංකා විදුලිබල මණ්ඩලයට සහනදායී රේටයකට ඉන්ධන (දැවිතෙල් සහ නැප්තා) සැපයීම, ගබඩා පහසුකම් නඩත්තු කිරීමේ දුර්වලතාවය, ප්‍රමාද ගාස්තු ගෙවීම සහ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඛණ්ඩව හීන වීම ආදිය අනාවරණය විය.

ජාත්‍යන්තර මිල වෙනස් වීම් හා රජයේ අරමුණුවලට සමගාමීවූ ඵලදායී මිලකරන උපාය මාර්ගයක් සැළසුම්කර ස්ථාපනය කර නොතිබූ නමුදු, සංස්ථාව විසින් මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම සඳහා 2014 සැප්තැම්බර් දක්වා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව ඉහළට සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද, ජාත්‍යන්තර වෙළඳපොළේ තෙල් මිල ගණන් පහළ යාමට ප්‍රතිචාර දක්වමින් ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් 2014 වර්ෂයේ දෙවරක් එනම් සැප්තැම්බර් සහ දෙසැම්බර් මාසවලදී, සහ නැවතත් 2015 ජනවාරි මාසයේදී පහළ දමන ලද අතර, 2015 ජනවාරි මාසයේදී ජාත්‍යන්තර තෙල් මිල ගණන් අඛණ්ඩව පහළ යාමේ ප්‍රවණතාවයක් පැවතීම සහ ජාත්‍යන්තර වෙළඳපොළේ මිල පහළ යාම ඉහත සංශෝධනයන් මගින් සම්පූර්ණයෙන් නිරූපණය නොවීම මීට හේතු වී තිබුණි. ගෝලීය මිල ගණන් පහළ යාමේ ප්‍රතිලාභය විදුලි පාරිභෝගිකයන්ට ලබා දීමට, විදුලි බල උත්පාදනය සඳහා භාවිතා කරන දැවි තෙල් (සල්ෆර් ප්‍රතිශතය අඩු සහ වැඩි) ලීටරයක මිල 2015 පළමු කාර්තුව තුළදී රු.10 කින් අඩු කර තිබුණි.

2014 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව ඉන්ධන ආනයනික මිල දර්ශකය 2014 ප්‍රථම භාගය තුළදී ඉහළ ගොස් තිබූ නමුත් එය වර්ෂයේ දෙවන භාගයේදී අඛණ්ඩව පහළ ගොස් තිබූ අතර ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වල පහළ ඉල්ලුම සහ ඔපෙක් නොවන රටවල (ඛනිජ තෙල් අපනයනය කරන සංවිධානය ) විශාල සැපයුම හේතුවෙන් 2014 වර්ෂයේදී ඛනිජ තෙල් ආනයන මිල දර්ශකය සියයට 6.3කින් පහළ යාමට හේතු වී තිබුණි. 2014 වර්ෂයේ අවසන් භාගය තුල ජාත්‍යන්තර වෙළඳපොලේ ඉන්ධන මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු වී තිබියදීත් 2014 වර්ෂයේදී පිරිපහදු නිෂ්පාදන ආනයන

ප්‍රමාණය ඉහළ යාම නිසා ඛනිජ තෙල් ආනයන වියදම රු. මිලියන 269,449 දක්වා එනම්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 8.6කින් ඉහළ ගොස් තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඛනිජ තෙල් සඳහා වන ඉල්ලුම සපුරා ලීම සඳහා පිරිපහදු කරන ලද ඛනිජ තෙල් ආනයනය වසර තුළදී ඉහළ ගොස් තිබුණි. මේ නිසා පැරණි උපකරණවල සමහර ඇණහිටීම් සහ නිතර සිදුවන ප්‍රතිජනනය මගහැරවීම සඳහා සහ ලාභදායිත්වය හා මෙහෙයුම් නම්‍යතාවය වෙනුවෙන් පිරිපහදුව නවීකරණය කිරීම අවශ්‍ය වේ.

## පිරිපහදු ක්‍රියාවලියේ අකාර්යක්ෂමතා

1969 වර්ෂයේදී ස්ථාපිත, වර්ෂ 45 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛණිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී ඇති අතර, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජතෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. තවද, 2014 දෙසැම්බර් 31 දින දක්වා සංස්ථාව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් වශයෙන් දරන ලද රු. මිලියන 837.6ක මුදල අනාර්ථික නොවන ගනුදෙනු ලෙස නිරීක්ෂණය විය.

2013 දී පිරිපහදු කළ බොර තෙල් ධාරිතාවය වන මෙට්‍රික් ටොන් 1,643,218 හා සසඳන විට 2014 වර්ෂයේදී එය මෙට්‍රික් ටොන් 1,760,170 දක්වා වැඩි වී තිබූ නමුත් ක්‍රියාවලි මට්ටම දිනකට නියම කර ඇති නිෂ්පාදන ධාරිතාව වන ටොන් 6,900 හෙවත් 2014 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 2,415,000 දක්වා ළඟා වී නොතිබුණි.

ජාත්‍යන්තර වෙළඳ පොළේ බොර තෙල් (බ්‍රෙන්ට්) බැරලයක සාමාන්‍ය මිල 2013 වසරේ පැවති එ.ජ.ඩො. 109.15ට සාපේක්ෂව 2014 වර්ෂයේදී එ.ජ.ඩො. 99.68ක් දක්වා අඩු වී තිබුණි. 2014 වර්ෂයේ පළමු භාගය තුළදී බොර තෙල් මිල ගණන් ඉහළව පැවතුණු අතර, වසරේ ඉතිරි කාලය තුළදී බොර තෙල් මිල ගණන් සියයට 50කින් පමණ පහළ වැටී තිබුණි. ජාත්‍යන්තර මිල ප්‍රවණතාවයන්ට අනුකූලව ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල (DES) 2013 වර්ෂයේදී වාර්තා වූ එ.ජ.ඩො. 109.96ට සාපේක්ෂව 2014 වර්ෂයේදී එ.ජ.ඩො. 104.83ක් දක්වා සියයට 4.7කින් පහළ ගොස් තිබුණි. ඉරාන සැහැල්ලු බොරතෙල් පිරිපහදු කිරීම සඳහා නිර්මාණය කර ඇති බොරතෙල් පිරිපහදුවේ පිරිවිතරයන්ට ගැලපෙන ලෙස සංයෝග කිරීම සඳහා බොර තෙල් වර්ග දෙකක් ආනයනය කිරීමේ අවශ්‍යතාවය සහ ඛනිජ තෙල් නිෂ්පාදනය අඛණ්ඩව සැපයීම තහවුරු කර ගැනීම සඳහා සංස්ථාව විසින් දිගුකාලීන කොන්ත්‍රාත්වලට එළඹ තිබීම හේතුවෙන් සාමාන්‍යයෙන් බොර තෙල් බැරලයක ආනයනික සාමාන්‍ය මිල ජාත්‍යන්තර වෙළඳ පොළේ බ්‍රෙන්ට් බොර තෙල් සාමාන්‍ය මිලට වඩා ඉහළ අගයක් ගනී. (සංස්ථාව විසින් වෙනස් කාල පරිච්ඡේදයන් තුල බොර තෙල් වර්ග දෙකක් (මර්බන් + ඕමන් බ්ලෙන්ට්) සංයෝග කිරීමේ ක්‍රියාවලිය සිදුකරයි). කෙසේ නමුත්, වර්ෂයේ අග භාගය තුළදී

ආනයනික බොර තෙල් මිල ගණන් වසරේ සාමාන්‍ය මිල මට්ටමට වඩා විශාල ලෙස පහළ ගොස් තිබුණි. පිරිපහදුව නවීකරණය කිරීමකින් තොරව දේශීයව ඉන්ධන පිරිපහදු පිරිවැය අඩු කළ නොහැක.

## ලැබිය යුතු ගිණුම්

රාජ්‍ය ආයතනවලින් හා පුද්ගලික ආයතනවලින් ලැබිය යුතු පිළිවෙලින් රු. මිලියන 6,078ක් සහ රු.මිලියන 30,982ක් ඇතුලත්ව 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වෙළඳ ශේෂය රු. මිලියන 37,060 ක් විය.

## හෙජින් ගනුදෙනු

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හෙජින් ගනුදෙනුවලට අනුව වාණිජ බැංකු කීපයක් සමඟ එළඹ තිබුණු හෙජින් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවයක් වශයෙන් සංස්ථාව කැඳවා තිබුණි. පාර්ශව අතර එළඹ තිබූ බේරුම් කිරීමේ ඔප්පුව යටතේ එ.ජ.ඩො. මිලියන 60ක් (රු. මිලියන 7,612ක්) ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුවට (SCB) 2013 ජූනි 03 දින ගෙවා තිබුණි. ලැබී ඇති තොරතුරුවලට අනුව, රු.5,261,827ක ගමන් වියදම්ද ඇතුළුව 2014 අගෝස්තු 31 දිනට සංස්ථාව දරා ඇති පාඩුව රු. මිලියන 9,780ක් විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෙජින් ගනුදෙනුවලට අදාලව නීති වියදම් වශයෙන් රු. මිලියන 571ක් දරා තිබූ අතර ඉන් රු. මිලියන 568ක් 2011 සිට 2014 දක්වා කාලය තුල සංස්ථාව විසින් මහ බැංකුව වෙත ප්‍රතිපූරණය කර තිබුණි. ඊට අමතරව, සංස්ථාවේ හෙජින් ගනුදෙනුවලට අදාලව ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින්ගෙන් ලබා ගත් සේවා සඳහා 2014 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රු. මිලියන 379 ගෙවා තිබුණි.

## කළමනාකරණ අකාර්යක්ෂමතා

## ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP)

ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳව අදාළ පාර්ෂවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම, මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස උපයෝජනය කර නොතිබුණි.

## සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමට හා සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමට සහනාධාර මිලට ඉන්ධන සැපයීම

සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගම සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම කොන්ත්‍රාත් පාරිභෝගිකයන් වුවද, සංස්ථාව විසින් අති විශේෂ සහනදායී මිල ගණන්වලට ඉහත සමාගම් සඳහා ගුවන්

සේවා ටර්බයින් ඉන්ධන අලෙවියෙන් 2011, 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 670 ක, රු. මිලියන 457ක, රු. මිලියන 2,010ක සහ රු. මිලියන1,903 ක පාඩු දරා ඇත. විස්තර පහත පරිදි වේ.

| සමාගමේ නම | වර්ෂය තුලදී සංස්ථාව දරා ඇති පාඩුව | | | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 1,762 | 1,866 | 424 | 627 |
| මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 141 | 143 | 33 | 43 |
| **එකතුව** | **1,903** | **2,009** | **457** | **670** |

සහනදායී මිල යටතේ මෙම සමාගම් දෙකට ඉන්ධන සපයා තිබියදීත්, ඔවුන්ගේ දුර්වල මූල්‍ය කාර්ය සාධනය නිසා හිඟ හිටි ඉන්ධන බිල් පියවීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. එනම් 2014 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම රු. බිලියන 29ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර තිබූ අතර මිහින් ලංකා (පුද්ගලික) සමාගම රු.මිලියන 652 ක ආන්තික මෙහෙයුම් ලාභයක් වාර්තා කර තිබුණි. 2010 වර්ෂයේ සිට හිඟ හිටි ශේෂයන්ගේ වර්ධනයේ උපනතිය පහත දැක්වේ.

| සමාගමේ නම | දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| සී/ස ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම | 20,900* | 29,520* | 25,890* | 12,351 | 541 |
| සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම | 1,339 | 4,314 | 3,416 | 1,227 | 361 |

*ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගමෙන් ලැබිය යුතු එකතුව එක්සත් ජනපද ඩොලර් මිලියන 121.17 ක මුදලක් එක්සත් ජනපද ඩොලර් මුදල් ඒකක අනුව සියයට 4ක් සහ ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතයේ එකතුවෙහි පොළියට යටත්වූ ණය මුදලකට 2012 ජුලි 05 දින පරිවර්තනය කර තිබූ අතර එය හිඟ හිටි වෙළඳ ණය පියවීම සඳහා කාර්තු පදනමින් වර්ෂ 4ක් තුළ ආපසු ගෙවිය යුතු විය. ඒ අනුව, 2012, 2013 හා 2014 දෙසැම්බර් 31 දිනට ණය මුදලේ ශේෂයන් වන පිළිවෙලින් රු.මිලියන 14,728 ක්, රු.මිලියන 10,020 ක් සහ රු. මිලියන 6,391ක් මෙම ශේෂයන්හි ඇතුළත් වේ.

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු වෙළඳ ණය වටිනාකම වන රු. මිලියන 37,060 න් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් ඉහත දැක්වූ සමාගම් දෙකෙන් ලැබිය යුතු වෙළඳ ණය නියෝජනය වී තිබුණි.

## බැංකු අංශයෙන් ලබා ගත් ණයවල ඉහළ දැමීම

සංස්ථාව විසින් බණිජ තෙල් බිල්පත් පියවීම සඳහා බැංකු වලින් ණය ලබා ගෙන තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ ලාභය අඩු වී තිබූ අතර සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය වැඩි වී තිබුණි. තවද,

සංස්ථාව අඛණ්ඩව පසුගිය අනුයාත වර්ෂ හතර තුල අධික මූල්‍ය පිරිවැයක් දරා තිබූ බව නිරීක්ෂණය වූ අතර එහි පහත විස්තර වන පරිදි වේ.

| වර්ෂය | දෙසැම්බර් 31 දිනට බැංකු අංශයෙන් ණය ලබා ගැනීම් | මූල්‍ය පිරිවැය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2010 | 168,020 | 6,859 |
| 2011 | 310,060 | 9,001 |
| 2012 | 399,520 | 18,360 |
| 2013 | 406,850 | 18,540 |
| 2014 | 376,607 | 13,962 |

## තෙල් ප්‍රවාහනය සඳහා නල මාර්ග ජාලය

කොළඹ වරාය සිට කොළොන්නාව ඛණිජතෙල් ස්ථාපිතයට ආනයනික පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැවිතෙල් වැනි ඛණිජ තෙල් නිෂ්පාදිත ප්‍රවාහනය කිරීම සඳහා දශක කිහිපයකට පෙර ස්ථාපනය කරන ලද නල මාර්ග අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග තුලින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී ඇත. එම අබලන් වූ නල මාර්ග තුලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් සමඟ මුළු රටම අකර්මන්‍ය වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති ඒක් අන්ත නැංගුරම් බෝයා පද්ධතිය (SPEM) මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට නිෂ්පාදිත සැපයෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවීය. අන්තර් පර්යන්ත නිෂ්පාදිත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොළොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවූ අතර, ඒ හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා වී තිබුණි.

"රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

## ධීවර කූපන් ක්‍රමය

ධීවරයින්ට සහනදායී මිලට ඉන්ධන මිලදී ගැනීමට පහසුකම් සැලසීමේ අරමුණින් රජය විසින් 2012 වර්ෂයේදී හඳුන්වා දුන් ධීවර කූපන් ක්‍රමය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා මහා භාණ්ඩාගාරයේ සහයෝගීත්වයෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, කූපන් ක්‍රමය ක්‍රියාවට නැංවීමේදී ඇති වූ පාලන ක්‍රමවල දුර්වලතා නිසා මෙම වැඩසටහන තුලින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල ඉෂ්ට කර ගැනීමට නොහැකි වී තිබුණි. එවැනි අසමත්වීම් පහත පරිදි වේ.

- ධීවරයන්, තෙල් බෙදා හරින්නන් සහ මෙම කූපන් ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වෙනත් පුද්ගලයින්ගේ අවභාවිතයන් සහ අවකල්ක්‍රියාවන් නිසා රජය විසින් 2013 සැප්තැම්බර් මසදී මෙම ක්‍රමය අත්හිටුවන ලදී.

- ව්‍යාජ කූපන්පත් අමුණා තිබීම, එකම කූපන්පත් දෙවරක් ඉදිරිපත් කිරීම වැනි විවිධ හේතු නිසා බෙදාහරින්නන්ට ප්‍රතිපූරණය කළ යුතු රු. මිලියන 24 ක මුදලක් සංස්ථාව විසින් රඳවා තබා ගෙන ඇත.

- වංචනික සහ ද්වීගණනය කරන ලද කූපන් සඳහා සංස්ථාව විසින් බෙදුම්කරුවන් වෙත රු. මිලියන 3 ක් ප්‍රතිපූරණය කර තිබුණි.

- 2012 ජුලි 20 සිට 2013 අප්‍රේල් 30 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී එක් බෙදුම් කරුවකු ඉල්ලුම් කරන ලද හිමි මුදලට වඩා රු. මිලියනයක් වැඩිපුර ගෙවා තිබුණි.

- 2013 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත රු. මිලියන 176 ක් වැඩිපුර ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම මුදල පියවා නොතිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පතුවක් ලෙස වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වියදම් යටතේ පෙන්වා තිබුණි.

## නාවික ඉන්ධන අලෙවිය (Bunkering Business)

පිරිපහදුවේ බොර තෙල් සැකසුම් ක්‍රියාවලියෙන් උපදවන ලද දැවි තෙල් 1500 අවසර ලත් නාවික ඉන්ධන සැපයුම්කරුවන්ට නිකුත් කිරීමෙන් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද අලාභය රු. මිලියන 1,277ක් වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට මෙම බෙදුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල රු. මිලියන 1,665 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

- සංස්ථාවට මෙම නිෂ්පාදනයන්ගෙන් වන අලාභය මඟහරවා ගැනීමට වඩා සකසුරුවම් සහිතව ඒම නිෂ්පාදන හසුරුවන ක්‍රමයක් සඳහා වන මනා සැලැස්මක් සංස්ථාවට නොතිබුණි. 2014 වර්ෂයේ දී ඒම නිෂ්පාදිතය දේශීය හා විදේශීය ගනුදෙනුකරුවන්ට පිළිවෙලින් මෙට්‍රික් ටොන් 54,796 ක් සහ මෙට්‍රික් ටොන් 44,138 ක් අලෙවියෙන් ලද අලාභය පිළිවෙලින් රු. මිලියන 1,277 ක් (මෙට්‍රික් ටොන් එකකට රු.23,296 ක් ) සහ රු. මිලියන 3,219ක් (මෙට්‍රික් ටොන් එකකට රු.72,936ක්) වශයෙන් විය.

- නාවික ඉන්ධන සැපයුම් ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කිරීම සඳහා කිසිදු අලෙවි ප්‍රවර්ධනයක් සිදු කර නොතිබුණි.

# ජල සම්පාදන හා ජලාපවාහන

ජල මූලාශ්‍රයන් හා පාරිසරික සමතුලිතතාවය සුරකමින් පවිත්‍ර වූ පානීය ජලය නිෂ්පාදන හා විකිණීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන අතර රටේ මුළු ජන ගහණයෙන් සියයට 44කට නල ජලය ලබාදීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට කරන ලද ආයෝජනයේ වටිනාකම රු. බිලියන 283 ක් විය. ඒ අනුව මුළු ජනගහණයෙන් සියයට 56 ක් තවදුරටත් ළිං, ඇළ දොළ, ගංගා සහ වැව් යනාදී අනාරක්ෂිත ජල මූලාශ්‍ර මඟින් තම ජල අවශ්‍යතා සපුරාගන්නා අතර 2020 වසර වන විට රටේ ජන ගහණයෙන් සියයට 60 කට නල ජලය ලබාදීමට නියමිතය.

ජල සම්පාදන හා ජලාපවහන අංශය සම්බන්ධයෙන් 2014 වර්ෂයේ දී කරන ලද විගණනයේ ප්‍රධාන නිරීක්ෂණ වලින් කිහිපයක් පහත දැක්වේ.

- නල ජලය බෙදාහැරීම සඳහා අවශ්‍යය ජලය බොහෝ විට ගංගා මගින් ලබාගන්නා අතර අපවිත්‍ර වූ ජලය පිරිසිදු කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට මණ්ඩලයට සිදුවේ. ආරක්ෂිත පානීය ජලය ලබාදීම හා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා රජයට විශාල ප්‍රාග්ධනයක් දැරීමට සිදුවන අතර එය දේශීය හා විදේශීය ණය හා ආධාර වලින් මූල්‍යයනය කරනු ලබයි. ඒ සඳහා පසුගිය වසර 5 තුළ දරන ලද රාජ්‍ය වියදම පහත දැක්වේ.

| | රු. මිලියන |
|---|---|
| 2010 | 26,442 |
| 2011 | 27,222 |
| 2012 | 31,279 |
| 2013 | 26,076 |
| 2014 | 27,249 |

ඒ අනුව දේශිය අරමුදල් හා විදේශාධාර යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධයෙන් කරන ලද විගණනයන්ගේ වැදගත් නිරීක්ෂණ පහත දැක්වේ.

(i) මූලික සැලසුම් හා අධ්‍යනයන් අනුව ව්‍යාපෘති නිමකිරීමේ අපේක්ෂිත කාලය තීරණය කර තිබුණද, නියැදියට භාජනය වූ ව්‍යාපෘති අතරින් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් අපේක්ෂිත කාලය තුල නිමකර නොතිබුණි. මේ සඳහා විවිධ හේතූන් බලපා තිබුණ ද අවසානයේදී අතිරේක කාර්යයන් සහ මිල වැඩවීම් වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට රජයට සිදුවී තිබුණි.

(ii) විදේශ ව්‍යාපෘතීන් සම්බන්ධව මූල්‍ය ආයතන සමග ඇති කරගත් ගිවිසුම් අනුව හා භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියමයන් පරිදි එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් ගිණුම් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කල යුතු නමුත්, විදේශ ව්‍යාපෘති 12 ක් සම්බන්ධව එම අවශ්‍යතාව ඉටු කර නොතිබුණි. ඉදිරිපත් කරන ලද ගිණුම්ද නිශ්චිත කාලවකවානුව තුල ඉදිරිපත් කිරීමට අසමත් වී තිබුණි.

(iii) විදේශ ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා රජය හා ජල සම්පාදන මණ්ඩලය අතර ඇති කරගන්නා උප ණය ගිවිසුම් රහිතව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 17 ක් විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iv) විදේශ ව්‍යාපෘතීන් මගින් මූල්‍ය සම්පාදනයේදී ඇතිවන අපහසුව මෙන්ම විදේශ කොන්ත්‍රාත්කරුවන් මගින් ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේදී දැරීමට සිදුවන ඉහල පිරිවැයට මණ්ඩලයේ අවධානය යොමු කරමින්, භාණ්ඩාගාර ඇපකර සමග දේශීය බැංකු මගින් දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ තාක්ෂණ හා මූල්‍ය යෝජනා අනුව ජල හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම 52 ක් රු. බිලියන 62.7 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ ද ගෙවිය යුතු ණය පොළී අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීමත්, මූලික ඇස්තමේන්තු පිරිවැය අසාමාන්‍ය ලෙස වැඩිකර තිබීමත් හේතුවෙන් අපේක්ෂිත ආර්ථික, ඵලදායි හා කාර්යක්ෂම ලෙස අරමුදල් උපයෝජනයක් ඉන් සිදු නොවන බව නිරීක්ෂණය විය.

- විදේශාධාර යටතේ ක්‍රියාත්මක වූ අසාර්ථක ව්‍යාපෘති සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) අඹතලේ පානීය ජලය පවිත්‍රාගාරය හා මීගමුව මුහුදු ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ස්පාඤ්ඤ ආධාර (SETA) ලෙස යුරෝ මිලියන 12.9 ක් ලැබී තිබුණු අතර එය ගිණුම් තැබීමේදී ණය ලෙස හෝ ප්‍රදාන ලෙස ගිණුම් තැබිය යුතුද යන්න පිළිබඳව මහ භාණ්ඩාගාරය වෙතින් මණ්ඩලයට නිශ්චිත උපදෙස් ලැබී නොතිබුණි.

ව්‍යාපෘතියේ මුහුදු ජල පවිත්‍රාගාරයට ජලය ලබාදෙන නල ළිඳෙහි ජල ධාරිතාව අඩුවීම, ජලයේ යකඩ හා රසායනික ද්‍රව්‍ය නිර්දේශ මට්ටමට වඩා අඩුවීම යන හේතු මත 2010 වර්ෂයේ සිට එම ව්‍යාපෘතිය අක්‍රියව පවතින අතර ජල පවිත්‍රාගාරය සඳහා වැය වූ මුදල රු. මිලියන 363 ක් විය.

මෙම ජල පවිත්‍රාගාරයේ වැඩ නිමකර වසර 05 ක් ඉක්ම ගොස් තිබුණ ද ඉන් අපේක්ෂා කල පාරිභෝගික පානීය ජල සම්බන්ධතා 3000 ක් ලබාදීමට මණ්ඩලය සමත්වී නොතිබුණි.

(ii) යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජලය ලබාගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය ඉරනමඩු ජලාශය වූ නමුත් ජනතා විරෝධතා හේතුවෙන් හා මූලික ශක්‍යතා අධ්‍යනය නිසි පරිදි සිදුනොවීම හේතුවෙන් එය මේ වන විට අසාර්ථක වී තිබුණි. මෙයට විසඳුම් ලෙස මුහුදු ජලය පිරිසිදු කර ලබාදීමට සැලසුම්කර තිබුණ ද ප්‍රදේශයේ ධීවරයින්ගේ විරෝධතා හේතුවෙන් එයද ක්‍රියාත්මක කල නොහැකිවී තිබීම ව්‍යාපාතියේ නිමකිරීම් කාලය දීර්ඝවීමට හා එහි මුළු පිරිවැය ඉහල යාමට හේතුවනු ඇත.

(iii) මොරටුව, රත්මලාන, ජාඇල, ඒකල අප ජල ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු බුංවත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අතරමග නවතා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 සහ 5.4.7 ඡේදයන්ට අනුව විදේශ බැංකුවකින් රඳවා

ගැනීමේ සහ කාර්ය සාධන සුරක්ෂිත ලබා ගැනිමේදී දේශීය බැංකුවකින් තහවුරුවක් ලබා ගතයුතු වුවද ඊට පටහැනිව ක්‍රියාකිරීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ මූල්‍යමය පාඩුව පියවා ගැනීම සඳහා අයකර ගත හැකිව තිබුණු එ.ජ.ඩො. 9,065,048 ක් වටිනා කාර්ය සාධන සුරක්ෂණය හා එ.ජ.ඩො. 7,959,086 ක ඉදිකිරීම් කොන්ත්‍රාත් වැඩ සඳහා රඳවාගැනීමේ මුදල් නිදහස් කිරීමේ සුරක්ෂිතය මුදල් කර ගැනීමට මණ්ඩලය අසමත් වී තිබුණි. තවද, මේ සම්බන්ධයෙන් නීති ක්‍රියාමාර්ග ගැනීම භාණ්ඩාගාරයේ උපදෙස් මත නතර කර තිබුණි.

- ග්‍රාමීය ජනතාවට ජල සැපයීම සඳහා ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ජල යෝජනා ක්‍රම 2,255 න් යෝජනා ක්‍රම 308 ක් 2014 දෙසැම්බර් 31 දිනට අතහැර දමා හෝ අක්‍රීයව පැවති අතර ජල මූලාශ්‍ර සිදීයාම, ජලයේ ගුණත්වය ප්‍රමිත පරිදි නොමැතිවීම , ප්‍රජා මූල සංවිධාන විසින් නිසි පරිදි නඩත්තු කටයුතු නොකිරීම හා ඒවායේ අකාර්යක්ෂමතා, ප්‍රජා මූල සංවිධානවල මූල්‍ය පාලනය නිසි පරිදි සිදුනොවීම, නල පද්ධතියට හානිවීම, ප්‍රජා මූල සංවිධාන වලට මණ්ඩලයෙන් අවශ්‍ය තාක්ෂණික සහය නොලැබීම යන දුර්වලතා ඊට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

- විවිධ ජල ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කරගැනීමේදි විශාල කාලයක් ගත වන අතර, ඉඩම් හයක් අත්පත් කර ගැනීම සඳහා 2010 වසරේ සිට රු. මිලියන 13 ක් විවිධ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල අත්තිකාරම් ලෙස තැන්පත් කර තිබුණ ද 2014 දෙසැම්බර් 31 දිනවන විටත් එම අත්පත් කර ගැනීම් සිදුකර නොතිබුණි.

- මහගාල්ල ජල සම්පාදන ක්‍රමය සඳහා හෙක්ටයාර් 1.123 ක ඉඩමක් රු. මිලියන 17 ක් ගෙවා 2011 වර්ෂයේ දී අත්පත් කර ගෙන තිබුණ ද එම ඉඩම 2014 දෙසැම්බර් 31 දිනවන විටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

- කාකාපල්ලිය ජල සම්පාදන ක්‍රමය සඳහා හෙක්ටයාර් 0.3895 ක ඉඩමක් 1994 වසරේ අත්පත් කරගෙන ඇතත් එම ඉඩම ද දිර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

- ගම්පහ සහ කුරුණෑගල ප්‍රාදේශිය සහය සේවා මධ්‍යස්ථානයේ රු. මිලියන 24 ක් වටිනා වත්කම් ගිණුම් ගත කර නොතිබුණු අතර කුරුණෑගල ප්‍රාදේශිය ගබඩාවේ රු. මිලියන 11 ක් වටිනා විදේශ ව්‍යාපෘති වලින් ලද ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිතගත නොකර තොගයේ පවත්වාගෙන ගොස් තිබුණි.

- ජල කාන්දුවීම, නීත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා, නොමිලේ ලබාදෙන ජලය හා පරිපාලන ගැටළු යනාදී හේතුන් නිසා වර්ෂය තුල මණ්ඩලයේ සමස්ථ ජල නිෂ්පාදිතය වූ ඒකක මිලියන 575 න් සියයට 29 ක හා කොළඹ නගරය තුල බෙදාහරින ලද ජල ඒකක මිලියන 57 න් සියයට 47 ක ප්‍රමාණයක් සඳහා ආදායම් නොලබන අතර එය අඩු කිරීම සඳහා විදේශ ව්‍යාපෘති තුනක් යටතේ රු. මිලියන 1,440 ක වියදමක් දරා තිබූ නමුත් ආදායම් නොලබන ජල අනුපාතයේ සැලකිය යුතු අඩුවීමක් සිදුවී නොමැති බව පහත තොරතුරු වලින් නිරීක්ෂණය විය. ඒ අනුව එක් ජල ඒකකයක් වෙනුවෙන් පාරිභෝගිකයකු දැරූ අතිරේක පිරිවැය රු. 7.86 ක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරේක ඒකක පිරිවැයේ රු. 8.05 සමඟ සන්සන්දනය කිරීමේ දී ඒකක පිරිවැයේ අඩුවීම සියයට දෙකක් වේ.

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| ආදායම් නොලබන සමස්ථ ජල ප්‍රතිශතය | 32 | 31 | 32 | 30 | 30 | 30 | 29 |

එමෙන්ම කොළඹ නගරය තුල ආදායම් නොලබන ජල ප්‍රමාණය සියයට 48 සිට සියයට 41 දක්වා සියයට හතකින් අඩු කිරීමට සමාලෝචිත වර්ෂයේ දී අපේක්ෂා කලද සත්‍ය ලෙස ලඟාකර ගැනීම හැකිවී තිබුණේ සියයට 47 ක් පමණි.

- තවද, කොළඹ නගරය තුල එලා ඇති වසර 80 ක් පමණ පැරණි ජලය බෙදාහැරීමේ නල පද්ධතිය ප්‍රතිසංස්කරණය හෝ ප්‍රතිස්ථාපනය කිරීමේ කාලීන අවශ්‍යතාවයක් ඇතත් එය ක්‍රියාත්මක වීම මන්දගාමී තත්වයක පවතී.

- ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සහ පානීය ජලය ආරක්ෂා කරගැනීම සඳහාත් නාගරිකකරණය සමග ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීම මෙන්ම මළාපවාහන පහසුකම් සැපයීමද මණ්ඩලයේ වගකීමක් වේ. විදේශාධාර ලබන මළාපවාහන ව්‍යාපෘති හතක් රු. බිලියන 22 වියදමක් යටතේ මේ වන විට ආරම්භ කර ඇතත් කොන්ත්‍රාත් පිරිනැමීම හා වැඩ ප්‍රමාදයන් හේතුවෙන් මණ්ඩලය විසින් මළාපවාහන පද්ධති මගින් සේවා සැපයීමේ ප්‍රමාණවත් ප්‍රගතියක් නිරීක්ෂණය නොවිණි.

- 2014 වර්ෂයේ රු. මිලියන 1,426 ක් වූ මණ්ඩලයේ මෙහෙයුම් ලාභය පසුගිය වසරට සාපේක්ෂව සියයට 5 කින් වැඩිවී තිබුණු අතර ශුද්ධ ලාභය සියයට 42 කින් වර්ධනය වී තිබුණි. වර්ෂයේ ආදායම සියයට 10 කින් හා අනෙකුත් මෙහෙයුම් ආදායම සියයට 21 කින් වැඩවීම මෙයට මූලිකවම හේතු වී තිබුණි. මෙහෙයුම් වියදම් වලින් සියයට 48 ක් සේවක පඩිනඩි සඳහා දැරීමට සිදුවී තිබු අතර ජල සම්පාදනය සඳහා ඍජුවම දායක වූ පිරිස සඳහා වන සේවක වියදමේ සියයට 9 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ නව සේවක බඳවා ගැනීම්වල සියයට 5 ක වර්ධනය මෙන්ම සේවක වැටුප් හා වේතන ඉහළ දැමීම සේවක පිරිවැය ඉහළ යාමට හේතුවී තිබුණි.

# රජයේ සේවය සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

රාජ්‍ය සේවය සඳහා උරදුන් නිලධාරීන්ගේ සේවා අවසාන ප්‍රතිලාභ සහතික කිරීම තුලින් ඔවුන්ගේ විශ්‍රාමික ජීවන තත්ත්වය නගා සිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සක්‍රීය දායකත්වය නිබඳව ලබාදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ.

මෙම මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහාත්, දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය වඩාත් ගුණාත්මකව හා කාර්යක්ෂම තලයකට රැගෙන ඒම සඳහාත්, පරිගණකගත විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුල ස්ථාපනය කර ක්‍රියාත්මක කරමින් පවතී. මෙම පරිගණකගත ක්‍රමවේදය තුල වඩාත් කාර්යක්ෂම සේවාවන් විශ්‍රාමිකයන්ට ලැබී තිබුණද, අදාල පරිගණක වැඩ සටහන තුල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගේ දුර්වලතා හේතු කොටගෙන විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ගෙවීම් කිරීමේදී වැරදි හා අඩුපාඩු සිදුවීම ඉතා ඉහළ මට්ටමක පවතින බව විගණන පරීක්ෂණයන් හිදී තහවුරු වී ඇත.

2014 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබන විශ්‍රාමිකයින් සංඛ්‍යාව 546,379 ක් වන අතර, වර්ෂය තුළ රාජ්‍ය විශ්‍රාම වැටුප් වියදම රුපියල් මිලියන 145,293 ක් විය. එය මුළු රාජ්‍ය පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස සැලකූ විට සියයට 11 ක් වන අතර මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 12 කට ආසන්න ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රජය විසින් වාර්ෂිකව දරනු ලබයි.

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තුළ පැවති හා පවතින අභ්‍යන්තර පාලන දුර්වලතාවයන් සහ විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සහ අක්‍රමිකතා පිළිබඳව විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- විශ්‍රාම වැටුප් පරිගණක පද්ධතියට සාවද්‍ය තොරතුරු ඇතුළත් කිරීම හේතුවෙන් ද්විත්ව ගෙවීම් සිදුවීම හා වෙනත් අක්‍රමිකතාවයන් හේතුවෙන් 2014 වර්ෂය තුළදී රුපියල් මිලියන 30.6 ක මුල්‍ය වංචාවක් සිදුකර තිබූ බව අභ්‍යන්තර විගණන අංශය විසින් අනාවරණය කර ගෙන තිබුණි. මධ්‍යගත පරිගණක ක්‍රමයක් නොමැති වීම සහ පරිගණකයට තොරතුරු ඇතුළත් කිරීම් වෙනස් කිරීම හා සැකසීම් විශ්‍රාම වැටුප් ගෙවනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට සිදුකිරීමේ හැකියාව පැවතීම හේතුවෙන් මෙම වැරදි හා වංචා සිදුකිරීමට ඉඩකඩ සැළසී තිබුණි.

- නිවැරදි නොවන විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ ඇතුලත් කර තිබූ තොරතුරු මත බැංකු ක්‍රමය හරහා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදය ස්ථාපිත කිරීමත්, පද්ධතියේ තොරතුරු සම්බන්ධයෙන් වූ දුර්වල පාලනයත් හේතුවෙන් ඇතිවූ පහත සඳහන්, අවිධිමත් තත්ත්වයන්ද විශ්‍රාම වැටුප් අක්‍රමිකතාවයන් සිදුවීමට හේතුවී තිබුණි.

    (i) විශ්‍රාම වැටුප් අංක ලබා දීම මධ්‍යගතව හා විමධ්‍යගතව ලෙස ආකාර දෙකකට යම් යම් කාලසීමාවන් තුළ පැවතීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීමේ ඒකාකාරී ක්‍රමයක් නොතිබීම හේතුකොට ගෙන එකම විශ්‍රාම වැටුප් අංකය විශ්‍රාමිකයින් ගණනාවකට නිකුත් කර තිබීම.

(ii) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය සඳහා ඇතුළත් කරන තොරතුරුවල යම් තොරතුරක ස්ථාවර පාලන කාරකයක් (unique key) ලෙස යොදා ගෙන නොතිබීම.

(iii) විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 145(2)(3) විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යලයන්හි මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරින්ට විධිමත් පරිදි කාර්යභාරයන් පැවරීමක් සිදුකර නොතිබීම.

(iv) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් තොරව සිදු වීම.

(v) විශ්‍රාම යන අවස්ථාවේදීම වැන්දඹු හා අනත්දරු ගොනු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැන්දඹු හා අනත්දරු ගෙවීම්වල විශාල ප්‍රමාදයක් පැවතීම හා ඒ අනුව හිඟ වැන්දඹු හා අනත්දරු ගෙවීම් සිදු කල යුතු ප්‍රමාණය ඉහල යෑම.

(vi) විශ්‍රාම වැටුප් නිළධාරින් හා ඒ සම්බන්ධ කාර්යයන්හි නියුතු නිළධාරින් සම්බන්ධයෙන් ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබීම හේතුවෙන් ඉතා දීර්ඝ කාලයක් එකම අංශයේ එකම කටයුතු වල යෙදෙන නිලධාරීන් සිටීම.

(vii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති විශ්‍රාම වැටුප් නිළධාරින් වෙත කාර්ය පැවරුම් සිදු කිරීමේදී අදාල කාර්ය පැවරුම අධීක්ෂණ නිලධාරියෙකු වෙතින් පරික්ෂාවට භාජනය වන පරිදි අභ්‍යන්තර පරික්ෂාවක් ඇති වන අයුරින් නොපැවරීම හා අසීමිත බලතල පැවරීමක් සිදු කර තිබීම.

(viii) හඳුනාගන්නා ලද වැඩිපුර ගෙවීම් හා විශ්‍රාම වැටුප් වංචා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව එම වැරදි හා වංචා වලට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.

(ix) ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු යන ගෙවීම් සිදු කරන ආයතන මට්ටමින් ඒකාබද්ධ පාලන ගිණුමක් සැකසීමකින් තොරව විශ්‍රාම වැටුප් ගෙවීම.

(x) බැංකු පද්ධති හරහා විශ්‍රාම වැටුප් ගෙවීම ස්ථාපිත කිරීමේදී නිවැරදි විශ්‍රාමිකයාගේම බැංකු ගිණුමට මුදල් බැර වීම සම්බන්ධයෙන් තහවුරු කර ගැනීම සඳහා බැංකු පද්ධතිය සමඟ නිසි පාලන ක්‍රියාදාමයකට එළඹීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කර නොතිබීම.

- ජීවිත සහතික ඉදිරිපත් නොකල විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම, මරණ සහතිකය ඉදිරිපත් කල විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප නතර නොකිරීම හා අදාල සහතික කලට වේලාවට ඉදිරිපත් කිරීමට ග්‍රාම නිළධාරීන් කටයුතු නොකිරීම. 2012 සහ 2013 වර්ෂ වලදී පමණක් මියගිය විශ්‍රාමිකයින්ගේ මරණ සහතික ඉදිරිපත් කිරීමෙන් පසුවද, විශ්‍රාම වැටුප් අත්හිටුවීමකින් තොරව විශ්‍රාමිකයින්ගේ ගිණුම් වලට බැර කරන ලද මුදල රුපියල් 2,489,200 ක් වූ අතර, එම මුදල් විශ්‍රාම වැටුප් හිමියන්ගේ යැපෙන්නන් විසින් ලබාගෙන තිබුණි.

- සක්‍රීය විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව හා විශ්‍රාම ගොනු සංඛ්‍යාව අතර නොසැසඳීම් පැවතීම, විශ්‍රාම ගොනුවක් තුල පැවතිය යුතු අත්‍යාවශ්‍ය ලියවිලි අදාල විශ්‍රාම ලිපිගොනු තුල නොපැවතීම සහ විශ්‍රාම වැටුප් සම්බන්ධ ගණනය කිරීම් සිදු කරන විට සමාන ආකාරයේ ගෙවීම් පවතින ගොනුවල ගණනය කිරීම් හි විවිධ විෂමතා පැවතීම.

- 2009 ජුලි සිට දෙසැම්බර් දක්වාත්, 2010 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වාත් විශ්‍රාම වැටුප් ගෙවීමේ දත්ත, පරිගණනක ගත දත්ත පද්ධතියෙන් සම්පූර්ණයෙන් ඉවත්වී තිබුණි.

- විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට විශ්‍රාමිකයකු සම්බන්ධයෙන් ඇතුලත් කලයුතු සියල්ලම සම්පූර්ණයෙන් ඇතුලත් කර නොතිබුණද විශ්‍රාම වැටුප් ඉල්ලුම් කිරීමට හෝ ගෙවීමට එය බාධාවක් වි නොතිබූ අතර, 2014 ජුලි මාසයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට අනුව බැංකු ගිණුම් අංකයක් නොමැති විශ්‍රාමිකයින් 100,915 ක්ද ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොමැති විශ්‍රාමිකයින් 148,248 ක්ද බැංකු සංකේත (කුමන බැංකුවට විශ්‍රාම වැටුප බැරවන්නේදැයි හඳුනා ගැනීම සඳහා) සඳහන් නොවන විශ්‍රාමිකයින් 134,974 ක් ද වශයෙන් දත්ත තීරු අසම්පූර්ණව තිබියදී විශ්‍රාම වැටුප් ගෙවන ලද පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් දත්ත පද්ධතියේ තොරතුරු අනුව හඳුනාගත හැකි විය.

- දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ යුද්ධයේදි මියගිය හා ආබාධිත රණවිරුවන් සඳහා අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් වැටුප් ගෙවීම සඳහා සන්නද්ධ අංශයන් හා පොලිසිය වෙත මුදල් නිදහස් කිරිමේදි වියදම් වාර්තා ක්‍රමානුකූලව ලබාගෙන නොතිබුණි. මෙම මුදල ගෙවීම් කිරිම පිළිබඳව දෙපාර්තමේන්තුවේ සම්බන්ධිකරණයක් හා අධික්ෂණයක් සිදු වි නොතිබුණු බැවින් ඒ හේතුවෙන් වැටුප සමඟ සහ විශ්‍රාම වැටුප හෝ වැන්දඹු විශ්‍රාම වැටුප සමඟද ජීවන වියදම් දිමනාව සාවද්‍ය ලෙස වැඩිපුර ගෙවීම් කර තිබුණි.

- උක්ත කරුණ සම්බන්ධයෙන් ගුවන් හමුදාවේ දත්ත හා නාවික හමුදාවේ දත්ත සමඟ සිදුකළ නියැදි පරික්ෂාවේදී 2008 වර්ෂයේ සිට ආබාධිත හා මියගිය ගුවන් රණවිරුවන් 301 ක් සඳහා රු.මිලියන 17.12 ක මුදලක්ද නාවික රණවිරුවන් 36 දෙනෙකු සඳහා රු.මිලියන 4.39 ක මුදලක්ද වශයෙන් රු. මිලියන 21.52 ක් සාවද්‍ය ලෙස වැඩිපුර ගෙවීම් කර තිබුණි.

  මෙහිදී, විශ්රාම වැටුප් දත්ත පද්ධතිය 2008 වර්ෂයේ සිට පවතින බැවින් ඊට පෙර තත්ත්වය පරික්ෂා කල නොහැකි වු බවද, තොරතුරු නිසි පරිදි නොමැති වීමෙන්, විශ්‍රාම වැටුප දත්ත පද්ධතිය සමඟ ගලපා ගත නොහැකි වු නාවික හා ගුවන් රණවිරුවන් ගණන 1,679 ක් වු බවද, වයස අවුරුදු 55 සම්පූර්ණ වී වැටුප නතර වු රණවිරුවන්ගේ දත්ත තවදුරටත් සළකා බැලිය යුතුය.

  පොලිසිය හා යුධ හමුදාව සම්බන්ධයෙන්ද මේ සියළු කරුණු සලකා බැලු විට සන්නන්ධ අංශයන් හා පොලිස් නිලධාරින් වෙත උක්ත කරුණු අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මේ සියල්ල සම්බන්ධීකරණය නොකිරීම හේතුවෙන් සාවද්‍ය ලෙස ජීවන වියදම් දීමනා වැඩිපුර ගෙවීමෙන් රජයට වාර්ෂිකව විශාල පාඩුවක් සිදු වෙමින් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය.

- ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය සියයට 50 ට වැඩි ආබාධිත සන්නන්ධ හා පොලිසියේ නිලධාරීන් වැටුප් හා දීමනා සහිතව විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප ගෙවිය යුතු වුවද, නාවික හමුදාවේ

187 දෙනෙකුගේ ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය සියයට 50 ට අඩු තත්ත්වයකදී වැටුප හා දීමනා සහිතව විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප්ද ගෙවා තිබුණි.

- 2014 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් ලෙස විසර්ජන ගිණුමේ රු.මිලියන 188.96 ක මුදලක් පැවතුණද, එම වැඩිපුර ගෙවීම සඳහා පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කරගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

- ඉ - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතියේ නියමු ව්‍යාපෘතිය 2011 සැප්තැම්බර් 20 දින සාර්ථකව අවසන් කර ඇති අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් හා අනෙකුත් වියදම් හැර රුපියල් මිලියන 182 ක වියදමක් දැරූ පසුව පද්ධතියේ හටගත් තාක්ෂණික දෝෂයන් නිසා යැයි දක්වමින් 2013 නොවැම්බර් 01 දින සිට මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුණි.

- හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදුකිරීම 2014 ජූනි මස සිට නතර කිරීමේදී ඒ පිළිබඳ අධ්‍යනය කර දෙපාර්තමේන්තු ව්‍යුහය ඒ අනුව සකසා නොතිබුණි. හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳව සිදු කළ විගණන පරීක්ෂණයේදී විශ්‍රාමිකයන් 58 දෙනෙකු සඳහා රු.මිලියන 14.78 ක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

- අංක 14/2014 හා 2014 නොවැම්බර් 18 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය පරිදි සේවයේ විශ්‍රාම ගන්වනු ලබන සිවිල් හා හමුදා නිළධාරීන්ගේ ගෙවීම් තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මධ්‍යගත දත්ත පද්ධතියට ඇතුලත් කර 2014 ඔක්තෝබර් 1 දිනට පසුව විශ්‍රාම යන විශ්‍රාමිකයින්ගේ ප්‍රථම මාසික විශ්‍රාම වැටුප 2014 නොවැම්බර් මස සිට ගෙවීම් කිරීම ආරම්භ කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂාවේදී විශ්‍රාමිකයින් 07 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමේදී ද්විත්ව ගෙවීම් ලෙස රු.මිලියන 0.34 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය සම්බන්ධව කටයුතු බාහිර උපදේශකයකුගේ සේවය 2012 වර්ෂය සිට ලබාගෙන තිබූ අතර 2013 වර්ෂයේ සිට අඛණ්ඩවම ඔහු වෙතින් එම රාජකාරිය ලබා ගැනීමේදී නිශ්චිත කාලයක් සඳහන් කර නොතිබූ අතර මෙවැනි උපදේශකවරයෙකු මඟින් සකස් කරන ලද පරිගණක මෘදුකාංග අනුව මෙම සියළු විශ්‍රාම වැටුප් ගෙවීම් කිරිමේදී එකී කටයුතු සඳහාත් එම නිලධාරියා සම්බන්ධ වීමක්ද නිරීක්ෂණය විය.

- විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත හා ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේදී ඇතුලත් කල පුද්ගලයා හඳුනාගත හැකි වන පරිදි එම පුද්ගලයාට ආවේනික වන රහස්‍ය සංකේත භාවිතා කර නොතිබූ අතර පද්ධතියට දත්ත ඇතුලත් කිරීම පුහුණු වන පරිගණක සහායකයින් යොදාගෙන සිදුකර තිබීම හේතුවෙන් සාවද්‍ය දත්ත පරිගණක පද්ධතියට ඇතුළත් වී තිබුණි.

## විශ්‍රාමික පාරිතෝෂිත ගෙවීමේ දුර්වලතා

විශ්‍රාම ගිය ඇතැම් රජයේ නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු අවකරණ තිබියදී එම මුදල් අයකර ගැනීමෙන් තොරව මුළු විශ්‍රාමික පාරිතෝෂික මුදලම විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබීම නිසා අදාල විශ්‍රාමිකයාගෙන් රජයට අයකරගත යුතුව තිබූ විශාල මුදලක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.උදාහරණයක් ලෙස විගණන නියැදි පරික්ෂාවට භාජනය කරන ලද දකුණු පළාත් සභාවේ කළාප අධ්‍යාපන කාර්යාල 9 ක විශ්‍රාමිකයින් 141 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු රු. මිලියන 7.68 ක් වූ මුදල් ද දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 3ක විශ්‍රාමිකයින් 24 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු රු. මිලියන 0.54 ක් වූ මුදලක්ද වශයෙන් එකතුව රු.මිලියන 8.22 ක් වූ මුදලක් අයකර ගැනීමකින් තොරව විශ්‍රාමිකයින් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

# පළාත් සභා විගණන නිරීක්ෂණවල සාරාංශය

# බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 45,803 ක ආදායමක් ඇස්තමේන්තු කර එයින් රු. මිලියන 14,526 ක් රජයේ ප්‍රදාන මඟින් ලබාගැනීමට හා රු. මිලියන 31,277 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කිරීමටද, මින් රු. මිලියන 39,024 ක් පුනරාවර්තන වියදම් සඳහා හා රු. මිලියන 6,779 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මඟින් රු. මිලියන 13,306 ක් ලැබී තිබූ අතර රු. මිලියන 31,092 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 38,582 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 5,863 ක් වැයකර තිබුණි.

බස්නාහිර පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු (vat) ගෙවීමේදී කොන්ත්‍රාත් ඉන්වොයිසිවල සඳහන් එකතු කළ අගය මත බදු (vat) ලියාපදිංචි අංක හා කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කරවා නොගැනීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අක්‍රීය වැට් බදුහිමියන් ලෙස නම් කරන ලද කොන්ත්‍රාත්කරුවන් 25 දෙනෙකු සඳහා 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.3,895,579 ක් හා රු. මිලියන 6.65 ක් වැට් බදු ලෙස ගෙවා තිබුණි.

- පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය රු. මිලියන 158.03 ක් වැය කර 2012 වර්ෂයේදී මිලදීගත් කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර දෙක මිලදී ගෙන වසර තුනක් ගතවී තිබුණද එක් අවස්ථාවකදී පරීක්ෂණ මට්ටමින් භාවිතා කිරීම හැර කිසිදු මාර්ග ඉදිකිරීමක් සඳහා යොදාගෙන නොතිබුණි. කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර මිලට ගැනීමේදී එම යන්ත්‍ර ශ්‍රී ලංකාවේ මාර්ග ඉදිකිරීමේ කටයුතුවලට යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ නිවැරදි නිර්ණායක මත ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොමැති නිසා එම යන්ත්‍ර නිශ්කාර්ය තත්ත්වයට පත්වී ඇති බව නිරීක්ෂණය විය.

- 2012 අයවැය යෝජනා ප්‍රකාරව 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා 2012 ජනවාරි සිට මාසිකව රු. 15,000 බැගින් ගෙවීමට අනුමත වූ වෘත්තීය දීමනාව බස්නාහිර පළාත් සභාවටද අදාල කරගෙන තිබුණි. පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නොවන ඉංජිනේරුවරුන් 23 දෙනෙකු සඳහා 2012 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා වෘත්තීය දීමනා වශයෙන් රු. මිලියන 11.34 ක් ගෙවීම් කර තිබුණි.

- පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ගම්පහ දිස්ත්‍රික් විධායක ඉංජිනේරු කොට්ඨාශ 04 මඟින් රුපියල් බිලියන 05 ක් වටිනා මාර්ග සංවර්ධන ව්‍යාපෘති 158 ක්, පැකේජ ක්‍රමය යටතේ ව්‍යාපෘති 26 ක් ලෙස පෞද්ගලික කොන්ත්‍රාත් සමාගම් 03 කට ප්‍රදානය කර තිබුණි. මේ ආකාරයට ප්‍රදානය කර ඇති එක් එක් පැකේජයන් පිළිබඳ පරීක්ෂාවේදී ගිවිසුම් ප්‍රකාරව ලබාදී ඇති කාලසීමාව තුළ කිසිදු ව්‍යාපෘතියක් නිම කර නොතිබූ අතර ගිවිසුම් ප්‍රකාරව එම කොන්ත්‍රාත් මත අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු.මිලියන 365.95 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම

ව්‍යාපෘති සඳහා රු.මිලියන 768.71 ක් වැඩ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර ඉන් රු. මිලියන 342.39 ක්වූ අත්තිකාරම් සඳහා අත්තිකාරම් බැඳුම්කර ලබාගෙන නොතිබුණි.

- පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය 2012 වර්ෂයේදී රු. මිලියන 6.20 ක් වැයකර මිලට ගන්නා ලද කර්බ් (Cuber) යන්ත්‍රය 2014 නොවැම්බර් වන විටත් ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට එකලස් කිරීමක් සිදු නොකොට දිවුලපිටිය කොන්ක්‍රීට් අංගනයේ ගබඩාවේ තබා තිබුණි.

- මෝටර් රථවාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමට පැමිණෙන පාරිභෝගික ජනතාවට තැරැව්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සපයා ඔවුන්ගේ මුදල් ලබා ගැනීමෙන් ව්‍යාජ බලපත්‍ර ලබාදීමේ ජාවාරමක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන බව නිකුත් කර ඇති ව්‍යාජ ආදායම් බලපත්‍ර සංඛ්‍යාව අනුව විගණනයේදී නිරීක්ෂණය විය. වර්ෂ ගණනාවක සිට මෙවැනි ව්‍යාජ බලපත්‍ර ලබාදී තිබියදීත් කාර්යාලය අවට වංචනික පුද්ගලයන් ගැවසෙන බවට මහජනයා දැනුවත් කිරීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට හා හඳුනාගෙන ඇති එවැනි ව්‍යාජ බලපත්‍ර සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

- 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 3(5) වගන්තියට අනුව එක් එක් පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ ආදායම් එකතු කිරීමේ බලයට අනුකූල නොවන පරිදි පළාත් සභාවට ලැබිය යුතු ආදායම පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට හිමිවන ඇතැම් විධිවිධාන 2007 මාර්තු 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර තිබුණි.

- කිරිබත්ගොඩ මූලික රෝහලට හදිසි අනතුරු ඒකක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර, 2014 වර්ෂය අවසන් වනවිට එහි ඉදිකිරීම් සහ අනෙකුත් කටයුතු වෙනුවෙන් ව්‍යාපෘති අදියර 08 ක් යටතේ රු. මිලියන 37.25 ක් වැයකර තිබුණි. 2015 වර්ෂයේ ජූලි මාසය වනවිටද මෙම කටයුතු නිම නොවීම හේතුවෙන් වැය කරන ලද මුදලින් මහජනතාවට ප්‍රතිලාභ ලබාගැනීම තවදුරටත් ප්‍රමාදවී තිබුණි.

- පළාත් අමාත්‍යවරුන් සඳහා අනුමත පෞද්ගලික කාර්ය මණ්ඩලයට උපදේශක තනතුරු ඇතුළත්ව නොතිබියදී පළාත් අමාත්‍ය මණ්ඩලයේ තීරණයන් හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත 2008 ජනවාරි සිට 2014 ජනවාරි දක්වා වරින් වර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු සියළු අමාත්‍යවරුන් සඳහා උපදේශකවරුන් පත්කර තිබුණි. මේ ආකාරයට පත්කර ඇති උපදේශකවරුන්ට රු.30,000 බැගින් මාසික දීමනාවක් සහ වාහන, ඉන්ධන, දුරකථන දීමනා වැනි අනෙකුත් වරප්‍රසාද ද ලබාදී තිබුණි.

- 2007 අංක 01 දරන බස්නාහිර පලාත් සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පළාතේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවලින් පරිසරයට එකතුවන අපද්‍රව්‍ය උපරිම ලෙස වගක්වා පළාතේ මහජනතාවගේ මෙන්ම සතුන් හා වෘක්ෂලතා ආදියේද පහපත උදෙසා පරිසරය පිරිසිදුව තබා ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලැසීම අරමුණු කරගෙන තිබුණි. පළාත් පාලන ආයතන හා අනෙකුත් පාහිර ආයතනවලින් එකතු කරනු ලැබූ කසල දළ වශයෙන් දිනකට ටොන් 500 ක් පමණ අවිධිමත්ව කරදියාන ඉඩමට බැහැර කර තිබූ අතර, එමගින් අධිකාරිය උපයා තිබූ ආදායම මුළු ආදායමෙන් සියයට 90 ක් පමණ විය. කරදියාන ඉඩමට විධිමත් නොවන පරිදි

කසල  බැහැර කිරීමෙන් පරිසරයට වන හානිය සම්බන්ධයෙන්  අධිකාරිය මහජනතාවගෙන් හා වෙනත් ආයතනවලින් විරෝධතා එල්ලවී තිබියදී ඒ සම්බන්ධයෙන් අධිකාරිය  විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

- 2006 අංක 03 දරන බස්නාහිර පළාත් සමාජ සේවා ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන වැඩිහිටියන්, ආබාධිතයන් සඳහා වූ නිවාස සහ ඔවුන් සඳහා සේවා සපයන ආයතන සියල්ලක්ම සමාජසේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතු විය. 2014 දෙසැම්බර් මාසය වනවිට වැඩිහිටි නිවාස 73 ක් හා අබාධිත නිවාස 39 ක් ලියාපදිංචි කර තිබූ අතර ලියාපදිංචි නොවූ වැඩිහිටි හා ආබාධිත නිවාස විශාල ප්‍රමාණයක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මකව පැවතියත් එම ආයතන ලියාපදිංචි කරවීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

- පළාත් සභාවේ අමාත්‍යාංශ හා දොපර්තමේන්තුවල ඉහළ කළමනාකරණ තනතුරු ඇතුළු විවිධ තනතුරුවල  සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් සැලැකිය යුතු ප්‍රමාණයක් ආණ්ඩුකාරවරයාගේ/ පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන්  කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගෙන තිබූ අතර, ඉහළ ශ්‍රේණිවල පුරප්පාඩු තනතුරුවලට වැඩ බලන නිලධාරීන්  පත් කිරීම දිගින් දිගටම  තිබුණි.

- පළාත් සභාවේ ඇතැම් දෙපාර්තමේන්තු / ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ ගණකාධිකාරී තනතුරක් නොමැති වූවද එම දෙපාර්තමේන්තු / ප්‍රාදේශීය කාර්යාල සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ පදනම මත වෙනත් කාර්යාලවල ගණකාධිකාරීවරුන් පත්කර ඔවුන්ට දීමනා ගෙවා තිබුණි.

- පළාත් සභාව ආරම්භයේ සිට වාර්ෂික මුදල් ප්‍රකාශය මඟින් ප්‍රධාන අමාත්‍යවරයාට පැවරී තිබූ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා ආර්ථික සංවර්ධනය යන විෂයයන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය 2009 මැයි මාසයේදී ප්‍රධාන ලේකම්ට පවරා තිබුණි. ඒ අනුව ප්‍රධාන අමාත්‍ය ලේකම්ගේ විෂය පථයට ඇතුළත්ව තිබූ අමාත්‍ය මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නිකුත් කිරීම ප්‍රධාන ලේකම්ට පැවරී තිබුණි. ප්‍රධාන ලේකම්, පළාත් භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් පළාත් ශිඝ්‍රකාරක සභාව නියෝජනය කරන බැවින් අමාත්‍ය මණ්ඩල රැස්වීම් මෙහෙයවීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවලට අත්සන් තැබීම සුදුසු කටයුත්තක් නොවූ අතර, එය ආණ්ඩුකාර ලේකම්වරයාද පිළිගෙන තිබූ නමුත් එම තත්ත්වය 2014 දෙසැම්බර් මාසය දක්වාත් නිවැරදි කරගැනීමට කටයුතු කර නොතිබුණි.

# මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 24,752 ක ආදායමක් ඇස්තමේන්තු කර එයින් රු. මිලියන 19,527 ක් රජයේ ප්‍රදාන මගින් ලබා ගැනීමට හා රු.මිලියන 5,225 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කිරීමටද, මින් රු.මිලියන 20,825 ක පුනරාවර්තන වියදම් සඳහා හා රු.මිලියන 3,927ක මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 21,824 ක් ලැබී තිබූ අතර රු.මිලියන 5,285 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 21,661 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 4,565 ක් වැයකර තිබුණි.

මධ්‍යම පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාල වූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු ඉටුකිරීම වෙනුවෙන් එම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ 2014 වර්ෂයේදී රු. මිලියන 12,108.41 ක් වැය කර තිබූ අතර, ඉන් වැය විෂයයන් 07 ක් යටතේ රු. මිලියන 116.58 ක් ප්‍රාථමික හා ද්වීතියික අධ්‍යාපන තත්ත්ව යෙදවුම් සඳහා වැයකර තිබුණි. කෙසේ වුවද, විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා අවශ්‍ය විෂයානුබද්ධ ප්‍රතිඵල සමාලෝචනයක් සිදුවී නොතිබුණු අතර, ප්‍රතිඵල ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගත් බවට හෝ සාක්ෂි ඉදිරිපත් නොවීය. 2014 වර්ෂයේ විභාග ප්‍රතිඵල පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වෙන අතර, මෙම විභාග ප්‍රතිඵල තුළ ජාතික පාසැල් 54 ක තොරතුරු ද ඇතුළත්ව ඇත.

| විභාගය | ඉදිරිපත් වූ සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | අසමත් මුළු සංඛ්‍යාව | සියළු විෂයයන් අසමත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5 වසර ශිෂ්‍යත්වය | 43,595 | 4,891 | 38,704 | - |
| අ.පො.ස. (සා.පෙ) | 34,085 | 22,481 | 11,604 | 1,255 |
| අ.පො.ස.(උ.පෙ) | 25,975 | 15,547 | 10,428 | 1,862 |

පළාත් සමස්ථ ප්‍රතිඵල අනුව මධ්‍යම පළාතට අ.පො.ස. (සා.පෙ) සඳහා 6 වැනි ස්ථානයත්, අ.පො.ස. (උ.පෙ) සඳහා 7 වැනි ස්ථානයත් හිමිවී තිබුණි.

- මධ්‍යම පළාත් සභා පරිපාලන සංකීර්ණය සඳහා 300 KVA හා 400 KVA ධාරිතාවයෙන් යුත් විදුලි ජනන යන්ත්‍ර 2 ක් සපයා සවිකිරීම සඳහා 2013 ජනවාරි 28 දින ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු. මිලියන 31.30 ක මුදල් ගෙවා වසර 2 ක පමණ කාල පමාවකින් පසු එනම් 2015 පෙබරවාරි මසදී රු. මිලියන 16.49 ක් වටිනා 400 KVA විදුලි ජනන යන්ත්‍රය පමණක් සපයා සවිකර තිබුණි.
- 2014 අප්‍රේල් 23 දිනැති අංක සීපීසී/සීඑම්/සීබී/2014/32 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මධ්‍යම පළාත් සභාවේ තනතුරුධාරී මන්ත්‍රීවරුන් සඳහා නිවාස 03 ක් වෙන් කර ඒ සඳහා රු.2,196,341 ක් වටිනා ගෘහ භාණ්ඩ සපයා නවාතැන් පහසුකම් සම්පූර්ණ කර තිබුණු නමුත් එම නිවාස ඌන උපයෝජිතව පැවතුණි.

- ප්‍රධාන අමාත්‍යාංශය යටතේ වූ අංක 550-60-4-0-2602 දරන "මහවැලියෙන් පවරාගත් වත්කම් නඩත්තු" යන වැය විෂයය සඳහා සළසා තිබූ රු. මිලියන 10.00 ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන 4.43 ක් පල්ලේකැලේ ජනසවිගම පිහිටි ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමට සහ ඇවිදින මන්තීරු ඉදිකිරීම සඳහා වැයකර තිබුණි. ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුව රු. මිලියන 4.08 ක් වුවද, 2014 දෙසැම්බර් 31 දින වනවිට එම ව්‍යාපෘතියෙන් සියයට 60 ක් නිමකිරීම සඳහා රු. මිලියන 4.44 ක් වියදම් දරා තිබුණි. එය මුළු ඇස්තමේන්තුව රු.355,516 කින් ඉක්මවීමක් විය.

- 2013 වර්ෂයේ සිට පිරිවැටුම් බදු අය කිරීම නවතා තිබුණු නමුත්, මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 64.66 ක පිරිවැටුම් බදු ඇතුළුව රු. මිලියන 175.14 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

- රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් වූ අංක CSA/PI/40 දරන 2006 ජනවාරි 04 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයෙකුට හා ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට තබාගතයුතු වාහන සංඛ්‍යාව 07 ක් වුවද, මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්යාලයට වාහන 12 ක් සහ සංචිතයේ වාහන වලින් 02 ක් අනුයුක්ත කර තිබුණි.

# උතුරු මැද පළාත් සභාව

උතුරු මැද පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 15,666 ක ආදායමක් ඇස්තමේන්තුකර එයින් රු. මිලියන 12,628 ක් රජයේ ප්‍රදාන මගින් ලබාගැනීමට හා රු. මිලියන 3,038 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කිරීමටද, මින් රු. මිලියන 11,286 ක් පුනරාවර්ථන වියදම් සඳහා හා රු. මිලියන 4,071 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුල රජයේ ප්‍රදාන මගින් රු. මිලියන 12,077 ක් ලැබී තිබුණු අතර රු. මිලියන 2,752 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 11,672 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 3,219 ක් වැය කර තිබුණි.

උතුරු මැද පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- ප්‍රධාන අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් රු. මිලියන 8.00 ක් වූ ගෙවීම් වවුචර් 106 ක් ඇතුළු විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදීම ප්‍රමාද කිරීම හෝ පැහැර හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විගණනය 2015 අප්‍රේල් 24 දිනවන විටත් අවසන් කිරීමට නොහැකි විය.

- පළාත් සභා හා පළාත් සභා ලේකම් කාර්යාලය විසින් ධූරධාරීන්ගේ, සභානායකගේ හා විපක්ෂනායකගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 5.83 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු නමුත් එකී කාර්යය මණ්ඩලයේ පැමිණීම තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එම කාර්යාල පරීක්ෂා කිරීමේදී ඔවුන් කාර්යාලය තුල සේවයේ යෙදී නොසිටි බවද තහවුරු විය.

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධි විධානවලට අනුකූල නොවන ලෙස සභා නායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙන් තනතුරු 04 ක් ඇති කර එකී තනතුරුධාරීන්ට පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද ඉක්මවූ වරප්‍රසාද ලබා දී තිබුණි. එකී වරප්‍රසාද වෙනුවෙන් අදාල තනතුරුධාරීන් වෙත 2014 වර්ෂයේදී රු. මිලියන 6.46 ක්ද ඉකුත් වර්ෂ දෙකේදී රු. මිලියන 11.06 ක් ද ගෙවා තිබුණි.

- දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනට පෙර ආපසු ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අනුව දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් 18 ක නිරවුල් නොකල අග්‍රිම ශේෂයන්හී එකතුව රු. මිලියන 374.62 ක් විය.

- පළාත් සභා සංවර්ධන ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ලෝක බැංකු ආධාර, සාමූහික ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු. මිලියන 1,615.59 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 1892 කින් ව්‍යාපෘති 1881 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු. මිලියන 1,055.22 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 1291 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති රු. මිලියන 1,011.22 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 719 කින් ව්‍යාපෘති 568 ක් ක්‍රියාත්මක කර එයින් ව්‍යාපෘති 501 ක් නිමකර තිබුණි.

- පළාත් සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු ඉඩම් අක්කර 540, වාහන 33, ගොඩනැගිලි 124, ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ විශාල ප්‍රමාණයක වටිනාකම තක්සේරු කර නොතිබුණි.

- පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ පළාත් සභා අමාත්‍යවරුන්ගේ දීමනා සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල දීමනා සඳහා එක් එක් අමාත්‍යාංශ වැය ශිර්ෂයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලින් එකී සම්පූර්ණ දීමනා ගෙවා තිබුණි. එසේ වුවත් එකී ගෙවීම් වලට අතිරේකව පළාත් සභා හා සභා ලේකම් කාර්යාල වැය ශිර්ෂය යටතේ 2014 වර්ෂයේදී රු. මිලියන 4.88 ක රියදුරු දීමනා හා පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණු අතර ඉකුත් වර්ෂ දෙකේදී ගෙවා තිබුණු එකී දීමනාවල වටිනාකම රු. මිලියන 8.06 ක් විය.

- 2007 නොවැම්බර් 19 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන චක්‍රලේඛ ලිපියෙන් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සමාංක දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කල හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද උතුරුමැද පළාත් ගරු ප්‍රධාන අමාත්‍යවරයා එකී අනුමත සීමාව ඉක්මවා වාහන 15 ක් භාවිතා කර තිබුණු අතර එකී වාහන ධාවනය සඳහා රු. මිලියන 5.99 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 44,850 ක් ලබාගෙන තිබුණි. එසේම ගරු ප්‍රධාන අමාත්‍යවරයාට වෙන්කර දෙන ලද නිල ඩීසල් රථ දෙකට හා ආරක්ෂක රථයට හිමි ඉන්ධන සීමාව ඉක්මවා වර්ෂය තුල ඉන්ධන ලීටර් 13250 ක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 1.80 ක් ගෙවා තිබුණි.

- වාහනවලට ඉන්ධන ඇණවුම් නිකුත් කිරීම සඳහා වාහන භාර නිලධාරීන්ගෙන් ලබා ගන්නා ඉන්ධන ඉල්ලුම් පත්‍රවල ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පැවරූ රජයේ නිලධාරියෙකු විසින් ඇණවුම් නිකුත් කිරීමට බලය දිය යුතු වුවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිල මුද්‍රාව යොදා ප්‍රධාන අමාත්‍යවරයා හෝ ඔහුගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරියෙකු ඉන්ධන ඇණවුම් නිකුත් කර ඔවුන් වෙත වෙන්කර දී තිබුණු වාහනවලට ඉන්ධන ලබාගෙන තිබුණි.

- ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් 20 දෙනෙකු සේවයේ යොදවා තිබියදීත් සමාලෝචිත වර්ෂය තුල අතිකාල හා නිවාඩු දින වැටුප් වශයෙන් රු. මිලියන 9.80 ක් පෞද්ගලික කාර්යය මණ්ඩලයට ගෙවා තිබුණි. ඒ අනුව අනුමත එක් තනතුරක මාසික අතිකාල හා නිවාඩු දින පිරිවැය රු.54,467 ක් විය.

- ගරු මැති ඇමතිවරු හා ආණ්ඩුකාරවරයා වෙනුවෙන් වාර්ෂිකව රු. මිලියන 1.39 ක ජීවිත රක්ෂණ වාරික ගෙවා තිබුණු අතර එකී ගෙවීම් සනාථ කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලද ලදුපත් හෝ වෙනත් ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ආයතනවල, පළාත් පාසල්වල සහ පළාත් රෝහල්වල අනුමත සේවක සංඛ්‍යාව 27270 ක් වූ අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 5985 ක් විය.

# දකුණු පළාත් සභාව

දකුණු පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 21,523 ක ආදායමක් ඇස්තමේන්තු කර එයින් රු.මිලියන 15,895 ක් රජයේ ප්‍රදාන මගින් ලබාගැනීමට හා රු.මිලියන 5,628 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කිරීමටද, මින් රු.මිලියන 18,812 ක් පුනරාවර්තන වියදම් සඳහා හා රු.මිලියන 2,711 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මගින් රු.මිලියන 17,332 ක් ලැබී තිබූ අතර, රු.මිලියන 5,410 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 20,147 ක් හා මූලධන වියදම් සඳහා රු.මිලියන 2,368 ක් වැයකර තිබුණි.

දකුණු පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ගේ උසස්වීමේ වැටුප් පරිවර්තනයන් සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

  (i) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇති වැටුප් වැඩිකිරීම දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින්ට ගෙවීමට අදාලව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2006 දෙසැම්බර් 26 දිනැති අංක DMS/B/03/01/03/01/ SA දරන ලිපිය මගින් ලබාදී ඇති නිර්දේශ වලට පටහැනිව වැටුප් පරිවර්තනයක් සිදුකර තිබුණි.

  (ii) විධිමත් අනුමැතියක් රහිතව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත අධිකාරියේ සියලුම මාණ්ඩලික නොවන සේවකයින් වෙත 2008 ජුලි 01 සිට වැටුප් වර්ධක 4 ක වැටුප් වැඩිවීමක් ලබාදී තිබුණි.

  (iii) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 , 2006 මැයි 26 දිනැති අංක 28(1), 2006 අගෝස්තු 1 දිනැති අංක 28(11), 2007 අගෝස්තු 01 දිනැති අංක 36 හා 2007 ඔක්තෝබර් 15 දිනැති අංක 36(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන හා 1990 මාර්තු 09 දිනැති අංක 15/90 , 1990 ජුනි 15 දිනැති අංක 15/90(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2006 ජනවාරි 01 සිට 2012 ජනවාරි දක්වා සේවකයින් 60 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

- දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් 2013 ජනවාරි මාසයේ සිට 2014 නොවැම්බර් මාසය දක්වා කාලය තුළදී අනියම් කම්කරුවන් 21 දෙනෙකු බඳවාගෙන ඔවුන් දකුණු පළාත් අධ්‍යාපන ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහාමාර්ග, ප්‍රවෘත්ති අමාත්‍යවරයා වෙත මුදාහැර තිබුණි. අධිකාරියට අදාල කිසිදු රාජකාරියක් මොවුන් විසින් ඉටුකර නොතිබියදී 2015 මැයි මාසය දක්වා වැටුප් වශයෙන් රු. මිලියන 5.46 ක් ගෙවා තිබුණි. මීට අමතරව දකුණු පළාත් අධ්‍යාපන සේවාව සඳහා බඳවාගත් සේවකයින් 12 දෙනෙකු ද මෙකී අමාත්‍යවරයාට අනුයුක්තකර තිබුණු අතර ඔවුන් වෙනුවෙන් 2014 වර්ෂය සඳහා වැටුප් වශයෙන් රු. මිලියන 2.86 ගෙවා තිබුණි.

- මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් විද්‍යාලයක පාසල් කාර්ය සහායකයකු ලෙස 2013 ඔක්තෝබර් 14 සිට පත්වීම් ලද කොටපොල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු එදින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා කාලය තුළදී දින 02 ක් පමණක් විද්‍යාලයට පැමිණ 2013 නොවැම්බර් මස සිට 2015 මාර්තු මාසය දක්වා වැටුප් වශයෙන් රු.406,798 ක් ලබාගෙන තිබුණි. මීට අමතරව එම කාලපරිච්ඡේදය සඳහාම කොටපොල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස රු.135,000 ක් මන්ත්‍රී දීමනා වශයෙන්ද ලබාගෙන තිබුණි. තවද දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත රියදුරු මහතකු 2006 වර්ෂයේ සිට ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරතිබූ අතර තම නිත්‍ය සේවා ස්ථානයේ පැමිණීම, පිටවීම අත්සන් කිරීමකින් හෝ කිසිඳු රාජකාරියක් ඉටුනොකර තිබියදී 2015 අගෝස්තු 31 දක්වා වැටුප් වශයෙන් රු.1,994,197 ක් ලබාගෙන තිබුණි.

- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සේවය කරනු ලබන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වරින් වර සිදුකරනලද වැටුප් ප්‍රතිශෝධනයන්ට අදාලව නියමිත පරිදි වැටුප් පරිවර්තනයන් සිදුනොකිරීම හා ප්‍රතිපාදන හිඟකම හේතුවෙන් 2015 ජුලි 31 දිනට ගෙවීමට ඇති හිඟ වැටුප් මුදල රුපියල් මිලියන 1,212.4 ක් විය. මෙම තත්ත්වය දකුණු පළාත් අධ්‍යාපන සේවාව තුළ සිටින කාර්ය මණ්ඩලයට සිදුවී ඇති අසාධාරණයක් බවත්, පළාත් අධ්‍යාපන සේවාවේ ගුණාත්මක තත්ත්වයට අහිතකර ලෙස බලපෑ හැකි බවත් නිරීක්ෂණය විය.

- “සුභ දකුණක් දිනූ ජයග්‍රහණ රැකගනිමු” යන තේමාව යටතේ 2015 වර්ෂය වෙනුවෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සුභ පැතුම් පත් 380,000 ක් මුද්‍රණය කර 2015 ජනවාරි 08 දින පැවති ජනාධිපතිවරණයට දින දෙකට පෙර දකුණු පළාතේ සියලුම පාසල් සිසුන් වෙත බෙදාදී තිබුණි. දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග, ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2014 දෙසැම්බර් 31 දිනැති ලිපිය මගින් අදාල සුභ පැතුම්පත් සිසුන්ගේ දෙමව්පියන් අතට පත්වන බවට පුද්ගලිකව සෑහීමකට පත්විය යුතු බව සියළුම විදුහල්පතිවරුන් වෙත දන්වා යවා තිබුණි.

- දකුණු පළාත් සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද නව ප්‍රභේද තේ පැල තවාන් ව්‍යාපෘතිය මගින් එක් තවාන් කරුවෙකු වෙත ලබාදී තිබුණු අත්තිකාරම් මුදලින් නැවත නොපියවූ රු. මිලියන 8.58 ක් ද ඊට අදාල රු. මිලියන 5.69 ක් වූ පොලිය හා රු. මිලියන 5.93 ක් වූ දෙපාර්තමේන්තු ගාස්තු ඇතුළුව රු.මිලියන 20.20 ක මුදලක් 2014 වර්ෂය ආරම්භය වන විට ලැබිය යුතුව තිබුණි. අධිකාරිය විසින් එම මුදල අයකර ගැනීමට කටයුතු නොකර කිසිඳු විධිමත් අනුමැතියක් රහිතව ඔහුට අයත් අක්කර 1යි පර්චස් 25 ක් වූ ඉඩමක් රු.7,026,250 කට පවරාගෙන තිබුණි. මෙම ඉඩම 1998 දෙසැම්බර් 02 දින රු.17,500 කටත් 2001 පෙබරවාරි 25 රු.50,000 කටත් හුවමාරු වී තිබූ අතර 2009 මාර්තු 24 දින තවාන්කරු විසින් මෙම ඉඩම රු.300,000 කට මිලට ගෙන 2013 මාර්තු 03 දින රු.350,000 කට විකුණා තිබුණි. එම ගැනුම්කරු වෙත 2014 ඔක්තෝබර් 24 දින අධිකාරිය විසින් රු.600,000 ක් ගෙවා ඉඩම අධිකාරියට පවරා නොගෙන ඒ වෙනුවට තවාන්කරු වෙත පවරාදීමට කටයුතු කර තිබුණි. ඊට දින 19 කට පසුව රජයේ තක්සේරුකරුගේ තක්සේරු වාර්තාවක් රහිතව දකුණු පළාත් ආදායම්

කොමසාරිස්ගේ තක්සේරුවක් මත රු. මිලියන 7.08 කට අධිකාරිය විසින් පවරාගෙන තිබුණු බවත් ඒ අනුව ඉඩම සඳහා අධිකාරිය රු. මිලියන 7.68 ගෙවා තිබුණු බවත් විගණනයේදී වැඩිදුරටත් අනාවරණය විය.

# නැගෙනහිර පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාව විසින් 2014 සඳහා එකතුව රු.මිලියන 23,781 ක් සඳහා ආදායම් ඇස්තමේන්තු කර එයින් රු.මිලියන 21,271 ක් රජයේ ප්‍රදාන මඟින් ලබා ගැනීමට හා රු. මිලියන 2,510 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස් කිරීමටද, සම්පූර්ණ වියදම රු. මිලියන 21,141 කින් රු.මිලියන 16,115 ක් පුනරාවර්තන වියදම් සඳහා සහ රු. මිලියන 5,026 ක් මූලධන වියදම් සඳහා යෙදවීමට ද අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2014 වසර තුළ දී රජයේ ප්‍රදාන වශයෙන් රු.මිලියන 18,148 ක් හා අභ්‍යන්තර මාර්ග මඟින් රු.මිලියන 2,501 ක් ද වශයෙන් ලද එකතුව රු.මිලියන 20,649 ක් වූ ආදායමෙන් පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 15,754 ක් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මිලියන 4,661 ක් වශයෙන් එකතුව රු.මිලියන 20,415 වියදමක් 2014 වර්ෂය තුළදී දරා තිබුණි.

නැගෙනහිර පළාත් සභාවේ කටයුතු වලට අදාල 2014 වර්ෂය සඳහා වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- පළාත් අමාත්‍යාංශ 03ක් හා පළාත් දෙපාර්තමේන්තු 15ක් විසින් වැය විෂයයන් 36ක් යටතේ සලසා තිබූ රු. මිලියන 26.56 ක්වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

- මධ්‍යසාර බලපත්‍ර වෙනුවෙන් 2014 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 25.00 ක් විය. එනමුත්, රු. මිලියන 16.30 ක් ආදායම පමණක් සමාලෝචිත වර්ෂය තුළදී මධ්‍යසාර බලපත්‍ර ගාස්තු වශයෙන් රැස්කර තිබුණි.

- නෛතික විධිවිධාන පරිදි උසාවි විසින් පනවන ලද දඩ මුදල් සහ දේපල පැවරුම් මත පනවන ලද මුද්දර ගාස්තු වලට අදාළව පළාත් සභාව විසින් රැස්කල එකතුව රු. මිලියන 783.65 ක් මුදලක් අදාල පළාත් පාලන ආයතන වලට ප්‍රේෂණය කිරීමෙන් තොරව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරිකිරීම් ගිණුමක 2014 දෙසැම්බර් 31 දක්වා රඳවා තිබුණි.

- නැගෙනහිර පළාතේ මහ නගර සභා 03කට, නගර සභා 05කට හා ප්‍රාදේශීය සභා 36කට අදාළව ප්‍රධාන ආදායම් මාර්ග වූ වරිපනම්, බදු, කුලී සහ කල්බදු වැනි ආදායම් වලට අදාළව හිඟ මුදල් එකතුව රු. මිලියන 522.11 ක් 2014 දෙසැම්බර් 31 දින දක්වා අය නොවී පැවතිණි.
- ප්‍රදේශීය ලේකම් කාර්යාල 05 කට අදාලව රජයේ ඉඩම් සඳහා වූ එකතුව රු. මිලියන 73.17 ක්වූ කල්බදු ආදායම් 2009 වර්ෂයේ සිට 2016 ජුනි 30 දක්වා අය නොවී පැවතිණි.

- තත්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන, පළාත තුළ ක්‍රියාත්මක වෛද්‍ය ආයතන 62 ක් විසින් රු. මිලියන 21.64 ක් වටිනා අතිරික්ත ඖෂධ ලබාගෙන තිබුණි. කෙසේ වුවත්, ඉහත සඳහන් ඖෂධ කල් ඉකුත්වීම නිසා භාවිතයට ගත නොහැකිව තිබුණි.

- ප්‍රමිතියට අනුකූල නොවූ රු. මිලියන 8.37 ක් වටිනා බාල තත්වයේ ඖෂධ වර්ග 160 ක් පිළිබඳව කිසිඳු ක්‍රියා මාර්ගයක් ගැනීමෙන් තොරව, ත්‍රිකුණාමලය මූලික රෝහලේ සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩාවල 2014 දෙසැම්බර් 31 දිනට පැවතිණි.

- පළාත් සභාවේ සත්ව නිෂ්පාදන ගොවිපලක් විසින් මිලට ගත් වටිනාකමේ එකතුව රු.576,660 ක්වූ ඖෂධ වර්ග 5 ක්, එම ඖෂධ කල් ඉකුත් දිනයට පෙර භාවිතයට නොගැනීම නිසා කල් ඉකුත් වී තිබුණි.

- පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2011 සිට 2013 කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 1.12 කට මිලට ගත් ක්‍රීඩා ඇඳුම් අදාල ක්‍රීඩා සමාජ වලට බෙදා දීමෙන් තොරව, 2015 ජනවාරි 26 දින වන විටත් ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

- සෞඛ්‍ය අංශයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේ ලද රු. මිලියන 36.69 ක් වූ අරමුදල් ආපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

- සංවර්ධන කටයුතු සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ එක් එක් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා වෙන්කල අරමුදල් අවස්ථා ගණනාවකදී දෙන ලද කටයුතු සිදු නොකර වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වෙනත් කටයුතු සඳහා මුදාහැර තිබුණි.

- පාසල් අධ්‍යාපන දැනුම් මධ්‍යස්ථාන වශයෙන් පරිවර්තනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය (TSEP) යටතේ නැගෙනහිර පළාතේ තෝරාගත් පාසල් වල රු.මිලියන 108.20 පිරිවැයකින් මහින්දෝදය විද්‍යාගාර 13 ක් ඉදිකර 2014 වර්ෂයේදී අදාළ පාසල් වලට භාරදී, ඒවා 2015 අගෝස්තු 14 දින වන විටත් භාවිතා කර නොතිබුණි.

- රු. මිලියන 82.64 ක පිරිවැයක් දරමින් මහින්දෝදය විද්‍යාගාර වෙත 2014 වර්ෂය තුලදී සපයන ලද පරිගණක 325 ක්, ලී බඩු සහ උපකරණ වසරකට අධික කාලයක් තුල නිෂ්ක්‍රීයව පැවතිණි.

- කිරි නිෂ්පාදන අලෙවිය පහසු කිරීම සඳහා පළාත් දෙපාර්තමේන්තුවක් විසින් අක්කරෛයිපත්තුවේ,අලයඩිවෙම්බුහි රු.මිලියන 5.25 පිරිවැයකින් 2012 වර්ෂයේ ඉදිකල අලෙවි මධ්‍යස්ථානය, එම කටයුත්ත සඳහා 2015 ජූලි 07 දින දක්වාම භාවිතා කර නොතිබුණි.

- ගෘහස්ථ හිංසනයට ලක්වූවන්ට සුරැකි පදිංචි පහසුකම් ලබාදීම සඳහා රු.මිලියන 18 ක වටිනාකමින් ගොඩනැගිල්ලක් ඉදිකර ත්‍රිකුණාමලයේ සුරැකුම් නිවසක් ස්ථාපනය කිරීම සඳහා 2012 වසරේදී සමාජසේවා දෙපාර්තමේන්තුවට භාරදී ඇතත්, 2015 අප්‍රේල් වන විටත් එය අදාළ කටයුත්ත සඳහා භාවිතා කර නොතිබුණි.

- රු.මිලියන 1.99 ක පිරිවැයක් දරමින් 2013 වසරේදී මුත්තූර්, අලෙයිනගර්හි ඉදිකරන ලද තොරතුරු තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානයක් 2015 අගෝස්තු 04 දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතිණි.

- ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය පූර්ව අනුමැතිය හා නිශ්කාෂණ සහතික ලබා ගැනීමෙන් තොරව, රු.මිලියන 12.02 ක පිරිවැයක් දරමින් 2010 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අම්පාරේ කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. ඒ හේතුකොට ගෙන, නාගරික සංවර්ධන

අධිකාරිය වෙතින් පූර්ව අනුමැති ලබා නොගැනීම මත දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 1.01 ක සේවා ගාස්තුවක් ගෙවා තිබූ අතර, දෙපාර්තමේන්තුවට එරෙහිව නාගරික සංවර්ධන අධිකාරිය විසින් උසාවියේ ගොනුකල නඩුව සඳහා ද නීතිඥ ගාස්තු වශයෙන් රු.16,000 ක් ගෙවා තිබුණි.

- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 21 ක එකතුව රු. මිලියන 51.44 ක් වූ කාර්ය මණ්ඩල ණය ශේෂ වසර 2 සිට 10 ක කාල පරාසයක් තුල අය නොවී පැවතිණි. ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු එකතුව රු. මිලියන 46.25 ක් ණය ශේෂ ද, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු එකතුව රු. මිලියන 41.18 ක් වූ ණය ශේෂ සහ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.මිලියන 1,02 ක් වූ ණය ශේෂ වලින් මෙම ණය ශේෂ සමන්විත විය.

- පළාත් සභාවට අයත් විවිධ මාදිලියේ වාහන 620 වටිනාකම නිශ්චය කොට ගිණුම්වලට ගෙන නොතිබුණි.

- දිස්ත්‍රික්කය තුල වූ අනෙකුත් පාසල් සමඟ සැසඳීමෙන්, ඉහළ මට්ටමක සමත්වීමේ ප්‍රතිශතයක් පවත්වා ගෙන යාම සඳහා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාසල් තුනක් විසින් 2014 වර්ෂයේ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම සඳහා සිසුන් 88 දෙනෙකුට ඉඩ ලබාදී නොතිබුණි. අදාළ සිසුන්ගේ උසස් අධ්‍යාපනය කෙරෙහි මෙම පිළිවෙත අහිතකර අන්දමින් බලපා තිබුණි.

# උතුරු පළාත් සභාව

උතුරු පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 16,596 ක් සඳහා ආදායම් ඇස්තමේන්තුකර එයින් රු.මිලියන 14,647 ක් රජයේ ප්‍රධාන වශයෙන් ලබාගැනීමට හා රු.මිලියන 1,949 ක් අභ්‍යන්තර මාර්ග වශයෙන් රැස්කිරීමට ද මින් රු. මිලියන 14,591 ක් පුනරාවර්තන වියදම් සඳහා සහ රු.මිලියන 2,005 ක් මූලධන වියදම් සඳහා යෙදවීමට ද අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් 2014 වසර තුළදී රජයේ ප්‍රදාන වශයෙන් ලද රු.මිලියන 16,248 ක් හා අභ්‍යන්තර මාර්ග මගින් රු.මිලියන 1,866 ද වශයෙන් ලද එකතුව රු.මිලියන 16,248 ක් වූ ආදායමෙන් පුනරාවර්තන වියදම් වශයෙන් රු.මිලියන 13,925 ක් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.මිලියන 1,967 ක් එකතුව රු.මිලියන 15,892 ක වියදමක් වර්ෂය තුළදී දරා තිබුණි.

උතුරු පළාත් සභාවේ කටයුතු වලට අදාල 2014 වර්ෂය සඳහා වූ වැදගත් විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- පත්කරන ලද උතුරු පළාත් සභාව 2013 ඔක්තෝබර් 25 දින ස්ථාපිත කළ නමුත් , 2007 සිට 2013 දක්වා වූ වසර 7 ක් සඳහා වූ උතුරු පලාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තා, 1987 අංක 42 දරන පලාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව සභා රැස්වීම්වලදී 2015 අගෝස්තු 31 දින දක්වාම සභාගත කර නොතිබුණි. මේ හේතුකොටගෙන, 2007 වර්ෂයේ සිටම විගණකාධිපති වාර්තා මගින් පෙන්වා ඇති කරුණු නිවැරදි කිරීම සඳහා පලාත් සභාව විසින් යාන්ත්‍රණයක් යොදා නොතිබුණි.

- ආණ්ඩුකාර භාර අරමුදලක් ඇති කිරීම සඳහා උතුරු පලාත් ආණ්ඩුකාරවරයා විසින් සම්මත කළ සංදේශයක් හෝ පලාත් සභාව විසින් සම්මත කළ ප්‍රඥප්තියක් හෝ නොමැතිව ආණ්ඩුකාර භාර අරමුදල ස්ථාපනය කර තිබුණි. 2007 ජනවාරි 01 දින පටන් ක්‍රියාත්මක වන පරිදි උතුරු පලාත සඳහා වූ භාර අරමුදල මෙහෙයවා තිබුණි. කෙසේ වෙතත් , එවකට සිටි උතුරු පලාත් ආණ්ඩුකාරවරයා විසින් , ඔහුගේ අවශ්‍යතාවයමත පිළියෙළ කළ අංක 01/2007 හා 2007 ජනවාරි 01 දිනැති සංදේශයේ 08 ඡේදයේ සඳහන් පරිදි , මහජනයාගෙන් ලැබෙන පරිත්‍යාග හෝ දායක මුදල්, සංවිධාන , සමිති සහ භාරගත් ව්‍යාපෘති මගින් ජනිත ආදායම් වලින් අරමුදල සමන්විත විය යුතුය. එනමුත්, ඉහත සඳහන් ප්‍රභවයන්ගෙන් එවැනි දායක මුදල් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී නොතිබු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වූ ආණ්ඩුකාර භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 22 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. 2014 වර්ෂයේදී රු. මිලියන 138.86 ක මුදලක් ආණ්ඩුකාර භාර අරමුදලේ වූ අතර, විගණනය සඳහා විගණකාධිපතිවරයාට දී තිබු බලය, 2014 ජනවාරි 10 දිනැති ආණ්ඩුකාරවරයාගේ අංක 1/2014 දරන සංදේශය මගින් ඒකපාර්ශවිකව අවලංගු කර තිබුණි.

- නිශ්චිත අරමුණු සඳහා වූ අරමුදල් ගණනාවක් පලාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගිණුමේ රඳවනු ලැබ, අදාල බලධාරීන්ගේ බලයක් ලබා නොගෙන, ආණ්ඩුකාරවරයාගේ අභිමතානුසාරී අරමුදල ඇති කිරීම සඳහා මුදල් මාරු කර තිබුණි. පලාත් සභාව විසින් ප්‍රඥාප්තියක් සම්මත කිරීමෙන් තොරව ආණ්ඩුකාරවරයා විසින් අභිමාතානුසාරී අරමුදලක් ඇති කිරීම සඳහා පළාත් සභා පනතේ හෝ වෙනත් පනතක ප්‍රතිපාදන නොමැති බැවින්, තැන්පතු ගිණුමෙන් මුදල් මාරු කිරීම බලය නොලත් කරුණක් ලෙස සැලකිය යුතුවේ. ආණ්ඩුකාරවරයාගේ අභිමතානුසාරී

අරමුදල ඇතිකිරීම සඳහා වු අනුමැතිය ආණ්ඩුකාරවරයා විසින්ම දී තිබූ බවත්, වර්ෂ දෙකක කාලයක් තුළ ආණ්ඩුකාරවරයාගේ අභිමතානුසාරී අරමුදලට මාරුකළ මුදල් අක්‍රියව පැවති බවත්, තවදුරටත් නිරීක්ෂණය විය.

- ආණ්ඩුකාරවරයාට මාසිකව රු.100,200 ක ඉන්ධන දීමනාවකට හිමිකම් ඇතත්, ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක පීසීඑම්ඩී/1 4/23/4/4 හා 2011 දෙසැම්බර් 19 දිනැති චක්‍රලේඛයට පටහැනිව රු.247,400 සිට රු.497,600 දක්වා වූ පරාසයක මාසික ඉන්ධන දීමනා ආණ්කාරවරයාට ගෙවා තිබුණි. ඒ හේතුකොටගෙන රු.3,686,440 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැඩියෙන් ගෙවා තිබුණි. රජයේ වාහන සඳහා සුපිරි පෙට්‍රල් මිලදී ගැනීමට චක්‍රලේඛයේ විධිවිධාන නොමැති නමුත්, සුපිරි පෙට්‍රල් හා සාමාන්‍ය පෙට්‍රල් සඳහා ගෙවීම් කර තිබූ බැව් තවදුරටත් නිරීක්ෂණය විය. ආණ්ඩුකාරවරයාට මසකට රු.50,000 ක සීමාව ඉක්මවා ගෙවූ අතිරික්ත ඉන්ධන දීමනාව වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු සඳහා වූ බදු අයකරගෙන නොතිබුණි.

- කිසිදු චක්‍රලේඛ උපදේශවලට අනුකූල නොවී, ආණ්ඩුකාරවරයා විසින් නිශ්චය කරන ලද මුදලක් පදනම් කරගෙන, ප්‍රවෘත්ති සංස්කරණ ගාස්තු වශයෙන් ආණ්ඩුකාරවරයාගේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.430,000 ක මුදලක් මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරියාට ගෙවා තිබුණි.

- මධ්‍යම රජයේ ප්‍රතිපත්තිවලට පටහැනිව ආයතන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

  (i) පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1999 ජුනි 01 දිනැති අංක පීඩී/බීපී/9 දරන චක්‍රලේඛයේ උපදෙස් වලට අනුව, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ආයතනික කරුණු ක්‍රියාත්මක කිරීම් හැකිතාක් දුරට රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරු වලට අදාල ක්‍රියාපරිපාටිවලට අනුකූලව සිදුකල යුතුවේ.

  (ii) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් තොරව, නිල කටයුතු සඳහා පළාත් සභාව විසින් 2011 ජනවාරි සිට ගොඩනැගිලි 14කට වැඩි ප්‍රමාණයක් කුලියට ගෙන තිබූ අතර, ඒ සඳහා 2011 සිට 2014 වසර දක්වා ආසන්න වශයෙන් රු. මිලියන 25 නිවාස කුලී ගෙවා තිබුණි. ගෙවල් කුලී ගෙවීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. ආයතන සංග්‍රහයේ විධි විධානවලට පටහැනිව, මෙම නිවාස වල පදිංචිව සිටි ලේකම්වරුන්ගෙන් රු.500ක කුලිය පමණක් අයකර තිබුණි. එක් ලේකම්වරයෙකුට ආසන්න වශයෙන් රු.150,000ක් පමණ වටිනා ගෘහ භාණ්ඩ හා උපකරණ ලබා දී තිබූ අතර, එම නිවාස වල විදුලිය හා ජල බිල් පළාත් සභා අරමුදල් වලින් ගෙවා තිබුණි. ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 53 වගන්තිය ප්‍රකාරව කුලියට ගත් නිවාස වල පදිංචි ලේකම්වරුන්ගෙන් නිවාස කුලිය සහ ඔවුන් විසින් ගෙවිය යුතු විදුලිය හා ජල ගාස්තු බිල් සඳහා වූ මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

  (iii) ඡන්දයෙන් පත් කල පළාත් සභාවක් ස්ථාපනය කර නොතිබූ 2013 වර්ෂය සඳහා ප්‍රාදේශීය කොමසාරිස් වරුන් සඳහා වූ සේවක සංඛ්‍යාව අනුමත කර තිබූ නමුත්, කිලිනොච්චි, යාපනය, වවුනියා සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා කොන්ත්‍රාත් පදනම මත,

නැවත සේවයේ යොදනු ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් නොවන නිලධාරින් විසින් ප්‍රාදේශීය කොමසාරිස් සේවාව පවත්වාගෙන ගොස් තිබුණි. අංක 9/2007 හා 2011 මැයි 11 දිනැති රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛයට පටහැනිව. ඔවුන්ට මේ සම්බන්ධයෙන් රු.9,095,424 ක් වැටුප් දීමනා වශයෙන් ද ඊට අතිරේකව, වාහන නඩත්තුව, ඉන්ධන හා වෙනත් කාර්යාල නඩත්තුව සඳහා වියදම් ද දරා තිබුණි.තවද ප්‍රාදේශීය කොමසාරිස්වරුන්ගේ කාර්යය සාධනය/ ඉටු කළ රාජකාරි පිළිබඳ තොරතුරු විගණනයට ලබා දී නොතිබුණි.

- උතුරු පළාත් සභාවට අයත් වාහන දහසයන් රු. මිලියන 5.10 ක තක්සේරුවක් පදනම් කරගෙන, ප්‍රසිද්ධ වෙන්දේසියේ රු. මිලියන 5.41 ක මිලකට විකුණා තිබුණි. මෙම වාහන අබලි වාහන ලෙස සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පෙන්නුම් කර නොතිබුණි. එනමුත් පාරිපාලන අඩුපාඩු හේතුවෙන්,මාස 39 ක් ගතවීමෙන් පසුවක්, වාහන දහයක අයිතිය ඒවායේ ගැනුම්කරුවන්ට පවරා දී නොතිබුණි.පසුව වාහනවල අයිතියට අදාල පොත් හා ලියකියවිලි ලබා නොදිම පිළිබඳව ගැනුම්කරුවන් දෙදෙනෙකු විසින් ප්‍රධාන ලේකම්වරයාට එරෙහිව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාවේ නඩුවක් ගොනු කර තිබුණි.

- උතුරු පළාත් සභාවේ පළාත් පාලන ආයතන 34 ක රුස් කරන අපද්‍රව්‍ය කොම්පෝස්ට් ව්‍යපෘතියක් ක්‍රියාත්මක කිරීමෙන් තොරව ගිනි තබා හෝ වලලා විනාශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් වාවකච්චේරි නගර සභාව විසින් කසල කළමනාකරණය සඳහා ගොඩනැගිලි ඉදි කිරිම සඳහා රු.මිලියන 3.2 ක් වැය කර තිබූ අතර, වලිකාමච් දකුණ ප්‍රදේශීය සභාව විසින් සීමා තාප්පයක් ඉදිකිරිම සඳහා රු.මිලියන 4.73ක් වැය කර තිබූ නමුත්, එම වත්කම් අපේක්ෂිත කටයුතු සඳහා උපයෝගී කරගෙන නොතිබුණි.

- චුන්නාකම් හි ජලය ලබා ගන්නා බිම් ප්‍රදේශය චුන්නාකම් හි පොසිල ඉන්ධන බලාගාරයට ඉතා ලඟින් පිහිටා තිබූ අතර, චුන්නාකම් ජලය ලබා ගන්නා බිමෙහි ඉන්ධන ගඳක් ඇතිබව ජාතික ජලා පවාහන හා ජල සම්පාදන මණ්ඩලයට 2012 වර්ෂයේදී නිරීක්ෂණය වී තිබුණි. චුන්නාකම් බලාගාරය වටා පිහිටි උඩුවිල් සහ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශව වූ ළිං 100 ක් ජල සම්පාදන ජල පවහන මණ්ඩලය විසින් විශ්ලේෂණය කරනු ලැබේ. එයින් සියයට 80 ක ප්‍රමාණය මි.ග්‍රෑ/ 1, 0.33 සිට 19.40 දක්වා පරාසයක (ශ්‍රී.ල.ප්‍ර.සීමාව මි.ග්‍රෑ.0.2/1 මි.ග්‍රෑ/1-1.0)අපවිත්‍ර තෙල් වලින් ඒවා දූෂණය වී ඇති බැව් සොයා ගෙන තිබුණි. ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාලය (චුන්නාකම්) විසින් ද තවදුරටත් ළිං 16 ක් පරීක්ෂා කරනු ලැබ එම වාර්තා මඟින් ද තෙල් හා ග්‍රීස් මිශ්‍ර වීම පෙන්නුම් කර තිබිණි. උතුරු පළාතේ පානීය ජලයට සිදුව ඇති ගැටලුව මඟ හරවා ගැනිම සඳහා අවුරුදු තුනක් තිස්සේ පළාත් සභාව විසින් අර්ථවත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

- ආහාර හා කෘෂි සංවිධානය විසින්,ගැණුම් පිරිවැයෙන් 50% ක් වූ මිලට ජල පොම්ප 570 ක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත නිකුත් කර තිබුණි. පොම්ප 570 අතුරෙන් පොම්ප 264 ක් පමණක් 2011 අගෝස්තු 15 සිට 2011 සැප්තැම්බර් 12 දක්වා වූ කාල පරිච්ඡේදය තුල ගොවියන්ට බෙදා දි, ගොවින්ගෙන් රු.මිලියන 2,887 ක් එකතු කර, රජයට එම මුදල් ප්‍රේෂණය නොකර, පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි.එහි ප්‍රතිඵලයක් වශයෙන්, පෞද්ගලික බැංකු ගිණුමක තැන්පත් කළ රු.මිලියන 2.887 ක් වූ මුළු මුදලම නියෝජ්‍ය කෘෂිකර්ම විසින් අයුතු ලෙස පරිහරණය කර තිබුණි.

# සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 22,726 ක ආදායමක් ඇස්තමේන්තු කර එයින් රු. මිලියන 19,766 ක් රජයේ ප්‍රදාන මගින් ලබාගැනීමට හා රු. මිලියන 2,960 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කිරීමටද , මින් රු. මිලියන 16,970 ක් පුනරාවර්ථන වියදම් සඳහා හා රු. මිලියන 5,756 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මගින් රු. මිලියන 16,865 ක් ලැබී තිබූ අතර රු. මිලියන 3,071 ක් අභ්‍යන්තර මාර්ග මගින් රැස්කර තිබුණි. තවද පුනරාවර්ථන වියදම් සඳහා රු. මිලියන 15,729 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 2,792 ක් වැයකර තිබුණි.

සබරගමුව පළාත් සභාවට අදාලව 2014 වර්ෂයේ සිදුකරනු ලැබූ විගණනයේදි අනාවරණයවූ වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන මුළු කෙටිකාලීන ආයෝජන අගය නිරූපනය වන ස්ථාවර තැන්පතුවල වටිනාකම රු. මිලියන 3,607.93 ක් ලෙස දක්වා තිබුණූ අතර, බැංකුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ සනාථන ලිපිය අනුව එකතුව රු. මිලියන 3,634.52 ක් නියෝජනය කරන ස්ථාවර තැන්පතු 11 ක් සහ එක් ඉතුරුම් ගිණුමක් පවතින බව අනාවරණය වූයෙන් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ කෙටිකාලීන ආයෝජන අගය රු. මිලියන 26.58 ක් අඩුවෙන් දක්වා තිබුණි. 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වාර්ෂිකව රු. මිලියන 3.00 ක් බැගින් පළාත් සභා නඩත්තු අරමුදල නමින් වූ වැය විෂයයකට ප්‍රතිපාදන වෙන් කර, වර්ෂය අවසානයේ දි සම්පූර්ණ ප්‍රතිපාදනයම එම වැය විෂයයට හර කර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ බව විගණනයේදි වැඩිදුරටත් අනාවරණය විය.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පළාත් සභාවට අයත් මුදල් සඳහා වූ බැංකු ගිණුම්වල රු.100,000 ක් රඳවා තබා ඉතිරි මුදල් මාසිකව පළාත් සභාව වෙත ප්‍රේෂණය කරන ලෙස අංක CSAC/AP/04/01 දරණ හා 2007 පෙබරවාරි 22 දිනැති සබරගමුව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මූල්‍ය කළමනාකරණ) ගේ ලිපිය මගින් දන්වා තිබුණි. එසේ වුවත් රත්නපුර දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඊට පටහැනිව කටයුතු කිරිම හේතුවෙන් 2013 වසර අවසානයේ දී හා 2014 වසරේ සැප්තැම්බර්, ඔක්තෝබර් හෝ නොවැම්බර් මස අවසානයේ දි ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි බැංකු ගිණුම්වල එකතුව රු. මිලියන 213.48 ක බැංකු ශේෂයක් පැවති බවත් මේ නිසා පළාතේ සංවර්ධනය වෙනුවෙන් යෙදවිය හැකි මුදලක් කිසිදු පොළියක් ද රහිතව බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව පැවැති බවත් නිරීක්ෂණය විය.

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2008 දෙසැම්බර් 31 දිනට අනුමත කර තිබූ තනතුරුවලින් සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරක් වන, ප්‍රධාන අමාත්‍ය උපදේශක යන තනතුර සඳහා 2014 මාර්තු 20 දිනැති ආණ්ඩුකාර ලේකම්තුමාගේ අංක ආ.කා./සලේ/2/1 ලිපිය මඟින් 2014 අප්‍රේල් 02 දින සිට උපදේශකවරයෙක් පත්කර එදින සිට 2015 පෙබරවාරි මාසය දක්වා දීමනා වශයෙන් එකතුව රු.938,417 ක් ගෙවා තිබුණි.

- 2014 වර්ෂයේ දි ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකු විසින් සහ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවන පුද්ගලයින් දෙදෙනකු විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරි ලෙස දක්වමින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව හා රහිතව සංචිත වාහන 04 ක් භාවිතා කර තිබූ අතර, ඒ සඳහා ඉන්ධන වෙනුවෙන් රු.692,516 ක් වැය කර තිබුණි.

- සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් විවිධ ආයතන වෙත බදු දී තිබූ ඉඩම් වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. මිලියන 18.42 ක් වූ දිගුකාලින බදු සහ දඩ මුදල් ද, එකතුව රු. මිලියන 4.45 ක් වූ වාර්ෂික බදු සහ දඩ මුදල් ද , ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාල එකතුව රු.175,984 ක් වූ එළදා බදු ද , 2015 ජුලි මස වන විට හිඟව පැවති අතර, ඒ සම්බන්ධයෙන් 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරණ ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 07 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව එකතුව රු.මිලියන 7.14 ක් වූ ජල බදු හා දඩ මුදල් ද අයවිය යුතුව පැවතුණි. සබරගමුව පළාත් සභාවේ ආදායම් ජනනය හා ප්‍රවර්ධනය සඳහා වූ විශේෂ ස්ථාවර කමිටුව පිහිටුවා වසර 2 කට අධික කාලයක් ගත ව ඇතත් එහි අරමුණු වලින් කිසිවක් ඉටු වී නොමැති බව කමිටු රැස්වීම් වාර්තා හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පසුගිය වසරවල ආදායම් රැස්කිරීම් ප්‍රගතිය පිළිබඳව පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. එහෙත් 2013 පෙබරවාරි සිට 2015 මාර්තු 31 දක්වා වූ කාල සීමාවට අදාළව මෙම කමිටු සාමාජිකයන් වෙත සහභාගීත්ව දීමනා , මාසික දීමනා හා දිරි දීමනා වශයෙන් එකතුව රු. මිලියන 1.39 ක් ගෙවා තිබූ අතර, කමිටුවේ ලේකම්වරයා පත් කිරීමේ දී විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2007 මැයි 11 දිනැති අංක 09/2007 හා 2007 අගෝස්තු 24 දිනැති අංක 2007/09(1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව කටයුතු කර තිබුණි.

- 2014 වර්ෂය වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක හා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක කිසිදු ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් නොතිබුණු තත්ත්වයක් තුළ 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වැසී ඇති පාසල් හා පේෂකර්ම මධ්‍යස්ථාන යොදාගෙන සබරගමුව පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් තුළ මධ්‍යම බෙහෙත් ශාලා 05 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 1.50 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබුණ ද 2014 වර්ෂය තුළ දී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ දී රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත වෙන් කර තිබූ රු. මිලියන 6.88 ක මුදලින් 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.35 ක මුදලක් ඉතිරි වී අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ ඒ වැඩසටහන්හි ඉතිරිවීමේ ප්‍රතිශතයන් සියයට 6 සිට සියයට 80 දක්වා වූ අතර, අරමුදල් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ගනිමින් නියමිත පරිදි අදාල සෞඛ්‍ය වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරිමට රත්නපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අපොහොසත් වී තිබුණි.

- 2001 මාර්තු 28 දිනැති අංක මුදල් 01/2001 දරණ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.1 වගන්තියට අනුව පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ලබා ගත හැකි ණය උපරිම සීමාව රු.250,000 ක් ලෙස දක්වා තිබුණ ද , ඊට පටහැනි ලෙස සබරගමුව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සභා ලේකම් කාර්යාලය විසින් එක් මන්ත්‍රීවරයෙකුට රු.500,000 බැගින් ණය ලබා දී තිබූ බව විගණනයේදී අනාවරණය විය. තවද, 2014 දෙසැම්බර් 31 දින වන විට ඉහත පරිදි අනුමත සීමාව ඉක්මවා ලබා දී තිබූ ණය මුදලින් 2012 ජුනි 27 දින මන්ත්‍රීධුරය අහෝසි වී ඇති මන්ත්‍රීවරු 12 දෙනෙකුට අදාල එකතුව රු. මිලියන 1.42 ක් වූ ණය ශේෂ දිගින් දිගටම අක්‍රියව පවතින බවත් ඇපකරුවන් හෝ බැදුම්කර මගින් එම ණය මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් හා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් විගණනයට අනාවරණය විය.

- 2014 වර්ෂය තුළ දී හිටපු ආණ්ඩුකාරතුමා විසින් ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය මගින් තිළිණ ලබා දීම වෙනුවෙන් රු.මිලියන 18.55 ක් වැයකර භාණ්ඩ මිල දී ගෙන තිබූ අතර, එම මිල දී ගැනීම්වලදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4, 5.6, 7.8 හා 7.9 යන මාර්ගෝපදේශයන්ට පටහැනි ලෙස කටයුතු කර තිබුණි. අදාල සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ භාර ගැනීම හා ගෙවීම් කිරීම අවිධිමත් අයුරින් සිදුකර තිබූ බවත් මෙම භාණ්ඩ හිටපු ආණ්ඩුකාරතුමා විසින් සිය අභිමතය පරිදි පෞද්ගලික තිළිණ වශයෙන් විවිධ පාර්ශවයන්ට බෙදා හැර තිබූ බවත්, විගණනයේ දී අනාවරණය විය. තවද, මෙම භාණ්ඩ කුමන පාර්ශවයන්ට බෙදා හැර තිබේ ද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

- ප්‍රධාන අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන Electronic Internal Morbidity & Mortality Register (EIMMR) ව්‍යාපෘතිය සහ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු අවශ්‍යතා වෙනුවෙන් එකතුව රු.මිලියන23.48 ක් වැය කර පරිගණක යන්ත්‍ර 236 ක් මිල දී ගැනීමේ දී තාක්ෂණික පිරිවිතර සැකසීම, තාක්ෂණික ඇගයීම් සිදු කිරීම සහ පිරිවිතර පරීක්ෂා කර භාණ්ඩ භාරගැනීම යන ක්‍රියාවලින් වංචනික ස්වරූපයෙන් ඉටු කිරීම හේතුවෙන් සැපයුම්කරු වෙත පළාත් සභා අරමුදලින් රු. මිලියන 2.15 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

- අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් අධ්‍යාපන පද්ධතිය දැනුම් කේන්ද්‍රයේ පදනම ලෙස පරිණාමය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදුකරන මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 09 ක් සඳහා තොරතුරු තාක්ෂණ ආශ්‍රිත උපකරණ හා විද්‍යාගාර ගෘහ භාණ්ඩ සපයා ගෙනෙවිත් භාරදී ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් එකතුව රු. මිලියන 60.37 ක මුදලක් වැයකර පරිගණක 589 ක් මිලදී ගෙන තිබුණි. එහි දී තාක්ෂණික පිරිවිතර සැකසීම, තාක්ෂණික ඇගයීම් සිදුකිරීම සහ පිරිවිතර පරීක්ෂා කර භාණ්ඩ බාරගැනීම වැනි ක්‍රියාවලින් අවිධිමත් ආකාරයකින් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව ඉටු කිරීම හේතුවෙන් සැපයුම්කරු වෙත පළාත් සභා අරමුදලින් රු. මිලියන 7.96 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

- සබරගමුව පළාතේ සංවර්ධනය අරමුණු කොට, විදේශ රටවල් සම්බන්ධ කොට ගෙන විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් 06 ක් වෙනුවෙන් 2011, 2012 සහ 2013 යන වර්ෂයන් හි දී විදේශ ගමන් වෙනුවෙන් අවස්ථා 10 ක දී එකතුව රු. මිලියන 8.97 ක වියදමක් දරා තිබුණ ද, 2014

අගෝස්තු 11 දින වන විට ද එම කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක තත්ත්වයක නොතිබුණි. තවද, ඒ ඒ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳව පූර්ණ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොමැති බවත්, ක්‍රියාත්මක කිරීමේ නිසි අධිකාරි බලයක් නොමැති බව පෙනී ගොස් තිබුණ ද, එම වැඩසටහන් යටතේ දිගින් දිගටම විදේශ සංචාරයන් සිදුකර තිබු බවත් අනාවරණය වූ අතර, වැඩසටහන් 04 ක දී ප්‍රධාන අමාත්‍යවරයා දිවයිනෙන් බැහැරවීම සඳහා චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ද ලබා ගෙන නොතිබුණි.

- විදේශ රටවල් වල ආරාධනයන් මත විවිධ ආගමික හා සංස්කෘතික වැඩසටහන් වෙනුවෙන් 2012 සහ 2013 යන වර්ෂයන් හි දී අවස්ථා 04 ක දී ප්‍රධාන අමාත්‍යතුමා සහ පෞද්ගලික ලේකම් විසින් පළාත් සභා අරමුදලින් රු. මිලියන 2.62 ක් වැය කරමින් විදේශ ගත වී තිබුණි.

- කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාර අදාල කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත වටිනාකමට සමාන වූ පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගත යුතු වුවද, පළාත් සභාවේ අමාත්‍යාංශ දෙකක් විසින් සමාලෝචිත වර්ෂයේ දි හා පෙර වර්ෂයන්හි දී ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එවැනි රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබීම නිසා එක් අවස්ථාවක දී ස්වභාවික උවදුරක් හේතුවෙන් හානියට පත් වූ ඉදිකිරීමක් නැවත යථාතත්ත්වයට පත් කිරීම සඳහා ඉඩම්, පළාත් වාරි මාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් රු. මිලියන 2.62 ක් වැය කර තිබුණි.

- 2006 මාර්තු 18 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන රාජ්‍ය වියදම් කළමනාකරණය චක්රලේඛයේ සහ 2006 ඔක්තෝබර් 23 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරණ අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිය ප්‍රකාරව ප්‍රධාන අමාත්‍යවරයාට නිල වාහන දෙකක් සහ එක් ආරක්ෂක රථයක් පමණක් වෙන් කළ යුතුව තිබුණි. එසේ වුවත් එම විධිවිධාන වලට පටහැනිව 2013 සහ 2014 වර්ෂයන් හි දී වාහන 12 ක් ප්‍රධාන අමාත්‍යවරයා විසින් භාවිතා කර තිබු අතර, එම වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයේ දී ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු. මිලියන 3.03 ක් වැය කර තිබුණි.

# වයඹ පළාත් සභාව

වයඹ පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 26,727 ක ආදායමක් ඇස්තමේන්තු කර එයින් රු. මිලියන 20,672 ක් රජයේ ප්‍රදාන මඟින් ලබා ගැනීමට හා රු. මිලියන 6,055 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කිරීමටද, මින් රු. මිලියන 22,119 ක් පුනරාවර්තන වියදම් සඳහා හා රු. මිලියන 4,608 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මඟින් රු. මිලියන 19,393 ක් ලැබී තිබූ අතර, රු. මිලියන 5,719 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කර තිබුණි. තවද පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 21,198 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 2,980 ක් වැයකර තිබුණි.

වයඹ පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- වකුගඩු රෝගීන් සඳහා පිරිසිදු ජලය ලබාදීමේ අරමුණින් වයඹ ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු. මිලියන 1.25 ක් වටිනා රතුමැටි පෙරන 500 ක් මිළදීගෙන තිබුණද, ඉන් රු.358,848 ක් වටිනා මැටි පෙරන 144 ක් නිෂ්කාර්ය ලෙස ගබඩා කර තිබුණි. තවද රෝග නිර්නයකින් තොරව පළාත් පාලන ආයතනයක සේවක මහතුන් අතරේද එම මැටි පෙරන බෙදාහැර ඇති බව නිරීක්ෂණය වුණි. මෙම මැටි පෙරන මිළදීගැමේදී ඒවායේ ප්‍රමිතිය සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ඒවායේ දෝෂ ගණනාවක් පැවති බව නිරීක්ෂණය විය.

- ප්‍රධාන අමත්‍යාංශය විසින් 2014 වර්ෂයේ උපමාන පාදක ප්‍රතිපාදන උපයෝගී කරගෙන රු. මිලියන 21.47 ක් වටිනා ප්ලාස්ටික් පුටු 15,000 ක් , සාස්පාන් කට්ටල 20 ක්, ශබ්දවිකාශන කට්ටල 50 ක්, වානේ කබඩ් 200ක් හා ඇස්බැස්ටෝස් ෂීට් 1324 ක් මිළදීගෙන තිබුණු අතර, එම භාණ්ඩ ග්‍රාමීය ප්‍රජා මට්ටමේ ස්වේච්ඡා සංවිධානවලට බෙදාහැරීමට තීරණය කර තිබුණි. මෙම භාණ්ඩ බෙදාහැරීම සම්බන්ධව සිදුකල නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

    (i) රු.658,763 ක් වටිනා භාණ්ඩ අදාල පාර්ශවයන් වෙත ලැබී ඇති බවට සාක්ෂි නොවීම.

    (ii) අවස්ථා 21 කදී බෙදාහැර ඇති බවට වාර්තා කර තිබුණු රු.701,634 ක් වටිනාකමැති භාණ්ඩ වර්ග 4ක් භාරගත් බවට යොදා ඇති අත්සන් සහ නිලමුද්‍රාවල වෙනස්කම් පැවතීම.

    (iii) රු.436,900 ක් වටිනා සෙවිලි තහඩු 289 ක් පුද්ගලයින් 10 දෙනෙකු අතර බෙදා හැර ඇති බවට වාර්තා කර තිබුණු අතර, අදාල පාර්ශවයන් එම ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ ඡන්ද හිමි නාමලේඛනයේ ඡන්ද දායකයන් බව සනාථ නොවීම.

    (iv) තෝරාගත් එක් සමිතියක් සඳහා පමණක් රු.739,000 ක් වටිනාකමැති ප්ලාස්ටික් පුටු 600 ක් සහ වානේ අල්මාරි 16 ක් ලබාදී ඇති බවට වාර්තා වීම.

(v) වයඹ පළාත තුල පිහිටි ස්වේච්ඡා සංවිධානවලට බෙදාහැරීම සඳහා මිළදීගෙන තිබුණු භාණ්ඩ පුත්තලම දිස්ත්‍රික්කයේ කිසිම ස්වේච්ඡා සංවිධානයකට ලබාදී නොතිබීම සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් සංවිධාන කිහිපයක් අතරේ පමණක් බෙදා දී තිබීම.

- වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් කිහිපයක පැවති අබලන් ඩෙස් පුටු වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය මගින් අලුත්වැඩියා කිරීමේ කටයුතු කර තිබුණි. එහෙත් ඒ සඳහා පළාත් මූල්‍ය රීති අනුව නිසි රේටයක් හා නිසි පිරිවිතරයන් වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් ඉදිරිපත් කර නොතිබුණි. අදාල පාසැල් මගින් හෝ වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය මගින් එක් එක් උපකරණයේ අළුත්වැඩියා කළයුතු කොටස් කලින් හඳුනාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. ඒ අනුව එක් එක් අලුත්වැඩියාවේ ස්වභාවය අනුව ගෙවීම් නොකර සම්පූර්ණ අලුත්වැඩියාවම කලා සේ සලකා රු. මිලියන 4.21 ක මුදලක් වයඹ පළාත් යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ගෙවා තිබුණි.

- 2014 වර්ෂය වනවිට වයඹ පළාතේ පාසල් 126 ක් වසා දැමීමට කටයුතු කර තිබූ අතර, එයින් 72ක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට භාරදී තිබුණද 54 ක් භාර දී නොතිබුණි. තවද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 295 ක් පැවති අතර, ඉන් නිල නිවාස 60 ක පමණක් නිලධාරින් පදිංචි වී සිටි අතර 107 ක් අබලන් තත්ත්වයේ පැවතුනද, යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු පාසල් 337 ක සිටිය යුතු ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් වෙනුවට පහල ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් වැඩකටයුතු කරන බවත්, පාසල් 206 ක සිටිය යුතු ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් වෙනුවට ඉහල ශ්‍රේණියක විදුහල්පති ශ්‍රේණිධාරින් වැඩකටයුතු කරන බවත් නිරීක්ෂණය විය. තවද දෙපාර්තමේන්තුව සතු පාසල් 10 ක සිටිය යුතු ශ්‍රේණිධාරි නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙනුවට ඊට වඩා පහල ශ්‍රේණියක නියෝජ්‍ය විදුහල්පති ශ්‍රේණිධාරින් වැඩකටයුතු කරන බවත්, පාසල් 150 ක ශ්‍රේණිධාරි නියෝජ්‍ය විදුහල්පතිවරුන් සිටිය යුතු වුවද, එම පාසල්වලට ශ්‍රේණිධාරී නියෝජ්‍ය විදුහල්පතිවරුන් අනුයුක්ත කර නොතිබුණි. එසේම දෙපාර්තමේන්තුව සතු පාසල් 147 ක වැඩබලන විදුහල්පතිවරුන් කටයුතු කරන බවත් පාසල් 112 ක විදුහල්පතිවරුන් නොසිටින බවත් නිරීක්ෂණය විය.

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ වන ආයතන සඳහා බඳවාගෙන තිබුණු ප්‍රාථමික මට්ටමේ තනතුරු 80 ක අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාසල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 4,927 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

- පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් රෝහල් 04 ක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක, පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ගබඩාවේ හා ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් ඒකකයේ වටිනාකම රු. මිලියන 11.97 ක් වූ ඖෂධ හා ශල්‍ය වෛද්‍ය උපකරණ පාරිභෝජ්‍ය තොග වර්ග 253 කින් යුත් ඒකක 3,880,075 ක්ද, වටිනාකම ගණනය කල නොහැකි වූ තවත් ඖෂධ හා ශල්‍ය වෛද්‍ය උපකරණ පාරිභෝජ්‍ය තොග වර්ග 199 කින් ඒකක 1,210,385 ක තොගයක්ද, කල් ඉකුත්වීම, නියැදි සාම්පල් අසමත්වීම, පැහැය හා සුවඳ වෙනස්වීම යනාදී කරුණු හේතුවෙන් භාවිතයෙන් ඉවත්කර තිබුණි.

- කුලියාපිටිය රෝහලේ සායනික අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා 2011 දෙසැම්බර් මස 23 දින රු. මිලියන 1.25 ක් වැයකර රෝහලේ පස් මහල් ගොඩනැගිල්ලේ ඉහල මාලයේ දාහකයක් (Incinerator) ස්ථාපනය කර තිබුණි. මෙම ඉදිකිරීම, එම ගොඩනැගිල්ලේ පැවැත්මට හානියක් වන බැවින් කුලියාපිටිය ප්‍රාදේශීය ඉංජිනේරු විසින් නිර්දේශකර නොතිබුණු අතර රෝහලේ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ඇතුළු සියළුම අංශ ප්‍රධානීන්ද ඉදිකිරීම අනුමත කල නොහැකි බව දන්වා තිබුණි.

- එහෙත් එම විරෝධතා හා පාරිසරික බලපෑම් පිළිබඳ නොසලකා හැර ඉදිකිරීම සිදුකර තිබුණ අතර 2012 ජූනි 11 සිට අගෝස්තු 14 දින දක්වා කාලය තුල දින 14 ක් පමණක් අපද්‍රව්‍ය පිළිස්සීමෙන් පසු රෝහලේ වෛද්‍ය නිලධාරීන්ගේ විරෝධතාවය මත එහි කටයුතු නතර කර තිබුණි. ඒ අනුව විගණිත දිනය වූ 2015 ජූනි 05 දින දක්වා අදාල උපකරණ ඌන උපයෝජිතව පැවතුණි. තත්ත්වය එසේ තිබියදී දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ 2014 ජූනි 27 දින නැවතත් දාහනාගාරය සකස් කිරීම සඳහා රු.මිලියන 2.5 ක මුදලක් වෙන්කර ඉදිකිරීම් කටයුතු සිදුකරන ලෙස දන්වා තිබුණි. මේ අනුව රෝහලේ සියළුම අංශවල විරෝධතාමත කසල දාහකයක් සවිකිරීම, එය නිශ්කාර්යව පැවතීම හා එහි ඉදිකිරීම් සඳහා නැවත මුදල් වෙන් කිරීම තුලින් රජයේ මුදල් නිශ්කාර්ය ලෙස වැය කර ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

- 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3.5 වගන්තිය ප්‍රකාරව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් එකතු කරනු ලබන ගාස්තු වලින් සියයට 50 ක් එනම් රු. මිලියන 5.60 ක් පළාත් සභාව වෙත යවනු ලැබිය යුතු වුවත්, එසේ කටයුතු නොකර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යවරයාගේ විශේෂ ගිණුමකට ඉන් රු. මිලියන 3.61 ක් බැර කර තිබුණි.

- සමාලෝචිත වර්ෂය අවසාන වන විට සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අදාලව පුරප්පාඩු 1,577 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

- 2014 වර්ෂය අවසාන වන විටද ආයුර්වේද රෝහල් 09 ක් හා මධ්‍යම බෙහෙත් ශාලා 18 ක් පිහිටි ඉඩම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණු අතර, එම රෝහල් හා බෙහෙත් ශාලා ගොඩනැගිලිවල අළුත්වැඩියා හා සංවර්ධන කටයුතු සිදු කිරීමට එය බාධාවක් වී තිබුණි.

- 2014 වර්ෂයේදී පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව නිෂ්පාදනය කරන ලද ඖෂධ වර්ග 14 ක් සැලකිල්ලට ගත් කල නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය මෙන් සියයට 4 සිට සියයට 450 දක්වා වූ ප්‍රමාණයක් පිටතින් මිලදී ගෙන තිබුණි. එමෙන්ම 2014 වර්ෂයේදී එසේ පිටතින් මිලදී ගත් ඖෂධ වර්ග 11 ක් පිළිබඳ සලකා බැලීමේදී මෙම ඖෂධ දෙපාර්තමේන්තුව තුල නිෂ්පාදනය කලේ නම් 2014 වසර තුල දෙපාර්තමේන්තුවට ඉතිරි කර ගැනීමට හැකිව තිබුණු මුදල දළ වශයෙන් රු. මිලියන 1.62 ක් පමණ විය. ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් නොමැති වීම නිසා ඖෂධ වර්ග අවශ්‍ය ප්‍රමාණය දෙපාර්තමේන්තුව තුල නිෂ්පාදනය කර ගැනීමට නොහැකි වී තිබුණි.

- 2014 ජනවාරි 01 දින සිට වයඹ සංවර්ධන අධිකාරියට පත්වීම් ලබාදී ඇති නිලධාරීන් දෙදෙනෙකු එදින සිට ප්‍රධාන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුයුක්ත කර තිබුණු අතර, ඒ සඳහා අධිකාරියෙන් මසකට රු. 20,000 බැගින් රු.480,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. මෙම දීමනා ලබාදීම නිෂ්කාර්ය වැටුප් ගෙවීමක් ලෙස නිරීක්ෂණය විය.

- වයඹ පළාත් සභාව යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදනවලින් වසර 08 ක කාලයක් තුලදී හෝටල් පාසැලක් පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 95.53 ක මුදලක් වැය කර තිබුණද එයින් වයඹ පළාත් සභාවට කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගෙන රජයෙන් බාහිර වෙනත් ආයතනයක් වෙත අවබෝධතා ගිවිසුමක් මගින් මෙම දේපල පවරා තිබුණි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් හෝටල් පාසැලේ පාඨමාලා පැවැත්වීම, සිසුන් බඳවා ගැනීම, විභාග පැවැත්වීම, සහතික පත්‍ර ප්‍රදානය කිරීම, ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීම සහ වැඩිදුර අධ්‍යාපනය යන කරුණු ඉටු කිරීමේ කාර්යයයේ නියුක්ත වන අතර එම ආයතනය උපයන ආදායමින් කිසිදු ප්‍රතිලාභයක් පළාත් සභාවට අයකර නොගන්නා බව නිරීක්ෂණය විය.

- වයඹ සංවර්ධන අධිකාරිය විසින් ඉබ්බාගමුව තලාගස්වැව සංචාරක මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා 2009 දෙසැම්බර් 31 දින රු. මිලියන 1.17 ක වියදමක් දරා බෝට්ටු 10 ක් මිලදී ගෙන තිබු අතර, එහි ගෘහ නිර්මාණ ශිල්පී වියදම් ලෙස රු. 238,925 ක් වැයකර තිබුණි. ඒ අනුව එකතුව රු. මිලියන 1.41 ක වියදමක් දරා ඇතත්, සමාලෝචිත වර්ෂය තුලදී එය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එය නිෂ්කාර්ය වියදමක් වී ඇති බව නිරීක්ෂණය විය.

- වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය විසින් 2012 වර්ෂයේදී රු. මිලියන 1.48 ක මුදලක් ගෙවා එග් ඉන්කියුබේටර් 02 ක් මිලදී ගෙන තිබුණු අතර, ඒවා 2015 ජූනි 06 දින වන විටත් කාර්යාංශය වෙත ලැබී නොතිබුණි.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීම් බදු අඩුකර, ගෙවීම් අඩුකල මසට පසුව එළඹෙන මාසයේ 15 දින හෝ එයට පෙර දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් රු. මිලියන 13.28 ක් වටිනා බදු මුදල් වසර කිහිපයක සිට නියමිත කාලය තුලදී ගෙවා නොතිබුණි.

- 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත ප්‍රකාරව සේවක අර්ථ සාධක සහ සේවක භාර අරමුදල් අවකරණ මුදල් එළඹෙන මාසයේ ප්‍රේෂණය කළයුතු වුවද, වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් රු. මිලියන 16.16 ක අවකරණ ශේෂයන් නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබුණි. තවද සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් නියමිත දින නොගෙවීම හේතුවෙන් අධිභාර හා දඩ මුදල් ලෙස රු. මිලියන 3.97 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.544,634 ක් අධිභාර සහ දඩ ලෙස ගෙවා තිබුණි.

- වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ මුල්‍ය පාලනය අයහපත්වීම නිසා සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලිය ලෙස රු.571,141ක් ගෙවා තිබුණි.

- අබලන්වීම හේතුවෙන් වසර ගණනාවක සිට පාවිච්චියට ගත නොහැකිව ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලින් ඉවත්කර ඇති රු. මිලියන 19.66 ක් වටිනා යන්ත්‍ර සහ උපකරණ විෂයයන් 15 ක් සමාලෝචිත වර්ෂයේ වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ සථාවර වත්කම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. ඒවා ඉවත්කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

- වර්ෂ ගණනාවක සිට ප්‍රමාණවත් සේවා ඉල්ලුමක් ලබාගැනීමට සැලසුම් පිළියෙල නොකිරීම හේතුවෙන් වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය සතුව පැවති පිරිවැය වටිනාකම රු. මිලියන 16.84 ක් වූ රථවාහන 08 ක් නිෂ්ක්‍රීයව පැවතුණ බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එසේම වටිනාකම රු. මිලියන 25.38 ක් වූ රථ වාහන 11 ක් වර්ෂ ගණනාවක සිට සුළු සේවා කටයුතු නොකිරීම හෝ සේවා සඳහා අවශ්‍ය අමතර උපාංග ලබා නොගැනීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

- වයඹ ජනකලා පදනමේ රැස්වීම් ශාලාව ඉදිකිරීමේ කටයුතු 2010 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර, ඒ සඳහා අදියර 02 ක් යටතේ රු. මිලියන 10.75 ක් වියදම් කර තිබුණද එය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයටගත හැකි තත්ත්වයට පත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොහැකි වී තිබුණි.

- 2010 ඔක්තෝබර් 07 දිනැති අංක සී.ඒ/09/එන්.එස්.සී.සී/පොදු දරන ලිපිය හා 2012 අගෝස්තු 20 දිනැති අංක පී.සී.එම්.ඩී/1/4/23/1/14 දරන ජනාධිපති ලේකම්ගේ ලිපි මඟින් පළාත් රාජ්‍ය සේවාවන්හි වැටුප් හා සේවක සංඛ්‍යාව තීරණය කිරීමේදී ජාතික ප්‍රතිපත්තියකට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබියදී වයඹ පළාතේ සභා ලේකම් කාර්ය මණ්ඩලයේ තනතුරුවලට අදාල වැටුප් පරිමාණ, සභාවේ කාර්ය මණ්ඩල උපදේශක කමිටුවක නිර්දේශ මත තීරණය කර ඉහල වැටුප් තල මත පිහිටුවා තිබුණි.

- වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයට හා ඊට පෙර වර්ෂවලට අදාලව ප්‍රාදේශීය සභාවලට ගෙවිය යුතු රු. මිලියන 113.63 ක මුද්දර ගාස්තු හා රු. මිලියන 26.70 ක උසාවි දඩ වශයෙන් එකතු වටිනාකම රු. මිලියන 140.33 ක් අදාල ආයතනවලට නොගෙවා පැවතුණි.

- පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රැස් කරගත යුතු පිරිවැටුම් බදු ප්‍රමාණයෙන් රැස් කරගෙන තිබූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 11.43 සිට සියයට 0.6 දක්වා වූ පරාසයන් තුල බෙහෙවින් අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

- පළාත් අධ්‍යාපන කාර්යාලය විසින් 2014 වර්ෂය තුළ රු. මිලියන 8.06 ක අත්තිකාරම් මුදලක් විවිධ කටයුතු සඳහා නිලධාරීන් වෙත ලබාදී තිබුණු අතර, එම අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කර තිබුණු බිල්පත්වල වටිනාකම රු. මිලියන 6.01 ක් විය. ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර නිලධාරීන් වෙත ලබාදී තිබුණු අත්තිකාරම් මුදල රු. මිලියන 2.05 ක් වූ අතර, එය මුළු අත්තිකාරම් මුදලින් සියයට 25 ක ප්‍රතිශතයක් විය. එසේම නිලධාරීන් 32 කට ලබාදී තිබූ රු. මිලියන 1.65 ක අත්තිකාරම් මුදල්වලින් අත ඉතිරි වී තිබූ මුදල ලබාදුන් අත්තිකාරමට සාපේක්ෂව සියයට 24 ත් සියයට 84 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

- මූල්‍ය රීතිවලට අදාල නොවන ලෙස පළාත් අධ්‍යාපන කාර්යාලය විසින් දෙන ලද අත්තිකාරම් වලින් අත රඳවා ගෙන පසුව නිරවුල් කල මුදල රු. මිලියන 2.05 ක්වූ අතර, ඉතිරි රු. මිලියන 6.01 ක් වටිනා බිල්පත් පියවීමේදී දින 20 ත් 62 ත් අතර කාල පමාවක්ද විය. එසේම පළාත් අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් 16 කට රු. මිලියන 4.77 ක වටිනාකමැති අත්තිකාරම් මුදල්ද නිකවැරටිය කලාප කාර්යාලයේ නිලධාරින් 08 ට රු.344,250 ක අත්තිකාරම් මුදල්ද ඔවුන් විසින් කලින් ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර එම නිලධාරීන්ටම නැවත ලබාදී තිබුණි.

# ඌව පළාත් සභාව

ඌව පළාත් සභාව විසින් 2014 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 17,253 ක ආදායමක් ඇස්තමේන්තු කර එයින් රු. මිලියන 14,873 ක් රජයේ ප්‍රදාන මඟින් ලබාගැනීමට හා  රු. මිලියන 2,380 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කිරීමටද, මින් රු. මිලියන 13,380 ක් පුනරාවර්තන වියදම් සඳහා හා රු. මිලියන 3,873 ක් මූලධන වියදම් සඳහා යෙදවීමටද අපේක්ෂා කර තිබුණි.  මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයේ ප්‍රදාන මඟින් රු. මිලියන 16,433 ක් ලැබී තිබූ අතර රු. මිලියන 2,596 ක් අභ්‍යන්තර මාර්ග මඟින් රැස්කර තිබුණි.  තවද පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 13,869 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 4,448 ක් වැය කර තිබුණි.

ඌව පළාත් සභාවේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව වැදගත් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අර්තාපල් ගිණුමේ ශේෂය රු. මිලියන 41.01 ක් වූ අතර, එම ශේෂය වර්ෂ 10 ට අධික කාලයක් තිස්සේ  පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් නිරූපනය කර තිබුණි.  මෙම ශේෂය අදාල නිලධාරීන්ගෙන් මාසිකව අයකරගත යුතු වුවද සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 05 ක කාලය තුළ අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 05 ක්ව පැවතීමෙන් එම කාර්යය ක්‍රමාණුකූලව සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ සමස්ථ පුනරාවර්තන වියදම රු.මිලියන 13,869.33 ක්ද සමස්ථ  මූලධන වියදම රු. මිලියන 4,447.95 ක්ද වූ අතර පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් විගණනයට ඉදිරිපත් කළ විසර්ජන  ගිණුම් අනුව සමස්ථ පුනරාවර්තන වියදම රු. මිලියන 13,705.07 ක් හා සමස්ථ මූලධන වියදම රු. මිලියන 4,453.70 ක් වීමෙන් පුනරාවර්තන හා මූලධන වියදම් අතර පිළිවෙලින් රු.මිලියන 164.26 ක හා රු.මිලියන 5.74 ක වෙනසක් නිරීක්ෂණය විය.

- 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක්ද ඇතුළුව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 32 කට අදාලව එකතුව රු. මිලියන 170.19 ක් වූ අග්‍රිම ශේෂයන් නිරවුල් කර නොතිබුණි.

- බදුල්ල, ඌවපරණගම, හපුතලේ, මහියංගණය හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලීනව බදු දුන් ඉඩම්වල බදුකරුවන් 48 දෙනෙකුගෙන් රු. මිලියන 5.96 ක වාර්ෂික බදු, වාර/දඩ මුදල් සහ රු.556,259 ක පොලී මුදල් අයකර ගෙන නොතිබුණු අතර, හපුතලේ හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බදුකරුවන් 14 දෙනකුගෙන් රු. මිලියන 9.94 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු වාර / බදු මුදල් අඩුවෙන් අයකර තිබුණි.

- ලුණුගල අංක 02 රා තැබෑරුම් රේන්දය 2014 වර්ෂයට විකිණීම සඳහා මිල ගණන් කැඳවීමේදී ලැබී තිබූ ටෙන්ඩර් දෙකෙන් වැඩිම මිල ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුගේ රු. මිලියන 7.03 ක් වූ මිල ගණන සුරා බදු කොමසාරිස්වරයා විසින් තක්සේරු කළ  රු. මිලියන 9.50 ට වඩා අඩු අගයක්

විය. ගැසට් නිවේදනයට අනුව තක්සේරු මිලට රා තැබෑරුම රේන්දය ලබාගැනීමට ටෙන්ඩර්කරුගෙන් විමසා ඔහු ඊට එකඟවීම ප්‍රතික්ෂේප කරන්නේ නම් රේන්දය නැවත විකිණීමට කටයුතු කළ යුතුය. එම විධිවිධාන අනුව කටයුතු කිරීම වෙනුවට තක්සේරු අගයෙන් සියයට 10 ක් අඩු කර එනම් රු. මිලියන 8.55 කට ටෙන්ඩරය විකිණීම නිසා ලබාගත හැකිව තිබූ මත්පැන් බලපත්‍ර ආදායමෙන් රු.950,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

- දිසා යාන්ත්‍රික වැඩපල සඳහා වූ අත්තිකාරම් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දින වන විටත් 2011 වර්ෂයේ සිට පැවත එන හිඟ ආදායම් රු. මිලියන 9.97 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- මොනරාගල අධ්‍යාපන කලාපයට අයත් පාසල් 12 ක ගුණාත්මක යෙදවුම් මුදල් රු. මිලියන 1.75 ක් 2014 අගෝස්තු 31 දින වනවිටත් වියදම් නොකර නිෂ්කාර්යව ගිණුම්වල රඳවාගෙන තිබුණි.

- වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ 2014 වර්ෂයේ මූලධන ප්‍රතිපාදන වලින් අධ්‍යාපන කලාපය තුළ පැවැත්විය යුතු වටිනාකම රු. මිලියන 2.21 ක්වූ වැඩ සටහන් 40 ක් විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබූ අතර එම වැඩසටහන් තුල 2014 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය ඉලක්ක කරගත් රු.121,560 ක්වූ වැඩසටහන් 03 ක් ද ඇතුළත්ව තිබුණි.

- බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 78 ක් සඳහා ලැබී තිබූ ගුණාත්මක යෙදවුම් රු. මිලියන 15.85 ක් විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

- පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රූඩ් 3 පර්චර්ස් 18.5 ක්වූ කුඩා මුත්තෙට්ටුව නැමැති ඉඩම අත්පත් කර ගැනීම සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත රු. මිලියන 2.28 ක් ගෙවා තිබුණද 2015 මාර්තු 30 දින වන විටත් මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා රු. මිලියන 2.28 ක් වසර 05 ක් තිස්සේ නිශ්කාර්යව බදුල්ල ප්රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබීමෙන් එම මුදල් වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා භාවිතා කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.